## ශාක්‍යමුනීන්ද්‍රාවදනය

හෙවත්

## සිද්ධාර්ථගෞතම

# බුද්ධ චරිතය

<u>සම්පාදක</u>

බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය
මහානායක හිමිපාණන් වහන්සේ

ශාක්‍යමුනීන්ද්‍රාවදනය

හෙවත්

සිද්ධාර්ථගෞතම

# බුද්ධ චරිතය

අතිගරු බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය
මහා නාහිමි

බුද්ධ කාලයේ ජම්බුද්වීපය භූමි විස්තරය

ඇතුළත්

උපන්‍යාසය

# පිරිනැමීමයි

මේ 'ශාක්‍යමුනීන්ද්‍රාවදන' ග්‍රන්ථය
මට දම් සතර උගන්වාවදාළ
මූර්තිමත් ගුණකදම්බයක් වූ
විනයාචාර්ය ආභිධර්මික
**දෙණිහේනේ ශීලානන්දාභිධාන**
මගේ ආචාර්යපාදයන් වහන්සේ ගේ
**ශ්‍රී නාමයට**
ආදරභක්තියෙන් පිරිනැමෙන
**උපහාරයෙක් වේවා.**

බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය භික්ෂු

මෙම පොත (සංශෝධිත මුද්‍රණය 2000)
අතිගරු බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය
මහා නාහිමිපාණන් වහන්සේ
විසින් අපවත්වීමට ප්‍රථම සංස්කරණය
කරන ලදී.

ශාක්‍යමුනීන්ද්‍රාවදානය

හෙවත්

සිද්ධාර්ථගෞතම

# බුද්ධ චරිතය

අතිගරු බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය
මහා නාහිමි

# විෂය සූචිය


| විෂය | පිටුව |
|---|---|
| පෙරවදන | I |
| පුරාතන ජම්බුද්වීපය | II- VII |
| අංග- මගධ | VII - XI |
| කාශි - කෝශල | XI - XV |
| ශාක්‍යජනපදය, කපිලවාස්තු පුරය | XVI |
| ආළවි රට | XVI - XVII |
| වජ්ජි රට | XVIII |
| මල්ල ජනපදය | XIX |
| චේති රට | XIX |
| වත්ස රට | XIX |
| කුරු රට | XX |
| පංචාල දේශය | XXI |
| මත්ස්‍ය රට, සූරසේන රට | XXII |
| අස්සක රට | XXII |
| අවන්ති ජනපදය | XXII |
| ගන්ධාර දේශය | XXIII |
| කාම්බෝජ රට | XXIV |
| කුඩා රටවල් | XXIV, XXV |
| ගමන් මාර්ග | XXVI |

**1. පරිච්ඡේදය** **1-6**
ශාක්‍යවංශය - මහාසම්මත රජ

**2. පරිච්ඡේදය** **6-8**
ලුම්බිණි උයන, ශුද්ධෝදන කුමරු

**3. පරිච්ඡේදය** **8-10**
තුන් කෝලාහල, දේවායාචනය

**4. පරිච්ඡේදය** **11-14**
ඇසළ උළෙල, මායා දේවීන්ගේ හීනය, ලුම්බිනි ගමන, බෝසත් උපත, මාතංග පසේබුදුරජ , දේව සන්නිපාතය

**5. පරිච්ඡේදය** **14-16**
අසිතර්ෂීන් පැමිණීම, නාලක පැවිද්ද

**6. පරිච්ඡේදය** **16-21**
නාමකරන මංගලය, මායා දේවීන් කළුරිය කිරීම, කිරි මවුන් සෙවීම, වප් මඟුල, සිප්සතර ඉගැන්ම, ළමා විය, දේවදත් කුමරුගේ අරගල. හංස නඩුව, කුමාරවරුන් හා ගමන් අත්හැරීම

පිටුව

**7. පරිච්ඡේදය** **22-30**
ප්‍රාසාද තුන, ආවාහ මංගලය.

**8. පරිච්ඡේදය** **30-38**
උයන් කෙළි ගමන, මහල්ලකු දකීම, ලෙඩකු දකීම, මිණියක් දකීම, මහණ රුවක් දකීම, බෝසතාණන් පැවිදි වීමට පිය රජුගෙන් අවසර ගැනීම.

**9. පරිච්ඡේදය** **38-46**
මහාභිනිෂ්ක්‍රමණය, අනුපිය අඹවෙනෙහි සතියක්, ඇදුරන් සොයා යෑම, රජගහනුවර පිඬු සිඟීම, බිලිපූජා නැවැත්වීම.

**10. පරිච්ඡේදය** **46-48**
කිඹුල්වත් නුවර තොරතුරු, බෝසතුන් වෙතට දූතයන් යැවීම.

**11. පරිච්ඡේදය** **48-51**
කාලාමයන් වෙත යෑම, රාමපුත්‍රයා වෙතයෑම, පසවැගි තවුසන් බෝසතුන් ඇසුරට බැසීම.

**12. පරිච්ඡේදය** **51-55**
බෝසතාණන් භාවනා වැඩීම, අප්‍රාණකධ්‍යානය, පවත්ත ඵල භෝජී වීම, කෙලෙස් තවන ව්‍රතයක්, බෝසතුන්ගේ අල්පාහාරතාව, සිරුර කෙට්ටු වීම, මුසපත් ව වැටීම, යශෝධරාවන්ගේ ව්‍රත සමාදානය.

**13. පරිච්ඡේදය** **56-60**
මරහුගේ දයාවක්, දස මරසෙන්, සත්‍යානුසාරි විඥ්ඥාණය පහළ වීම, කය සැසැප්පීම, පස්වැගි තවුසන් බෝසතුන් ගෙන් වෙන්ව යෑම, බෝසතුන් විතර්ක විමැසීම.

**14. පරිච්ඡේදය** **60-63**
බෝසතුන් දුටු සීන පස, අජපල් නුගරුක කරා ගමන, සුජාතාවන් ගේ දානය, නේරංජරාතීරයට යෑම, භද්‍ර වනයෙහි දිවා විහාරය, බෝරුක කරා වැඩීම, අපරාජිත පයඞ්කයෙන් වැඩහිඳීම.

**15. පරිච්ඡේදය** **63-66**
මාරසංග්‍රාමය

**16. පරිච්ඡේදය** **66-71**
බෝසතාණන් සප්ත විශුද්ධි වැඩීම; බුදු වීම.

පිටුව


**17. පරිච්ඡේදය** 71-77

පළමු ප්‍රීතිවාක්‍යය, පළමු සතිය, යමා මහ පෙළහර, දෙවෙනි තෙවෙනි සිවුවන සති, පස්වන සතිය, බමුණකුගේ ප්‍රශ්නයක්, මරහුගේ දෝෂාරෝපණයක්, ගුරුවරයකු පත් කැරගැන්ම, සවැනි සතිය.

**18. පරිච්ඡේදය** 77-86

සක් දෙව්ඳුගේ පූජාවක්, තපුස්ස භල්ලික වෙළෙන්දෝ අට වන සතිය, බඹ යැදුම, ශ්‍රෝතෘන් සෙවීම, උරුවේලා යෙන් පිටත් වීම, උපකයා හමුවීම, ඉසිපතන් වැඩීම, ප්‍රථම ධම්දේශනා සමාගමය, ප්‍රථම දේශනාව, පළමු වස් විසුම.

**19. පරිච්ඡේදය** 87-91

සාතාගිර හා හේමවත. පළමු සෝවාන් උපාසිකාව, දෙවෙනි ධම්දේශනාව.

**20. පරිච්ඡේදය** 92-94

වප්ප තවුසා සෝවාන් වීම, අනාත්ත ලක්ඛණ දේශනාව, පස්වග මහණුන් රහත් වීම, නාලක තෙරුනට මෝනෙය්‍ය වත දෙසීම.

**21. පරිච්ඡේදය** 94-97

යස කුල පුත්‍රයා, තෙරුවන් සරණ ගිය පළමු උපාසකයා, සුජාතාදීන් තෙරුවන් සරණ යෑම, යසකුල පුතුගේ යහලුවෝ, රහතුන් එක් සැට නමක්.

**22. පරිච්ඡේදය** 97-99

ඒරක පත්‍ර නාගරාජ සමාගමය.

**23. පරිච්ඡේදය** 99-104

පළමු ධම්දූත පිරිස, භද්‍රවර්ගිකකුමරුවෝ, දෙවෙනි ධම්දූත පිරිස, ජටාධර තුන් තවුසන් බුදු සස්නැ පැවිදි වීම, ආදිත්ත පරියාය දේසනාව.

**24. පරිච්ඡේදය** 104-107

භාග්‍යවතුන් වහන්සේ ලක්දිව් වැඩීම, රජගහ නුවර වැඩීම, බිම්සර රජු හා පිරිස සෝවාන් වීම, බිම්සර රජුගේ ප්‍රාර්ථනා පස, රජ ගෙදර දානය, වේළුවන පූජාව, ප්‍රේතයනට පින් පෙත් දෙවීම.

පිටුව

**25. පරිච්ඡේදය** 108-113
සැරියුත් මුගලන් දෙනම සසුන් ගත වීම, බුදුරදුන් භග්ග රට වැඩීම, අගසවු තනතුරු දීම, මහාශ්‍රාවක සන්නිපාතය, පාමොක් දෙසීම, බුදුරදුන් භද්දිය පුර වැඩීම, විශාඛා සෝවාන් වීම, කේණිය සේල දෙදෙනාට දම් දෙසීම.

**26. පරිච්ඡේදය** 113-120
කාලුදායි ඇමතියා පැවිදි වීම, මහා කාශ්‍යපයන් වහන්සේ, මහා භික්ෂු පිරිසක්, කාලුදායි තෙරුන් ගේ මාර්ග වර්ණනාව, බුදු රදුන් කිඹුල් වතට වැඩීම, යමා මහ පෙළහර, මල්ල රජකුමරුන් පැවිදි වීම, වෙස්සන්තර ජාතක දේසනාව.

**27. පරිච්ඡේදය** 120-124
බුදුරදුන් කිඹුල් වතැ පිඩු සිඟීම, සුදොවුන් රජුට දම්දෙසීම, නාටිකාවන් ගේ වන්දනාව, යශෝධරාවන් දක්නට වැඩීම, යශෝධරාවන් ද පැවිදිවන්නට අදහස් කිරීම.

**28. පරිච්ඡේදය** 124-127
නන්ද කුමරු පැවිදි කිරීම, රාහුල කුමරු පැවිදි කිරීම, ධම්පාල ජාතක දේශනාව, යශෝධරාවන් සැනැසීම, බුදු රදුන් කිඹුල්වතින් පිටත් වීම, භද්දිය ආදීන් පැවිදි වීම.

**29. පරිච්ඡේදය** 128-133
දෙවෙනි තෙවෙනි වස්, බුදුරදුන් රජගහ පුර වැඩීම. විසල් පුර වැඩීම, යළි රජගහ පුර වැඩීම, සුමන මාලාකාර සමාගමය, පූර්ණයන් පැවිදිවීම, ජම්බුකාජීවක සමාගමය, අනේපිඩු සිටු බුදුරදුන් දක්නට යෑම, සැවැත් නුවර ආරාම පිළියෙල කිරීම.

**30. පරිච්ඡේදය** 133-138
බුදුරදුන් සැවැත් නුවර වැඩීම, ජේතවන පූජාව, අනේපිඩු සිටුතුමා, නන්ද භික්ෂු නම රහත් වීම, ආමගන්ධ සෘෂීන් සහිත පිරිස සස්නැ පැවිදි වීම, පූර්ණතෙරුන් ගේ පැමිණීම, මංගල සූත්‍රසමාගමය.

**31. පරිච්ඡේදය** 138-147
සිවුවන වස, පුක්කුසාති රජ පැවිදි වීම, තිස්ස රජු පැවිදි වීම, සැඩොලකු පැවිදි වීම, මහළු සැඩොලියකට දක්වූ කරුණාව, සෝපාක දරුවා, භාරද්වාජයන් පැවිදි වීම, මාතුපෝසක බමුණා, උග්ගසේන සමාගමය.

පිටුව

**32. පරිච්ඡේදය** 147-154

ශාක්‍යකෝලිය යුද්ධය සමාදාන කැරැවීම, පස්වන වස විසාලාපුරයෙහි, ශුද්ධෝදන රජු රහත් වැ පිරිනිවීම, යශෝධරා මහණ වන්නට තැත් කිරීම, ප්‍රජාවතී ගෞතමීන් පැවිදි වීම, මෙහෙණි සස්න ඇරැඹීම, බුදුරදුන් සැවැත් පුර වැඩීම, කොසොල් රජු පැහැදීම, බුදු රදුන් ලක්දිව් වැඩි දෙවෙනි ගමන

**33. පරිච්ඡේදය** 154-159

සවන සත්වන වස්, බුදුරජුන් රජගහ පුර වැඩීම, ඛේමා, විකුර්වණ ඍඬිප්‍රාතිහාර්‍ය්‍ය තහනම් කිරීම, යමාමහ පෙළහර, සත්වන වසැ තව්තිසාහි, මෛත්‍රෙය බෝසතුන් පැවිදිවීම.

**34. පරිච්ඡේදය** 159-166

අටවන වස භේසකලායෙහි, බෝධිරාජකුමාරයාට දම්දෙසීම, සැවැත් පුර වැඩීම, පුණණ කෙළෙඹි පැවිදි වීම, පුණණතෙරුන් සුණාපරන්තයට යෑම, සුප්පාරකයෙහි සස්න පිහිටීම, බුදුරදුන් සුණාපරන්තයට වැඩීම, සුණාපරන්ත වාණිජ සමාගමය, නර්මද නදීතීරයේ පා සටහන් තැබීම, සච්චබද්ධයට වැඩීම, බුදුරදුන්ගේ තුන්වැනි හෙළදිව් ගමන, සුමන දෙව් රජුගේ ආයාචනය.

**35. පරිච්ඡේදය** 166-174

බුදුරදුන් කොසඹෑපුර වැඩීම, මාගන්දිය බමුණා පැවිදි වීම, සාමාවතියගේ මරණය, නව වන වස, භද්‍රවතිකා ඇතින්න, සංඝ භේදය, බාලකලෝණකාරගමට වැඩීම, පාරිලෙය වනයේ වස් විසීම, ඇතකු ගේ උපස්ථානය, වඳුරකුගේ පූජාව, භික්ෂූන් බුදුරදුන් වෙත යෑම, බුදුරදුන් පාරිලෙය්‍ය වනයෙන් පිටත් වීම, සැවැත්පුර වැඩීම.

**36. පරිච්ඡේදය** 174-178

එකොළොස්වන වස ඒකනාලා ගමැ, සිවුරු කැපීමට නියමය, වේරංජා පුර වැඩීම, දොළොස්වන වස, කච්චායන බමුණා පැවිදිවීම, අවන්ති රට සස්න පිහිටුවීම, ඉසිදත්තයන් පැවිදි වීම, විසල් පුර වැඩීම, සුදින්න කුලපුතු පැවිදි වීම, බුදුරදුන් කිඹුල්වතට වැඩීම, තෙළෙස්වන වසැ චාලිකා පර්වතයෙහි.

**37. පරිච්ඡේදය** 179-184

තුදුස්වන වස සැවැත්පුර, රාහුලයන්ගේ උපසම්පදාව, පසළොස්වන වස කිඹුල්වත, ජේතවනයට වැඩීම, ශක්‍රප්‍රශ්න සමාගමය, ආළවක සමාගමය, සොළොස්වන වස අළවු පුරයෙහි, සතොළොස්වන වස රජහග පුරයෙහි, සිරිමා නගරසොභිනි සමාගමය.

පිටුව

**38. පරිච්ඡේදය** 184-190
අචොලෝ්ඛන වස, පේශකාර, දුහිතෘ සමාගමය, එකුන් විසිවන වස.

**39. පරිච්ඡේදය** 191-195
එක්විසිවන වස, ස්ථිර උපස්ථායකයකු පත් කිරීම, පූර්වාරාම පූජාව, මුහුදේත් සස්නේත් ආශ්වර්ය්‍ය ධර්ම.

**40. පරිච්ඡේදය** 195-205
ආනන්ද බෝධි රෝපණය, තුන් චෛත්‍යයෝ. ජීවකම්බවන පූජාව, අංගුලිමාල දමනය, සුන්දරීගේ දුෂ්ට ක්‍රියාව, සියලු තැනම තුෂ්ණීම්භූත නො වනු, අසදෘශ මහා දනය. දන විපාක, දන් පැවැත්වීම.

**41. පරිච්ඡේදය** 205-216
දෙව්දත් තෙරණුවෝ, දෙව්දතු බිම්සර මරවන්නට තැත් කිරීම, බිම්සර රජුගේ මරණය, බුදුරදුන් නසන්නට දෙව්දතුගේ උත්සාහය, බුදු රදුන් මත ගලක් පෙරලීම, ධනපාල සමාගමය, සංඝභේදය, දෙව්දතු භාග්‍යවතුන් වහන්සේ දක්නට යෑම, දෙව්දතු පොළොවැ ගිලීම, දෙව්දතුගේ අනාගතය, අජාසත් රජු පැහැදීම.

**42. පරිච්ඡේදය** 216-224
උපාලි දමනය

**43. පරිච්ඡේදය** 216-233
ඡත්තපාණි උපාසක තුමා, රජගෙයි බණ ඉගැන්වීම, කාල සිටුපුත්, සුන්දරික භාරද්වාජ දමනය, බුදුරදුන් හිස සිට වසා පොරවා ඉඳීම, කෙත නැසුණු බමුණා, රජ්ජුමාලා.

**44. පරිච්ඡේදය** 234-239
දරුවන් විසින් පිටමංකළ බමුණා, ගොවියකු මරණින් මුදාලීම, ද්‍රෝණ බමුණා පැහැදීම.

**45. පරිච්ඡේදය** 240-249
මිසදිටු ළමයින් පැහැදීම, ගැරඬියකු පෙළූ ළමයි. කුමර කසුබ මව, වාශිෂ්ඨී, පටාචාරා. පූර්ණා දසී, කිසා ගෝතමී, කුෂ්ඨ රෝගියකුට බුද්ධොපස්ථාන,

**46. පරිච්ඡේදය** 249-268
කෝලිය මහාමාත්‍ය සමාගමය, සුලසා නගර සෝභිනී, සාකේත බ්‍රාහ්මණ සමාගමය, ඡත්‍ර මාණවක සමාගමය, බකබ්‍රහ්ම සමාගමය, මණ්ඩූක දේවපුත්‍ර සමාගමය, ආනන්ද ශ්‍රෙෂ්ඨි සමාගමය, ගරහදින්න සමාගමය, මට්ටකුණ්ඩලී සමාගමය, සරභ පරිබ්‍රාජකාදි සමාගමය.

පිටුව

**47. පරිච්ඡේදය** **270-273**

කොසොල් රජුගේ මරණය, විඩූඩභ ශාක්‍ය යුද්ධය,

**48. පරිච්ඡේදය** **273-278**

අපරිහානීය ධර්ම, රජගහෙන් අම්බලට්ඨිකාවට, නාලන්දාවට වැඩීම, පාටලීපුත්‍ර නගරාරම්භය, ගෞතමද්වාරය, ගෞතම තීර්ථය, කෝටි ග්‍රාමයට වැඩීම, ඥාතික ගමට වැඩීම, විසල් පුර වැඩීම.

**49. පරිච්ඡේදය** **278-295**

පරිනිර්වාණ වර්ෂය, පාථික පුත්‍රයා, බේලුව ගමැ වස, බුදුරදුන් ගිලන් වීම, සක්දෙවිඳු ගේ උවටන, ගුරු මුෂ්ටි, ධර්මාරාම භික්ෂු, සැරියුත් පිරිනිවන, මුගලන් පිරිනිවන, රජගහ පුර වැඩීම, චාපාල චෛත්‍යස්ථානය, මාරායාචනය, ආනන්ද තෙරුන්ගේ ආයාචනය, කූටාගාර ශාලා ගමන, ප්‍රජාවතී සහෝදරා දෙනම පිරිනිවීම, භණ්ඩගමට වැඩීම, අම්බ ගාමාදිය පසු කිරීම, පාවානුවර වැඩීම, බුදු රදුන්ගේ රෝගය මතුවීම, පුක්කුස මල්ල පුතු පැහැදීම, කුකුත්ථා නදිය කරා වැඩීම, කුසිනාරා පුර වැඩීම, පිරි නිවන් ඇඳෙහි සැතැපීම, මහා සුදර්ශන සූත්‍ර දේශනාව, මල්ල රජුන් රැස්වීම, අන්තිම ශ්‍රාවකයා, ධර්මයෙහි ශාස්තෘ භාවය, භාග්‍යවතුන් වහන්සේගේ අන්තිම වචනය, මහා පරිනිර්වාණය.

**50. පරිච්ඡේදය** **296-310**

ප්‍රකීර්ණක කාණ්ඩය, බුද්ධ කෘත්‍ය පස, චාරිකා විභාගය, බුදුරදුන්ගේ දේශනා ක්‍රම, භාග්‍යවතුන් වහන්සේ වස් වුසූ තැන්, සූවිසි මහා සමාගම්, අසූ මහසව්වෝ, තනතුරු ලත් මෙහෙණිහු, තනතුරු ලත් උපාසකවරු, තනතුරු ලත් උපාසිකාවෝ, බුද්ධ චරිතයේ අග්‍ර දවස්, සස්නේ දීර්ඝායුෂ වැළඳුවෝ.

**51. පරිච්ඡේදය**

උපග්‍රන්ථය

පදෙපක්‍රමණිකාව 355

ගාථාදීන් පිළිබඳ උපක්‍රමණිකාව 369

# පෙරවදන

බොහෝ පෙර සිට මිනිසාගේ අදහස් උදහස් පැවැසුම් විසින් රැසැයුණු ග්‍රන්ථ බොහෝය. මුල දී කට පාඩමින් ද අකුරු ලිවීම දියුණු වූ පසු පොත් තනා ඒවායේ ලිවීමෙන් ද, මුද්‍රණ ශිල්පය වැඩුණු පසු මුද්‍රාපණයෙන් ද ග්‍රන්ථ පළ කැරිණ. ආගම ධර්ම, ඉතිහාස, දෝ සතර, වෙද සතර ආදී නානාවිධ විෂයයන් පිළිබඳ ග්‍රන්ථ දියුණු වූ හැම රටෙක ම සිය ගණනින් දහස් ගණනින් නැගී ආයේය. ඒ රටවලැ පොත්ගුල් පහළ විය. පොත් සිය ගණනින් දහස් ගණනින් ඒ පොත් ගුල් පිරිණ. නොයෙක් අංශයෙන් ලෝකාර්ථ චර්යායෙහි යෙදුණු වීරයන් ගේ චරිත කථා ඒ ගත් අතුරෙහි පාමොක් තැනැ වැජැඹිණ.

මේ චරිත කථා අතුරෙහි බුදුරජාණන් වහන්සේ ගේ ජීවිත කථාවට ලැබී ඇත්තේ උසස්ම තැනය. බෞඩයකුට බුඩචරිතය මහාර්හ වැ පැනෙනු අරුම නො වේ. තමන් ගත් දෘෂ්ටියෙහි දඩි ලෙස බැඳීම නිසා බුඩධර්මය නාස්තිකවාදයෙකැ යි දෙස් තැගුවෝ පවා බුදුරජුන් ගේ චරිතය ආදර්ශවත් ශ්‍රෙෂ්ඨ එකෙකැයි කීහ. බුදු රජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨත්වය ප්‍රතික්ෂිප්ත කළ නො හැකි බ්‍රහ්මලබ්ධිකයෝ උන් වහන්සේ දෙවියන්ගේ සතුරන් වූ අසුරයන් මුළා කරනු පිණිස, ලොවැ මිනිස් වැ පහළ වූ විෂ්ණු දෙවියෝ (විෂ්ණුහු ගේ නව වන අවතාරය) යැ යි කීහ. බුදු දහමේ ඇතැම් කරුණු නො පිළිගන්නා දැඩි කතෝලික භක්තිමතෙක් වූ **බර්තොලමී සේනේට් හිලෙයර්**[1] 'උන් වහන්සේ ගේ ජීවිතය නො කිලිටි ය. වීරත්වය පරාර්ථය පිණිස ආත්ම පරිත්‍යාගය (සිය සැප නොතකා හැරීම), මෛත්‍රිය, සද්ගුණ මාධුර්‍ය යන ගුණවලට ශ්‍රෙෂ්ඨ ආදර්ශය යැ' යි කී ය. එසේ ම අබෞද්ධ ආචාර්යවරයෙක් වූ **බාත්** මහතා[2] උන්වහන්සේ 'සංසුන් බව, දක්නවුන් තුළ ගෞරවාන්විත භක්තිය පහළ කරවන තේජස, හැම සතුන් කෙරෙහි පැතිරුවූ අපරිමිත දයාව සියලු දුඃඛිත සත්ත්වයන් කෙරෙහි පැ මහා කරුණාව, පරිපූර්ණ ආධ්‍යාත්මික නිදහස, අගතියෙන් තොර වූ සර්වසාධාරණත්වය යන ගුණයන් ගේ පූර්ණ මූර්තිය යැ' යි කී ය. සිය වස් ගණනකට පෙර පර්සියාවේ (ඉරාණයේ ) වුසු **අබුල් අත හියා** නමැති ඓස්ලාමික ගත් කරු[3] 'මිනිසුන් අතර පහළ වූ උත්තරීතම' තැනැත්තා දකිනු කැමැත්තහු නම්, භික්ෂක වේශයෙන් සැරි සැරූ රජාණන් දෙස බලන්න. ඒ මිනිසුන් අතර සිටි, පරම පවිත්‍ර උත්තමයාණෝ යැ' යි කී ය. ඔහුගේ මේ කියුම පිරික්සූ අවුස්ත්‍රියාවේ බුඩාපෙස්ට් නුවර මහාචාර්‍ය **ගෝල්ඩ්සිහර්**[4] පඬිතුමා 'අබුල්අතහියා මෙය කීයේ පාංශුකූල චීවරයක් පෙරෙවැ භික්ෂාටනයෙන්

---

1. "His life is without blemish, he is the finished model of heroism, self-renunciation, the love, Sweetness he commands." Bartholemy Saint Hilaire.

2. "The finished model of calm and sweet majesty, of infinite tenderness for all that breathe and compassion for all that Suffer, of perfect moral freedom and exemption from every prejudice" Barth.

3. "If you desire to see the most noble of mankind, look at the king in beggar's clothing, it is he whose Sanctity is great among men." Abul Atahiya.

දිවි පවත්වමින් ලෝ වැඩෙහි යෙදුණු බුදුරජාණන් වහන්සේ ගැන ම යැ' යි පැවැසීය.

උදාන පාළිය පළමුවෙන් ම ඉංගිලිසියට නගා පළ කළ ආචාර්ය ඩී. එම්. ස්ට්‍රෝං මහතා ඒ පොතට පෙර වදන ලියනුයේ, 'මේ පොත මා ඉංගිලිසියට නගා පළ කරනුයේ පාළිභාෂා විෂයයෙහි මගේ ප්‍රවීණත්වයක් පෙන්වීමට නො වැ ඉන්දියාවේ පැවිදි වෙසින් සැරි සැරූ ලොවැ දුක් ලෙඩින් පෙළෙන්නවුන් සුව පත් කිරීමට ඉදිරි පත් වූ චිකිත්සකයන් අතර අග්‍රතමයාණන් වූ දුකින් පිරුනු මේ භව නැමැති සිර ගෙයින් මිදී සදහාවී විශ්‍රාමය වූ විමුක්තියට(නිවනට) පැමිණෙනු පිණිස දෙවි මිනිස්නට මඟ පෙන්වීමට ලොවැ පහළ වූ ඒ භාග්‍ය වත් අර්හත් සම්‍යක් සම්බුඩ මහෝත්තම ගෞතමයන් වහන්සේ සිහි කොට කැරෙන ආදර භක්තිමය පූජාවක් වශයෙනි' යි සඳහන් කෙළේ ය.

මේ ටික පැවැසුයේ අබෞඩ උගතුන් පවා බුදුරජාණන් වහන්සේ ගේ චරිතයේ ජ්‍යේෂ්ඨත්වය පිළිගෙන තිබෙන සැටි දක්වීමට ය. අනෙකකු ගේ 'රේකමනක්,' අවශ්‍ය නැත. එලැඹැ සිටි සිහි ඇති ව මුල සිට අගට ම බුඩ චරිත කථාව කියන කියවන කාට වුව ද එය ආදි කල්‍යාණ මධ්‍යකල්‍යාණ පර්යවසාන කල්‍යාණ-හෙවත් සියලු ලෙසින් ම කලණ ගුණයෙන් පිරිපුන් එකෙකැ යි වැටහෙනු ඇත. ශීලයෙන් හෝ සමාධියෙන් හෝ ප්‍රඥයෙන් හෝ බුදුරජුනට වැඩි තරම් කෙනෙක් පෙරත් නො වූහ. මතුත් නො වෙති, දැනුත් නැත. උන් වහන්සේ සකල සද්ගුණ නිධානහ, අසම හ, අසම සම හ.

අසහාය ජගදචාර්ය වූ අතුල්‍ය පරාර්ථචාරී වූ සකල සද්ගුණ සමුදයයේ පරම මූර්තිය වූ සිඬාර්ථ ගෞතම තථාගතයන් වහන්සේ ගේ චරිත කථාව ලිවීමේදීත් එය පුන පුනා කියැවීමේදීත් මේ ග්‍රන්ථයෙහි කර්තෘහට ඇති වන ප්‍රීතිය හා චිත්ත ශාන්තිය අන් මොන ම කෙනකු ගේ චරිතයක් කියැවීමේදී නො ම ලැබේ. සෙස්සනට ද එසේ මැයැ යි අනුමානයෙන් සිතම්හ.

බුඩ චරිතය විදහා නොයෙක් භාෂාවලින් රැසැයුණු පොත් අද පළ වැ ඇත. හෙළ බසිනුදු බොහෝ පෙර සිට ම ගද්‍ය පද්‍ය දෙකින් ම රචිත වූ බොහෝ ග්‍රන්ථ ඇත. අපට ද බුඩචරිත ග්‍රන්ථයක් ලියනුවට කොළොඹ තරුණ බෞඩ සමිතියෙන් අයැදුමෙක් ලැබිණ. ඒ ව්‍යවහාර වෂියෙන් 1928 වන්නෙහි අප කොළොඹැ අනඳ

---

4. Professor Goldzihar of Budapest.
4. I publish this translation not with any pretension to proficiency in Pali but as a tribute of love to the memory of the noble Gotama, who ........................................ stands forth as the most prominent of the world's physicians, that traversed India in monastic garb the exalted, the holy, the highly illuminated One who came into the world to show to gods and men the way out of the sorrowful prisonhouse of being into the freedom of everlasting Rest, D.M. Strong (preface to the translation of Udana),

මහ විදුහලැ රැඳී වෙසෙමින් එහි බුදු දහමත් පාලි සංස්කෘත භාෂාත් උගන්වන සමයෙහි යැ. එය ලියා දුනුමු. 'ශාක්‍ය සිංහාවදන' නමින් එය පළ කැරිණ. පළමු වර පොතට වඩා කරුණු එකතු කොට දෙවෙනි වර මුද්‍රණයට පොත සකසා දුනුමු. මේ අතර පණ්ඩිත වැලිවිටියේ සෝරත නායක ස්ථවිරයන් වහන්සේ බොහෝ පොත් බලා එකතු කොට සූවිසි මහා සමාගම් නම් වැල වෙසක් කලාපයෙක පළ කැරැවූහ. උන් වහන්සේ ගෙන් ලැබුණු අවසරය පරිදි එය ද අප පොතට එකතු කළෙමු. පොත වාර ගණනක් ම මුද්‍රිත විය. එහෙත් මෙයින් හවුරුදු කිහිපයකට පෙරැ දහම් පාසල් පාඩම් මාලාව අන් සැටියෙකින් සකස් විය. 'ශාක්‍යසිංහාවදනය' අනවශ්‍ය විය. එහි මුද්‍රණය නැවැතිණ. පොත අභාවයට ගියේ ය. එසේ වුව ද බොහෝ දෙනා එය යළි දු මහජනයා අතට පමුණුවන්නැයි නොයෙක් වර අප අයැදූහ. කොළොඹැ මරදනේ මාලිගාකන්ද මාවතේ සමයවර්ධන මුද්‍රණාලයාධිපති **ආරියදස වීරමන්** මහතා ද බුධ චරිතයක් ලියා දෙන ලෙස අයැදීය. පළමු අප සැකැසූ බුධචරිතය පදනම් කොට ගෙන අළුතෙන් තවත් බොහෝ කරුණු එකතු කොට මේ 'ශාක්‍යමුනින්ද්‍රාවදනය' පිළියෙල කළමු. පොත මුද්‍රිත වූ පසු මෙහි සමහර තැනෙක භාෂාව ගැඹුරු යැ යි අපට හැඟිණ. මෙහි දෙවෙනි සංස්කරණය බොහෝ ලිහිල් බසින් පළ වනු ඇත.

මේ පොතේ බෝධිසත්ත්ව චරිත කොටස කියවන සමහර කෙනකුට මෙය වෛතුල්‍ය මත ඇතුළත් එකෙයැයි හැඟෙන්නට ද පිළිවන. එබැවින් එය ගැන ද යමක් කියැ යුතුය.

මෙහි ඇතුළත් මහාසම්මත රාජ පරම්පරාවද ශාක්‍යවංශයේ ප්‍රභවය ද තරමක් දුරට පාළි පොත්හි දක්වෙත්. ස්ථවිරවාද ශාඛාවක් වූ සර්වාස්තිවාදයට අයත් පොත්වලද මහාසාංඝිකයන් ගෙන් ප්‍රභූත වූ මහායානයට අයත් පොත් වලද ඒවා වඩාත් විස්තර කොට දක්වෙත්. මෙහි දක්වෙන විස්තරය ඒවායිනුත් කරුණු ගෙන සැකැසුමු.

සුදොවුන් කුමරු පසල් දනව්වක් සංසිඳුවූ පුවත කිසි දු පාළි පොතෙකැ නැත. එය ටිබෙට් චීන පොත්වල ඉංගිලිසි පරිවර්තන ද මහාවස්තු ආදී සංස්කෘත බණ පොත් ද ඇසුරින් සැකැසුමු. මහාමායා කුමරියත් පජාපතී කුමරියත් යන දෙදෙනාම සුදොවුන් කුමරු ආවාහ කොට ගත්තේ කවර හෙයින්ද? කෙසේ ද? යනු කිසිම පාළි පොතෙක දක්වී නැත. සර්වාස්තිවාදී ආදීන් ගේ පොත්වලැ ආ ඒවා පිළිබඳ විස්තර කථාව ඒ පොත්වලින් ම ගෙන මෙහි බහා ලූමු.

සිද්ධාර්ථ කුමාරයන් වහන්සේ ගේ කුඩා වියේ තොරතුරු විස්තරයෙන් දක්වෙන්නේ සර්වාස්තිවාදීන් ගේ ද මහායානීන් ගේ ද පොත්වල යැ. යශෝධරාවන් සිද්ධාර්ථ කුමාරයන් වහන්සේට ආවාහ කොට දීමේ පුවත පාළි පොත්හි එනුයේ සැකෙවිනි. අන්‍ය නිකායවල පොත්හි එය බොහෝ විස්තරයෙන් දක්වේ. මෙ අත්බව්හි ම රහත්බව ලබනු සඳහා විවසුන් වැඩූ, සස්නේ ආදිම යුගයේ සිටි ථෙරවාදීන් ඒ පුවත් දන ඉගැන්මෙන් තමන් පිළිවෙතට වන වැඩක් නැතැ යි දක

ඒවා මුව පරපුරින් නොගෙනාවා විනා, ග්‍රන්ථාරූඪ නො කළා විනා ඒ පුවත්වල සත්‍යතාව නොපිළිගන්නා නො වේ. එහෙත් ඒ පුවත්වල ඓතිහාසික අගය සැලැකූ අන්‍ය බෞද්ධ නිකායිකයෝ ඒවා රැකගත්හ, ග්‍රන්ථාරූඪ ද කළහ. ලුම්බිණි උයන ඇති වූ සැටි ද දක්වෙනුයේ ඒ පොත්හි මය. යශෝධරාවන් ආවාහ කැරැ ගත් පසු ගිහි ගෙන් නික්මෙන අවස්ථාව තෙක් ඒ දෙදෙනා වහන්සේ ගේ ජීවිත ප්‍රවෘත්තිය පිළිබඳ කිසිවකුත් පාළි අටුවාහි නො දක්වේ. කම්සැපෙහි ම ගිලී, වට පිටාව ගැන කිසිත් නොදනෙන ලෙසට කැරැවුණු ආවරණ මැද 'නිවාස හිර බාරයේ' කල් ගෙවූවකුගේ සැටියක් ජාතක අටුවා ආදියෙන් දක්වේ. එහෙත් ත්‍රිපිටක පාලියේ සමහර සූත්‍රවල, කොතරම් සැප පහසු කම් මැද වූසුවත් බෝසතාණන් වහන්සේ එලැඹැ සිටි සිහියෙන් කල් යැවූ බව සඳහන් වේ. මහායානිකයන් ගේත් සර්වාස්තිවාදී ආදීන් ගේත් පොත්වල ද නාඩි ග්‍රන්ථාගත බුඩ චරිතවල ද එන පුවත් එයට අනුකූල වේ.

සිඬාර්ථ රාජයාණන් වහන්සේ පමණක් නොව යශෝධරා දේවින් වහන්සේත් ගිහි ගෙහි ඇලුම් නැති ව වූසූහ. ඕ බෝසතාණන් කැටුව ම ගිහි ගෙන් නික්මෙන්නට සිතා සිටි, පෙරැ සසරැදි සේ ම මේ අත්බවිහි ද, බෝසතාණන් ගිහි ගෙන් නික්මැ තවුස්දම් පුරා බුදු වන තුරු ඔබට උවටන් කරමින් ඔබ රැක බලාගන්නට පත පතා සිටි, බෝසතාණන් වහන්සේට මවක සේ ද ඉතා ළැදි සොහොයුරියක සේ ද, කීකරු සේවිකාවක සේ ද, උන්වහන්සේ කෙරෙහි අපරිමිත ස්නේහයෙන් යුතු ව සිටි මහාමායා දේවින් වහන්සේත් ප්‍රජාවතී ගෞතමීන් වහන්සේත් යන දෙදෙනා පමණටම සද්ගුණ සමුදයෙන් පරිපූර්ණ වූ, මෙ කපැ පෙරැ ද පහළ නොවූ මතු ද පහළ නො වන අසම රූපසම්පත්තියෙන් සේ ම ගුණසම්පත්තියෙන් ද දෙව්මිනිස් දෙලොව්හි ම සියලු ස්ත්‍රීන් අබිබවා සිටි ආශ්චර්‍ය්‍ය ස්ත්‍රී රත්නයෙකැ යි ඒ අන්‍ය නිකායිකයන්ගේ පොත් වලැ එන පුවත්වලින් ද දක්වේ.

'බෝසතාණන් වහන්සේ අනුව ඕ ද ජරා ව්‍යාධි මරණාදී දුක් ගැන සිතමින් සාකච්ඡා කරමින් කල් ගත කළා ය'. යන්න වියැ යුතු වියැ හැකි සැටිය මය.

බෝසතාණන් වහන්සේ කාට වත් නො දන්වා ගිහි ගෙන් නික්මගිය පමණෙක් පාලි පොත් හි දක්වේ. ඒ, සිදු වූ දය (විස්තර මනා කොට) සැකෙවින් කී අයුරු ය. එහි විස්තර කථාව ලලිත විස්තරාදී බොහෝ පැරැණි සකු බණ පොත්හි සඳහන් වේ. මේ පොතට ඒ පොත්වලින් ගෙන ඒ විස්තරය ඇතුළත් කළම්හ.

පාලි පොත්හි දක්වෙන සංක්ෂිප්ත සඳහනින් බෝසතාණන් වහන්සේ ගිහිගෙන් නික්මෙන මෙහොතෙහි කාටත් නොදන්වූ බව මිස, එයට කලින් එය ගැන මාපිය ආදී කිසිම කෙනෙකු සමග කථාමාත්‍රයකුත් නො කළහ යි සිතිය නොහැක්ක. ජරාරූපාදිය දක්නා වේලෙහි බෝසතාණන් වහන්සේ ළඟ 'සිටි ඡන්නයා ගෙන් ඒ තොරතුරු සෙස්සනට හෙළි නොවිණි ද? ඡන්නයා ගෙන් ඒ තොරතුරු දැනගත් සුදෙවුන් මහරජාණන් ඒ ගැන කළ යුතු ද පිළිබඳ වැ 'රජගෙදර අය හා මැති

ඇමැතියන් හා කතා බස් කළ බව රකවල් තරකිරීමේ යෙදුණු බව (පාලි පොත්හි ද එන) පුවතින් හෙළි පෙහෙළි වේ. එය දනගත් ප්‍රජාවතී ගෞතමීන් වහන්සේ යශෝධරා දේවීන් වහන්සේ නන්ද කුමාරිකාවන් බෝසතාණන් වහන්සේගේ හිතමිත්‍ර කාලුදයි ආදීන් හෝ සෙසු නෑද කෙනකු එය ගැන උන්වහන්සේ හා වචන මාත්‍රයකුත් කතා නොකළෝද? එසේ කතා කරන්නට බිය ඇත්තන් කරන තරම් රළු පරොස් හැඩිදැඩි බවෙක් ගොර හැඩි බවෙක් උන්වහන්සේ තුළ වූයේ යැ යි සිතියැ හැකිද? උන් වහන්සේ තේජස්වී වුවත් දුරාසද වුවත් මහාකාරුණික මෘදුගුණ සම්පන්න කෙනකු බව ඒ හැම දෙනා ම අතර ප්‍රකට බැවින් ඔවුන් උන්වහන්සේට සුදුසු ගෞරව දක්වා ඒවා ගැන කරුණු කීවා යන්න වියැ හැකි මය. උන් වහන්සේ ද ඒ කවුරුන් සමගත් කාමාදීනව ලොවැ ජරාමරණාදිය අනිවාර්‍ය බව පිළිබඳ ව නොයෙක් විට කරුණු වදළා ද විය හැක්කකි. 'තමන් වහන්සේ තුළ පහළ වූ හැඟීම් ගැන කිසිම කෙනකු හා කිසිත් නොකියා ගොළුවන රකිමින් හෝ තුන් ප්‍රාසාදයන්හි පැවැති නෘත්‍යගීතාදිය අතට ම යොමු කළ ඉඳුරන් ඇති වැ මුළාවෙනුත් මුළාවට වැටෙමින් කම් සැපෙහි ම ගිලී අටවිසි වන හවුරුද්ද තෙක් අඳුරෙහි ම, ක්‍රීඩෝත්සව පිරුණු හිරගෙයෙක කල් ගෙවා, අන්තිමේදී දෙවියන් විසින් දක්වූ පෙරනිමිති දැක කලබොල වැ කාටවත් නො දන්වා පලාගිය හා යන්න සාරාසෙකි කප් සිය දහසක් පැරුම් පිරූ නුවණ වැඩූ මහා වීරපුරුෂයකු ගත් ක්‍රියා මාර්ගයෙකැ යි කෙසේ පිළිගත හැකි ද? අටුවායෙහි සංක්‍ෂිප්ත කොට සඳහන් කළ ද එහි විස්තරය හොඳන්නාහු වරදවා සිතා ගෙන බෝසතුන් කාටවත් නොදන්වා එද ම උපන් දරුවා සහිත බිරිය ද අසරණ කොට නොතකා රහසින් පලාගිය කෙනෙකු කොට දක්වූහ. එහෙත් එහි යථාතත්ත්වය මෙහි හෙළි කොට දක්වූමු.

'සිද්ධාර්ථයන් වහන්සේ නුවුස් පැවිද්දෙන් පැවිදි වූයේ බඹහු දුන් අට පිරිකර පිළිගෙන යැ' යි පාලි අටුවාහි ඇත. ඡන්නයා ඉදිරියේදී මෙය සිදු වී නම් ඔහු ආපසු ගොස් සුදෙවුන් රජු ආදීනට එය කියනු ඇත. බඹහු අහසින් බැස එය පිළිගැන්වූහු නම් මේ ආශ්චර්ය සිඩිය ඔහු පවසනු ම ඇත. බඹහු ඡන්නයාට නොපෙනී බෝසතාණන් වහන්සේට පමණක් පෙනෙමින් අට පිරිකර පිළිගැන්වූහු නම් ඒ මෙහොතේ 'ඉබේ ම පහළ වූ අට පිරිකර' ගැන ද ඔහු රජ ගෙදර දී කියනු වියැ හැකි ම ය. එය ද පුදුම සිඩියක් බැවිනි. බඹුන් අවුත් ඒවා පිළිගැන්නුවේ බඹ වෙසින් ද මිනිස් වෙසින් ද කෙසේ ද යනු පාලි අටුවාවේ විස්තර වැ නැත. බඹුන් අටපිරිකරින් පිදූ බව පමණෙක් පාලිපොත්හි කොටීන් දක්වේ. සර්වාස්තිවාදීන් ගේත් මහායානීන්ගේත් පොත්හි එය විස්තරයෙන් දක්වේ. ඔවුන් කියන පරිදි වැදිවෙසින් ආයේ බඹුහු යැ නැත හොත් බ්‍රහ්මාවේශයෙන් ආ කෙනෙකි.

'මා හැදූ වැඩූ නොපමණ වියදම් කොට මට සුව පහසු සැලැස්සූ ආදරණීය පියාණනට නොදන්වා අවසර නො ගෙන ගිහිගෙන් නික්මිය යුතු නො වේ, යැ' යි. 'කෙසේ හෝ පියා ගෙන් අවසර ගෙන ම ගිහි ගෙන් නික්මෙමි' යි බෝසතාණන් වහන්සේ සිතූ නියාව ලලිත විස්තරාදියේ දක්වේ. මෙයින් බෝසතුන් වහන්සේ දක්වූ ආදර්ශය, උන්වහන්සේ ගේ විශාරදත්වය කොතරම් ශ්‍රෙෂ්ඨ ද? කාටත් නො කියා

පලායෑමේ කතාවට වඩා මෙය කොතරම් අගෙනේද?

බෝසතාණන් වහන්සේ රාත්‍රියේ පිය රජු දක්නට ගිය වේලේ උන්වහන්සේ ගේ ශරීරයෙන් බඹයක් තරම් දුර පැතුරුණු එළිය ගැන ලලිත විස්තරයේ දක්වා ඇති ලෙසට ම මෙහි ද සඳහන් කළම්හ. මෙයත් විය හැක්කක් දැයි කෙනකුට සිතෙන්නට පිළිවන. මිනිසුන්ගේ ශරීරවලින් පමණක් නොව ගස් වලින්ද රශ්මියක් විහිදෙන බව අද විද්‍යාඥයන් සොයා දැන ගෙන තිබේ. ඒ ඒ තැනැත්තාගේ ශරීර තත්ත්වය අනුව ඒ රශ්මිය අඩු වැඩි වේ. මෙයින් අවුරුදු සියයකට පමණ පෙර තම සිරුරෙන් විදුලිය එළි වැනි රශ්මියක් විහිදුවන කෙනකු රශියාවේ සිටි බව කලකට පෙර පළ වූ ඥනාදර්ශ සඟරා වේ පළ වී තුබුණේය. බුදුවන මහෝත්තමයා ගේ සිරුරෙන් බඹයක් පමණ එළියක් විහිදුණ බවත් එය පැහැදිලි වනුයේ උන් වහන්සේ අඳුරු තැනක සිටින විට බවත් හැඟේ. මෙය බ්‍යාම ප්‍රභාමණ්ඩල යැයි ථෙරවාදීන් ගේ පොත්වල ද දක්වේ.

බෝසතාණන් වහන්සේට ගිහි ගෙන් නික්ම යන්නට අවසරය දී යලිත් ඒ ගමන නවත්තන්නට සුදෙවුන් රජු මුර කළ බව සුදුසු ද? යන ප්‍රශ්නයද නැංවිය හැක්ක. සුදෙවුන් රජු ඒ අවසරය දුන්නේ කැමැත්තෙකින් සතුටෙකින් නො වේ. තව ස්වල්ප කලකට වත් ගමන පමා කළොත් යෙහෙකැ යි යනු රජුගේ අදහස විය. කවද නුමුත් ගිහි ගෙන් නික්මෙන බව නියතයෙන් ම දැනගත්තත් ගමන තව ටිකක් පරක්කු කළ හැකි වුවොත් මැනැව යනු රජුගේත් අනිත් නෑ පිරිසගේත් අදහස විය. මුර කළේ එහෙයිනි. පුත්‍රප්‍රේමයේ බලවත් බව නිසා ය.

'මා ගිහි ගෙන් නික්මැ යන ගමනේ දී කොතරම් දුර බැහැර යන්නට වේ ද, කොතරම් කරදර වලට මුහුණ පාන්නට වේ ද යි කිය නො හැක්ක. අත දරුවකු ඇති වැ නුඹ මේ ගමනට එක් වීම නුඹටත් දරුවාටත් දුක් හිරි හැර ඇති කැරැ ගැන්මෙකි. නිරර්ථක ක්‍රියාවෙකි, බුඩත්වය සඳහා නොපමණ වෙහෙස වින්ද යුතු යැ. එබැවින් ඔබ මේ ගමනට එක්වීම මා ගන්නා ක්‍රියාමාර්ගයට බාධකයෙක් වෙයි. එයින් දරුවාට වත් ඔබට වත් මට වත් වන වැඩෙක් නැත. ඒ බැවින් මා ගොස් ගුණදහම් වඩා බුදු වැ අවුත් ඔබට ත් මපියාණනටත් කුඩා මෑණියන් ආදී සෙස්සනටත් මා අවබොධ කළ ධර්මය අවබෝධකර වන්නෙමි, මා ලබන විමුක්තිය ඔබ ඇතුළු හැම දෙනාට බෙද දෙන්නෙමි, එ බැවින් ඔබ නවතින්න, දරුවා රැක බලා ගන්න, ඔබට මෙහි සියලු සැප පහසු කම් තිබේ. පියාණෝ ද කුඩා මෑණියෝ ද සෙසු නෑයෝ ද ඔබේ ආරක්ෂාවට සිටිති. මා එන තෙක් බලාපොරොත්තු වී සැනැසී ඉන්නැ'යි යශෝධරා දේවීන් වහන්සේට බෝසතාණන් වහන්සේ අවවාද කොට සනසා ඇගෙනුත් මහබිනික්මනට අවසර ගත් පුවත කොතරම් අගී ද! ස්වාභාවිකද! මෙය මහායානයේ හෝ සර්වාස්තිවාදයේ හෝ වෛතුල්‍යවාදීන් ගේ හෝ කවර කෙනකුගේ පොතෙක තිබුණත් 'යශෝධරාවනට තමා කිසිසේත් නොදන්වා දරුවා සහිත ඇය හැරදමා රහසින් පලා ගියේය' යන්නට වඩා පිළිගත හැකි ස්වභාව සිඩියෙකි. කලින් ඒ කාටත් දන්වා අවසර ගෙන තිබුණු බැවින් ගමන නොදන්නුවේ පිටත් වන මොහොතේ ය. හැම දෙනා ම තමන් වටා රැස් වැ

හඬන්නට වැලැපෙන්නට වුවොත් එය ගමනට බාධක වන බැවිනි. බෝසතාණන් වහන්සේ පිටත් ව ගිය බව දනගත් පසු ප්‍රිය විප්‍රයෝග දුකින් කවුරුනුත් හැඬුව ද, වැලැපුණ ද, 'උන් වහන්සේ බුදු වී තමන් වෙත එතැ' යි යන තහවුරු වූ විශ්වාසය නිසා ඔහු හැම දෙනාම සැනසුණහ, සාපේක්‍ෂක වූහ. ස්වල්ප දේපල ඇති දුප්පත් දරුපවුලකට 'මතු සැපසේ ඉන්නට හැකි වනු පිණිස ටිකකලෙකින් මහාධනස්කන්ධයක් සපයා ගෙන එමැ' යි කියා ධන සැපයීමට ඈත රටකට යන ගෙහිමියා ගේ වෙන් වැ යෑමේ දුක වැන්නෙකි කිඹුල්වත්පුර රජගෙහි ඇති වූයේ. එහෙත් ඒ ගමන ඔවුන් ගේත් සෙස්සන් ගේත් යහපත පිණිස ම යැ යි ඔවුහු දත්හ. එයින් සැනසුණහ, කලින් ම මෙය සලකා බැලූ බෝසතාණන් වහන්සේ අභිනික්මන් මොහොතේ කාටත් නොදන් වූහ.

මේ පොතෙහි බෝධිසත්ත්ව චරිතයේ දක්වෙන, සර්වාස්තිවාදී ආදීන්ගේ පොත්වල එන විස්තර අප ලබා ගත්තේ ලලිත විස්තර මහාවස්තු ආදී සංස්කෘත පොත්වලිනුත්, ටිබෙට් පොත්වලත් චීන පොත්වලත් ඉංග්ලිසි පරිවර්තනවලිනුත් ය. ඒ ටිබෙට් චීන පොත් යනු බුදු දහම ඉන්දියාවෙන් අතුරු දහන් වන්නට බොහෝ කලින් එහි සංස්කෘත මාගධී ආදී භාෂාවලින් තිබුණු බණපොත් ය. ඒවා මහාරාශියක් ටිබෙට්රටට ද චීනයට ද ගෙන ගොස් ඒ භාෂාවලට නගා තුබුණේ ය. එයින් සමහරෙක් ඉංග්ලිසියට නගන ලදු ව පළ වුණහ. මේ බුද්ධ චරිතය සැකැසීමේදී ඒ බොහෝ පොත්වල එන බෝසත් සිරිතේ ඇතැම් කොටස් සස දා බලා මෙහි ඇතුළත් කළම්හ.

මෙතෙකින් පෙර වදන අවසන් කරම්හ.

මේ අවස්ථායෙහි, අප පැවිදි කොට සිංහල පාලි සංස්කෘත භාෂාත් ධර්ම විනයයත් උගන්වා වදළ, අපට ඉංග්ලිසි භාෂා විෂයයෙහි දනීම දියුණු කැරැ ගන්නැයි එයට දිරි දුන්, බළන්ගොඩැ බුලත්ගමැ (උඩුමුල්ලේ) ශ්‍රී නන්දාරාමාධිපතිවැ වැඩ වුසූ විනයාචාර්ය ආභිධර්මික දෙණිහේනේ ශ්‍රී ශීලානන්දාභිධාන අස්මදචාර්ය පාදයන් වහන්සේ ද, අපගේ අභිවෘද්ධියට හැම ලෙසින් ම රුකුල් දුන් මහවළ තැන්නේ චන්ද්‍රශේඛර මන්ත්‍රීන්ද්‍රාරාමාධිපති වැ වැඩ වුසූ දමහන ධර්මානන්දාභිධාන අස්මත් ප්‍රාචාර්ය මහානායක ස්වාමීන්ද්‍ර පාදයන් වහන්සේ ද මේ ගත රැසැයීමේ පින් අනුමෝදන් කරමින් සිහි කරම්හ. ඒ දෙදෙනා වහන්සේට ද, අප මාපියනටද අප දියුණුවට අතිශයයෙන් උපස්තම්භක වූ ඇස්. ඩී. මහවළතැන්නේ රටේ මැතිතුමාට ද බාන්ස් රත්වත්තේ රටේ තුමාට ද සගමොක් සුව පිණිස මෙය ලියූ පින ද ප්‍රත්‍යය වේ වායි ද පතම් හ.

මෙයට

**බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය ස්ථවිර**

1985 ඔක්:

අමරාවතී විහාරය, ග්‍රේට් ගැඩස්ඩන් , එංගලන්තය

## ශාක්‍යමුනීන්ද්‍රාවදානය

හෙවත්

## සිද්ධාර්ථගෞතම

# බුද්ධ චරිතය

**නමො භගවතො විසුද්ධචරිතස්ස**

**සම්පූරිතාපමිත පාරමිතාපගාය**
**නිද්ධුය යො' ඛිල කිලෙසමලප්පබන්ධං**
**නිස්සේසඤෙය්‍යවිදූතාභරණො රරාජ**
**සො චිත්තගන්ධකුටියං ලසතං ජිනො මෙ**

## පුරාතන ජම්බුද්වීපය

හිමාලය පර්වතයෙහි පිහිටි ජම්බු වෘක්ෂ නමින් ප්‍රකට කඳුවැටියෙන් ලක්ෂිත වූ ද්වීපය ජම්බුද්වීප නම් වේ. මෙය දන් ඉන්දියා නමින් ව්‍යවහාර වූ දේශයයි. ඉන් බාහිර රටවල් බුද්ධාදී උතුමන්ගේ ජන්ම භූමි නොවූ හෙයින් සුලු කොටැ සැලකීමෙන් දෝ ජම්බුද්වීපයේ පිරිවර වූ කොදිව් යැයි කියන ලදහ.

**දඹදිව බෙදීම** දඹදිව එනාහි මහාමණ්ඩල, මධ්‍යමණ්ඩල, අන්තර් මණ්ඩල යැයි විශාල කොටස් තුනකට බෙද තිබුණ බව අටුවාවලින් පෙනේ. එයින් මහා මණ්ඩලය යොදුන් නව සියෙකි. මධ්‍ය මණ්ඩලය යොදුන් නවසියෙකි. අන්තො මණ්ඩලය යොදුන් තුන් සීයෙකි.

මෙහි මහා මණ්ඩල නමින් දැක්වුණේ මධ්‍යම දේශයැ යි හැගේ. මධ්‍යම ජනපදයෙහි ප්‍රමාණය වටින් යොදුන් 900 කැයි පෙනෙන බැවිනි.

මධ්‍යම ජනපදයේ සීමා නම්: නැගෙනහිරින් කජංගලා නිගමය, ගිනිකොනින් සලලවතී ගඟය, බටහිරින් ථූනා නම් බමුණුගමය, උතුරින් උශීරධ්වජ පර්වතය යන මොහුය. මෙ කී සීමාවලට මැදි වූ

මධ්‍ය දේශය මිහිඟු බෙරයකට බඳු හැඩහුරුකම් ඇත්තේ ය. බුඩාදීන් පහළ වන ශ්‍රේෂ්ඨ භූමිය වේ.

තවද කොදෙව් සහිත වූ සියලු මැ ජම්බුද්වීපයට මධ්‍ය දේශයැ යි ද, අපරගෝයාන, පූර්ව විදේහ, උත්තරකුරු යන ඉතිරි මහාද්වීප තුනට ප්‍රත්‍යන්ත දේශ යැ යි ද ව්‍යවහාරයෙකුත් වීය. ගෝයාන යනු තවලම් මහයි. එයින් බටහිර වූයේ අපර ගෝයානය යි. විදේහ යනු ඉන්දියාවේ නැගෙනහිර මායිමේ වූ පෙදෙසෙකි. එයින්ද නැගෙනහිර වූයේ පූර්වවිදේහය යි. කුරුරටට උතුරින් වූයේ උත්තරකුරුව යැ, උත්තරකුරු නමින් රටවල් දෙකක් තුබුණු බව පෙනේ. එකක් හිමාලයයට උතුරෙන් වූ ටිබෙට් රටට උතුරු දිගැ සතර පැත්තෙන් ම කඳුවලට මැදි වූ ගුප්ත ප්‍රදේශයෙකි. එහි වසන යෝගීන් ගේ කැමැත්ත නැතිව කිසිවකුට එහි යෑ නොහැක්ක. අනිත් උත්තරකුරුව උතුරු ඇමෙරිකාවට අයත් පෙදෙසෙකි. කොරියාව පුරාතනයේ කුරුවීප නම් විය. එයට උතුරු අතට පිහිටියේ උත්තර කුරුව යි. මෙය ඔට්ටර කොරා යනුවෙන් මෙගස්තීනස් නම් ග්‍රීක් ඉතිහාසඥයා සඳහන් කරයි.

මේ උඩ දැක්වුණු මහාද්වීප බෙදීම මෙයින් වර්ෂ 50000 කටත් පෙර පොළොවේ පිහිටීම අනුව ව්‍යවහාරයට ආවකි.

**සොළොස් මහා ජනපද**

බුඩ කාලයෙහි දියුණු වැ පැවැති දඹදිව මහා ජනපද නම් :- අංග, මගධ, කාසි, කෝසල, වජ්ජි, මල්ල, චෙති, වංස, කුරු, පංචාල, මච්ඡ, සූරසේන, අස්සක, අවන්ති, ගන්ධාර, කාම්බෝජ යන සොළොස යි. ශාක්‍යදේශයය මෙයින් ඉතාම දියුණු වූ රටක් වුවත් භූමිවශයෙන් කෝශල ජනපදයේ ම උතුරු කොටසය. එහෙත් කොසොල් රජුට නොයටත් ශාක්‍යයන් ගේ ම පාලනය පිට පැවැති එකෙකි.

## අංග - මගධ

**අංග රට**

අංග ජනපදය මගධ දේශයට නැගෙනහිරින් පිහිටියේය. චම්පා නදිය ඒ දෙරට අතර සීමාව විය.

**චම්පා පුරය**

අංග ජනපදයේ අගනුවර **චම්පා** පුරය යි. එය පිහිටියේ චම්පා නදිය ගංගා නදියට වැටුණු ස්ථානය කිට්ටු ව ය. පවුරු පදනම් ආදි සියලු නගරාංගයන්ගෙන් සමන්විත වූ මෙය ඉතා පූර්වයෙහි **මාලිනී, කාලචම්පා** යන නම්වලින් ප්‍රකට වැ පැවැත්තේ පසු කාලයෙහි **චම්පා පුර** යැ යි වැහැරැවිණ. මෙහි

සිටැ ස්වර්ණභූමියට නැවින් යන වෙළෙඳුන් කරන කොටැ වෙළඳාම අතින් ද මෙය ප්‍රසිද්ධියක් ඉසුලූයේ ය. මෙයින් කොචින් චීනයට ගොස් පදිංචි වූවන්ගේ ඒ (පදිංචි වූ) භූමියට ද චම්පා යන නම පසු කාලයෙකැ ව්‍යවහාර විය. බුඩ කාලයෙහි දඹදිවැ වූ මහා නගර සයෙන් **චම්පා** පුරය එකෙකි. මෙහි **ගර්ගරා** නම් මෙහෙසියක කෙරැවූ **ගර්ගරා** නම් පොකුණ ගැන ද මෙය ප්‍රසිඞ වැ පැවැත්තේ ය. මේ නගරය වූ භූමිභාගයෙහි කොටසෙකැ චම්පාපුර චම්පා නගර යන නමින් කුඩා ගම් දෙකෙක් දැන් ඇත්තේ ය. එ ගම් පිහිටා ඇත්තේ භගලපූර් සමීපයෙහි **චාන්දන් නදී** තීරයේ ය. චාන්දන් යනු පුරාණ චම්පා නදියට දැන් ව්‍යවහාර නාමය යි. බුඩ කාලයෙහි මෙහි ඡාත්‍රයන් 300 ක් සහිත වූ **සෝණදන්ඩ** නම් බමුණු ඇදූරෙක් රාජ පූජිත වැ විසී ය.

**කජංගලා** මෙය බෞඞ මධ්‍යදේශයේ නැගෙනහිරැ සීමා ස්ථානය යි. මෙහි මහා ශිෂ්‍ය පිරිසක් සහිත වූ **පාරාසරිය** නමින් ප්‍රකට බමුණෙක් විසී ය. චම්පා පුරැ සිටැ මෙයට දුර සැතැපුම් * ස-සැටක් පමණ වේ. මැදුම් සඟියේ අන්තයෙහි සඳහන් ඉන්ද්‍රිය භාවනා සූත්‍රය වදළේ මෙහි දී ය. මෙහි බොහෝ උපාසකයෝ වූ හ.

**උග්ග පුර** මෙහි ප්‍රධාන සිටුහුගේ පුත්‍රයාට අනාථපිණ්ඩික සිටුහුගේ දූ වූ **චූල්ල සුභද්‍රා** විවාහ කොටැ දෙන ලද්දී ය. ජෛන ලබ්ධික මුළු සිටු පවුල මැ ඇගේ මඟින් බෞඞෝපාසක විය.

**අස්ස පුර** මේ නිගමයෙකි. මෙහි දී භාග්‍යවතුන් වහන්සේ **මහා අස්සපුර සුත්ත, චූල අස්සපුර සුත්ත** දෙක දෙසූ සේක.

**අංගුත්තරාප දනව්ව** **අංගුත්තරාප ජනපදය** අංග රටෙහි වූ විශාල පළාතෙකි. මෙය එරට මැදින් ගලා යන මහා මහී නදියෙන් උතුරු පැත්තේ පිහිටියේ ය. මෙහි නගර අතුරෙන් **අංගුත්තරාප නගරය, ආපණ නගරය, භද්දිය නගරය** යන මොහු බුඩ කාලයෙහි ප්‍රසිඞ වැ පැවැත්තෝ ය. ඉන් ආපණ පුරය විශාල වෙළඳාම් පලෙකි. භද්දිය නුවර මහ සිටුවරුන්ගේ වාසස්ථානයෙකි. **සාමාවතී, විශාඛා** යන දෙදෙනාගේ ජන්ම භූමිය මේ **භද්දිය පුරය** යි. බුදු වූ වර්ෂයේ දී භාග්‍යවතුන් වහන්සේ අංගරට **අංගුත්තරාපයෙහි** සැරිසරන සේක්

---

* මෙහි සැතැපුම් යැ යි ව්‍යවහාර කොට ඇත්තේ ඉංග්‍රීසි 'මයිල්' එකටය.

භද්දිය පුරයට වැඩිසේක. එකල සත් හැවිරිදි වූ විශාඛාව භාග්‍යවතුන් වහන්සේ දුටු ඒ ප්‍රථම වාරයේ දී මැ බණ අසා සෝවාන් වූවා ය. භද්දිය පුරයෙහි **ජාතියා වන** නම් උයනෙක් විය. බුදුරජාණන් වහන්සේ එහි ද වැඩ වුසූ සේක.

**2. මගධ රට** මගධ රටෙහි බුඩ කාලයේ දී මැ බුදුසස්න බෙහෙවින් පැතිර ගියේ ය. උතුරෙන් **ගංගා නදිය** ද, නැඟෙනහිරින් **චම්පා නදිය** ද, තිරිතෙන් **වින්ධ්‍යා කඳුවැටිය** ද බටහිරින් **සෝනා නදිය** ද යන මොහු මගධ ජනපදයේ සීමාවෝ යි.

**රජගහ නුවර** **රජගහ පුරය** මගධ රට අගනුවර යි. මෙය ගංගා නදියට (දකුණෙන්) යොදුන් 5 ක් පමණ ඈතින් පිහිටියේ ය. මෙයට පූර්ව කාලයෙහි **වසුමතී** යන නාමයෙක් වී ය. **වසු** නම් රජකු විසින් මෙය ඉදිකරන ලදැ යි **රාමායණයෙන්** පෙනේ. මෙය නගරයක් හැටියට විශාල ලෙස නිම කෙළේ **මහාගෝවින්ද** පඬිතුමා ය. මෙයට **මාගධ පුර, ගිරිව්‍රජ පුර** යන තවත් නම් දෙකක් ද විය. බුඩ කාලයෙහි මෙයට **රාජගෘහ, මගධයන්ගේ ගිරිව්‍රජ පුර** යන නම් දෙක බැවහාර වී ය. ගාලක් වටේ බැඳි වැටක් මෙන් නුවර හාත්පස **වේභාර. වේපුල්ල, ගිජ්ඣකූට, ඉසිගිළි, පාණ්ඩව** යන පර්වත පස පිහිටියේ ය. මේ පර්වත පසේ නම් හින්දු ග්‍රන්ථයන් හි **වෛභාරගිරි, විපුලගිරි, වරාහගිරි, වෘෂභගිරි, ඍෂිගිරි** යැයි සඳහන් වේ. ඉතා පූර්වයේ සිට මහ රජුනට නිවාස වූ බැවින් මෙයට **රාජගෘහ** යන නම වී ය. "**මගධානං ගිරිබ්බජං**" යන්නෙන් මගධ ජනපදයේ **ගිරිව්‍රජ** යැ යි පාළි පොත්හි සඳහන් වේ. 'මගධ ජනපදයේ' යන්නෙන් වෙසෙසන ලද්දේ **කේකය** ජනපදයේත් **ගිරිව්‍රජ** නමින් නුවරක් වූ බැවිනි. ස්වාංජ්ශ්වාන්* නම් චීන යාත්‍රිකයාගේ ගමන් විස්තරයෙහි මෙයට **කුශාගාර** පුර යැ යි ද කියන ලදී.

ගයාව අසලැ කඳුවලට මැදි වූ දැන් **රාජගිර්** යන නමින් ව්‍යවහාර වන භූමියෙහි පුරාණ රාජගෘහ පුරය වූයේ ය. රජගහ පුරයේ සිටැ කපිලවාස්තු පුරයට දුර යොදුන් 60 කි. මෙහි සිටැ විසාලා පුරයට ගංගා නදිය පසු කැර යැ යුතු විය. ගංගා නදියට මේ නුවර සිටැ යොදුන් **5**ක් ද, ගංගා නදියේ සිටැ වෛශාලි පුරයට යොදුන් **3**ක් ද දුර ප්‍රමාණය වූ බැවින් වෛශාලි පුරය රජගහ සිටැ යොදුන් **8** ක් ඈත්හි

* හුයාන්ත්සාන් හ්‍යුඑන්සාන් යනු වැරැදියි.

වූ බව පෙනේ. රජගහ පුරයෙන් අනෝමා ගං තෙරට දුර යොදුන් 30කි. රජගහ පුර සමීපයේ **තල්වනය, වේළුවනාරාමය, ශීතවනය, මද්දකුච්ඡි මිගදය, ජීවකම්බවනය, මෝරනිවාපය, ලට්ඨිවනය** යන ආදීහු භාග්‍යවතුන් වහන්සේ වුසූ තැන් ය. මෙහි ගිජ්ඣකූළපව්ව මුදුනට එහි පාමුලැ සිටැ පහසුවෙන් යා හැකි මාර්ගයක් **බිම්බිසාර** රජහු විසින් කරවන ලදී.

ගිජුකුළු පව්වෙහි වූ ආවාස හැර රජගහ වටා පිහිටි සෙසු පර්වතවලත් භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක ගණයාත් වුසූ තන් වීය. ඉන් සමහරෙක් නම් : **චෝරපපාතය, ඉසිගිළි පර්වත** පාර්ශ්වයෙහි වූ **කාළසිලාව, වේභාර පර්වත** පාර්ශවයෙහි වූ **සත්තපණ්ණිගුහාව, ශීතවන** (සීවක වන) නම් මිනී පිට්ටනිය සමීපයෙහි වූ **සප්පසොණ්ඩික පබ්භාරය, ගෝතම කන්දරය, තින්දුක ගුහාව, තපෝද කන්දරය, තපෝදරාමය, ඉන්දසාල ගුහාව. පිප්පලි ගුහාව** යන මොහු යි. මින් තපෝදරාමය වූයේ උණුදිය උල්පතක් සමීපයේ ය. තපෝද යනු උණු දිය උල්පතට නමෙකි. දැනුදු මේ උණු දිය උල්පත එහි ඇත්තේ ය. ඉන්දසාල ගුහායේ දී භාග්‍යවතුන් වහන්සේ **සක්කපඤ්හ සුත්තය** දෙසූ සේක. නගරයෙන් පිටතැ කැලෑවල ද අරණ්‍ය කුටිකාවන්හි භික්ෂූහු වුසූහ.

**සූකරඛත ලෙන** (ඌරන් හැරූ ලෙන) **ගිජුකුළු පව්වෙහි** වූයේ ය. මෙහි දී භාග්‍යවතුන් වහන්සේ **සැරියුත්** තෙරුන්ගේ බෑණනු **දීඝනඛ** පිරිවැජියාට වදළ **වේදනා පරිග්ගහ සුත්ත** (දීඝනඛ සුත්ත) දේශනාව අසා තෙරණුවෝ රහත් වූහ.

දෙවෙනි, තෙවෙනි, සිවුවන, සතළොස්වන, විසිවන වස් කාලයන්හි බුදුරජාණන්වහන්සේ රජගහ නුවර වුසූ සේක. **සංජය** නම් ශාස්තෘහු වුසූයේ මෙහි ආශ්‍රමයෙක යි. බුධප්‍රාදුර්භාවයෙන් පළමුයෙන් මැ පහර වැදුණේ ඔහුට යි. සැරියුත් මුගලන් දෙනම මොහුගේ ශිෂ්‍ය වැ සිට ඉන් නික්ම බුධශ්‍රාවක වූහ.

**නාලන්ද පුරය**

**නාලන්ද නුවර** රජගහ නුවරින් යොදුනක් ඈත පිහිටියේ ය. මෙහි **අම්බලට්ඨිකා** උයනෙහි රාජාගාරකයෙක් (රජුගේ ක්‍රීඩා පිණිස කැරැවූ ප්‍රාසාදයෙක්) වී ය. භාග්‍යවතුන් වහන්සේ **බ්‍රහ්මජාල සූත්‍රය** දෙසූයේ එහිදීය. **දුස්සපාවාරික**

නම් සිටුහු විසින් ද මෙහි **පාවාරිකම්බ වනයෙහි** විහාරයක් කොටැ භාග්‍යවතුන් වහන්සේට පූජා කරන ලදි. **නිර්ග්‍රන්ථ ඥාත පුත්‍රයා (නිගණ්ඨ-නාතපුත්තයා)** නාලන්ද වැසියෙකි.

**අම්බසණ්ඩා නිගමය** — මෙය රජගහට නැගෙනහිර විය. මෙහි උතුරෙන් පිහිටි වේදිසක පර්වතයෙහි **ඉන්ද්‍රශාල** ගුහායේ දී භාග්‍යවතුන් වහන්සේ සක්දෙව් රජු ඇසූ ප්‍රශ්න විසඳීමෙන් (දීඝ්සහියේ) **සක්කපඤ්හ සූත්තය** දෙසූ සේක.

**කල්ලවාලමුත්ත ගම** — මෙය මගධ රට සීමාව ආසන්නයෙහි යැ යි සිතිය හැකි.

**මාගධ ක්ෂෙත්‍රය** — මෙය මගධ රට කුඹුරුවලින් ගහණ වූ පෙදසෙක් බැවින් මාගධ ක්ෂෙත්‍ර නම් විය. මෙහි භාග්‍යවතුන් වහන්සේ පිණිස **පාෂාණචෛත්‍ය** නම් තන්හි විහාරයක් කරවා තුබුණෝ ය. එය **පාසාන චේතිය විහාර** (පාෂාණ චෛත්‍ය විහාර) නම් වී ය.

**අන්ධකවින්ද ගම** — මෙය රජගහ පුරින් ගවු තුනක් ඇත් හි **සප්පිනිකා** නදිය සමීපයේ වී ය. මෙහි භාග්‍යවතුන් වහන්සේ පිණිස උපාසකයකු විසින් කරවන ලද විහාරයක් වී ය. **අන්ධකවින්ද සූත්‍රය** දෙසූයේ මෙහි දී ය.

**මහාතිත්ථ බ්‍රාහ්මණ ගම** — මෙය මහා **කස්සප** තෙරුන්ගේ ජාත භූමි යයි.

**නාලක ගම** — මෙ මගධ රට නැගෙනහිර පැත්තේ පිහිටි බමුණු ගමෙකි. සැරියුත් තෙරුන්ගේ උත්පත්තිය ද, පිරිනිවන් පෑම ද මෙහි දී ම වී ය.

**ජේන්ත ගම** — මෙය මගධෙශ්වර වූ බිම්බිසාර රජු යටතේ මාණ්ඩලික රාජයකු විසින් පාලිත වී ය. එම මාණ්ඩලික රජුගේ පුත්‍ර වූ **ජේන්ත** (ජයන්ත) කුමරු භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදි විය.

**උරුවෙලා ජනපදය** — බොහෝ පෙරැ තවුසන් විසින් ගෙනවුත් ගොඩ ගසන ලද මහත් වැලි රැසක් කරණ කොටැ මේ පෙදෙසට උරුවේලා යන නම වී ය යනු පාළි අට්ඨවණ්ණනාචරිය මතයයි. මහ බෙලි පල ගන්න පෙදෙසක් බැවින් මේ උරුවිල්වා නැමැයි සංස්කෘත බෞද්ධ ග්‍රන්ථයන්හි සඳහන් වේ.

**සෙනානී නිගමය** — මෙහි මගධ රජුගේ සේනාධිපතියකු (සේනානියකු) වූ හෙයින් සේනානි නිගමයැ යි නම් වී යැ යි සිතියැ හැකි.

බුදුවන දට පූර්ව දිනයෙහි අප මහසතාණන් ක්ෂීරපායාසයෙන් පිදූ තැනැත්තී යථෝක්ත සෙනෙවි කෙළෙඹියාගේ දූ වූ සුජාතාවෝ යි.

**ගයා** ගය නම් රාජර්ෂීන් විසින් කරන ලද බැවින් මෙයට **ගයා** යන නම ව්‍යවහාර වී ය. මෙය ජයසිරි මහ බෝ මැඩින් තුන් ගව්වක් පමණ ඈත්හි **නේරංජරා** නදිය අද්දර වූ ගමෙකි. මෙ ගම සමීපයෙහි බ්‍රහ්ම ලබ්ධිකයන් පව් සෝදන පොකුණක් වී ය. නේරංජරාවේ තොටුපල ද ඔවුන්ගේ පාපප්‍රවාහස්ථානයෙක් වී ය. එබැවින් එ දෙපොල මැ **ගයා තීර්ථ** නමින් දන්නා ලද්දේ ය. ඉන් ගම් දෙරටුව සමීප තන්හි **ගයා පොකුණ** තෙර ලොකු ගල් සතරක් උස දිග පුළුල ඇති මහත් ගල්ලැල්ලක් අතුට කරන ලද ගල් ඇඳෙක් වී ය. මෙය **ටංකිතමංච** යැ යි දන්නා ලද්දේ ය. එය ඇසුරු කොට පිහිටි **සූචිලෝම** යකුගේ භවනයෙහි ද භාග්‍යවතුන් වහන්සේ වුසූ සේක. තව ද ගයා ගම සමීපයේ මැ ගයා තොටුපල ඉස්මත්තේ ගජ ශීර්ෂයක් (ඇත් ඔලුවක්) බඳු කඳු මුදුනෙක් වී ය. එ කඳු මුදුනේ වූ විශාල සම ගල් තලය දහසක් පමණ භික්ෂූනට විදූමට තරම් අවකාශ ඇති වී ය. ගයා තොටුපල ඉස්මත්තේ වූ ඒ විශාල ගල් තලයෙහි (ගයා ශීර්ෂයෙහි) ද භාග්‍යවතුන් වහන්සේ වුසූ සේක. **පුරාණ ජටිල** භික්ෂූනට **ආදිත්ත පරියාය සූත්තය** දෙසූයේ මෙහි දී යි. මෙහි දෙව්දත් තෙරුනට අජාසත් රජු කරවා දුන් විහාරයෙක් ද වී ය. සංඝභෙදය කොටැ පන්සීයක් පමණ වූ නවක භික්ෂූන් ගෙනැ ආවේත් ඒ ගයා ශීර්ෂ විහාරයට යි. දැන් **බුධගයා** නමින් ප්‍රසිඩ වැ ඇත්තේ **බෝධිමණ්ඩ** ප්‍රදේශය යි.

**රෝහිත වාස්තු** (රෝහණ වත්ථු), **උරුවේලකප්ප** (උරුවිල්වා කල්ප), **අනාලය**, **සාරථීපුර** යන ග්‍රාම නිගමයෝද බෝ මැඩින් උතුරු දිගැ මහ මඟැ පිහිටියෝ යැ.

**පාටලී ග්‍රාමය** මෙය බුධ කාලයෙහි මගධ රටැ උතුරෙහි ගංගා නදිය අද්දර තොටුපල යි. පරිනිර්වාණ වර්ෂයේ දී අජාසත් රජු විසින් මෙය මහා නගරයක් කරන ලදී. එතන් පටන් **පාටලී පුත්‍ර** නමින් ප්‍රකට වී ය. නගර නිර්මාපණ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ එහි වැඩි සේක. එහි භාග්‍යවතුන් වහන්සේ නුවරින් පිටැ වූ ද්වාරයට **ගෞතමද්වාර** යැයි ද, ගඟ අද්දර වැඩි තොටුපලට **ගෞතමතීර්ථ** යැ යි ද නම් කරන ලදී.

**ඉෂ්ටකාවතී**, **දීඝරාජී** යනු ද මගධ රට ගම් දෙකෙකි. මෙයින් **ඉෂ්ටකාවතියෙහි අරුණවතී** නම් විහාරයෙක් වී ය.

**දක්ෂිණගිරි ප්‍රදේශය**

රජගහ පුරය වටේ වූ කඳුවැටියෙන් දකුණු පැත්තේ (එනම් නුවරට දකුණින් පර්වත වළල්ලෙන් පිටතැ) පිහිටි පෙදෙස **දක්ඛිණගිරි** ජනපද යැයි කියන ලදී. **ඒකනාලාව** මෙහි ප්‍රධාන ගමය. භාග්‍යවතුන් වහන්සේ මෙහි එකොළොස්වන වස් වුසූ සේක. **කසීභාරද්වාජ සූත්‍රය** වදළේ මෙහි දී ය.

**ඛානුමත**

මෙය සසුන් පැතුරුණු බමුණු ගමෙකි. මෙහි **කූටදන්ත** බමුණා බෞද්ධෝපාසක වී ය.

**පංචශාල**

මෙය ද බමුණු ගමෙකි. දිනක් මෙහි පිඬු පිණිස වැඩි භාග්‍යවතුන් වහන්සේට කිසි මැ තැනෙකින් භික්ෂාව නො ලැබුණේ ය.

**විශේෂ කරුණු**

මගධ දේශයට පුරාතනයෝ **කීකටස්ථාන** යැ යි ද කීහ. බුඩ කාලයෙහි අංග මගධ දෙ රටේ ප්‍රමාණය යොදුන් 300 ක් වීය. දෙරට මැ අසූදහක් පමණ ග්‍රාමයෝ වූහ. බුඩ කාලයෙන් බොහෝ පෙර අංග ජනපදය, මුදු වෙරළ දක්වා විශාල වැ පැවැත්තේ ය. මගධ රට පවා අංග ජනපදයට යටත් පළාතෙක් වී ය. සමහර කලෙකැ එ දෙ රට වෙන වෙන මැ මහ රජුන් යටතේ පැවැත්තේ ය. අප මහසතාණන් බුදු වන්නට පෙර අංග මගධ දෙ රට රජුන්ගේ යුඩ ඇති වී ය. මුල් වර අංගාධිපති වූ බ්‍රහ්මදත්ත රජහු විසින් මගධෙශ්වර **භට්ටිය** රජ පරදවන ලද්දේ ය. එහෙත් පසුවැ **භට්ටිය** රජුගේ පුත් **බිම්බිසාර** කුමරු යුඩයට වැද බ්‍රහ්මදත්ත රජහු මරා අංග දේශය අල්ලා ගත්තේ ය. එතන් සිට අංග ජනපදය මගධ රාජ්‍යයට ඇතුළත් වී ය. **බිම්සර** කුමරු තෙමේ ද අංග රට ප්‍රධාන නුවර වූ **චම්පා** පුරයෙහි වසමින් යුවරජකම් කොටැ පිය රජහුගේ ඇවැමෙන් රාජගෘහ පුරයට පැමිණැ එහි නැවතී අහු මගධ දෙරට ආංඩු කෙළේ ය. බුඩ කාලයෙහි අංග රට ආංඩු කෙළේ බිම්සර රජු යටතේ සිටි රජෙක් ය. හෙතෙම **අංගරාජ** යන නමින් හැඳින්විණ. අංග මගධ දෙරට **සින්ධු සෝවීර** යන රටවල් හා වෙළෙඳම් අතින් සම්බන්ධ වී ය.

**ආගම**

මෙහි **පූරණ කාශ්‍යපාදී** ෂට් ශාස්තෘන් ගේ ධර්ම අනු වැ ගියෝ කලෙකැ බොහෝ වූහ. එහෙත් බුදුරජාණන් වහන්සේ පහළ වීමෙන් පසු එ සියලු අන්‍ය තීර්ථ දර්ශන දැඩි අඳුර භජනය කෙළේ ය.

**රාමර්ෂිගේ පුත්‍ර උද්‍රක** නම් තවුසාගේ ආශ්‍රමය වූයේත් මගධ රටෙහි ය.

## කාශි කෝශල

**3 කාශි රට**

කාශි දේශයේ මායිම් මොන මැ පොතකිනුදු නො දුටුමු. දඹදිව සොළොස් මහ ජනපද අතුරෙන් මෙය බොහෝ සමෘඬ වැ බැබැළුණු රටෙකි. උසස් දියුණුවක් පැවැති කාලයෙහි මෙහි ප්‍රමාණය සැතපුම් දෙදහකට අඩු නොවී යැයි කියන ලදී. කලක් දකුණු ඉන්දියාවේ **අස්සක ජනපදයත් කාශි** දේශයේ පළාතෙක් වැ පැවැත්තේ ය. තවත් කාලයෙක කෝශල රටත් කාශි ජනපදයට ඇතුළත් වූයේ ය. පළමු පැවැති දියුණුවෙන් මඳක් පහත බැස්ස මේ ජනපදය බුඩ කාලයෙහි කෝශල රාජ්‍යයට අයත් වී ය.

**බාරාණසි**

බාරාණසී පුරය (බරණැස්නුවර) කාශි රටේ අගනුවරයි. පිහිටියේ ගංගා නදිය අද්දර ය. **වරණා අසී** යන නදීන් දෙදෙනා අතර වූ භූමි භාගයෙහි ඉදිකළ බැවින් **වරණාසි** යැ යි වැහැර වූ මෙය පසු කාලයෙක බාරාණසි ය යි ව්‍යවහාරයට පැමිණියේ ය. එසේ මැ වටින් තවත් ගම් ආදිය නගරයටමැ ඇතුළත් වීමෙන් ක්‍රමයෙන් විශාල පුරයෙක් වී ය. බුද්ධ කාලයෙන් පූර්වයෙහි එක් කලෙක යොදුන් දෙළොසක් තරම් වැ පැවැත්තේ ය. මෙහි නානා ලබ්ධික ජනයා රැස් වැ තමතමන්ගේ දෘෂ්ටි ගැන කථා පවත්වන **සමයප්‍රවාදක** නම් නගර ශාලාවෙක් ද විය. තවුසන්ගේ අසපුවක් වූ **ඍෂිපතනය** (ඉසිපතනය) මෙයට සමීපයේ ය. භාග්‍යවතුන් වහන්සේ මුලින් මැ දම්සක් පැවැත් වූයේ ද මුල් වස වුසුයේ ද මෙහි ය. බරණැස පටන් ජයසිරි බෝමැඩට දුර ගවු 18 යි . බෞඩයන් විසින් විශේෂයෙන් යෑ යුතු පුණ්‍ය භූමි සතරින් බරණැස එකෙකි.

**විශේෂ කරුණු**

නුවරින් ඊශානයෙහි **වරණා** ගඟේ බටහිර තෙර ලී* 10 ක් පමණ දුරින් ඉසිපතනාරාමය වී යැ යි ද මෙය වටේ විශාල ප්‍රාකාරයෙක් වී යැ යි ද, මෙහි හීනයානයට අයත් සම්මිතිය නිකායිකයන්ගේ ධර්මය හදරන භික්ෂූන් 100 ක් පමණ තමන් එහි යන කාලයේ වුසූ හ යි ද, ප්‍රාකාරය ඇතුළත අඩි 200 ක් තරම් උස් විහාරයක් වූහ යි ද. එහි මැද දම්සක් පවත්වන අයුරු දක්වන තඹමුවා විශාල පිළිමයක් වූහ යි ද, මෙය සමීපයේ පසෙකැ **ආඥාත කෞණ්ඩිණ්‍යාදීන්** තවුස් දම් පිරූ ස්ථානයෙහි ස්තූපයක් වූහ යි ද, එයට නොදුරින් පසෙක් හි බෝසතාණන්ගේ උත්පත්තියට බුඩක්ෂෙත්‍රයෙහි ඉඩ

---

* ලී යනු මයිල කාලක් පමණ වූ චීන මැනීමකි.

සලසනු පිණිස පන්සීයක් පසේ බුදුවරුන් වැඩ පිරිනිවන් පෑ ස්ථානයෙහි කළ ස්තූපයක් වූහ යි ද, ඊළඟැ **මෛත්‍රෙය** බෝධිසත්වයන් විවරණ ලත් තැන කළ ස්තූපයක් වූහ යි ද ආදී විස්තරයෙක් ය්වාංජ් ශ්වාන්ගේ ගමන් වාර්තා පොතේ පෙනේ.

**පෙසකාර ගම**

බරණැස සමීපයේ පෙහෙරුන්ගේ ගමෙක් වී ය. බරණැසට බටහිරින් ගංගා නදියේ එගොඩ **වාසභ** නම් ගමක් ද, එය ඉක්මවා **චුන්දත්ථික** නම් ගමක් ද වූ බව පොතින් පෙනේ. මේවා ගැන කියැ යුතු තරම් විශේෂ කිසිත් නැත. බිම්සර රජුගේ **කෝලිය** නම් මහාමාත්‍යයකු පසල් දනව්වෙක කැලැඹීමක් සංසිඳුවා ආපසු එන ගමන් ගංගා නදිය දිගේ පහළට යාත්‍රා කළ බවකුත් ඔහුට චුන්දත්ථි ගමට ගඟ දිගේ ඉහලට යන ප්‍රෙතයකු හමු වූ බවකුත් පොතින් පෙනේ. බරණැස කිට්ටු වැ මගධ රටට යටත් දනව්වක් වූ බව මෙයින් සිතිය හැකි ය. ඒ එසේ නම් මගධ දේශය කාශි ජනපදය තෙක් ව්‍යාප්තවැ පැවැති බව ද සිතිය හැකි ය. **කේවට්ටද්වාර** නම් ගමෙක් බරණැස් නුවර එක් දොරටුවක් සමීපයෙහි වී ය.

**4. කොශල දේශය**

බටහිරින් **පංචාල** රට ද දකුණින් **ගංගා** නදිය ද, නැගෙනහිරින් **සදනීරා*** නදිය ද, උතුරෙන් **නේපාලිය** කඳුකර පෙදෙස ද යන මොහු කෝශල ජනපදයේ සීමාවෝ යි. දැන් **අවුද්** නමින් ප්‍රසිඩ පළාතට පුරාණ කෝශල දේශය පිහිටි භූමියෙන් ඉතා වැඩි කොටසෙක් ඇතුළත් වේ. **උත්තර කෝශල, දක්ෂිණ කෝශල** යැයි මෙහි බෙදීම් දෙකක් වීය. බුඩ කාලයෙන් පෙර උත්තර කෝශලයෙහි අගනුවර **ශ්‍රාවස්ති** (සාවත්ථි) පුරය වී ය. දක්ෂිණකෝශලයෙහි ප්‍රධාන නුවර **කුසාවතී පුරය** යි. එහෙත් බුඩ කාලයේ දී කුසාවතී නමින් ප්‍රසිඩ මහා නගරයක් වූ බවෙක් නොපෙනේ. **ශ්‍රාවස්තිය** මැ මුළු කෝශල රටේ අග්‍ර නගරය වැ පැවැත්තේ ය. බුඩ කාලයෙහි කොසොල් රටැ වූ මහා නගර තුන **ශ්‍රාවස්ති, සාකේත,** අයොධ්‍යා යන මොහු යි.

**ශ්‍රාවස්ති**

ශ්‍රාවස්ති (සාවත්ථි) පුරය **අචිරවතී** නදී තීරයේ පිහිටියේ ය. නදිවක්‍රය ඇතුළැ වූ බැවින් උතුරු දකුණු දෙසින් මැ නදිය වී යැ. පසේනදී කොසොල් රජුගේ වාසය වූයේ මෙහි ය.

---

* ගණ්ඩකී නදිය යි ද කියත්.

බුඩ කාලයේ මෙය **අනාථ පිණ්ඩික, විශාඛා** ආදි උපාසක උපාසිකාවන්ගෙන් විශේෂයෙන් බැබලී ගියේ ය. බුදුරජාණන් වහන්සේ ඉතා වැඩි කලක් වැඩ වුසුයේ මේ නුවර සමීපයේ ය. නගරය ජනයාගේ ආකීර්ණතා හේතුයෙන් නිතර මැ පාහේ ඝෝෂ සහිත වැ පැවැත්තේ ය. රැ ප්‍රථම යාමය දක්වා මුළු කාලය මැ පවා රථ යාන වාහන ගමනයෙන් ද, ගනුදෙනු පිණිස යනෙන ජනයාගේ කථා ශබ්දයෙන් සුෂ්ට වී ය. අචිරවතී නදියේ එගොඩැ දකුණු දිගැ **ජේතවනාරාමය** වී ය. එ සමීපයෙහි මැ පසේනදී කොසොල් රජහු කැරැ වූ **රාජකාරාම** විහාරය ද වී ය. සැවැතට නැගෙනහිරින් නුවර සමීපයේ **පූර්වාරාමය** වී ය. මේ සැවැත් පුරයේ සිට **කපිල වාස්තු** පුරයට දුර යොදුන් 15 ක් පමණ ය.

ශ්‍රාවස්තියේ ප්‍රමාණය වටින් 'ලී' 6000 ක් පමණ යැයි ද, ජේතවනය නගරයට 'ලී' පහක් හයක් පමණ දකුණින් වූයේ යැයි ද තමා එහි යන කාලයෙහි ජේතවනාරාමය ජරාවාස වැ විහාර අත්තිවාරම් පමණක් ඉතිරි වැ පැවැත්තේ යැයි ද, එහි ඉතිරි වැ පැවැති ගඩොල් ගොඩනැගිල්ලක් තුළැ පිළිමයක් පමණෙක් වී යැයි ද, ඒ පිළිමය වනාහි භාග්‍යවතුන් වහන්සේ **මාතෘ දෙව්පුතුට** දම් දෙසීමට ස්වර්ගයට නැංග කල **උදයන** (උදෙන) රජහු සඳුනින් බුදුරුවක් කැරැ වූ බව අසා කොසොල් රජු විසින් කරවන ලද බුදුරුව යැ යි ද **ය්වාංජ්ශ්වාන්** තුමාගේ ගමන වාර්තායෙහි දක්වන ලදී.

තවද සංඝාරාමයට පියවර 100 ක් පමණ නැගෙනහිර දිගැ විශාල ගැඹුරු අගලෙක් වේ යැ යි ද, භාග්‍යවතුන් වහන්සේ ට වස දෙන්නට උපායක් යෙදූ දෙව්දත* ගිලුණු තැනයැ යි ද එයට දකුණින් දේවදත්ත පාක්ෂික **කුකාලී** (කොකාලිකා) මෙහෙණිය බුඩාපවාද අකුශල හේතුයෙන් පොළවැ ගිලුණු තැන වූ ගැඹුරු අගලෙකුත් එයට පියවර 100කින් පමණ දකුණෙහි චිංචාමාණවිකා පොළෝ ගිලුණු තැනැ වූ අගලත් වේ යැ යි ද, වහින කාලයෙහි දිය ගලා අන් ගංගා වැව් පොකුණු ඉතිරැ ගියත් මෙකී තුන් අගල් වතුර ඇති බවක් වත් නො පෙණෙන තරම් ගැඹුරු යැ යි ද යන ආදී විස්තරයෙක් යට කී ගමන වර්ණනායෙහි මැ පෙනේ.

---

* මෙය ලක්දිව පොත්වලැ ප්‍රවෘත්තියට වෙනසි. දෙව්දතු වස දෙන්නට ප්‍රයත්නයක් කළ බවක් දැන් පවත්නා පාළි පොතකැ නැත. එසේම දෙව්දත් සුප්‍රබුද්ධ රාජ පුත්‍ර බව මැ පාළි පොත්හි පෙනේ.

භාග්‍යවතුන් වහන්සේ ධරමාණ කාලයෙහි මෙහි ද පූරණකාශ්‍යපාදීන්ගේ ධර්මය පැවැත්තේ ය. ඉනුත් වැඩි වශයෙන් දියුණු වැ පැවැත්තේ මංඛලි පුත්‍ර ගෝශාල නම් ආජීවක නායකයාගේ සමය යි. එ ද භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම දේශනා හේතුයෙන් දුබල වැ ගියේ ය. මෙහි නැගෙනහිරින් අචිරවතී නදිය සමීපයේ විශාඛාව කරවා පිදූ පූර්වාරාම විහාරය විය. මෙ පුර වුසු **ජානුස්සෝනී, පිංගලකොච්ජ, සුන්දරිකභාරද්වාජ, අස්සලායන, ඒසුකාරී, සුභ, සංගාරව** ආදි ප්‍රභූ බ්‍රාහ්මණ ගෘහපතීහු බෞද්ධෝපාසකයෝ වූහ.

**විදේහ** රට වැස්සන් හා වෙළෙහෙළෙඳාම් අතින් **සැවැත්** වැසියන්ගේ සම්බන්ධය වී ය. සැවැත් නුවර වූ භූමි ප්‍රදේශය දැන් **සහෙත් මහෙත්** නම්. අචිරවතියට දැන් **රප්ති** යැ යි කියත්. පුරාතන කාලයෙහි ශ්‍රාවස්ති පුරයට **ධර්මපත්තන ධර්ම පූරි** යන නම් ද ව්‍යවහාර විය. **ශ්‍රවස්ත**[1] ඍෂිහුගේ වාස භූමිය වූ බැවින් මෙයට ශ්‍රාවස්ති යන නම විය. සියල්ල ඇත්තේ ය යන අර්ථය පිට **සර්වමස්ති** යැ යි කිය යුතු තැන එය වෙනස් වී යැ යි ද පුරාතනයෝ කීහ. මේ නගරයේ සීමායෙන් පිට ජේතවනයට ඊසානින් **අන්ධ වන** නම් බිහිසුණු වන ලැහැබෙක් වී ය. එය දිවා විහාරය පිණිස ප්‍රව්‍රජිතයන් පැමිණෙන තැනෙකි.

**අයොධ්‍යා** මෙය සැවැත් නුවරින් දකුණේ **ශරයූ** ගඟ බඩ පිහිටියේ ය. බුඞ කාලයෙහි වැඩි ප්‍රසිඞ නුවරක් නොවූවත් ඉන් බොහෝ පෙර ප්‍රසිඞ මහා නගරයෙක් වූයේ ය. මේ නුවර ද භාග්‍යවතුන් වහන්සේ වැඩ දම් දෙසූ සේක.

**සාකෙත** සැවැත් නුවරට දකුණින් සත් යොදුනක් පමණ ඈත්හි අයොධ්‍යා නුවර ළඟැ මෙය පිහිටියේ ය. මේ නුවර බුඞ කාලයෙහි (බුදුරජාණන් වහන්සේ බුදු වූ වර්ෂය පමණේ දී) කොසොල් රජහු විසින් ඉදි කරවන ලදී. ඉන් පසු මහා සිටු කුලයන්ගේ වාසස්ථානයෙක් වී ය. දඹදිව මහා නගර සයෙන් මෙය ද එකෙකි. සාකේත පුර ළඟැ **කාලාරාම, කණ්ටකී වන, අංජන වන** යැ යි ආරාම තුනෙක් වී ය. එය කරවන ලද්දේ **කාලක** සිටුහු විසිනි. මිසදිටු වූ හෙතෙම භාග්‍යවතුන් වහන්සේගෙන් බණ අසා සෝවාන් විය.

1. ශ්‍රාවගේ පුත් ( යුවනාශ්වගේ මුණුබුරු වූ) ශ්‍රාවස්ත විසින් මේ නගරය නිර්මිත වියැ යි හරිවංශ, විෂ්ණු පුරාණ, මහාභාරත, භගවත් පුරාණ යන ඉතිහාසයන් හිද, පාණිනීය ව්‍යාකරණයෙහි V 1 2, 27 හිද සඳහන් වේ.

**මාතිගාමය** මෙය කොසොල් රට පර්වත පාදයෙහි (කඳු පාමුල) පිහිටි බොහෝ ජනයාගෙන් ගැවසී ගත් ගමෙකි.

**පඞ්කධා** මෙය නිගමයෙකි. මෙහි ද භාග්‍යවතුන් වහන්සේ වැඩ වුසූ සේක.

**සක්ඛර නිගමය** **සක්ඛර** නම් නියම්ගම රජගහපුර සමීපයේ වී ය. මුගලන් තෙරණුවෝ මෙහි වැසි **කොසිය** නම් මසුරු සිටුහු දමිත කොටැ සසුන්හි පැහැදවූහු.

**පණ්ඩු පුරය** පණ්ඩු පුරය සැවැත් නුවර සමීපයේ ගමෙකි. කියැ යුතු තරම් විශේෂ යමක් මෙහි දී වූ බවෙක් නොපෙනේ.

**සේතව්‍යා පුරය** **සේතව්‍යා** පුරය ද කෝශල රටේ බ්‍රාහ්මණයන්ගේ වාස භූමියෙකි. මෙහි **සිංසපා වනයෙහි** බුදුරජාණන් වහන්සේ වුසූ සේක.

මෙය ශ්‍රාවස්ති සේතව්‍යා නගර දෙක අතුරෙහි පිහිටියේ ය.

**උක්කට්ඨා** උක්කට්ඨා (උල්කාසථා) පුරය පසේනදි කොසොල් රජු විසින් **පොක්ඛරසාදි** බමුණාට ත්‍යාග වශයෙන් දෙන ලද්දෙකි. නොයෙක් පළාත්වලින් ශිල්පශාස්ත්‍රාභිලාෂීහු මෙහි පැමිණැ පොක්ඛරසාදි බමුණා ඇසුරු කළහ.

**ඉච්ඡානඞ්ගල ගම** මෙය ද බමුණු ගමෙකි. උක්කට්ඨා නුවරට කිට්ටු වැ පිහිටියේ ය. මෙහි වේද සාකච්ඡා ශාලාවෙක් විය.

**ථූන ග්‍රාමය** මෙද බමුණු ගමෙකි.

**ශාලාවතිකා, ඔපසාද, සාලා, නගරවින්ද, මනසාකට, වේනාගපුර, දණ්ඩකප්පක, කේසපුත්ත** යන මොහු ද සැවතට කිට්ටුව පිහිටි ග්‍රාම නිගමයෝ යි. **ශාලවතිකායෙහි ලෝහිච්ච** බමුණා ද **ඔපසාදයෙහි චංකි බ්‍රාහ්මණ, කාපඨික** මානව ද යන ආදි බෞද්ධෝපාසක වූ බමුණු ගැහැවියන්ගේ නම් පෙළ පොත්හි දක්නා ලැබේ. මෙ ඉහතැ කී ගම් සියල්ලෙහි මැ බුදු සස්න පැතිරැ පැවැත්තේ ය.

**ශාක්‍ය ජනපදය** ශාක්‍ය ජනපදය කෝශල රටට, භූමියේ පිහිටීම් වශයෙන් ඇතුළත් ය. හිමාලය කඳු වැටියේ දකුණු පැත්තේ බෑවුම් ප්‍රදේශය ශාක්‍ය ජනපදයෙහි අන්තර්ගත විය. මේ දනව්වේ සීමාවෝ කවුරුදැ යි කිසි පොතකින් නුදුටුමු. මෙහි බුඩ කාලයේ දී ශාක්‍ය ජනපදය ශුඩෝදන රජතුමා විසින් ආණ්ඩු කරන

ලදී. පසු ව, බෝසතාණන් වහන්සේ 13 වර්ෂයක් රජය කැරූ වූ සේක. බෝසතාණන් මහණ වූ පසු සුදෙවුන් රජතුමා ම ආණ්ඩු කෙළේ යැයි පෙනේ. එයට පසු අන්‍ය ශාක්‍ය රජෙක් ආණ්ඩු කෙළේ දැයි පොතෙකින් නො පැනේ. එහෙත් බෝසතුන් බුදු වූ පසු කලක් භද්දිය රජ ද එයට පසු මහානාම රජු ආණ්ඩු කළ බව පෙනේ. රට පාලනය පිළිබඳ විශේෂ කටයුත්තක් පැමිණි විටැ සාකච්ඡා කැරූ ගැනීමට රජතුමා සහිත වූ අනිකුත් ශාක්‍ය ප්‍රධානයන් කපිලවාස්තු පුර සන්ථාගාර ශාලාවට පැමිණීම සිරිත විය. ශාක්‍ය රජුහු වංශය අතින් තමන් ශ්‍රෙෂ්ඨ ලෙස ද, බලසම්පන්න වුවත් කෝශල රජු ආදීන් පහත් ලෙස ද සැලකූහ. එසේම අන්‍ය රජුන් විසින් ද ශාක්‍ය වංශය ශ්‍රෙෂ්ඨ යැයි සම්මත වී ය. ශාක්‍ය වංශයේ ආරම්භ කාලයේ පටන් ම ඥාති සම්බන්ධයෙන් බැඳුණු කෝලිය වංශිකයෝ ද වංශයෙන් ශාක්‍යයන් මිස අන් කිසිවකු තමනට සම තන්හි නො තැබූහ. ශාක්‍ය කෝලියයන්ගේ වාස භූමිහු **රෝහිණී නදියේ** දෙ තෙරැ වූහ. ශාක්‍යයන්ගේ බලය වැඩි බැවින්, පාලක බලය ඔවුන් අතැ ම තුබුණු බව පෙනේ. මෙසේ හෙයින් කෝලිය රට ශාක්‍ය ජනපදයේ ම පළාතක් වූ බව පෙනේ. තමන් රාජවංශිකයන් වුවත් ඔහු ගොවිතැන ගරු කොට සලකා එහි යෙදුණහ. ශාක්‍යයෝ පරහිංසායෙන් වැළැකුණු, ධාර්මික වූ, සත්පුරුෂ ධර්මය රකින්නෝ වූහ.

**කපිලවාස්තු පුරය**

මෙය **රෝහිණී** නදිය අද්දරැ පිහිටියේ ය. ශාක්‍ය ජනපදයේ අගනුවර යි. මෙය බිමට බට දෙව්පුරයක් මෙනැ යි කාව්‍ය කාරයෝ වැණූහ. රජුන්ගේ සන්ථාගාර ශාලාදියෙන් මේ සම්පූර්ණ වී ය. අතීතයෙහි බෝධිසත්ත්ව **කපිල** තපස්විහුගේ වාසස්ථානයෙහි ඉදි කළ මේ නගරයට **කපිලවාස්තු** යැයි නම් කළහ. බුද්ධ කාලයෙහි නුවර වටේ ලෝහ දෙරවලින් යුත් විශාල ප්‍රාකාරයෙක් වූයේ ය. මෙයින් සැවැත් පුරයට දුර යොදුන් පසොළොසක් පමණ ය. රජගහ පුරයට යොදුන් සැටක් පමණ ය. කපිලවාස්තු පුරයට දැන් **පදරියායි** ව්‍යවහාර යි. රෝහිණී නදිය **කොහානා** නමින් දන්නා ලැබේ. ය්වාංජ්ශ්වාන්ගේ යාත්‍රා වාර්තාවෙහි ඔහු එහි පැමිණි කාලයේ පැවැති කපිල පුර තත්ත්වය ලියා තිබේ. ඒ එයින් ගෙන සැකෙවින් මෙහි දැක්වේ.

'කපිලවාස්තු රාජධානිය වටින් 'ලී' 400 කි. මෙහි නගර දහසක් පමණ ජරා වාස ව මනුෂ්‍ය වාසයෙන් තොර ව පවතී. මහා නගරය නෂ්ටාවශේෂ දැයින් වැසී තිබේ. රජ මාලිගාව පිහිටි භූමිය ලී 14 ක්

පමණ වට ය. එහි සියලු ගොඩනැගිලි ගඩොලින් ම නිමවා තුබුණේ ය. එහි අත්තිවාරම් භිත්ති තවමත් ඉතා ශක්තිමත් ය. උස් ය. ඒ අසළැ මිනිසුන් ඉන්නා බිම් කට්ටි ඉතා ස්වල්පයෙකි. මෙහි එක ම මහරජෙක් නැත. එක එක නගරය එහි අධිපති රජකුගේ පාලනය පිටැ පවතී. පොළොව සාර ය. ධාන්‍ය නියම කලකට සශ්‍රීක ව වැඩේ. දේශගුණය ද එයට සුදුසු ව පවතී. වැසියෝ මෘදු මොළොක් ගුණ ඇත්තෝ ය. දහසකටත් වැඩි තරම් ජරාජීර්ණ වූ සංඝාරාමයෝ දක්නා ලැබෙත්. රජ මාලිගාව පිහිටි බිම සමීපයේ තවමත් භික්ෂූන් තිස්නමක් පමණ ඉන්නා සංඝාරාමයෙක් ඇත. ඔහු සම්මිතිය නිකායාන්තර්ගත හීනයාන ධර්මය හදරති. මාළිගා භූමිය තුළැ ජරාවාස වූ අත්තිවාරම් බිත්ති සතරෙක් ඇත. මොහු ශුඩෝදන රජුගේ නිවාසය කැඩී බිඳී ගොස් ඉතිරි ව පවත්නා දෑ ය. ප්‍රාසාදය වූ තැන ශුඩෝදන රජුගේ ප්‍රතිමාව පිහිටුවා තිබෙන විහාරයෙක් ඇත. මෙයට නුදුරෙහි මායා බිසව ගේ ශයනාගාරය වූ තන්හි කරවන ලද විහාරයෙක් වේ. එහි මායා බිසවගේ රූපය තනා තිබේ. මෙහි අද්දරැ විහාරයෙක් වේ. එය බෝසත් කුසැ පිළිසිඳ ගන්නා අවස්ථාවෙහි මායා බිසව නිදහොත් තැන ය. මේ ප්‍රවෘත්තිය ඒ විහාරයේ බිත්තියෙකැ සිතියම් කැරැ තිබේ. ස්ථවිර වාදයෙහි උත්තරාෂාඪ මස තිස්වන ද රැ බෝධිසත්ත්ව ප්‍රතිසන්ධානය වී යැ යි මතයෙක් පවතී. අන්‍ය පරම්පරාවල ඒ මස තෙවිසි වන ද මේ වී යැ යි පිළිගැනේ. මෙ කී තැනින් ඉසාන දිග බෝසතාණන් අසිතර්ෂි විසින් පිළිගත් තැන කරවන ලද ස්තූපයෙක් වේ.

නුවර දකුණු දෙරැ ස්තූපයෙක් ඇත. මෙය දෙව්දත් කුමරුන් විසින් තළලට ගසා මරා දමා පාර මැද දැමූ ඇතකු සිදුහත් කුමරු විසින් ඔසොවා නුවර දිය අගලින් එ පිටට වීසි කළ ස්ථානයේ කරවන ලද්දෙකි. මෙය සමීපයෙහි සිදුහත් කුමරුන්ගේත් යශෝධරාවගේත් ශයනාගාරය වූ තැනැ විහාරයෙක් වේ. මෙහි යශෝධරාව රාහුල කුමරු ළෙහි හොවා ඉන්නා සැටි හඟවන රූප සාද තිබේ. මෙ විහාරයේ එක් අද්දරෙකැ තවත් විහාරයෙක් දක්නා ලැබේ. මෙහි ශිෂ්‍යයකු ඉගෙන ගන්නා සැටි හඟවන රූපයෙක් වේ. මෙය වනාහි සිදුහත් කුමරු ශිල්ප උගත් ස්ථානය යි.

නුවරට ගිනිකොනැ සිදුහත් කුමරු සුදු අසකු අරා ඉන්නා සැටි හඟවන ප්‍රතිමා සහිත විහාරයෙක් වේ. මෙය බෝසතුන් ගිහි ගෙන් නික්මුණු ස්ථානය යි. නුවර සතර දෙරින් පිටතැ මහල්ලකු, ලෙඩකු,

මලකඳක්, පැවිද්දකු යන එක් එක් රූපයක් සාද තිබෙන විහාර සතරෙකි. මේ සතර පෙර නිමිති දුටු ස්ථාන සතර යි. මාලිගාවට නුදුරින් නුවර දකුණු දිගැ බුද්ධත්වයෙන් පසු මුලින් ම සුදෙවුන් රජුට බුදුරජාණන් වහන්සේ හමු වූ තැනැ ද ස්තූපයෙක් වේ.

නුවරට දකුණු නැගෙනහිර සර්වඥ ධාතු නිධාන කැර කරවන ලද ස්තූපයෙක් වේ. එය ඉදිරියෙහි අඩි තිහක් උස මත්තෙහි තෙලු සිංහ රූපයක් ඇති ස්ථම්භයෙක් වේ. එහි පැත්තෙකැ බුද්ධ පරිනිර්වාණ වාර්තාව ලිපි කොටැ තිබේ. මෙය අශෝක රජහු විසින් කරවන ලද්දෙකි.

නුවරින් ඉසාන දිගැ 'ලී' 40 ක් පමණ දුර වප් මඟුල් ද බෝසතුන් ප්‍රථම ධ්‍යානයට සමවැද හුන් තැන ද කැර වූ ස්තූපයෙක් දක්නා ලැබේ.

නුවරින් වයඹ දිගැ විරූඪක (විඩූඩභ) රජහු විසින් ශාක්‍ය රජුන් මරන ලද ස්ථානයෙහි දහස් ගණන් ස්තූප දක්නා ලැබේ. මෙයින් දකුණු බටහිර කුඩා ස්තූප සතර දෙනෙක් වෙත්. මේ ශාක්‍ය රජුන් සතර දෙනෙකුන් සතුරු සෙනඟ ප්‍රතිවර්තනය කැරලූ ස්ථානය යි. විඩූඩභ කුමරුන් ශාක්‍යයනට විරුද්ධ ව එනු දුටු ශාක්‍ය රජහු සිවුදෙනෙක් ඔවුනට විරුද්ධ ව ඉදිරියට ගොස් ඔවුන් විසුරුවා හැර නුවර වන්හ. ඔවුන් කළ දෑ ඇසූ ශාක්‍යයෝ අපේ වංශයෙහි අය සත්ත්ව ඝාතනයෙන් තොර වූවෝ ය. මොවුන් වංශ ප්‍රවේණියට නින්දා ලැබෙන අකුශලයක් කළහ යි කියා ඔවුන් රටින් නෙරපූහ. ඔහු ද හිමවතට ගියහ. ඉන් එක් අයෙක් වධ්‍යයන්ගේ රටෙහි රජ වූහ. අයෙක් උද්‍යාන රටෙහි ද, අයෙක් හිමතල රටෙහි ද සතර වැන්නා ශාම්බි රටෙහි ද රජ විය. එහි ඔවුන්ගේ රාජ පරම්පරාව අවිච්ඡින්න ව පැවත ආ ය.

නුවරින් දකුණැ ලී තුන හතරක් දුර භාග්‍යවතුන් වහන්සේට ශාක්‍යයන් කරවා දුන් නිග්‍රෝධාරාමය වේ. මෙහි සංඝාරාමයේ පසෙකැ ස්තූපයෙක් වේ. භාග්‍යවතුන් වහන්සේට **ප්‍රජාවතී ගෞතමිය** විසින් මහඟු කසාවතක් පුදන ලද්දේ මෙ තැන දී ය.*

නුවර නැගෙනහිර දෙරින් ඇතුළතැ මහ මඟැ වම් පසැ සිදුහත් කුමරුන් ධනුශ් ශිල්පාදිය පුරුදු කළ ස්ථානය හැඟවීමට කළ ස්තූපයෙක් දක්නා ලැබේ.

---

* මෙය භාග්‍යවතුන් වහන්සේගේ අවවාද පරිදි ඇය විසින් සංඝයාට පුදන ලදී. පසු වැ මහා කාශ්‍යපයන් වහන්සේ විසින් කුක්කුට පර්වතහෙි සුරැකි කොට මෛත්‍රෙය බෝසතාණන් පිණිස තබා ලූ බවෙක් චීන පොතේ පෙනේ. මෛත්‍රෙය බෝසතාණෝ තමන් ලත් වස්ත්‍රයෙන් භාග්‍යවතුන් වහන්සේ පිදූහ.

නුවරින් පිට ඊශ්වර දේවාලයෙක් වේ. මෙහි දේවරූපය බිමට නැමී නැගී සිටින ආකාර පෙනේ. බෝසතාණන් උපන් ද සුදෙවුන් රජ **ලුම්බිනී** වනයෙන් එන ගමනැ ශාක්‍ය දරුවන්ගේ ශුභ සිද්ධිය සඳහා ඔවුන් උපන් අළුතැ පළමු කොට ඔවුන් ලවා වන්දවන ස්ථානය වූ යථෝක්ත දේවාලයට පැමිණියේ ය. මේ වේලාවේ ප්‍රජාවතී ගෞතමී බෝසත් කුමරු වඩා ගෙන ආවාය. ඇය බෝසතුන් ගෙන එහි ඇතුළැවත් කෙනෙහි දේවරූපය හුනස්නෙන් නැගිට බෝසතාණනට නමස්කාර කෙළේ ය. මේ ඒ ස්ථානය යි.

නුවර දකුණු දෙරින් පිට මහ මහැ වම් පසැ ස්තූපයෙක් දක්නා ලැබේ. බෝසත් විද්ද ඊගසක් බිම වැදී පොළොව බිඳී ගොස් දිය උල්පතක් මතු වී පොකුණක් වූ තැනෙකැ යි සලකනු ලබන **ශරකූප** නම් පොකුණෙක් යට කී ස්තූපයෙන් ලී තිහක් දකුණු නැගෙනහිරින් දක්නා ලැබේ. මෙහි ජලය ද මඩ ද රෝග සුව කිරීමේ ශක්තිය ඇත්තහ යි අසල් වැසියෝ සලකත්.

මේ පොකුණෙන් 'ලී' අසූවක් ගිය තැනැ **ලුම්බිනී** වනය වේ.

**ලුම්බිනී ග්‍රාමය 1**

**ලුම්බිනී** නම් රජ කුමරියකගේ නමින් ඉදි කරන ලද රාජෝද්‍යානය සමීපයේ වූ ගම ද ලුම්බිනී ග්‍රාම නමින් ප්‍රකට වී ය. යථෝක්ත උයන මහා බෝධිසත්ත්ව සිඬාර්ථ කුමාරයන් වහන්සේගේ ජාතභූමියයි. මෙය කපිලවාස්තු (කිඹුල්වත්) පුරයටත් දෙව්දහ පුරයටත් අතරැ පිහිටියේ ය. පසු කාලයෙක ධර්මාශෝක රජතුමා මෙය බලන්නට අවුත් ලුම්බිනී ගම අය බද්දෙන් නිදහස්කොට එහි ගල් කණුවක් කරවා තමාගේ පැමිණීම් ආදිය එහි කොටවා තැබ්වී ය. මේ ශිලාලිපිය තව ම දක්නා ලැබේ. දැන් ලුම්බිනිදයයට **රුමින්දයි** යැයි කියත්.[1]

ලුම්බිනී වනය ගැන ය්වාංජ්ශ්වාන්ගේ ගමන වාර්තායෙහි මෙසේ සඳහන් වේ.

---

1. මෙහි මුල් නම රුග්මිණී දය යැ යි සිතමි. රුග්මිණී යනු විෂ්ණු භාර්‍යාවකි. ඇයගේ නමින් ශාක්‍ය කුමරිය ද රුග්මිණී යයි ප්‍රකට වී යැ යි සිතිය හැකි. රුග්මිණී යනු රුම්මිනි විය හැකි. රුම්මවාසි යන තැන **රුම්ම** යනු සංස්කෘතයෙහි රුග්ණ යනුවෙන් ආ සේ යි. මෙසේ **රුග්මිණී** යන්න ලුම්මිණී ලුම්බිණීයැ යි විය හැකි. රුක්මිණී දය යන්න රුමින්දයි කියා හින්දි බසට ද පෙරළී ආසේ පෙනේ. එසේ වුවත් වෛයාකරණයෝ 'ලුබි' 'ලුම්බ' යන ධාතුන් කෙරෙන් ප්‍රත්‍යය යොද ලුම්බිනි ශබ්දය සිඬ කරත්. මහා සුප්‍රබුද්ධ රජුගේ බිසව (මායා බිසවගේ මෑණියෝ) ලුම්බිනි දේවි නැමැයි සංස්කෘත පොත්හි පැනේ.

˙මෙහි (මේ ලුම්බිනි වනයෙහි) ශාක්‍යයන් නාන පොකුණ වේ. එහි ජලය කැඩපතක් සේ පිරිසුදු ය. පැහැදිලි ය.

පොකුණින් උතුරට පියවර විසි පහක් පමණ ගිය තැන දිරා ගිය අශෝක රුකෙක් ඇත. මෙහි දී වෙසක් පුර අටවක් ද බෝසත් උපන්නේ ය. සථවිරවාදීහු මෙය පසළොස්වක් ද යැ යි කියති. මෙයින් නැගෙනහිර නාගයන් බෝසතාණන් නැවූ සථානයෙහි අශෝක රජහු කැරැවූ ස්තූපයෙක් වේ.

ඉන් නැගෙනහිර පිරිසුදු දිය උල්පත් දෙකෙකි. මෙය බෝසතුන් උපන් කෙණෙහි එකෙකැ ඇල් දිය ද අනෙකෙහි උණු දිය ද ඇති වැ පහළ වූ දෙ උල්පත් ය. මේ සමීපයෙහි ද ස්තූප දෙකෙක් දක්නා ලැබේ. මෙයට දකුණින් ශක්‍රයා බෝසතුන් වඩා ගත් තැනැ කැරැවූ ස්තූපයෙක් දක්නා ලැබේ. මෙයට නො දුරෙහි බෝසතුන් උපන් කෙණෙහි සිවු වරම් රජුන් එ තුමන් වඩා ගත් තැන ස්තූප සතර දෙනෙක් වෙත්.

එයට නො දුරින් පසෙකැ අශෝක රජහු කැරැවූ මත්තෙහි අශ්ව රූපයක් සහිත ගල් කුලුනෙක් වේ. මෙය නාගයකු විසින් පසු කලෙකැ මැදින් කඩා කොටසක් බිම හෙලන ලදී. මෙයට ඉතා සමීපයෙහි ගිනිකොණට ගලා යන කුඩා දිය පාරෙක් වේ. ඒ තෙල් නදිය යැ යි කියනු ලැබේ. මෙය බෝධිසත්ත්ව ප්‍රසූතිය කළ මායා බිසවගේ පරිහරණයට දෙවියන් මැවූ පොකුණෙකි. පසු වැ එය කුඩා නදියෙක් වී ය.

මෙ තැනින් ˙ලී˙ 100 ක් පමණ නැගෙනහිරට ගිය තැන **රාමග්‍රාමය** වේ.˙

**දෙව්දහ පුරය** දෙවදහ පුරය **සුප්‍රබුද්ධ** ශාක්‍ය රජුගේ වාසභූමිය යි. මෙය ද ශාක්‍ය ජනපදයේ වී ය.

**තවත් ගම්** **චාතුමා, සාමගාම, බෝමදුස්ස. සීලවතී, දෝන වත්ථු, නාගරක, උළුම්ප** යනු ද ශාක්‍ය ජනපදයේ තවත් ග්‍රාමයෝ යි. භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පානා වර්ෂයේ උළුම්ප නම් ශාක්‍ය ගම වැඩ වසන සමයෙහි කොසොල් රජ එහි පැමිණ කතා බස් කොට බණ අසා ගියේ ය. රජුගේ ඇමැතියා කල් ඇති වැ පිරිස කැටුව ගොස් ඒ රජුගේ මැ පුත්‍ර වූ විඩූඩභ කුමරු රජ බවට පැමිණැවූයේ ය. තනි වූ රජ, පිහිට ලබනු වස්, සිය බෑනණු වූ අජාතශත්‍රැ රජ වෙත (රජගහපුරයට) ගියේ ය. රැ නුවර දෙරටු වසා

තුබුණෙන් නුවරින් පිට ශාලාවෙක නවාතන් ගත්තේ ය. ශෝකයටත්, වෙහෙසටත් පත් වැ සිටි අසූ හවුරුදු මහල්ලෙක් වූ දුර්වල රජ තෙම මෙහි දී කලුරිය කෙළේ ය.

**හලිද්දිවසන, සජ්ජනේල, සාපූග, උත්තරකා, කක්කරපට්ට** යනු කෝලිය රජුන් ගේ ග්‍රාම නිගමයෝ යි.

**විශේෂ කරුණු** ශාක්‍යයෝ **ගෞතම** ගොත්‍රයෙහි (පෙළපතෙහි) වූවෝ ය. එබැවින් සමහර විටෙකැ පෙළපතේ නම් ද ඔහු ව්‍යවහාර කළහ. බෝසතාණනට ද, අනඳ තෙරුණටද **ගෝතම** යන නම් ව්‍යවහාර කළ බව පෙනේ.

**කෝලිය** රජුහු **ව්‍යග්ඝපජ්ජ** යන නම ව්‍යවහාර කළහ. ඔවුන් ගේ මුල් බිම **රාමග්‍රාමය** යි.* **කෝළනගර, ව්‍යාඝ්‍රපද්‍ය** යනු ද එයට ම නම්. ශුද්ධොදන රජතුමාට පසු සිද්ධාර්ථ රජතුමා රාජ්‍යය කැරැවූ බව මත්ස්‍ය පුරාණයෙන් පෙනේ. ශාක්‍ය රජුගේ පුත්‍ර ශෞද්ධොදනි (සිඬාර්ථ) රජය, තත්පුත්‍ර රාහුල ය, තත්පුත්‍ර ප්‍රසෙනජිත් ය යන රජවරුන් රජ කැරැ වූහ යි විෂ්ණු පුරාණයෙහි පෙනේ. එහෙත් රාහුල කුමරු රජ වූ බවද ප්‍රසේනජිත් රාහුල පුත්‍ර වූ බව ද බෞද්ධ පොත්වලට හාත්පසින් ම විරුඬයි. ශුඬෝදන රජතුමා මුළු කෝශල රටට ම මහරජ වූ බවක් පෙළ අටුවාවලින් නො පැනේ. ශාක්‍ය ජනපදය පමණක් සුදෙවුන් රජු විසින් පාලිත වූ බවද මහා කෝශල රජු කෝශල ජනපදයේ අග රජ වූ බව ද ඔහුගේ ඇවෑමෙන් කොසොල් රට පසේනදි කොසොල් රජුගේ පාලනය පිට පැවැති බව ද පෙළ අටුවාවලින් පෙනේ.

බුද්ධ කාලයෙහි කාශි කෝශල දෙ රට කෝශල මහ රජුට අයත් විය.

**ආළවි පුර** මෙය ආටවී පුර යැ යි සංස්කෘත පොත් හි සඳහන් වේ. මෙය කොසොල් ජනපදයෙහි වූ වෙන මැ මාණ්ඩලික රාජයකු විසින් පාලිත රටෙකි යි පෙනේ. සැවත සිට මෙයට දුර යොදුන් තිහකි.

**ආළවි රට** මෙ පුරැ **අග්ගාලව** චෛත්‍ය ස්ථානය, **ගෝමග්ග සිංසාප වනය** යන දෙ තන්හි භික්ෂූහු වූහ.

---

* මෙය ලුම්බිනියෙන් 'ලී' 300ක් නැගෙනහිරිනැ යි ය්වාජ්ශ්වාන්ගේ යාත්‍රා වෙහි පෙනේ.

මෙහි ආධිපත්‍යය දැරූ **හත්ථිකාලවක** රජ සතර සංග්‍රහ වස්තුයෙන් රට රක්නන්ගෙන් අග තැන්පත් බෞද්ධෝපාසකයෙකි.

## 5. වජ්ජිරට

**වජ්ජී (වෘජ්ජී)** රට **වජ්ජී, විදේහ, ලිච්ඡවී, නාතික** ආදි ගෝත්‍ර අටෙක ක්‍ෂත්‍රියයන් ගේ සමානච්ඡන්දයෙන් පාලිත වි ය. ඔවුන්ගෙන් විදේහ ලිච්ඡවි ගෝත්‍ර දෙකෙහි වූවෝ සෙස්සනට වඩා ප්‍රකට වූ බලවත්තු යැ යි හැඟේ. මෙයින් ලිච්ඡවීන්ගේ ප්‍රධාන නගරය **වේසාලි** (වෛශාලි) පුරය යි. විදේහයන්ගේ ප්‍රධාන නුවර **මිථිලාව** යි. නාතිකයන්ගේ අගනුවර **කුන්දපුර** (කුන්දග්‍රාම) ය යි. අන් ගෝත්‍රවලැ වූවන්ගේ ප්‍රධාන නගර පොතෙකින් නො පෙනේ. බුද්ධ කාලයේ දී විසාලා පුරය ඒ සියලු ම වජ්ජී රටේ අග්‍ර නගරය වී ය. වජ්ජී ජනපදයේ සීමාවෝ කවරහු දැ යි නො පැනේ. මෙහි සමූහ ආණ්ඩුවක් පැවති බව හැඟේ.

**වේසාලි පුරය**

මේ වජ්ජී ජනපදයේ අගනුවර යි. **වජ්ජීගාම** යැ යි ද මෙයට නම් වී ය. ගංගා නදියෙන් තුන් යොදුනකින් ඈත උතුරු දිගැ පිහිටියේ ය. රජගහ පුරය මින් යොදුන් අටෙකින් මෑතැ ගංගා නදියෙන් දකුණු දිගැ පිහිටියේ ය. මේ නුවරට පිටි පසැ මහාවනය හිමාලය තෙක් පැතිරැ පැවැත්තේ ය. එහි භාග්‍යවතුන් වහන්සේ පිණිස **කූටාගාරශාලා** නම් විහාරයක් කරවා තුබුණේ ය. භාග්‍යවතුන් වහන්සේ පස්වන වස වුසූයේ එහි ය. මෙ නුවර වටේ ගව්ව බැගින් එකිනෙකට ඈත් වූ ප්‍රාකාර වලලු තුනෙක් විය. ලිච්ඡවි රජහු 7707 දෙනෙක් විශාලා පුරයෙහි මැ නැවැතී රාජ්‍ය පාලන කටයුතුවල යෙදුණහ. මෙ නගරය සමීපයේ **උදේන චේතිය, ගෝතමක චේතිය, සත්තම්බ චේතිය, සාරන්දද චේතිය, චාපාල චේතිය** යන චෛත්‍ය සථානයත් හි ද, **අම්බපාලි වනයෙහි** ද භාග්‍යවතුන් වහන්සේ වුසූ සේක. මෙය වර්තමානයෙහි ගණ්ඩකී නම් නදිය අද්දරැ වූ **බෙසාර්** නම් පුරය යි.

**බේළුව ග්‍රාමය**

භාග්‍යවතුන් වහන්සේ අන්තිම වස වුසූ සථානය මෙය වේ. මෙය පිහිටියේ වෛශාලි පුර සමීපයේ ය. මේ **වේණුව** ග්‍රාම නමින් ද සංස්කෘත බෞද්ධ පොත්හි සඳහන් වේ. **භාණ්ඩග්‍රාමය** ද වජ්ජී රටෙහි ගමෙකි.

**කෝටි ග්‍රාමය**

මෙය "**කුන්දග්‍රාම, කුන්දපුර**" යන නම් වලින් ද ප්‍රකට වී ය. විසාලා පුර ළඟ පිහිටියේ ය. **නාතික** (ඥාතික) ගම් දෙකින් මේ කෝටි ග්‍රාම ය එකෙකි.

**නිගණ්ඨනාතපුත්තයාණන්ගේ** පිය වූ සිඩාර්ථ ක්‍ෂත්‍රිය තෙම මෙහි ආධිපත්‍යය දැරුයේ ය.

**කොල්ලාග (නාතික)**

බෞඩ පොත්හි **නාතික** නමින් ව්‍යවහාරවන්නේ මෙය විය හැකි ය. මේ කුන්ද ග්‍රාමය හැර ඥාතිකයන්ගේ අන් (දෙවෙනි) ගම යි. මෙහි **ගිඤ්ජකාවසථ** (උළු සෙවිලි කළ ගෙය) නමින් කරවා තුබුණු විහාරයෙහි භාග්‍යවතුන් වහන්සේ වුසූ සේක. **ගෝසිංග සාලවනදය** මෙයට නො දුරෙහි වී ය.

**මිථිලා**

මෙය පුරාතනයෙහි විදේහ දේශයේ අගනුවර ව බල-සම්පන්නව පැවැත්තේ ය. පසු කාලයෙකැ විදේහ ලිච්ඡවි ආදීන් එක් ව සමූහ ආණ්ඩුවක් පිහිටුවා ගත් තැන් පටන් **වෛශාලි** පුරය ප්‍රධාන නගරය වූයෙන් **මිථිලාව** එයට දෙ වැනි වූ (විදේහයන්ගේ ප්‍රධාන නුවර) වී ය. නේපාල සීමාවේ දැනට තිබෙන **ජනක් පූර්** නම් කුඩා ගම පුරාණ **මිථිලා පුරය** වූ භූමි භාගයෙන් පසෙකැ වී යැ යි පැරැණි තතු සොයා බැලූ සමහර උගතුන් ගේ මතය වේ. දියුණු වී පැවැති කාලයෙහි මෙහි ප්‍රමාණය වටින් සත් යොදුනක් පමණ වී ය. මෙහි ද භාග්‍යවතුන් වහන්සේ වැඩි සේක.

**ධම්ම කොණ්ඩ පුරය**

මෙය විදේහ රට මැදැ පර්වත රටේ (කඳුකර පෙදෙසේ) මහී නදී තීරයේ පිහිටියේ ය. ධනිය නම් ගොපල්ලාට අනුග්‍රහ පිණිස බුදුරජාණන් වහන්සේ මෙහි වැඩිසේක. දැන් මෙය ධාම් කොණ්ඩ නමින් ප්‍රකට ය.

**විශේෂ කරුණු**

ප්‍රබල ව පැවැති **වජ්ජී ජනපදය** භාග්‍යවතුන් වහන්සේ ගේ පරිනිර්වාණයෙන් තුන්වන වර්ෂය පමණේ දී අජා-තශත්‍රු රජහු විසින් ගන්නා ලදී. එය එ තන් පටන් මගධ දේශයට යටත් පළාතෙක් වී ය.

**ආගම්**

භාග්‍යවතුන් වහන්සේ පහළවන්නට සියවස් කිහිපයකට පෙර **පාර්ශ්වනාථ** නම් ජෛන ශාස්තෘහුගේ කාලයේ පටන් **ලිච්ඡවී රටෙහි ජෛන සමය** පැතිර පැවැත්තේ ය. නිගණ්ඨනාතපුත්තයන් පහළ වූ පසු වඩාත් ඒ පැතිර ගියේ ය. මෙයට වැඩියෙනුත් හේතු වූයේ නිගණ්ඨනාත පුත්තයන් එහි සම්භාව්‍ය **ක්‍ෂත්‍රියයකු** වීම යි.

ලිච්ඡවි රාජ පරම්පරාවෙහි **ඥාත (නාත)** පෙලපතේ එවකට අධිපතිව සිටි **කුන්ද (-කෝටි) ග්‍රාමවාසී සිද්ධාර්ත්ථ** නම් ක්‍ෂත්‍රියයාගේත්

තද්භාර්‍යා වූ **විදේහදත්තා** (ත්‍රිශාලා) නම් (චේතක් ලිච්ඡවි රජු දූ වූ) ක්ෂත්‍රියාණියගේත් පුත්‍ර **වර්ධමාන මහාවීර** යන නමින් ප්‍රකට නිර්ග්‍රන්ථඥාත පුත්‍රයා (නිගණ්ඨනාත පුත්තයා) එ සමයෙහි පහළ වැ මහා ශ්‍රාවක පිරිසක් ඇති වැ සිටි ජෛන ශාස්තෘවරයා යි.

## 6 මල්ල ජනපදය

බටහිරින් ශාක්‍ය ජනපදය ද, දකුණින් වජ්ජි රට ද **මල්ල** ජනපදයේ සීමා යි. මෙහි වැසියෝ භක්තිමත් බෞද්ධයෝ යි. මල්ල රජුනට **වාසෙට්ඨ** යන නමෙක් ද විය. මේ මල්ල රජුහු **ඔක්කාක රාජවංශයට** අයත් වූවෝ ය. පුරාතනයෙහි රාජාංඩුවක් පැවැති මේ රටෙහි පසු කාලයෙහි (එනම් මගධ රට **හර්‍ය්‍යංක** රජ ආණ්ඩු කරන කාලයෙහි) මල්ල රජුන් විසින් සමූහ ආණ්ඩුවක් පිහිටුවන ලදී. මල්ල ලිච්ඡවී යන රටවල් සමීප බැවින් නොයෙක් විටැ ඔවුන් ගේ සතුරු මිතුරුකම් ඇති වී ය. **බන්ධුල** නම් කොසොල් රජුගේ සේනාපතියා මල්ලරාජ වංශිකයෙකි. ඔහු විසින් ලිච්ඡවි රජුන් 500 ක් මරා දමන ලද බව **භද්දසාල ජාතක කථා** ආදියෙහි පැනේ.

**කුසිනාරා** මෙය බුද්ධ කාලයෙහි කුඩා නගරයෙක් ව පැවැත්තේය. ඉන් බොහෝ පෙර **කුසාවතී** නමින් දියුණු අඩියකැ පැවැති නුවරෙකි. මෙය **හිරණ්‍යවතිය** (හෙවත් අචිරවතියේ නැගෙනහිර කොටස) **ගණ්ඩකී** නදිය හා එක් වූ තන්හි පිහිටියේ ය. දැන් නේපාලයට අයිති යි. වර්තමානයෙහි **ගෝරක්පූර්** නම් පෙදෙසේ නැගෙනහිර පැත්තේ වූ **කුසී නගරය මේ කුශාවතී** (හෙවත් කුසිනාරා) පුරය යි. මෙහි වූ පරිනිර්වාණ චෛත්‍යය නොබෝද සොයා ගන්නා ලදී. එහි එක් තඹ තහඩුවෙක **"පරිනිර්වාණ චෛත්‍ය තාම්‍රපට්ට ඉති"** යන වාක්‍ය සඳහන් වී ය. මේ නගරයෙහි **හිරණ්‍යවති** නදිය අද්දර වූ **උපවත්තන** නම් රාජශාලවනයෙහි දී භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑ සේක.

**පාවා** මෙය බුද්ධ කාලයෙහි මල්ල රජුන්ගේ අගනුවර යි. මෙහි නුවර මැද **උබ්භතක** නමින් සන්ථාගාර සාලාවක් මල්ල රජුන් ගොඩ නංවා නිමැ වූ කාලයෙහි ද භාග්‍යවතුන් වහන්සේ මෙහි වැඩි සේක. මල්ලයන් ගේ ආයාචනා පිටැ පළමුයෙන් ම එය පරිභෝග කළ සේක. ඒ කාලයෙහි දී ම පාවා පුරයේ දී නිගණ්ඨනාථපුත්තයා මළේ ය. ඔහු ගේ අතැවැසියෝ නිර්ග්‍රන්ථ ධර්මය

ගැන නානා මත පහළ කරමින් ආරාවුල් කරන්නට වූහ. මෙය ඇසූ සැරියුත් තෙරණුවෝ, භාග්‍යවතුන් වහන්සේ ගේ අවසර පිටැ භික්ෂූනට දම් දෙසනුවෝ, බුද්ධ වචනය ගැන භික්ෂූන් ගේ මත භේදයක් නොවනු පිණිස මුළු බුද්ධ වචනය පිඩු කොට **සංගීති සූක්තය** දෙසූහ. මේ පාවා නගරයේ මැ **චුන්දකර්මාර පුත්‍රයා** ගේ අඹවනයෙක් ද වී ය. එහි ද භාග්‍යවතුන් වහන්සේ කලින් කල වුසූ සේක.

**අනුපිය නරගය**

මෙය **අනෝමා** නදී තීරයේ පිහිටි මල්ල රට කුඩා නුවරෙකි. මෙයට **අනුපිය** නිගම යැ යි ද නම් විය. මෙහි මල්ලයන් ගේ අඹ වනයෙක් වී ය. බුදු වූ අළුතැ භාග්‍යවතුන් වහන්සේ මෙහි වැඩි සේක. **භද්දිය, අනුරුද්ධ, ආනන්ද, භෘගු, කිම්බිල, දේවදත්ත, උපාලි** යන සත් දෙන අවුත් පැවිදි වූයේ බුදුරජුන් ඒ අනුපිය අඹ වෙනෙහි වසද්දී ය. **දබ්බමල්ල** තෙරුන් වහන්සේ ගේ ජාතභූමියත් මේ නගරය යි.

**කිඹුල්වතැ** පටන් මෙ පුරය තෙක් දුර යොදුන් 30 කි. **ගෝරක්පූර්** පෙදෙසේ වූ **අලමී** නමින් දැන් ප්‍රකට නදිය අනෝමාව යි.

## 7 චේති රට

**චේති** රට වනාහි **කුරු** රට සමීපයෙහි කොසොල් රටට බටහිරින් යමුනා නදී තීරයේ පිහිටියේ ය. මෙහි දකුණ සීමාව වින්ධ්‍යා කඳුවැටිය යි. වර්තමානයේ **බන්ඩල්කන්ඩ්** නමින් ප්‍රසිද්ධ පෙදෙස හා එයට යා බද වූ පළාත් මේ පුරාණ චේති ජනපදය වූ භූමි භාගයට ඇතුලත් යැයි සලකනු ලැබේ. මේ රටට **චේදී** යැයි ද ව්‍යවහාර වි ය. මෙහි **භද්දවතිකා පුර** සමීපයේ **අම්බතිර්ථය** වී ය. මෙ රට ගැන වැඩි විස්තරයක් කිසිද පොතෙකැ නො පැනේ.

**සහජාති**

මෙය ගංගා නදිය අද්දර ප්‍රසිද්ධ තොටුපලෙකි. **පාරිලේය** ග්‍රාමය මේ සමීපයේ ය.

## 8 වත්ස රට

**වත්ස** ජනපදය **අවන්ති** රටට උතුරෙන් **යමුනා** නදී තීරයේ පිහිටියේය. මෙයට **වංස** ජනපදය යැ යි ද ව්‍යවහාර වි ය. බුද්ධ කාලයේ දී **පරන්තප** රජු ගේ පුත් **උදේන** (උදයන) රජ මෙය ආණ්ඩු කෙළේ ය. එකල අවන්ති රට රජ වූ **චණ්ඩප්‍රද්‍යෝත** රජුගේ දූ වූ **වාසුලදත්තා උදේන** රජු ගේ මෙහෙසියක් වූ ය. **බෝධිරාජ කුමාර** තෙම උදේන රජුගේ පුත්‍රයෙකි.

**කෝසම්බි පුරය**

**කොසම්බි** (කෞශාම්බි) හෙවත් **කොසඹෑ නුවර** වංස දේශයේ අගනුවර යි. උදේන රජ වුසුයේ මෙහි ය. මෙය පිහිටියේ **යමුනා නදී** තීරයේ යි. නදියෙන් යතොත් මෙහි සිටෑ බරණැසට දුර යොදුන් 30කි. මෙහි **බදරිකාරාම, ඝෝසිතාරාමය, කුක්කුටාරාම, පාවාරිකම්බවන විහාර** යෑ යි ප්‍රධාන විහාර සතරෙක් විය. භාග්‍යවතුන් වහන්සේ නව වන වස වුසුයේ මෙහි **ඝෝෂිතාරාමයේයි.** මේ නගරයෙහි නදී තීරයෙහි **උදකවන** නම් උයනේදී **පිණ්ඩොල භාරද්වාජ** තෙරුන්ගෙන් බණ අසා පැහැදී **උදේන රජ** බෞද්ධයෙක් වී ය. දැන් **අලහබාද්** නගරයේ සිටෑ මයිල 30 ක් පමණ උතුරෙන් **කොසාම්** නම් ගමෙක් පුරාතන කොසැඹෑ පුර පිහිටි පෙදෙසේ ඇත.

**පයාග පතිට්ඨාන**

මෙය ගංගා නදී තීරයේ පිහිටියේය. **සෝරෙය්‍ය පුරය** මෙයට සමීපයේ විය.

**බාලක ලෝණකාර ගම**

මෙය කොසඹෑ පුර සිට කොසොල් රටට යන මාර්ගයේ චේතිය රට දෙසට හුරුව පිහිටියේ යි සිතමි. **පාරිලෙය්‍ය** වනයට වඩනා බුදුරජාණන් වහන්සේ මෙහි **බාලකලෝ-ණකාරාමයට** පැමිණ **භගු** තෙරුනට දම් දෙසූ සේක.

**භග්ග රට**

**භග්ග** ජනපදය **වංස** රටට ඇතුළත් ය. මෙහි **සංසුමාර ගිර** නුවර සමීපයේ **භේසකලා** නම් වනයේ බුදුරජුහු අට වන වස වුසුහ.

## 9 කුරු රට

නැගෙනහිරින් පංචාල රට ද, දකුණින් මාත්ස්‍ය රට ද මෙහි සීමායි. සෙසු දිශාවලින් කිනම් සීමා වී දැ යි පොතෙකින් නො පැනේ. මෙහි වට යොදුන් 300 කි. **යුධිෂ්ඨිර** පෙළපතේ රජ්ජුහු මෙහි රාජ්‍යය කැරවූවෝ ය. බුද්ධ කාලයෙහි **කෝරබ්බ (කෞරව)** රජකු විසින් පාලිත වූ බව පමණෙක් පෙනේ.

**ඉන්දපත්ථ පුරය**

**ඉදිපත් නුවර** මෙහි අග නුවර යි. රජුගේ වාසය වූයේ මෙහි යි. **මිගාචීර** නම් උයනේ දී **රට්ඨපාල තෙරණුවෝ** රජුට දම් දෙසූහ. මේ නගරය යොදුන් 7 ක් පමණ විශාල යැ යි කියන ලදී. මෙය වූ තන්හි දැන් **ඉන්ද්‍රප්‍රාත්** නම් ගමෙක් වේ. පිහිටා තිබෙන්නේ **දිල්හි** පුරය සමීපයේ යි.

**හස්තිනා පුරය** හස්තිනා පුරය පෙර ඉතා බලසම්පන්න වැ පැවැති බව මහා භාරතයේ සඳහන් වේ. බුද්ධ කාලයෙහි **හස්ථිනී** නම් කුඩා නුවරෙකි.

**ථුල්ලකොට්ඨිත** මෙය මහාධනීන් ගේ නියම් ගමෙකි. **රට්ඨපාල** තෙරුන් ගේ ජාත භූමිය යි.

**විශේෂ කරුණු** කුරු රට දේශ ගුණය විශේෂයෙන් සුබ දායක යි. මනා සැප පහසු ඇති බැවින් එහි මිනිස්සු අන් රටවලැ ජනයාට වඩා නිරෝග වූහ. නුවණ සුව සේ මුහුකුරුවන්නට හැක්කෝ ද වූහ. ගැඹුරු බණ දහම් අසා තේරුම් ගැන්මෙහි සමර්ථයෝ වූහ. එබැවින් මෙහිදී භාග්‍යවතුන් වහන්සේ **මහාසතිපට්ඨාන, මහානිදාන, සතිපට්ඨාන, සාරෝපම, රුක්ඛෝපම, මාගන්දිය, ආනෙඤ්ජසප්පාය** යන ගැඹුරු සූත්‍රාන්තයන් දෙසූ සේක. **රට්ඨපාල** සූත්‍රය දෙසන ලද්දේ ද මෙහි දී ය. තව ද මෙහි වැසියෝ නිරර්ථක කථායෙන් කල් නො ගෙවූවෝය. ඉතා පහත් දාස දාසීහු පවා යම් කිසි සතිපට්ඨාන භාවනාවක් ඉගෙන එය වැඩීමෙහි යෙදුණාහ. භාවනා නො කිරීම ඔවුනට ලජ්ජාවට කරුණු වී ය. පසු කාලයෙක මෙහි සමූහ ආංඩුවක් වී යැ යි ඓතිහාසිකයෝ කියත්.

## 10 පංචාල දේශය

කුරු රටට නැගෙනහිරින් පංචාල දේශය විය. මෙය මැදින් වූ **භාගිරථී** (ගංගා) නදියෙන් උතුරු කොටස **උත්තර පංචාල** යැ යි ද දකුණු කොටස **දක්ෂිණ පංචාල** යැයි ද බැවහර වී ය. මෙහි බුද්ධ කාලයෙහි කිසි රාජාංඩුවෙක් විද නැතහොත් සමූහාංඩුවෙක් වී දැ යි බෞද්ධ පොතෙක නො පෙනේ. **කම්පිල්ල** නුවර වුසු සඤ්ජය රජතුමා රාජ්‍යය හැර ගොස් නිගණ්ඨනාතපුත්තයා ගේ සස්නෙහි පැවිදි වූ බවක් ජෛනයන්ගේ **උත්තරාධ්‍යයන සූත්‍රයෙහි** සඳහන් වේ. ඉන් පසු සමූහ ආංඩුවෙක් වූයේ යැයි ඓතිහාසිකයන් ගේ මතයයි. මෙය බුද්ධ කාලයෙන් පෙර දඹදිව ඉතා බලසම්පන්න රටෙක් වි ය. **කම්පිල්ල** (කාම්පිල්‍ය) පුරය දක්ෂිණ පඤ්චාලයේ ප්‍රධාන නුවර යි. දැන් මෙයට **කම්පිල්** යැ යි කියත්. උත්තර පඤ්චාලයේ ප්‍රධාන නුවර **අහිච්ඡත්‍ර** පුරය යි. මේ **අහිච්ඡත්‍ර** පුරයට වර්තමාන ව්‍යවහාරය **රාම්නගර්** යනු යි.

**කාන්‍යකුබ්ජ** පුරය ද මෙහි ප්‍රසිද්ධ නුවරෙකි. ගංගා නදිය අද්දර පිහිටියේ ය. මෙය දැන් **කානුජ්** නම්. එක් කලෙකැ **මහෝදය** යැ යි ද මෙයට නම් විය.

## 11 මත්ස්‍ය රට

කුරු රටට දකුණින් (යමුනා නදියට බටහිරින්) **මච්ඡ** (මාත්ස්‍ය) රට පිහිටියේ ය. **විරාට පුරය** මෙහි අගනුවර යි. මෙය දැන් **ජයපූර්** කෙරෙන් උතුරෙන් මයිල40 කින් ඇත් වූ **බෛරාට්** නම් නගරය යි. මෙහි ද සමූහ ආංඩුවෙක් විය යනු ඓතිහාසිකයන් ගේ මතය යි.

## 12 සුරසේන රට

**සුරසේන** රට මාත්ස්‍ය රටට තිරිතින් යමුනා නදියට බටහිරින් විය. බුද්ධ කාලයෙහි මෙය ආංඩු කෙළේ **අවන්ති පුත්‍ර** නම් රජෙකි.

**මධුරා**

**මධුරා පුරය** සුරසේන රට අග නුවර යි. යමුනා තීරයේ පිහිටියේ ය. රජු ගේ වාසභූමිය මෙහි විය. භාග්‍යවතුන් වහන්සේ කීප වරක් මෙහි වැඩි සේක. මෙයට දැන් **මධුරා මත්‍රා** යන නම් ව්‍යවහාර යි. දකුණු ඉන්දියාවේ ද තිනවෙල්ලි පළාතේ **මධුරා** නම් නුවරෙක් ඇත. ඉන්දියාවේ බොහෝ උතුරෙහිද මේ නමින්ම, තවත් නගරයෙක් වී ය. මේ ශූරසේන රටේ වූ මධුරා නගරය හින්දු සමයෙහි පෙනෙන ශ්‍රී කෘෂ්ණයාගේ ජාත භූමිය යි.

**වේරඤ්ජා** මෙය මධුරාවට නො දුරු තන්හි බටහිරින් පිහිටියේ ය.

## 13 අස්සක

**අස්සක** (අශ්මක) ජනපදය **ගෝධාවරී මාහිස්සති** (හෙවත් **නර්මදා**) යන දෙ නදීන් අතර පිහිටියේ ය. මේ සමීපයේ ම (ගෝධාවරියේ අනිත් තීරයේ) මූලක ජනපදය වි ය. මෙ දෙරට ම ආන්ධ්‍ර තෙලිඟු රජහු රජය කරවූහ. මෙ රටවල් දක්ෂිණාපථ (දක්ෂිණ ජනපද) යට අයත් හ.

**පෝතන හෙවත් පෝතලි**

කාලිඞ්ග දේශය ද මූලක රට ද බුද්ධ කාලයේ **අස්සක** ජනපදයට යටත් ව පැවති බව පෙනේ. **පෝතන** පුරය සංස්කෘත පොත්හි **පෞදන්‍ය** යැ යි කියන ලදී. මේ අස්සක රටේ අගනුවර යි.

**පතිට්ඨාන**

පතිට්ඨාන පුරය **මූලක** රටේ අගනුවර යි. **ගෝධාවරී** නදීතීරයේ පිහිටියේ ය. මෙයට දැන් **පෛතාන්** යැ යි කියනු ලැබේ. ග්‍රීක් ඉතිහාසයෙහි **බෛතානා** යි කියන ලදී.

**විශේෂ කරුණු**

**අලහබාද්** පෙදෙසේ දැන් **ප්‍රයාග** නම් වූ පුරය ද පෙර **පතිට්ඨාන** නම් විය. මෙහි වෙන නගර ග්‍රාමාදියක්

ගැන පෙළ අටුවාවලැ නොදුටුමු. ගෝධාවරී නදිය දෙකට බෙදී ගලන තැන යොදුන් තුනක් පමණ වූ අතුරු දූපතෙක් වූයේ ය. කොසොල් රජු ගේ පුරෝහිත **බාවරී** බමුණු තෙම එහි අවුත් අසපුවක්* කොට තවුස්දම් රැක්කේ ය. බුදුරජාණන් වහන්සේ පහළ වූ පසු හෙතෙම එ පවත් අසා **අජිත, තිස්ස, මෙත්තෙය්‍ය, පුණ්ණක, මෙත්තගු, ධෝතක, උපසීව, නන්ද, හෙමක, තෝදෙය්‍ය, කප්ප, ජතුකණ්ණි, භද්‍රාවුධ, උදය, පෝසාල, මෝඝරාජ, පිංගිය** යන ශිෂ්‍යයන් භාග්‍යවතුන් වහන්සේ දක්නට එවී ය. උතුරු ජනපදයට එන ඔහු **පතිට්ඨාන, මාහිස්සති, උජ්ජේනි, ගෝනද්ධ, වෙදිසා, වනසාවත්ථි, කොසම්බි, සාකේත, වෙසාලි, රාජගහ** යන මේ නගරයන් පසු කොටැ මාගධ ක්ෂේත්‍රයෙහි **පාෂාණක චෛත්‍ය** විහාරයෙහි වැඩ උන් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියෝ ය.

**දන්ත පුරය** ද අස්සක රටේ වී යැයි සිතිය හැකි.

## 14 අවන්ති ජනපදය

මෙය දක්ෂිණාපථයට උතුරින් පිහිටියේ ය. බුද්ධ කාලයෙන් ශත වර්ෂ 12 කින් පමණ පසු මෙයට **මාලව දේශ** යැ යි ව්‍යවහාර වී ය. මෙය **උත්තර අවන්තිය, දක්ෂිණ අවන්ති** යැ යි පළාත් දෙකකට බෙදී පැවතිණැයි සිතිය හැකි. අවන්ති **දක්ෂිණාපථ** යැ යි දකුණු අවන්තියට කියන ලදැ යි හැඟේ. වර්තමානයෙහි **මල්වා නිමර්** යන පළාත් දෙකත් එයට සමීප වූ මධ්‍යම පළාතේ සීමායෙහි කොටස් කීපයකුත් යන මෙ කී සියල්ල පුරාතන අවන්ති දේශයට ඇතුළත් වූ බව පෙනේ. බුද්ධ කාලයෙහි මෙහි රජය කැරැවූයේ **චණ්ඩප්පජ්ජෝත** රජතුමා යි. එතුමා බෞද්ධයෙකි.

මෙහි **කුරරඝර** නුවර **පපාත පබ්බතයෙහි** ද **මක්කරකටක** ගම අසළැ ද කච්චාන තෙරුන් ගේ ආශ්‍රම වී ය.

**උජ්ජේනි** ග්‍රීක්වරු ojene (ඔජේනෝ) යැ යි මෙයට ව්‍යවහාර කළහ. මෙය බුද්ධ කාලයෙහි මුළු අවන්ති දේශයේ ප්‍රධාන නුවරයි. මහ රහත් කච්චායන තෙරුන් වහන්සේ ගේ ජාතභූමියයි. මිහිඳු මාහිමියන් වහන්සේ උපන්නේ මේ නුවරෙහි ය. මෙය අවන්ති රටේ උතුරු කොටසේ **චර්මන්වතී** නදී තීරයේ පිහිටියේ ය.

---

* මෙය කපිත්ථ තිත්ථාරාම නම් විය.

**මාහිස්සති** අවන්ති දක්ෂිණාපථයේ ප්‍රධාන නගරය වූ මෙය බුද්ධ කාලයෙන් පෙර කලක් මුළු අවන්ති ජනපදයේම අග්‍ර නගරය වි ය. **නර්මදා** නදී තීරයේ පිහිටියේ ය. දැන් මෙය **මාන්ධාතෘ** පුර යැයි කියනු ලැබේ.

**කුරරඝර** මේ නගරය අවන්ති රටට අයත් බව මිස කිනම් පැත්තෙකැ පිහිටියේ දැ යි අවිනිශ්චිත යි. මෙහි වුසු **කාලි** නම් තැනැත්තිය මුලින් ම මේ සස්නෙහි සෝවාන් වූ උපාසිකාව යි. ඇගේ පුත්‍ර වූ **සෝණකුටිකණ්ණ** තෙම භාග්‍යවතුන් වහන්සේ ගෙන් තනතුරු ලත් මහා ශ්‍රාවකයෙකි.

**වේදිසා** මෙය මාහිස්සති නුවර සිට සැවැත් පුරට යන මහා මාර්ගයෙහි **වේත්‍රවතී** නදී තීරයේ වූයේ ය. සැරියුත් මුගලන් යන දෙඅගසව්වන් වහන්සේ ගේ ධාතු තිදන් කොට කරවන ලද චෛත්‍ය දෙක මේ සමීපයෙහි ය. අශෝක රජු ගේ පළමු බිරින්දෑ මෙහි කුමරියකි.

**ගෝනද්ධපුරය** මෙය උජ්ජේනි වේදිසා යන දෙනුවර අතර වී ය.

## 15 ගන්ධාර දේශය

මෙය දඹදිව උත්තරාපථයේ පිහිටියේ ය. කාශ්මීර රට ද මෙයට ඇතුළත් විය. බුද්ධ කාලයෙහි **පුක්කුසාති** නම් රජෙක් මෙය ආංඩු කෙළේ ය. හෙතෙම බිම්සර රජු ගේ මිත්‍රයෙකි. පසු කලැ භාග්‍යවතුන් වහන්සේ වෙත අවුත් බණ අසා අනාගාමි වි ය.

**උක්කල පුරය** මෙය උත්තරාපථයෙහි නගරයෙකි. පුෂ්කරවතී නුවර මෙයට සමීප යැ යි සිතියැ හැකි ය. මෙහි **තපුස්ස භල්ලික** දෙදෙන සර්වඥ කේශධාතු තිදන් කොට චෛත්‍යයක් කළහ. බංගාලය වරාය අද්දර පිහිටි **ඔරිස්සා** පුරයට ද **උත්කල** යැ යි නාමෙක් වේ.

**තක්ෂශිලා පුරය** තක්ඛසිලා **(තක්සලා)** පුරය ගන්ධාරයේ අගනුවර යි. බුදුරජාණන් වහන්සේ මෙහි වැඩි බවක් පොතෙකින් නො දුටුමු.

**පොක්ඛරවති පුරය** **පුෂ්කරවති** නුවර සින්ධු නදියේ අත්තක් වූ **සුවාස්තු නදිය** අද්දර පිහිටියේ ය. **තපුස්ස භල්ලික** දෙදෙනා මෙහි සාර්ථවාහකයකු ගේ පුත්‍රයෝ යි.

**අසිතඤ්ජන නගරය** මෙය පොක්ඛරවතී පුර සමීපයේ වී යැයි හැඟේ. තපුස්ස භල්ලික දෙදෙනා ගේ ජාත භූමිය යි.

**විශේෂ කරුණු** **පුක්කුසාති** රජ පැවිදි වූයේ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ අළුතයි. එයින් පසු කවරෙක් රජ වී දැ යි බෞද්ධ පොතෙක නො පෙනේ. **නග්ගති** (නග්නජිත්) නම් රජකු එහි නිගණ්ඨනාතපුත්තයාට සම කාලයෙහි වූ බවත් ඔහු නිගණ්ඨ සමය පිළිගත්තකු බවත් ජෛන පොත්වලින් පෙනෙන බැවින් පුක්කුසාති රජුගෙන් පසු **නග්නජිත්** රජ වූ යේ යි සිතීමට ඉඩ තිබේ. නිර්ග්‍රන්ථ ඥාතපුත්‍ර ධර්මයේ පොතක් වූ උත්තරාධ්‍යයන සූත්‍රයෙන් පංචාලයෙහි **විමුඛ රජ**, විදේහ රට **නමි රජ**, කාලිංගයෙහි **කරකණ්ඩු රජ** යන තුන් දෙනා නිගණ්ඨනාත පුත්තයාණන් සරණ ගිය බව පෙනේ.

## 16 කාම්බෝජ රට

මෙය ද උත්තරාපථයෙහි (දඹදිව) වයඹ පැත්තේ පිහිටියේ ය. මෙහි වැසියෝ ශිෂ්ටාචාරයෙන් අඩු, රළු ගති ඇත්තෝ වූහ. මේ රට අශ්වයන් ගැන ප්‍රසිද්ධ විය. භාග්‍යවතුන් වහන්සේ **වේරංජා පුර** වස්වුසූ සමයෙහි උත්තරාපථයෙන් ආ අස් වෙළඳහු උන් වහන්සේ සහිත භික්ෂු පිරිසට උපකාර කළහ. ඒ වෙළඳහු මේ කාම්බෝජ රටින් ආවෝ යැයි සිතිය හැක්ක.

**ද්වාරකා පුරය** මෙය දඹදිව බටහිර සීමායෙහි වූයේය. කාම්බෝජයේ අග නුවරයි. **රාජපුරය** ද මෙහි වූ තවත් නුවරෙකි.

**විශේෂ කරුණු** වියට්නාම් රටට දකුණින් කාම්බෝදියා යි කුඩා රටෙක් වේ. එය අප පොත්හි සඳහන් කාම්බෝජය නො වේ. අනෙකෙකි.

## කුඩා රටවල්

**මද්‍ර** දේශය සොළොස් මහ රටවලින් කුමකට අයත් වී දැ යි අවිනිශ්චිත යි. **සාගල** පුරය මෙහි අගනුවර යි. මෙය දැන් පංජාබ් පළාතට අයිති යි.

**සින්ධු දේශය** මෙය වර්තමාන රාජපුටානාහි වාලුකා කාන්තාරයට බටහිරින් සින්ධු නදිය දෙපැත්තේ පිහිටියේ ය. සැවැත් නුවර හා වෙළෙඳාම අතින් මෙහි සම්බන්ධය විය.

**සෝවීර දේශය** මෙය **රාජපුටානාහි** වාලුකා කාන්තාරයට දකුණින් (පුරාතන) අවන්තියට බටහිරින් වින්ධ්‍යා කඳු වැටියට උතුරින් පිහිටියේ ය. මෙහි අගනුවර **රෝරුක** හෙවත් රෝරුව පුරය යි. සෝවීර රට ද සැවැත් නුවරට වෙළෙඳාම අතින් සම්බන්ධ වී ය. බුද්ධ කාලයෙහි මෙහි තිස්ස නම් රජ රජය කැරැවූයේ ය. ඔහුට ඔහුගේ මිත්‍ර වූ බිම්සර රජ බුද්ධ චරිතය වස්ත්‍රයෙක සිතියම් කරවා, රන් පතෙකැ පටිච්චසමුප්පාදය ලියවා තෑගි පිණිස එවූයේ ය. එය බලා පහන් වූ තිස්ස රජ භාග්‍යවතුන් වහන්සේ වෙත අවුත් පැවිදි වූයේ ය.

**අපරාන්ත රට** මෙය දක්ෂිණා පථයට බටහිරින් සමුද්‍ර තීරයේ පිහිටියේ ය. **භරුකච්ච, සුප්පාරක** යනු මෙහි තොටවල්ය. මෙයට **සුනාපරන්ත** ය යි ද කියන ලදි.

බාහිය රට, **අජිත** රට, **අල්ලකප්ප** රට, **වේඨදීප** රට, **ආළවි** රට, **කෝකාලික** රට, **පත්තුන්න** රට, **පාතියත්ථ ජනපදය, බුලු ජනපදය** යන මේ වා දඹදිව සොළොස් මහ ජනපදවලින් කුමකට අයත් දැ යි කිසි පොතෙකින් නො දුටුමු. **භද්දවතී** රට **චේතිය** ජනපදයේ වී යැ යි අනුමානයෙන් සිතමු. එහි ප්‍රධාන පුරය **භද්දවතී** නුවර යැ යි පැනේ. දැන් මෙය **හතල්** නම්. අල්ලකප්පක වේඨදීපක යන දෙ රට එකිනෙකට යා බද් ව පිහිටියා විය හැකි ය. බුදුරජාණන් වහන්සේ ගේ පහළ වීමට වර්ෂ 60 කින් පමණ පෙර මෙහි රජය කැරැවූ රජුන් දෙදෙන සිය රටවල් හැර පර්වත දෙකකට ගොස් තවුස් දම් රැක්ක බව දම්පියා අටුවායෙහි කියන ලදී. කොසඹෑ පුරයේ උදේනි රජ කුඩා කාලයේ දී **වේඨදීපක** තවුසා ළඟ වැඩුණේ ය. වේඨදීප රට දැන් **බෙටියා** නම්. එය නේපාලයට දකුණින් **ගොරක්පුරයට** නැගෙනහිරින් පිහිටියේ ය.

**කෝකාලික රට** කෝකාලික තෙරුන් ගේ ජාතභූමිය යි.

**පත්තුන්න රට** පට්ටවස්ත්‍ර ගැන ප්‍රසිද්ධ වූවෙකි.

**බුලු ජනපදයේ උත්තරකා** නම් නියම් ගමේ භාග්‍යවතුන් වහන්සේ වුසූ සේක.

**නගරග්‍රාම** : පහත සඳහන් නගර ග්‍රාම කිනම් රටකට අයත් දැ යි අනිශ්චිත යි.

**දීඝලම්බක පුරය** මේ නුවර සමීපයේ අරණ්‍ය කුටිකාවෙක භාග්‍යවතුන් වහන්සේ වුසූ සේක. එ සමයෙහි නගරවාසි බමුණු දරුවකු යක්ෂෝපද්‍රවයෙන් මුදනු සඳහා භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ලවා සත් දිනක් දිවා රෑ දෙක්හි මැ පිරිත් බැණවූ සේක.

**මුණ්ඩනිගමය** : මෙය වින්ධ්‍යා පර්වත අඩවියේ පිහිටියේ ය.

**කේසපුත්ත පුරය** : කාලාමගෝත්‍රයෙහි වූවන් ගේ බලය පැවැති නුවරෙකි.

**හස්තිග්‍රාමය** (හත්ථිගාමය) : මෙහි නාගවනාරාම නම් වෙහෙරක් වී ය. මෙය වජ්ජි රටට හෝ මල්ලරටට අයත් වියැ යුතු යි.

**අට්ඨක නගරය** : මෙහි කුක්කුටාරාම නම් වෙහෙරක් වී ය.

**ජාලිකා පුරය** : මෙය **කිපිල්ලිකා** නදී තීරයේ වී ය. මේ **චාලිකා** නමින් ද ව්‍යවහාර විය.

**පිප්ඵලිවන පුරය** : මෝරියවංසික රජුන් ගේ නගරයෙකි.

**වෙළුකන්ටකි පුර, මන්තාවතී පුර, මාතුලා පුර** යන මොහු ද කිනම් රටකට අයත් දැ යි නො හැගේ.

## ගමන මාර්ග

දඹදිව ඉතා දීර්ග මාවත් කීපයෙක් සඳහන් වෙත්.

**උතුරු සිට නිරිත දිගට වූ මාර්ග** : සැවැත් නුවර සිට පතිට්ඨාන නුවර තෙක් පිහිටියේ ය. ඉන් එහා තවත් දකුණු අතට එය පිහිටි නො පිහිටි බවෙක් අපේ පොතෙකින් නො පැනේ. මෙහි අතරු වූ ප්‍රධාන නවාතන් පලවල් නම් **සාකේත, කෝසම්බි, වේදිසා, ගෝනද්ධ, උජ්ජේනි, මාහිස්සති** යන නගරයෝ යි.

**උතුරු සිට ගිනිකොන** (දකුණු - නැගෙනහිර) අතට වූ එක් මාර්ගයෙක් සැවැත් පුර සිට රජගහ නුවර තෙක් ද, ඉන් ගයාව තෙක් ද විය. මෙහි නොයෙක් තැනැ නදීන් පසු කරු යෑ යුතු ය. මෙහි අතර ප්‍රධාන නවාතන් පලවල් නම් (සැවැත පටන්) **සේතව්‍යා, කපිලවාස්තු, කුසිනාරා, පාවා, හස්තිග්‍රාම, භාණ්ඩග්‍රාම, වේසාලි, පාටලීග්‍රාම, නාලන්දා, රාජගෘහ,** ගයා යන මොහු යි.

බරණෑස සිට **තාමලිත්ති** පටුන දක්වා ගයාව පසු කර යන තවත් මාර්ගයෙක් වී ය. මෙය ද උතුර සිට ගිනිකොණ දක්වා වූයේ ය. නැගෙනහිර පටන් බටහිරට දියෙන් යෑ යුතු විය. එ ගමන ගංගා නදිය දිගේ ඉහළට යාත්‍රා කොට **සහජාත** තොටුපළ ළඟදී යමුනා නදියට වැද බටහිර අතට කොසැඹෑ පුර තෙක් යෑ යුතු විය. කොසැඹෑ පුර සිට යමුනාව දිගේ පහළට (නැගෙනහිරට) යාත්‍රා කැර ගංගා නදියට වැදැ බටහිරට එය දිගේ ගොස් මුහුදට පැමිණ මූදු වෙරළ සමීපයෙන් යාත්‍රා කොට ස්වර්ණ භූමියට (බුරුමයේ දැන් ථාටෝන් නම් වූ පළාතට) වෙළෙඳුන් ගේ යාත්‍රා කිරීම ද වූ බව පෙනේ.

වේරංජාපුර සිට බරණෑස දක්වා වූ දීර්ඝ මාර්ගයේ ප්‍රධාන ස්ථානයෝ **සෝරෙය්‍ය සංකස්ස කණ්ණකුජ්ජ පයාගපතිට්ඨාන** (මෙහිදී ගංගා නදියෙන් එගොඩ විය යුතුයි.) බරණෑස් යන නගර ග්‍රාමයෝ යි. විදේහ රටින් **ගන්ධාරයට** ද, **මගධයෙන් සෝවීර රටට** ද මහා මාර්ග විය. ඒ මාර්ග දෙක්හි වාලුකා කාන්තාරයන් පසු කළ යුතු බව ද පෙනේ. එ වැලි බිමැ යන විටැ රාත්‍රියෙහි ම යෑ යුතු වේ. එ ගමනේ දී තාරකා ලකුණින් මඟ පෙන්වන නියාමක පුරුෂයෝ ද ආවශ්‍යක වූ හ.


**භාරුකච්චය** පටන් කොට ඉන්දියාවේ වෙරළ සමීපයෙන් යාත්‍රා කොට සුවර්ණ භූමියට යන තවත් සමුද්‍ර මාර්ගයෙක් වී ය. **බබිලෝනියට** ද දඹදිවින් ඇත්දත් ආදී අගනා දෑ නැව්වල පටවා ගෙන ගිය බව බෞද්ධ පොත්වලින් ද ඉතිහාසයෙන් ද පැනේ. බබිලෝනිය බෞධ පොත්හි බාවේරු රට යෑ යි කියන ලදී.

---




දේවාරාධනාව

මිනිස් ලොවට වැඩ බුදු වී ලෝකාර්ථචර්යාවෙහි යෙදෙන්න යැයි
බෝසතාණන් වහන්සේ දේවාරාධනා ලැබීම.




මහමායා දේවිය දුටු සවපනය

ඇසළ පොහෝයදා මහමායා දේවිය විසින් සුදු පියුමක් සොඬින් රැගත් සුදු ඇත් පැටවෙකු
තම යහනවටා තෙවරක් ගමන්කර දකුණැලයට ලංවී කුසතුලට පිවිසෙනු සවප්නයෙන් දිටිමි.




**සිදුහත් උපත**

ලුම්බිණි සල් උයනේදී සිදුහත් කුමරු උපත ලැබීම.




**තවුසාට කුමරා ඉදිරිපත් කිරීම**

සුද්ධෝදන රජතුමා විසින් අසිත තවුසාට සිද්ධාර්ථ කුමාරයා පෙන්වීම.



වප් මඟුල් දා
උත්සවයේ දී සිද්ධාර්ථ කුමාරයාගේ ප්‍රාතිහාර්ය පෑම දුටු සුද්ධෝදන රජතුමා කුමාරයා හට දෙවෙනි වරට වැඳීම.



විශ්වමිත්‍ර ගුරුවරයා විසින් සිද්ධාර්ථ කුමරාට ශිල්ප ඉගැන්වීම.




තම ඥාතීන් හා ජනයා ඉදිරියේ සිද්ධාර්ථ කුමාරයා ශිල්ප දැක්වීම.




**සරණ මංගල්‍යය**

සිද්ධාර්ථ කුමරා හා යශෝධරා කුමරිය අතර සරණ මංගල්‍යය.




**සතර පෙර නිමිති**

සතර පෙර නිමිති දැකීමෙන් පසු සිද්ධාර්ථ කුමරා කලකිරී සිටින අයුරු.




**ගිහිගෙයින් නික්මීම**


ගිහිගෙයින් නික්මෙන අවස්ථාවේදී තම යශෝධරා දේවිය හා රාහුල කුමරා දැකබලා ගැනීම.




නේරංජනා ගඟින් එතෙරවීම
සිදුහත් කුමරා ඡන්න ඇමති සමඟ කන්තක අසුපිටින්
අනෝමා නදී තෙරින් එතර වීම.



සිද්ධාර්ථ කුමරා මඟුල් කඩුවෙන් කෙස් වැටිය කපන මොහොතේ
ඡන්න ඇමති සහ කන්ථක අසු ශෝකයෙන් බලා සිටින අන්දම.



සිද්ධාර්ථ බෝසතාණෝ අප්‍රණක ධ්‍යාන වඩමින් දුෂ්කර ක්‍රියාවෙහි යෙදී සිටීම.



**උරුවෙල් දනව්ව**

සිද්ධාර්ථ බෝසතාණන්ගේ බුදුවනු සැකනැති බව දැක වසවතු විසින් බෝසතාණන්ගේ දුෂ්කර ක්‍රියාව නැවැත්වීමට සිතා ව්‍යාජදයාවක් පෙන්වීම.



සුජාතාව විසින් බෝසතාණන් හට කිරිපිඬු පූජා කිරීම.



කලියුග වර්ෂ 2513 වන් පුර පසළොස්වක් දින මහා පුරුෂයාණන් වහන්සේ
ලෝදා එකලු කරමින්, සුබ නිමිති පළ කරමින් සකල ක්ලේෂයන්ගෙන් නිරුත්තරව
සම්‍යක්සම්බෝධියට පැමිණි මොහොත.

# ශාක්‍යමුනීන්ද්‍රාවදානය
## හෙවත්
# සිද්ධාර්ථ ගෞතම බුද්ධ චරිතය

නමො බුද්ධාය

## පළමු පරිච්ඡේදය
### ශාක්‍ය වංශය

**මහා සම්මත රජ**

ලොවැ මිනිසුන් ඇති වූ මුල් යුගයෙහි ඔවුන් පාලනය කරන රජෙක් නොවී ය. මිනිස්සු දැහැමින් සෙමෙන් කල් යවන්නාහු තුමූ ම තමන් ගේ පාලකයෝ වූහ. ඔවුන් අතරැ ප්‍රාණවධාදි කිසි අපරාධයෙක් නො වී ය. ඔහු ජාති කුල ගෝත්‍ර ආදි වශයෙන් නො බෙදුණහ. සියල්ලෝ එක් ම පවුලෙහි සහෝදර පිරිසක්සේ සමගියෙන් වුසූහ.

මෙසේ බොහෝ කලෙක් ගෙවිණ. ටිකින් ටික නරක ගති ගුණ මිනිසුන් කෙරෙහි පහළ වන්නට පටන් ගත. කිසි කෙනෙක් අන් සතු දැ සොරා ගත්හ. නින්ද ගර්හා කිරීම ද බොරු කීම ද ඇති විය. නොබෝ කලෙකින් අනුනට හිංසා පීඩා කිරීම ද පටන් ගැනිණ.

මෙසේ අපරාධ වැඩී ගෙන යන විට මහජනයා ගේ ආරක්ෂාව පිණිස පාලකයකු පත් කැරැ ගැන්ම අවශ්‍ය වි ය. මිනිස්සු එක්රැස් වැ මහා සභාවක් පැවැත්වූ හ. පවත්නා තත්ත්වය ගැන සාකච්ඡා කොට සමානච්ඡන්දයෙන් සුදුස්සකු පාලක ධූරයට පත් කරන්නට තීන්දු කැරැ ගත්හ. ඔවුන් අතුරෙහි වූ ආරෝහ පරිණාහ සම්පන්න, පෙනුමෙන් ශෝභන වූ එහෙත් තෙදවත් ශූරවීර පුරුෂයකු තෝරා ගෙන ඔහු තමන්ගේ පාලකයා කැරැ ගත්හ. හැම දෙනා ගේ සම්මතියෙන් පත් කැරැණු බැවින් හේ **මහාසම්මත** නම් විය. **දාන, ප්‍රිය වචන, අර්ථචර්යා, සමානාත්මතා** යන සතර සංග්‍රහ වස්තුයෙන් ජනරංජනය කරන බැවින් **රාජ** නම් ද විය. මේ ලොවැ ඇති වූ, පළමු මහරජු ය.

මෙකී **මහාසම්මත** රජුහු ඇවෑමෙන් ඔහු පුත් **රෝජ** නම් කුමර රජ විය. ඔහුගේ පරපුරෙහි පිළිවෙළින් **වරරෝජ, කල්‍යාණ, වර කල්‍යාණ,**

**උපෝසථ, මන්ධාතු, චර, උපචර, චේතිය, මුචල, මුචලින්ද, සගර, සාගර, භරථ, භගීරථ, රුචි, සුරුචි, ප්‍රතාප, මහාප්‍රතාප, ප්‍රණාද, මහා ප්‍රණාද, සුදර්ශන, මහාසුදර්ශන, නේරු, මහානේරු, අච්චිමන්තු** යන රජ්ජු රජය කැරැවූහ. ඔවුන්ගෙන් සමහරු **කුශාවතී** නුවර ද සමහරු **රාජගෘහ** නුවර ද, සමහරු **මිථිලා** නුවර ද, රාජධානිකොට ගෙන ජනතාව පාලනය කළහ. **අච්චිමන්තු** රජු ගේ පරපුරෙහි සමහරු **මිථිලා** නුවර ද, බොහෝ දෙනෙක් **බාරාණසී** (බරණැස්) නුවර ද, සමහරු **අයෝධ්‍යා** ආදි කලින් කලැ නැංවුණ නගර ද රාජධානි කැරැගත්හ. ජනගහනය වැඩි වත් ම පොළොවේ නොයෙක් අතට විහිද පැතිරී ගිය ජනතාව සමග ම මේ රජ පරපුරේ පාලකයෝ ද වෙන වෙන පෙදෙස් පාලනය කරන රජුන් වශයෙන් බෙදී ගියහ.

දහස් ගණනක් රජුන් ඇතුළත් මේ මහාසම්මත වංශයෙහි වූ **මහේශ්වර සේන** නම් රජෙක් එක් කලෙක **බරණැස් නුවර** රජදහන කොට ගෙන දඹදිව එක් ප්‍රදේශයක් පාලනය කෙළේ ය. ඔහුගේ පුතුන් අතුරෙන් **කර්ණික** නැමැත්තා පිය රජු ඇවෑමෙන් **පෝතලී** (පෞදන්‍ය) නම් නුවරෙක වැස රට පාලනය කෙළේය. ඔහු ගේ දරුවන් දෙදෙනාගෙන් වැඩිමාලු **ගෝතම** නම් කුමර රජ සැප අතහැර වනගතවැ **කෘෂ්ණ** නම් තවුසකු ඇසුරු කෙරෙමින් විසී ය. ඔහුට දෙදරු කෙනෙක් වූහ. හිරු උද වන මෙහොතෙහි උපන් බැවින් ඔහු දෙදෙනා ම **සූර්ය** යන නමින් හැඳින් වුණහ. ඔවුන් උපන් පෙදෙස **ඉක්ෂු** (උක්) වනයෙකි. එහෙයින් ඔහු ඉක්ෂ්වාකු (ඔක්කාක) නම් ද වූහ. මේ කුමරුන් දෙදෙනාගෙන් දෙවැන්නා ඉක්ෂ්වාකු රාජ නමින් පෝතලී පුරයේම රජ වී ය. ඔහුගේ පරපුර ඉක්ෂ්වාකු (ඔක්කාක) වංශ **සූර්යවංශ** නමින් ද ගෝත්‍ර වශයෙන් (ගෝතම තවුසාගේ නමින්) **ගෞතම** නමින් ද හැඳින්විණ. මේ පරපුරෙහි **ඉක්ෂ්වාකු** නමින් ප්‍රසිද්ධ වූ රජ්ජු තුන්දෙනෙක් වූහ. එයින් තුන්වැන්නා **ඉක්ෂ්වාකු විරූඪක** (ඔක්කාක විරුළ්හක) නම් විය. ඔහුට පළමු බිසෝවරුන්ගෙන් **උල්කාමුඛ, කරකර්ණ** (කරකණ්ඩු). **හස්තිනික, නූපුර** (නිපුර) නම් පුත්තු සතර දෙනෙක් ද දියැණියෝ පස් දෙනෙක් ද වූහ.*

---

* දියැණියෝ පස් දෙනා අතිත් බිසෝවරුන් ගේ දරුවෝ යැ යි සතු බණ පොත්හි එයි. පාළි අටුවාහි ඒ හැම එක් ම බිසොවක ගේ යැ යි සඳහන් වේ. සතුපොත්හි එන පුවත හරි විය හැක්ක.

විරූඪක ඉක්ෂවාකු රජ පළමු බිසෝවරුන් මළ පසු තවත් ආවාහයක් කැරගත්තේ ය. ඒ අළුත් බිසොව ගෙන් උපන් කුමරුට **ජන්තු** යන නම තැබී ය. කුමරු දැක, රජ පැහැද බිසොවට තමා රිසි වරයක් ඉල්ලා ගත මැනැවැ යි කී ය. 'පසු කලෙකදී පිළිවනැ' යි ඕ එය කල් දැමූවා ය. කලකට පසු ජන්තු කුමරු තරුණ වයසට ළං වූ සමයෙහි ඕ රජු කරා ගොස් වරය ඉල්ලූවා ය. කුමක් වුවමනා දැ? යි විචාල රජුට තම පුත් ජන්තු කුමරු රජයට හිමි කරන්නැ යි ඕ ඉල්ලුවා ය. කැමැති වරයක් දෙමැ යි කලදී ම පොරොන්දු වූ බැවින් රජ බිසොවගේ ඉල්ලීමට විරුද්ධ විය නො හැකි විය. එහෙත් මැය නිසා තමාගේ අනිත් කුමරුවන් සතර දෙනාට විපත් වෙතැ යි සැක කොට, ඔවුන් රහසින් කැඳවා 'ඈත පෙදෙසකට ගොස් වාසය කරන්නැ'යි උපදෙස් දුන්නේ ය.

කුමරුවෝ සතර දෙන රට හැරයන්නට සැරැසුණා හ. ඔවුන් ගේ බිහිනියෝ පස් දෙනා ද* 'සොහොයුරන් යන තැනකට ම අපිත් යම් හ' යි කියා ඔවුන් කැටුව ම නික්මුණාහ. තමන්ගේ පාලක රජුහු ගේ දූ පුතුන් අන් දෙසකට යතැයි ඇසූ නුවර වැසි බොහෝ ජනයෝ අවශ්‍ය වූ උපකරණ ද රැගෙන කුමර කුමරියන් අනුව ගමන් ඇරඹූහ. සිය නුවරින් නික්මුණු කුමරුවෝ අන් කෙනකු පාලනය කරන කිසි ද පෙදෙසෙක රැඳෙනු නො කැමැත්තෝ, හිමාලය වන ප්‍රදේශය අතට ම ගියාහ. එහි වාසයට සුදුසු පෙදෙසක් සොයා යන්නාහු **කපිල** නම් සෘෂිහු ගේ අසපුවට පැමිණියහ. සෘෂි තෙම ඔවුන් ආ කරුණ විචාරා, තමා වසන අසපු පෙදෙස 'ජයභූමියකැ'යි ද එහි නගරයක් නැංවුවහොත් ප්‍රබල පාලකයන් වසන තැනක් වෙතැ'යි ද කියා ඒ පෙදෙස කුමරුවනට පවරා දී තෙමේ එයට නොදුරු අන් බිම් පෙදෙසෙක අසපුවක් කොට ගෙන විසී ය. කුමරුවෝ එහි තමන් කැටුව ආ ජනයා හා එක් වැ මාර්ග, වීථි, මන්දිර ආදියෙන් පරිපූර්ණ නගරයක් නැංවූහ. කපිල සෘෂිහට වාසස්ථාන වූ තැනැ නැංවූ බැවින් එයට **කපිලවාස්තු** යැ යි නම තැබූහ. වැඩිමහලු **උල්කාමුඛ** කුමර සෙස්සන් විසින් පාලක රාජයා වශයෙන් පත් කැර ගන්නා ලද්දේ ය. සෙසු කුමරුවෝ යුවරාජ සෙන්පති ආදී වශයෙන් සුදුසු තනතුරුවලට පත් වූහ.

---

* වෙන මවකගේ, සුළු මවගේ

උල්කාමුඛ ආදි ඒ සහෝදර රාජපුත්‍රයනට සුදුසු කුමරියන් ආවාහ කොට පාවාගත යුතු අවස්ථාව පැමිණියේ ය. කිසිම සමීප පෙදෙසක ඔවුන්ගේ ගෝත්‍රයට සරිලන ගෝත්‍රයකට අයත් කුමරියෝ නො වූහ. ඔහු 'පහත් තැනෙකින් කැරැගත් ආවාහයෙන් වංශය කිලිටි වේතැ'යි ද බිය වූහ. ගොස් කපිල සෘෂිහු ගෙන් උපදෙස් විචාළාහ. තමන් කැටි වැ අවුත් සිටින වෛමාතෘක* බිහිතියන් පාවා ගන්නැ යි සෘෂි තෙම කීය. ඔහු ද සෘෂිහුගේ උපදෙස් පරිදි තමනට වැඩිමහලු කුමරිය මවු තන්හි තබා සත්කාර කළහ. වයසින් බාල කුමරියන් භාර්යා කොට ගත්හ.

මෙසේ කල් යවන සමයෙහි ඒ වැඩිමහලු කුමරියට දරුණු කුෂ්ට රෝගයෙක් ඇති විය. එය බෝවෙන ලෙඩක් වූ බැවින් රජකුමරුවෝ සමීප වන පෙදෙසෙහි බිම් ගෙයක් සාරා වාසයට යෝග්‍ය වන ලෙසට අවශ්‍ය සියල්ල සපයා කුමරිය ගෙන ගොස් එහි රඳවා ආහාර පානාදිය යවමින් සාත්තු කළහ.

එක් රැයෙක එය අසල ගැවසෙන ව්‍යාඝ්‍රයෙක් මිනිස් ගඳ ඉව වැටී ඒ ගුහාවේ දෙර ළහට ගොස් පහුරු ගාමින් පස් ඇවිස්සී ය. කුමරිය බිය ගෙන මහ හඬින් කෑ ගැසුවා ය. ව්‍යාඝ්‍රයා එයින් බිය පත් වැ පලා ගියේ ය.

මෙයට සමීප කාලයෙහි බරණැස රජය කැරැවූ රාම නම් රජ තමාට වැළැඳුණු කුෂ්ට රෝගය සුව කැරැගත නො හැකි වැ පුතුට රාජ්‍යය පවරා තෙමේ හිමවත් පෙදෙසට අවුත් ඇවිදිනුයේ ලොකු බෙනයක් ඇති කෝල (ඩෙබර) ගසක් දැක එහි බෙනය ශුද්ධ කොට දෙර අගුළු යොදා කාමරයක් සේ සකස් කොට එහි වැස පලවැල කොළමුල් පොතු ආදිය වළඳමින් කල් යවනුයේ රෝගය දුරු වූයෙන් සුව පත් විය. ඔහු වසන තැනට කුමරිය කෑ ගැසූ හඬ ඇසිණ. පසු දින උදැසනක් සේ ම හඬ ආ පැත්තට ගොස් විපරම් කරනුයේ ගුහා දෙර දැක එතැනට ගොස් මෙහි කවුරු දැ යි ඇසී ය. 'මම රජ දුවකිමි' යි ඕ කීවා ය. 'මම රාම නම් බරණැස් රජ වෙමි'යි හෙතෙම කී යේ ය. 'ඔබ රාජවංශික වෙත් නම් ක්ෂත්‍රිය මායාව දත්තකු විය යුතු යැ' යි ඕ කීවාය. එ බසට රාම රජ ක්ෂත්‍රිය මායා පැවැසී ය. කුමරිය සැක හැර ඔහු ගේ බසට අවනත වූවා ය. හේ ඉනිමහක් තනා වළට බස්වා එහි තුළ වූ ගුහාවෙන් උඩට එන්නැයි කැඳවී යැ. ඕ ද ආවා ය. එයට පසු කතා බස් කොට ඇය

* වෙන මවකගේ, සුළු මවගේ

තමා වසන තැනට කැඳවා ගෙන ගොස් තමා වැළඳූ කොළමුල් පොතු වර්ග වළඳන්නට දුන. එයින් කුමරිය සුවපත් වැ රූ සිරින් බබලන්නී වූ ය. **රාම** රජ ඇය භාර්යා කොට ගෙන විසී ය. මෙයතරැ ඒ රජු ගේ පුත් තෙම පිය රජු ගැන සොයා බලන්නට එවූ දූතයන්ගෙන් රජු සුවපත් වැ සිටිනු අසා මහ පිරිවර ඇති වැ ඒ වන පෙදෙසට අවුත් ඔහු දැක 'බරණැසට ගොස් රජය බාර ගන්නැ'යි අයැදී ය. රජ එය පිළිකෙවු කොට නුඹ ම එහි රජය කරවන්න, හැකි නම් මේ ගස උගුල්ලවා මෙහි නිවසක් කරවා දෙන්නැ'යි කී ය. එවිට හේ තමා කැටුව ආ පිරිස ලවා ගස උගුල්වවා එහි මාලිගාවක් තනවා දී පිය රජු ගේ මෙහෙවරට තමාගේ පිරිසෙන් කොටසක් නවත්වා බරණැසට ම ගියේ ය. වෙනෙහි රැඳුණෝ ක්‍රමයෙන් ඒ පෙදෙස ගෘහ මන්දිර වතු පිටි කෙත් ආදිය තනමින් දියුණු කොට මහ නුවරක් බවට පෙරැළූහ. කෝල වෘක්ෂය වූ තන්හි කැරැවුණ බැවින් එය **කෝලිය** නගර යැ යි ද ව්‍යාඝ්‍රයා ගැවසුණ පෙදෙසැ වූ බැවින් **ව්‍යාඝ්‍රපද්‍ය** යැ යි ද නම් දෙකෙකින් ප්‍රසිද්ධ විය. ඒ නගරය ද කල් යෑමෙන් විශාල වී ඒ පෙදෙසෙහි නව නවත් ගම් නියම්ගම් ආදිය ඇති වූයෙන් මුළු පෙදෙස **කෝලිය** රට නම් විය. එහි **රාම** රජුගේ පරපුර **කෝලිය** වංශ නම් විය.

**විරූඪක** රජු තම දරුවන් ගේ තොරතුරු දැනගෙන ඊමට විටින් විට රාජ දූතයන් කපිලවාස්තු පුරයට එවන්නේ විය. වරෙක එහි විත් රජු කරා පැමිණි රාජපුරුෂයෝ 'තමන් වංශය කිලිටි වෙතැ'යි බියෙන් රාජපුත්‍රයෝ සිය නැගෙණිවරුන් පාවා ගෙන වෙසෙතැ යි සැළ කළහ. ඔක්කාක රජ එය අසා ප්‍රීතියෙන් ඉපිල ගියේ 'මගේ දරුවෝ සිය පරපුර රක්නට ශක්‍යයෝ යැ. ඔහු ශක්‍යයෝ (හැක්කෝ) යැ'යි උදන් ඇනීය. රජුහු කී 'ශක්‍ය' යන්න ම කපිල වාස්තුවේ වුසූ ඔක්කාක වංශයේ රජදරුවන් හඳුන්වන නාමය විය.

කපිල වාස්තුවේ පිහිටි පෙදෙසෙහි **ශාක** (තේක්ක?) ගස් බහුල බැවින් ඒ පෙදෙස ශාක්‍ය නම් වී යැයි ද කියති.

ස්වල්ප කාලයෙකින් කපිලවස්තු වාසී ශාක්‍ය කුමර කුමරියෝ ද කෝලිය වංශික කුමර කුමරියෝ ද ආවාහ විවාහ මගින් ඥාති සම්බන්ධයෙන් බැඳුණාහ. කපිලවාස්තු පෙදෙස ද ක්‍රමයෙන් විශාල විය. එක් පසෙකින් අචිරවතී නදිය තෙක් ම රට වැඩී විහිදී ගියේ ය. ශාක්‍ය කෝලිය දෙරට අතරින් ගලා ගිය රෝහිණී නදියෙන් දෙරටේ ම කෙත් වතු සශ්‍රීක විය.

පසු කලෙක ඔක්කාක වංශික රජුහු (ජන්තු රජුගේ පරම්පරාව) කෝශල දේශයෙහි ශ්‍රාවස්ති නගරය රාජධානි කොට ගත්හ. ශ්‍රාවස්තියෙහි රජුන් ඔක්කාක පරපුරට අයත් වුවද අන්‍යගෝත්‍රිකයන් හා ආවාහ විවාහ මගින් මිශ්‍ර ව සිටි බැවින් ශාක්‍යයෝ ඔවුන් පහත් කොට සැලකූහ.

## දෙවෙනි පරිච්ජේදය

මහාසම්මත සූර්ය වංශයෙන් ප්‍රභව වූ ශාක්‍ය රාජ පරම්පරාව අවිච්ඡින්න වැ දිගට ම පැවැත්තේ ය. කෝලිය රටේ කෝලිය වංශය ද එසේ ම විය. පසු කලෙක ශාක්‍යවංශික **ජයසේන** නම් ප්‍රබල රජෙක් ශාක්‍ය දේශයේ පාලක වැ කපිලවාස්තු පුරයේ විසී ය. එ සමයෙහි කෝලිය රටේ දෙව්දහ නුවර **දේව දහ ශාක්‍ය** නම් රජෙක් විය. ජයසේන රජුට **සිංහහනු** නම් පුතෙක් ද **යශෝධරා** (ලුම්බිනී) නම් දුවක් දැ යි දෙ දරු කෙනෙක් වූහ.

**ජයසේන** රජහු ඇවෑමෙන් **සිංහහනු** කුමර ශාක්‍යදේශයේ පාලකයා විය. හේ දේවදහ ශාක්‍යයා ගේ දියැණියන් වූ **කාංචනා** කුමරිය අග මෙහෙසිය කොට පාවා ගත්තේ ය. කෝලිය රටේ ද දේවදහශාක්‍යයාගේ ඇවෑමෙන් ඔහු පුත් **අංජන** (හෙවත් **මහාසුප්‍රබුද්ධ**) කුමර රජ විය. හේ සිංහහනු රජු ගේ නැහැණියන් වූ **යශෝධරාව** (හෙවත් **ලුම්බිනී කුමරිය**) අග මෙහෙසුන් කොට ගත්තේ ය.

**සිංහහනු** නම් ශාක්‍ය රජුට **ශුද්ධෝදන. ශුක්ලෝදන, ද්‍රෝණෝදන, අමෘතෝදන,** (අමිතෝදන) යැ යි පුත්තු සතර දෙනෙක් ද. **ශුද්ධා, ශුක්ලා, ද්‍රෝණා. අමෘතා** (අමිතා) යැ යි දියැණියෝ සතර දෙනෙක් ද වූහ.[1]

**ලුම්බිනී උයන** දෙව්දහ නුවරවැසි එක් සිටුවරයකු ගේ ශෝභන වූ මහ උයනෙක් විය. රජ පවුලේ අය ද නොයෙක් විට ගොස් උයන බලා ඇවිදිති. දවසෙක මහාසුප්‍රබුද්ධ රජ සිය බිසොව කැටුව ඒ උයන බලන්නට ගියේ ය. උයන් සිරි දුටු බිසොවට ඒ උයන අත්පත් කැර ගන්නට ආශාවක් ඇති විය. ඕ රජුට ඒ බව කීවා ය. රජ තෙම සිටුවරයා කැඳවා ඔහු ගේ උයන මිළයට ගන්නට කැමැත්ත පැවැසී ය. සිටුවරයා එය තමා කිසිසේත් නො විකුණන බව කීය. එ විට රජ දෙව්දහ නුවරට සමීප මහ වන පෙදෙසක් හෙළි පෙහෙළි කරවා යට කී සිටුහුගේ උයනටත් වඩා විශාල ද ශෝභන ද වූ උයනක් කරවා බිසොව නමින් 'ලුම්බිනී උයනැ'යි නම් කොට ඇයට තෑගි කෙළේය.

**අංජන** (මහාසුප්‍රබුද්ධ) රජුට රුසිරින් අගපත් ලුම්බිනී බිසොවගෙන් ඇය සේ ම දැකුම්කලු ශ්‍රී සෞභාග්‍යප්‍රාප්ත දූහු දෙදෙනෙක් වූහ. වැඩිමාලු දියැණියන් උපන් ටික දිනෙකින් ඇයට නම් තබනුයේ දුටුවන් මෝහනයට පත් කරවන රූපශ්‍රීයෙන් ශෝභිත බැවින් **මායා** යැ යි නම තැබී ය. හවුරුදු දෙක තුනකට පසු එවැනි මැ රුසිරින් හෙබි තවත් දුවක් ලැබිණ. එවිට පළමු දුවට **මහාමායා ගෞතමී** යි නම් කොට දෙවැනි දුවට මායාගෞතමී' යි නම් කෙළේය. මේ දෙදෙනා උපන් අළුත පිය රජු ජ්‍යොතිර්විද්‍යාඥ නිමිත්ත පාඨක බමුණන් ගෙන්වා ඒ කුමරියන් උපන් දින වේලාවල් ද ගත ලකුණු ද අනුව පලාපල කියත් නැ යි අයැදී යැ. ඔහු මැනැවින් ඒ සියල්ල පිරික්සා බලා මේ කුමරියන් දෙදෙනාම සක්විති රජ වන්නට තරම් පින් ඇති දරුවනට මවුන් වෙති යි පැවසූහ. බමුණන් ගේ ශාස්ත්‍ර අනුව දෙවෙනි දුව (මායා ගෞතමී) බොහෝ දරු කැලකට මවක වෙතැ යි කී බස අසා පිය රජ ඇගේ පළමු නම වෙනස් කොට "**ප්‍රජාවතී ගෞතමී**" යැ යි දෙවෙනි නමක් තැබී ය. පසුව ඒ දෙවෙනි නමින් ම ඕ ප්‍රසිද්ධ වූවා ය.

**ශුද්ධෝදන කුමරු**

සිංහහනු රජුහු ගේ දරුවන් අතුරෙන් වැඩිමහලු **ශුද්ධෝදන** (සුදෙවුන්) කුමරු රූප සම්පත්තියෙන් සේ ම ශූර වීර බැවින් අන් හැමට වඩා විශිෂ්ට විය. යුද්ධ ශිල්පයෙහි ද ප්‍රවීණ විය. වරෙක ශාක්‍ය රටේ පසල් දනව්වෙක මහ කැරැල්ලෙක් පැන නැංගේ ය. සිංහහනු රජු එය සංසිඳුවනු පිණිස තම දරුවන් යැවීමට අදහස් කෙළේ ය. ශුද්ධෝදන කුමරු හැර සෙස්සෝ පසු බැහ. ශුද්ධෝදන කුමරු බල සෙනඟක් ගෙන පසල් දනව්වට ගොස් කැරළිකරුවන්ගේ බලය බිඳ ඔවුන් තමන් යටතට ගෙන දනව්ව සංසිඳුවා පෙරලා කපිලවාස්තු පුරයට අවුත් පියරජුහු ඉදිරියේ පෙනී සිටියේ ය. රජ ඔහු කළ දෑ අසා බොහෝ පැහැද තමා කැමැති වරයක් ඉල්ලන්නැ'යි කී ය. සුදෙවුන් කුමරු **මහාමායා ප්‍රජාවතී** යන සිය මයිලනුවන්ගේ දූන් දෙදෙනා ගැන බමුණන් කී අනාවැකි අසා තිබුණෙන් කවරදා හෝ මේ දෙදෙනා ම පාවා ගන්නෙමි' යි ඉටා ගෙන

---

* බොහෝ පෙර දවස බමුණෝ අද වාක්‍ය නමින් ප්‍රකටව ඇති මහා පුරුෂ ලක්ෂණ විද්‍යාව අනුව ජීවිත ඵල කීහ. ප්‍රජාවතී ගෞතමී මහ දරුපිරිසක් ලබන තැනැත්තියකැ යි ඔවුන් කියේ, බොහෝ කලකට පසු ඇය පැවිදි වැ එයින් පසු පැවිදි වන සියලුම මෙහෙණින් ගේ ශාසනික මාතෘ (උපාධ්‍යායා) වන බව සැලකීමෙනැ යි පෙනේ.

සිටියේය. 'වරයක් ඉල්ලන්නැ'යි පියරජු කී බස අසා තමා ඉටු දැය සිදුකැරැ ගන්නට කාලය පැමිණියේ වනැ යි සිතා, සිය මයිලණුවන්ගේ දූන් දෙදෙනා ම පාවාගන්නට අවසර ඉල්ලී ය.

විශේෂයෙන් සැළකියැ යුතු කරුණක් නැති වැ, එක් භාර්යාවකට වැඩියෙන් බිරියන් තබා ගැන්ම ශාක්‍යවංශික රජුන් ගේ නීතියෙන් තහනම් වූ දැයෙක. එබැවින් සිංහහනු රජ රාජ සභාව කැඳවා පුතු ගේ ඉල්ලීම එයට ඉදිරිපත් කෙළේ ය. රාජසභාව සුදෙවුන් කුමරුගේ අදහස විචාරා එයට කී කරුණු විමසා බලා කුමරියන් දෙදෙනා ම පාවා ගන්නට අවසර දුන. **සිංහහනු** රජ **අංජන** රජුට පණිවුඩ යවා කැමැත්ත ගෙන ඔහු ගේ දූ කුමරියන් දෙදෙනා ම සුදෙවුන් කුමරුට පාවා දී යුවරජ තනතුර ද පත් කෙළේ ය.

සිංහහනු රජුහුගේ ඇවැමෙන් ශුක්ලෝදනාදී සොහොයුරු පිරිසත් ඇමැති මඬුල්ලත් එක් වැ **ශුද්ධෝදන** කුමරුට මහරජ තනතුර පැවරූහ. ශුඩෝදන රජතුමා ද සක්විති රජ කමට සුදුසු පුතකු පතා දෙවියන් යැදුම් ව්‍රත සමදාන ආදිය කෙරෙමින් දැහැමෙන් සෙමෙන් රට පාලනය කෙළේ ය.

# තුන්වැනි පරිච්ජෙදය

**තුන් කෝලා හල**

කල්ප කෝලාහලය. බුද්ධ කෝලාහලය, චක්‍රවර්ති කෝලාහල යැයි ලොවැ කෝලාහල (මහා උද්ඝෝෂණ) තුනෙකි. කල්ප විනාශයට හවුරුදු සිය දහසක් තිබියැදී කිසි කාමාවචර දෙවි කෙනෙක් මිනිස් වෙස් ගෙන විසුළ කෙහෙ ඇති වැ රත්පැහැ වස්ත්‍ර හැඳ පෙරෙවැ අතින් කඳුළු පිසිමින් හැඩූ මුහුණින් 'භවත්නි, මෙයින් හවුරුදු සිය දහසක් ගිය තැන ලොව වැනැසෙයි. බඹලොවැ තෙක් ම ලෝකය වැනැසී යන්නේ ය. එබැවින් මෛත්‍රී වඩවු කරුණාව වඩවු, මුදිතාව වඩවු, උපේක්ෂාව වඩවු, මා පියනට උවටන් කරවු. පවුලේ වැඩිහිටියනට ගරු බුහුමන් කරවු, පස් පවින් දස අකුසලින් වළකිවු' යන ආදීන් අවවාද කරන්නාහු ලොව පුරා හැවිදිති. මේ **කල්ප කෝලාහල** නමි.

ලොවුතුරා බුදු කෙනෙකු ලොවැ පහළ වන්නට හවුරුදු දහසක් තිබියැදී ලෝකපාලක දෙවිවරු මිනිස් වෙස් ගෙන මිනිස් ලොව පුරා හැවිදින්නාහු 'භවත්නි, මෙයින් හවුරුදු දහසක් ගිය තැන සර්වඥ බුදු කෙනෙක් පහළ වන්නාහ. උන් වහන්සේ දක්නා කැමැත්තෝ අකුසලින් වැළැකී කුසල් දහම් පුරත් වා'යි උද්ඝෝෂණ කෙරෙති. මේ **බුද්ධ කෝලාහල** නම් වෙයි.

චක්‍රවර්ත්ති රජක්හු පහළ වන්නට හවුරුදු සියයක් තිබියැ දී කාමාවචර දේවතා කෙනෙක් මිනිස් වෙස් ගෙන ලොව පුරා හැවිදින්නාහු 'භවත්නි, තව හවුරුදු සියයක් ගිය තැන සක්විති රජෙක් ලොවැ පහළ වන්නේ ය. මුළු පොළොව එක ම රජයකට යටත් කොට, සියලු වාද භේද නැති කොට. මිනිස්නට ද සිවුපා පක්ෂි ආදී තිරිසන් සත් කැලට ද හැම සැටියෙන් සුව පහසු සලස්වා, සියලු දෙනාට සැනැසුම් ඇති කොට, දැහැමෙන් සෙමෙන් රජය කරවන්නේ ය. ඔබ දක්නට කැමැත්තෝ අකුසලින් වැළැක කුසල් කෙරෙත්වා 'යි උද්ඝෝෂණය කෙරෙති. මේ **චක්‍රවර්ත්ති කෝලාහල** නම් වෙයි.

**දේවායාචනය** අප මහ බෝසතාණන් වහන්සේ **වෙස්සන්තර** අත් බැවින් සැව තුෂිත භවනයෙහි ඉපිදැ **සන්තුෂිත** (හෙවත් **ශ්වේතකේතු**) නමින් ප්‍රකට වැ වසන සේක. මේ අතර උන්වහන්සේට මිනිස් ලොවැ උපදනට හවුරුදු දහසක් තිබියැ දී, උඩැ කී පරිදි බුද්ධ කෝලාහල රාවය දෙව් මිනිස් බඹ යන තුන් ලොවිහි පැතිරිණ. එයින් බොහෝ දෙව් බඹුහු 'ලොවුතුරා බුදු වන මහතාණෝ කොහි දැ?' යි සොයා බැලීමෙහි උත්සුක වූහ. ඔහු තුෂිත දිව්‍යලෝකයෙහි වැඩවසන මහබෝසතාණන් දැක හැඳින ගත්හ. යට කියන ලද හවුරුදු දහස පිරෙන්නට ළං වැ තිබියැ දී ඔහු තුසීපුර බෝසතාණන්වෙත රැස්වැ වැඳ ගරුබුහුමන් දක්වා, 'නිදුකාණනි, දැන් ඔබට බුදුවනු පිණිස මිනිස් මවු කුසයෙක උපදනට කාලය පැමිණියේ යැ'යි සැළ කළාහ.

මහ බෝසතාණන් වහන්සේ ඔවුනට එක් වරම ප්‍රතිඥාවක් නොදී නිහඬ වැ විමසන්නාහු. '**කාල, දේශ, ද්වීප, කුල, මාතෘ** යනු කරුණු පස සම්පූර්ණ වැ ඇත් දැ'යි දිවැස යොමා බැලූහ.

හවුරුදු ලක්ෂයට වඩා පරමායුෂ ඇති සමයෙහි මිනිස්නට ආයු දික් බැවින් ලෙඩ රෝග නැති බැවින්, දුබික් ආදී දුක් නැති බැවින්. අනිත්‍යතාව දුඃඛතාව අනාත්මතාව පිළිගැන්වීම අසීරු වෙයි. පරමායුෂ හවුරුදු සියයට අඩු වැ ගිය සමයෙහි රාග ද්වේෂ ආදි කෙලෙස් බහුල වන බැවින් අවවාදයට නො නැමෙති. ඔවුනට කරන අවවාද දියෙහි ඇඳි ඉරි සෙයින් වහා මැකීයෙයි. එ බැවින් පරමායුෂ හවුරුදු ලක්ෂයටත් සියයටත් අතර කාලය ම බුදුවරුන් පහළ වන කාල සීමා ව යැ. මෙය විමසා බලන බෝසතාණන් වහන්සේ 'දැන් මිනිසුන්ගේ

පරමායුෂ සියය ය. එබැවින් මිනිස් ලොවැ උපදනට සුදුසු කාලයැ'යි දුටුහ.

ඊළඟට කවර මහද්වීයක ඉපැදියැ යුතු දැ?යි කවර පෙදෙසකැ ඉපැදියැ යුතු දැ?යි බලන සේක්, දඹදිව් හි ගුණවතුන් පිරි සරුසාර වූ මධ්‍ය දේශය උපදනට යෝග්‍ය ම රට යැයි දුටුහ.

රටේ කවුරුනුත් 'උසස් යැ'යි පිළිගත් කුලයෙකැ (-පවුලෙකැ) ඉපැද එහි සියලු යස ඉසුරු හැරදමා වාම් දිවි පෙවෙතට බැස ජාතිභේදදියට විරුද්ධ ව ද කම් සුවෙහි ගැලීමට විරුද්ධ වැ ද කරන දේශනාව හැම දෙනාගේ සිත් හි තදින් කා වැදෙයි. එවැන්නහුගේ වාම් ජීවිතය උසස් මැදුම් පහත් යන හැම තරාතිරමේ ම අයට මහත් ම ආදර්ශය වෙයි. එසේ කුලයේ සේ ම උසස් වූ පිරිසිදු චරිතයක් ඇති ගුණවත් පියකුගේ දරුවකු වීම ද ලෝ වැඩ කරන්නට ඉදිරිපත් වන්නහුට අවශ්‍ය දැයෙකි. එබැවින් මේ දෙ කරුණ ම විමසා බලනසේක්, එද දඹදිව හැම දෙනා විසින් උසස් මැ යැ යි ගෞරවයෙන් සලකන ලද ශාක්‍ය වංශය ද දඹදිව අන් රටවල රජුනට වඩා සැප සම්පතින් ආඪ්‍ය වූ ශාක්‍ය වංශිකයන්ගේ පාලක ශුද්ධෝදන මහ රජු ද දුටු සේක. ඊළඟට මව වීමට සුදුසු තැනැත්තියක් ඇත් දැ?යි විමසනුවෝ මුළු ලෝවැස්සාට ම මවක බඳු කරුණා ගුණ සම්පන්න, සිල්වත්, පිරිසිදු පැවැතුම් ඇති **මහාමායා ගෞතමී** දේවීන් දුටුහ.

බෝසතාණන් වහන්සේ මෙසේ කාල දේශාදි අවශ්‍ය කරුණු පහ ම සම්පූර්ණ වැ තිබෙනු දැක, 'කල් නොයාදී ම මිනිස් ලොවැ උපදිමි'යි වදරා දෙව් බඹ පිරිස පිටත් කළ සේක. ඉක්බිති මවු වන මහාමායා ගෞතමීන්ගේ ආයුෂ කාල සීමාව විමසා බලා, ඇයට ආයුෂය තව දසමසකුත් සත් දිනක් ඉතිරි වැ තිබියැ දී දෙව්ලොවින් ච්‍යුත වන්නට ඉටා ගත් සේක.

මෙසේ නියම කැරගත් අවස්ථාව පැමිණි සෙමෙහි පිරිවර දෙවියන් කැටුවැ තුසී පුර වූ නන්දන වනයට* වැඩියහ. එහි පිරිවර දෙවියන් විසින්, 'නිදුකාණන් වහන්ස, මෙයින් සුගතියට - මිනිස් ලොවට වඩින්නැ, බුදු වැ ලොකාචාර්යාවෙහි යෙදෙන්නැ'යි කියනු ලබන ආශිර්වාදත්මක ප්‍රිය කථාව අසන සේක් ම 'දැන් මෙයින් ච්‍යුත වෙමි'යි අධිෂ්ඨාන කළ සේක.

---

* හැම දෙව්ලොවෙක ම නන්දන නම් උයනෙක් ඇත.

# සතරවැනි පරිච්ඡේදය

**ඇසළ උළෙල**

දඹදිවැ හැම පෙදෙසෙක ම හවුරුද්දකට වරක් ඇසළ මසැ පැවැත්වෙන මහෝත්සවයෙකි. ඉහත කී පරිදි බෝසතාණන් දෙව්ලොවින් ච්‍යුතවන්නට සතියක් තිබියැ දී ද මේ උළෙල ඇරැඹිණ.

මේ උළෙල පැවැත්වෙන සමයෙහි හැම දෙනා ම පහන්දෙර නැඟීසිට ඉස් සෝද නා මනා ලෙස හැඳ පැළඳ සැරැසී උත්සවයෙහි යෙදෙති. ශුද්ධෝදන මහරජාණෝ ද ඉස් සෝද නා මිහිරි රජ බොජුන් වළඳා සිහසුන් අරා ඇමැති මඩුල්ල පිරිවර කොට ගෙන සිරි සැපත් විඳිති. රජ පවුලේ හැම දෙනා ද නොයෙක් ලෙසින් කෙළිදෙළෙන් කල් යවති. රටැ වැසියෝ මුළු රට ම එක් මැ මඟුල් ගෙයක සිරි ගන්වති. මෙසේ දින සයෙක් ගත විය. පළමු සදිනෙහි නකත්කෙළි සුවින් කල් ගෙවූ මහාමායා ගෞතමී තෝමෝ[2] සත්වන ද පහන්දෙරින් මැ නැඟී සිට ඉස් සෝද නා වෙන ද සේම රජ ගෙදරට රැස් වැ සිටි දුගී මඟී යාචකාදීනට ආහාරපාන වස්ත්‍රාදියෙන් සංග්‍රහ කොට යැවූවා ය. ඉක්බිති තොමෝ සිය නැහෙණියන් වූ ප්‍රජාවතී ගෞතමිය ද රජගෙහි වෙසෙන සෙසු කාන්තාවන් ද සමග බොජුන් වළඳා එයට පසු සහ පිරිවරින් රජුගේ උයනෙහි වෙසෙන **අසිත දේවල** සෘෂීන් වෙත එළැඹියා ය. වැඳපුද ඔබ වෙතින් පෙහෙවස් සමාදන් වූවා ය. එයින් පසු සිය පහයට අවුත් ධර්මසංවාදයෙන් ද මෛත්‍රීභාවනාදියෙන් ද මුළු දහවල ගෙව්වා ය. රෑ නිදන කාලය පැමිණියෙන් සිරියහනැ සැතැපී තමා වැඩූ ගුණ දහම් මෙනෙහි කෙරෙමින් මැ නින්දට බටුවා ය. මෙසේ නිදගත් දේවී තොමෝ පශ්චිම යාමයෙහි පුදුම සිහිනයක් දුටුවා ය.

**මහාමායා දේවින් ගේ සිනය**

'සතර වරම් දෙව් රජ්හු අවුත් බිසොව, හොත් යහන පිටින් ම ඔසොවා ගෙන ගොස් හිමාලය පර්වතයේ සිරියල් ගල් තලාවෙක මහ සල් රුකක් මුල තබා පසකට වී සිටියාහ. එවිට ම ඔවුන් ගේ දේවීහු එහි අවුත් මහාමායා දේවීන් අනෝතත්ත විලට කැඳවාගෙන ගොස් නාවා දිව සළු හඳවා දිව සුවඳ විලෙවුන් ගල්වා දිව මල්පලඳවා සමීපයේ රිදී පර්වතයෙක වූ රන් පහයකට ගෙන ගියා හ. එහි බටහිර දෙසට සිරස ලා සැතපෙන ලෙසට යහනක් පණවා ඇය එහි සැතැප්වූහ. මේ අතරැ දැකුම්කලු

සුරතල් සුදු ඇත් පැටියෙක් සමීපයේ වූ රන් පව්වෙහි හැව්ද එයින් බැස රිදී පව්වට නැඟ හැව්දිනුයේ උතුරු පැත්තෙන් අවුත් සොඬින් සුදු පියුමක් ගෙන දේවීන් සැතපෙන රන් විමනට වැදුණේ ය. එයින් පසු ඇය සැතැපෙන යහන වටා තුන් වරක් හැව්ද ඇගේ දකුණැලයට ළං වීය. ඉක්බිති ඇය කුසට පිවිසියාක් මෙන් විය.[3]

මෙ ස්වප්නයෙහි ඇත් පැටියා ඇය කුස පිවිසියා සේ දැනුණේ මහ බෝසතාණන් තුසී දෙව්ලොවින් සැව දේවීන් කුස පිළිසිඳ ගත් වේලෙහි ය.[4]

පසු ද උදසන දේවී තොමෝ රජු කරා ගොස් තමා දුටු සීනය පැවසුවා ය. රජ තෙම වේදවේදංගයන්හි සමත් බමුණු පඬිවරුන් සූ සැටක් කැඳවා ආහාර පානාදියෙන් සංග්‍රහ කොට, ඉක්බිති බිසොව දුටු සීනය දන්වා 'එය කුමක් නිසා පෙනුණු එකක් දැ?'යි විචාළේ ය. ඔහු එය ගැන සාකච්ඡාකොට කියන්නාහු. 'මහරජාණනි, ඔබ ගේ දේවිය කුසැ දරුවෙක් පිළිසිඳගෙන ඇත. හේ පුතෙකි. හේ සක්විති රජක්හු වන්නට හෝ ලොවුතුරා බුදු වන්නට හැකි මහ පිනැත්තෙකි'යි පැවසූහ. මව කුසැ පිළිසිඳගත් මහ බෝසතාණෝ සුවසේ වැඩුණාහ. මෑණියෝ කිසිදු රෝගාදී පීඩාවෙකින් නොපෙළී සුව සේ කල් යැව්වාය.[5]

**ලුම්බිනි ගමන**

දරු ගබට දස මස පිරෙන්නට ළං විය. දේවී මාපියන් වෙතට දෙව්දහ නුවරට යන්නට අදහස් කොට ඒ බව සුදෙවුන් රජුට දැන් වූවා ය. දෙව්දහ නුවරට වැඩි දුරෙක් නැත. කපිලවාස්තුව රෝහිණී නදියෙන් මෙ ගොඩ ය. එගොඩැ ලුම්බිනී උයනට ටිකක් එපිටින් දෙව්දහ නුවර පිහිටියේ ය.

සුදෙවුන් මහ රජතුමා 'එන පසොළොස්වක් ද මහාමායා දේවීන් එහි එතැ'යි දන්වා අංජන රජු වෙතට දූතයෙකු යැවී ය. යන මග දිගට ම සැරසැවී ය. නියමිත දිනයෙහි දේවිය රන්සිවි ගෙයක නංවා ක්ෂත්‍රිය කාන්තාවන් පිරිවර කොට දී ඇමැතියන් ගේ රකවරණ ඇති කොට මහ පෙරහැරින් දෙව්දහ පුර කරා යැවී ය. මෙසේ ගමන් ගත් පිරිස **රෝහිණී** නදිය ද තරණය කොට යන්නාහු **ලුම්බිනී** උයන සමීපයට පැමිණියහ. දෙව්දහ පුරයෙන් ද දේවීන් පිළිගැන්මට මහත් නැදෑ පිරිසෙක් ලුම්බිනිය වෙත අවුත් පොරොත්තු වැ සිටියා හ.

මෙ දවසැ ලුම්බිනී උයන මල් පල බරින් බර වූ වෘක්ෂලතාවන් ගෙන් ශෝභාසම්පන්න වූයේ අතිසයින් බැබැළිණ. එහෙ මෙහෙ පියාසර කරන

තැන තැන රැව් පිළිරැව් දෙන ගිරා මොනර ආදි පක්ෂීන් ගේ හඬින් ද මල් රොන් ගනිමින් හැසිරෙන බඹරුන්ගේ ගුමු ගුමු හඬින් ද උයන් පෙදෙස ඒකනින්නාද විය. සුගන්ධ මන්දමාරුතයෙන් මුළුපෙදෙස ම සුගන්ධිත වූයේ ඉතා රම්‍ය විය.

සමීප මාර්ගයෙන් යන පෙරහැර දෙව්දහ නුවරින් ආ නෑදෑ පිරිස විසින් පිළිගැනිණ. මේ අතර ම මහාමායා දේවී උයන් සිරි දැක එහි යන්නට කැමැත්ත පළ කළා ය. ඇය කැටුව ම පෙරහැර ලුම්බිනී උයනට පිවිසියේ ය. මහාමායා දේවී රන්සිවි ගෙයින් බැස සිය නැහැණියන් ආදි ක්ෂත්‍රියාවන් හා සෙසු සේවක සේවිකාවන් හා උයන් සිරි බලා හැවිදිනී මුලසිට අග දක්වා මලින් සැදුණු මහල් සල් රුක[6] දැක එහි ගියා ය. අත්තක් අල්ලා ගනු කැමැත්තී දකුණත දිගු කළාය. සල් අත්ත නැමිණ. එය අල්ලා ගත්තී ය.

**බෝසත් උපත**

එකෙණෙහි ම කම්ජවාතය සැලිණ. මායා දේවී තමාට ප්‍රසව අවස්ථාව පැමිණි බව ළඟ සිටියවුනට දැන්නුවාය. ඔහු ඇමතියනට සැළ කළහ. සියල්ලෝ එක් වැ වහාම යහනක් පණවා වට තිර ඇද සේවිකාවන් ළඟ නවත්තා තුමූ තිරයෙන් පිටත ඇත් වැ රකවරණ ලා සිටියහ. මඳ වේලාවෙකින් බෝසතාණෝ මව කුසින් බිහි වූහ.[7] මේ මොහොතෙහි හිරු වටා වණීවත් චක්‍රයක් කරකැවෙන්නා සේ දශීනයෙක් වීය. දෙතිස් පෙර නිමිති පහළ විය. ක්ෂණයක් මුළු ලෝදැහි ම සියලු දුක් කරදර නිවී ගිය බවෙක්, මහා ශාන්තියෙක් පැවැතිණ. මෙය වූයේ කලියුග වර්ෂයෙන් 2478 වන්නෙහි වෙසක් පුණු පෝද උදයාදි එකොළොස් වන පැය පමණේ දිය.[6]

**මාතංග පසේ බුදුන් පිරිනිවීම**

මෙ සමයෙහි රජගහ නුවර ඉසිගිලි පව්වෙහි මාතංග නම් පසේ බුදුවරයෙක් විසී ය. බෝසතාණන් උපන් කෙණෙහි ඔබ දක්නට එන දේවතාවෝ ඒ පසේ බුදුරජුන් වෙත ද ගියහ. ශොස් 'වහන්ස, ලොවුතුරා බුදුවන බෝසතාණෝ උපන්හ. අපි උන්වහන්සේ දක්නට යම්හ' යි කියා වැඳ අවසර ගෙන නික්මියාහ. ඔවුන්ගේ කථාව ඇසූ පසේ බුදු රජුහු තමන් ගැන විමසනුවෝ තමන් ආයුෂ කාලය ද නිමියේ යි දුටුහ. ඉක්බිති උන්වහන්සේ හිමවත්හි මහාප්‍රපාත පර්වතයට වැඩ පිරිනිවන් පෑහ. මේ, මෙ අතුරුකපැ අන්තිම පසේබුදු රජු යැ.

**දේව සන්නිපාතය**

බෝසතාණන් මව කුසින් බිහි වූ කෙණෙහි දෙවියෝ ලුම්බිනී උයනෙහි රැස්වූහ. ඔවුන් අතුරෙන් සතර දෙනෙක් බඹහු මව කුසින් බිහිවූ බෝසතාණන් රන් දැලින් පිළිගත්හ. ඔවුන් අතින් වරම් රජුහු ද* ඔවුනතින් ඇමතියෝ ද ඔබ පිළිගත්හ.

බෝසතාණන් වහන්සේ ඇමැතියන් අතින් බිමට බැස පියුම් පිට සත් පියක් වැඩ සත්වන පියවරෙහි සිටැ

**'මම ලොවට අග්‍රයෙමි, ජ්‍යෙෂ්ඨයෙමි,**
**ශ්‍රේෂ්ඨයෙමි, මේ මගේ අන්තිම අත්බව ය.**
**මෙයට පසු මට භවෝත්පත්තියක් නැතැයි'**
වදාළාහ.+

**පෙරළා කිඹුල්වත් පුරයට යැම**

මෙයට පසු, කිඹුල්වත් පුරයෙන් ද දෙව්දහ නුවරින් දැයි දෙපෙදෙසින් ම එක්රැස් වැ සිටි නෑදැයෝ බෝසතාණනුන් මැණියනුත් මහ පෙරහැරින් කිඹුල්වත් පුරයට වැඩම කැරවූහ.[10]

# පස්වැනි පරිච්ඡෙදය

**අසිතර්ෂින් පැමිණීම**

ශුද්ධෝදන රජතුමා ළපැටි වියෙහිදී සිප්සතර උගත්තේ එවකට **සිංහහනු** රජුහට පුරෝහිත වැ සිටි **අසිතදේවල** නම් බමුණු පඬිවරයා ගෙනි. සිංහහනු රජු කලුරිය කළ නොබෝ කලෙකින් හේ තවුස් පැවිද්දෙන් පැවිදි වැ රජගෙට නොදුරු උයනේ වැස ධ්‍යාන වඩා පංචාභිඥා හා අෂ්ට සමාපත්තීන් ඉපදැවීය. හෙතෙම කිසි විටෙක දෙව් ලොව ගොස් කිසි කෙනෙකු නැති ශුන්‍ය විමානයෙක රැඳී සමවත් සුවයෙන් කල් යවයි.

බෝසතාණන් වහන්සේ උපන්දා ද එ තුමාණෝ පෙර වරුයෙහි රජගෙහිදී දන් වළඳා තව්තිසා දෙව්ලෝ වැඩ කිසි ම කෙනකු නැති ශුන්‍ය දිව්‍ය විමානයෙක ධ්‍යාන සමාපත්තියෙන් කල් ගෙවී ය. වික

* උපන් කෙණෙහි බෝසතුන් පිළිගත් අය නම් කිරිමවුන්ගේ වෙසින් එහි අවුත් සිටි බ්‍රහ්මයොත් දෙවියෝත් යැ යි සමහර මහායාන පොත්හි දැක්වේ. ඒ දෙවිබඹුන් එහි සිටි කිරිමවුනට ආවිෂ්ට වැ මෙසේ බෝසතාණන් පිළිගත්හයි ද විවරණ කෙරෙති.

\+ උපන් කෙණෙහි කථා කළ අය තවත් ලොව වූහ. උපග්‍රන්ථය අංක 10 බලනු.

වෙලාවකට පසු (දඹදිවට සවස් වූ වේලෙහි) සමාපත්තියෙන් නැඟී සිටියහ. වටපිට බලනුවෝ ගැයුම් වැයුම් ආදියෙන් සැණකෙළි කෙළනා දෙවියන් දුටුහ. දැක එයට කරුණු විචාළාහ. 'බුදුවන මහ බෝසතාණන් වහන්සේ අද කිඹුල්වත් නුවර ශුද්ධෝදන රජුගේ අගබිසෝ වූ මහාමායා දේවීන් කුසින් බිහි වූහ. එ හෙයින් මෙසේ සැණ කෙළි පවත්වම්හ' යි දෙවියෝ කීහ. තවුසාණෝ එය අසා වහා ම දෙව්ලොවින් නික්ම කිඹුල්වත් පුර පැමිණ සුදොවුන් මහරජුගේ මාලිගාවට වැඩියාහ. රජතුමා වඩිනා තවුසාණන් දැක වහා අසුන් පණවා ඉදිරියට ගොස් වැඳ රජගෙට කැඳවා ගෙනවුත් අස්නක් පිළිගැන්වී ය. තවුසාණෝ හිඳගත්තාහු ම 'මහරජ, තොපට පුතෙක් උපන්නේ ලු. ඔබේ ඒ පුත්‍රයාණන් 'දක්නා කැමැත්තෙන් ආම්හ' යි සැළකළහ.

රජ තෙම මහාමායා දේවීන් හොත් ගබට ගොස් 'ආචාර්යයන් වහන්සේ, අප පුතාණන් දකිනු රිසින් අවුත් හිඳිති' යි කියා බිසොවට සැළකොට කුමරුවාණන් වඩා ගෙන තවුසාණන් වෙත ආයේ ය. මහාමායා බිසෝ ආදී කවුරුත් අවුත් තවුසාණන් වැඳ පසෙක සිටියාහ. රජතුමා පුත් කුමරුවා තවුසාණන් ළඟට ගෙන ගොස් 'පුතා තාපසයාණන් වහන්සේ වැඳ පින් සිදු කැරගන්නැ' යි කියා තවුසා දෙසට කුමරුවා යොමු කෙළේය. එකෙණෙහි ම පුත් කුමරුවාණන් ගේ සිරිපතුල් දෙක එසැවී තවුසාණන් ගේ හිසැ ජටාමඩුල්ල මත පිහිටියේය. අසිත තවුස් තුමාණෝ දෙවියන් කී වචන ද සිහි කොට අනාගතාංශඥානයෙන් ද බලනුවෝ 'මේ ලොවුතුරා බුදු වන මහා උතුමාණෝ යැ' යි දුටුහ. දැක වහා අස්නෙන් බැස කුමරුවාණන් ගේ දෙපා තමන් හිස මත්තෙහි තබා ගෙන වැන්දාහ. තමන් හැම දෙනා ගෙන් ම වැඳුම් ලබන තවුසාණන් කළ දැ දුටු රජු ද මහාමායා දේවී ද රැස් වැ සිටි සෙසු හැම දෙනා ද මහත් පුදුමයට පත් වූහ.

තවුසාණෝ කුමරුවාණන් වඩාගෙන ශරීර ලක්ෂණ ද විමසනුවෝ දෙතිස් මහා පුරිස් ලකුණු දුටුහ. දැක සිනහ පහළ කොට මඳක් නිහඬ වැ හිඳ හැඬූහ. ඍෂීන්ගේ සිනාවත් හැඬීමත් දුටු සියල්ලෝ කැලඹුණහ. 'ඔබවහන්සේ සිනාසී හැඬුයේ මන්ද? කුමරුවනට සැපත සේ ම විපතකුත් වෙති දෝ?' යි විචාළහ.

තවුසාණෝ කියන්නාහු 'මෙතුමාණෝ මතු බුදු වන්නාහ. එය දැක්මෙන් හටගත් ප්‍රීතිය නිසා සිනහ පහළ විය. 'මෙතුමාණන් ගේ

බුඩශ්‍රීය දැක්කහෙම්දැ?' යි අනාගතාංශඥානයෙන් බැලූ විට මා තව ටික කලෙකින් මැරෙන බව ද බෝසතාණන් ලබන බුදුසිරි දකින්නට නොලැබෙන බවද[11] දුටුයෙමි. මුල් කරුණින් සිනහව ද දෙවෙනි කරුණින් ශෝකය ද ඇතිවී යැ' යි තවුසාණෝ පැවසූහ. තවුසාණන් වඳිනු දුටු රජතුමා ද පුත්‍රයාණන් ගේ දෙපතුල් නලළ මතැ තබාගෙන නමස්කාර කෙළේ ය.

**නාලක පැවිද්ද**

ටික වෙලාවෙකින් පසු රජ ගෙයින් නික්මුණු තවුසාණෝ සිය නැහැණියන්ගේ ගෙට ගියහ. තමන් බැහැණනු නාලක බමුණු කුමරුවා[12] බණවා' පුතා, ශුඬෝදන රජුට උපන් පුත්‍රයාණෝ වයස තිස්පහ වන විට ලොවුතුරා බුදු වන්නාහ. නුඹ අද ම එතුමාණන් නමට පැවිදි වන්න. එ තුමාණන් බුදු වූ පසු එහි ගොස් දෙන අවවාද පරිදි පිළිපැද දුක් කෙළවර කරන්නැ' යි කියා එතැනින් නික්මැ ගියාහ. එදාම නාලක කුමරු කඩ වීදියට කෙනකු යවා කසාවතුත් මැටි පාත්‍රයකුත් ගෙන්වා ගෙන කෙහෙ රැවුලු බහවා ගෙන කසාවත් හැඳ පෙරෙවැ පාත්‍රය උරේ එල්ලාගෙන බෝසතාණන් දිශාවට දොහොත් මුදුන් තබා වැඳ ගෙන 'මගේ මේ පැවිද්ද ලොවැ අසහාය මහතාණන් උදෙසායැ' යි කියා උද්දිස්සක පබ්බජ්ජායෙන් පැවිදි විය. ඉක්බිති මැණියන් ගෙන් සමුගෙන හිමවත් පෙදෙසට ගොස් තපස් කෙළේ ය. මහ බෝසතාණන් උදෙසා පැවිදි වූ පළමු ම තැනැත්තා මේ **නාලක** කුමරාය.[12]

# ස වන පරිච්ඡේදය

**නාමකරණ මංගලය**

බෝසතාණන් වහන්සේ ඉපිද පස්වැනි දවස විය. සුදොවුන් රජතුමා පුත්‍රයාණන්ගේ ශරීර ලක්ෂණ පිරික්සැවීමට ද නමක් තැබ්වීමට ද අදහස් කෙළේ ය. මෙසේ හේ උගත් බමුණන් එක්සිය අට දෙනකු ගෙන්වා අන්නපානාදියෙන් සත්කාර කොට, තමා ඔවුන් ගෙන්වූ කාරණය සැළ කෙළේ ය. ඔහු ද 'මැනැවැ' යි ගිවිසැ තුමූ ම සාකච්ඡා කොට තම පිරිසෙහි වූ අග්‍ර ම පඬිවරුන් අට දෙනාට ඒ කාර්යය පැවරූහ. ඒ අට දෙනා වනාහි **රාම ධජ ලක්ඛණ මන්ති කොණ්ඩඤ්ඤ භෝජ සුයාම සුදත්ත** යන බමුණෝය.[13]

ඔහු බෝසතාණන්ගේ ගත ලකුණු විමැසූහ. තමන් දත් ශාස්ත්‍රය පරිදි සිය නිගමනය පැවැසූහ. 'මේ කුමාරයාණෝ ගිහිගෙයි රැඳෙන්නාහු

නම් මුළු පොළොව ම පාලනය කරන සක්විති රජෙක් වන්නාහ. ඉදින් ගිහි ගෙයින් නික්ම ගියෝ නම් පැවිදි ව ලොවුතුරා බුදු වන්නාහ' යි ඇඟිලි දෙකක් ඔසොවා **රාම ධජ ලක්ඛණ** යන තිදෙන කීහ. එහෙත් අනිත් **මන්ති කොණ්ඩඤ්ඤ භෝජ සුයාම සුදත්ත** යන පස් දෙනා කුමාරයාණන්ගේ ගත ලකුණු බලා එකැඟිල්ලක් ම ඔසොවා, 'මහරජාණනි, අප දන්නා ශාස්ත්‍රය අනුව නම් මෙතුමාණෝ කිසිසේත් ගිහිගෙයි නොරැඳෙන්නාහ. ගිහි ගෙන් නික්ම පැවිදි වැ ලොවුතුරා බුදු වන්නාහු මැයැ' යි නිශ්චිත කොට කීහ. ඉක්බිති 'පුතකු ලබම්හ' යි බොහෝ කලක් රජහු බලාපොරොත්තු වූ අර්ථය සිඬ කළ බැවින්*, සිඬ කළ අභිමතාර්ථය ඇත්තේ ය' යන අදහස අනුව, 'සිඬාර්ථ' යන නම දුන්හ.[14]

'මගේ පුත්‍රයාණෝ කරුණක් නැති ව ගිහිගෙය හැර නො යති. කිමෙකින් කලකිරී ගිහිගෙය හැර දමා යන්නෝ දැ?' යි රජ ඇසී ය. බමුණෝ තමන් උගත් මහා පුරුෂ ලක්ෂණ විද්‍යාව[15] අනුව විමසන්නෝ 'මහල්ලකුත් ලෙඩකුත් මිණියකුත් පැවිද්දකුත් දැක ම ගිහි ගෙය හැර යන්නාහ' යි කීහ. පුත්‍රයාණන් සක්විති රජක්හු වී සිටිනු දක්නට ම අපේක්ෂා කළ රජ තුමා 'ඒ පෙර නිමිති දැක්ම වැළැක්වූ විට ගිහිගෙයි ම රැඳෙතැ'යි සලකා එසේ කරන්නට ඉටා ගත්හ.

එතැන් සිට බෝසතාණෝ ගෝත්‍ර නාමයත් සහිත ව **සිඬාර්ථ ගෞතම** නමින් ප්‍රකට වූහ.

**මහාමායා දේවීන් කලුරිය කිරීම**

බෝසතාණන් උපන් දා සිට මහාමායා ගෞතමී තොමෝ කිසිදු වෙහෙසක් දුකක් නැති වැ සැපයෙන් කල් යැවූවාය. ඕ අසිත සෘෂීන් විසින් ද ලක්ෂණ පාඨක බමුණන් විසින් ද තමන් පුත් කුමරුවාණන් පිළිබඳ වැ කී අනාවැකි නිතර සිහි කරන්නී, සිය නැගණියන් වූ ප්‍රජාවතී ගෞතමී ආදි නැදෑ කාන්තාවන් හා ඒ ගැන ම කතා කරන්නී මහත් මැ ප්‍රීතියෙන් කල් ගෙව්වා ය. මෙසේ බලවත් ම ප්‍රීතියෙන් සතුටින් කල් යවන්නී සතිය ගෙවුණු සත්වැනිදා රැයෙහි ඇසි පියා ගත්තී යළි මේ සිරුරෙන් නොමැ නැගිට්ටා ය. තුෂිත දිව්‍ය ලෝකයෙහි සොළොසැවිරිදි දෙව් කුමරක්හුගේ බඳු වූ දිව්‍ය ශරීරයක් ඇති වැ ඇස් හැරියා ය. හෙවත් දෙව් ලොවැ

* ලොවට මහත් අර්ථයක් සිදු කිරීම පිණිස උපන් හෙයින් සිඬාර්ථ යැ යි නම් කළ හැයි පාළි අටුවාහි දැක්වේ.

දෙව් පුතෙක් වැ උපන්නා ය. හේ දෙවියන් අතර **මාතෘ දේවපුත්‍ර** (මව් දෙව්පුත්) නමින් ප්‍රකට වූයේ සියලු දෙවියන්ගේ මහත් ආදර ගෞරවයට පාත්‍ර විය.

**කිරි මවුන් සෙවීම**

සුදෙවුන් මහරජතුමා තම පුත්‍රයාණන් රැක බලා ගන්නට කිරි මවුන් සෙවී ය. කිරි මවු තනතුරට හොබනා ගුණාංග ඇති රාජ වංශික කාන්තාවන් සමූහයක් තෝරා ගෙන කුමරුවාණන් ඔවුනට පැවරුයේ ය.

**වප්මගුල් උළෙල**

බෝසතාණන් ඉපිද පස් මසෙක් ගත විය, මෙ සමයෙහි කිඹුල්වත් නුවර රෝහිණී ගඟ අද්දර දිගට ම පිහිටි රජුට අයත් විශාල කුඹුරුයායේ වාර්ෂික හීහෑමේ මහ උළෙලට කාලය විය. මඟුල් නඟුල අත තබා එය ඇරැඹීම ශුඩෝදන රජුට පැවරුණේ ය. උළෙල බලන්නට රැස්වන ජනයා සුදු වතින් සැරැසී සුදු මල් පැලැඳ එති. මහරජු ද රජගෙහි තව බොහෝ ජනයෝ ද එහි යන්නට සැරසුණහ. රජු ද පුත් කුමරුන් කිරිමවුන් බාරේ රන් සිවිගෙයෙකින් ගෙන්වාගෙන පිටත් විය. කුඹුර අද්දර මහ කමතේ වූ මහ දඹගස් සෙවණේ වට තිර අදවා උඩුවියන් බඳවා ඇඳෙක කුමරුන් හොවා රැක බලාගන්නට කිරි මවුන් නවතා රජතුමා කුඹුරට බැස රන් නඟුලක අත තබා සුබ මොහොතින් වැඩ ඇරැඹීය. සේවකයෝ ගී ගයමින් හී හෑම පැවැත්තුහ. මඳ වේලාවකින් එය බලන්නට කිරි මව්වරු ද තිරයෙන් පිටත ආහ.

මෙ වේලෙහි බෝසතාණෝ ළඟ කිසිවකුත් නැති නියාව දැක නැගිට ඇඳෙහි ම පළක් බැඳගෙන අනාපාන සතිය වඩා ප්‍රථම ධ්‍යානයට සමවැද හුන්හ. මඳ වේලාවකින් කිරිමවුහු තිරයෙන් ඇතුළට ගියාහු බෝසතාණන් වැඩ ඉන්නා නියාව දැක මවිත ව වහා ගොස් රජුට දැන්වූහ.

රජ අවුත් කුමරුන් උන් සේ දැක විස්මිත වැ උපන් බලවත් සෙනෙහස දරා ගත නො හැකි වැ කුමරුන්ගේ පතුල් ළඟ ඉස තබා ගෙන 'පුතා නුඹ අද ම බුදු වූ යෙහිදැ' යි කියමින් වැන්දේ ය.[17]

මඳ කලකට පසු ප්‍රජාවතී ගෞතමී (මහාමායා දේවින් ගේ බාල සොහොයුරී ද පුතකු වැදුවා ය. රජ තෙම බෝසතාණනට සෙයින් එ කුමරුට ද ශරීර ලක්ෂණ පිරික්සැවීම් ආදිය කරවා හැම දෙනා ම සතුටු කරවමින් උපන් බැවින් **නන්ද** යන නම තැබීය. නන්ද කුමරු උපන්

පසු ඔහු ගේ මවු වූ ප්‍රජාවතී ගෞතමී තොමෝ කලුරිය කළ වැඩිමහල් සොහොයුරිය ගේ දරු වූ සිඬාර්ථ (සිදුහත්) කුමාරයාණන් තමා ගේ බාරයට ගෙන තම පුත් **නන්ද** කුමරුවා කිරි මවුනට පැවරුවාය. සිඬාර්ථ කුමරු සුළු මවුගේ තනෙන් කිරි බී වැඩුණේ ය. නන්ද කුමරු උපදනට හවුරුදු දෙකකට පමණ කලින් ද ඇයට ලැබුණු **නන්ද** නම් දුවක් ද සිටියා ය. නන්ද සිඬාර්ථ නන්ද යන දරු තිදෙනා ගේ ම මවු වශයෙන් වුසු ඇයට දරුවන් ඇති **ගෞතමී** යන අර්ථය අනුව **ප්‍රජාවතී ගෞතමී** (ප්‍රජාපතී ගෝතමී) යන නම සුදුසු ම විය. ළදරු වියේ සිට ම සිඬාර්ථ කුමාරයනට මව ගේ මරණය කිසිසේත් නො දැනෙන ලෙසටද ප්‍රජාවතී ම එතුමන් ගේ ද මෑණියෝ මැ යැ යි හැඟෙන ලෙසට ද රජ පවුලේ සියල්ලෝ ම කතා බස් ආදි හැම එකෙක දී ම පරිස්සමින් ක්‍රියා කළහ. මෙසේ බෝසතාණන් වහන්සේ ද නන්ද කුමරු ද ඒ දෙදෙනාට ම වැඩිමාලු වූ නන්ද කුමරි ද යන තුන් දරුවෝ ඔවුනොවුන් කෙරෙහි මහත් සෙනෙහසින් කෙළිදෙළෙන් සුවසේ වැඩුණහ. සිඬාර්ථකුමාරයාණට සේ ම නන්ද කුමරුට ද පිරිවර වශයෙන් තෝරා ගත් ශාක්‍යවංශික කුමරුවන් ද මහ පිරිසෙක්[18] නිතර රජ ගෙය ඇසුරු කෙළේ ය.

**සිප් සතර ඉගැන්ම** [18]

සිය දරුවනට සිප් සතර ඉගැන්මට කාල යැ යි සැලකූ ශුඬෝදන රජ තුමා සුදුසු ඇදුරක් හු සොයනුයේ, එද පැවැති හැම සිප් සතරෙහි ප්‍රවීණ **සර්වමිත්‍ර** (විශ්වාමිත්‍ර)[19] නම් බමුණු පඬිවරයා ගැන අසා ඔහු ගෙන්වා මාළිගාවෙහි ම රඳවාගෙන සිදුහත් කුමරු නන්ද කුමරු ආදී රජ පවුලේ දරුවනට ඉගැන්වීම සිදු කැරැවීය. ඔවුන් අතුරෙන් සිදුහත් කුමරුවාණෝ කල්නොයා දීම ඇදුරු බමුණා දත් සියලු සිප් සතර උගත් හ.*[20]

**ළමාවිය**

සිය මල් **නන්ද** කුමරු ද තවත් ශාක්‍ය කෝලිය කුමාරවරු ද ඇමැති පුත් **කාලුදයි වත්ස** ආදි හු ද රියැදුරු පුත් **ඡන්න** ආදිහු දැයි බෝසත් සිදුහත් කුමරාණන්ගේ බොහෝ මිතුරෝ වූහ. කිසිවිටෙක **දේව දත්ත** (දෙව්දත්) කුමරු ද සිදුහත් කුමරාණන්ගේ කෙළිමඬලට එයි.

---

* මෙසේ සිප් සතර උගත් සිදුහත් බෝසතාණෝ බ්‍රාහ්මී නම් විශේෂ අකුරු වගයක් අමුතුවෙන් නිපැදවූහ යි ක්‍ෂෙමේන්ද්‍ර පඬිහු කළ අවදාන කල්පලතාපල්ලවයෙහි දැක්වේ. අශෝක රජ භාවිත කෙළේ ඒ අකුරු ය. පසුව අශෝකාක්‍ෂර නමින් ද ඒවා හැඳින්වුණහ.

**දෙව්දත් කුමරුගේ අරගල** හෙතෙම ක්‍ෂත්‍රියමානයෙන් මත් වූවෙකි සැඩ පරොස් පුද්ගලයෙකි. සිද්ධාර්ථ කුමාරයාණන් ඡන්න ආදී සේවකයන් ගේ දරුවන් හා මිත්‍ර ලීලාවෙන් ගැවැසෙනු හේ නො ඉවසයි. තමාට පහත් අය හා සමාගම් නොපවත්වන්නැයි හේ බෝසතාණනට කියයි. බෝසතාණන්වහන්සේ ඔහු ගේ බසට කන් නො දෙති. එවිට දෙව්දත් කුමරා සුදෙවුන් මහරජුන් වෙත ගොස් 'සිදුහත් කුමරු පහත් කුලවලැ අය හා සමානයන් හා සේ එක් වැ ගැවසෙතැ'යි පැමිණිලි කෙරෙයි. බෝසතාණන්ගේ සැටි දන්නා රජ තුමා එයට කිසිවක් කියා ඔහු අස්වසයි.

**හංසයා ඇරැබ නඩුව** දවසෙක බෝසතාණෝ තමන්ගේ කෙළිමඬලෙහි සිට එන්නාහු තමා ඉදිරියෙහි කිසිවක් වැටුණා දැක දිවැ ගොස් බැලූහ. ඒ අත හැන්දෙක ඊයක් ඇනී බිමැ වැටුණු හංසයෙකි. බෝසතාණන් වහන්සේ වහා ම ඊය ගළවා දමා ඌ රැගෙන රජගෙය දෙසට ගියහ. දෙව්දත් කුමරු තමා විද හෙලූ 'හංසයා කොහි දැ?'යි සොයා එනුයේ සිදුහත් කුමරුන් අතෙහි ඉඳිනු දැක 'ඔය හංසයා මගෙයි, මා ඊයෙන් විද බිම හෙලූ එකා'යි කියා ඌ ඉල්ලීය. බෝසතාණෝ ඌ නොදී ම ගෙන ගියහ. උගේ තුවාලයට බෙහෙත් කළහ.

දෙව්දත් කුමරු ගොස් සුදෙවුන් රජුට නඩුව පැමිණිලි කෙළේ ය. රජ පුත් කුමරු කැඳවා ප්‍රශ්න කෙළේ ය. තමාට හමු වූ ඒ අසරණ සතා සුවපත් කොට මුදහරිනු මිස ඌට හිංසා පීඩා කරන්නකුට නොදෙමි'යි බෝසතාණෝ කීහ.

'මතු රටේ පාලනය බාරගන්නට සිටින මේ දරුවන් කුඩා වියේ සිට ම නීතියට අනුව සිටින්නට පුරුදු වියැ යුතු යැ'යි සිතූ රජතුමා 'නුඹ නඩුව රාජ සභාවට පැමිණිලි කරන්න 'යි දෙව්දත් කුමරුට කී ය. හේ එසේ පැමිණිලි කෙළේ ය. රජතුමා රාජ සභාව කැඳවා 'මේ මා පුතාත් බෑනණුවනුත් අතර නැංග ආරවුල විසඳා තීන්දුව දෙන්නැ'යි නියෝග කෙළේ ය.

රාජ සභාව රැස්විය. කුමරුවන් දෙදෙනා ම කැඳවා නඩුව විනිශ්චය කෙළේ ය. 'දෙව්දත් කුමරුවාණන් විසින් විද බිමැ හෙලූ බැවින් ඒ හංසයා ඒ කුමරුනට ම අයිති ය. එ බැවින් දෙව්දත් කුමරුනට හංසයා බාර දියැ යුතු යැ'යි එක්කෙනෙකු හැර අනිත් සියලු සභාසදයෝ තීන්දු

කළහ. එවිට සිඩාර්ථ කුමාරයෝ නැඟී සිට. අහසේ නිදහසේ පියාහඹා ඇවිදින කිසිදු පක්ෂියෙක් මිනිසුනට අයත් නැත. උන් පෙළීමට ද කිසිවෙකුට අයිතියෙක් නැත. එ බැවින් උන් පිළිබඳ අයිතිකම් පැවැසීම වියරුවෙකැයි' පවසා 'ජීවියකු අයත්වනොත් අයත් වනුයේ උගේ දිවි නසන්නාට ද? නැත හොත් දිවි රකින්නාට දැ?'යි ප්‍රශ්න කළහ. බෝසතාණන් ඉදිරිපත් කළ යුක්තිය ඇසූ සභාව ගොළු විය. මද වේලාවකින් පසු එක් මහළු සභාසදයෙක් නැගිට 'ජීවියකු අයත් වන්නේ උගේ ජීවිතය රකින්නාට මිස නසන්නාට නොවේ යැ 'යි කීය. කාටත් කාරණය අවබෝධ වීය. 'හංසයා දිවි ඇති බැවින් සිදුහත් කුමරුනට අයති යැ'යි සියල්ලන් ගේ තීන්දුව විය. නඩුවෙන් පැරැදුණු දෙව්දත් කුමරු කෝපයෙනුත් ලජ්ජාවෙනුත් සභා ශාලායෙන් බැස තමා ගේ නිවාසය කරා ගියේ ය. බෝසතාණෝ ද නික්ම ගිය හ. කීප දිනක් සාත්තු කොට, සුවපත් වූ හංසයා මුදහැරියා හ.

**කුමාරවරුන් හා ඇත ගමන් අත්හැරීම** දවසෙක නෑ රජ කුමරුවෝ කිහිප දෙනෙක් අවුත් සිඩාර්ථ කුමාරයාණන් ද කැඳවා ගෙන ඇවිදින්නට ගියහ. කුමරුවන් සඳහා පිළියෙල කොට තුබුණු කෙළි බිම ද ඉක් මැ ඈත වන පෙදෙසකට ඔහු ගියහ. එහි ඇත මෑත දිව හැව්දුනා ගෝන මුව ආදී සතුන් බලමින් සතුටු වූහ. සමහර කුමාරවරු ඔවුන් ලුහුබැඳ යන්නාහු ඔවුන් විද මැරූහ. සිඩාර්ථ කුමරුවාණෝ එය දැක, 'අනේ! තමන් ගේ දුක මිනිස් බසින් කියන්නට නොහැකි, ගොළුවන් රූසක් බඳු වූ මේ අසරණ සතුනට මෙහෙම හිරිහැර කරන්නේ ඔවුන් මොන වරදක් කළාට ද? කැලේ හැදෙන වල් පැලෑටි කමින් තමන් ගේ පාඩුවේ නිදැල්ලේ ජීවත් වන මේ අසරණ සත්නට හිංසා කරන්නේ ඇයි ද?' කියා කලකිරී වහාම එහි නොසිට ආපසු මාලිගාවට ම ආහ. එයින් පසු ඔවුන් හා ඇවිදින්නට නො ගියහ.

ලා බාල වියෙහි සිට ම සිදුහත් කුමරාණන්ගේ ජීවිතයෙහි කරුණාව මෛත්‍රිය ක්ෂාන්තිය (ඉවසීම) පරෝපකාරය. සමානාත්මතාව යන ආදී ශ්‍රෙෂ්ඨ ගුණයෝ පිළිබිඹු ව පැවැත්තාහ. බෝසතාණන් ගේ ගති පැවැතුම් ඇසූ දුටු හැම දෙනා ම ඔබ කෙරෙහි මහත් ආදරයත් ගෞරවයත් දැක් වූහ. බෝසතාණන් ගේ කීර්ත්තිය හැම තැන ම පැතිර ගියේ ය. මගධ රට රජය කරවන **මහාපද්ම** මහ රජ ද තම පුත් බිම්බිසාර කුමරු ලවා **සිඩාථ** කුමාරයනට තුටු පඬුරු එවීම් ආදියෙන් ඒ කුමරුවන් අතර මිත්‍ර සම්බන්ධය ද ඇති කෙළේ ය. ලිච්ඡවී රජහු ද විටින් විට බෝසතාණනට තුටු පඬුරු එවූහ. හැම රජක්හුගෙන් ම බෝසතාණනට සුබ හසුන් ලැබිණ.

# සත් වැනි පරිච්ඡේදය

උතුරු දඹදිවැ කාලගුණය අනුව ශීත සෘතුව ග්‍රීෂ්ම සෘතුව වර්‍ෂා සෘතුව යැයි සෘතු තුනෙකි. ශීත සෘතුවට අයත් මාස සතරෙහි දැඩි ශීතය ද ග්‍රීෂ්ම සෘතුවෙහි සාර මසෙහි ම උෂ්ණය ද, වැසි සාර මසෙහි නො තොර වැස්ස ද පවතී. එබැවින් සමහරු තමනට අහිතකර සෘතු ගුණය ඇති වූ විට ඈත පෙදෙස්වලට යෙති. බොහෝ පොහොසත් උදවිය තමන් ඉන්නා පෙදෙස්හි ම වෙනස් වන සෘතු ගුණය අනුව එයට ගැළපෙන පරිදි නිවාස පිළියෙල කරවා ගෙන ඒ ඒ සෘතුවලදී ඒවාට මාරු වෙති.*

ශුද්ධෝදන මහ රජාණෝ ද තම දරුවනට තුන් සෘතුවට සරිලන වෙන් වෙන් උයන් හා ප්‍රාසාද කැරැවූහ. සිඬාර්‍ථ කුමාරයන් සඳහා **රම්‍ය සුරම්‍ය ශුභ** නමින් ප්‍රාසාද තුනක් කැරැවූහ.

**රම්‍ය ප්‍රාසාදය**

එයින් ශීත සෘතුවේ වාසයට කැරැවුණු ප්‍රාසාදය රම්‍ය නමි. එය මහල් නවයකින් යුක්ත විය. ඒ වායේ ද උණුසුම ගන්වනු පිණිස එකකට එකක් අනුක්‍රමයෙන් මිටි වන ලෙසට ද දෙර කවුළු සිදුරු නැති සේ මනාව හේත්තු කොට ද කරවන ලදහ. බිත්තිවලැ ඇවිලෙන මහ ගිනි දැල් සිත්තම් කැරැවිණ. සියලු බිමුතුරුණු කම්බල වස්ත්‍රවලින් ම සැදැවිණ. එහි දී පරිභෝග කැරෙන තිර වියන් ද සැට්ට හා හඳනා පොරෝනා වස්ත්‍ර ද හිස්වෙළුම් ද කම්බල වස්ත්‍රවලින් ම කැරැවුණහ. පහය තුළැ උණුහුම ඇති වනු පිණිස දොරවල් ද ජනෙල් ද දහවල් හැර තබන ලද්දහු රාත්‍රියෙහි වසා තබන ලදහ.

**සුරම්‍ය ප්‍රාසාදය**

ග්‍රීෂ්මර්තුයෙහි වාසයට කැරැවුණු පහය **සුරම්‍ය** නම් විය. එය පස් මහල් යැ. එහි මහල් ද උසින් දිගින් පුලුලින් වැඩි කොට ද, දොර ජනෙල් විවර සහිත කොට ද දැල් කවුළු ඇතිකොට ද කැරැවුණහ. බිත්තිවලැ නිල් මහනෙල් මල් හෙළ පියුම් රත් පියුම් ආදි දියේ හට ගන්නා මල් ද හඳවන ලදහ. බිමුතුරුණු තිර වියන් සැට්ට හඳනා පොරෝනා වස්ත්‍ර හිස්වෙළුම් ආදිහු දුහුල් රෙද්දෙන් ම කැරැවුණහ. ප්‍රාසාදය අවට තැන තැන ජලයන්ත්‍රිකා කැරැවිණ. මෙයින් වැසි වස්නා සෙමෙහි සෙයින් නිතර පාහේ දිය දහර

---

* යසකුල පුතුනට ද සිය පියා විසින් තුන් සෘතුවට සරිලන සේ වූ ප්‍රාසාද තුනක් කරවා දී තිබුණු බව මහාවග්ග (විනය)පාළියෙහි දැක්වෙයි

විදෙයි. තන්හි තන්හි මඩ පිරවූ ඔරු තබවා ඒවායේ පස්වණක් පියුම් වැවිණ. පහයේ දොර කවුළු දහවල් හි වසා ද රාත්‍රිහි විවෘත කොට ද තැබිණ.

**ශුභ ප්‍රාසාදය**

වැසි සාරමසෙහි විසීම පිණිස කැරවුණු පහය **ශුභ** නම් විය. ඒ මහල් සතක් ඇත්තේ විය. ශීතයත් උණුහුමත් ප්‍රමාණවත් වැ ඇති වන්නට එහි මහල් වඩා මිටිත් වඩා උසුත් නො වන සේ මැදුම් පමණින් කැරවිණ. සමහර දොර කවුළු හොඳට හේත්තු වන ලෙසට ද, සමහරෙක් එ තරම් හේත්තු නොවන ලෙසට ද කැරවිණ. බිත්තිවලැ කිසි තැනෙක ගිනිජල් ද කිසි තැනෙක ජලජ පුෂ්ප ද සිත්තම් කැරවිණ. ඇතැම් දෙරකවුළු දහවල් විවෘත ද රාත්‍රියෙහි වසන ලද්දේ ද විය. සෙස්ස දවල් වැසුනේ ද රාත්‍රියෙහි විවරුණේ ද විය.

සිදුහත් කුමරාණෝ මෙසේ වූ මේ තුන් පහයෙහි ඒ ඒ සෘතුයෙහි වෙසෙමින් ඒ වායේ නිතර පැවැත්වෙන නෘත්‍යගීතා දී දකිමින් අසමින් මහත් සිරි සැපතින් වැඩෙන්නාහු තරුණ වයසට පත් වූහ.

**ආවාහ මංගලය**

එක් දිනෙක ශුඩෝදන මහරජුත් සෙසු රජුහුත් * මැති-වරුත් කිඹුල්වත් පුර සංස්ථාගාර ශාලායෙහි රැස් වැ රාජ්‍යයෙහි කටයුතු පිළිබඳ වැ සාකච්ඡා කෙරෙමින් හුන්හ. එහි දී මහළු ශාක්‍ය රජවරු ශුඩෝදන මහරජුට 'දේවයිනි, නිමිත්ත පාඨකයන් කී පරිදි සිඩාර්ථ කුමාරයෝ ගිහිගෙහි වුසුවොත්, චක්‍රවර්ත්ති රජ කෙනෙක් වන්නාහ. පැවිදි වුවොත් බුදු වන්නාහ. ඔබත් අපත් පතනුයේ ඔවුන් චක්‍රවර්ති රජ කෙනෙකුන් වීම යි . මෙසේ වූ කලැ පෙරද චක්‍රවර්ත්තීන් සිටි අපේ වංශය නොසිඳී දිගට ම පවත්නේ ය. අපි හැම සෙසු රටවලැ රජුන් විසින් මානිත ද පූජිත ද වන්නමු. එබැවින් කුමාරයනට ස්ත්‍රිගණයා සහිත කුමරියක පාවා දියැ යුතු කාලය පැමිණියේ යැ'යි කීහ.

'එසේ ය, කුමාරයනට සුදුසු කුමරියක සොයා බලන්නැයි'යි මහරජු කීය. එහි සිටි රජෙක් මගේ දුව සුදුසු යැ යි කීය. සෙසු රජහුත් 'අපේ දූහු සුදුසු යැ යි' කීහ.

---

* රාජවංශික උසස් තිලතල දරන හැම කෙනෙක් ම රාජ (රජ) නමින්, හැඳින් වුණහ. අද ද ඉන්දියාවේ ප්‍රභූවරුනට ඇමතීමේ දී සෙස්සෝ 'මහාරාජ්' යන වචනය බැවහර කරති.

එවිට ශුද්ධෝදන රජ්ජුරුවෝ 'සිඩාථී කුමාරයෝ ලෙහෙසියෙන් අනුන්ගේ බසට නො නැමෙන කෙනෙක. එහෙයින් පළමු කොට ඔවුන් කැමති කුමරිය කවරී දැ? යි ගොස් අසමු'යි කීහ. ඉක්බිති ශුද්ධෝදන මහරජු ප්‍රධාන කොටැති ඒ හැම දෙනාම සිඩාර්ථ කුමාරයන් වෙත එළඹුණහ. එළැඹ කාරණය සැළ කළාහ. 'මම මෙයින් සත්වැනි දිනෙහි උත්තරයක් දෙන්නෙමි'යි කුමාරයෝ කීහ.

ඉක්බිති එතුමෝ විවේකී වැ හිඳ මෙසේ සිතූහ.

'කම් සැපෙහි දෙස් අනන්ත ය. කලහ වෛර ශෝක නානාවිධ දුක් කරදර ඇති වීමට කම් සැපත මුල් වේ. කම්සැප බියකරු ය. කැ කෙණෙහි දිවි නසන විෂ එල පත්‍ර බඳු ය. ගිනි ජාලාවක් බඳු ය. කඩුමුණතක් බඳු ය. මට කම් සැපත කෙරෙහි කිසිම ආශාවෙක් නැත. ස්ත්‍රීන් මැද විසීම මට රිසි නො වේ. වනයකට වී ධ්‍යාන සමාධි සැපයෙන් වසන්නට ඇතොත් මැනැව'.

මෙසේ සිතා, 'මගේ අදහස පියාණනට දන්වා කිසි සේත් වනවාසයට යන්නට නම් අවසර ගත නො හැක්ක. එබැවින් ඔවුනට කළ නොහැකි දැයක් ලියා දන්වමි'යි සිතූහ. සිතා මෙසේ ලිපියක් සැකැසූහ.

'මට කුමරියක පාවා දෙතොත් ඇය මෙහි සඳහන් වන ගුණ ඇත්තියක විය යුතු. ඕ රූපමදයෙන් මත් නොවිය යුතු. මවක සේ සොහොයුරියක සේ මෙත් සිතැත්තියක විය යුතු. මහණ බමුණනට දන් දීමෙහි ඇලුණියක වියැ යුතු. මානය, කිපෙන ගතිය. ශඨ බව, ඊර්ෂ්‍යාව, වංක බව යන දුර්ගුණ නැති ස්වාමිභක්තිය ඇති, උඩඟු නොවූ, හැඩි දැඩි නොවූ, රසයෙහි ගිජු නොවූ, ගැයුම් වැයුම් ආදී වශයෙන් පැවැත්වෙන ගාලාගෝට්ටි කෙරෙහි ඇලුම් නැති, සුවඳ විලෙවුන් දැරීමෙහි ආශා නැති, ලොභොබී නොවූ, අන් සතු දැය දැක ආශා නො කරන, සත්‍යවාදී වූ, සැපතෙහි දී ආඩම්බර නොවන. විපතෙහි දී නො තැවෙන, ඒ හැම තැන දී මධ්‍යස්ථ (උපේක්ෂක) වැ සිටින, ලජ්ජා බය ඇති, දෘෂ්ටමංගල ශ්‍රැතමංගලයෙහි (ප්‍රිය දෑ දැකුම් ආදියෙන් සුබ පල ලැබෙතැයි යන මතයෙහි) නොඇලුණු , ගුණදහමින් යුත්. හැම කල්හි හිත කය වචන යන තුන්දෙර ම පිරිසිදු ලෙස රැක ගත්තා, අලස බැවින් කුසීත බැවින් දුරු වූ, කුලමාන වංශ මානයෙන් මත් නොවූ, විමසා කටයුතු කරන, ධර්මචාරී වූ, නැදිමයිලන් කෙරෙහි ගුරුනට සේ ආදර

ගෞරව ඇති, දසියක සේ යටහත්, මවක සේ කාරුණික, කුහක නොවූ එකියක විය යුතු, මෙබඳු ගුණ ඇති කුමරියක ලදෙත් පිළිගනිමි'යි යනු යැ.

මෙය ලියා ශුද්ධෝදන මහරජුනට දුන්හ. මහරජ එය කියවා බලා පෙරෙවි බමුණා කැඳවා. 'බමුණාණනි යන්න, මෙහි සඳහන් ගති ගුණ ඇති කන්‍යාවක් ඇද්දැ?'යි සොයා බලන්න. යම් කන්‍යාවක කෙරෙහි මේ ලිපියෙහි සඳහන් ගුණ ඇත්නම්, ඕ ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය ශුද්‍ර යන කවර කුලයෙක එකියක වුව ද කම් නැත. මගේ පුතාණෝ කුල වංශ ගෝත්‍ර භේද නො සලකති. ඔහු ගුණදහම පමණක් සලකන්නාහ'යි කීහ. බමුණු තෙමේ ද ලියැවිල්ල ගෙන හැම තැන ම විමසමින් හැවිදිනුයේ , මානාධික වූ ශාක්‍ය කන්‍යාවන් අතුරෙහි හෝ අන් කුලවල දැරියන් අතර හෝ ලියවිල්ලෙහි දැක්වෙන සියලු ම ගුණවලින් පරිපූර්ණ තැනැත්තියක සොයා ගත නො හැකි විය. නො පසු බැස තව දුරටත් සොයා හැවිදුනා, හෙතෙම එක් රාජවංශිකයකුගේ* ගෙයකට පිවිසියේ පෙර නොදුටු විරූ රූප සම්පත්තියෙන් යුත් කන්‍යාවක දිටී ය. බමුණා දුටු කුමරි වහා ඉදිරියට අවුත් පෙරෙවි බමුණා ගේ පාමුලැ වැටී දෙපා අල්ලා 'ඔබට කිමෙක් අවශ්‍යදැ?' යි ඇසුවා ය. හේ ලියවිල්ල පෙන්වා ශුද්ධෝදන මහරජු පුත් සිද්ධාර්ථ කුමාරයා මේ ලියවිල්ලෙහි දැක්වෙන ගුණ ඇත්තියක ආවාහ කොට ගන්නට අපේක්‍ෂා කෙරෙති'යි සැළ කෙළේය. මේ කුමරී නම් **යශෝධරාවෝ** ය. ඕ ලියැවිල්ල අතට ගෙන කියවා බලා එහි සඳහන් සියලු ගති ගුණ තමා තුළ ඇති නියාව දැක, 'බමුණාණනි, මෙහි සඳහන් හැම ගුණ ම මා කෙරෙහි ඇත. සිද්ධාර්ථ කුමාරයෝ මගේ ස්වාමීහු වෙත්වා. එය කුමාරයනට කියන්නැ. පහත් ගති ඇති කිසිවකු හා එක් වැ මගේ වාසයෙක් නොවන්නේයැ'යි කීවාය. මේ යශෝධරාවෝ සුප්‍රබුද්ධ රජුගේ, සුදෙවුන් රජුගේ සොහොයුරියකගේ, දියැණියෝ ය.

බමුණාණෝ ගොස් සුදෙවුන් මහරජුට යශෝධරාවන් පිළිබඳ වැ තමා විමසා දත් සියල්ල සැළ කළාහ. එවිට රජ තෙම 'කුමාරයෝ දුරා සදහ, ගුණ දහම් හි ම ඇලුණෝ ය. ඇතැම් විට ස්ත්‍රීහු තමන් කෙරේ නැති ගුණ ද ඇති සේ අහවති. එ බැවින් කුමරියක තෝරා ගැන්ම

---

* නහි කුමාරඃ කුලාර්ථිකො නගොත්‍රාර්ථිකඃ ගුණාර්ථික එව කුමාරඃ. (ලලිත විස්තර. පිට 98) බ්‍රාහ්මණීං ක්‍ෂත්‍රියාං කන්‍යාං වෛශ්‍යාං ශුද්‍රීං තථෛව ච යස්‍යාඃ එතෙ ගුණාඃ සන්ති තාං මේ කන්‍යාං ප්‍රවෙදය, න කුලෙන න ගොත්‍රෙණ කුමාරො මම විස්මිතඃ ගුණෙ සත්‍යෙච ධර්මේ ච තත්‍රාස්‍ය රමතෙ මනඃ.' ල.වි

කුමාරයනට ම පැවැරීම නුවණට හුරු යැ මම එයට උපායක් යොදම්'යි කියා, ස්ත්‍රී පලඳනා රාශියක් කරවා 'මේවා කුමරුන් ලවා රූස්වන ශාක්‍ය කුමාරිකාවනට දෙවන්නෙමියි ද, මේවා දීමේ දී යම් එකියක කෙරෙහි කුමරුවෝ වැඩි සැලකිල්ලෙන් බැල්ම හෙලූහු නම්, ඇය පාවා දෙමැ'යි ද සිතා ගත්තේ ය. ඉක්බිති රන් රිදී මුතු මැණික් යොදවා ස්ත්‍රීපලඳනා රාශියක් කැර වී ය.

එයට පසු 'තව සතියෙකින් කපිලවාස්තුවෙහි සංස්ථාගාරශාලාවෙහි සිඩාථී කුමාරයෝ පෙනී සිටින්නාහ. එහි එන සියලු දැරියනට තුටු පඬුරු දෙන්නාහ. ඒවා ලබනු කැමැති සියලු දැරියන් එදා සංස්ථාගාර ශාලාවට පැමිණියැ යුතු යැ යි හැමතැන ම සණ්ඨාඝෝෂණාව කැර වී ය.

සත් වන දිනයෙහි බෝසතාණෝ සංස්ථාගාර ශාලාවට වැඩ තමනට නියමිත භද්‍රාසනයෙහි හිඳගත්හ. ශුඩෝදන රජ ද කවර නම් තැනැත්තියකට කුමාරයාණෝ වැඩි සැලැකිල්ලක් දක්වත් දැ'යි විමසා තමාට දන්වන්නැ'යි රහසින් බලා සිටින්නට රාජපුරුෂයන් කිහිප දෙනෙකු ද යෙදී ය.

කුමාරිකාවෝ එකියකට පසු වැ එකියක් දැ යි පිළිවෙළින් කුමාරයාණන් වෙත ආහ. සිඩාර්ථ කුමාරයාණන් රූපශ්‍රියෙන් අගපත් වුව ද ඒ එක්ක ම පැවැති තේජස නිසා ඒ කිසි ම කුමරියක් කුමාරයාණන් දෙස කෙලින් බලන්නට නො සමත් වූවා ය. බිම බලා ගත් වන ම අවුත් කුමාරයාණන් දෙන පඬුර පිළිගෙන වහා නික්මියා ය. සිඩාථී කුමාරයෝ ද තුටු පඬුරු දුන්නාහු නුමුදු ඒ කිසි ද කුමරියක දෙස ඕනෑකමින් නො බැලූහ. මැදහත් බැල්මෙන් යුතු වැ ඒ හැම දෙනාට ම තුටු පඬුරු දුන්හ. වටා ආසනවල හිඳ බලා සිටි ශාක්‍යාධිපතීහු කුමාරයාණන්ගේ ඉරියවු දැක, 'මේ නම් මහ පුදුම කෙනෙක. දෙව් කුමරියන් බඳු මේ තරම් රූසිරින් හෙබි මේ කුමරියන් දැක ද ඕනෑකමින් බැල්මකුදු නො හෙළී ය. සිනහ පමණකුදු නො පෑයේ ය. කිසි කෙනකු විසිනුත් නමා ගත නොහැකි තද සිතැත්තෙකැ'යි ඔවුනොවුන් කතා බස් කළහ. සියලු කුමරියන් නික්ම ගිය නොබෝ වේලායෙහි යශෝධරාවෝ ආහ. අවුත් කුමාරයාණන් වෙත ගොස් ඔවුන් දෙස බලාගත් වණ ම පසෙක සිටියාහ. මේ වන විට දීමට පිළියෙල කැර තුබුණු සියලු ම පළඳනා දී නිම වී තිබිණ. එහි යශෝධරාවනට දෙන්නට කිසිත් ඉතිරි නොවී ය. යශෝධරාවෝ

කුමාරයාණන් ළඟට ම ගියාහ. ගොස් සිනාමුසු මුහුණින් යුතුවැ `කුමාරයාණනි, මට තුටු පඬුරක් නොදෙන්නහු ද? ඔබෙන් යමක් පතා ආ මට සැලකිල්ලක් නො දක්වවු දැ යි, ඇසුවා ය. `ඔබට නොසලකත්තෙම් නො වෙමි. සියලු තුටු පඬුරු දී නිම විය. ඔබ ආවේ බොහෝ පරක්කු වී`යැ යි කියා සිනහ මුහුණින් යුතු වැ තමන්ගේ ඇඟිල්ලෙකැ තුබුණ ලක්‍ෂගණනක් අගනා මුද්ද ගලවා ඇය ඇතෙහි තැබූහ.

`මේ ඔබේ මුදුව පලඳින්නට මම් සුදුසු දැ?`යි ඕ ඇසුවාය.` මෙය මා සතු මුද්දෙක. මෙය පිළිගන්නැ`යි කුමාරයාණෝ කීහ. `අපි ඔබ පලඳනා හැර ගෙන ඔබ ඇඟිලි හිස් කරන්නට නො කැමැත්තම්හ. අපි ඔබ සුදුසු පලඳනායෙන් සරසන්නම්හ`යි කියා යශෝධරාවෝ ගරුබුහුමන් දක්වා නික්මියාහ.

සිදු වන දැ රහසින් විපරම් කරමින් සිටි රාජපුරුෂයෝ ශුද්ධෝදන රජහු වෙත ගොස්, `දේවයන් වහන්ස, යශෝධරා කුමාරිකාවෝ කුමාරයන් වහන්සේ ගේ ඇසට ඉලක්ක වූහ. දෙදෙනා අතර මොහොතක් කිසි කතාබහක් දවී` යැ යි සැළ කළාහ. ශුද්ධෝධන මහරජ එය අසා ප්‍රීත වැ යශෝධරාවන් ගේ පියාණන් වෙතට `ඔබ දුව මා පුත් කුමරාට පාවා දෙන්නැ` යි දූතයකු යැවී ය.

යශෝධරාවන්ගේ පිය රජ ශුද්ධෝදන මහරජුට පිළිතුරු එවනුයේ, `ආයුෂ්‍ය, ඔබේ පුත් කුමර රජගෙහි ම සිවුමැලි වැ වැඩුණේ ය. සිප් සතර දන්නකුට මිස නො දන්නකුට අපේ කන්‍යාවෝ නො දිය යුතුහ, යන්න අපේ කුල ධර්මයෙකි. ඔබ පුතා කිසිත් නොදනී. කඩු දුනු ආදිය පිළිබඳ වූ ශිල්ප රජකුමරුවන් විසින් උගත යුතුය. ඒ කිසිත් නො දන්නා ඔබ පුතුට කෙසේ මා දුව දෙන්නෙම් දැ?`යි කියා එවී ය. මේ තම පුත්‍රයා සිප් සතර නො දනිතැ යි යන කථාව ඇසූ සුදොවුන් රජ `මෙයට කුමක් කරම්දෝ` යි කල්පනාවෙහි ගිලී හුන්නේ ය. කෙසේ හෝ මේ කථාව සිධාර්ථ කුමාරයාණට ආරංචි විය. කුමාරයාණෝ පිය රජු වෙත ගොස් `පියාණනි, මේ මුසුප්පුවෙන් ඉඳිනුයේ ඇයි දැ?`යි ඇසූහ. `එය ඔබට වුවමනා නැතැ`යි රජ කීය. කුමරුවාණෝ තුන්වරක් ම ප්‍රශ්න කළහ. එවිට රජ ඇත්ත ම කී ය. `පියාණනි, මා හා ශිල්පශාස්ත්‍ර අතින් තරඟ කිරීමට සමතෙක් මිහිපිට නැතැ`යි කුමාරයෝ කීහ. රජ සිනාමුසු මුහුණින් `පුත, ශිල්ප දක්වන්නට ඔබට හැකි දැ?`යි ඇසීය.`හැක්කෙමි, ශිල්ප දන්නවුන් රැස් කරවන්න. මම ශිල්ප දක්වන්නෙමි`යි කුමාරයෝ කීහ.

ශුද්ධෝදන රජ 'මෙයින් සත් වන ද සිද්ධාර්ථ කුමාරයෝ ශිල්ප දක්වන්නාහ. සියලු ශිල්පඥයෝ කිඹුල්වත් නුවර ශිල්ප දක්වන භූමියෙහි රැස්වෙත්වා'යි සන්ධ්‍යාඝෝෂණාව කැරැවී ය.

නියමිත දිනයෙහි හැම දෙනාට පළමුවෙන් දේවදත්ත කුමාරයා සරඹ බිම වෙත එන්නට නික්මුණේ ය . බෝසතාණනට සතුටු පඬුරු වශයෙන් ලිච්ඡවී රජයෙන් එවන ලද සුදු ඇත් පැටියා ද ඇත් ගොව්වෝ තරඟ බිම දෙසට ගෙනෙන්නෝ වූ හ. දේවදත්ත තෙම උඹ දැක ඊර්ෂ්‍යාවෙන් මඬනාලද්දේ උඹට වැරයෙන් පහරක් දී ගියේ ය. ඇත් පැටියා එ තැනම මැරී වැටුණේ ය. එහි එන කිසි කෙනෙක් ඇත් කුණ ඉවත් කිරීමෙහි සමත් නො වී ය. මේ අතර **සුන්දර නන්ද** කුමරු මළ ඇතා දැක. 'අහෝ කර ඇති අපරාධයෙක සැටි!'යි කියා ඇත් කුණ පාරෙන් පැත්තකට ඇද දමා නික්ම ගියේ ය. හැම දෙනාට ම පසුව ආ සිද්ධාර්ථ කුමාරයෝ ඇතාට වූ දෑ අසා නන්ද කුමරු කළ සැටි සුදුසු යැයි කියා 'මෙය මෙතැන කුණු වූ පසු, මුළු පෙදෙසෙහිම දුගඳ පැතිරෙතැ'යි ද කියා එය ඔසොවා නගර ප්‍රාකාරයෙන් පිටතට වීසි කළහ. ඇතු වැටුණ තැන ඇති වූ වළ එදා සිට **හස්තිගර්තා** නමින් හැඳින්විණ. කුමාරයාණන් කළ දෑ දුටු ජනයා විස්මිත වැ, ප්‍රීතියෙන් උද්ඝෝෂණ කළහ.

ශිල්පඥයන් රැඳ් වූ පසු තරඟය පැවතිණ. සිදුහත් කුමරුවෝ අක්ෂර ශාස්ත්‍ර සංඛ්‍යා ශාස්ත්‍ර ආදී ශාස්ත්‍ර සියල්ලෙහි අන් හැම පරදවා ජය ගත්හ. එයට පසු දිවුම් පැනුම්, කඩු සිප් දුනු සිප් ඈ ශිල්ප සම්බන්ධ තරඟයෙන් ද සිද්ධාර්ථ කුමාරයෝ ම අන් හැම අභිභවා සාමර්ථ්‍යය දැක්වූහ.

යශෝධරාවන් ගේ පියා සිදුහත් කුමරුවන් භාෂාශාස්ත්‍ර ශිල්ප විද්‍යා විෂයයන් හි දැක් වූ සාමර්ථ්‍යයෙන් පැහැදුණ ද, ළපැටි වියෙහි කුමාරයන් පිළිබඳ අනාවැකි පැවැසූ නිමිත්ත පාඨකයන් ගේ කථාවන් සිහි කොට, කවරදක හෝ මෙ කුමරු ගිහි ගෙය හැර දමා පැවිදි වෙතැයි සිය දියණියන් පාවා දීමට මැලි විය. එහෙත් එය පිටතට නො අඟවා යශෝධරාවනට තම අදහස් පිළිගන්වනු පිණිස ඇය ළඟට කැඳවා,

---

* මේ පුවත ලලිත විස්තර ආදී මහායාන පොත්හි එන සැටියෙන් මෙහි දැක්වූ මු. පාළි ජාතක අටුවා ආදියෙහි මෙ තරම් විස්තර නැත. සිදුහත් කුමරුට යශෝධරාවන් පාවා දුන් පසු ඇයට පිරිවරට කුමරියන් ඉල්ලා යැවූ පසු නෑරජුන් සිදුහත් කුමරු කිසිත් නොදනිතැයි ප්‍රතික්ෂෙප කළ බැවින් ශිල්ප දැක්විණැයි ජාතක අටුවා ආදියෙහි එයි.

දුව. සිධාර්ථ කුමාරයෝ කවරදක හෝ ගිහි ගෙය හැර තපසට යන්නාහ. අසිතර්ෂි තුමා ද නිමිත්ත පාඨක බමුණන්ද කී මේ අනාවැකිය ප්‍රකට එකෙක. නුඹ ඔවුනට පාවාදුන හොත්. වැඩිකල් නොයා දී ම කණවැන්දුම් වෙති. එබැවින් ඔහු හා කාර බන්ධනයට කැමති නොව ව'යි කීය.

'පියාණනි, මා සරණ යතොත් සිඩාර්ථ කුමාරයන් සමග ම ය. එතුමන් හෙට පැවිදි වනත් එතුමන් කෙරෙහි ම මිස අන් කිසිවකු කෙරෙහි නො වසමි,'යි ඕ තරයේ ම කීවා ය.

සිඩාර්ථ කුමාරයෝ ද 'යශෝධරාවන් ම මිස අන් කිසිම කුමාරියක ආවාහ කොට නොගන්නෙමි'යි කීහ.

මෙසේ ඒ කුමර කුමරියන් ගේ සරණ මඟුල කිසිවකු විසිනුත් වළක්වාලියැ නො හැකි විය. නොබෝ දිනෙකින් මහත් මඟුල් උළෙලින් යශෝධරාවෝ සිඩාර්ථ කුමාරයාණනට පාවා දෙන ලදහ. ඉක්බිති ශුඩෝදන රජ්ජුරුවෝ දෙදෙනාට ම එක් විට කිරුළු පැළැඳවූහ.*

සිඩාර්ථ බෝසතාණන් වහන්සේත් යශෝධරා දේවීන් වහන්සේත් පෙර සිය දහස් ගණන් ජාතීන්හි එකට ඇසුරු කරමින් පැරුම් පිරීමට උනුනට උපකාරී වූහ. එයින් ඇති වූ ස්නේහය නිසා ඔහු එක්වැ විසීමට කැමැත්ත ඇති වැ සිටියත් කාමාසක්ත නො වී සෙනෙහෙබර සහෝදරයකුත් සහෝදරියකත් සෙයින් ඔවුනොවුනට උපකාරී වැ ලැදි වැ කල් යැවූහ. ශුඩෝදන රජ ද ප්‍රජාවතී ගෞතමී ද මේ අළුත් රාජ රාජිනී දෙදෙනාට දුක් පිළිබඳ කිසිම හැඟීමක් ඇති නොවන ලෙසට අවශ්‍ය හැම දැයක් ම සැපයූහ.

යශෝධරාවන් රජ ගෙට එන්නට පෙර රජ පවුලේ පිරිසට වෙනමත් සේවක සේවිකාවනට වෙනම ත් බොජුන් පිළියෙළ කැරිණ. එහෙත් යශෝධරාවෝ එය වෙනස් කොට රජ පවුලට පිළියෙල කැරෙන රාජභෝජනය ම එහි සේවක සේවිකා දස දසි හැම දෙනාට ම දෙන්නට සැලැස්සූහ.[22]

එද රටේ සිරිත අනුව ශුඩෝදන රජ ගෙදර ද දස දසී නමින් සේවක පිරිසක් සිටියත් ඔහු වහල්ලු නො වූහ. රජ පවුලෙ හිත මිතුරන් සේ මහත් රුචියෙන් සේවා ව කළෝ වූහ.

---

* මෙය සිදු කරන ලද්දේ සිධාර්ථ කුමරයාණනට සොළොස් වස් පිරුණු තැන දී යැයි පාළි අටුවාහි දැක්වෙතත් සමහර මහායාන පොත්හි දෙවිසිවන වර්ෂයෙහි යැයි කියන ලදී

රජගෙයි පමණක් නොව මුළු රටෙහි ද හැම දෙනාම යශෝධරාවන් ගේ කරුණා ගුණය කෙරෙහි පැහැදුණාහ. කපිලවාස්තු පුර වැසි සියල්ලෝ යශෝධරාවනට තමන් හැම දෙනා ගේ මවකට මෙන් මහත් ආදර ගෞරව දැක්වූහ.*

සිද්ධාර්ථ කුමාරයාත් යශෝධරාවත් වසන මාළිගාව ශුද්ධෝදන රජුගේ මෙහෙයීමෙන් නිරතුරු පැවැත්වෙන නෘත්‍යගීතාදියෙන් හැම ද ම මඟුල් ගෙයෙක සිරි දැරී ය. කොතරම් සිරි සම්පතින් පිරිවැරුණත් සිද්ධාර්ථ කුමාරයන් වහන්සේගේත් යශෝධරා දේවින් වහන්සේගේත් රජගෙහි ජීවිතය උත්සව භූමියෙක ඉන්නා තපස්වියකුගේත් තපස්විනියක ගේත් ජීවිත බඳු විය. ඔහු ලොවැ තතු සලකා බලනුවෝ එළැඹ සිටි සිහියෙන් කල් යැවූහ. 'යම්කිසි දවසෙක ගිහිගෙය හැර යෑ යුතු යැ, අනගාරික ජීවිතයක් ගත කළ යුතු යැ' යනු දෙදෙනාගේ ම අදහස විය. තවුසන් මෙන් දිවි ගත කළ ඔවුනට බොහෝ කලක් යන තුරුත් දරුවෙක් නො ලැබිණ. යශෝධරාවන් කුසැ දරුවකු පිළිසිඳ ගත්තේ බෝසතාණනට අටවිසි වැනි හවුරුද්දේ දී ය.+

# අට වැනි පරිච්ඡේදය

**උයන් කෙළි ගමන**

දවසෙක බෝසතාණන් වහන්සේට නගර සීමාවෙන් ඈතට ද ගොස් උයන් වතු පිටි ආදිය බලන්නට සිත් විය. පිය රජුට මෙය සැළ කළහ. ශුද්ධෝදන රජ 'ලබන සතියේ අසෝ දවසෙහි සිද්ධාර්ථ කුමාරයෝ උයන් කෙළි යෙති'යි නුවර වැසියනට දන්වා මහ දෙපස සරසවා මහල්ලන් රෝගීන් මළ සිරුරු හෝ පැවිද්දන් ඒ පෙදෙසට නො එන්නට රකවල් ලැවී ය. නියමිත දිනයෙහි සිද්ධාර්ථ කුමරුවෝ ද සුදු අසුන් යෙදූ මහඟු රියෙකින් උයන් බලා නික්මුණහ. පිරිවර කුමර කුමරියෝ ද ඔබ අනුව පිටත් වූහ. 'සිද්ධාර්ථයන් වහන්සේ එති'යි ඔබගේ රූසිරි දකුම්හ'යි මිනිස්සු මහ

---

* යශෝධරාවන් පිළිබඳ මේ පුවත නාඩිග්‍රන්ථවල සවිස්තර වැ එයි.

\+ බෝසතාණන් වහන්සේත් යශෝධරාවන් වහන්සේත් බ්‍රහ්මචාරී වැ වුසූහ යි, ද දරුවකු නැතිකමේ පාඩුව කියමින් පියරජුත් කුඩා මෑණියනුත් කරන කන්නලව්ව නිසා බෝසතාණන් දැඩි අධිෂ්ඨානයක් කොට සිය සුරතැ ඇඟිල්ලෙකින් යශෝධරාවන්ගේ නාභිය පිරිමැද්දහයි ද එයින් රහල් කුමරු පිළිසිඳගත්හයි ද සමහර ආචාර්‍යවරුන්ගේ මතය යි. හෙළ දිවැ විසූ ලක්මිණි පහනේ සංස්කාරක ආභිධර්මික ධර්මරත්න පඬිතුමා මේ මතය දැරුවෙකි.

දෙපසැ රැස්කකා සිටියාහ. කුමාරයන් වහන්සේ ට වැඩි දුරක් නොයා දීම වෙවුලමින් සැරයටි වාරුවෙන් යන ඇඟ රැලි ගැසුණු කෙහෙ රවුලු පැසුණු කුදු වූ මහල්ලෙක් මඟ පසෙක දක්නට ලැබිණ. මෙ තරම් ජරපත් මහල්ලකු පෙර කිසි ම දක ඔබ නොදුටුවහ. අනුමානයෙන් මේ 'මහල්ලෙකැ'යි දැනගත්තත්, රියැදුරු ඡන්නයා ගෙන් 'අර කවරෙක්දැ?'යි බෝසතාණන් වහන්සේ ඇසූහ. ඡන්නයා ඒ මහල්ලෙකැ'යි කී ය. තව තවත් ඔහු ගැන කථා කරන බෝසතාණන් වහන්සේ 'අපටත් මෙවැනි අවස්ථාවක් ඇති වෙයි දැ?'යි ඇසූහ. 'බොහෝ මහලු වන විට අප හැමත් මේ තත්ත්වයට වැටෙතැ'යි ඡන්නයා කී ය.

බෝසතාණනට, මෙ තරම් ජරපත් මහල්ලකු පෙර නොදුටු බැවින් මහලු බව ගැන දුරට සිතන්නට අවස්ථාවෙක් නො එළැඹිණ. එහෙත් එදා ජරපත් මහල්ලා දුටු මොහොතෙහි මහලු බව ගැන ගැඹුරට ම සිතනුවෝ උයන් කෙළියෙහි ඇල්ම හළහ. 'පෙරළා යම්හ'යි කියා රථය ආපසු මාලිගාව අතට ම හැරවූහ.

වැඩි වෙලාවක් යන්නට කලින් බෝසතාණන් ආපසු පැමිණි කරුණ ඡන්නයා ගෙන් දැනගත් ශුද්ධෝදන රජ්ජුරුවෝ ද ප්‍රජාවතී ගෞතමී ආදී සෙසු හැම දෙනා ද කැළඹුණාහ. බෝසතාණන් තුළ පහළ වූ අදහස් අමතක වන ලෙසට අමුතු අමුතු නෘත්‍යාදියෙන් ඔබගේ ප්‍රාසාදය සෝභවත් කැරවූහ. ප්‍රාසාදය කොතරම් නෘත්‍යගීතාදියෙන් ඇලැලී ගියත්, බෝසතාණන් වහන්සේ තමන් දුටු දැය ගැන නිතර සිතූහ. යශෝධරාවන් සමග ද තමන් කොතරම් රූපශ්‍රීයෙන් යුතු ව සිටියත් කලක් ගිය තැන දත් වැටුණු ඇඟ රැලි ගැසුණු කුදු ගැසුණු මහල්ලන් විය හැකියැ යි කියන්නෝ වූහ. මේවා ගැන සිතන කතාබහ කරන ඒ කුමර කුමරියෝ දෙදෙනා ම සිය රූප ශෝභාව නිසා මත් නො වූහ. රූප මදය ඔවුන් ගෙන් ඈත් විය. 'යම් දවසෙක අපි දෙදෙනාම ගිහිගෙන් නික්මැ අජර සුවය සොයා යම්හ'යි කතිකා කළහ.

**ලෙඩකු දැකීම**

කාලයෙක් ගත විය. යළි දු බෝසතාණෝ අසෝ දිනයෙහි උයන් කෙළි යම්හැ'යි පිය රජුට දැන්වූහ. ශුද්ධෝදන රජ ද අසෝදින පුත්‍රයාණන් උයන් කෙළි යතැ යි නුවරුනට දන්වා පෙර සේම මග දෙපස සරසවා රකවල් ලැවී ය. බෝසතාණන් වහන්සේ ද පෙර සෙයින් ම මහ පිරිසෙන් පිරිවැරුණෝ අස්රිය නැඟ නික්මුණහ. වැඩි දුරක් යන්නට නො ලැබිණ. කුෂ්ට රෝගයෙකින් පෙළෙන මහසැළක් සෙයින් ඉදිමුණු බඩ ඇති බරවා පා ඇති ලෙඩෙක්

මහ මහැ පැත්තෙකැ දක්නට ලැබිණ. බෝසතාණෝ මෙතරම් විකෘතියකට පැමිණියෙකු පෙර නොදුටුවත්, මේ කිසියම් කායික පීඩාවකට පැමිණියකැයි අනුමානයෙන් දැන ගෙනත් තවත් විස්තර දනු කැමැත්තෝ, 'අර කවරෙක් දැ?'යි ඡන්නයා අතින් විචාළාහ. ඡන්නයා 'ඒ ලෙඩෙකැ'යි කීය. තව දුරටත් ප්‍රශ්න කිරීමේ දී කාට වුවත් මෙ බඳු තත්ත්වයක් ඇති වියැ හැකි බව පැවැසී ය. බෝසතාණන් වහන්සේ ගැඹුරට ම සිතූහ. 'මම් නීරෝගයෙමි'යි යන ආරෝග්‍ය මදය පහ විය. එය ඔස්සේ ම සිතන්නට වූහ. උයන් ගමන එපා විය. 'ආපසු යම් හ'යි එද ද ඉක්මනින්ම පෙරළා සිය පහයට ම ගියහ. එදා සුඩෝදන රජතුමා එපවත් ඡන්නයාගෙන් දැන ගෙන වඩාත් කැලැඹිණ. නිමිත්ත පාඨකයන් කී අනාවැකි එසේ ම හරි යන සේ පෙනුණෙන් රජගෙහි සියල්ලෝ නො සන්සුන් වූහ. බෝසතාණන් ගේ ප්‍රාසාදයේ ක්‍රීඩෝත්-සවයනට අමුතු අමුතු අංග එකතු කරවමින් උන්වහන්සේ ගේ සිත ඒවා අතට යොමු කරවන්නට බොහෝ උත්සාහ කළහ. බෝසතාණෝ ද යශෝධරාවෝ ද ජරාරෝගවලට ගොදුරු වන මේ කය බොහෝ ආදීනව ඇති එකකැයි සිතනුවෝ 'කවර ද නම් මේවායින් මිදෙන මඟක් සොයන්නට යමෝ දැ?'යි සිතමින් කල් යැවූහ.

**මිණියක් දැකීම**

තව කලෙක් ගෙවිණ. එක් තැන ම කල් ගෙවන කෙනෙකුට කාය ව්‍යායාමය පිණිස හෝ ඇතකට ඇවිදින්නට යන සිත ඇති වේ. බෝසතාණන් වහන්සේට ද ඈත උයනට යන්නට සිත උපන. අසෝ දවසැ උයන් කෙළි යමැ'යි පිය රජුට දැන් වූහ. පිය රජ පෙර වතාවලැ සේම මහ දෙපස සරසවා කලටත් වඩා හොඳට රකවල් ලැවීය. බෝසතාණෝ ද මඟුල් අස්රිය නැඟ මහ පිරිවරින් පිටත් වූහ. ඔබට යන්නට ලැබුණේ මඳ දුරෙකි. මහපාර පසෙක* 'කට ඇරගෙන හෝනා ඉදිමී නිල් වැ ගිය නව දෙරින් නික්මෙන පණු කැලන් ගෙන් වැසුණු මළ සිරුරෙකි. බෝසතාණෝ පෙර කිසි ද කලෙක එවැන්නක් නො දුටුවෝ, 'අර කිමෙක් දැ'යි ඡන්නයා ගෙන් ඇසූහ. ඡන්නයා 'එය මළ සිරුරෙකැ'යි කී ය. 'අප සිරුරටත් එසේ වේ දැ?'යි ඇසූ විට, අප හැම දෙනා ගේ ම සිරුරට මෙය වෙතැ'යි විස්තර කෙළේ ය. බෝසතාණෝ එය අනුව සිතනුවෝ සිරුර කෙරෙහි කළකිරුණහ. එයින් ජීවිත මදය දුරු විය. උයන් ගමන එපා විය. පළමු දෙ වර සෙයින් ම පෙරළා සිය පහය කරා ගියහ.

* සමහර පොතෙක කරින් ඔසොවාගෙනයන මිණියක් දුටුහ යි සඳහන් ය.

ශුඩෝදන රජ ගමනේ තොරතුරු අසා අසිතර්ෂි ආදින් කී දෑ එලෙසට ම සිදු වී ගෙන යන සැටි සිතමින් සිත සනසා ගත නො හැකි වැ බියටත් නොසන්සුන් බවටත් පත් විය. 'පැවිදි රුව දැක්මෙන් ගිහිගෙය හැර යතැ 'යි කී බස සිහි කොට එය දැකීම වැළැක්කුවොත් පුතු ගිහිගෙහි ම රැඳෙතැ යි යන්තම් සිත හද ගෙන එය සඳහා උපා යෙදී ය. කිසි ම පැවිද්දකුට කපිලවාස්තු නගරයට වත් උප නගරයට වත් පිවිසෙනු නො හැකි වන්නට දැඩි රකවල් තැබ්බී ය.

**මහණ රුව දැකීම**

ටික කලකට පසු එක් දිනෙක බෝසතාණෝ අස්රිය නැග පළමු සේ ම උයන් යන්නෝ උයනට නොදුරෙහි 'ශාන්ත දන්ත වැ විය ගහක් තරම් දුරට හෙලූ ඇස් ඇති වැ සෙමෙන් සංසුන් වැ යන මහණකු හු දුටහ.[23] තමන් කුඩා වියෙහි ගුරුහු වෙතින් වේද වේදංගාදී සිප් සතර උගතිද්දී දැන ගෙන තුබුණු පරිදි 'මේ ශ්‍රමණකෙනකැ 'යි අනුමානයෙන් සිතුවත් සැක හැර දැනගනු රිසියෙන් 'රියදුරනි, අර කවරෙක් ද?'යි විචාළ හ. 'ජරාරෝගාදී වශයෙන් ඇති සසර දුකින් මිදෙනු වස් ගිහි ගෙය හැර පැවිදි වැ ගුණ දහම් වඩන මහණ කෙනෙකැ'යි ඡන්න පැවැසී ය. එය ඇසූ බෝසතාණන් වහන්සේ තුළ පැවිදි වීමේ උනන්දුව බලවත් විය. ඔබ එද උයනට ම වැඩ උයන් සිරි බලමින් ප්‍රීතියෙන් කල් යැවූහ. මේ අතර ශුද්ධෝදන රජු විසින් එවන ලදු වැ, එහි අවුත් සිටි කාලුදයි ඇමැතියා ගේ මෙහෙයුම් පරිදි, නාටිකාවන් බෝසතාණන් සිත කම්සුවෙහි අලවනු පිණිස නොයෙක් ලෙසින් හාව භාව විලාස පාමින් ක්‍රීඩා කළ නුමුත්, තමන් දුටු මහල්ලා ද රෝගියා ද මළ සිරුර ද සිහි කරන බෝසතාණනට ඔවුන් ගේ ඒ සියලු විලාස පෑම් දුගඳ ලේ මස් නහරින් බැඳුණු ඇටසැකිලි ගොඩක් කරන වියරුවක් සේ වැටහිණ. එහෙත් නිහඬ වැ, තමන් බලාපොරොත්තු වන පැවිද්ද ගැන ම සිතමින්, සිය පිරිවර කුමරුන් හා උයන් සිරි බලා හැවිදීම් ආදියෙන් දවස ගෙවූහ.

සවස් විය. බෝසතාණෝ මඟුල් පොකුණට බැස නා ගොඩ නැගුණාහ. එ කෙණෙහි මඟුල් කපුවා පැමිණ ඔබ වස්ත්‍රාභරණයෙන් දෙව් රජක්හුසේ සැරැසී ය. බෝසතාණන් වහන්සේත් ගඳඹුවන් ගේ පසඟ තුරු ගොසින් ද බමුණන්ගේ ස්තෝත්‍ර ගායනයෙන් ද පුදනු ලබනුවෝ මඟුල් අස්රිය නැඟුනාහ. එකෙණෙහි ම සුදෙවුන් මහරජාණන් දූතයකු අතැ එවූ 'යශෝධරාවනට පුතෙක් ලැබිණ' යන හස්නට කන් යොමු කළහ. 'රාහුලයෙක් උපන,[24] බන්ධනයෙක් පහළ වී යැ' යන වචන බෝසතාණන් ගෙන් කියැවිණ.

දූතයා ආපසු ගියේ ය. බෝසතාණන් කී වචනය මහරජුට දැන්වී ය. රජ එය අසා, මෙ තන් සිට මා මුනුබුරු තෙම **රාහුල** නම් වේ වා'යි කී ය.

බෝසතාණන් වහන්සේ ද රිය නැඟ මහ පෙරහැරින් සිය භවනය අතට ගමන් ගත්හ. උන් වහන්සේ යන මඟ අද්දර ප්‍රාසාදයෙක සිට ඔබ දෙස බලා සිටි **කෘශාගෞතමී** (හෙවත් **මෘගජා**) නම් ශාක්‍ය කුමාරිකාවක් තේජස් සම්පන්න වූ තුමුත් ඒ එක්ක ම කරුණාබර ශාන්ත බැල්මෙන් යුත් බෝසතාණන් දැක 'මොහු හෝ මෙ වැනි පුතක්හු ලත් මව නිවුණි වේ. පියා ද නිවුණේ වේ. මොහු හෝ මෙවැන්නකු ස්වාමි ව ඇති ස්ත්‍රී ද නිවුණියක් වේ' යැයි ගාථාවකින් හඬ නඟා ස්තෝත්‍ර කළා ය.[25]

සසර දුක් ගිනි නිවීම අතට ම යොමු කළ සිත් ඇති වැ ඒ ගැන ම කල්පනා කරමින් හුන් බෝසතාණන් වහන්සේ ඇය ගේ කථාව අසා 'මා හෝ මා වැන්නකු අයත් මවත් පියාත් බිරියත් නිවුණවුන් වෙති'යි මෝ කියයි. 'කුමක් නම් නිවුණු කලැ හදවත නිවේ දැ?' යි සිතන්නාහු, රාග ගින්න. ද්වේෂ ගින්න, මෝහ ගින්න, මාන දෘෂ්ටි ආදී කෙලෙස් ගිනි නිවී ගිය කල්හි ම හදවත නිවුණේ වේ' යැ යි දුටුහ. ඉක්බිති 'සියලු දුක්වල නිවීම සොයන මා සිතට ධෛර්‍යය දෙන හස්නක් එවීමෙන් මා උනන්දු කළ මැයට තුටු පඬුරක් යැවියැ යුතු යැ'යි සිතා ගෙලැ පලන් ලක්ෂයක් වටනා මුත්හර ගලවා ඇයට ගුරු පඬුරු කොට යැවූහ. සිය පහයට ගොස් සිරි යහන් හි හෙවැ ගිහි ගෙන් නික්මැ යෑම ගැන ම කල්පනා කළහ.

බෝසතාණන් වහන්සේ ටික වෙලාවෙකින් පිබිදුණාහ. 'ගිහිගෙන් නික්මෙන්නට කාලය පැමිණියේ යැ'යි සැලැකූහ. එහෙත් 'මා හද වඩා රැක බලා ගත්, මගේ සැප පහසුව ද අභිවෘද්ධිය ද තකා පමණ කළ නොහැකි මහත් ධනසම්භාරයක් වියදම් කළ, රෑ දෙවේ මගේ යහපත ම පතා, නො පමණ වෙහෙස මහංසි දැරූ මගේ කරුණාබර පියාණන් වහන්සේට නො දන්වා උන් වහන්සේ ගෙන් අවසර නො ගෙන නික්ම යෑම අයුක්තෙකි. එය අකෘතඥ බවෙකි. එ බැවින් දැන් පියාණන් වහන්සේ වෙත ගොස් දන්වමි'යි සිතූහ. සිතා මහ රෑ ම පියාණන් ගේ මාළිගාව වෙත ගියාහ. ස්වභාවයෙන් ම බෝසතාණන් වහන්සේ ගේ

සිරුරේ ප්‍රභාව බඹයක් පමණ වටා ආලෝකවත් කෙරෙයි. යශෝධරාවන්ගේ ශරීරප්‍රභාව ද එබඳු ම ය. විශේෂයෙන් මෙය ප්‍රකට වනුයේ රෑ අඳුරෙහි ඉන්නා විට ය. බෝසතාණන් වහන්සේ පිය රජුගේ පහයට ගිය කෙණෙහි ඔබේ ශරීර ප්‍රභාව පැතිර පෙදෙස ආලෝකවත් වූ විට, රෑ පවා පුත් කුමරු ගැන නිතර සෝදිසියෙන් සිටි ශුද්ධෝදන රජ සේවකයන් බණවා 'කිමෙක් ද? රෑ පාන් වූයේ දැ?' යි ඇසී ය. 'නැත දේවයිනි, තව ම මහ රෑ ය. රාජපුත්‍රයාණන් වහන්සේ වැඩිය සේකැ' යි සේවකයෝ කීහ. ශුද්ධෝදන රජතුමා යහනින් නැගිට අවුත් බෝසතාණන් පිළිගෙන 'පුතා, මේ මහ රෑ මෙහි ආයේ කිසි වුවමනාවෙක් දැ ?' යි ඇසී ය.

'එසේ ය, පියාණන් වහන්සැ' යි බෝසතාණෝ වදළාහ.

'මොකක් ද පුතා, උවමනාව?'

'පියාණන් වහන්ස, මට දැන් ගිහිගෙයින් නික්මෙන්නට කාලය පැමිණියේ ය. මට සමා වන්න. රට වැසියන් සහිත පියාණන් වහන්සේ ගෙන් සමාව යදිමි, මම පිටත් ව යන්නෙමි.'

'පුතා හැයි ද මේ නැදෑ පිරිසත් රාජ සම්පතත් කීකරු රට වැසියනුත් හැර දමා යන්නට සිතන්නේ? ඔබට වුවමනා යම් දැයෙක් ඇත්නම් ඒ සියල්ල සපයා දෙමි.'

'මට වුවමනා දැය සපුරාදෙතොත් මේ රජ සැප හැර නො යමි. සපයා දෙන හැකි නොවෙතොත් මට යන්නට අවසර ඇද්ද?'

'මා විසින් සපයාදෙන නො හැකි කිසිත් නැත. සියල්ල සපයමි. ඒ කිසිවක් මට නො හැකි වී නම්, එය සොයා යන්නට අවසර ඇත.'

'එසේ නම් පියාණන් වහන්ස, මට අවශ්‍ය ව ඇති දැ සතරෙකි. එනම්, 'මහළු බව මට ඇති නො වේ වා' මෙය මා ඉල්ලන එක් දැයෙකි.

'යොවුන් බව, මනා පැහැපත් තරුණ බව හැම කල්හි ම මා කෙරෙහි වේවා' - මේ මා ඉල්ලන දෙවෙනි දැ ය.

'කිසිදු කලෙක මා සිරුරට රෝගයෙක් නො වැළඳේ වා' - මේ තුන්වැනි දැ ය යි.

'කිසිදු කලෙක නො මැරෙම්වා' - මේ මා ඉල්ලන සතර වැනි දැය යි.

පියාණන් වහන්ස, මෙසේ මහළු නොවන බව, සඳ තරුණ බව, ලෙඩ නොවන බව, නොමැරෙන බව යන කරුණු සතර හැර මට අවශ්‍ය

අන් දැයෙක් නැත. මේවා සපයා දෙත හැකි නම් රජගෙය හැර නොයමි. මෙහි ම රැඳෙමි. මේවා සපයා දෙත නො හැකි නම්, මගේ පමණක් නොව, ඔබ වහන්සේ ගේ පමණක් නො ව, මා වැඩූ කුඩා මෑණියන්ගේ ද යශෝධරාවන් ගේ ද, රාහුල නන්ද ආදී මගේ සහලේ නෑයන්ගේ ද පමණක් නො වැ, ජරා ව්‍යාධි ආදි දුක්වලින් පෙළෙන සියලු අසරණ ලෝකයා ගේ යහපත පිණිස, ඒ හැමදෙනාට මෙකී සියලු දුකින් මිදෙන මඟ සොයා පිහිට වනු පිණිස, එය මේ රජ ගෙය තුළැ රැඳී කට නො හැක්කක් බැවින් එය සොයනු පිණිස මා මෙහෙන් නික්ම යෑ යුතු නොවේ ද?'

බෝසතාණන්ගේ කථාව අසා සිටි ශුද්ධෝදන රජතුමාට තමා මෙතෙක් කල් කොතරම් උපා යෙදුවත් කොතරම් වෙහෙස මහන්සි ගත්තත් අසිත සෘෂිතුමාත් නිමිත්තපාඨක බමුණනුත් කී අනාවැකි හරි යන බව ම හැඟිණ. එය වළක්වන්නට නො හැකි බව ම වැටැහිණ. ඉක්බිති කඳුළු පිරි මුහුණින් පුත්‍රයාණන් දෙස බලා හිඳ 'පුතංඩ, ඔබ ඉල්ලූ වර දීමෙහි ශක්තියෙක් මට නැත. මහානුභාව සම්පන්න දීර්ඝායුෂ්ක සෘෂිහු පවා කලුරිය කළහ. ඔබේ අදහස මට වැටහෙයි. ගමනට ඔබට අවසර ඇත. ඔබ තුළ පවත්නා ලොව ජරාමරණාදි දුකින් මුදලීමේ ශ්‍රේෂ්ඨ අදහස එසේ ම සඵල වේවා, සම්පූර්ණ වේ වා!'

මෙසේ පියරජු ගෙන් අවසර ගත් බෝසතාණන් වහන්සේ ඔබට ගරු බුහුමන් දක්වා එ තැනින් සිය මාළිගයට පැමිණියාහ.

පසු දින පහන් දෙර ශුද්ධෝදන රජ සියලු ශාක්‍ය ප්‍රභූන් රැස්කරවා සිද්ධාර්ථ කුමාරයෝ ගිහිගෙන් නික්මෙන්නාහ'යි තමාත් පුත්‍රයාත් අතර ඇති වූ කථාව කියා 'මෙයට කුමක් කර මෝ දැ?'යි ඇසී ය. 'නිමිත්තපාඨකයන් කියා තිබෙන පරිදි පැවිදි වීම හෝ සක්විති වීම වයස එකුන් තිස් වැන්න පිරුණු තැන දී ය. ඒ වයස පිරෙන දිනට තව ඇත්තේ සතියෙකි. ඒ දිනය ඉක්මෙන තෙක් කෙසේ හෝ කුමරු රඳවා ගත යුතු යැ'යි ශාක්‍යයෝ කීහ. කියා එයට කටයුතු දැ නිශ්චය කැර ගත්හ. එය අනුවැ එද සිට නුවර දකුණු වාසල් දෙර ද්‍රෝණෝදන රජු සමග පන්සියක් ශාක්‍ය තරුණයෝ ද, බස්නාහිර පැත්තේ වාසල් දෙර ශුක්ලෝදන රජු සමඟ එපමණ ම ශාක්‍ය තරුණ පිරිසෙක් ද, උතුරු වාසල් දොර අමෘතෝදන (අමිතෝදන) රජ සහිත තරුණ ශාක්‍ය පිරිසෙක් ද, නැගෙනහිර වාසල් දෙර පන්සියයක් පමණ ශාක්‍ය

තරුණයන් සමග ශුද්ධෝදන මහරජ ද, රකවල් කරන්නට නියම කැර ගත්හ. ඔවුන්ගේ නියමය පරිදි නුවර සැම දෙමං හන්දි තුන්මං හන්දි සතරමං හන්දි ආදී සන්ධිස්ථානවල මහළු ශාක්‍ය රජුහු රකවල් කරන්නට බාරගත්හ. නුවර මැද සංචාරය කරමින් ආරක්ෂා කැර ගැන්ම මහානාම කුමාරයාට පැවරිණ.

මෙසේ ඔහු සදිනක් ම රෑ නිදිවරා නගරය ඇතුළත පිටත හැම තැනම මුර කළහ.

ඔවුන් ගත් ක්‍රියා මාර්ගය දැනගත් සිද්ධාර්ථ කුමාරයන් වහන්සේ ද සුදුසු දිනය හා වේලාව පැමිණෙන තුරු බලාපොරොත්තු වූහ. ප්‍රජාවතීගෞතමී ද නුවර හැම ප්‍රාසාදයෙකම හැම ගෙයකම ඉන්නා ස්ත්‍රීනට රෑ එළිවන තුරු පහන් නොනිවා සෝදිසියෙන් ඉන්නට විධාන කළා ය.

බෝසතාණෝ ද මේ කාලය තුළ ලොවැ දුඃඛ තත්වය නුවණින් සලකා බැලීම්, තමන් ජාතිස්මරණඥානය ඇත්තකු බැවින් අතීත ජාතීන්හි කළ චිත්තප්‍රණිධීන් මෙනෙහි කිරීම් ආදී වශයෙන් 'තවුසක්හු සේ කල් යැවූහ. සිද්ධාර්ථ කුමාරයන් ද සුදොවුන් මහරජු ද අතර පැවැති කථාව රහසෙක් නොවී ය. යශෝධරා ආදි කවුරුත් දත්හ. කවර දක හෝ සිද්ධාර්ථ කුමාරයන් කැටුව තමා ද ගිහිගෙන් වෙන් වැ තවුස් දිවියට බස්නට ඉටාගෙන සිටි යශෝධරාවෝ ඒ කිසිවෙකින් කලබොල නො වූහ. එහෙත් ඇය ගේ සිත නොසංසුන් වන්නට කරුණෙක් ඇති විය. ඒ එකී සත්වැනිද රෑ කලින්ම නිදා ගත් ඇය දුටු සිහිනයෙකි. එද සැන්දෑවේ ඕ නිදගත්තී සිහිනයක් දැක පිබිදී සිද්ධාර්ථ කුමාරයන් වෙත ගියා ය. තමා දුටු සිහිනය සැළ කරන්නී 'ස්වාමීනි, ඔබ මෙහි මා තනිකොට' හැර දමා තපසට ගියා සීනෙන් දිටීමි. ස්වාමීනි, ඔබ යන තැනට මම ද යෙමි'යි ඕ කීවා ය. බෝසතාණෝ ද 'තමන් යනුයේ නිවන දෙසටය, යන්න සලකා, 'එසේය, මා යන තැනට ම නුඹත් පමුණුවමි'යි කීය. ඉක්බිති නිවන් අවබෝධ කරනු පිණිස මහත් දුක් පීඩා වින්ද යුතු බව, බෙහෝ වෙහෙස මහන්සි වියැ යුතු බව, අතදරුවකු සහිත යශෝධරාවන් බඳු සියුමැලි ස්ත්‍රියකට එවැනි දුක් පීඩාවලට මුහුණ පෑ හැකි නොවන බව පැහැදිලි කොට දී, ' මම් විමුක්ති සැපය අත්පත් කොට ගෙන අවුත් ඔබ හැමට එය ලබවන්නෙමි. එතෙක් ඉවසා දරුවා රැකගන්න. මේ සියලු ධන සම්පත් ඔබට ඇත. මා පියාණෝ ද කුඩා මෑණියෝද ඔබේ ආරක්ෂාවට සිටිති'යි සැනසිලි බස් කීහ. දුර දිග දක්නා නුවණ ඇති,

ස්වාමිභක්තිය ඇති, විනීත වූ යශෝධරාවෝ කුමාරයාණන්ගේ අවවාදයට අවනත වූහ. ප්‍රිය විප්‍රයෝග දුක ඉවසා දරා ගන්නට නොයෙක් දෑ සිතමින් උත්සාහ-කළා හ.

## නව වන පරිච්ඡේදය

**මහාභිනිෂ්ක්‍රමණය**

යශෝධරාවෝ 'ළඟදී ම ස්වාමි දරුවෝ නික්ම යති. කවරදක හෝ නික්ම යතොත් තමාට කියා ම යති යි ටික කලකට පසු මමත් කෙසේ හෝ උන් වහන්සේ අනුව යමි' යන ආදීන් සිතා සැනැසෙන්නට උත්සාහ කරන්නී සිය ඕවරයකට ගොස් නිදගත්හ. බෝසතාණෝ ද කල්පනායෙහි නිමග්න ව තම යහනෙහි හොත්හ. මේ වෙලාවේ පෙර දිනවල සේම නාටිකාවෝ රුස්ව ඔබ ඉදිරියේ නැටුම් ගැයුම් ඇරඹූහ. බෝසතාණෝ ඒ කිසිත් නොසලකා සිත සිතා හොත්තාහු නින්දට බටහ. එය දුටු නාටිකාවෝ 'සාමිදරුවෝ නින්දට බටහ. අපේ ක්‍රීඩාවලින් වැඩෙක් නැතැ'යි කියා තුමළ ද තමන්ගේ වාද්‍ය භාණ්ඩ ඒ ඒ තැන තබා එහි ම නිද ගත්හ. මැදුම් රැයෙහි බෝසතාණෝ නින්දෙන් පිබිදියාහ. යහනෙහිම හිඳ අවට බැලූහ. නිදන නාටිකාවන් ගේ විප්‍රකාරය දුටුහ. කෙනෙක් මුව අයා ගොරවති. කෙනෙක් කට දෙකොණින් කුණු කෙල වගුරුවති. කෙනෙක් සිහිනෙන් නත්දොඩති. කෙනෙක් වැළැපෙති, කෙනෙක් නිරුවත් වැ හෙති, කෙනෙක් අවුල් වැ විසිරැ ගිය කෙහෙ ඇතියෝ වෙති. ඔවුන් දුටු බෝසතාණනට තමා මළ කඳන්, රැසක් මැද ඉඳින්නකු සේ හැඟිණ. ටික වෙලාවකට කලින් දෙවහනන් සිරි දෙව් විමනක් බඳු වැ පෙනුණු මේ මැදුර දැන් මළ කඳන්, පිරුනු තැනක් බඳු යැ'යි සිතිණ. මෙය සිතා සිතත් ම ගිහිගෙය කෙරෙහි කලකිරීම වැඩි විය. ගිහිසැප යනු මිරිඟුවක් වැනි බව පෙනිණ. නික්මැ යා යුතු අවස්ථාව සලකන්නාහු, අවට විමසා බලා සඳිනක් තිස්සේ ම නිදිවරා වෙහෙස පත් සියල්ලන් ම පාහේ තද නින්දට වැටී හෝනා නියාව දැන ගත්හ. දැන් පිටත් වන්නට වේලාව යැයි සැලැකූහ. යශෝධරාවනට කථා කොට පුතු ද වඩාගෙන සිඹ සනසා එයට පසු ප්‍රාසාදයෙන් බැස්ස යුතු යැයි සිතා ඇය නිදන ඕවරකය දෙසට පිය තැබූහ. එහි දොර ළඟට ම ගොස දොර හැර තිරය ඔසොවා ඇතුළත බලන්නාහු, කාන්ත වූ මෘදු පහන් එළියෙන් අඳුරු දුරු වැ ගිය, පහනෙහි දැවෙන සුවඳ තෙලින් සුවඳවත් වූ සිරියහන් ගබඩායෙහි සමන් මල් අමුණක්

අතුළ යහනෙහි රහල් කුමරු ළෙහි හොවා නිදන යශෝධරාවන් දුටුහ. 'ඇතුළට ගොස් ඇය පුබුදුවාලුවොත් ගමනට බාද වියැ හැක්ක. දැන්ම නොයන්නැ'යි ඇය ඇවිටිලි කරනු ඇත. පසු වැ අවුත් මොවුන් දක්නෙමි වේ ද! දැන් නිහඬ වැ නික්මැ යෑ යුතු යැ'යි සිතාගත්හ. මෙසේ සිතා අඹුදරු ආදීන් කෙරෙහි ඇති සසිම ප්‍රේමයට මුළු ලොවැසි සියලු සතුන් කෙරෙහි හටගත් මහා දයාව මාරු කොට, ජරා මරණාදී නොපමණ දුකින් පෙළෙන ලෝකයට පිහිට වෙමි'යි උපන් මහා කරුණාව පෙර දැරිකොට ගත්තාහු, ලෙහෙසියෙන් ම පය එළිපත්තෙන් පිටතට ඇද ගත්හ. මෙසේ නික්ම ප්‍රාසාදයේ උඩු මහලෙන් බැස තරප්පුව පාමුල නිදන ඡන්නයා පිබිදැවූහ. 'ඡන්නය, කන්තක අසු සරසා ගෙනෙන් නැ'යි කීහ. 'ස්වාමීනී, මේ මැදුම් රැ කොහි යන්නට දැ?'යි ඡන්නයා ඇසී ය. 'මම පැවිදි වන්නට ගිහි ගෙන් නික්මෙමි'යි බෝසතාණෝ වදළහ. 'ස්වාමීනි, මේ මාපිය නෑදෑ පිරිස් හැර දමා, කොහි වඩින්න ද? එසේ නොම වඩින්න ස්වාමීනි'යි ඡන්නයා අඬන්නට වන. බෝසතාණෝ නොයෙක් සැටියෙන් කරුණු කියා ඡන්නයා කැමැති කරවාගත්හ. එසේ වුවද හේ ගමනට සැරසෙන අතර ම යශෝධරාවනට ඇසෙන මානයට ගොස් ඇය පුබුදුවන්නට මහ හඬක් පවත්වා පෙරළා ආයේ ය. එහෙත් ඕ නොම පිබිදුණා ය. ඉක්බිති හේ කන්තක අසු සරහා ගෙනායේ ය. බෝසතාණෝ අසුගේ හිස මුහුණ අත ගා ආදරය දක්වා ඌ පිට නැගුනාහ. ඡන්නයා ද පිටු පසැ ඉඳුවා ගත්හ. ගමන ඇරඹූහ. නැගෙනහිර වාසල් දොරකඩ වෙත ගිය බෝසතාණෝ එහි නිදහොත් පිය රජු දැක, පියාණන් කෙරෙහි තමන් තුළ වූ දැඩි ප්‍රේමය නිසා නැංග ප්‍රිය විප්‍රයෝග දුක ඉතා අමාරුවෙන් මැඩ ගෙන, 'පියාණන් වහන්ස, මට අවසර යි. මම නික්ම යමි. මගේ අභිමතාර්ථය සපුරා ගෙන ඔබ වෙත එන්නෙමි' යි ආචාර පවත්වා දොර හැරගෙන එතැනින් නික්මුණාහ. වැඩි දුරක් නොයා දීම මාහානාම කුමරු හමු විය. හෙතෙම 'ඔබට සක්විති රජබව ලැබෙනුයේ සෙට ය, එ බැවින් නොයන්න' යන ආදීන් නොයෙක් සැටියෙන් කන්නලවු කෙළේ ය.* බෝසතාණෝ ඒ කිසිත් නොතකා ඉදිරියට ම ගියාහු ශාක්‍යදේශය ද

---

* පාලි අටුවාහි වසවත් මරදෙව්පුතු අවුත් ගමන වළක්වාලන්නට කළ කථාව ලෙස අන්‍යාලාපයෙන් සඳහන්කොට ඇත්තේ මේ මහානාම කුමරුගේ උත්සාහය වියැ යුතු ය. පැවිදිගුණදහම් වඩන්නවුනට කෙනකු විරුඬ වනුයේ මාරාවේශයෙනි යි ථෙරවාදීන් පවා පිළිගත් අදහසෙකි.

පසු කළාහ. ක්‍රමයෙන් කෝලිය රට ද ඉක් මැ මෙසේ දෙළොස් යොදුන් මඟ* ගෙවා මල්ල රටට පැමිණ පසු දිනට එළිය වැටීගෙන එන වේලෙහි **අනෝමා** නදී තීරයට පැමිණියහ. අසු පිටින් නො බැස ම නදියෙන් එගොඩ ව ගියහ. එහි සුදු වැලිතලායෙහි දී අසු පිටින් බිමට බැස්සාහ. ඉක්බිති ටික වේලාවක් එහි වැල්ලේ හිඳ ගමන් වෙහෙස නිවා ගෙන මුහුණ අත්පා සෝදා ගත්හ. එයට පසු දකුණතින් කඩුව ද වමතින් කෙස් වැටිය ද ගෙන එය සිඳ අහසට දැමූහ. එය එයින් ම නොපෙනී ගියේ ය.+[27] බෝසතාණන් වහන්සේ තමන් ගේ වස්ත්‍ර ම තවුසකු ගේ නියායෙන් හැඳ පෙරෙවැ අතීත බුදුවරුන් සිහිකොට දෙහොත් මුදුන් තබා වැඳ ආජීවාෂ්ටමක ශීලය[28] සමාදන් වැ ගත්හ. මෙසේ තවුස් පැවිද්දෙන් පැවිදි වූහ. ඉක්බිති තමන් හැඳ පැළඳ තුබුණු සැට්ට හා ආභරණ ඡන්නයාට පැවරූහ. මෙ විටැ 'ස්වාමීනී, මමත් පැවිදි වෙමි'යි ඡන්නයා සැළ කෙළේ ය. 'ඡන්නයිනි, ඔබ දැන් ම පැවිදි වනු නො යෙදෙයි. පියාණන් වහන්සේත් කුඩා මෑණියන් වහන්සේත් යශෝධරාවෝත් නන්ද කුමාරයෝත් සෙසු නෑයෝත් මා පැවිදි වූ බව නො දනිති. එබැවින් අශ්වයාත් මේ ආභරණාදියත් රැගෙන නුඹ දැන් කිඹුල්වත් පුරයටම යන්න. ගොස් මේවා බාර දී මපියාණන් වහන්සේටත් සෙසු අයටත් මා පැවිදි වූ නියාව සැළ කරන්න. තව කලක් ගිය තැන නුඹ ද පැවිදි කැරැ ගන්නෙමි, දැන් පිටත් වැ යන්නැ'යි බෝසතාණෝ වදළාහ. මේ වේලෙහි කන්තක අසු සිය ආදරණීය ස්වාමියා ගෙන් තමා වෙන් වන අවස්ථාව එළැඹී ඇති බව හැඟීමෙන් සෙනෙහබර සිතින් බෝසතාණන්ගේ සිරිපා ලෙවකමින් සෞම්‍ය බැල්මෙන් ඔබ දෙස බලා ගෙන ම හුන්නේ ය. බෝසතාණෝ ද ඔවුනට සමු දී එතැනින් පිටත් ව ගියහ. අස් තෙම එසේ වඩනා බෝසතාණන් දෙස ඇසි පිය නොහෙළා කඳුළු පිරි ඇසින් බලා ගෙන ම සිටියේ, ඔබ නො පෙනී ගිය පසු ප්‍රිය විප්‍රයෝග දුක ඉවසාගත නොහී ළය පැළී එහි ම මැරී වැටුණේ ය.[29] (හේ තව්තිසාහි දෙව්පුතෙක් වැ උපන.)

---

* පාලි අටුවාහි තිස්යොදුන් මඟ ඉක්මැ ගියහ යි සඳහන් ව ඇතත් කිඹුල්වත් පෙදෙසැ සිට අද අැමි නමින් හැඳින්වෙන අනෝමාව තෙක් දුර මයිල සැත්තෑවකට වඩා නැත. සකුබොදු පොත්හි දැක්වෙන දෙළොස් යොදුන් කථාව හරි බව හැගේ. යොදුන යනු එක්කලෙක මයිල පහකුත් ස්වල්පයක් පමණ දුරෙක් ව බැවහර විය.

\+ සක්දෙවිඳු ඒවා රුවන් කරඬුවෙකින් ගෙන ගියහ යි අප පොත්හි දැක්වේ.

ඡන්නයා අශ්වයාගේ මළ සිරුරට කළ යුතු සත්කාර කොට හඬමින් වැලැපෙමින් කිඹුල්වත අතට නික්ම ගියේ ය.

බෝසතාණන් වහන්සේ ද අනෝමා තීරයෙන් පිටත් ව වඩනාහු, වැඩි දුරක් නො ගියාහු ම තමන් ඉදිරියෙන් එන වැද්දකු [30] දුටුහ. හේ ළඟට ම ආයේ ය. දුනුහී ඇති වැ සිටි නුමුදු ඔහු පිටැ එල්ලෙන පසුම්බියක් සහිත පාත්‍රයෙක් විය. ඔහු හිසැ තබා ගත් බඩු පොට්ටනියෙක් ද විය. බෝසතාණන් වහන්සේ පාත්‍රය දැක විමැසුම් සහිත වූහ. 'ඔබ හිසැ පොට්ටනියේ කිමෙක් ඇද්ද?'යි විචාළාහ. හේ පොට්ටනිය බිම තබා ලිහා පෙන්වීය. එහි සිවුරු පිරිකර ය. 'මේවා කොහි ගෙනයවු දැ?'යි බෝසතාණෝ පුළුවුත්හ. මෙය ඕනෑ කරන පැවිදි කෙනෙකුට දෙන්නට ගෙන යමි. මෙය රුක් බෙනයක තිබී ලදිමි'යි වැදි කී ය. 'මම පැවිද්දෙකිමි. ඔය සිවුරු හා පාත්‍රය මට දෙන්න, මගේ මේ කශී වස්ත්‍ර නුඹ ගන්නැ'යි බෝසතාණෝ වදළාහ. හේ ඒ බස පිළිගෙන තමා ගෙනා පැවිදි පිරිකර බෝසතාණන් වහන්සේ ට පිළිගැන්වී ය. බෝසතාණෝ ඒවා හැඳ පෙරෑවැ පාත්‍රය ද උරේ එල්ලා ගත්හ.* තමන් එතෙක් දැරූ කශී වස්ත්‍ර වැද්ද අත තැබූහ. හේ ද ඒවා රැගෙන කිඹුල්වත අතට ම නික්ම ගියේ ය.

බෝසත් තවුසාණන් වහන්සේ ද සමීපයේ වූ අඹවනයක් දැක එහි වැඩියාහ. මේ මල්ලරටැ මායිමේ වූ **අනුපිය** නම් නුවර සමීපයේ වූ අඹවනය ය.

---

* මේ පුවත පාලි අටුවාහි නැත. සකු බණපොත්හි විස්තරයෙන් ඇත. මෙසේ වැදි වෙසින් හෝ වැද්දකුට ආවිෂ්ට වී පිරිකර ගෙන ආයේ දෙවියෙකැ යි සමහර සකු පොත්හි එයි. එය ම විස්තර නොකොට බ්‍රහ්මයා පිදූ පිරිකර පිළිගත් හ යි ඉතා කොටින් පාලි පොත්හි ආ නියාව පෙනෙයි. යට කී රුක් බෙනයට අට පිරිකර කොයින් ද ? මෙය මහායාන පොත්හි විස්තර කැරෙයි. කලකට පෙර එ පෙදෙසේ කිහිප දෙනෙක් පැවිදි වැ පසේ බුදු වූහ. එයින් එක් නමක් පිරිනිවෙනුවෝ නොබෝ කල්හි ලොවුතුරා බුදුවන බෝසතාණන් උපදිති යි දැන තමන් අට පිටපිරිකර ඒ බෝසතාණනට ලැබෙන ලෙසක් සලස්සන්නැ යි කියා සිය පවුලේ අයට පවරා තුමූ හිමවතට වැඩ පිරිනිවියහ. ඒ බෝසතාණන් උපන් දවසැ පිරිනිවී මාතංග පසේ බුදුහු ය. උන්වහන්සේ ගේ නෑ පරපුරෙහි එය බාර ව අන්තිමට සිටි තැනැත්තී වනයේ මහ රුක්බෙනයෙක එය තැන්පත් කොට රුක්දෙවියා අයැද එය බෝසත් කෙනෙකු පහළ වූ විට ඔබට ලැබෙන සැටියක් සලසන් නැ යි කියා ගියා ය. මේ වැද්දා වෙනෙහි යන විට එය දැක මෙසේ හැරගෙන ආයේය.

**අනුපිය අඹවෙනෙහි සතියක්**

ළදරු වියේ සිට නවවිසි වන වස තෙක් ම නිතර පැවැති නැටුම් ගැයුම් වැයුම් හා ඇසුරු කළවුන් ගේ කතාබස් ආදී වශයෙන් කිසිදු තිසි විවේකයක් නොලැබ කල්ගෙවූ බෝසතාණන් වහන්සේට ඒ සියල්ලෙන් වෙන් වැ පටන්ගත් මේ හුදෙකලා ජීවිතය මහත්ම සැනසිල්ලෙක් වැ වැටැහිණ. ලෝක තත්ත්වය ජීවිත තත්ත්වය සිතා බලන කෙනකුට අවශ්‍ය වනුයේ ජනයා ගෙන් වෙන් වූ හුදෙකලා බවයි. එය ලත් බෝසතාණන් වහන්සේ එයින් උපන් විවේකය ද ඒ නිසා ම උපන් ප්‍රීතිය ද භුක්ති විඳිනුවෝ නුවණින් ජීවිත තත්ත්වය විමසනුවෝ සතියක් ම කල් යැවූහ. සාපිපාසාවෙක් ඇති නොවී ය. මේ අතර 'මගේ වියෝගයෙන් ඇති වන ප්‍රියවිප්‍රයෝග දුක දරා ගැන්මේ ශක්තිය පියාණන් වහන්සේටත් කුඩා මෑණියන් වහන්සේටත් යශෝධරාවනටත් නන්ද කුමාරයාටත් නන්ද කුමරියටත් සෙසු ඥාතිගණයාටත් යන හැම දෙනාට ම ඇති වේ වා. එයින් කිසි කෙනකුටවත් කිසිම විපතෙක් නොවේ වා'යි තරයේ අධිෂ්ඨාන කළහ.

බෝධිසත්වයන් වහන්සේ අනුපිය අඹ වනයෙහි සතියක් වැස එයින් නික්මුණාහු **ශාක්‍යා බ්‍රාහ්මණී** නමින් ප්‍රසිධ තපස්විනියක ගේ අසපුවට වැඩියාහ. තපස්විනි තොමෝ බොජුනින් ද නවාතැනින් ද සංග්‍රහ කළා ය. එ තැනින් උගත යුතු දැයක් නැති සේ දැක නොදුරැ වූ **පද්මා** නම් තපස්විනිය ගේ අසපුවට වැඩියාහ. එහි දී ද මහත් ආදර සත්කාරයෙන් පිළිගන්නා ලදහ. එතැනිනුත් උගත යුතු දැයක් නැති තියා දැක එහෙන් ද නික්මුණහු. නොදුරැ වූ රේවත නම් සෘෂිහු ගේ අසපුවට වැඩියාහ. ඒ සෘෂිහුගේ ද ධර්මයෙහි සාරයක් නොදුටුවාහු එ තැන නො සිට නික්මුණාහ. මෙසේ වඩනාහු රජගහ නුවරට සමීප අසපුවෙක යාගහෝම, කෙරෙමින් නොයෙක් ව්‍රත පුරමින් වසන තවුසන් සමූහයක් ඉන්නා භාර්ගවාශ්‍රමයට පිවිසියාහ. අසපුවට අධිපති **භාර්ගව** තෙම මහත් සත්කාරයෙන් බෝසතාණන් පිළිගත. ඔහුගේ දහම විමසා බලනුවෝ සගසුව පතා යාගහෝම කරනුවට වැඩියෙන් දැයක් නැතැයි දැක එතැනින් ද නික්මෙන්නට සැරැසුණහ. එය දුටු එහි ව්‍රත පුරන මහලු තවුස් කෙනෙක් 'ඔබ සොයන දහම උගන්වන **ආළාර** නම් තවුස් කෙනෙක් විසාලා මහනුවර **වින්ධ්‍යාකෝෂ්ඨ** නම් අසපුවේ වෙසෙති. එහි වඩින්නැ'යි කීහ. **විසාලා** මහනුවරට යෑමට රජගහ නුවරට ගොස් ගංගානදියෙන් එගොඩට යෑ යුතු ය. එ බැවින් බෝසතාණෝ පළමු කොට රජගහ නුවර අතට ගමන ඇරැඹූහ.

බෝසතාණන් වහන්සේ රජගහ නුවරට පැමිණියේ එක් දවසෙක උදේ වරුවේ ය. පිඬු සිඟා යෑමට කාලය වූ බැවින් උන් වහන්සේ පාත්‍රය අතින් ගෙන නික්මුණා හ. එහි රජය කරවන බිම්බිසාර රජ බෝසතාණන් වහන්සේ ගේ අදෘෂ්ට මිත්‍රයෙකි. 'මා මෙහි ආ බව රජුට දැන්නුවොත් මහත් සත්කාර සංග්‍රහ ලැබෙනු ඒකාන්ත ය. එහෙත් දන්වා යවා සංග්‍රහ ලැබීම නො සුදුසු ය. පිඬු සිඟා ගොස් ලත් දැයින් යැපීම එයට වඩා උතුම් යැ' යි බෝසතාණන් වහන්සේ සිතූහ. එසේ සිතා පාත්‍රය ගෙන ගෙපිළිවෙළින් නුවර වීථියේ පිඬු සිඟා වැඩි සේක. එයට පෙර කිසි කලෙක නොදුටු අපූර්ව රූපශ්‍රීයෙන් බබලන බෝසතාණන් දුටු නුවරු විස්මිත වූහ. බෝසතාණන්ගේ රූපශ්‍රීයෙන් වශීකෘත වූවාහු තමන්ගේ වැඩ කටයුතු නවතා උන්වහන්සේ දෙස බලා ගත් වන ම සිටියාහ. 'මේ නම් මනුෂ්‍යයෙක් නොවේ. මහා බ්‍රහ්මයා කිසි යම් අදහසකින් මිනිස් වෙසින් පැමිණ සිට යැයි කෙනෙක් කීහ. සමහරු, මේ බ්‍රහ්මයා නොවේ කලින් කල ලොවට එන විෂ්ණුහුගේ මනුෂ්‍යාවතාරයෙකි' යි කීහ. සමහරු, මේ ශිව දෙවියෝ' යි ද සමහරු, මේ සඳ මඬලට අරක්ගත් සඳ දෙව්රජ' යැ යි ද තව කෙනෙක් 'මේ හිරුමඬලට අරක්ගත් සූර්යදිව්‍යරාජයා විය යුතු යැ'යි ද තව කෙනෙක්, මේ අනංගයා ම විය යුතුයැ'යි ද තමතමන්ගේ ඇදහිලි අනුව කියන්නට වූහ. ගැඹුරට කරුණු සිතා බලන කිසි කෙනෙක් 'මේ ඔය කියන කිසිවෙක් නොවේ. ලෝවැඩ පිණිස පහළ වූ කිසි යම් මහ පිනැති උත්තමයෙකැ'යි කීහ. රාජපුරුෂයෝ බිම්සර රජු වෙත ගොස් බැහැ දැක, 'දේවයන් වහන්ස, රටට මහා ශාන්තියක් සැලැසෙන පෙර නිමිත්තෙක. 'දෙවියෙක්ද මිනිසෙක්දැ'යි නොදනිමු. පෙර නොදුටුවිරූ විස්මය උපදවන රූපශ්‍රීයෙන් යුත් කෙනෙක් පැවිදි වෙසින් නුවර පිඬු සිඟා යෙති' යි කීහ. රජ ද සීමැදුරුකවුළුව හැර බලනුයේ මහසතාණන් දැක විස්මිත වැ බලා උන්නේ ය. 'මේ ආශ්චර්ය කෙනක, දැකුම්කලු අඟපසඟින් යුක්තහ. ආරෝහපරිණාහ සම්පන්න හ. පිරිසිදු බබලන ඡවිවර්ණයෙන් යුත්හ. දුටුවන් පහදවන ඉරියව්වෙන් යුත්හ. දෙවියෙක් හෝ වෙන අමනුෂ්‍යයෙක් වී නම් ටික දුරක් ගොස් අදෘශ්‍යමාන වෙයි. මිනිසෙක් වී නම් කිසි තැනකට ගොස් සිඟාලත් ආහාර වළඳයි. තෙපි ගොස් බලා අවුත් මට කියවු' යැයි රජතුමා රාජපුරුෂයන් පිටත් කොට යැවීය.

---

* මේ ඇසළ අටවක් ද යැයි පාලි අටුවාහි පෙනෙතත් සර්වාස්තිවාදී පොත් වලද එබඳු දිනයක සටහනෙක් නැත.

බෝසතාණන් වහන්සේ, පිඬු සිඟාගෙන වඩනාහු 'මෙහි එන පැවිද්දෝ කොහි නවාතන් ගනිද්දැ?'යි මිනිසුන් අතින් විචාරා, 'අර පෙනෙන පාණ්ඩව පර්වතයේ නැගෙනහිර බලා පිහිටි ගල්තල්ලෙහි යැ'යි ඔවුන් කී බස් අසා ඒ අතට වැඩියහ. කන්ද නැග ගල්තල්ල ඇතුළට වැඩ, හිඳ ගෙන බොජුන් වළඳන්නට සැරසුණහ. බෝසතාණන් පස්සේ යමින් ඔබ කරනා සියල්ල විපරම් කරමින් ගිය රාජපුරුෂයෝ උන්වහන්සේ බොජුන් වළඳන්නා දැක වහා කන්දෙන් බැස රජු වෙත ගොස් තමන් දුටු සියල්ල සැළ කළාහ.

'මේ නම් මනුෂ්‍යයෙක, එහෙත් සෙසු මිනිසුන් බඳු කෙනෙක් නොවෙති. ආශ්චර්ය පුද්ගල කෙනෙක. ගොස් තොරතුරු විමසනු වටී' යැයි රජුට සිතුණේ ය. හේ මහ පිරිසක් කැටුව පිටත් වැ බෝසතාණන් වෙත පැමිණියේ ය.

රජ තෙම බෝසතාණන් දුටු කෙනෙහි ම උන්වහන්සේ ගේ වර්ණනා විෂයාතික්‍රාන්ත අනුපමෙය රූපශෝභාවෙන් වශීකෘත විය. ගරුබුහුමන් දක්වා පසෙක හිඳ කතාවට බටුයේ ය. 'ඔබ ඉතා සියුමැලි කෙනෙක, තව ම තරුණ වියෙහි ය. පිඬු සිහා යැපෙනු ඔබ වැන්නකුට නො වටී. පින්වතාණනි, මේ අංගමගධ දෙ රට විශාල ය. සරුසාර ය. මේ මුළු පෙදෙස දෙකට බෙදා කොටසක් ඔබට පිරිනමමි. ඉතිරි කොටස මම ගනිමි. මෙසේ අපි දෙදෙනා ම රට පාලනය කරම්හ'යි කී ය.

බෝසතාණන් වහන්සේ ඔහුගේ කථාව අසා, 'මෙ රජ මා නොහඳුනති' යි තමන් හඳුන්වන්නට සිතුහ. 'මහරජ, භූමි ප්‍රදේශ වශයෙන් කෝශල රටට ඇතුළත් ශාක්‍ය නම් රටෙක් හිමවත් පාමුල ඇත. බොහෝ පෙර සිට ම පරම්පරා උරුමයෙන් රටට අධිපති වැ පාලනය කරන සූර්යවංශික වූ ශාක්‍ය නමින් ප්‍රකට පරම්පරාවෙක් ඇත. ජරා ව්‍යාධි මරණ යන දුක්වලින් ලොව පෙළෙන්නා දැක එයින් මිදෙන මඟක් සොයනු වස් මට අයත් රජකම හැර දමා ඒ ශාක්‍ය කුලයෙන් නික්ම පැවිදි වීමි. විමුක්ති මාර්ගය සොයා යමි. එබැවින් ඔබ පිරිනමන රාජ්‍යයෙන් මට වැඩෙක් නැතැ'යි බෝසතාණෝ වදාළාහ.

එය ඇසූ කෙණෙහි ම රජුට කාරණය වැටහිණ. 'පින්වතාණන් වහන්ස, ශාක්‍යදේශාධිපති ශුද්ධෝදන මහරජාණන් ගේ පුත් වූ සිද්ධාර්ථකුමාරයන් සතර පෙර නිමිති දැක ගිහිගෙන් නික්ම ගොස් පැවිදි වැ බුදු වෙති'යි අසා ඇත්තෙමි. ළදරුවියේ සිට ම මා හා හසුන් හා

ඇටුපඩුරු හුවමාරුවෙන් මිතුරු වැ සිටින මගේ හිත මිතුරු වූ ඔබ වහන්සේ දැක්මෙන් ඉතා ප්‍රීත වෙමි. පින්වතාණන් වහන්ස, ඔබේ මනෝරථය සඵල වේවා. ඔබ වහන්සේ බුදු බව ලැබූ පසු කල් නො යවා මගේ නුවරට ද වඩින සේක් වා. ඔබ ලැබූ විමුක්ති සැපය අපට ද දී අප සනසන සේක්වා' යි රජ කී ය. බෝසතාණන් වහන්සේ ද 'එසේ ය, බුදු වූ පසු එන්නෙමි' යි වදාළ සේක. ඉක්බිති රජ ද පිරිස ද බෝසතාණනට මහත් ආදර බුහුමන් දක්වා වැඳ පැදකුණු කොට නික්මැ ගියහ. බෝසතාණන් වහන්සේ ද එදා රැ ගිජ්ජකූළු කඳු පෙදෙසැ අසපුවෙක වැස පසු දින උදේ විසාලා මහනුවරට යනු පිණිස එතැනින් පිටත් වූහ.

**බිලි පූජා නැවැත්වීම**

සිද්ධාර්ථ ගෞතම තපස්වීන් වහන්සේ විසාලා මහනුවරට යන අදහසින් ගංගානදියෙන් එ තෙර වියැ යුතු බැවින් එය අතට ගමන් ගත්හ. මේ අතර පන්සීයක් පමණ වූ බැටළු රංචුවක් දක්කා ගෙන රජගහ නුවර අතට එන අජ පල්ලකු ඉදිරි දෙසින් එන්නා දුටුහ. ඒ බැටළු රැළෙහි හැමට ම පස්සෙන් කොරගසමින් අමාරුවෙන් පිය නගන බැටළු පැටියෙකි. ඌ අහළින් ම උගේ මව් බැටළු දෙන ද එයි. අජපල්ලා කිසිදු අනුකම්පාවක් නැතිව කෝටුවෙකින් තළමින් බැටළු පැටියා ඉදිරියට යවයි. බෝසතාණන් වහන්සේ ඔහු හමු වැ මොවුන් කොහි ගෙන යන්නෙහි දැ? යි ඇසූහ. 'අප මහරජුගේ අපල උවදුරු දුරු කරන්නට වේද නියමය පරිදි අද නුවර ළඟ දෙවොලෙහි බිලි පූජාවක් කැරෙයි. රාජ නියෝගයෙන් බැටළුවන් පන්සියයක් ගෙන යෑම මට පැවැරුණි. මොවුන් ඒ දෙවොලට ගෙන යෙමි' යි අජපල්ලා කී ය. 'එසේ වී නම් මමත් එමි. මේ ළදරුවාට තළන්නට එපා. මේ පැටියා මම් වඩා ගෙනවුත් දෙමි' යි වදාළහ. ඉක්බිති තවුසාණන් වහන්සේ 'බැටළු පැටියා වඩා ගත් සේක. බැටළු රංචුව පස්සෙන් ගමන් ඇරැඹූහ. බැටළු පැටියාගේ මව ද උන්වහන්සේ ගේ කාරුණික බව හැඟී උන්වහන්සේ එක්ක ම ගියා ය.

බෝසතාණන් වහන්සේ කෙළින් ම පූජාසනය කරා වැඩියහ. එකෙණෙහි පූදසුනෙහි හෝනා බැටළුවකු කෙළින් මුවහත් පිහියක් ඔසොවාගත් පූජකයා එය අසරණ බැටළුවා ගේ බෙල්ලට කිට්ටු කරන්නට සැරසුණා පමණ ය. බෝසතාණන් වහන්සේ වහා එ තැනට පැන ඔහුගේ අත අල්ලා ගත්හ. බෝසතාණන් ගේ මුහුණ දුටු පූජකයා මෙල්ල වැ පසු බැයේ ය. එහි පැමිණ සිටි බිම්බිසාර රජු දෙස බැලීය.

රජ බෝසතාණන් දැක නිහඬ වැ බලාගත් වණ ම සිටියේ ය. බෝසතාණන් වහන්සේ 'අසරණ සතුන් බිලි දෙමින් තමන් ගේ උවදුරු දුරු කරගන්නට සිතා කරණ ඒ ක්‍රියාවලින් වඩාත් පව් රැස්වනු මිස, විපත් වැඩි වනු මිස, ඒවා අඩු නො වෙතැ යි ද, මේ අසරණ සතුන් බිලිගන්නා තැනැත්තෙක් ඇත්නම් ඒ දෙවියෙක් නොවැ හීන දීන රකුසෙකැ යි ද යන ආදීන් කරුණු කියා අවවාද කළහ. බිම්බිසාර රජතුමා ඒ අවවාදය පිළිගෙන එ වේලෙහි ම සිය රටෙහි සත්ත්ව බලිපූජා තහනම් කෙළේ ය. බුදු වූ පසු වඩින්නැ'යි යලිදු අයැද වැඳ නික්මියේ ය.

බෝසතාණෝ ද විසාලා මහනුවර බලා වඩනාහු ගංගා නදිය අතට පිය නැඟූහ.

## දස වැනි පරිච්ඡේදය

**කිඹුල්වත් නුවර තොරතුරු**

බෝසතාණන් රජගෙන් නික්ම ගිය බව දත් සියල්-ලෝද නුවර වැසියෝ ද හඬා වැලැපුණාහ. මුළු නුවර මළගෙයක් මෙන් විය. ප්‍රජාවතී ගෞතමී, පැටියා නැති වූ දෙනෙක මෙන්, ශෝකහරිත වූවා බිම වැතිර වැලපෙ-න්නට වූවා ය. යශෝධරාවෝ මුසපත් වැ වැටුණාහ. සේවිකාවෝ දිය ඉසීම් ආදි විසින් කළ සාත්තු නිසා බොහෝ වේලාවෙකින් පියෙවි සිහි ලද්දී සියගෙහි බිම වැතිර හැඬූ කඳුලෙන් කල් ගෙව්වා හ. ශුද්ධෝදන රජ ඇයට කිසි විපතක් වේ දෝ යි බියෙන් නිතර අවවාද කරමින් රාහුල කුමරු රැක ගැන්මෙහි මෙහෙයී ය. දෙව්දත් කුමරු හැර සෙසු සියලු ශාක්‍යයෝ 'තමන් බලාපොරොත්තු වූ ශාක්‍යවංශිකයන් ගේ නැඟීම නැවතිණැ'යි බොහෝ සෙයින් තැවුණාහ.

සතියක් මෙසේ ගෙවුණ තැන ඡන්නයා එහි ආයේ ය.* දුටු දුටුවෝ 'සාමි දරුවන් ගෙන කොහි ගියෙහිදැ? යි ඔහුට බැණ වදින්නට වූහ.

* ඡන්නයා සිය කුලයට ගැළපෙන කුලයෙකින් **නම්ද** නම් කුලදුවක පාවාගෙන සිටියේ ය. සිඩාර්ථ කුමාරයන් කවර ද හෝ පැවිදි වෙති'යි කථාව ශාක්‍යදේශයෙන් පිටත ද පැතිරැ පැවැත්තේ ය. සිඩාර්ථ කුමාරයන් පැවිදි වුණොත් තමාත් පැවිදි වන බව ඡන්නයා සිය ගෙහිදීත් කියයි. මෙයින් ඔහුගේ බිරිය වූ නම්ද නිතර සැකෙන් බියෙන් කල් යැව්වා ය. තම සැමියා සිඩාර්ථ කුමාරයන් කෙරෙහි පවත්වන ආදර භක්තිය නො ඉවැසුවා ය. බෝසතාණන් සමග ඡන්නයා ද ගිය බව ඇසූ ඕ තොමෝ සිඩාර්ථ කුමරුන් තම සැමියා රැගෙන ගියහ යි දෙස් දෙවොල් තබමින් හැඬුවා ය. මේ පුවත ද ඇය කියූ විලාපය ද මුඛ පරම්පරායෙන් ගෙන එන ලදු ව නවම නේපාලයේ පිටිසර ගම්වල ගැමි කථා අතරැ පවතී.

පෙරළා ආ ඡන්නයා දුටු යශෝධරාවෝ ඔහු බණවා සාමිදරුවෝ කොහි ගියෝද? තුඹ කිසිවකුටත් ඇඟවීම් මාත්‍රයකුත් නොකොට සාමිදරුවන් කොහේදෝ ගෙන ගොස් දමා අවුත් දැන් බොරුවට කඳුළු වගුරුවති'යි තරවටු කළා ය. 'ආර්යාවනි, සාමිදරුවන් ගේ සේවක වූ මම් උන්වහන්සේ කරණ නියෝගය පිළිපදිනුවා විනා අන් කුමක් කළ හැකියෙම් ද? මම් අඩා වැලැපෙමින් ගමන නවත්තන්නට කොතරම් වත් තැත් කෙළෙමි. බැරි ම වූ තැන උන්වහන්සේට නො දැනෙන්න ක්ෂණයෙන් ඔබවහන්සේ ගේ යහන් ගබඩාවේ දොර ළඟට අවුත් ඔබ පුබුදුවන්නට සිතා මහත් ශබ්දයක් කොට වහා ගියෙමි. ඔබ ඒ හඬින් පිබිද ආවා නම් ගමන නතර කරන්නට තුබුණි. එහෙත් කිසිමැ කෙනෙක් නො පිබිදුණාහ. කිසිම කෙනෙක් නාහ. සේවක වූ මම් ස්වාමියාගේ අණ පිළිපැද්දෙමි. මා කළ වරදෙක් නැතැ'යි ඡන්නයා කී ය. එයට පසු කිසි ම කෙනෙක් ඔහුට දොස් නො නැඟුහ.

ශුද්ධෝදන රජ ද පුත්‍රයාණන් ගැන බාරහාර වීමට ශාක්‍යවර්ධන දෙවොලට ගොස් ආවාහු ඡන්නයා දැක තොරතුරු අසා වැලැපෙන්නට විය. මේ අතර බෝසතාණන්ගේ කසීවස්ත්‍ර මිටියක් කොට බැඳ හිස තබා ගෙන නුවරවන් වැද්දා දුටු මිනිස්සු ඔහු රජු වෙත ගෙනාහ. රජ්ජුරුවෝ ඒවා දැක 'මේවා කෙසේ ලද්දෙහි ද? කුමරුට විපතක් වත් කෙළෙහිදැ?'යි ඇසූහ. හේ සියලු පුවත කී ය. රජ බෝසතාණන් ගිය දිශාව ඔහුගෙන් දැනගත්තේ ය. පුත්‍රයාණන් සිය කැමැත්තෙන් ඔහුට දුන් දැ ඔහුට ම වේවා' යි කියා යන අතෙක යන්නට ඔහුට සමු දුන. ඡන්නයා තමා ගෙනා ආභරණ ප්‍රජාවතී ගෞතමීනට බාර දුන්නේ ය.

රජුහුගේත් ප්‍රජාවතී ගෞතමී යශෝධරා ආදීන්ගේත් මහත් වැලපීම දුටු පෙරෙවි බමුණාත් මහ ඇමැතියාත් 'ඔබ අවසර දෙතොත් අපි ගොස් කුමාරයාණන් කැඳවා ගෙනෙම්හ' යි කියා ඔවුන් අස්වැසූහ. හැඬුම් වැලැපුම් අඩු විය. රජ්ජුරුවෝ පෙරෙවියාත් ඇමැතියාත් පිටත් කැරැ යැවූහ. ඉක්බිති දෙවොලෙහි පූජකයන්ගේ නියමය පරිදි බෝසතාණන් දේව බලයෙන් ගෙන්වන්නට ව්‍රත පිරීමෙහි යෙදුණාහ.

අස්රියවල නැඟ වේගයෙන් පදවා ගිය පෙරෙවියා සහිත පිරිස දෙවෙනි දවසෙහි රජගහනුවර ද පසුකොට යන්නාහු, විසාලා මහනුවර දෙසට යන ගමනේ· ගංගා නදියෙන් මෙ පිට මහ රුක් සෙවෙණෙක විවික්ත ව ඉන්නා බෝසතාණන් දුටුහ. ප්‍රීතියෙන් ඉපිල ගිය සිතැත්තෝ රිය නවතා එයින් බැස වහා බෝසතාණන් වෙත ගොස් වැඳ පසෙක

ඉඳ ගත්හ. පියරජාණන් ඇතුළු හැම දෙනා මහත් සොවින් හඬන වැලපෙන නියාව කියා, 'ඔවුනට එසේ දුකක් දීම ධර්මය නො වේ යැ යි ඔවුන් සනසනු 'පිණිස කලක් රජය කරවා පසු ව පැවිදි විය හැක්කැ'යි ආදීන් කියා ආපසු යන්නට කැඳවූහ. බෝසතාණෝ ඔවුන්ගේ කථාව නිහඬව අසා හිඳ මෙසේ කියන්නට වූහ: 'මාපියන්ගේ දරු සෙනෙහස මම දනිමි. එහෙත් අපේ ජීවිතය ගොදුරු කැරැගන්නා ජරා ව්‍යාධි මරණ යන මේ දරුණු දුක් තුන වඩාත් මගේ සිතට වැදිණ. එබැවින් එයින් මිදෙන මඟක් සොයන්නට ය මා සිත නැමුණේ. දැන් ඔවුන් සනසන්නට මා ගියත් කවර දා හෝ මරණය ආ විට ආයෙත් මේ හැඬුම් වැලැපුම් ඇති වෙයි. මගේ පියා තුළත් කුඩා මෑණියන් තුළත් යශෝධරා ආදීන් තුළත් ශෝකය ඇති කළේ මා යැ යි ඔබ කියති. මම එය නො පිළිගනිමි. මපියාණන් ආදීන්ගේ ශෝකයට හේතුව ජීවිතයේ යථා තත්ත්වය මුවහ කරණ ඒ අය තුළ ම පවත්නා අවිද්‍යාව යි. දූදරු නෑ මිතුරන් හා එක් වැ විසීම ස්වප්නයක් වැනි එකෙකි. ඔවුන්ගෙන් වෙන් වෙමැ යි හෝ වෙන්වුම්හයි හැඟෙන්නා හා ම ශෝකය ඇති වේ. ප්‍රියවිප්‍රයෝගය ලොවැ ඉපිද ඉන්නා තාක් ම ඇති වන එකෙකි. එය වැළැක්විය නොහෙයි. එය වළක්වන්නට නම් ලොවින් මිදීගත යුතු ය. මේ සියලු දුකින් මිදීමට මඟ සොයා මා ඉදිරියට තැබූ පියවර ආපසු නො ගන්නෙමි. මගේ මනෝරථය මස්තක ප්‍රාප්ත කැරැගෙන මිස එසේ නැති වැ නැදැයින් වෙත නො එන්නෙමි.'

බෝසතාණෝ මෙබඳු වූ ම කරුණු තව දුරටත් වදාළාහ. ඉක්බිති හුනස්නෙන් නැගී සිට පිටත් වැ ගියහ. පෙරෙවියාත් ඇමැතියාත් බෝසතාණන් වඩිනා මඟ දෙස බලා සිට 'දැන් කුමක් කරමෝ ද ? මහ රජුට මොනවා කියමුදැ?' යි කියා තමන් හා ආ රාජපුරුෂයන් කිහිප දෙනකු 'අප්‍රසිද්ධ වේශයෙන් ගැවසෙමින් කුමාරයාණන් යන යන අතට ගොස් ආරක්ෂා සලස්වන්නැ'යි කියා එහි නවතා, තුමූ පෙරළා කිඹුල්වතට ම ගියහ.

---

# එකොළොස් වන පරිච්ඡේදය

බෝසතාණන් වහන්සේ රජගහ නුවර පෙදෙසින් නික්මැ විසාලා මහනුවර බලා වඩනාහු ගංගානදී තීරයට පැමිණියාහ. ගඟින් එගොඩ වූහ. විසාලා මහනුවරට වැඩ එය සමීපයේ වූ වින්ධ්‍යාකෝෂ්ඨයට පැමිණියාහ. එ සමයෙහි කාලාම ක්ෂත්‍රිය පරපුරට අයත් ආළාර නම් සෘෂි තෙම තුන්සියක් පමණ වූ තවුස් ගණයාට නායක වැ

වින්ධ්‍යාකෝෂ්ඨ අසපුවෙහි වෙසෙයි. හේ සප්ත සමාපත්තිලාභී මහ තවුසෙකි. ශ්‍රාවකගණයාට **ආකිංචඤ්ඤායතන** භූමිය තෙක් ශමථභාවනා මාර්ගය පෙන්වා දෙයි. හෙතෙම එහි වැඩි බෝසතාණන් දැක සාදර වැ පිළිගෙන එහි නැවැතී භාවනා කරන්නට අවශ්‍ය සියලු සැප පහසුකම් සැලැස්වී ය. බෝසතාණෝ ද ඔහුගේ අවවාදයෙහි පිහිටා බවුන් වැඩූහ. කලින් ගිහි කලැ ආනපානසතිය වඩා පුරුදු බැවින් සිත සමාධිගත කිරීම ඔබට ලෙහෙසිකාරියෙක් විය. මෙසේ නොබෝ දිනෙකින් බෝසතාණෝ ද ආකිංචඤ්ඤායතන ධ්‍යානය ලැබූහ. ආළාර තවුසාණෝ බෝසතාණන් තමන්ගේ තත්ත්වයට ම නැංග තියාව දැක ඉතා පැහැදුණෝ ගෝල පිරිස දෙකොටසකට බෙදා කොටසක් බෝසතාණනට පැවරූහ. එතැන් සිට තමාට දායකයන් පිරිනමන සියලු සත්කාර බෝසතාණන් අතට ම යොමු කෙරෙති. ඉතිරි වූ දැයක් ඇතොත් තුමූ පිළිගනිති. හැම තන්හිදී ම බෝසතාණනට ප්‍රමුඛස්ථානය දෙති. බෝසතාණෝ ද ආකිංචඤ්ඤායතන සමාපත්තිය පිරිසිඳැ බලනුවෝ එය පරම විමුක්තිය නොව ලොවට ම ඇතුළත් තරමකට සිතැ සංසුන් බව ඇති කරන සමාධි මාත්‍රයක් බව දුටුහ. 'මෙයටත් එහා කළ යුතු දැයෙක් නැත් දැ'යි ආළාරයන් විචාළහ. 'නැතැ' යි 'මේ පරම නිෂ්ඨාව යැ'යි ඔහු කීහ. ඉක්බිති බෝසතාණෝ මෙහි විසීමෙන් වන විශේෂ අර්ථයෙක් නැතැ යි සලකා. ආළාරයනටද ඒ බව දන්වා සමුගෙන ඒ අසපුවෙන් නික්මිය හ.

**උද්‍රකයා වෙත යෑම**

මහ බෝසතාණන් වහන්සේ සැරිසරන සේක් **මහී** නදියෙන් එගොඩ **රාමපුත්‍ර උද්‍රක** නම් මහ තවුස් ඇදුරකු ඉන්නා බව ඇසූහ. ඒ පළාතේ අධිපති **ඒලෙය්යක** පෙදෙස් රජ ද ඔහුගේ **යමක, මොග්ගල්ල, උග්ග, නාවින්දකී, ගන්ධබ්බ, අග්ගිවෙස්සාන** යන මහ ඇමැතියන් ද ඔහු තමන් ගුරුකොට සලකන බව ද ඇසූහ. එහි ගියොත් මැනැවැ යි බෝසතාණනට සිත් විය. නොබෝ දිනෙකින් ම ඔහුගේ අසපුවට වැඩියාහ. ඒ තවුසාණෝ ද බෝසතාණන් දැක සාදර ගෞරවයෙන් පිළිගත්හ. නවාතන් දුන්හ. ආහාරපානා දී අවශ්‍ය සියලු දැ සපයමින් ම තමන්ගේ කර්මස්ථාන මාර්ගය ද ඉගැන් වූහ. බෝසතාණෝ ද එය ඉගෙන පිළිපැද නොබෝ දිනෙකින් **නේවසංඤ්ඤානාසඤ්ඤායතන සමාධිය** ලැබූහ. බෝසතාණෝ තමන් ලත් සමාධි තත්ත්වය පැවැසූහ. 'මගේ ගුරු වූ **රාම** තවුසාණෝ ද ඔය සමාධිය ලැබ සිටියහ. එහෙත් මා වනාහි ඒ මගේ ගුරුන් ගෙන්

මේ සාමධි භාවනා ක්‍රමය ඉගෙන ඇතත් ඒ පරිද්දෙන් ම උගන්නතත්, තව ම ඒ සමාධිය නම් නො ලැබීමි. ඔබ මගේ ගුරු වූ රාම මහර්ෂීන්ගේ තත්ත්වයට පැමිණියහ. මෙ තන් සිට මෙහි අධිපති වැ වැඩ ඉන්න. අපි හැම ඔබගේ ශිෂ්‍යයම්හ`යි කියා ශිෂ්‍යයොත් තෙමේත් බෝසතාණන්ගේ ශිෂ්‍ය බවට පත් වූහ. `මෙයින් වැඩිමනත් කිසිවක් ඔබ නො උගත්වත්දැ?`යි බෝසතාණෝ උද්‍රකයාගෙන් ඇසූහ. `නැත, මේ අප ගුරු වූ රාමර්ෂීන් ඉගැන් වූ පරම විමුක්තියැ`යි උද්‍රක කීය. බෝසතාණෝ විමසා බලනුවෝ එය තමන් සොයන පරම විමුක්තිය නොවේ යැ යි දැන, එයට මග පෙන්වන අන් ඇදුරක්හු සොයා යන්නට සැරසුණාහ.

ශුද්ධෝදන රජතුමා ද පුතණුවන්ගේ තොරතුරු විමසා තමාට දන්වනු පිණිස මාරුවෙන් මාරුවට තමා යවන දූතයන් මගින් බෝසතාණන් වහන්සේගේ තොරතුරු දැන ගනී. මෙය රජ පවුලේ හැම දෙනාට ම සිත් සනසා ගන්නට හේතු විය. උන්වහන්සේ රාමපුත්‍ර උද්‍රක තවුසාණන් ගේ අසපුවට පැමිණ වසන සමයෙහි රජ්ජුහු විසින් එවන ලද දූතයෝ ඔබට විශේෂ උපස්ථායක කෙනෙක් නැතැ යි දුටුහ. ගොස් එපවත් රජුට දැන්වූහ. මෙය ඇසූ සුදොවුන් රජුත් සුප්‍රබුද්ධ රජුත් තමන් වෙතින් වෙන වෙන ම පිරිස් දෙකක් බෝසතාණනට උපස්ථාන පිණිස ඒ අසපුවට එවූහ.

ඒ පිරිස්හි වූ **කොණ්ඩඤ්ඤ, භද්දිය, වප්ප, මහානාම, අස්සජි** යන තවුසන් පස් දෙනා පමණක් බෝසතාණෝ තමන් වෙත රඳවා ගත්හ. සෙස්සන් පෙරළා යැවූහ. මෙයින් **කොණ්ඩඤ්ඤ** යනු බෝසතුන් උපන් පස් දිනෙන් නාමකරණ මංගලයට පැමිණි බමුණන් අතුරෙන්, `මෙ තුමෝ ගිහිගෙයි නොරැඳෙන්නා හ. පැවිදි වැ බුදු වන්නාහු මැ යැ` යි කී බමුණන් පස් දෙනා ගෙන් ළා බාල ම තැනැත්තේ ය. සෙසු සතර දෙනා අනිත් බමුණන් සිවු දෙනාගේ දරුවෝ ය. ඔහු ඒ කාලයේ ම බෝසතාණන් නමින් තවුස් පැවිද්දෙන් පැවිදි වැ කිඹුල්වත් පුර අසළ වෙනෙහි වැස තවුස් දම් වැඩූහ. ශුද්ධෝදන රජුත් සුප්‍රබුද්ධ රජුත් බෝසතාණනට උවටන් පිණිස එවන පිරිසට ඇතුළත් වැ ආහ.

බෝසතාණන් උද්‍රක ආශ්‍රමයෙන් නික්මෙනුවන් කැටුව ම ඔහු ද නික්මුණා හ. බෝසතාණෝ ද පස්වැගි තවුසන් කැටුව සැරිසරනුවෝ රජගහ පුරයෙන් ද නික්ම ගයාවට පැමිණ එහි ගයා ශීර්ෂයෙහි ලැගුම් ගත්හ.

එහි වසන බෝසතාණනට දවසෙක මෙසේ සිතෙක් විය. 'තෙත් වූ ගිනිගානා දඬු දෙකක් එකට කොතරම් මැද්දත් ගිනි නො උපදින්නා සේ කාමයන්හි ඇලී ගැලී සිටිනවුනට එහි ඇලී සිටුනා තාක් උත්තරී මනුෂ්‍ය ධර්ම සාක්ෂාත් කරන නො හැක්ක. තෙත් වූ ගිනිගානා දඬු දෙකක් වියැලි බිමෙහි තබාගෙන මැද්දත් ගිනි නොඋපදින්නා සේ කම් සැපෙහි ඇලී ගැලී නො උන්නත් සිත තුළැ කාමතෘෂ්ණාව තිබෙන තාක් උත්තරී මනුෂ්‍යධර්මයන් ලබන හැකි නො වන්නේ ය. වියැලි ගිනිගානා දඬු දෙකක් වියැලි බිමැ තබා මඩිනා විට ම ගිනි උපදින්නා සේ කාමතෘෂ්ණාව දුරුකොට සිටියාහු විසින් ම උත්තරීමනුෂ්‍යධර්ම සාක්ෂාත් කටහැක්ක. මම් වනාහි කම් සැප ද කාමතෘෂ්ණා ද මුළුල්ල ම දුරු කොට, ඒ සියල්ලෙන් වෙන් වැ ඉදිමි. ඒ මම් උත්තරීමනුෂ්‍ය ධර්ම සාක්ෂාත් කරන්නට සමත් වෙමි. එයට උත්සාහ කරමි' යනු යැ.

ඉක්බිති බෝසතාණෝ කිහිප දිනක් එහි වැස එයින් නික් මැ නිල්දලා (නේරංජරා) නදී තීරයට වැඩියාහ. එහි සුදුසු තැනක් සොයා ඇවිදුනාහු ගලන මිණි කදක් වන් නිමල් සිසිල් නිල් සිලිලෙන් හොබනා සිත්කලු නිල්දලා නදිය ද එහි අද්දර සුපිපි මලින් සැදුණු රුක්ලියෙන් සැදුම්ලත් මනරම් බිම් පෙදෙස ද අතින් පසෙහි විහිදැගිය මොනරපිල් කලඹක් වන් ප්‍රසාද ජනක වනලැහැබ ද හාත්පසැ නොදුර වූ සේනානී නිගමය ද දැක, 'මේ නම් බවුන් වඩන යෝගීනට සුදුසු ම තැනැ යි නිශ්චය කොටගෙන පස්වැගි තවුසන් හා එහි වාසග්‍රහණය කළාහ.

# දොළොස් වන පරිච්ඡේදය

**භාවනා වැඩීම**

මෙසේ උරුවෙල් දනව්වෙහි නිල්දලා ගං තෙර වන පෙදෙසෙහි වෙසෙන මහ බෝසතාණෝ පළමුවෙන් ම මෛත්‍රී භාවනාව වැඩූහ. නොයෙක් විට වනයෙහි විසීමේ දුෂ්කරතා විමසනුවෝ, කායික වාචසික මානසික දුශ්චරිතාදිය වෙනෙහි වසන්නවුනට බියට හේතු යැ යි දුටුහ. තමන් තුළ ඒ කිසිදු ලාමක ගති නැති බැවින් බිය ගන්නට කරුණු නැතැ යි දුටුහ. මිනිසුන් අදහන පරිදි තුදුස්වක් අමාවක් පසොළොස්වක් අටවක් තිථීන්හි අමනුෂ්‍යයන් බැල්ම හෙළන චෛත්‍ය වශයෙන් සලකන ලද රුක් වෙත ද වන පෙදෙස් වෙත ද රෑ ගොස් විමසන්නාහු මුවකු හෝ වෙන යම් එබඳු සතකු තමා වෙත එන නියාව ද කුරුල්ලකු ගසෙකින් ලී කැබැල්ලක් හෙළන නියාව ද සුළඟින් ගසකොළ සැලෙන නියාව ද දුටුහ. මිනිසුන් එහි ඇතැයි කියන භූත විකාර (හොල්මන්) මේවා නොවේ දැ යි සලකා බැලූහ.

පස්වැගි තවුසන් උපස්ථාන කළ ද බෝසතාණෝ හුදෙකලා වැ ඉදීම ම රිසි කළහ. එහි වසන සමයෙහි ඒ ස නම ම පිඩු සිගා වැඩියේ සෙනානි නිගමයට ය.

ඒ මහ වන පෙදෙසෙහි තන්හි තන්හි තවත් පැවිද්දෝ වූහ. ඔහු නොයෙක් තපෝව්‍රත පිරූහ. ඔහු **පිහිතාසව** නම් ජෛන ආචාර්යවරයාගේ සච්චෝ ය. ඒ ආචාර්ය‍ී තෙම එයින් හවුරුදු හත්අටසියයකට පෙර සිටි **පාර්ශවනාථ** නම් ශාස්තෘවරයක්හුගේ පරපුරෙහි වූ ජෛන නම් ශ්‍රමණ ගණයා ගේ නායකයෙකි. සිවුරු පොරොවන තවුසෙකි. ඔහු වෙත රැඳී ව්‍රත පිරුවෝ බොහෝ ය. ඔවුන් අතුරෙහි **මහාවීර වර්ධමාන** යන නම්වලින් ප්‍රසිධ වැ සිටි **ඥාතපුත්‍රනිර්ග්‍රන්ථ** තෙම ප්‍රමුඛස්ථානයක් ගත්තේ ය. හේ ක්ෂත්‍රියයෙකි. ලිච්ඡවිරාජවංශයේ ශාඛාවක් වූ ඥාත (නාත) ගෝත්‍රයට අයත් **කුන්දග්‍රාම කොල්ලාග** යන ගම් දෙකට අධිපති සිධාර්ථ නම් රජුගේ පුත්‍රයා ය. හේ සසර කලකිරී පැවිදි වැ මේ උධ කී **පිහිතාසව** තවුසාණන් වෙත අවුත් දොළොස්හවුරුද්දක් කයට දුක් දෙන කෂ්ටව්‍රත පුරා 'ජිනත්වයට පත්වීමි'යි එතැනින් නික්මැ ගොස් කිසිදු වස්ත්‍රයක් නොහඳින නග්න ශ්‍රමණ නිකායයක් ඇති කොට ගණනායක වැ විසීය.

**අප්‍රාණක ධ්‍යානය වැඩීම**

බෝසතාණන් එහි වැඩියේ පිහිතාසව තවුසා කලුරිය කළ මද කලකට පසු ය. එහෙත් පිහිතාසව තවුසා ඉගැන්වූ ව්‍රත පුරන තවුසෝ වූහ. බෝසතාණෝ ඔවුන් පුරන දුෂ්කර ව්‍රත ද පුරන්නට සිතූහ. උන් වහන්සේ තමන් ලබා තුබුණු ධ්‍යාන අතුරෙන් රූපාවචර චතුර්ථධ්‍යානයට සමවැද ආශ්වාස ප්‍රශ්වාස දෙක ම නවතා අප්‍රාණකධ්‍යානය වඩන්නට පටන් ගත්හ. එවිට කඹුරු සමක් පුඹිනා විටෙක සෙයින් කන් සිදුරුවලින් වාතය මහ හඬින් නික්මෙන්නට වන. තියුණු බුරුම කටුවෙකින් හිස විදිනා විටෙක සෙයින් දරුණු හිස රුජා නැඟෙන්නට වන. කුමක් වුවත් මෙය තව දුරටත් වඩමි සිතා මහත් උත්සාහයෙන් දෙකන් සිදුරෙන් නික්මෙන වාතය රඳවාගත්හ. එවිට වරපටෙකින් හිස වැරයේ බැන්ද විටෙක සෙයින් දරුණු හිසරුජා ඇති විය. මුවහත් කැත්තෙකින් සිඳිනා කලෙක සෙයින් කුස තුළ ද මහත් රුජා නැඟිණ.

**පවත්තඵල භෝජී වීම**

බෝසතාණන් වහන්සේ ටික කලක් සේනානී නිගමයට පිණ්ඩපාතය පිණිස වඩිනුවෝ දිවි පැවැත්වූහ. ටික කලකට පසු ව පවත්තඵල භෝජනයෙන් (කෙනෙකු

විසින් නො වවන ලද කැලේ තමත් ම වැටුණු ගස් වැල්වලැ පලපත් වළඳා) දිවි පවත්වන්නට ඉටා ගත්හ. ටික කලකට පසු එය ද හැර දමා තමන් උන් තැනට ස්වයං පතිත වූ (කෙනෙකු නො කඩා) තමන් ම වැටුණු ඵල පත්‍රාදිය වළඳමින් දිවි යැපූහ.

**කෙලෙස් තවන ව්‍රතයක්**

මෙසේ කල් යවන මහත්මාණෝ ඒ වනයෙහි ජෛන පිළිවෙත් පුරන තවුසන්ගේ කෙලෙස් තවන ව්‍රතය පුරන්නුවෝ උඩු යැටි දත් එකට ගැටෙන සේ තදින් මුව පියා දිවෙන් උඩු තල්ල ගටා එලැඹැ සිටි සිහි ඇති වැ ස්ථිර සිතින් විමසමින් චිත්තසන්තානයෙහි කුශල පක්ෂය වඩමින් අකුශල පක්ෂය තැවූහ. මෙයින් කයෙහි දැඩි වෙහෙස ඇති විය. ශක්තිමත්තු විසින් අල්ලා ගෙන පෙළනු ලබන ශක්තිහීන පුරුෂයකුගේ සෙයින් උන්වහන්සේගේ කිසිලිවලින් ඩහ ගලන්නට වන. එහෙත් එයින් ඒ ව්‍රත පිරීමේ ධෛර්යය හීන නොවී ය.

අප්‍රාණකධ්‍යානය වඩන බෝසතාණන් වහන්සේ එයින් වන කිසිම පීඩාවෙකින් පසු බට නොවූහ. එය දිගට ම වැඩූහ. බෝසතාණන් වහන්සේට එය වඩත් වඩත් ම බලවත් පුරුෂයන් දෙදෙනකු දුබලයකු ගිනි අඟුරු වළකට දමා තවන කලෙක සෙයින් කයෙහි දැඩි දැවිල්ල විය. මෙසේ වූ දැඩි කාය දාහ හේතුයෙන් දවසෙක මූර්ඡිත වූවෝ සක්මන් මලුයෙහි ම වැටුණාහ. ඒ දුටු දේවතා කෙනෙක් 'සිඩාර්ථ තවුසාණෝ කලුරිය කළහ' යි කීහ. ඔහු ගොස් ශුද්ධෝදන රජතුමාට ද බෝසතාණන් මළබවක් දැන්වූහ.[31] 'මා පුත් කලුරිය කෙළේ බුදු වී ද? නොවී දැ'යි රජු ඇසීය. බුදු වියැ නොහී ය, ප්‍රධාන භූමියෙහි ම වැටී කලුරිය කළහ'යි දේවතාවෝ කීහ.' බුදු නො වී මා පුතුගේ කාලක්‍රියාවෙක් නො වන්නේ යැ'යි කියා, රජ ඔවුන් බස් නො ඇදහීය.

**බෝසතුන්ගේ අල්පාහාරතාව**

මඳ වේලාවකින් මූර්ඡායෙන් නැගී සිටි බෝසතාණන් වහන්සේ 'සර්වප්‍රකාරයෙන් ම ආහාර වර්ජනය කරන්නෙමැ'යි සිතූහ. එවිට දේවතාවෝ 'සිඩාර්ථයන් වහන්ස, ඉදින් ඔබ වහන්සේ කොහෙත් ම අහර නො ගන්නා සේක් නම් අපි ලෝම කූප මගින් වත් ඕජාව ඔබ සිරුරට ඇතුළු කරන්නම්හ'යි කීහු. එවිට බෝසතාණන් වහන්සේ 'මා අහර මුළු මනින් ම හළොත් දේවතාවෝ මා සිරුරෙහි කූප මගින් ඕජාව ඇතුළු කරති. එසේ වතොත් මගේ ආහාර වර්ජනය හුදු රැවටිල්ලක් වන්නේ යැ' යි සිතා සම්පූර්ණ

ආහාර වර්ජනයෙහි අදහස හැරුදමා, එ තැන් සිට පතක් පමණ වූ මුං තැම්බූ දියෙන් හෝ කොල්ලු තැම්බූ දියෙන් හෝ කඩල තැම්බූ දියෙන් හෝ කලතණ තැම්බූ දියෙන් දිවි පැවැත් වූ හ. මේවා පිළියෙල කළෝ පස්වග තවුසෝය.

**සිරුර කෙට්ටුවීම**

ක්‍රමයෙන් ආහාර ගැන්ම අඩු කළ සේක.[32] මේ හේතුයෙන් සිරුර කෙට්ටු වෙවී ගොස් අන්තිමේදී සමින් නහරින් වැසුණු ඇටසැකිල්ලක්ම විය.

බඩ සම පිට කටුයෙහි ඇලිණ. උන්වහන්සේ සිරුර අස්වසනු පිණිස අතින් පිරි මැද්ද කල කුණුවූ මුල් ඇති ලෝමයෝ ඉන් ගැලැවී ආහ. හිස අත ගෑ කල කෙහෙ අතට ම ගැලැවී ආයේ ය.

උන්වහන්සේගේ ශරීරය අඳුනා ගත නොහෙන සේ දුර්වණී ද වී ය. කෙනෙක් උන්වහන්සේ දැක 'ශ්‍රමණ ගෞතමයන් වහන්සේ කළු පැහැ ය'යි ද, අන් කෙනෙක් 'පලාවන් පැහැ ඇත්තෝ යැ'යි ද ඇතැම් කෙනෙක් 'මඟුරු සිවි බඳු පැහැ ඇත්තෝ යැ' යි ද කීහු. බෝසතාණන් වහන්සේගේ දුෂ්කර ක්‍රියාව මෙ තරම් උග්‍ර තැනට නැංගේ ය. මේ සා දුක් විඳිමිනුත් උන්වහන්සේගේ සිතෙහි කිසි පසු බැස්මෙක් නම් නොවී ය.

**මූර්ජිතව වැටීම**

දිනෙක බෝසතාණන් වහන්සේ සිරුරු කිස පිණිස ඉඳගත් සේක. මුළු සිරුර වියැලී මල මඟ හැකිළී යෑමෙන් ගුද ප්‍රදේශයෙහි දැඩි දුක් වේදනා ඇති විය. එ හෙයින් මල කිස කරනු නො හැක්කෝ මූර්ජිත වැ එහි මැ වැටුණහ.

එ කල ද දෙවියෙක් 'බෝසත් මළේ ය'යි සිතා ගොස් එ පවත් සුදොවුන් රජුට කී ය. කිමෙක් ද, 'ම පුත් බුදු වීද නොහොත් බුදු නොවී දැ යි මළේ' යැ යි රජු විතාළේ ය.

'බුදු නොවී ය' යි දෙවියා කී ය.

'ඉවත යා, ම පුත් බුදු බව ලබා විනා නො මැරෙන්නේ ය' යි රජ දෙවියාට තර්ජනය කෙළේ ය. දෙවියා එයින් ම අතුරුදන් වී ය.

මහසතාණන් වහන්සේ ද මඳ වේලාවෙකින් සිහි ලැබ නැගී සිටි සේක.

නැවත දිනෙක ද අප්‍රාණක ධ්‍යානය වඩන සේක්, ආශ්වාස ප්‍රශ්වාස වැලැක්කූ සේක. ඒ නැහැයෙන් නික්මෙනු නො ලබන්නේ දෙකන් සිලෙන් නික්මිණි. නැවැත දෙකන් සිල ද වසා ගත් කල්හි ඉන් නැගී හිස මත්තට

පැමිණියේ ය. හිසෙහි දැඩි දුක් වේදනා විය. යලි හිස මත්ත සාරන කලෙක සෙයින් දැඩි කැක්කුම් වී. ඒ වාතය ද හිස බිඳ යෑ නොහෙනුයේ පෙරළී බඩට පිවිසියේ ය. ඉන් බඩ ඇතුළ ගෙරි කපනා කැත්තෙකින් සිදින කලෙකැ මෙන් දැඩි පීඩා ඇති වී ය.

මෙ සේ මහපුරුෂයාණන් වහන්සේ අතරතුරැ අප්‍රාණක ධ්‍යානය ද වඩමින් මහත් දුක් වින්ද සේක. එනෙකුදු වුවත් වීර්‍ය්‍යය කිසිදු නො පසු බැස්සේ ය. නො සැලුණේ ය. සිත එකග වූයේ, වික්ෂිප්ත නො වී ය. සිහි මනාව එළඹැ සිටියේ, මුළායෙක් නොවීය. නාම කය සංහුන් වූයේ සිත ද සමාහිත වි ය.

**යශෝධරාවන්ගේ ව්‍රතසමාදානය**

බෝසතාණන් ආහාර අඩුකිරීම් ආදීන් පුරන දුෂ්කර තපෝව්‍රත පිළිබඳ තොරතුරු කිඹුල්වතින් යැවෙන රාජ දූතයන් මගින් ශුඩෝදන රජ්ජුරුවෝ හැම දා ම දැනගත්හ. එහෙත් එ තුමෝ අසිතර්ෂි ආදීන් කී අනාවැකි සියල්ල ඒ තාක් අකුරට ම හරි ගිය බැවින් ඉතිරි ටිකත් එසේ ම හරියතැයි ද 'මා පුතාණෝ බුදු වන්නාහු ම යැ'යි අදහන්නාහු ලැබෙන ආරංචිවලින් නො කැලැඹුණාහ. කොතරම් දුෂ්කර ව්‍රත පිරුවත් විපතක් නොවෙති යි තරයේ ම සිතූහ. එහෙත් බෝසතාණන් ආහාර අඩු කිරීම් ආදී වශයෙන් කරන කය තැවීම් පිළිබඳ කිසි ම පුවතක් යශෝධරාවනට ආරංචි වෙන්නට ඉඩ නො තැබූහ. ඒ වගක් ඇයට නොකියන ලෙසට ඒ රාජ පුරුෂයනට ද අණ කළහ. යශෝධරාවන් සිතා සිටියේ බෝසතාණන් සාමාන්‍ය තවුසකු සේ ජීවත් වන බව පමණ ය. ඕ රාජපුරුෂයන් ගෙන් බෝසතාණන් බිම සැතපෙති යි අසා තොමෝත් ඇඳ පුටු පරිහරණය අත්හැරියා ය. කසට පෙවූ සිවුරු හඳිනැයි පොරොවනැ යි අසා තොමෝත් ආභරණ සුවඳ විලෙවුන් පාවිච්චිය හැර දමා කසට පෙවූ වස්ත්‍රයක් හැඳ කසට පෙවූ වතක් ම පෙරෙව ගත්තී ය. බෝසතාණන් කෙස් වැටිය සිඳ දැමූ පවත් අසා තොමෝ කෙස් වැටිය සිඳ දැමුවා ය. බෝසතාණන් වළඳනුයේ එක් වේලක් පමණයැ යි තොමෝත් එක් වේලක් ම අහර ගත්තා ය. මෙසේ රජගෙහි හිඳම තපස්විනියක සේ කල් යවන්නී ද හැම සැප පහසුවක්ම දෙමින් මැනැවින් රහල් කුමරු පෝෂිත කළා ය. තව ටික කලෙකින් මගේ ස්වාමිදරුවන් බුදු වී අවුත් අපට දුකින් මිදෙන මාර්ගය පෙන්වතියි, අපට විමුක්ති සැපය ලබවතියි උදාර අපේක්ෂා ඇත්තී අනාගත භාග්‍යය පතමින් කල් යැව්වා ය.

# තෙලෙස් වන පරිච්ඡේදය

**මරගුගේ දයාවක්**

නිවන් සුව අපේක්ෂා කෙරෙමින් අප්‍රාණකධ්‍යානය දැඩි සේ වඩන බෝසතාණන් දුටු වසවත් දෙව්පුත් 'සිඩාර්ථ කුමාරයන්ගේ වෑයම ඉතා මහත් ය. කිසි දවසෙක බුදුවනු සැක නැත. දැන් ම ඔහු රවටා දුෂ්කර ක්‍රියාව නවතාලුවොත් යහපතැ'යි සිතීය. දවසක් හේ බෝසතාණන් වෙත ගොස් හිත විලාසයක් පා, 'යහලුව, ඔබ කෙට්ටු ය, දුර්වර්ණ ය, මැරෙන්නට ළඟ ය. මරණය අතට ම බරවූ අප්‍රාණකධ්‍යානාදී දැ දහස් ගණනෙකි. එයට ඔබේ ජීවිතය එක් කොටසක් වා පමණෙකි. පින්වතාණෙනි, මේ තරම් දුක් නො විඳින්න, ජීවත් වෙන්න. ජීවත් වීම මරණයට වඩා උතුම්. හොඳට ආහාර පාන ගනිමින් ජීවත් වෙමින් දානමානාදී පින් කරන්න. ඒ අතර ඉඩ ලැබෙන පරිදි බඹසර ද පුරන්න. හෝම පූජා කරන්න. එයින් බොහෝ පින් රැස් වේ. ජීවත් වේදෝ යි සැක සිතෙන තරමට කටුක ලෙස මේ දුෂ්කර ව්‍රත පිරීමෙන් සිදු වන යහපත කිමෙක්ද ? යහලුව, පෙර බුඩාංකුරයන් ගිය ප්‍රධාන වීර්ය මාර්ගය අද සිටින අයට දුර්ගම එකෙක, දුෂ්ප්‍රාප්‍ය එකෙකැ'යි ව්‍යාජ දයාවක් පෙන්වා කීයේ ය.

**මරුට තර්ජනය කිරීම**

බෝසතාණෝ මේ වසවතු' යි දැනගත්හ. ඔහු බස් පිළිකුල් කොට පිළිකෙවු කරන සේක් 'පමා වුවන් බැඳ ගන්නා පවිට, මගේ ප්‍රධාන ව්‍යායාමයට හානි කිරීමට, තගේ වාසිය තකා ම තෝ මෙහි ආයෙහි. ඒ තා වණන පින් බිඳෙකිනුත් මට වැඩෙක් නැති. යම් කෙනෙක්නට එබඳු පිනින් වැඩෙක් ඇද්ද ඔවුනට නම් තගේ කථාව හොබී.

'ශ්‍රඩා, වීර්‍ය, ප්‍රඥා, ස්මෘති, සමාධි යන පඤ්ච ඉන්ද්‍රියෝ මා තුළැ ඇතියහ. මෙ කී අංගයන් ගෙන් සමන්විත ව ප්‍රධාන ව්‍යායාමයෙහි යෑවු සිතැති, නිවන් සඳහා පරිත්‍යක්ත ආත්මභාවය ඇති මගෙන් (ප්‍රධානයෙන් ජීවිතයට කවර වැඩෙක්දැයි') ජීවනය ගැන ප්‍රශ්න කෙරෙහිද?

'මා අප්‍රාණක ධ්‍යානයෙන් ඉපැදැ වූ වායු තෙම ගංගා ශ්‍රෝතසුනුදු වියලන්නට සමත් ය. එබැවින් මේ වායු තෙම කාය ජීවිත දෙක්හි නිරපේක්ෂක වූ දැඩි වීර්‍ය ඇති මගේ නැලියක් පමණ වූ ස්වල්ප ලෙය කිමෙක නො වියලන්නේ ද? ලෙය වියැලෙන කල්හි පිතත් සෙමත් වියැලේ. මෙසේ පිළිවෙළින් මදුත් ක්ෂීණ වන කල්හි ද සිත වඩාත් පහදී.

සිහිය ද ප්‍රඥාව ද සමාධිය ද ස්ථිර ව පිහිටති. තෝ මෙ බඳුවූ මගේ ධෛර්‍ය්‍යවත් සිත නො දැන 'කය පමණක් බලා, 'කෘශ ය' යන ආදීන් කියයි ද ?

'දෘඪාධිෂ්ඨාන ඇති ව මෙසේ කර්‍මස්ථානානුයෝගී ව, වසන මගේ උතුම් විදීම බලව, මෙ තරම් දුර්වල වුවත් මෙය හැර ආපසු රාජ සම්පත් ආදිය බලා යම්'යි මසිත කිසිදු කාම වස්තුවක් අපේක්ෂා නො කරයි. බලව, සත්ත්වයකුගේ ශුඞියෙක හැටි !'

**දස මරසෙන්**

'තවද පවිට මම දනිමි, කාමයෝ තගේ පළමු සේනාවයැ. ගුණධර්මයෙහි උකටලී බව දෙවෙනි සේනාව ය. බඩගිනි හා පවස තෙවෙනි සේනාව ය. ආහාරාදිය සෙවීමෙහි ආශාව සිවු වන සේනාව ය. චිත්ත චෛතසිකයන්ගේ මිලාන බව පස් වන සේනාව ය. බියසුලු බව සවන සේනාව ය. මේ මහ වේ ද නැද්දැයි පිළිවෙත්හි සැකය සත් වන සේනාව ය. මකු බව හා සිත අවවාදයට නො නැමෙන දැඩි බව අට වන සේනාව ය. ලාභ කීර්ති සත්කාර හා නො නිසි මගින් ලත් යස ඉසුරු යන මෙයින් නැංග තෘෂ්ණා මානයෝ නව වන සේනාව ය. තමා උසස් තැනැ තැබීම හා මෙරමාට අවමන් කිරීම දස වන සේනාව ය.

'නමුචිය, මේ අකුශල රාශිය තගේ දස වැදෑරුම් සේනාව යි. මහණ බමුණන් පෙළන පාපී වූ තගේ ආයුධ රැස යි. ශූර නො වූයෙක් තගේ ඒ දස මරසෙන් නො දිනයි. ශූර තෙමේ ම උන් හැම බිඳ ජය ගනී. දිනීමෙන් වනාහි ඒකාන්ත සුවය ලබයි.

'ජය ගෙන මිස පෙරළා නො ඊමේ ලකුණක් වශයෙන් මුදු තණ ගසක් දරන යෝධයකු සේ[33] කොට මා සලකා ගනුව. මේ ක්ලේශ යුඩයෙන් පැරදුණොත්. ඒ මගේ ජීවිතයට නින්දා වේවා ! පැරැදී ජීවත් වීමට වඩා රණබිමැ වැටී මිය යෑම උතුම්.

'ඇතැම් මහණ බමුණෝ මේ ක්ලේශ සේනා මධ්‍යයෙහි වන්නෝ නො පැනෙත්. මනා පැවතුම් ඇතියන් නිවනට යන ප්‍රතිපත්ති මාර්ගය ද නො දනිත් යැ'යි වදාළ සේක[34]

මෙ බස් ඇසූ වසවත් මරු කිසිත් නො බැණ පලා ගියේ ය.

දුෂ්කර ක්‍රියායෙහි යෙදුණු බෝසතාණන් වහන්සේ එයින් කිසි විශිෂ්ට ගුණ ලාභයක් නො දුටු සේක. සිතීම් සයුරෙහි කිමිද බලන සේක්,

'යමෙක් මෙ ලොව්, දුෂ්කර ක්‍රියා කෙරෙද්ද, ඔවුහු මට සම හෝ හීන වෙති. මෙයට වැඩි තරමින් දුෂ්කර ක්‍රියා කරන්නට සමතෙක් නම් නැති. මේ සා දුෂ්කර ක්‍රියා කොටත් සම්බෝධිය නො ලැබීමි. එ බැවින් මේ බෝධියට මඟ නොවේ යැ'යි දුටු සේක.

**සතානුසාරි විඥ්ඥාණය[35] පහළවීම**

යලි ගත වූ කාලය විමසා බලන සේක්, තමන් කුඩා වියෙහි පියාණන්ගේ කෙත් බිමේ දී දඹ ගස යටැ හිඳ වැඩූ **ආනාපාන ස්මෘතිය** සිහි කොට, 'මෙය බෝධියට මඟ වේ දෝ' යි සිතා එය වැඩීමට ඉටාගත් සේක. 'දුර්වල සිරුර ඇති ව ආනාපාන ස්මෘතිය පුරනු නො හැකි ය. එබැවින් ආහාර සේවනයෙන් කය සතපා, එයට පසු ව සමාධිය වඩන්නෙම් නම් යෙහෙකැ'යි සිතූ සේක.

**කය සැතැප්වීම**

ඉක්බිති බෝසතාණන් වහන්සේ පාත්‍රය තුබුණු තැනින් ගෙනැ උරුවෙල් දනව්වට පිඩු පිණිස වැඩියහ.[36] මිනිස්සු උන්වහන්සේ දැකැ, 'පෙර මෙ තුමා තමා ළඟට ගෙනවුත් දුන් ආහාරය වත් නො ගත්තේ ය. ඒකාන්තයෙන් මුන් වහන්සේ ගේ මනෝරථය මස්තක ප්‍රාප්ත වූයේ වන. එබැවින් තුමූ ම පිඩු පිණිස ආහයි සතුටු වැ ප්‍රණීත ප්‍රණීත ආහාර පිළිගැන්වූහ.

**පස්වග තවුසන් බෝසතුන් අත්හැර යෑම**

බෝසතුන් පිඩු පිණිස හැසිර වළඳා කය සතපනු දුටු පස්වග තවුසෝ, 'මෙ තුමා තිවත් මගින් බැහැරැවැ ප්‍රධාන වීර්‍යයෙන් ඉවත් වැ ආපසු කාය සෞඛ්‍යයට පෙරළී ගියේ යැ. තිවත් මගින් ඇත් වී යැ'යි කලකිරුණාහ. උන්වහන්සේ හුදෙකලා කොට නික්ම ගියාහ. බරණැසට පැමිණැ ඍෂිපතනයෙහි වුසුම් ගත්හ.

බෝසතාණන් වහන්සේ සැහෙන තරම් සුව පහසු ලැබෙන තෙක් ප්‍රණීත ආහාර වළඳමින් දෙසතියක් පමණ කාය විවේකයෙන් කල් යැවූ සේක.

**විතර්ක විමැසීම**

ප්‍රධන් වීර්ය වඩන බෝසතාණන් වහන්සේගේ සිත් සතන්හි නෛෂ්කාම්‍යසංකල්ප ආදී කුශල විතර්කයෝ මහ ගංවතුරක් සේ ඉතා අධික වැ පහළ වෙමින් පැවැත්තාහ. කලක් ම කෘශ වැ සිටි මුත් ආහාර සේවනයෙන් නැවතත් සිරුර ප්‍රකෘතිමත් වැ කලදී සේ ම මහා පුරුෂලක්ෂණයන් මතු වැ බ්‍රහ්මශරීරය ද ඉක්මැ ශෝභාසම්පන්න වූ තියාව දැක්මෙන් 'මගේ

ශරීරය සමෘද්ධියට පැමිණියේ යැ'යි කිසි විටෙක උන්වහන්සේට කල්පනා වෙයි. එහෙත් එය ද කාමවිතර්කයක් කොට සලකා නැවැත එවැන්නක් සිතේ පහළ නො වන ලෙසට සිත රැක ගන්න ඉටා ගත්හ.

තව ද පන්සල ඉදිරියේ ඉන්නා බෝසතාණන් වහන්සේ මුව ගව ආදි සිවුපාවුන් ද වෙනෙහි රැව් පිළිරැව් දෙමින් රුකින් රුක සරණ මොනර වලිකුළු ආදී පක්ෂීන් ද, නෙලුම් ඕලු මහනෙල් කුමුදු ආදී ජලජ පුෂ්ප සංඡන්න හෙප් හා මඩවගුරු ද, නානා පුෂ්ප සමූහයෙන් ශෝභිත තරුවර ශතයෙන් ගහන වනරොද ද, මිණි කඳක් වන් පිරිසිදු ජල ධාරායෙන් ශෝභමාන නේරංජරා නදිය ද දකින සේක. ඒ දැක්මෙන්, 'මේ සිවුපා රැල සිත්කළු ය. මේ පක්ෂීහු ප්‍රියංකර හ. මේ දිය හෙප් රම්‍ය ය, මේ රාජිහු ශෝභමාන හ. නේරංජරාව දර්ශනීය යැ'යි උන් වහන්සේට සිතෙයි. එවිට 'අහෝ මට කාම විතර්කයෙක් වී' යැ යි ඒ ස්වල්පය පවා කාමවිතර්ක පක්ෂයෙහි ලා සලකා ඒ ද දුරු කිරීමට ඉටා ගන්නා සේක.

දැඩි උණුසුම් දැඩි ශීත ආදියෙන් සිතෙහි මඳ පෙරළීමක් වූ විටැ එය ව්‍යාපාද විතර්ක පක්ෂයෙහි ලා සලකා එබඳු විතර්ක ද දුරු කරන්නට සිතූ සේක.

පන්සල් දොරැ ඉන්නා කිසි විටෙකැ උන් වහන්සේට ව්‍යාඝ්‍රාදීන් මුව හූරු ආදී දුබල සතුන් පෙළනු දක්නට ලැබේ. ගමට පිඩු පිණිස වැඩි කිසි විටෙකැ රාජකාර්‍ය හේතුයෙන් තමන් රැකියාවන් කැරැ ගන්නට නො ලැබැ උපද්‍රැත වූවෝ ද දක්නට ලැබෙති. මෙකී දර්ශන හේතුයෙන් උන්වහන්සේගේ සිතෙහි ශෝක උපදී. එ අනුනට හිරිහැර ඇති කරන්නන් ගේ අකාරුණික බව, ක්‍රෑරකම උන්වහන්සේට පැනේ. ඉන් සිත නොසංසුන් වේ. නො එකහ වේ. එවිටැ එ ස්වල්ප නොසන්සුන් බව පවා **විහිංසා විතර්ක** යැ යි ගෙන, එය ද දුරු කටයුතු යයි සිතූ සේක.

'මෙ සේ සිතන බෝසතාණන් වහන්සේ විතර්කයන් කුශලාකුශල වශයෙන් දෙ කොටසකට බෙදන සේක් 'මේ කාම විතර්කය, මේ ව්‍යාපාද විතර්කය, මෙ විහිංසා විතර්ක යැ'යි අකුශල පක්ෂය එක් කොටසක්ද 'මේ නෛෂ්කාම්‍ය විතර්කය, මේ අව්‍යාපාද විතර්ක ය, මේ අවිහිංසා විතර්ක යැ' යි කුශල පක්ෂය එක් කොටසක් දැ'යි කුසල් අකුසල් වියින් විතර්කයන් දෙ කොටසක් කොට අකුශල විතර්ක

වැනසීමෙහි ද කුශල විතර්ක වැඩීමෙහි ද යෙදුණු සේක. කාම විතර්කාදී අකුශල විතර්කයන් පහළ වූ විටැ එය තමනටත් අන්‍යයනටත් දෙපක්ෂයට ම අවැඩ පිණිස පවත්නා බව, ලොව්ලොවුතුරු සුවයට බාධක බව, දුක් පැත්ත ගෙන සිටින බව, නිවන් පිණිස නො පවත්නා බව සැලැකූ සේක. මෙසේ සලකන බෝසතාණන් වහන්සේ තුළැ ඒ හටගත් දුර්වල විතර්ක විනෂ්ට විය. උන්වහන්සේ අකුශල ධර්මයන් ගේ දෝෂයත් ලමා බවත් කෙලෙසුමත් කුශල ධර්මයන්ගේ, නෛෂ්කාම්‍යයාගේ, අනුහසුත් විශුඩ පක්ෂයත් දුටු සේක.

මෙ සේ අප්‍රමත්ත වැ කෙලෙස් තවන වීය්‍යී ඇති ව වසන සේක්, තමනට පහළ වූ නෛෂ්කාම්‍ය විතර්කාදී කුශල සංකල්පයන් තමනටත් අන්‍යයනටත් දෙපක්ෂයටමත් අවැඩ පිණිස නො පවත්නා බව ද, ලොව් ලොවුතුරා ප්‍රඥාව ගේ වැඩුමට හිත බව ද, දුඃඛ පක්ෂයෙහි නො වන බව ද, නිවන් පිණිස පවත්නා බව ද දුටු සේක.

යටැකී පරිදි රෑ මුළුල්ල ද, දාවල් මුළුල්ල ද, රෑ දාවල් දෙක් හි ම ද විතර්කන විචාරණයන්හි යෙදුණු උන් වහන්සේගේ ශරීරය ක්ලාන්ත වේ. සිරුර ක්ලාන්ත වූ විට සිත නො සංසුන් වේ. ඒ හේතුයෙන් සිත එකඟ බැවින් ඈත් වේ. එවිට සමාපත්තියට සමවැද ඒ සියලු පීඩා ද නො සංසුන් බව ද සංහිඳුවා ගන්නා සේක. අකුශල විතර්ක පක්ෂය නුවණින් බලමින් නිග්‍රහකොට කුශල විතර්ක පක්ෂය වඩන සේක.

මෙ සේ ප්‍රධන් වීය්‍යී වඩන බෝධිසත්ත්ව රාජර්ෂීන් වහන්සේ ගේ ඒ තවුස් ජීවිතය සම්බන්ධ සවන වර්ෂයේ අවසාන භාගය පැමිණියේය.

## තුදුස් වන පරිච්ජෙදය

**බෝසතුන් දුටු සින පස**

වෙසක් මස පුර තුදුස්වක් විය. ඒ දින රාත්‍රියෙහි නිද්‍රෝපගත වූ බෝධිසත්ත්ව රාජර්ෂීන් වහන්සේ එළි වීගෙන එන වේලෙහි පහත සඳහන් සීන පස දුටු සේක.

**පළමු සීනය**

'මහ පොළොව යහනෙක් වී ය. හිමාලය පර්වතය කොට්ටය විය. එහි උඩුකුරු වැ නිදන බෝසතාණන්ගේ දකුණත අවර සයුරෙහි ද, වමත පෙර සයුරෙහි ද, පා දකුණු සයුරෙහි ද බැහුණා හ.' මේ උන් වහන්සේ දුටු පළමු සීනය යි . (මෙය උන් වහන්සේ ලොවුතුරා බුදුවන බවට පෙර නිමිත්ත ය.)

**දෙවෙන සීනය** 'උන් වහන්සේ ගේ නාභියෙන් රතු ඊතන ගසෙක් ඉතා උසට නැගී අහසැ පැතිර සිටියේ ය.' (මේ ස්වප්නය උන් වහන්සේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය ප්‍රතිවේධ කොට ලොවට ප්‍රකාශ කරන බවට පෙර නිමිත්ත ය.)

**තෙවෙනි සීනය** 'කළු හිස් ඇති සුදු පණුවෝ පා මුලින් නැගී දණ ඉස දක්වා වසා ගත්හ.' (මෙය බොහෝ ගිහියන් උන් වහන්සේ ගේ උපාසකයන් වන බවට පෙර නිමිත්ත ය.)

**සිවු වන සීනය** 'නානා වර්ණ ලිහිණියෝ සිවුදෙනෙක් සතර දෙසින් පියාඹා අවුත් උන් වහන්සේ ගේ පා මුලැ හොත්තෝ වහා සුදු පැහැ වූහ. (මෙය සිවු කුලයන් හි ම ජනයා සස්නෙහි පැවිදි වැ පිරිසිදු වැ නිවන් පැමිණෙන බවට පෙර නිමිත්ත ය.)

**පස් වන සීනය** 'උන් වහන්සේ මහත් අශුචි පර්වතයක් මතුයෙහි ඒ අශුචි යෙන් නො තැවරී සක්මන් කළ සේක.' (මෙය සිවුපස බොහෝ සේ ලැබෙතත් එහි නො ඇලෙන බවට පෙර නිමිත්ත ය.)

**අජපල් නුගරුක් කරා යාම** මහා පුරුෂයාණන් වහන්සේ මෙකී ස්වප්න පස දැක, තුමූ ම ඒ විසඳා බලා, තමන් 'බුදු වන බව නිසැකැ'යි දැනැ, පසු ද උදය ම සිරුරු පිළිදැගුම් කොට, ගොස් අජපල් නුග රුක් මුල භික්ෂාචාර වේලාව තෙක් පෙර දිගට මුහුණ ලා වැඩ උන් සේක.

**සුජාතාවගේ කිරි පිඬු දනය** එදා වනාහි **සේනානි** නිගමයෙහි[30] අධිපති කෙලෙඹිහු ගේ දූ වූ **සුජාතාව** කලෙක සිට සිරිත් පරිදි කරන වාර්ෂික දේව බලි පූජායෙහි දිනය විය. බෝසතාණන් ගොස් වැඩ හුන්නේ ඔවුන්ගේ දේවායතනය වූ රුක මුලැ ය. යථෝක්ත සිටු දූ බිලියම් පිණිස ගෙහි දිය නො මුසු කිරිබතක් පිළයෙල කරන්නී පූර්ණා නම් දසිය බණවා 'නුගරුක මුල ඇමැද පිළියෙල කරව'යි යැවූය. ඕ ද එහි ගියා, රුක් මුලැ වැඩ ඉන්නා බෝසතාණන් වහන්සේ ගේ අතුල්‍ය ආශ්චර්‍ය්‍ය දේහ ශ්‍රිය දැක. 'වෘක්ෂ දේවතා යැ'යි සිතා ගත්තී, පෙරලා යුහු යුහුව ගොස් සුජාතාවට එපවත් සැළ කළා ය. එය අසා සුජාතා දේවී ප්‍රමුදිත වූවා එකෙණෙහි ඇය නිදහස් කළා ය. සියලු ස්ත්‍රී පලඳනායෙන් ඇය මොනොවට සරසාලූ ය. තොමෝ ද දහසක් අගනා රන් තලියක් කිරිබතින් පුරා රන් තලියෙකින් වසා ඉස මත්තෙහි තබා

ගෙන මහ පිරිවරින් නුග රුක අතට ගමන් ගත්තා ය. එ සේ යන ඕ සියලු රුක ශරීර ප්‍රභායෙන් රන්වන් කොට, මූර්තිමත් වූ පින් කඳක් මෙන් බබලමින් වැඩ ඉන්නා ඒ බෝධිසත්ත්‍ව වූ මහා සත්ත්ව රාජර්ෂීන් වහන්සේ දුරැ දී ම දුටුහ. දැක හටගත් ප්‍රීති සොම්නස් ඇති වැ, ඒ දුටු තන් සිට ම නැමී නැමී ගොස් වෙත එළැඹ, හිසින් රන්තලිය බා ගෙනැ, පියන හැර, බෝසතාණන් අතැ තබා, පසහ පිහිටුවා වැඳ, 'මගේ මනෝරථය යම් සේ මස්තකප්‍රාප්ත වී ද, එ සේ ම ඔබ වහන්සේ ගේ මනෝරථය ද නිපදීවා'යි [33] කියා රන්තලිය ද බෝසතාණනට ම පියා පැදැකුණු කොට නික්ම ගියා ය.

**නේරංජරා තීරයට වැඩීම**

බෝසතාණන් වහන්සේ ද කිරිපිඩු සහිත රන් තලිය ගෙන නිල්දලා (නේරංජරා) ගංතෙර වැඩියහ. එහි **සුපිහිටි** තොට අසා සෙවෙණෙහි රන්තලිය තබා, දියට බැස සනහා ගොඩ වුත් සිවුරු හැඳ පෙරෙව ගෙන සිසිල් රුක් සෙවෙනෙකැ හිඳ යථෝක්ත කිරිබත එකුන් පණස් පිඩක් කොට වැළඳූ සේක. ඉන් පසු 'ඉදින් අද ම බුදු වැ ගත හෙම් නම් මේ රන්තලිය උඩුගං යේ වා'යි ඉටා ඒ ස්වර්ණ පාතිය දියට දැමූහ. එය හොය මැදට දිවැ, දිය පිටැ දුවන නැවක් සේ උඩු ගං බලා ගොස්, දිය සළායෙකැ ගැසී දියේ ගැලිණ.[37] ඒ දුටු බෝසතාණන් වහන්සේ තමන් බුදු වනු ඒකාන්ත යැ'යි සිතූහ.

**භද්‍ර වනයෙහි දිවා විහරණය**

ඉක්බිති මහා පුරුෂයාණන් වහන්සේ ගං තෙරැ පිහිටි පරම සුරභි කුසුම සමලංකෘත වූ, පත්‍රයන් ගේ නීලාවභාෂයෙන් ශෝභිත, මනෝරම්‍ය උත්තුංග ශාල වෘක්ෂ පංක්තීන් ගෙන් සුසජ්ජිත භද්‍ර වනයට වැඩි සේක . එහි දිවා විහරණය කරන සේක්, පෙර ආළාර උද්‍රකයන් වෙත් හි දී උපදවන ලද, පසු කලැ දුෂ්කර ක්‍රියා සමයෙහි නොවැඩූ හෙයින් මල බැඳුණවුන් මෙන් වූ අෂ්ටසමාපත්තීන් හා පංචාභිඥාවන් පිරිසිදු කළ සේක. (මේ වනාහි මහසතාණන් වහන්සේ ගේ **චිත්තවිසුද්ධි ලාභ** [39] යැ යි දත යුතු.)

**බෝරුක කරා වැඩීම**

බෝසතාණන් වහන්සේ දහවල් සමවත් සමවදිමින් කල් යවා එ ද සවස් හි සල් වනයෙන් නික්ම බෝරුක දිශාවට යන මාර්ගයට බැස ගමන් ගත් සේක. ඉදිරි මගින් එන **ස්වස්තික** නම් බමුණෙක් උන් වහන්සේ ගේ ආකාරය දැක තමා ගෙන එන කුසතණවලින් අට මිටකින් පුද ගියේ ය. බෝසතාණන්

වහන්සේ ද එය පිළිගෙන බෝරුක වෙත එළැඹී සේක. එළැඹ එහි දකුණු දිග්භාගයෙහි වැඩ සිටි සේක. එකෙණෙහි එ පෙදෙස නෙළුම් පතකැ දිය බිඳක් මෙන් කම්පිත වූ සේ පෙනිණ. එවිටැ මේ ප්‍රදේශය මගේ ගුණය උසුලනු නො හැකි යැ'යි සිතා, පශ්චිම දිශා භාගයට වැඩි සේක. හෙ ද කම්පිත වූ සේ පෙනිණ. උතුරු දෙසට ද වැඩැ සිටි සේක. එද චංචල වූ සේ පෙනිණ. ඉක්බිති නැගෙන හිර දෙසට වැඩි සේක්, එහි පයඞ්කයක් පමණ තැන නිශ්චල යැ යි දැකැ 'මේ මගේ කෙලෙස් නසන තැනැ'යි සනිටුහන් කොට එහි තණ අට මිට සලා,

**අපරාජිත පයඞ්කයෙන් වැඩ හිඳීම**

'මේ ශරීරයේ සම් මස් ලේ ඇට නහර වියැලි සුණු විසුණු වන කල්හි ද පුරුෂස්ථාමයෙන් පුරුෂ වීර්‍ය-යෙන් පුරුෂ පරාක්‍රමයෙන් ලැබියැ යුතු වූ සම්‍යක් සම්බෝධිය ලැබ මිස මා උත්සාහය අත් නොහරිමි'යි චතුරංග වීර්‍යය[40] ඉටා බෝ කඳට පිට දී පෙර දිග බලා වජ්‍රාසනයෙන් (අජේය පයඞ්කයෙන්)[41] වැඩහුන් සේක.

# පසොළොස් වන පරිච්ඡේදය

**මාර සංග්‍රාමය**

මහා පුරුෂයාණන් වහන්සේට ගෞරව ස්තුති පූජා පිණිස, ගලා එන මහාජලෞඝයක් මෙන් අතුරු සිදුරු නැති සේ රැස් වන දිව්‍ය බ්‍රහ්ම සේනා හේතුයෙන් හාත් පස සියලු පෙදෙස මිහිබට දෙව් පුරයෙක සිරි ඉසිලී ය. මේ අතර කලින් ම ඇත එන සතුරකු දැක බිය ලකුණු සෙස්සනට ද පහළ කොට පැන යන්නක්හු සෙයින් හිරු අස්ත පර්වතය දිසාවට නැමුණු ගමන් ඇත්තේ විය. සඳ වූ කලී තමා නො තෙද වුවද වුවමනා විටෙකැ බෝසතාණනට පැරුම් පිරූ බවට දෙස් කියනු පිණිස නො බා එන හිතැති ගැත්තක්හු හෙයින් සුප්‍රකාශිත **ශශ ලාංඡන** ඇත්තේ ගගන තලය බබුළුවමින් උද වන්නට ආරම්භ දැක්විය.

ඇසතු රුක් මුලැ පෙර දෙසට මුහුණ ලා රන් පුටුයෙකැ තැපූ රිදී කඳක් සේ පනස් රියන් උස් බෝ කඳට **පිට දී** මතුයෙහි දැරුණු දිව්‍ය මණිච්ඡත්‍රයක් වැනි නීල පත්‍ර සංඡන්න ශාඛාවන් ගේ සිසිල් සෙවෙණෙහි තණ ඇතිරි මතුයෙහි වජ්‍රාසනයෙන් වැඩ හුන් මහ බෝසතාණන් වහන්සේ ගේ ස්වර්ණ වර්ණ ශරීර ප්‍රභායෙන් මුළු පෙදෙස රන් රෙසෙහි ගිල්වනු ලබන කලෙක මෙන් අභිරාම ව බැබළිණ.

**දුර්නිමිති**

බෝධි වෘක්ෂය හාත්පසැ පැවැති මංගලෝත්සව අදි-සියෙන් නැවතිණ. එතෙක් මහෝත්සවයෙන් කල් යැවූ සියලු දේව බ්‍රහ්ම සමූහයෝ ඈත එන අවාර්ය සතුරෙකු දැක්මෙන් සේ ක්ෂණයෙකින් හිස් ලූ ලූ අතැ දිවැ ගත්හ. එකෙකුදු එහි සිටින්නට සමත් නොවී ය. දහස් ගණන් උල්කාවෝ පතිත වූහ. ඝෝර දිග්දහයෙක් විය. අහසැ ධූමකේතුහු දෘශ්‍යමාන වූහ. දිශාවෝ ගාඪාන්ධකාරය භජනය කළහ. පෘථිවිය සුළඟින් පහළ වැලක් මෙන් සැලෙන්නට විය. හාත්පස චණ්ඩ වාතය හැමී ය. මේ ගැජුම් බඳු බිහිසුණු ගිගුම් ද විය. හැම අතින් වලාහක ප්‍රතිච්ඡන්න දුර්දිනයෙක ආකාර පහළ විය. රාහු ග්‍රහණ වේලායෙකැ සෙයින් බැස ගෙන යන සූර්‍ය්‍යයා තටුවා වූ රශ්මි ඇත්තේ වී. වැසි නැති මුත් අහසෙහි දෙව්දුනු ද විදුලි ද දෘශ්‍යමාන වූහ. දිලියෙන ගිනි හෙන තැන තැන පතිත වීය. වන කවුඩු රැල නාද කරන්නට පටන් ගත්තු. හාත්පස උළලෙහණුන් ගේ ද මහ මුහුණන්ගේ ද අමනොඥ හඬ ඇසෙන්න විය. සොහොනින් නැගිට ආ ඇටසැකිලි රැසක් බඳු භය ජනක ප්‍රෙත රැලක ගේ සංචාරයෙක් ද දෘශ්‍යමාන වීය. මේ සියල්ලටත් වඩා බිහිසුණු වූ ලොමු දහගන් වන සුලු කබන්ධ රූපයෙක් (හිස නැති සිරුරෙක්) අහසැ හැසිරෙන්නට වන.

මෙ සේ අශුභ අනිටු නානා ප්‍රාකර දුර්නිමිති පහළ වෙමින් පවත්නා කල්හි ම කඩු පොරෝ ශර අඩයැටි තෝමර ආදිය ගත් අතැති, විහිදෙන ගිනිදැල් හා විස දුම් සහිත විවෘත මුඛ ඇති, නග්න දුර්වර්ණ ප්‍රෙතාදීන් වැනි නොයෙක් අප්‍රිය දර්ශන ඇති භයංකර සත්ත්ව සමූහයන්ගේ බෝමැඩ දිශාවට දිව ඊමෙක් විය. 'ගනිවු, තළවු, මරවු' යන ආදී කෲර වචන ද හැම දෙසින් ශ්‍රූයමාණ විය. බිහිසුණු වෙසින් එහි රැස් වූයේ බ්‍රහ්ම පර්ෂදට ද ආවිෂ්ට වැ පීඩා කිරීමෙහි පොහොසත් කාමභූමිශ්වර වූ වසවර්ති මාරයා සහිත තත් සේනාව ය. එහෙත් ඔහු බෝ මැඩට ඇතුළු වියැ නොහී පිටත මැ සිටියහ.

මහා සත්ත්වයන් වහන්සේ ඔවුන්ගේ පැමිණීම සුළඟින් පරණලා ගසා ඊමක් පමණට ද නො තකා, පක්ෂීන් මැද ගුරුළු රජක්හු සේ, මුවන් මැද කේශර සිංහයකු සේ, අජේය වූ පැරුම් බල ඇති වැ විශාර ද වැ වීතභය වැ හුදෙකලා වැ වැඩ හුන් සේකි. මර සෙනඟ ගෙන අඩැසින් බල බලා අවුත් සිටි මර තෙම 'මම් මැ යැ මුළු ලොවට ජ්‍යෙෂ්ඨ, දෙව් මිනිස්නට ශ්‍රෙෂ්ඨ යැ'යි සිතා 'මිනිස් ලියක කුසැ කලලයෙහි කුණු

මසෙක පණුවකු සේ උපන් මේ මහණ නිර්ලජ්ජීය, තමා පමණ නො දනී. මා වැන්නකු ඉදිරියේ සිටියැදීත් නො ම නැගී සිටි යැ'යි මහසතාණන් වහන්සේ ට ගර්හා කෙළේ ය. ගරහා, මොහු බිය ගන්වා පලවම්'යි සිතා නව විධ වර්ෂාවන් මවා ලී ය. බෝසතාණන් වහන්සේට ඉන් පීඩාවෙක් නොවී ය. ඉක්බිති තමා නැගී හුන් ගිරිමේඛලා ඇතු මහසතාණන් වෙත පමුණුවා 'එම්බා සිධාථි, ඔය පළඟින් නැගිටුව'යි කී. මහසතාණන් වහන්සේ සිය පා මුලෙහි කෙළනා ළදරුවා අතින් පයින් පහර දෙන කල්හි දු, කිසි විියරුවක් කරන කල්හි දු, පුත්‍ර ප්‍රේමයෙන් වැළඳ ලෙහි හොවා ගන්නා දයාබර පියකු සේ, එ මරහු ගේ විකාරයෙන් අකම්පිත වැ මදකුදු දෙම්නසක් නො කොට දයාබර වූ සේක්, මෙත් වඩනා සේක්, මරහු දෙස බලා 'මාරය, මම මෙයින් නො ම නැගිටිම්'යි වදළහ. යලි හාත්පස රැස්ව සිටි මර සෙනඟ ද ගිරිමෙවුල් ඇතු නැගි මරහු ද බලා, වටා සියලු පෙදෙසැ ඉතිරැ පැතිරැ සිටි ගිරිමෙවුල් ඇතු නැගී මරු සහිත සේනාව දැක, 'මේ ධර්ම යුද්ධය පිණිස නො පසු බට සිතින් ඉදිරිපත් වෙමි. යම් සේ මර තෙම මා මේ පළඟින් සොලවන්නටත් නො හැකි වන්නේ ද එසේ ම කරන්නෙමි'යි ඉටා,

'මාරය, සදේවක ලෝකයා විසින් දුෂ්මතා ගේ කාමාදිසේනාව අජේ ය ය. එය දනිමි. එහෙත් මම් ඒ තාගේ බිහිසුණු මර සෙනඟ අමු මැටි බඳනක් ගලෙකින් සෙයින් ප්‍රඥායෙන් බිඳැ ලන්නෙමි. මාරය, ආයර්‍යමාර්ගය වැඩීමෙන් සියලු මිථ්‍යා කල්පනා දුරු කොට සම්‍යක්සංකල්පය පවත්වා, කායාදි සතර තන්හි මොනොවට පිහිටුවා ලූ, සිහි ඇති වැ, සව්වන් හික්මවමින් රටින් රට යන්නෙමි. මගේ අනුශාසන පරිදි පිළිපදින එ සව්වෝ නො මුළා සිහි ඇත්තෝ, නිවන් කරා මෙහෙයූ සිතැත්තෝ, දුෂ්මතා ගේ නො කැමැත්ත කිසිදු නො තකා, යැමෙන් පසු තමන් ශෝක නො කරන තෙනට (-අමා මහ නිවන් පුරට) යන්නාහ'යි වදළ සේක.

එය අසා මාර තෙම, 'මහණ, මෙ බඳු රළු යකකු වූ මා දැකත් බිය නොගන්නෙහි දැ?'යි ඇසීය.

'එසේ ය, මාරය, නො බාමි'යි බෝසතාණන් වහන්සේ වදළ සේක.

කුමක් හෙයින් නො බානෙහි දැ'යි මර ඇසී ය.

'මා දනාදි පැරුම් පිරූ හෙයිනැ'යි බෝසතාණන් වහන්සේ වදළ සේක.

'යුෂ්මත්හු පින් කළැ යි කවරෙක් දනී දැ 'යි මාර ඇසී ය.

එ විටැ මහ බෝසතාණන් වහන්සේ,

'මාරය, මෙහි ලා දෙස් දැක්වීමෙක් කුමට ද? අවශ්‍ය නම් එක් වෙසතුරු අත්බැවෙහි පමණක් දුන් දනින් සත් යලක් කම්පිත වූ මේ මහ පොළොව ම දෙස් වේ යැ'යි වදරා, සැඳැ වලා ගැබින් නිකුත් විදුලියක් සෙයින්, සිවුරු ගැබින් දක්ෂිණ ශ්‍රී හස්තය නිකුත් කොට බිමට දිගු කළ සේක. එ කෙණෙහි මහ පොලොව බිහිසුණු හඬ දෙමින් කම්පිත විය. ඒ ඇසූ මර තෙම සෙන පහර ලදුවකු සේ බිය පත් වැ ධවජය නමා ගෙන සෙනග හා පලා ගියේ ය. මෙසේ හිරු ධරමාන කල්හිම බෝසතාණන් වහන්සේ දෙව්පුත් මරහු පරද වා විජයශ්‍රිය ලැබූ සේක.

ජය පරාජය බලමින් ඈත සිටි දෙව් බඹුහු මහතාණන් ලත් විජය ශ්‍රිය දැක 'එවු නිදුකාණනි. සිඩාත්‍ථයන් වහන්සේ ට ජය ය. අසිඩාත්‍ථ වූ මරහට පරාජය ය. ජයමංගලය ද බුඩ මංගලය ද එකට කරන්නමු'යි කියා, එක් පැහැර අවුත් බෝ මැඩ වටා රැස් වූහ.

---

# සොලොස් වන පරිච්ඡේදය

සහශ්‍ර රශ්මීන් ශෝභිත වූ සූය‍ර්‍ය මණ්ඩලය නිම් වලල්ල ගෙන දියෙහි ගිල්වනු ලබන රන් සකක් සේ අවර දිගින් බැස්සේ ය. කාන්ත වූ ප්‍රභා සමුදය විහිදුවමින් අහස් ගබ හොබවමින් නේමිය ගෙන ගසනු ලදුව අහසැ බමන රිදී සකක් මෙන් පුර සඳ ප්‍රාචීන දිග්භාගයෙන් නැංගේ, ඒ මුළු රැ දැල්වෙන ප්‍රදීපයෙක ශ්‍රිය දැරී ය. තරු සහිත වලා නැති පිරිසිදු අහස මහතාණන් මතුයෙහි මණිඛචිත දිව්‍ය විතානයෙක ශෝභාව ගත්තේ ය. පෘථිවිය හාත්පසැ වලයාකාර ක්ෂිතිජය විශාල වූ සාණි ප්‍රකාරයක් ලෙසින් දිස් විය. මහී වර වධුව ගේ හෘදය ස්ථානීය වූ උත්තම ස්ථානයෙහි පිහිටි බෝධි මණ්ඩය අනන්‍ය සාධාරණ මණ්ඩපයෙක ශ්‍රී ඉසිලී ය. මුල පටන් ශාඛාග්‍රය තෙක් සියක් රියන් පමණ උස් වූ ඝනඛණ්ඩ මයුර පිංජ කලාපයක් සේ විද්‍යෝතමාන වූ, මත්තෙහි දැරුණු මණිවජ ත්‍රයෙක ශෝභාව ගත් බෝධි වෘක්ෂරාජයා ගේ සෙවණෙහි, සුධර්මායෙහි ඉන්ද්‍රාසනාරූඪ සනත් කුමාරයාට ද නිගා දෙමින් වැඩ ඉන්නා ජගදේක වීරපුරුෂයාණන් වහන්සේ, විජිත දිව්‍ය පුත්‍ර මාරයා ඇති සේක්, අවශේෂ මාරයන් හා ද සංග්‍රාමයට සැරසුණු සේක.

**ප්‍රථම විද්‍යාව ලැබීම හා දෘෂ්ටි විශුඩිසම්පාදනය**

මහ බෝසතාණන් වහන්සේ පළමුකොට ආනාපාන ස්මෘති කර්මස්ථානය වඩා පළමු වන දෙවෙනි තෙවෙනි සිවුවන රූපාවචර ධ්‍යානයන් සමවන් සේක. නැවැත චතුර්ථධ්‍යානයෙන් නැඟී සිට (සිත ඒ ධ්‍යානාලම්බනයෙන් ඉවත් කොට) පෙර වුසු කඳ පිළිවෙළ අතට එල්ල කොට යැවූ සේක. මෙසේ අතීත ජාතීන් සිහි කරන සේක්, අනේක කෙළ දහස් ගණන් ජාතීන් තත්වාකාරයෙන් දුටුහ. උක්ත පරිදි එද පූර්ව යාමයෙහි ම පෙර වුසු කඳ පිළිවෙල වසා ලන මෝහය බිඳී යෑමෙන් මහසතාණන් වහන්සේට **පූර්වෙනිවාසානුස්මෘතිඥාන ප්‍රතිලාභය** විය.

පූර්වෙනිවාසානුස්මෘති ඥානයෙන් පෙර වුසු කඳ පිළිවෙළ බලන බෝසතාණන් වහන්සේ,

'නාමරූපයෝ තත්තද්භවයෙහි පරම්පරා වශයෙන් පහළ වෙමින් බිඳෙමින් පැවැත්තාහ. එ නාම රූප පරම්පරාව ගේ ම චක්ෂුරාදි ද්වාරයන්හි රූප දැකීම් ආදි වශයෙන් නානා විඥානයෝ හට ගැනෙමින් බිඳෙමින් පැවැත්තාහ. එහෙත් හුදු තනි අවිකාරි තත්ත්වයෙක් හෝ ජීවයෙක් හෝ පුද්ගලයෙක් නො වී ය. එය මවන දෙවියෙක් හෝ මරෙක් හෝ බඹෙක් හෝ නො වී යැ'යි දක්නා සේක් විංශද්වස්තුක සත්කාය දෘෂ්ටිය[42] බින්ද සේක. මේ වනාහි බෝසතාණන් වහන්සේ ගේ **දිට්ඨිවිසුඩි සම්පාදනය** යි.

**ද්විතීය විද්‍යාව ලැබීම හා කඞ්ඛාවිතරණ විසුඩි සම්පාදනය**

නැවැත මහබෝසතාණන් වහන්සේ මධ්‍යම යාමයෙහි ද පළමු පරිදි ම ආනාපාන චතුත්ථධ්‍යානයට සම වැද ඉන් නැඟී සිට, සත්ත්වයන්ගේ ච්‍යුත්‍යුපපත්තීන් බැලීමට සිත යොමුකළ සේක්, මරණයට ඉතා ළං වූ ද, එ කෙණෙහි පිළිසිඳ ගත්තා වූ දැ යි කළකම් පරිදි සුගති දුගති දෙක්හි මැරෙන උපදින නන් වැදෑරුම් සත්ත්වයන් දුටු සේක.

මෙසේ සත්ත්වයන්ගේ ච්‍යුති උපපත්ති දැක්මෙන් නන් ප්‍රතිච්ඡාදක මෝහය දුරු විය. 'මම අතීතයෙහි වීම් ද , නොවීම් ද යන ආදි වශයෙන් සොළොස් පරිද්දෙකින් වන සියලු සැකය [42] ද ප්‍රහීණ විය. (මේ වනාහි මහසතාණන් වහන්සේ ගේ කංඛාවිතරණ විසුඩි සම්පාදනය යි.)

රෑ තුන් වැනි යාමය පැමිණියේ ය. මහ බෝසතාණන් වහන්සේ පළමු සේ ම ආනාපාන චතුර්ථ ධ්‍යානයට සමවැද එයින් නැඟී සිට ස්කන්ධ පස අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් බලන සේක්, කලාප සම්මර්ශනයේ

සිට එක් එක් පටිච්චසමුප්පාද අංගය සත්තානුපස්සනාවිථියට බැස් වූ සේක. මෙසේ විවසුන් වඩමින් අනිච්චානුපස්සනායෙන් නිත්‍යසංඥාව ද, දුක්ඛානුපස්සනායෙන් සුඛ සංඥාව ද, අනත්තානුපස්සනායෙන් ආත්මසංඥාව ද, විරාගානුපස්සනායෙන් රාගය ද, නිබ්බිදානුපස්සනායෙන් නන්දිය ද, නිරොධානුපස්සනායෙන් සමුදයය ද, පටිනිස්සග්ගානුපස්සනායෙන් ආදානය ද දුරුළු සේක.

නැවැත සියලු සංස්කාරයන් නාම රූප වශයෙන් දෙකට බෙදා උදය ව්‍යය වශයෙන් බලන උන් වහන්සේට **ආලෝක පීති පස්සද්ධි ඤාණ සද්ධා සති සුඛ උපෙක්ඛා විරිය නිකන්ති** යන විදර්ශනා උපක්ලේශ දහය පහළ විය.

ඉක්බිති ඒ ආලෝක ප්‍රීති ආදි ධර්මයන් නුවණින් බලන සේක්, 'තෘෂ්ණා දෘෂ්ටි මානයට අරමුණු බැවින් 'මොහු මාර්ගය නො වෙත්, තරුණ විදර්ශකයාට ධර්මතා වශයෙන් පහළ වන විදර්ශනෝපක්ලේශයෝ ම වෙති, මොවුන්ගෙන් මිදුණු විදර්ශනා විථියට පිළිපන් නුවණ ම මාර්ගය වේ යැ' යි මෙසේ මාර්ගාමාර්ග පිරික්සා දැන ඒ ආලෝකාදීන් කෙරෙහි නො ඇලී සිත විදර්ශනා භාවනාවට ම යොමු කළ සේක.

(මෙහි උන්වහන්සේට පහළ වූ මාර්ගාමාර්ග පරීක්ෂා කැර තීරණ කොට ගන්නා තියුණු විදර්ශනා ප්‍රඥාව මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධි සම්පාදනයයැ.)[45]

**පටිපදාඤාණ දස්සණ විසුද්ධිය**

ඉක්බිති විදර්ශනා මාර්ගයට පිළිපන් මහාසත්ත්වයන් වහන්සේ ස්කන්ධ පංචකයේ අනිත්‍ය දුඃඛ අනාත්ම ලක්ෂණයන් පරීක්ෂා කරන සේක් පංචස්කන්ධයේ පහළ වීමත් විනාශයත් දුටු සේක. (උදයව්‍යය ඥානය[46] ලැබූ සේක.) ස්කන්ධයන්ගේ පහළවීමත් විනාශයත් වඩ වඩා බලත්ම වඩ වඩා ස්කන්ධ භංගය ම ප්‍රකට වැ පෙනිණ. තමන් ඉදිරියෙහි සිටින ව්‍යාඝ්‍රයකුගේ අයා ගත් මුඛයම පැනෙන්නා සේ ඉතා බලවත් වී මරණය ම පෙනෙන්නට විය. සියලු ස්කන්ධ පංචකය හුදු මරණය නම් දැයෙකින් ම සැදුණාක් මෙන් වැටහිණ. (භංගානුපස්සනඤාණය[46] පහළ විය.)

ඉක්බිති භංගය අනුව බලන සේක් භවත්‍රය ගත සියලු සංස්කාරයන් ව්‍යාඝ්‍ර සර්පාදීන් මෙන් භයක් කොට, භයට කාරණ කොට දුටු සේක. (භයතොපට්ඨාන ඤාණය[47] ලැබූ සේක.) මෙසේ සංස්කාරයන් භය වශයෙන්, භය උපදවන්නත් වශයෙන් බලත් බලත් ම භවත්‍රය මුළුල්ල

ගිනිගත් කිහිරඟුරු වලක් සේ ජාති ජරාදී එකලොස් ගින්න ඇවිල පවත්නා ප්‍රතිෂ්ඨා රහිත තැනක් සේ පෙනිණ. භවය මෙ නම් ජාති ජරාදි දුකින් යුක්ත ය යි භවත්‍රයයේ ම දෝෂ දුටු සේක. (ආදීනව ඤාණය ලැබූ සේක.)[48]

ආදීනව ඤාණයෙන් සංස්කාරයන්ගේ දෝෂ බලන කල්හි තමන් සර්ප මුඛයට අසුවූ මැඩියකු සේ ද, දැලෙක අසු වූ මසකු සේ ද, හැඟී යෑමෙන් තුන් භූමියට අයත් සියලු ධර්මයන්ගෙන් මිදෙනු කැමැති නුවණ ඇති විය. (මුච්චිතුකම්‍යතා ඤාණය[49] පහළ විය.)

මිදෙන උපාය සොයන සේක්, චණ්ඩ මෘගයන් ඇති වනයකට වන්නකු ඉන් පැන යෑමට ඒ මේ අත මඟක් සොයා ඇවිදින්නාක් මෙන්, යළිත් සංස්කාරයන් අනිත්‍යාදී ත්‍රිලක්ෂණයට නඟා සම්මර්ශනය කළ සේක. (පටිසංඛානුපස්සනා ඤාණය)[50] ලත් සේක.

මෙසේ විදසුන් වඩන කල්හි දුරාචාර දෝෂයෙන් කලකිරී හරනා ලද භාර්යාවක සැඩොලුන් ගේ සමාගමයෙකැ සිටිනු දැක ද, ආලයක් හෝ අමනාපයක් නැති වැ උදසීන වන්නාක් මෙන්, දොස් දැක්මෙන් කලකිරුණු, ඇල්ම හැර දැමූ, සංස්කාරයන් මධ්‍යස්ථ වැ බලනා නුවණ (සංඛාරුපෙක්ඛා ඤාණය) [51] පහළ විය.

මෙහි කී උදයව්‍යය ඤාණය පටන් කොට සංඛාරුපෙක්ඛාඤාණය තෙක් වූ අෂ්ට ඥානයෝ මහබෝසතාණන් වහන්සේ විසින් පෙර බුදුවරයන් වෙත පැවිදි ව ධර්මය ඉගෙන විදර්ශනා වැඩීමෙන් ලදුවැ අළු යට ගිනි පුපුරු මෙන්, කුටියක් තුළැ ඇවිලෙන පහන් මෙන් සිටියෝ, වහා මැ පහළ වැ ආහ.

උක්ත පරිදි වූ සංඛාරුපෙක්ඛාඤාණය පුරුදු කරන මහසතාණන් වහන්සේ ගේ ශ්‍රද්ධාව[52] බලවත් විය, වීර්‍ය්‍යය මනාව වැඩිණ, සිහිය මොනවට එළැඹ සිටියේ ය. සිත සුසමාහිත විය. සංස්කාරෝපේක්ෂාව (සංස්කාරයන් මධ්‍යස්ථ ව බැලීම) ඉතා තියුණු විය.

සංඛාරුපෙක්ඛාව (සංස්කාරෝපේක්ෂාව) සංස්කාරයන් අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් සම්මර්ශනය කරමින් නැවැතැ භවාංගයට බැස ගති. ඉක්බිති, භවාංගයට අනතුරු වැ සංඛාරුපෙක්ඛා ඤාණයෙහි ආ පරිදි ම අනිත්‍යතාදි ත්‍රිලක්ෂණ අරමුණු කරමින් මනොද්වාරාවර්ජන සිත පහළ විය. ඉක්බිති යටැ පහළ වූ උදයව්‍යය ඥානාදි අෂ්ට

ඥානයන් ගේ කෘත්‍ය සංසිඩියටත් මතු පහළ වියැ යුතු වූ බෝධිපාක්ෂික ධර්මයනටත් අනුකූල වැ, චතුස් සත්‍යයන් මුවහ කරන අවිද්‍යාව බිඳ හරිමින්, අනිත්‍යාදි තිලකුණු සර්වප්‍රකාරයෙන් ප්‍රකට කෙරෙමින්, සියලු ලෞකික විදර්ශනාවන් ගේ මුදුන් පැමිණි මහා කුශල ජවන ගත ඥානත්‍රයය පිළිවෙළින් බලවත් වැ පහළ විය. (සච්චානුලෝමික ඤාණය පහළ වූයේ ය.)

**ගෝත්‍රභූ ඥාන ලාභය**

තදනන් තර ව පෘථග්ජන ගෝත්‍රය (ලෞකික බව) මඩිමින්, ඉක්මෙමින්, නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරමින් ගෝත්‍රභූ ඥානය[54] පහළ විය.

**ඥාන දර්ශන විශුඩිය[55] බුදුවීම**

ගෝත්‍රභූ ඥානය පහළ වැ නිරුඬ වීමට අනතුරුව එයින් දෙන ලද සංඥා ඇත්තක්හු සේ දුක දකිමින්, සමුදය දුරු කරමින්, (-දුකට හේතු වූ සක්කාය දිට්ඨි විචිකිච්ඡා සීලබ්බත පරාමාසයන් නසමින් ) නිරෝධ සත්‍යය (නිවන) අරමුණු කරමින්, මාර්ග සත්‍යය (අරිඅටැඟි මඟ) වඩමින් ප්‍රථම ඥාන දර්ශනය (සෝතාපත්තිමග්ග ඤාණය) පහළ විය.[56]

එයට අනතුරු ව සොතාපත්ති ඵලය ද, ඉන් පසු තමන් ආ මාර්ගය බලන මහා පච්චවෙක්ඛණඤාණය ද,[57] ලත් මාර්ගයේ අනුසස් බලන ඵල පච්චවෙක්ඛණ ඤාණය ද, බිඳ හල කෙලෙසුන් විමසා බලන පහීණ කිලෙස පච්චවෙක්ඛණ ඤාණය ද, ඉක්බිති ඉතිරි වූ කෙලෙසුන් සොයා බලන අවසිට්ඨකිලෙස පච්චවෙක්ඛණ ඤාණය ද යන ඤාණයෝ පහළ වූහ.

යලිදු උදයව්‍යය ඤාණයේ සිට සංස්කාරයන් තිලකුණට නහා බලන බෝසතාණන් වහන්සේට සංඛාරුපෙක්ඛාව කෙළවර අනුලොම ඤාණ චෝදන ඤාණයෝ ද තදනන්තර වැ දුක් පිරිසිඳිමින් රාගදෙවෂමෝහයන් තුනී කෙරෙමින් නිවන සාක්ෂාත් කෙරෙමින් අරිඅටැඟි මඟ වඩමින් දෙවෙනි ඥානදර්ශනය (හෙවත් සකදාගාමිමග්ග ඤාණය[58]) පහළ විය. එයට අනන්තර වැ එහි ඵලය ද එයට පසු මාර්ගයත් ඵලයත් ප්‍රහීණ ක්ලේශත් ප්‍රහීණ නො කළ ක්ලේශත් පිරික්සන ප්‍රත්‍යවේක්ෂාඥානයෝ පිළිවෙළින් පහළ වූහ.

නැවැත ද මහා පුරුෂයාණන් වහන්සේ උදයව්‍යය ඥානයේ සිට සංස්කාරයන්ගේ ලක්ෂණ බලන්නට පටන් ගත් සේක. උන්වහන්සේට පළමු සේ ම සංස්කාරෝපේක්ෂාව අවසනැ අනුලෝමචෝදන ඤාණයෝද,

තදනන්තරව දුක් පිරිසිඳිමින්, සමුදය (කාමරාග ව්‍යාපාදයන්) ප්‍රහාණ කරමින්, නිවන් පසක් කරමින් අරි අටැඟි මග වඩමින් තෙවෙනි ඥාන දර්ශනය (අනාගාමී මාර්ගය) [59] පහළ විය.

එයට අනන්තර වැ තදනුරූප ඵලය ද මාර්ග ඵල ප්‍රහීණ ක්ලේශ, ඉතිරි කෙලෙස් යන මොවුන් පරීක්ෂා කරන ඥානයෝ ද පහළ වූහ.

තවත් වධ්‍ය ක්ලේශයන් ඇති බව දැක පළමු පරිදි ම උදය ව්‍යයාදි නව මහා විදර්ශන ඥානයෙන් සංස්කාරයන් ලක්ෂණත්‍රයට නගා ක්‍රමයෙන් විමසා බලන යෝගීන්ද්‍ර වූ මහා පුරුෂයාණන් වහන්සේ ට සංඛාරුපෙක්ඛා ඥානය ද, ඉන් පසු අනුලෝම චෝදන ඥානයෝ ද පහළ වූහ. තදනන්තර වැ සියලු දුක් පිරිසිඳ දකිමින්, සමුදය (ඉතිරිවැ සිටි සියලු කෙලෙසුන් ) වාසනා දෝෂ ද සමග විහත විධ්වස්ත කරමින්, නිවන් සාක්ෂාත් කරමින් මාර්ගය භාවිත කරමින්, සිවු වන ඥාන දර්ශන ය (අර්හත්ත්වමාර්ග ඥානය) පහළ විය. මෙසේ සෝවාන් ආදී සතර මාර්ගයන් ලැබීම උන්වහන්සේ ගේ ඤාණදස්සන විසුඩි සම්පාදන යයි.

අර්හත්ත්වමාර්ග ඥානයට අනතුරුව අර්හත්ත්ව ඵලය ද ඉක්බිති මාර්ගත් ඵලත් ප්‍රහීණ ක්ලේශත් නිර්වාණයත් යන මොවුන් පිළිබඳ වූ ප්‍රත්‍යවේක්ෂණ ඥානයෝ[60] ද පහළ වූහ.

මහාපුරුෂයාණන් වහන්සේට අර්හත්ත්වමාර්ග ඥානය සමග ම සිවුපිළිසිඹියා ද ෂඩ් අසාධාරණ ඥාන ද තුදුස් බුඞඥාන ද අටළොස් ආවේණික ධර්ම ද දශබල චතුවෛශාරද්‍යාදි අපරිමිත බුඞ ගුණයෝ ද සමෘඞ වූහ.

මෙසේ එද රෑ ගෙවී අරුණු නගින කල්හි ම මහා පුරුෂයාණන් වහන්සේ ලෝද් එකලු කෙරෙමින්, සුබ නිමිති පළ කෙරෙමින් සවාසන සකල ක්ලේශ විද්ධවංසනයෙන් නිරුත්තර සම්‍යක්සම්බුඞ පදවියට පැමිණ වදළ සේක.

බෝසතාණන් මෙසේ බුදු බව ලදුයේ කලියුග වර්ෂයෙන් 2513 වන්නෙහි පුර පසළොස්වක් ද ය.

## සතොළොස් වන පරිච්ඡේදය

**පළමු ප්‍රීතිවාක්‍යය**

ලොවුතුරා බුදුබව ලැබගැන්මෙන් ස්වකීය මනෝරථය මුදුන් පමුණුවාගත් භාග්‍යවතුන් වහන්සේ තමන් බිහිසුණු සසර දුකින් මිදුණු බව, දුර්ලභ වූ සම්‍යක් සම්බෝධිය

ලත් බව, එයින් මහත් ම විජයශ්‍රිය ලත් බව, දහම් ඇස ලත් බව, දම් දෙසා සත්ත්වයන් සසර දුකින් මුදලීමෙහි සමත් වූ බව සැලැකූ සේක. මෙය සලකත් ම මහත් ප්‍රීතියෙක් ඇති විය. සිතැ තුළැ මැ මෙසේ වූ ප්‍රීති ප්‍රකාශයෙක් ද ඇති විය:[61]

'යලි යලි ඉපැද්ම දුක් ය. එබැවින් ආත්මභාව නැමැති ගෙය නංවන තෘෂ්ණා නැමැති වඩුවා සොය සොයා උහු දැක්ක හැකි සත්‍යාවබෝධ ඥාන ඇස ලබන්නට අපේක්ෂා ඇති වැ එහෙත් ඌ දැක ගත නො හැකි ව නොයෙක් සිය දහස් ගණන් උත්පත්ති ඇති සසරැ දිව ඇවිද්දෙමි. හෙම්බා වඩුව, දැන් තා දිටිමි. මෙයට පසු තෝ මට අත් බව් ගෙය නො නංවන්නෙහි ය. තගේ සියලු කෙලෙස් පරාල මම බිඳ දැම්මෙමි. අවිද්‍යා කැණිමඩල පළා දැමීමි. මා සිත නිවන අතට ගියේය. තෘෂ්ණාව වැනසීමි (රහත් බව ලදිමි.)'

**පළමු සතිය**

මෙසේ සිත තුළැ ම උදන් අනා, ඉක්බිති, 'මම සාර අසංඛ්‍ය කල්ප ලක්ෂයක් මේ පළඟ (පර්‍ය්‍යංකය) පිණිස දිවැ ආමි. මේ මා ජයග්‍රහණය කළ විජයපර්‍ය්‍යංක යැ. 'චතුරංගික වීර්‍ය්‍ය වඩමි ඉටා මා බුදු වූයේ මේ පළඟෙහි යැ'යි සිතූ සේක්, පළඟ නො ලිහා මැ, උන් සැටියෙන් මැ ඉඳගෙන අර්හත්ත්වඵල සමාපත්තියට සිය දහස් ලක්ෂ කෝටි වාර ගණනක් සමවදිමින් සතියක් මැ කල් යැවූ සේක. සතිය අවසන් වූ ද රෑ අනුලෝම වශයෙන් **පටිච්ච සමුප්පාදය**[63] මෙනෙහි කළ සේක. (ප්‍රත්‍යය වන දෑ ද එයින් එයින් උපදනා (ප්‍රත්‍යයෝත්පන්න) දෑ ඉපිදෙමින් ඉදිරියට යන සැටි ද මෙනෙහි කළ සේක. ඉක්බිති (යාමය අවසනැ) 'වීර්‍ය්‍යවත් , ධ්‍යාන වඩන, පව් බැහැර කළ යෝගාවචරයාට බෝධි පාක්ෂික ධර්ම සිතැ පහළ වන ක්ෂණයෙහි සියලූ සැක දුරු වේ.' [64] යැයි ප්‍රීති වාක්‍යය මුවින් පිට කළ සේක.

යලි රෑ මධ්‍යම යාමයෙහි පටිච්ච සමුප්පාද ය ප්‍රතිලෝම වශයෙන් 'මෙය නො උපන් කලැ මෙ නම් දෑ නො උපදී' යැයි මෙනෙහි කළ සේක. මැදුම් ය මැ අවසනැ,

'කෙලෙස් තවන වැර ඇති, ධ්‍යාන කරන, පව් බැහැර කළ යෝගියාහට බෝධි පාක්ෂික ධර්ම පහළ වන කෙණෙහි අවිද්‍යාදි ප්‍රත්‍යයන්ගේ ක්ෂයයට කාරණ වූ නිවන නුවණැසට ඉලක්ක වන බැවින් එය පිළිබඳ වූ ඔහු ගේ සියලු සැක දුරුවැ යේ ' යැයි මේ දෙවෙනි ප්‍රීතිවාක්‍යය ද මුවින් පිට කළ සේක.

රෑ තුන් වන යාමයෙහි උන් වහන්සේ පටිච්ච සමුප්පාදය අනුලෝම වශයෙන් ද ප්‍රතිලෝම වශයෙන් දැයි දෙසැටියෙන් ම මෙනෙහි කළ සේක. යාමය අවසන් වූ කෙණෙහි,

'කෙලෙස් තවන වීර්යය ඇති, ධ්‍යාන වඩන, පව් බැහැර කළ යෝගී තෙම, තමා තුළ බෝධිපාක්ෂික ධර්ම පහළ වූ කෙණෙහි, අඳුර දුරු ගසා අහස බුබුලුවන හිරු සෙයින් සියලු මර සෙන් බිඳ හරිමින් සිටී' යැ යි මේ ප්‍රීතිවාක්‍යය මුවින් පිට කළ සේක.

**යමා පෙළහර**

බුදු වීමෙන් පසුත් උන් පළඟ නො ලිහා ම බෝ මුලැ භාග්‍යවතුන් වහන්සේ ඉන්නා දුටු ඇතැම් දේවතා කෙනෙක්නට[71] තව ම සිද්ධාර්ථයන් වහන්සේ විසින් කළ මනා කෘත්‍ය ඇත්තේ වන. පළඟෙහි ඇල්ම නො හැරියේ එහෙයින් දෝ යි කල්පනා විය. එවිටැ භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ පරිවිතර්කය දැන, අහස් නැග ඔවුන් විතර්ක දුරු කිරීමෙහි සමර්ථ වූ යමා පෙළහරක් දැක් වූ සේක.

**දෙවෙනි සතිය**[67]

ඉක්බිති බෝමුලැ වැඩ උන් තෙනට මඳක් ඊසාන පැත්තේ සිට, තමනට බුදු බව ලබා ගැනීමට ආධාර වූ ස්ථානය බව සලකා ඒ දෙස ඇසි පිය නො හෙළා බලාගෙන සතියක් ම ඇසින් පූජා කරමින් සමවත් සමවැද සිටිසේක. (මෙ තැන **අනිමිසලෝචන චෛත්‍ය** නම් වී.)

**තෙවෙනි සතිය**

ඉක්බිති බෝ පළඟත් වැඩ සිටි තෙනත් අතරැ නැගෙන හිරැ සිට බස්නාහිරට සක්මනක් මවා එහි සතියක් දහම් මෙනෙහි කරමින් සක්මනින් කල් ගත කළ සේක. (මේ ස්ථානය **රත්නචංක්‍රමණ චෛත්‍ය** නම් වී.)

**සිවු වන සතිය**

භාග්‍යවතුන්වහන්සේ සිවු වන සතියෙහි බෝරුකින් වයඹ පැත්තේ රුවන්ගෙයි[68] වැඩ හිඳ ධර්මය මෙනෙහි කොට, වෛනේය ජනයන් බලා ශීලයෙහි පිහිටා සමාධිය වඩා ප්‍රඥායෙන් විවසුන් කොට සත්ත්වයෝ ආර්යමාර්ගයට බසිතැ'යි **ශීල සන්දීපක වූ විනය පිටකය** ද, **සමාධි සන්දීපක වූ සූත්‍රාන්ත පිටකය** ද ඉක්බිති **ප්‍රඥාසන්දීපක** වූ **අනන්තනය** ඇති **අභිධර්ම පිටකය** ද සම්මර්ශනය කරන සේක් ප්‍රස්ථාන ධර්මය මෙනෙහි කිරීමට බැස ගත් සේක. සියල්ලට ම වඩා ගැඹුරු වූ ප්‍රස්ථාන ක්‍රමය මෙනෙහි කරත් කරත් ම උන්වහන්සේට බලවත් ප්‍රීතිය ඇති විය.

හෘදයවාස්තු ගත ලෙය ප්‍රසන්න විය. වාස්තු රූපය ද විශේෂයෙන් පහන් විය. ඡවි වර්‍ණය ද පැහැදුණේ ය. චිත්ත සමුත්ථාන (සිත කරණ කොට ැ සෑතුයෙන් හටගත්) වර්‍ණය හාත්පස අසූරියන් පමණ තැන පැතිර සිටියේ ය. එය වටා පෙදෙස සිය දහස් දෙව් දුනු පහළ වූවා සේ, ඉර සඳ සුවහසක් පහළ වූ කලෙකැ සේ එකාලෝක විය.[69]

**පස්වන සතිය [70] බමුණකුගේ ප්‍රශ්නයක්**

බුදු වීමෙන් මසෙක් ගත වී ය. උක්ත පරිදි මසක් ම බෝ මැඩ අසළ වුසූ භාග්‍යවතුන් වහන්සේ ඉන් නික්ම අජපාල නුග රුක කරා වැඩැ ඒ මුලැ සතියක් විමුක්ති සුඛය විඳිමින් උන් සේක. 'උන් වහන්සේ පල සමවතින් නැඟී සිටි කිසි වේලාවෙකැ මානයෙන් දැඩි වූ, අනුන් හෙලා දක්නා සුලු එක්තරා බමුණෙක් එහි පැමිණියේ ය. උරුවෙල්හි උන් වහන්සේ දුෂ්කර ක්‍රියා සමයේත් නැවැත සේනානි ගමෙහි පිඬු පිණිස හැසිරෙන සමයේත් මෙ තෙම උන් වහන්සේ දැක කතා බස් කර අඳුනන කෙනෙකි. පැවැදි වූ තන් පටන් කොට ගෞතම තාපසයන් වහන්සේ යන නම ඉර සඳ සේ දඹදිවැ ප්‍රකට ව පැවැත්තේ ය. එබැවින් හෙ තෙම ගෝත්‍ර නාමයෙනුත් උන් වහන්සේ හඳුනයි.

හේ භාග්‍යවතුන් වහන්සේ වෙත අවුත්, 'භාග්‍යවත් ගෞතමයන් වහන්ස, කරුණු කීයෙකින් බ්‍රාහ්මණයෙක් වේ ද? කෙනකු බමුණකු කරන ධර්‍මයෝ කවුරු ද?' යන ප්‍රශ්නය ඇසී ය.

එ විටැ භාග්‍යවතුන් වහන්සේ :

**'පව් දුරු කළ, මානාහංකාරයෙන් අනුන් හෙලා නො දක්නා, කෙලෙස් කසට නැති, කෙලෙසුන් කෙරෙන් සිත රැක ගත්, සතර මහ නුවණින් නිවන් කරා පැමිණි, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමැ වූ යමෙක් වේ නම්, හේ සැබෑ බ්‍රාහ්මණයා නම් වේ. ලොවැ කිසි අරමුණකුත් රාග ද්වේෂ මෝහ මාන දෘෂ්ටින්ගේ වශයෙන් නො ගන්නා හෙ තෙම තමා 'බමුණෙකැ'යි ප්‍රතිඥා කෙරේ නම්, ඒ කරුණු සහිත'**[70] යැ යි වදාළ සේක.

**මරගු ගේ දෙෂාරොපණයක්**

අජපල් නුග රුක මුලැ වැඩ ඉන්නා භාග්‍යවතුන් වහන්සේට '**අනර්ථ නිඃශ්‍රිත දුෂ්කර ක්‍රියායෙන් තමන් මිදී මැදුම් පිළිවෙතෙහි පිහිටා බුදු වූ බව කොතරම්** යෙහෙක් දැ,යි සිතෙක් වී ය. එවිට භාග්‍යවතුන් වහන්සේට වූ කල්පනාව දැනගත් දේවපුත්‍ර මාර තෙම එහි විත්,

**'සත්වයන් ගේ ශුද්ධියට හේතු වූ තපස් කිරීමෙන් ඉවත් වැ අශුධ වැ 'ශුද්ධ වෙමි'යි සිතවු ද? ඔබ ශුද්ධිමාර්ගයෙන් බොහෝ ඈත් වැ ඉඳිති'යි කී ය.**[71]

එවිට භාග්‍යවතුන් වහන්සේ 'මේ මාරයා'යි දැන,

**'නො මැරෙන පිණිස යැ යි කරන ලද ආත්මක්ලමථය, වනයෙහි නැවක් හබලෙන් පදනට තැත් කිරීමක් මෙන්, නිෂ්ඵල හිස් අවැඩ ගෙන දෙන එකෙකැයි දැන, මාර්ගඥාන ලාභය පිණිස මඟ වූ ශීල සමාධි ප්‍රඥා යන ධර්මත්‍රයය වඩා පරම ශුද්ධියට** (රහත් බවට) පැමිණියෙමි. මාරය තෝ පැරදුණෙහි'යි වදාළ සේක.[72]

එ විට මාර තෙම 'බුදු රජ් තමා හැඳින ගත්තේ වනැ'යි දැනැ දොම්නසින් එහි ම අතුරුදහන් විය.

**මරහු බුදුරදුන් බිය කරන්නට කළ උත්සාය**

එක් දිනක් රෑ දැඩි කළුවරයෙහි භාග්‍යවතුන් වහන්සේ අජපල් රුක අසළ සක්මන් කෙළවර ගල් පුවරුයෙහි හුන් සේක. මඳින් මඳ වැහි පොද ද වැටිණ. එ කලැ දෙවමාරපුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේට බිය ගන්වන අදහසින් ලොකු ඇතකුගේ වෙසින් ආ ය. ඔහු හිස මහ කළුගලක් වැන්න. දත් පිරිසිදු රිදී මෙන් සුදුය. හොඬ මහ නඟුලිසක් පමණ විශාල ය.

භාග්‍යවතුන් වහන්සේ 'මේ මාරයා'යි දැන **'දීර්ඝ කාලයක් ම ප්‍රිය අප්‍රිය අනේක ප්‍රකාර වෙස් ගෙන නොයෙක් වර මා වෙත ආයෙහි ය. ලාමකය, මේ යුෂ්මතාගේ බිය ගැන්වීමේ ව්‍යාපාරයෙන් වැඩෙක් නැතැ'**[73] **යි වදාළ සේක.**

එ විට මාර තෙම 'බුදු රජහු මා හැඳින ගත්තෝ'යි සිතා දොම්නසින් එහි ම අතුරු දහන් ව ගියේ ය.

තවත් වරෙකැ මාර තෙම අඳුරු වේලායෙහි භාග්‍යවතුන් වහන්සේට බිය ඇතිකරන අදහසින් කුදු මහත් ශුභාශුභ වෙසින් පෙනෙන්නට විය. එ විටැ ද පළමු සේ ම වදරා, **'මාරය, කයින් වචසින් මනසින් සංවෘත වූවෝ යුෂ්මත්හුගේ වශයට නො යෙත්, යුෂ්මත්හුගේ අත වැස්සෝ හෝ නො වෙත් යැ යි වදාළ සේක. එවිටත් පළමු සේ ම මර පලාගියේය.**[74]

**භාග්‍යවතුන් වහන්සේ ගුරුවරයකු පත්කර ගැනීම**

අජපල් රුක් මුලැ මෙසේ වැඩ ඉන්නා බුදුරජාණන් වහන්සේට "කිසිවකු ගුරු තන්හි නො තබා, කිසිවකුට යටත් පැවතුම් නැති වැ ඉන්නා තැනැත්තේ වනාහි දුකසේ වෙසේ. මම කවර මහණ බමුණකුට ගරු බුහුමන් යටත් පැවතුම් කොට කවුරු ඇසුරු කොට වසම් දැ?"යි කල්පනාවෙක් විය. එහෙත් ශීල සමාධි ප්‍රඥා යන ගුණවලින් තමන් වහන්සේ ට වැඩි හිටි කෙනකු තුන්ලොවැ ම නැති බව දුටු භාග්‍යවතුන් වහන්සේ "මා පිළිවිදි ලෝකෝත්තර ධර්මයට ම සත්කාර කොට ගරු බුහුමන් කොට එය ඇසුරු කොට වසම් නම් යෙහෙකැ"යි සිතූ සේක.

එ කෙණෙහි සහම්පති මහබඹුහු භාග්‍යවතුන් වහන්සේ ඉදිරියේ පෙනී සිට ඇදිලි බැඳත "එසේ ය, භාග්‍යවතුන් වහන්ස, එසේ ය, සුගතයන් වහන්ස, අතීතයෙහි අර්හත් සම්මා සම්බුදුවරුන් ධර්මයට මැ සත්කාර ගුරුකාර කොට එයමැ ඇසුරු කොට වුසූ හ. අනාගතයෙහි ඇතිවන අර්හත් සම්මාසම්බුදුවරුත් ධර්මයට ම සත්කාර කොට ධර්මය ම ඇසුරු කොට වසන්නෝ ය. වහන්ස, මෙ සමයෙහි අර්හත් සම්‍යක්සම්බුඬ වූ භාග්‍යවතුන් වහන්සේ ද ධර්මයට ම සත්කාර කොට, ධර්මය මැ ඇසුරුකොට වසන සේක් වා!"යි කී ය.

**සවැනි සතිය**

පස් වන සතිය ඇවෑමෙන් භාග්‍යවතුන් වහන්සේ එ තැනින් නික්මැ සමීපයේ වූ මිදෙල්ල ගහක් කරා වැඩ එහි මුලැ සතියක් පල සමවත් සුවින් ගෙවූ සේක. එ සමයෙහි හද්ද වැස්සෙක් වට. වැහිපොද මුසු තද ශීත සුළං වූ හෙයින් එ දවස් කරදර සහිත විය. යට කී මිදෙල්ල රුක අසළ වුසූ නාගයෙක් ඒ දැක භාග්‍යවතුන් වහන්සේට ශීත සුළං නො වදිනාසේ ඒ සතියේ ම ආවරණය කොට සිටියේ ය.

සතිය ඇවෑමෙන් භාග්‍යවතුන් වහන්සේ සමාපත්තියෙන් නැඟී සිටි සේක. වැස්ස නැවති බව දැක නාග තෙමේ ද උන් වහන්සේ ඉදිරියට වුත් නමස්කාර කෙරෙමින් සිටියේ ය. මේ වේලායෙහි භාග්‍යවතුන් වහන්සේ විවේක සැප විඳින්නහුට කොතැනත් සැප බව සලකා,

"චතුර්මාර්ගඥාන සන්තෝෂයෙන් සතුටු වූ, තමා තුළ ප්‍රකට වූ ලොවුතුරා දහම් ඇති නුවණැසින් උපධි විවේකය (නිවන) බලන පුද්ගලයාට ඒ සැප වේ. ලොව කිසිවකු කෙරෙහිත් නො කිපෙන බව ද සත්ත්වාහිංසාව ද සැපයි. කාමාශායෙන් වෙන්වීම වූ විරාග බව ද ලොවැ සැපෙකි. අස්මිමානයේ විනාශය උසස් ම සැප වේ "යැ යි උදන් ඇනූ සේක.[76]

**සත්වන සතිය**

සවන සතියෙන් පසු බුදුරජාණන් වහන්සේ නුදුරෙහි වූ කිරිපලු රුක වෙත වැඩ එහි සමවත් සුව විඳිමින් සතියක් හුන් සේක.

# අටලොස් වන පරිච්ඡේදය

බුදු වූ තැන් පටන් කොට ගත වූ සත් සතියෙහි භාග්‍යවතුන් වහන්සේ කිසි දු අහරක් නො වැළඳූ සේක. ඵල සමාපත්තියෙන් ම කාලය ගත කළ සේක.

**සක් දෙවිඳුගේ පූජාවක්**

සත්වන සතිය අවසන්හි සමවතින් නැගී සිටි උන්-වහන්සේට සක් දෙව් රජාණෝ දැවටු දඬු ද මුව දෝනා පැන් ද බෙහෙත් අරළුවක් ද ප්‍රදානය කොට ගියහ. භාග්‍යවතුන් වහන්සේ ද දැහැටි වළඳා මුව දෙවා කිරිපළු රුක් මුලැම හුන් සේක.

**තපස්සු භල්ලික වෙළෙඳ දෙබෑයෝ**

මෙ සමයෙහි උත්කල ජනපදයෙන් වෙළඳාමෙහි යන **තපුස්ස භල්ලික**[77] නම් සහෝදර වෙළෙන්දෝ දෙදෙනෙක් පන්සීයක් පමණ ගැල් පදවා ගෙන ඒ පෙදෙසට බටහ. වියැලි බිම එරුණාක් මෙන් වීමෙන් ගැල්පැදවියැ නොහැකි විය. ගැල් තිබුණු තැනින් මඳකුත් සොලොවන්නට අසමත් වූහ. මෙසේ ඔවුන් කරදර වන අතර එක් දෙවිදුවක් අතැවැසි පුරුෂයකුට ආවිෂ්ට වී බුදු රජුන් ඒ වනයෙහි කිරිපලු රුකක් මුලැ ඉන්නා බව කියා ඔවුන් දන් දීමෙහි මෙහෙයූවා ය.

වෙළෙන්දෝ ද දේවතානුශාසනය පරිදිම භාග්‍යවතුන් වහන්සේ කරා එලැඹ විළඳිනුත් මී පිඩුයෙනුත් උන්වහන්සේ පිදූහ. ඒ පිළිගන්නට භාග්‍යවතුන් වහන්සේ වෙත කිසි භාජනයෙක් නොවීය. 'කිමෙකින් මෙය පිළිගනිම් දැ'යි උන්වහන්සේට සිතෙක් විය.

උන් වහන්සේ ගේ චිත්තාචාරය දත් සිවුවරම් දෙව්රජහු මුං වන් ගල්මුවා පාත්‍ර සතරක් ගෙනවුත් පිළිගැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ ඒ පාත්‍ර සතර ම අධිෂ්ඨාන බලයෙන් එකක් කොට එයින් යටැ කී දෙ වෙළෙඳුන් දුන් අත් සුණු හා මී පිඩු පිළිගෙන වැළැඳූ සේක.

වළඳා අන්තයෙහි උන් වහන්සේ ඔවුනට භුක්තානුමෝදනා වශයෙන් ආනුපුබ්බී කථාව වදළ සේක. බණ ඇසූ ඔවුහු ද 'වහන්ස, අපි භාග්‍යවතුන් වහන්සේත් ධර්මයත් සරණ යම්හ. අද පටන් දිවි හිමි කොට

බුදුන් දහම් සරණ ගිය උපාසකයන් හැටියට අප සලකන සේක් වා'යි කියා සරණ ගියහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නමින් පිදීමට වස්තුවක් ඉල්ලූ ඔවුනට කේශධාතු මිටක් දුන් සේක. ඔවුහු රන් කරඬුයෙන්, ඒ ගෙන ගොස් සිය ජාත භූමිය වූ අසිතංජන පුරයෙහි චෛත්‍යයක් කොට පිදූහ.

**අටවන සතිය බඹුගේ ඇයැදුම්**

භාග්‍යවතුන් වහන්සේ කිරිපලු රුක් මුලින් නැගිට යලිත් අජපාල නුගරුක වෙත වැඩි සේක. ඒ රුක්මුලැ ඉන්නා උන් වහන්සේට මතු සඳහන් වන පරිදි වූ කල්පනාවෙක් ඇති විය.

"මා අවබෝධ කළ මේ සිවුසස් දහම් ගැඹුරු ය. සුව සේ දැක්ක නොහැකි ය. සුව සේ අවබෝධ කළ නො හැකිය. මා අවබෝධ කළ ලෝකෝත්තර ධර්මය ශාන්ත ය, ප්‍රණීත ය, තර්ක මාත්‍රයෙන් බැස ගත නො හැකි ය. සූක්ෂ්මය, මනා ව පිළිපන් නැණැතියන් විසින් ම දත හැකි ය. මේ සත්ත්වයෝ තෘෂ්ණායෙන් දැඩි සේ බැඳී ගියෝ, එයින් මිදීමට තැත් නො කොට එයින් ම තෘප්තියට පැමිණ ඉඳිත්. ඥානාන්ධ වූ මොවුන් විසින් ප්‍රත්‍යයාකාර ධර්මය ද නිවන ද දත නොහැක්ක. ඥානාන්ධ ව ඉන්නා තුරු එය මොවුනට දෙසීම නිෂ්ඵල වෙහෙසීමෙකි. මා ඉතා පරිශ්‍රමයෙන් අවබෝධ කළ ගැඹුරු ධර්මය දෙසීමට තව ම යෝග්‍ය නො වේ. රාගයෙන් රක්ත ද්වේෂයෙන් ද්විෂ්ට වූවන් විසින් මෙය අවබෝධ කළ නො හැකිය. උඩු හොයට ගිය, සියුම්, ගැඹුරු, දුර්දර්ශ, ඉතා සූක්ෂ්ම වූ චතුස් සත්‍යය රාගයෙන් රත් වූ අවිද්‍යා අඳුරු කඳින් වැසුණු සිත් ඇතියෝ නොදක්නාහ."[79.]

ධර්මයේ ගැඹුරු බවත්, සත්ත්වයන් දැඩි කෙලෙස් බැඳුම්වලින් බැඳී ඉන්නා තෙක් ම එය දෙසීම නිෂ්ඵල බවත් සිතීම් වශයෙන් භාග්‍යවතුන් වහන්සේට ඇති වූ මන්දෝත්සාහය දත් සහම්පති බඹ තෙම කැළැඹී ගියේ ය. දස දහසක් සක්වල දෙව් බඹුන් කැටි වැ 'බණ අසා අවබෝධ කිරීමට වියෑම් කරම්හ'යි උනන්දුව ඇති කැරගෙන අවුත් බණ අසන්නට දැඩි ඕනෑකම දන්වා ආයාචනා කරනුයේ,

"මගධ රටෙහි කෙලෙස් සහිත පුද්ගලයන් සිතා නිපැදැවූ අශුඩ ධර්මයෙක් පෙරැ පහළ විය. එබැවින් වහන්ස, මේ අමා දෙර (ධර්මය) විවෘත කළ මැනවි. නික්ලෙශීන් වහන්සේ අවබෝධ කළ ධර්මය අසත්වා, සුප්‍රාඥයන් වහන්ස, සර්වඥයන් වහන්ස, සෙල් පව්වක් මුදුනැ සිටියකු

හාත්පසැ පහත් පෙදෙසැ සිටියන් දක්නා සේ, ඔබ වහන්සේ ධර්මප්‍රාසාදයට නැඟී පහ වූ ශෝක ඇති සේක්, ශෝකයෙහි බට ජාති ජරා දුකින් මැඩුණු සත්ත්ව සමූහයා බලා වදාළ මැනැවි. වීරයන් වහන්ස. මාරසංග්‍රාමයෙන් ජයගත් මහෝත්තමයන් වහන්ස. සසර කතරින් සතුන් එ තෙර කරන නාථයන් වහන්ස, කාමච්ඡන්ද නැමැති ණය නැති නිදහස් ශ්‍රේෂ්ඨයන් වහන්ස. නැඟී සිටිනු මැනව. දැන ගන්නෝ ඇති වෙති"යි කීය.[80] මහබඹුහුගේ මෙහෙයීමෙන් බොහෝ දෙව් බඹුහු ධර්මාවබෝධයට උත්සාහවත් වූහ.

භාග්‍යවතුන් වහන්සේ බුදු ඇසින් ලොව බැලූ සේක. ඇසූ කෙණෙහි ම ධර්මය අවබෝධ කිරීමට තරම් මේරූ නුවණ ඇතියන් ද ලුහුඬින් වදාළක් ඒ ඇසූ කෙනෙහි අවබෝධ නොකට හෙතත් විස්තර කරන සෙමෙහි අවබෝධයට පොහොසතුන් ද බුද්ධ වචනය විස්තර ලෙස දැන ඉගෙන නුවණින් සලකමින් සත්පුරුෂාශ්‍රයය කිරීමෙන් ධර්මාවබෝධය කිරීමට තරම් ශක්ති ඇත්තන් ද, කිසි ලෙසකිනුත් මේ ජාතියේ දී ධර්මාවබෝධයට පෙහොසත් නො වූවන් ද යන සතර වැදෑරුම්[81] පුද්ගලයන් දුටු සේක. දැක දහම් ඇසීමට බොහෝ සත්ත්වයන් සැරැසී ඉන්නා බැවින්, දැන් ධර්ම දේශනාවට කාලය යැයි සලකා, බ්‍රහ්මය, ප්‍රණීත වූ ධර්මය එය අවබෝධ කැරැගැන්මට උනන්දුව නැත්තවුනට දෙසීම පීඩාකරය" යන අදහසින් නො දෙසීමි. දැන් වනාහි බොහෝ දෙනා උත්සාහවත්හ. කන් ඇත්තෝ (-දහම ඇසීමට) ශ්‍රද්ධාව විහිදුවත්වා! ඔවුනට අමාදොරවල් (ආර්ය මාර්ග ද්වාරයෝ) හැර තබන ලදහ, නො වසන ලදහ"යි වදාළ සේක.

සහම්පති බඹ ද බුදුරජාණන් වහන්සේ තම අයැදුම පිළිගත් බව දැන ඔබ වැඳ පැදකුණු කොට දෙව් බඹ පිරිස් හා එතන්හි ම අතුරුදන් විය.

**ශ්‍රෝතෘන් සෙවීම**

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "මම පළමුවෙන් ම මිනිසුන් අතුරෙහි කාට දම් දෙසම්දැ"යි සිතූ සේක්, "ආළාර තවුසා ඉඳී නම් ධර්මාවබෝධයට සමත්ථී යැ"යි දුටු සේක. හේ දැන්, කොහි ඉඳී දැයි දිවැසින් බලා ඔහු මැරී එවකට සතියක් වූ බව දැක, "අන් කවරෙක් ධර්මාවබෝධයට තරම් නැණැත්තේ දැ"යි බැලූ සේක්, **උද්‍රක** තෙමේ සමතැ"යි දුටු සේක. "හේ කොහි ඉඳී දැ"යි බැලූසේක්, හීයේ රෑ හෙතෙම මළේ" යැයි දුටු සේක.[83] යළි අන්

කවුරු ධර්මාවබෝධයට සමත් දැයි **විමසා** පස්වග තවුසන් දැක, ‘උහු කොයි දැ’යි දිවැසින් බලා බරණැස ඉසිපතන්හි ඉන්නා තියා දැක එහි යන්නට අදහස් කළ සේක.

**උරුවේලායෙන් පිටත් වීම උපකයා හමු වීම**

භාග්‍යවතුන් වහන්සේ කිහිප දිනක් බෝ මැඩ අසලැ වාසය කොට, ඉක්බිති, බරණැස් නුවර බලා අටළොස් යොදුන් මහ මඟට පිළිපන් සේක. මෙසේ වඩනා උන්වහන්සේට බෝ මැඩටත් ගයාවටත් අතරෙහි දී **උපක** නම් ආජීවකයෙක් හමු වීය.[84] හෙ තෙම බුදුරජාණන් වහන්සේ දැක පැහැදී, ‘**ආයුෂ්මතාණෙනි, ඔබ ගේ ඇස් ආදී ඉන්ද්‍රියයෝ ප්‍රසන්න හ. ශරීර වර්ණය පිරිසිඳුය. ඔබ කිනම් ශාස්තෲවරයකු උදෙසා පැවිදි වූ ද නොහොත් ඔබ ගේ ශාස්තෲ කවරෙක් ද? කාගේ ධර්මයෙක් ඔබට රිසියෙයි දැ?**’ යි ඇසීය.

එ විට ඔහුට පිළිතුරු දෙන භාග්‍යවතුන් වහන්සේ,

‘[85]මම් තුන් භවයට අයත් සියලු දැ මැඩ ලූයෙම් වෙමි. සියල්ල දනිමි. භවයට අයත් සියල්ලෙහි නො ඇලුණෙමි. භවයට අයත් ඒ සියල්ල දුරැ -ලූයෙම් වෙමි. රහත්පල නැමැති විමුක්තිය ලැබ සියලු සසර දුකින් මිදුණෙම් වෙමි. එසේ වූ මම් තමා සත්‍යාවබෝධය කොට කවරකු ආචාර්ය වශයෙන් දැක්වියැ හෙම් ද? (මට ඇදුරෙක් නැත. මම ම මගේ ම උත්සාහයෙන් සත්‍යය අවබෝධ කෙළෙමි.)

‘මේ සත්‍යාවබෝධයෙහි මට කිසි බාහිර ඇදුරෙක් නැත. එබැවින් මට සම කෙනෙක් (අද) නැත. දෙවියන් සහිත ලොවෙහි මට සම පුද්ගලයෙක් නැත.’

‘මම් අද ලොවැ එකම රහත් පුද්ගලයා වෙමි. එක ම නිරුත්තර ශාස්තෲ වෙමි. එක්ම සම්මා සම්බුදුවරයා වෙමි. ක්ලේශාග්නිය නිවීමෙන් සිසිල් වූයෙමි. නිවුණෙකිමි. ඒ මම් බරණැස යෙමි. අවිද්‍යායෙන් අඳුරු වූ (අවිද්‍යා තින්දෙහි වැටී සිටින) ලොවෙහි (ධර්ම ලාභය සඳහා ප්‍රබෝධය ඇති කරනු පිණිස) අමා බෙරය ගසන්නෙමි’යි වදළ සේක.

එවිටැ ‘ඔබ තමන් ප්‍රතිඥා කරන පරිදි **අනන්තජින** වීමට සුදුස්සෝ’ යැ යි උපක කී ය. ඔහු ගේ වචනයට භාග්‍යවතුන් වහන්සේ,

‘රහත් බවට පත් මා වැන්නෝ ඒකාන්තයෙන් ජින නම් වෙති. උපකය, සියලු පාපයෝ මා විසින් දිනන ලදහ. එ හෙයින් මම ජින වෙමි’යි වදළ සේක.

ඒ අසා උපක තෙම 'එසේත් විය හැකි යි, ඇවැත්නි'යි කියා හිස සලා භාග්‍යවතුන් වහන්සේට වඩිනට මහ හැර (පාරෙන් අයින් වැ) දකුණු දෙසට, ගියේ ය. භාග්‍යවතුන් වහන්සේ ද උතුරු දෙසට වැඩි සේක් ගයා පෙදෙස ඉක්මැ **රෝහිතවාස්තු, උරුවිල්වාකල්ප. අරුණාලය, සාරථිපුර** ආදී ග්‍රාමනිගමයන් පසු කොට ගංගා නදියෙන් එ තෙර වී බරණැස් නුවරට පැමිණිසේක.

මේ වනාහි ඇසළ පුණු පොහෝ ද ය.

**ඉසිපතන වැඩීම**

සවස් කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ නගරයට නොදුරු වූ **ඉසිපතනයට** සමීප වූ සේක. පස්වග තවුසෝ ඈත වඩනා භාග්‍යවතුන් වහන්සේ දුටුවෝ ය. දැක,

'ආයුෂ්මත්නි, ශ්‍රමණ ගෞතමයෝ ප්‍රධන් වීය්‍යීයෙන් පහ වැ, සුව පහසු ප්‍රත්‍යය පරිභෝගයට පෙරළී බැස, බුදු වී ගතැ නොහී, දැන් අප කරා එති. ඔහු දැක හුනස්නෙන් නැගීම හෝ ඉදිරියට ගොස් පා සිවුරු පිළිගැනීම හෝ වැඳීම හෝ නො කළ යුතු. උසස් කුලෙහි උපන් බැවින් හිඳිනා අසුන් පමණක් පැණැවිය යුතු'යැ යි කතිකා කැර ගත්හ.

එහෙත් බුදුරජාණන් වහන්සේ ළං වත් වත්ම ඔහු තමන් කැර ගත් කතිකායෙහි පිහිටා සිටිත්නට නො හැකි වූහ. එක් තවුසෙක් පෙරමුණට ගොස් පාත්‍ර චීවර පිළිගත්තේ ය. එක් තවුසෙක් අසුන් පැණැවී ය. තවත් තවුසෙක් පා සේදීමට දිය ද පා පුටුව ද පාද කඨලිකාව ද ගෙනවුත් ළං කොට තැබී ය.

භාග්‍යවතුන් වහන්සේ ද පැණැ වූ ආසනයෙහි හිඳ පා සේදූ සේකි. ඉන් පසු තවුසෝ බුදු රජාණන් වහන්සේට පෙර සේ තමනට සම කෙනෙකුට කථා කරන්නාක්මෙන් 'ඇවැත්නි,[86] ගෞතමයිනි,' කියා ආමන්ත්‍රණය කරන්නෝ 'ඇවැත්නි ගෞතමයිනි, අපි ඒ කාලයෙහි උරුවේලායෙහි වසන්නමෝ ඔබ ගේ පා සිවුරු ඔසොවා ගෙන හැසුරුණමු. මුව දෝනා දිය හා දැහැටි පිළියෙල කොට දුනුමු. ඔබ වුසූ පිරිවෙන ඇමැද්දමු. ඉන් පසු ඔබට වත් පිළිවත් කොළෝ කවුරු ද? අප ඔබ හැර දමා ගිය කලැ අප ගැන යමක් සිතුණේ නැද්ද?' යන ආදී වශයෙන් බුදුරජාණන් වහන්සේ හා කථාවට පටන් ගත්හ. එ විටැ භාග්‍යවතුන් වහන්සේ ඔවුන් අමතා, 'මහණෙනි, තථාගත වූ තැනැත්තහුට 'ඇවැත්නි' කියාත්, නම කියාත්, ආමන්ත්‍රණය නො කරවු, මහණෙනි, තථාගත තෙම සියලු කෙලෙස් නැසූයෙකි, මනා කොට සියලු

ධර්මයන් තෙමේ ම අවබෝධ කළ කෙනෙකි. මහණෙනි, කන් යොමු කරවු. තථාගත වූ මා විසින් නිවන ලද්දේ ය. ඒ මම් යුෂ්මත්නට අනුශාසන කරමි, දහම් දෙසමි. කුල පුතුන් ගිහි ගේ හැර දමා නිසි සේ බඹසර රැකීමෙන් ලබන්නට බලාපොරොත්තු වන ඒ ඉතා උතුම් රහත් බව මා අනුශාසන පරිදි පිළිපැදීමෙන් යුෂ්මත්හු තුමූ ම ලබාගෙන වසවු යැ'යි වදාළ සේක.

එවිට පස්වග මහණහු 'ආයුෂ්මත්නි, ඒ දවස්වලැ දී ඒ තරම් වීර්‍ය්‍යයෙනුත් ඒ තරම් දුෂ්කර ක්‍රියායෙනුත් ඔබට ලෝකෝත්තර ගුණයෙක් නො ලැබුණේ නම්, කිම! ඔබට ලෝකෝත්තර ධර්ම පහළ වූයේ දුෂ්කර ක්‍රියා හැර දමා ආහාරපානාදි ප්‍රත්‍යයයන් බහුල කොට ගැනීමෙන් ශරීරයට සැප පහසු සලසාලීමෙන් දැ?'යි කීහ.

එවිට බුදුරජාණන් වහන්සේ 'මහණෙනි, තථාගත තෙම ප්‍රත්‍යය බහුල කොට ගැනීමට බැස්ස කෙනෙක් වත් වීර්‍ය්‍යය හැර දැමූ කෙනෙක්වත් නො වේ. තථාගත තෙම, අර්හත් ය, සම්‍යක්සම්බුද්ධ ය. මහණෙනි, කන් යොමු කරවු. මා විසින් නිවන් ලද්දේ ය. මම යුෂ්මත්නට අනුශාසන කරමි, දහම් දෙසමි, කුලපුතුන් ගිහි ගේ හැර දමා ගොස් පැවිදිව නිසි ලෙස බඹසර රැකීමෙන් ලබන්නට බලාපොරොත්තු වන ඉතා උතුම් වූ ඒ රහත් පදය මා අවවාදනුශාසන පරිදි පිළිපැදීමෙන් යුෂ්මත්හු තුමූ ම මේ අත්බව්හි දී ම ලබා වසන්නාහු යැ' වදාළ සේක. මෙසේ වදාළ විට ද පස්වග මහණහු පළමු සේම කීහ. නැවතත් බුදුරජාණන් වහන්සේ පළමු සේ ම වදළාහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔවුන් අමතා වදරන සේක් 'මා ඒ උරුවෙල් දනව්වේ යුෂ්මතුන් හා වැස ප්‍රධන් වීර්‍ය්‍ය කරන කාලයෙහි කිසි ම දිනෙකැ යුෂ්මතුන් රවටා සනසනු සඳහා, 'මට මෙසේ එළියෙක් පෙනේ යැ' කියා හෝ 'මෙසේ අමුතු අරමුණෙක් පෙනේ යැ' කියා (නො ලැබූ යමක් ලැබීමි යි) 'බොරුවක් කී බවක් මතෙක ද?' යි ඇසූ සේක. මෙ සේ වදාළ විට පස්වග තවුසෝ කාරණය තේරුම් ගෙන උන් වහන්සේ 'බුදු බව ලැබුණේ යැ'යි කළ ප්‍රකාශය සත්‍ය යැ යි පිළිගත්හ. 'ස්වාමීනි, ඔබ වහන්සේ බොරුයෙන් අප කිසි කලෙකත් නො රැවටූ සේකැ'යි ඔවුහු කීහ. එ විට බුදුරජාණන් වහන්සේ පළමු වදාළ සේ ම 'මහණෙනි, තථාගත තෙම අර්හත් ය, සම්‍යක්සම්බුද්ධය' යන ආදිය වදාළ සේක. පස්වග තවුසෝ භාග්‍යවතුන් වහන්සේ බුදුබව ලත් බැවින් ම මෙසේ වදරන සේකැ'යි පිළි ගත් හ. පිළිගෙන ධර්ම ශ්‍රවණයට සැරසුණ හ.

---

## ප්‍රථම දේශනා සමාගම ය

**ප්‍රථම මහා සමාගම**

සූර්‍ය්‍ය තෙම අවර දිගට නැමී ගමන් ගත්තේ ය. මල් සුවඳින් උපන් මදයෙන් මුදිත ව හඬ නගන බමර කැල ගෙන් ද, අතු අගැ රඟ දෙන මයුර පංක්තීන්ගෙන් ද සෙසු සියලු පක්ෂි නාදයනට නිගා දී හඬ නගන කෝකිල සමූහයා ගෙන් දැ යි අනේක පක්ෂි කුලයන්ගෙන් හා මෙය නිරුපද්‍රැත යැ යි දැනැ පෙම් කෙළිමින් සිය දරුවන් කැටි ව දිව පැන ඇවිදුනා මෘගාදීන් ගෙන් දැ යි මෙසේ අනේක විධ මෘග පක්ෂි ගණයා ගෙන් සවස් කාලයෙහි **ඍෂිපතනය** රඟ බිමෙක ශ්‍රී ඉසලී ය. **කොන්ඩඤ්ඤ භද්දිය වප්ප මහානාම අජසජි** යන තවුසෝ පස් දෙන එක් එළි මහන් පෙදෙසකැ රැස් වූහ. ඔවුනට මුහුණ ලා භාග්‍යවතුන් වහන්සේ අනුපමේය බුඩශ්‍රීන් බබලමින් අස්නෙකැ වැඩහුන් සේක. එ කෙණෙහි බොහෝ දිව්‍ය බ්‍රහ්ම යක්ෂ සමූහයෝ ගලා එන මහ වතුරක් සේ සියුම් වෙස්ගෙන එහි රැස් වූහ.

භාග්‍යවතුන් වහන්සේ ශ්‍රී මුඛය විවෘත කොට බ්‍රහ්ම ස්වර විහිදුවා දම් දෙසන්නට ආරම්භ කළ සේක. ඒතාක් පැවැති සියලු ශබ්ද නැවැතී දැඩි නිශ්ශබ්දතාවෙක් ඇති වී ය. සියලු මෘග පක්ෂිහු ද නිහඬ ව හුන් තැන ම හිඳ උන් වහන්සේ ගේ මධුර කට හඬට කන් යොමු කළහ.

සඩම්වර චක්‍රවර්ති වූ ද්විපදෝත්තම ශාක්‍යසිංහ සාමිදරුවන් වහන්සේ පස්වග තවුසන් අමතා මෙසේ වදළ සේක.

**ප්‍රථම දේශනාව**

'මහණෙනි, පැවිද්දහු විසින් නො සෙවිය යුතු මේ කෙළවර දෙකෙකි. ඒ කවර දෙකෙක් ද? හීන ග්‍රාම්‍ය අන්ධබාල ලෞකිකයන් ගේ පුරුද්දක් වන, අනාර්‍ය්‍ය අවැඩ ගෙන දෙන කාමසුඛල්ලිකානු යෝගය ද, දුක් උපදවන, අනාර්‍ය්‍ය, අවැඩ ගෙන දෙන අත්තකිලමථානුයෝග ය ද යන අන්ත දෙක යැ.

මහණෙනි, මේ කී අන්ත දෙක හැර දමා, නුවණැස පිරිසිදු කරන, ඥානය පහළ කරන, කෙලෙස් දුරු කරනු පිණිස, සත්‍ය ප්‍රතිවේධය පිණිස, සම්බෝධිය පිණිස, නිවන් ප්‍රත්‍යක්ෂ කරනු පිණිස පවත්නා මධ්‍යම ප්‍රතිපත්තිය තථාගත වූ මා විසින් පසක් කැරිණ. ඒ මධ්‍යම ප්‍රතිපත්තිය නම්

| | |
|---|---|
| සම්‍යක් දෘෂ්ටිය | සම්‍යක් ආජීවය |
| සම්‍යක් සංකල්පය | සම්‍යක් ව්‍යායාමය |
| සම්‍යක් වචනය | සම්‍යක් ස්මෘතිය |
| සම්‍යක් කර්මාන්තය | සම්‍යක් සමාධිය |

යන මේ අංග අටක් ම වූ[87] ආර්‍ය්‍යමාර්ගය යැ.

මහණෙනි, මේ වනාහි තථාගත මා විසින් අවබෝධ කරන ලද, නුවණ පහළ වීම පිණිස ද නිවන ප්‍රත්‍යක්ෂ කරනු පිණිස ද පවත්නා ඒ මධ්‍යම ප්‍රතිපත්තිය යි.

**දුක්ඛ සත්‍යය**

මහණෙනි, 'ඉපැත්ම දුක් ය, ජරාව ද දුක් ය, ව්‍යාධිය ද දුක් ය, මරණය ද දුක් ය, අප්‍රියයන් හා එක්වීමත්, ප්‍රියයන්ගෙන් වෙන්වීමත් දුක් ය. ලබනු කැමති දෑ නො ලැබීම දුක් ය. සැකෙවින් කියතොත් උපාදාන ස්කන්ධ පසම දුක් ය' යන මෙය වනාහි **දුඃඛාර්‍ය්‍ය සත්‍යය යි.**[88]

**සමුදය සත්‍යය**

මහණෙනි, නැවත නැවත සසර ඉපැත්ම සිදු කරන. නන්දි රාගය හා එක්ව හට ගන්නා ඒ ඒ උපනුපන් භවයෙහි ඇල්ම කරන යම් තෘෂ්ණාවෙක් වේද,

කාම තෘෂ්ණා භව තෘෂ්ණා විභව තෘෂ්ණා යැ යි තුන් වැදෑරුම් වූ ඒ තෘෂ්ණාව **දුඃඛ සමුදයාර්‍ය්‍ය සත්‍යය යි.**[89]

**නිරෝධ සත්‍යය**

මහණෙනි, ඒ තෘෂ්ණාව ගේ ම යම් මුල් සිඳීමෙක් වේ ද, යම් දුරු කිරීමෙක් වේ ද, සර්වප්‍රකාරයෙන් යම් බැහැර ලීමෙක් වේ ද, යම් ආලය නො කිරීමෙක් වේ ද, තෘෂ්ණා නිරෝධයට කාරණ වූ ඒ නිර්වාණය **දුඃඛ නිරෝධාර්‍ය්‍ය**[90] **සත්‍යය** යි.

**මාර්ග සත්‍යය**

මහණෙනි, සම්‍යග්දෘෂ්ටි, සම්‍යක්සංකල්ප, සම්‍යග්වචන, සම්‍යක් කර්මාන්ත, සම්‍යගාජීව, සම්‍යග්ව්‍යායාම, සම්‍යක්-ස්මෘති, සම්‍යක්සමාධි යන මේ අංග අට ම වූ උතුම් උපාය ම **දුඃඛ නිරෝධගාමිනී** ප්‍රතිපදාර්‍ය්‍ය[91] සත්‍යය යි.

**සත්‍ය ඥානය**[92]

මහණෙනි, මේ දුඃඛාර්‍ය්‍ය සත්‍යය නමැති පෙර නෑසූ චතුස්සත්‍ය ධර්ම විෂයයෙහි නුවණැස, ඥානය, ප්‍රඥාව, විද්‍යාව, ඥානාලෝකය මට පහළ විය,

**කෘත්‍ය ඥානය**[93]

මහණෙනි, ඒ දුඃඛාර්‍ය්‍ය සත්‍යය පිරිසිඳ දත යුතු යැ යි පෙර නෑසූ ධර්ම විෂයයෙහි නුවණැස, ඥානය, ප්‍රඥාව, විද්‍යාව, ඥානාලෝකය මට පහළ වී ය.

**කෘත ඥානය**[94]

මහණෙනි, ඒ දුඃඛාර්‍ය්‍ය සත්‍යය මා විසින් පිරිසිඳ දන්නා ලද්දේ වේ යැ යි පෙර නො ඇසූ ධර්ම විෂයයෙහි නුවණැස, ඥානය, ප්‍රඥාව, විද්‍යාව, ආලෝකය මට පහළ වී ය.

**සමුදය සත්‍යයෙහි සත්‍ය ඥානය [95]**

මහණෙනි, මේ දුඃඛ සමුදයාර්‍ය සත්‍ය යැ යි කියා පෙර නෑසූ ධර්ම විෂයයෙහි නුවණැස, ඥානය, ප්‍රඥාව, විද්‍යාව, ආලෝකය මට පහළ වී ය.

**සමුදය සත්‍යයෙහි කෘත්‍ය ඥානය [96]**

මහණෙනි, 'ඒ දුක්ඛ සමුදයාර්‍ය සත්‍ය ය (තෘෂ්ණාව) පහ කළ යුතු යැ'යි පෙර නෑසූ ධර්ම විෂයයෙහි නුවණැස, ඥානය, ප්‍රඥාව, විද්‍යාව, ආලෝකය මට පහළ වී ය.

**සමුදය සත්‍යයෙහි කෘත ඥානය**

මහණෙනි, ඒ දුක්ඛ සමුදයාර්‍ය සත්‍යය (තෘෂ්ණාව) මා විසින් නසන ලදැ යි නුවණැස................................ මට පහළ වී ය.

**නිරෝධ සත්‍යයෙහි සත්‍ය ඥානය**

මහණෙනි, දුක්ඛ නිරොධාර්‍ය සත්‍යය (නිවන) නම් මේ යැ යි පෙර නෑසූ ධර්ම විෂයයෙහි නුවණැස......... පහළ වී ය.

**නිරෝධ සත්‍යයෙහි කෘත්‍ය ඥානය**

මහණෙනි, මේ දුඃඛ නිරෝධාර්‍ය සත්‍යය (නිවන) ප්‍රත්‍යක්ෂ කළ යුතු යැ යි පෙර නෑසූ ධර්ම විෂයෙහි මා තුළ කෘත්‍ය ඥානය පහළ වී ය.

**නිරෝධ සත්‍යයෙහි කෘත ඥානය**

මහණෙනි, ඒ දුඃඛ නිරෝධාර්‍ය සත්‍යය (නිවන) මා විසින් ප්‍රත්‍යක්ෂ කරන ලදැ යි පෙර නෑසූ ධර්ම විෂයයෙහි නුවණැස........................ මට පහළ වී ය.

**මාර්ග සත්‍යයෙහි සත්‍ය ඥානය**

මහණෙනි, පෙර නෑසූ ධර්ම විෂයයෙහි 'මේ දුක් නැසීමට පමුණුවන උපා යැ යි නුවණැස .................... මට පහළ වී ය.

**මාර්ග සත්‍යයෙහි කෘත්‍ය ඥානය**

මහණෙනි, පෙර නෑසූ ධර්ම විෂයයෙහි 'ඒ දුක්ඛ නිරෝධ ගාමිනී ප්‍රතිපදායී සත්‍ය ය මා විසින් වැඩිය යුතු' යැයි නුවණැස.................... මට පහළ වී ය.

**මාර්ග සත්‍යයෙහි කෘත ඥානය**

මහණෙනි, පෙර නෑසූ ධර්ම විෂයෙහි 'ඒ දුක් නසන උපාය මා විසින් වඩනා ලදැ'යි නුවණැස.................... මට පහළ වී ය.

මහණෙනි, මෙ සේ සත්‍යඥාන කෘත්‍යඥාන කෘතඥාන යැ යි එක සත්‍යයක් පාසා තුන් ආකාර වීමෙන් සතර සත්‍යයන්හි දෙළොස් ආකාර[95] වූ තත්ත්වඥානය යම්තාක් කල් මා තුළැ පහළ නො වී ද,

ඒ තාක් ම දෙවියන් මරුන් බඹුන් සහිත ලෝකයෙහි මහණ බමුණන් සහිත සත්ත්ව වර්ගයා අතුරෙහි 'මම නිරුත්තර සම්‍යක්සම්බෝධිය ලැබුයෙමි'යි ප්‍රතිඥා නො කෙළෙමි.

එහෙත් මහණෙනි, යම් කලෙක් හි චතුස්සත්‍යයන් පිළිබඳ ව තුන් පරිවර්තයක් ද දෙළොස් ආකාරයක් ද ඇති තත්ත්වඥානය මට පහළ වී ද, මහණෙනි, එයින් පසු ම දෙවියන් මරුන් බඹුන් සහිත ලෝකයෙහි මහණ බමුණන් සහිත සත්ත්ව වර්ගයා අතුරෙහි 'මම් නිරුත්තර සම්‍යක් සම්බෝධිය ලැබීමි'යි ප්‍රතිඥා කෙළෙමි. මා තුළ දර්ශන ඥානය පහළ වී ය. මගේ චිත්ත විමුක්තිය අකෝප්‍ය ය. මේ කෙළවර අත්බව ය. දැන් මතු භවයෙක් මට නැත. (මින් මතු භවෝත්පත්තියෙක් නැත.') මෙසේ භාග්‍යවතුන් වහන්සේ ඒ තවුසනට මේ පළමු දම් දෙසුම කළ සේක.

**ප්‍රථම සෝවාන් පුද්ගලයා**

මේ ධර්මය ඇසීමෙන් **කොණ්ඩඤ්ඤයන්** වහන්සේ ට දහම් ඇස (ස්‍රෝත ආපත්ති මාර්ග නුවණ) පහළ විය[96]

'කිසිවකු විසින් අප්‍රතිවර්ත්‍ය වූ ධර්මචක්‍රය භාග්‍යවතුන් වහන්සේ විසින් පවත්වන ලදැ'යි භෞම දේවතාවන් පටන් කොට බ්‍රහ්මකායික දෙවියන් තෙක් දෙව් බඹහු මහත් උද්ඝෝෂණ කළහ. දසදහසක් ලෝ ද කම්පිත වී ය. අප්‍රමාණ වූ උදර අතුල්‍ය ආලෝකයෙක් සියලු දෙව් බඹුන්ගේ ආලෝක මැඩ ගෙන පහළ වී ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භවත්නි, කොණ්ඩඤ්ඤ තෙම සිවු සස් දැන ගත්තේ වේ දැ!'යි දෙවරක් ප්‍රීති වාක්‍ය පහළ කළ සේක.

මෙ තන් පටන් කොට කොණ්ඩඤ්ඤයන් වහන්සේ **අඤ්ඤාත කොණ්ඩඤ්ඤ**[96] නම් වූ සේක.

මෙසේ සෝවාන් වූ කොණ්ඩඤ්ඤ තවුසාණෝ භාග්‍යවතුන් වහන්සේ වෙතින් පැවිද්ද හා උපසම්පදව ඉල්ලූහ. 'භික්ෂුව එව, ධර්මය ස්වාක්ඛ්‍යාතය, මනා කොට දුක් නසන පිණිස මහ බඹසර පුරව'යි[97] භාග්‍යවතුන් වහන්සේ වදළ සේක. එය ම කොණ්ඩඤ්ඤයන් වහන්සේගේ **උපසම්පදව** වී ය.

**පළමු වස ඉසිපතනයේ**

ඉර බස්නට පෙර ම භාග්‍යවතුන් වහන්සේ ගේ දම් දෙසුම අවසන් වී ය. මෙ දිනැ වැසි සමය ඇරැඹිණ. එ බැවින් ඒ ඇසළ පුණු පෝද සැන්දෑවෙහි 'මේ වර්ෂර්තුයෙහි ඉසිපතන්හි ම වෙසෙමි'යි භාග්‍යවතුන් වහන්සේ ඉටූ සේක. මේ බුදුරජුන්ගේ **පළමු වස් විසීම** යි.

# එකුන් විසි වන පරිච්ඡේදය

**ශාතාගිර හා හෙමවත**

දම්සක් පැවැත්වීමෙහි දී ඇති වූ පෘථිවිකම්පනාදි ප්‍රාතිහාර්‍ය්‍ය යකුන් අතුරෙන් පළමු ව දුටුයේ **ශාතාගිර**[98] නම් යක් සෙනෙවියා යි. 'මෙයට හේතු කවරේදැ?'යි විමසා දැන ගත් හෙතෙම සිය පිරිස කැටි ව අවුත් භාග්‍යවතුන් වහන්සේ ගේ ධර්ම දේශනාව ඇසීය. එහෙත් හේ සොවාන් වීම වැනි කිසි ගුණ විශේෂයක් නො ලැබීය. කවර හෙයින් ද? යත් : සිය මිතුරු **හේමවතයා** නා බව දැන එය ගැන සිතමින් නොඑකග සිතින් සිටි හෙයිනි.

ශාතාගිර තෙම 'යහළුවා කැඳවා ගෙනෙමි'යි ආකාශචාරී වැ මවාගත් හස්තියාන අශ්වයාන ගරුඩයානාදියෙන් සිය පිරිස හා හිමවත අතට පිටත්ව ගියේ ය.

තථාගතයන් වහන්සේ ගේ ප්‍රතිසන්ධි උත්පත්ති අභිනිෂ්ක්‍රමණ සම්බෝධිප්‍රාප්ති පරිනිර්වාණ අවස්ථාවන්හි පහළ වන පෙර නිමිති වැඩි වේලා නො සිටින නුමුත් දම්සක් දෙසන අවස්ථාවෙහි පහළ වූ පෙර නිමිති වනාහි විශේෂ වැ වැඩි වේලා පැවැත්තේ ය.

හිමවතැ නොකල් මල් පිපීම් ආදිය දුටු හේමවත යක්ෂ ද 'මා මිතුරා හා මේ පුෂ්ප ශ්‍රී විඳිමි'යි ශාතාගිර යකු කැඳවා ගනු පිණිස මධ්‍ය දේශාභිමුඛ ව නික්මියේ ය.

මෙසේ දෙ දෙසින් පිටත් වැ ආ මිත්‍රයෝ දෙදෙන රජගහ පුර මත්තෙහි දී හමු වූහ. හමු ව ඔවුනොවුන් දක්නට ඊමට හේතු විචාළහ.

කිසි කලෙකැ නො දුටු විරූ නො කල් මල් පිපීමෙන් හිමවත් පෙදෙස අභිරාම ව බබළන බවත්, ඒ පුෂ්ප ශ්‍රී විඳින රිසියෙන් මිතුරා සොයා තමා ආ බවත් හේමවත යක් කී ය.

'මේ අකල් මල් පිපිම් පෙළහරට හේතු දනු දැ?'යි **ශාතාගිර** ඇසී ය.

'නො දනිමි'යි **හේමවත** කීය.

'නිදුක, මේ පෙළහර හිමවතැ ම නොවේ. වැලි දස දහසක් ලෝ ද පහළ වූයෙක. සම්මා සම්බුදුහු ලෝ උපන්හ. අද දම්සක් පැවැත්තුහ. ඒ කාරණයෙන් මේ පෙළහර වී යැ'යි **ශාතාගිර** තෙම බුදුරජුන් පහළ වූ බව පැවැසී ය.

ඉක්බිති හේ හේමවතයා කැඳවනුයේ 'අද පසොළොස්වක් පොහො යයි. පුන්සඳ එළියෙන් බබළන රාත්‍රියක් ද එළැඹ සිටියේ ය. ඒකාන්ත විශ්වාස ඇතිව එව, යම්හ. අලාමක නම්[99] ඇති ගෞතම ශාස්තෲන් වහන්සේ දකුම් හ'යි කීය.

ඉක්බිති පහත සඳහන් පරිදි ඔවුන්ගේ කථාව වී ය.

**හේමවත :** කිමෙක් ද? ඒ තොප ශාස්තෘහුගේ සිත මනා ව පිහිටියේ ද? හෙතෙම සියලු සතුන් කෙරේ සම සිත් ඇත්තේ ද?[100] කිමෙක් ද, ඉටු අනිටු අරමුණෙහි රාග ද්වේෂ වශයෙන් පහළ වන සංකල්ප එතුමා විසින් වශග කරන ලද ද?

**ශාතාගිර:** 'ඒ තාදීහු* ගේ සිත මනා වැ අවල වැ සියල්ල කෙරේ සම වැ පිහිටියේ ය. ඉටු අනිටු අරමුණු විෂයයෙහි සංකල්පයෝ උන් වහන්සේ විසින් වශග කරන ලදහ.'

**හේමවත :** 'කිමෙක් ද හේ අන්සතු දෑ සොර සිතින් නො ගනී ද? පණිවායෙන් දුරු වූයේ ද? අබ්රම්සරින් දුරු වී ද? ධ්‍යානය හිස් නොකෙරේ ද (නො හරී ද?')?

**ශාතාගිර :** 'බුදු රජාණන් වහන්සේ අන් සතු නො දුන් දෑ නො ගන්නා සේක. පණිවායෙන් ද වැළැකී සේක. අබ්රම්සරින් දුරු වූ සේක. ධ්‍යානය නො හරිනා සේක.'

**හේමවත :** 'කිමෙක් ද, ඒ යුෂ්මත්හුගේ **ශාස්තෘ** තෙම බොරු නො තෙපලා ද? පරුෂ බස් නො බෙණේ ද? කේලාම් නො කියා ද? ප්‍රලාප බස් නො දෙඩා[102] ද?'

**ශාතාගිර :** 'උන් වහන්සේ බොරු නො තෙපලන සේක. පරුෂ බස් නො බණිනා සේක. කේලාම් නො කියන සේක. ප්‍රලාප නො දෙඩන සේක. නුවණින් පිරිසිඳ වැඩ පිණිස පවත්නා වචන ම[103] වදරන සේක.

**හේමවත :** 'කිමෙක්ද? හේ කාම වස්තූන් කෙරෙහි නෑ ලේද? ඔහු සිත ව්‍යාපාදයෙන් නො කැළැඹුණේ ද? මිථ්‍යාදෘෂ්ටියට හේතු වූ මුළාව ඉක්මියේ ද? ඥෙය ධර්ම විෂයයෙහි නො පැකිලැ පවත්නා සමතැස් ඇත්තේ ද?

**ශාතාගිර :** 'ඒ භාග්‍යවතුන් වහන්සේ පංච කාමයන්හි නො ඇලෙන සේකි. උන්වහන්සේ ගේ සිත ව්‍යාපාද දෝෂයෙන් නො කැළඹුණේ ය. උන් වහන්සේ මෝහය ද ඉක්මී සේකි. ඒ බුදුරජාණන් වහන්සේ සකල ඥෙය ධර්ම විෂයයෙහි නො පැකිළ පවත්නා සමතැස් ඇති සේක.'

* තාදී - ලාභඅලාභාදියෙන් කම්පා නොවන්නා

**හේමවත :** 'කිමෙක? එ ශාස්තෘහු අෂ්ට විද්‍යායෙන් යුක්ත ද?[104] පිරිසිදු චරණ ධර්ම ඇත්තෝ ද? ඔවුන් විසින් ආස්‍රවයෝ නසන ලදු ද? ඔවුනට පුනර්භවයෙක් නැද්ද?'

**ශාතාගිර :** 'ඒ ශාස්තෘන් වහන්සේ අෂ්ට විද්‍යායෙන් ද සම්පන්න සේක. පිරිසිදු චරණ ධර්ම ද ඇති සේක. උන්වහන්සේගේ පුනර්භවයෙක් නැත.'

**හේමවත :** 'ඒ මුනීන්ද්‍රයන් වහන්සේගේ සිත සම්පූර්ණද? විද්‍යා චරණ ධර්මයන් ගෙන් යුක්ත වූ උන් වහන්සේට යුෂ්මත්හු බෝ ගුණ දැන ම ඇති ගුණයෙන්ම ප්‍රශංසා කරවුද?'

**ශාතාගිර :** 'එසේය මිත්‍රය, ඒ මුනීන්ද්‍රයන් වහන්සේගේ සිත ඒ කී පරිදි ම සම්පූර්ණ ය. පිරිසිදු කාය වාක් මනඃ කර්මයෙනුත් සම්පූර්ණය. ඒ යුෂ්මත්හු විසින් මොනවට දැන ගන්නා ලද්දේ ය. එ සේම යැ යි මැනැවින් පිළිගන්නා ලද්දේ ද වේ.'

'ඒ මුනීන්ද්‍රයන් වහන්සේ ගේ සිත සම්පූර්ණය, කාය වාක් මනඃ සුචරිත සම්පන්නය. සැක රහිත ව එය දැන ගන්න. එසේ වූ විද්‍යාචරණ ධර්මයන් ගෙන් යුක්ත උන් වහන්සේ දැකුම්හ.' (මේ තාක් කළ කථාව නුවණින් සැලකූ හේමවතයා එහි දී සෝවාන් විය.) භාග්‍යවතුන් වහන්සේ පිළිබඳ තවත් තොරතුරු ශාතාගිරයා වෙතින් අසා දත් හේමවත යක් තෙම මෙසේ ද කී ය.

**හේමවත :** 'එව මිත්‍රය, යම්හ, ඒනි මෘගයකුගේ වැනි ක්‍රමයෙන් වට වූ කෙංඩා[105] ඇති ස්ථූල නොවූ සිරුරක් ඇති, වීර වූ, ස්වල්පාහාර ඇති ආහාරයෙහි ලොල් නො වූ, මුනි ගුණ ඇති[107] වනයෙහි ධ්‍යාන කරන ඒ ගෞතමයන් වහන්සේ දකුම්හ. සිංහයකු මෙන් එකචාරි වූ, පව් නො කරන, කාමයන්හි අපේක්ෂා රහිත ගෞතමයන් වහන්සේ කරා එළැඹ මරහුගේ මලින්[108] මිදීමට නිමිත්ත වූ නිවන විචාරමු.'

**පළමු සෝවාන් උපාසිකාව**

මේ වේලෙහි රජගහ පුරයේ ඇසළ නකත් උළෙල පැවැත්තේ ය. මිනිස්සු නුවර සරසා නකත් කෙළි සුව විඳිති. කාලි නම් කුල ස්ත්‍රියක් ක්‍රීඩා සුව විඳින්නී සිය පහයෙහි සී මැදුරු කවුළුව විවෘත කොට ගිම් නිවන්නී, සුළං වදිනා තැනෙක සිටියා ය. ඕ යට කී ශාතාගිර හේමවත දෙදෙනා ගේ කථාව මුළුමනින් ම අසා සිටියා ය. ඉක්බිති 'බුදුවරයෝ මෙබඳු

විශිෂ්ට ගුණ ඇත්තෝ' යැ යි බුධාලම්බන ප්‍රීති උපදවා සෝවාන් පෙලෙහි පිහිටියා ය. මෝ ආරංචියෙන් බුදු ගුණ අසා පැහැදුණු පළමු වන සෝවාන් උපාසිකාව ය.

**දෙවෙනි ධර්ම දේශනාව**

යට කී ඒ යක් සෙනෙවියෝ මධ්‍යම යාමයෙහි සිය පිරිවර හා ඍෂිපතනය ට පැමිණ දම්සක් පැවැත්තු පළහින් ම හුන් බුදුරජාණන් වහන්සේ කරා එළැඹියහ.

ඉක්බිති හේමවත යක්තෙම භාග්‍යවතුන් වහන්සේ වැඳ මේ මතු දැක්වෙන පරිදි ප්‍රශ්න විචාළේ ය.

'සත්‍යයන් බෙද නිශ්චය කොට වදරන, ආයර්‍ය සත්‍ය විෂයයෙහි ඥානය පවත්වන, සිවු බිමැ සියලු දහමුන්ගේ පර තෙරට පැමිණි, මෝහ නිද්‍රායෙන් පිබිදුණු, වෛර හා භය ඉක්මැවූ ගෞතමයන් වහන්සේ විචාරම්හ.'

'කුමක් නම් උපන් කල්හි ලෝකය උපන්නේ වේ ද? කුමක් කෙරෙහි සත්ත්ව තෙම තෘෂ්ණා දෘෂ්ටි සංස්තවය කෙරේ ද? කුමක් නිසා 'ලොව' යැ යි ව්‍යවහාර වේ ද? කවර කරුණෙකින් ලොව පෙළේ ද?'

**භාග්‍යවතුන් වහන්සේ :** 'ආධ්‍යාත්මික බාහිර ෂඩායතනයන් උපන් කල්හි ලෝකය උපන්නේ වේ. ඒ ද්විප්‍රකාර ආයතනයන් කෙරෙහි ම ලෝවැසි තෙම තෘෂ්ණා දෘෂ්ටි සංස්තවය කෙරේ. ඒ දෙ වැදෑරුම් ෂඩායතන නිසා ම 'ලෝක යැ' යි ව්‍යවහාරය වේ. ඒ ෂඩායතනයන් ඇති කල්හිම ලෝකය පෙළේ.'

**හේමවත:** යම් ධර්ම කෙනෙකුන් කරණ කොට ලෝකය පෙළේ නම් එ උපාදනිය ධර්ම කවරේ ද? ලෝකය කෙරෙන් නික්ම යන මාර්ගය කවරේ ද? උපාදනීය ධර්මයෙන් (දුකින්) කෙසේ සත්ත්වතෙමේ මිදේ ද? මේවා මට පැහැදිලි කරන සේක් වා!

**භාග්‍යවතුන් වහන්සේ:** ලොවැ මනස සවන කොට ඇති පංච කාම ගුණාලම්බනයෝ ඇත. ඒ ආධ්‍යාත්මික බාහිර වශයෙන් ද්විවිධ වූ ෂඩායතන විෂයයෙහි තෘෂ්ණාව සර්ව ප්‍රකාරයෙන් දුරු කිරීමෙන්[106] මෙසේ සත්ත්ව තෙම දුකින් මිදේ.

'මෙය ලෝකයෙන් නික්මෙන උපාය යි. දහස්වර විචාළත් මා විසින් අවිපරීත කොට කියන ලද මේ ලෝකනියර්‍යාණ මාර්ගය ම කියමි.

කවර හෙයින් ද? මෙයින් ම සත්ත්ව තෙම දුකින් මිදේ, එහෙයිනි.'

මේ දේශනාව අවසන්හි දී යක් සෙනෙවියෝ දෙදෙන දහසක් පමණ යක්සෙන් හා සෝවාන් වූහ.

ඉක්බිති හේමවත තෙම ස්වභාවයෙන් ම තමා දහමට ගරු කරන හෙයින් මෙතෙකින් අතෘප්ත ව මත්තෙහිත් සේඛාසේඛ භූමි විචාරන්නේ,

'මෙහි කවරෙක් සතර ඕඝයෙන් එ ගොඩ වේ ද? කවරෙක් මෙහි සසර සයුරින් එ තෙර වේ ද? යැටින් පිහිටක් හෝ මත්තෙන් එල්බෙන තැනක් නැති ගැඹුරු සසර සයුරෙහි කවරෙක් නො ගිලේ දැ?'යි ඇසුයේ ය.

මෙය විසඳන **භාග්‍යවතුන් වහන්සේ:**

'සැම කල්හි ශීල සම්පන්න වූ, ලොවි ලොවුතුරා ප්‍රඥා ඇති, උපචාර අර්පණා සමාධියෙනුත් යට මාර්ග ඵලයෙනුත් මොනොවට පිහිටි, නිජ ස්කන්ධ පංචකය තිලකුණට නගා විමසන සුලු, එලැඹ සිටි සිහි ඇති පුද්ගල තෙම සතර ඕඝයෙන් එතෙර වේ.

කාම සංඥායෙන් සර්ව ප්‍රකාරයෙන් දුරු වූ, සියලු සංයෝජනයන් ඉක්මි, තෘෂ්ණාව හා පුනර්භවය ක්ෂීණකළ රහත් පුද්ගලයා සසර සයුරෙහි ච්‍යුති ප්‍රතිසන්ධි වශයෙන් නො ගැලේ.'

මේ කථායෙන් පසු හේමවත තෙම යහලු ශාතාගිරයා දෙස ද සෙසු යක් පිරිස දෙස ද බලා, ප්‍රීති සොම්නසින්:

'ගැඹුරු ප්‍රඥා ඇති, ප්‍රශ්නයන් ගේ අර්ථ දක්නා, රාගාදි පරිබෝධ නැති, වස්තුකාම ක්ලෙශ කාම දෙක්හිත් ත්‍රිවිධ භවයෙහිත් නො ලැගුණු, ස්කන්ධාදි ප්‍රභේද ගත සියලු අරමුණෙහි ඡන්ද රාග වශයෙන් බැඳීමෙන් මිදුණු, දිව්‍ය විහාර පථයෙහි (හෝ පල සමවත්හි) නුවණින් බස්නා ඒ මහර්ෂීන් වහන්සේ බලවු. සර්වප්‍රකාරයෙන් සම්පූර්ණ (අලාමක) නම් ඇති නිපුණාර්ථදර්ශි වූ, ප්‍රඥා දයක වූ කාමාලයයෙහි නො ඇලුණු,. සියල්ල දන්නා, ශෝභන වූ (පාරමිතා) ප්‍රඥා ඇති, ආර්‍යාෂ්ටාංගික මාර්ග පථයෙහි (හෝ පල සමවත්හි) නුවණින් බස්නා ඒ මහර්ෂීන් වහන්සේ බලවු. චතුරෝඝ තරණය කළ නිරාස්‍රව වූ සම්‍යක් සම්බුඩයන් වහන්සේ දැකගත් හෙයින් අද අප ගේ ශුභ දැක්මෙක් විය. අද පහන් වීම ශුභ ය. අද නින්දෙන් නැගී සිටියා ශුභ ය. නවද කර්ම විපාකජ ඍද්ධියෙන් සමන්විත වූ යශස් ඇති මේ සියලු දහසක් යක්කු ලොවුතුරා සරණ ගමණයෙන් ඔබ සරණ යෙති. ඒ අපි සම්බුඩ වූ, ඔබ වහන්සේට ද ඔබ වහන්සේ ගේ ධර්මයේ සුධර්මත්වයට ද[111] නමස්කාර කරමින් දෙව් ගමින් දෙව් ගමට ද දිව්‍ය පර්වතයෙන් දිව්‍ය පර්වතය ට ද යන්නමු.'

මෙසේ හේමවත තෙම භාග්‍යවතුන් වහන්සේට ස්තුති කොට වැඳ ප්‍රදක්ෂිණා කොට සිය මිතුරා සහිත යක්සෙන් කැටුව ස්වකීය භවනයට ම ගියේ ය.[112]

# විසි වන පරිච්ඡේදය

**අව පැලවිය ද වප්ප තවුසා සෝවාන් වීම** ඇසළ පුණු පොහෝ දිනෙන් දෙවෙනි දිනයෙහි අන් සිවුදෙන පිඩු පිණිස යවා භාග්‍යවතුන් වහන්සේ ආරාමයෙහි හිඳ, වප්ප තවුසාණනට ඔවා දුන්සේක. වප්ප තවුසාණෝ ද, භාග්‍යවතුන් වහන්සේ දුන් කමටහන් වඩා පැලවිය ද ම සෝවාන් ව ඒහි භික්ෂු ප්‍රව්‍රජ්‍යෝපසම්පත්තිය ලැබූහ.[113]

එ සේ ම අව දියවක් ද **භද්දිය** තවුසාණෝ ද,

අව තියවක් ද **මහානාම** තවුසාණෝ ද,

අව ජලවක් ද **අස්සජී** තවුසාණෝ ද,

භාග්‍යවතුන් වහන්සේ ගේ අවවාදයෙහි පිහිටා කමටහන් වඩා සෝවාන් වූහ. ඒහි භික්ෂු සම්පත්තිය ද ලැබූහ.

මේ දිනවල ඒ භික්ෂූනට අවවාද කෙරෙමින් විහාරයෙහි ම භාග්‍යවතුන් වහන්සේ වැඩ හුන් සේක. තුන් නමක් පිඩු පිණිස ගොස් ගෙනා භෝජනයෙන් බුදුරජාණන් වහන්සේ ඇතුළු සනම ම යැපුණා හ.

**අව විසේනිය ද අනත්ත ලක්ඛණ සුත්ත දේසනාව** නැවැත අව විසේනිය ද භාග්‍යවතුන් වහන්සේ ඒ කොණ්ඩඤ්ඤ ආදී පස් නම ම අමතා අනාත්ම ලක්ෂණ සූත්‍රය වදළ සේක.

## අනාත්ම ලක්ෂණ සූත්‍රය

**භාග්‍යවතුන් වහන්සේ:** මහණෙනි, රූපය ආත්ම (තමා) නොවේ. මේ රූපය ආත්ම වේ නම්, ආබාධ පිණිස නො පවත්නේ ය. 'මාගේ රූපය මෙසේ වේවා මෙසේ නම් නො වේ වා'යි රූපයෙහි තමා රිසි අයුරෙක් ලැබෙන්නේ ය. එහෙත් මහණෙනි, රූපය ආත්ම නොවන බැවින් ම ආබාධ පිණිස පවතී. 'මෙසේ මගේ රූපය වේ වා, මෙසේ නම් නො වේවා! යි තමා රිසි අයුරෙක් රූපයෙහි නො ලැබෙන්නේ ය.

මහණෙනි, වේදනාව ආත්ම නො වේ. මේ වේදනාව ආත්ම වේ නම් ආබාධ පිණිස නොපවත්නේ ය..............

මහණෙනි, සංඥාව ආත්ම නො වේ. මේ සංඥාව ආත්ම වේ නම් ආබාධ පිණිස නො පවත්නේ ය............. මහණෙනි, සංස්කාරයෝ ආත්ම නො වෙත්. මේ සංස්කාරයෝ ආත්ම වෙත් නම් ආබාධ පිණිස

නො පවත්නේ ය....... මහණෙනි, විඥානය ආත්ම නොවේ. මේ විඥානය ආත්ම වේ නම් ආබාධ පිණිස නො පවත්නේ ය. ...... මහණෙනි, රූපය නිත්‍ය ද? නොහොත් අනිත්‍ය ද? තෙපි මේ කිමැයි සිතවූ ද?

**පස්වග මහණහු :** වහන්ස, ඒ අනිත්‍ය යි.

**භාග්‍යවතුන් වහන්සේ :** යමෙක් අනිත්‍ය නම් ඒ දුක් ද නො හොත් සුවද?

**පස්වග මහණහු:** ඒ දුක්ය, වහන්ස.

**භාග්‍යවතුන් වහන්සේ:** යමෙක් අනිත්‍ය වේ නම්, දුක් වේ නම් පෙරළෙන සුලු නම්, එය 'මෙය මගේ ය, මේ මම ය, මේ මා තමා යැ'යි දක්නට සුදුසුද?

**පස්වග මහණහු:** ඒ (එ සේ දක්නට) නම් සුදුසු නො වේ මය, වහන්ස.

වේදනා සංඥා සංස්කාර විඥාන යන සතර ගැනත් මෙසේ ම ප්‍රශ්න උත්තර කථාව විය.

**භාග්‍යවතුන් වහන්සේ:** එහෙයින් මහණෙනි, අතීතානාගත හෝ වර්තමාන වූ ආධ්‍යාත්මික හෝ බාහිර වූ, ඖදරික හෝ ශූක්ෂම වූ, හීන හෝ ප්‍රණීත වූ දුර හෝ සමීපයේ වූ යම් රූපයෙක් වේ ද, එ සියලු රූපය 'මෙය මගේ නොවේ. මෙය මම් නො වෙමි. මෙය මගේ ආත්මය නො වේ යැ' යි මෙසේ තත් වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥායෙන් දැක්කැ යුතු ය.

අතීතානාගත හෝ වර්තමාන වූ යම් වේදනාවෙක් වේ ද... අතීතානාගත හෝ වර්තමාන වූ...... යම් සංඥාවෙක් වේ ද ...... අතීතානාගත හෝ වර්තමාන වූ........ යම් සංස්කාර කෙනෙක් වෙත්ද........ අතීතානාගත හෝ වර්තමාන වූ........ යම් විඥානයෙක් වේද........ එ මේ සියලු විඥානය 'මෙය මගේ නො වේ, මම් නො වෙමි, මගේ ආත්මය නො වේ යැ' යි මෙසේ ඇති සැටි ලෙස සම්‍යක්ප්‍රඥායෙන් දැක්කැ යුතු ය.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම රූපය කෙරෙහි කලකිරේ, වේදනාව කෙරෙහි කලකිරේ, සංඥාව කෙරෙහි කලකිරේ, සංස්කාර කෙරෙහි කලකිරේ, විඥානය කෙරෙහි කලකිරේ. කලකිරෙන්නේ එහි ඇල්ම දුරු කෙරේ, ඇල්ම දුරු කිරීමෙන් සියලු කෙලෙසුන්ගෙන් මිදේ, මිදුණු කලැ මා සිත මිදුණේ යැ යි දැනීම වේ. 'මතු ඉපදීම ක්ෂීණ විය, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව වැස

නිමවන ලද්දේ ය. (රහත් බවට පැමිණියෙමි.) දුකින් මිදීමට කළමනා සියලු (ශෝඩෂ විධ) කෘත්‍යය කරන ලද්දේ ය. මේ රහත් බව පිණිස තවත් කළ යුතු කිසිත් නැතැ'යි දැන ගනී.

භාග්‍යවතුන් වහන්සේ ගේ මේ දේශනාව ඇසීමෙන් ඒ පස්වග මහණහු සියල් කෙලෙස් නසා රහත් වූහ.

**නාලක තෙරහට මෝනෙය්‍ය වත දෙසීම**

සැටවක් ද **නාලක** තෙරණුවෝ අවුත් මෝනෙය්‍ය-වත්[114] විචාළහ. එය භාග්‍යවතුන් වහන්සේ විස්තර කොට වදාළ සේක. තෙරහු එය ඉගෙන එද ම නික් ම ගියහ. පෙරළා කිසි ම කලෙක නාහ.

# එක් විසි වන පරිච්ඡේදය

**යස කුල පුත්‍රයා**

එ සමයෙහි එක් දිනෙකැ රෑ බරණැස් සිටු පුත් යස නම් තරුණ තෙම ගිහිගෙයි කලකිරී, කිසිවකුටත් නො දන්වා හුදෙකලාව සිය මාලිගයෙන් නික්ම තවුස් පැවිද්ද ලබන අදහසින් යන්නේ, එ කලැ තවුසන්ගේ වාසස්ථානයක් ලෙස ප්‍රකට ව පැවැති සෘෂිපතනයට ළඟා වි ය. මේ වේලාව රෑ එළිවෙන යාම යයි. භාග්‍යවතුන් වහන්සේ සිරිත පරිදි අලුයම්හි නැගිට නුවණින් ලොව බලන සේක්, යසකුල පුත්‍ර ගිහිගෙන් නික්ම එන්නහු දැක ඔහු හමු වීම ද බලාපොරොත්තුයෙන් සක්මන් කරමින් සිටි සේක. සක්මනෙහි යෙදී සිටි උන් වහන්සේ දුරැ එන යස කුල පුතු දැක සක්මන් මළුයෙන් බැස (පස් වග රහතුන් විසින් එ වේලායෙහි) පණවන ලද ආසනයෙහි වැඩ හුන් සේක. යස තෙම ආරාමය සමීපයට එන්නේ භාග්‍යවතුන් වහන්සේට නො දුරු තන්හි දී 'අහෝ! ගිහිගෙය උවදුරු සහිතය! අහෝ! හිරිහැර සහිතය! යන වචන කීයේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ 'යස, මේ මහණ දම නම් ඒ උවදුරුවලින් මිදුණේ ය. හිරිහැර නො මැත්තේ ය. යස මෙහි එන්න, ඉඳ ගන්න, නුඹට ධර්මයක් දේශනා කරන්නෙමි' යි වදාළ සේක. එය ඇසූ යසකුලපුත් 'මේ මහණ දම් උවදුරු නැති එකක් ලු, හිරිහැර නැති එකක් ලු'යැ යි සිතා සතුටු වැ පාවහන් ගලවා තබා, බුදුරජාණන් වහන්සේ කරා පැමිණ වැඳ එක් පැත්තකැ ඉඳ ගත්තේ ය. එසේ හුන් ඔහුට භාග්‍යවතුන් වහන්සේ 'දන් දීමේ අනුසස්, සිල් රැකීමේ අනුසස්, එයින් ලැබෙන ස්වර්ගී සම්පත්තියේ හැටි, එහෙත් ඒ සියලු කාම සම්පත්තීන් දොස් සහිත බව, ලාමක බව, කිලුටු බව, එ බැවින් කම්සැප හැර දමා මහණවීමේ වටිනාකම' යන දේශනා ක්‍රමයෙන් දහම් දෙසූ

සේකි. ඒ බණ ඇසීමෙන් කෙලෙස් බර ගතිය, කෙලෙස් රළු ගතිය අඩු වී ගොස් යස කුල පුතුගේ සිත මෘදු වූ, පහන් වූ, චතුස්සත්‍ය අවබෝධ කැර ගැනීමට සුදුසු සේ පිළියෙල වූ විගස බුදුවරුන්ගේ ම දේශනා ක්‍රමය වූ දුක්, දුක් හේතුව, නිවන, නිවනට මඟ යන සැබෑ සතර ප්‍රකාශකැර වදාළ සේක. පිරිසිදු වස්ත්‍රය යම් සේ රදන් (සායම්) ඉතා තදින් උරා ගන්නේ ද, එසේ ම ඒ ආසනයේ ඉන්දෑ දී ම චතුස්සත්‍යාවබෝධය කිරීමෙන් යස කුල පුත් සෝවාන් විය.

**තෙරුවන් සරණ ගිය පළමු උපාසකයා**

යස කුල පුතුගේ මවු ප්‍රාසාදයට නැඟ සිය පුතු නො දැක, සැමියා හට ඒ බව දැන්වූවා ය. සිටු ද පුතු සොයනු පිණිස සිවු දෙසට අසරු දූතයන් යවා තෙමේත් නික්ම යනුයේ, රන් මිරිවැඩිවල අඩි සටහන් දැක එය අනුව ගියේ, ඉසිපතනාරාමයට පැමිණියේ ය. ඈත එන ඔහු දුටු භාග්‍යවතුන් වහන්සේ සිටුහට යස කුලපුත්‍ර නො පෙනෙන්නට සැලැස් වූ සේකි.

සිටු තෙමේ ද ආරාමයට පැමිණ 'භාග්‍යවතුන් වහන්ස, දැන් ටිකකට පෙර මේ පැත්තට ආ යස කුලපුත්‍රයා දුටු සේක් දෝ'යි විතාලේ ය. 'යස කුලපුතු දක්නා කැමැත්තෙහි නම්, ගෘහපතිය, ටිකක් මෙහි හිඳින්න. තව ටිකෙකින් මෙහි ම ඉන්නා යස කුලපුතු දැක්කැ හැකි' යි බුදුරජාණන් වහන්සේ වදාළ සේක. එ විටැ ගෘහපති තෙම 'මෙහි ම ඉන්නා යස කුල පුතු දක්නෙමි' යි සිතා සතුටුව වැඳ එක් පැත්තෙකැ ඉඳ ගත්තේය. එසේ උන් ගෘහපතියාට භාග්‍යවතුන් වහන්සේ දන කථාදී පිළිවෙළින් බණ වදාළ සේක. දේශනාවසානයේදී හේ සෝවාන් වූයේ, ඒ බව දන්වා වචනයෙන් ද තෙරුවන් සරණ ගියේ ය. ලොවැ තෙරුවන් සරණ ගිය පළමු උපාසකයා යස කුල පුතුගේ පියා වූ බරණැස් සිටුය.

**යස කුල පුතු පැවිදි විම**

තම පියාට දෙසූ ධර්මය අසා යස කුලපුත් තෙම නුවණ මුහුකුරුවා සියල් කෙලෙස් නසා රහත් විය. ඉන්පසු හේ කිසිසේත් ගිහි ගෙයි නො බැඳෙන්නේය. මේ බව සැලකූ බුදුරජාණන් වහන්සේ බරණැස් සිටුහට යස කුලපුත්‍රයා පෙනෙන්නට සැලැස් වූ සේක. එ විට ගෘහපති තෙම ස්වකීය පුත්‍රයා දැක 'පුත, නුඹේ මව හඬමින් මැරෙන තරම් ශෝකයෙන් තැවි තැවි ඉඳී. මවට ජීවිතය දෙව' යි කීය. යස තෙම භාග්‍යවතුන් වහන්සේ ගේ මුහුණ බැලීය. බුදුරජාණන් වහන්සේ යස කුලපුතු රහත් වූ බවත් එහෙයින් ගිහිගෙහි නොරැඳෙන බවත් වදාළ සේක. සිටු ද යස කුල පුත්‍රයාට වූයේ මහත් ලාභයෙකැයි සතුටු වැ ඒ දින දනට යසයන් හා

සමග වඩින ලෙස බුදුරජාණන් වහන්සේට ආයාචනා කෙළේ ය. බුදුරජාණන් වහන්සේ ද තුෂ්ණීම් භාවයෙන් එය පිළිගත් සේක. සිටු ද බුදුරජාණන් වහන්සේ තමාගේ ආයාචනය පිළිගත් බව දැන, වැඳ පැදකුණු කොට ගියේ ය. සිටු ගිය පසු යස කුල පුත් තෙම බුදුරජාණන් වහන්සේගෙන් ඒහි භික්ෂු සම්පත්තිය ලැබුයේ ය.

**සුජාතාවත් ඇගේ යෙහෙළියත් උපාසිකාවන් වීම**

ඉක්බිති. භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි යස භික්ෂුව කැටුව සිටුහුගේ ගෙට වැඩි සේක. පණවා තුබුණු ආසනයේ ඉඳගත් සේක. ඒ වේලායෙහි සුජාතා (යස භික්ෂුවගේ මවු) ද පෙර ගිහි කල ඔහුගේ භාර්‍ය්‍යාව වූ තැනැත්තී ද අවුත් භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පසෙකැ උන්හ. දාන කථා ශීල කථා ස්වර්ග කථාදි පිළිවෙළ කථායෙන් භාග්‍යවතුන් වහන්සේ ඔවුනට බණ වදළ සේක. බණ ඇසීමෙන් ප්‍රසන්නවූ ඔවුනට චතුස්සත්‍ය ධර්මය ප්‍රකාශ කළ සේක. ඒ අසා දෙදෙනාම සෝවාන් වූහ. ඉක්බිති තමන් ගේ පැහැදීම දන්වා වචනයෙනුත් උහු තෙරුවන් සරණ ගියාහ.

**යස කුල පුතුගේ යහළු සිවු දෙනෙකුන් පැවිදි වීම**

ඉක්බිති ඔහු බුදුරජාණන් වහන්සේටත් යස භික්ෂුවටත් දන් පිළිගැන් වූහ. ඔවුන් වහන්සේ දන් වැළඳූ පසු. ඔහු එක් පසෙකැ ඉඳ ගත්හ. බුදුරජාණන් වහන්සේ ඔවුනට අනුමෝදන බණ වදරා විහාරයට වැඩි සේක.

යස කුල පුතු මහණ වූ පවත් ඇසූ ඔහුගේ යහළු වූ බරණැසැ උසස් කුල සතරෙකැ දරු වූ **විමල සුබාහු පූර්ණජී ගවම්පති** යන සිටුකුල පුත්තුද යස රහතුන් වහන්සේ කරා පැමිණ වැඳ පසෙක සිටියෝය. යස රහත්හු එ යහලුවන් සිවුදෙනා ගෙන බුදුරජාණන් වහන්සේ වෙත එළැඹියහ. වැඳ පසෙක හිඳ ඔවුනට අවවාදනුශාසනා කරන ලෙස භාග්‍යවතුන් වහන්සේ අයැදූහ. බුදු රජාණන් වහන්සේ ඔවුනට දාන කථා ශීල කථා දි පිළිවෙල කථායෙන් අවවාදානුශාසන කළ සේක. ඉක්බිති ඒ ඇසීමෙන් තුනී වූ කෙලෙස් ඇති ඔවුනට චතුසත්‍යය ප්‍රකාශ කළ සේක. ඔහු ඒ අසා සෝවාන් ව ඒහි භික්ෂුප සම්පත්තිය ලැබූහ. නැවතත් භාග්‍යවතුන් වහන්සේ ඔවුනට බණ වදළ සේක. එය ඇසූ ඒ භික්ෂූහු සියල් කෙලෙස් නසා රහත් වූහ.

**යස කුල පුතුගේ තවත් යහළුවන් පනස් දෙනෙක්** යස රහතුන් වහන්සේ ගේ ගිහි කාලයෙහි යහළු වූ අන් පළාත් වැසි තවත් පනස් දෙනෙක් කුල පුත්තු යස කුල පුත් මහණ වී යැයි අසා, එහි අගය සලකා ආයුෂ්මත් යසයන් වහන්සේ වෙත පැමිණියාහ. පැමිණ වැඳ එක් පසෙකැ සිටියහ. යස රහත්හු ඔවුන් පණස්දෙනා ගෙන බුදුරජුන් කරා ගියහ. ඔවුනට ද දනකථාදි පිළිවෙළ කථායෙන් සර්වඥයන් වහන්සේ බණ දෙසූ සේක. ඒ ඇසීමෙන් මෘදු මොලොක් සිත් ඇති වූ ඔවුනට ඉන් පසු චතුස්සත්‍යය ප්‍රකාශ කළ සේක. ඒ ධර්ම කථාව ඇසූ කුලපුත්තු පනස්දෙනා ම සෝවාන් වූහ. ඉක්බිති ඔහු භාග්‍යවතුන් වහන්සේ ගෙන් මහණකම ඉල්ලූවෝ ඒහිභික්ෂුපසම්පත්තිය ලැබුවෝ, එයට පසු වැ දෙසූ දහම් අසා සියල්ලෝම රහත් වූහ.

**රහතුන් හැට එක් නමක්** මෙ සේ එසමයෙහි ලොවැ බුදුරජාණන් වහන්සේත් ඇතුළු සියලු ම රහත්හු එක් සැට නමෙක් වූහු.

---

# දෙවිසි වන පරිච්ඡේදය

**ඒරකපත්ත්‍ර නාගරජ සමාගමය** **ඒරකපත්ත්‍ර** නම් නා රජෙක් 'බුදුවරයකු ලොවැ පහළ වූ විට එ පවත් මහ ජනයා මගින් දැන ගනිමි'යි සිතා, සිය දුවට ගාථාවක් උගත්වා ගංගා නදිය මත්තෙහි සිට ඇය නටවමින් ගයවයි.

'යමෙක් මැය ගයන ගීතයට සරිලන ප්‍රතිගීතයක් ගෙනේ නම් ඔහුට මැය මහත් සම්පත් හා පාවා දෙන්නෙමැ'යි ප්‍රසිඬ කැරැවී ය. හෙතෙම අඩමසක් පාසා පොහෝ දිනයන්හි ඇය ලවා ගයවමින් නටවයි. මෙසේ දීර්ඝ කාලයෙක් ගත විය.

අප බුදුරජාණන් වහන්සේ බුදුවැ සත්සති ගෙවා බරණැස් වැඩ දම්සක් දෙසා පළමු වැසි සමයෙහි ඉසිපතන්හි වසන සේක්, පසොළොස්වක් දිනෙක අලුයම්හි සිරිත් පරිදි තිවන් අවබෝධ කළ හැකි සත්ත්වයන් සොයනු පිණිස ලොව බැලූ සේක්, ඒරකපත්ත්‍ර නාගරාජාදීන් දක, බරණැසින් නොදුරු තන්හි ප්‍රසිඬ වැ පැවැති රිටිගස් සතින් එකක් මුලට වැඩහුන් සේක.

මෙදිනැ දඹදිව නොයෙක් පළාත්වලින් බොහෝ ජනයෝ ඒරකපත්ත්‍රනාගරාජයාගේ දුව ගේ ගීතයට ප්‍රතිගීත ගොතා ගෙන ගංගා නදිය අසළ රැස්වූහ. භාග්‍යවතුන් වහන්සේ එහි යන **උත්තර** නම්

මානවකයා දැක කැඳවා 'කොයි යෙහිදැ?' යි විචාළ සේක. ඒරකපත්‍රයාගේ දුව ගයන තෙනට යනබව හේ කීය. 'ඇය ගේ ගීතයට ප්‍රතිගීතයක් දන්නෙහි දැ'යි භාග්‍යවතුන් වහන්සේ අසා වදළ සේක.

'දනිමි වහන්සැ'යි මානවකයා කීය.

'එය කියව'යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක. හේ කී ය. භාග්‍යවතුන් වහන්සේ ඔහු අමතා,

'මෙය ඇය ගේ ගීතයට පිළිගීයක් නොවේ. මම තුඹට පිළිගීයක් දෙන්නෙමි. එය ගෙන යවැ 'යි වදළ සේක. හේ 'මැනැවැ'යි පිළිගත. භාග්‍යවතුන් වහන්සේද ඔහුට ගීයක් උගන්නා 'උත්තරය, මෙය යුෂ්මතා ගැයූවිට ඕ මෙ නම් ගීයක් ගයන්නී ය. එයට ප්‍රතිගීත විසින් මෙය ගයව'යි තවත් ගීයක් උගන්වාලූ සේක.[115]

උත්තර මානවකයා මේ ධර්මනිඃශ්‍රිත ප්‍රතිගීත ඉගෙන ගත්තේ ම එහි අරුත් මෙනෙහි කොට සෝවාන් වීය.

මෙසේ උත්තර තෙම ප්‍රතිගීත ඉගෙන යට කී ගංගා තට ප්‍රදේශයට පැමිණ, රැස් වැ සිටි මහජනයා මැදින් ගොස් තමා පිළිගීයක් ගෙනා බව කී ය.

එවිට නාග මානවිකා තොම,

'කුමකට අධිපති පුද්ගල තෙම රජ නම් වේ ද? කෙසේ වනාහි රජ තෙම රජස්වර නම්වේ ද? කෙසේ නම් එ රජ තෙම විරජ වේ ද? එ රජ කෙසේ නම් බාලයෙකැ යි කියනු ලැබේ ද?' යන අර්ථ ඇති ගීතයක් ගැයූ ය.

එවිටැ උත්තර මානවක තෙම භාග්‍යවතුන් වහන්සේ උගන්වාලූ පරිදි,

'චක්ෂුරාදි සදෙරට අධිපති ව ඒ එක් දෙරෙකත් රූපාදි අරමුණුවලැ නො මැඩුණු පුද්ගල තෙම රජ නම් වෙයි. යමෙක් වූ කලී එ රූපාදි අරමුණුවලැ රජ්ජමාන ද (-ඇලෙන්නේ ද) හෙ තෙම රජස්සර නම් වේ. ඒ අරමුණුවලැ නො ඇලෙන පුද්ගල තෙම විරජ නම් වේ. ඇලෙන තැනැත්තේ වනාහි 'බාලයා'යි කියනු ලැබේ.' යන මේ අදහස් ඇති ප්‍රතිගීතය ගැයූයේ ය.

එවිට නාග මානවිකාව -

'බාල (අඥ) තෙම කිමෙකින් පහළට ඇද ගෙන යනු ලැබේ ද? එය පණ්ඩිත තෙම කෙසේ දුරු කෙරේ ද? කෙසේ නම් යෝගක්ෂෙමී (බන්ධනයෙන් මිදී නිරුපද්‍රැත) වේ ද? එය මට කියා දුන මැනැවි.

යන අර්ථ ඇති ගීතයක් ගැයූවා ය.

එයට ප්‍රතිගීත වශයෙන් උත්තර තෙම තමාට භාග්‍යවතුන් වහන්සේ උගන්වා ය.

'කාමෝඝාදි සතර ඕඝයෙන් බාල තෙම ඇදී යෙයි. පණ්ඩිත තෙම සම්‍යක්ප්‍රධාන වීර්‍ය්‍ය නැමැති යෝගයෙන් ඒ සතර ඕඝයන් දුරු කෙරේ. කාමාදි සියලු යෝග (යොත්) වලින් මිදුණු පුද්ගල තෙමේ යෝගක්ෂෙමී නම් වේ' යන අදහස ඇති පිළිගීය ගැයී ය.

ඒරකපත්‍ර තෙම එය අසා 'මේ නම් බුදුවරයක්හු ගේ විසර්ජනයෙකැ'යි සිතා අතිප්‍රීත ව **උත්තර** මානවකයා වෙත අවුත් ඔබට මෙය ඉගැන්වූ 'ශාස්තෘන් වහන්සේ කොහි දැ?'යි ඇසී ය. 'අර රුක්මුලැ ඉන්නා සේකැ'යි හේ කීය. ඉක්බිති නාරජ ඔහු හා භාග්‍යවතුන් වහන්සේ වෙත ගියේ ය. සෙසු සියල්ලෝ ද නා රජහු හා ම ගියහ.

භාග්‍යවතුන් වහන්සේ ඒරකපත්‍රයා ආදි කොටැති ඒ පිරිසට දම් දෙසන සේක්,

'මනුෂ්‍යත්වය දුර්ලභ ය. සත්වයන් ගේ දිවි පැවැත්වීම දුකසේ කටයුතු ය. සද්ධර්ම ශ්‍රවණය දුර්ලභ ය. බුදුවරුන්ගේ පහළ වීම දුර්ලභ යැ'යි විස්තරයෙන් දහම් වදළ සේක. දේශනාවසානයෙහි සුවාසූ දහසක් ප්‍රාණීන්හට ධර්මාභිසමය වී ය.

# තුන් විසි වන පරිච්ඡෙදය

**පළමු ධම් දූත පිරිස භික්ෂූන් හැට නමක්**

වැසි කාලය ගත විය. තවත් මාසයක් (ඉල් මස පසොළොස්වක් ද වන තුරුත්) භාග්‍යවතුන් වහන්සේ බරණැස ම වුසූ සේක. එසේ වසන උන් වහන්සේ එක් දවසක් රහත් සැට නම බණවා,

'මහණෙනි, මම් සියලු දිව්‍ය වූ ද මනුෂ්‍ය වූ ද පාශයෙන් මිදුණෙමි. තෙපි ද එසේ ම එයින් මිදුණහු ය. මහණෙනි, බොහෝ දෙනා ගේ දියුණුව පිණිස, බොහෝ දෙනාගේ යහපත පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙව් මිනිසුන්ගේ දියුණුව පිණිස, යහපත පිණිස, සැප පිණිස, ගම් නියම් ගම්හි හැසිරෙවු, තෙපි දෙදෙනෙක් එක් මගින් නො යවු. මුල යහපත් වූ, මැද යහපත් වූ, කෙළවර යහපත් වූ[116] අර්ථ සහිත ව්‍යඤ්ජන සහිත සියලු ආකාරයෙන් පරිපූර්ණ පිරිසිදු ධර්මය දේශනා කරවු, (සර්වප්‍රකාරයෙන් සම්පූර්ණ වූ ද පිරිසිදු වූ ද) බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කරවු, මඳ වූ කෙලෙස් ඇති සත්ත්වයෝ ඇත්හ. ධර්මය අසන්නට

නො ලැබුණොත් ඔවුනට උසස් ගුණ නො ලැබීයෙයි. ධර්මය අසා අවබෝධ කරන්නෝ ඇති වෙති. එ බැවින් දම් දෙසීමට පිටත් වැ යවු. මහණෙනි, මමත් උරුවෙල් දනව්වට ධර්මදේශනා පිණිස යන්නෙමි'යි වදාළ සේක.

මෙසේ වදරා ඒ රහත් ධර්ම දූතයන් හැට නම හැට දෙසක යවා තමන් වහන්සේත් උරුවෙල් දනවු බලා නික්මුණු සේක.

**භද්‍රවර්ගික කුමරුන් පැවිදි වීම** බරණැස පටන් උරුවෙලාව තෙක් පිහිටි මහා මාර්ගයෙන් වඩනා බුදුරජාණන් වහන්සේ මහ වනය පැත්තෙක පිහිටි කැප්පෙටියා ලැහැබක් දැක මගින් ඉවත් ව එහි වැඩ රුකක් මුලැ හුන් සේක.

මේ වේලෙහි තිසක් භද්‍රවර්ගීය කුමරුවෝ[117] සිය බිරියන් හා ඇවිදින්නට යන්නෝ, ඉන් බිරියක නැති කුමරුට වේශ්‍යා ස්ත්‍රියක ද ගෙන්වා ගෙන, එ වන ලැහැබෙහි ප්‍රීතියෙන් ඇවිද්දෝ ය. එහි දී වේශ්‍යා ස්ත්‍රී කුමරුන්ගේ පමාවක් දැක ඔවුන්ගේ බඩුත් ගෙන පලා ගියා ය. කුමරුවෝ ඇය සොයමින් ඇවිදුනෝ රුකක්මුලැ හුන් භාග්‍යවතුන් වහන්සේ දැක එහි පැමිණ, 'වහන්ස, භගවත්හු මේ පැත්තෙන් යන ස්ත්‍රියක දුටුහු දැ?'යි ඇසූහ.

'ළමයිනි, තොපට ස්ත්‍රියක සෙවීමෙන් ඇති කම කිම් දැ?'යි භාග්‍යවතුන් වහන්සේ ඇසූ සේක.

'වහන්ස, භාර්යාවන් හා අපි මෙහි සෙල්ලම් පිණිස ඇවිදින්නමෝ අපේ එක් කුමරකුට භාර්යාවක නැති බැවින් වේශ්‍යා ස්ත්‍රියක ගෙන්වා ගතුමු. ඕ අපේ ප්‍රමාදයක් දැක බඩුත් රැගෙන පලා ගියා ය. යහළු කුමරුට උදවු වශයෙන් ඇය සොයමින් මෙසේ ඇවිදිමු'යි කීහ.

'ළමයිනි, තමන් සොයා ගැන්ම වඩා උතුම් ද? නැත හොත් (අන්‍ය) ස්ත්‍රියක සෙවීම වඩා උතුම් ද? තෙපි මෙය කෙසේ සිතවු ද?' යි බුදුරජාණන් වහන්සේ ඇසූ සේක.

'ස්වාමීනි, අපි අපම සොයමෝ නම්, ඒ සෙවීම් උතුම් යැ' යි ඔහු උත්තර දුන්හ.

'එහෙනම් ළමයිනි, ඉඳ ගනිවු. යුෂ්මත්නට තමන් සොයා ගන්නා සැටි කියන්නෙමි' යි බුදුරජාණන් වහන්සේ වදාළ සේක.

ඔහු ද 'එසෙයි, ස්වාමීනි' යි කියා භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කොට පැත්තෙකැ ඉඳ ගත්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දාන කථා ශීල කථාදි පිළිවෙල කථායෙන් අවවාද අනුශාසනා කළ සේක. එය ඇසීමෙන් ප්‍රසන්න වූ මෘදු මොළොක් වූ සිතැති ඔවුනට චතුස්සත්‍යය ප්‍රකාශ කළ සේක. එය ඇසීමෙන් ඔවුනට දහම් ඇස පහළ වී ය. (හෙවත් සමහරු සෝවාන් වූහු, සමහරු සකෘදගාමී වූහු. අන්හු අනාගාමී වූහ.) මෙසේ ආර්‍ය්‍ය භූමියට පැමිණි එ කුමරුවෝ බුදුරජාණන් වහන්සේ වෙතින් පැවිද්ද ඉල්ලූහ. බුදුරජාණන් වහන්සේ ද ඒහිභික්ඛුපසම්පත්තියෙන් ඔවුන් පැවිදි උපසපන් කළ සේක. ඔවුන් ගේ භාර්‍ය්‍යාවෝ ආපසු සිය මාලිගාවනට ගියහ.

**දෙවෙනි ධර්‍මදූත පිරිස තිස්දෙනෙක්**

භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන් තිස් නම ද ධර්‍මදූත මෙහෙයෙහි යෙදීම පිණිස දිසාවන්හි යවා තමන් වහන්සේ හුදෙකලා වැ **උරුවිල්වා** ජනපදය බලා ගමන්ගත් සේක.

**ජටාධර සහෝදර තවුස්න තිදෙන**

ඒ කාලයෙහි උරුවෙල් දනව්වෙහි **උරුවිල්වාකාශ්‍යප, නදී කාශ්‍යප, ගයා කාශ්‍යප** යැ යි සහෝදර තවුසෝ තිදෙනෙක් නේරංජරා ගඟ අද්දර තාපසාරාම කොට ගෙන වසති. ඉන් උරුවිල්වාකාශ්‍යප නම් වැඩිමහලු තවුසාගේ පිරිස පන්සියයක් පමණ ය. මධ්‍යම සහෝදර නදීකාශ්‍යප තෙමෙ තවුසන් තුන් සියයකට නායක ය. බාල සොහොයුරු ගයා කාශ්‍යප තෙමේ ජටිලයන් දෙ සියයක ප්‍රධාන තැනැත්තේ ය.

**පළමු පෙළහර**

භාග්‍යවතුන් වහන්සේ උරුවෙල් දනවු වැඩ උරුවිල්වා කාශ්‍යපයා ගේ ආශ්‍රමය වෙත එළැඹි සේක. උරුවිල්වා කාශ්‍යපයාට කථා කොට 'කාශ්‍යපය, මගේ ඉඳීම නුඹට බරෙක් (කරදරයෙක්) නො වේ නම් එක් රැයක් ගිනිහල් ගෙයි වසන්නෙමි?' යි වදළ සේක.

'මහා ශ්‍රමණය, එහි ඉඳීම මට නම් බරෙක් නො වේ. එහෙත් එහි ඉතා රෞද්‍ර නාගයෙක් ඉඳී. ඌ ඔබට වෙහෙසක් වත් කෙරේ දෝ!' යි උරුවෙල්කසුප් කී ය.

'මට උගෙන් පීඩා ඇති නො වේ. එ බැවින් ගිනිහල් ගෙයි ඉඳීමට අවසර දුන මැනැවැ' යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

'මහා ශ්‍රමණයාණනි, එසේ හැකි නම් සුව සේ එහි වුසුව මැනැවැ' යි කියා ජටිල අනුදත්තේ ය.

ඉක්බිති බුදුරජාණන් වහන්සේ ගිනිහල් ගෙට වැඩ තණ ඇතිරියක් පණවා ගෙන එහි හුන් සේක. එහි වැඩි බුදුරජාණන් වහන්සේ දුටු නා රජ කුපිත ව දුමා ගියේ ය.

'මොහු ගේ සිවි මස් නහර ඇට ඇටමිදුලු යන මේ කිසිවකට පීඩා නො වන සේ, මගේ සෘඩි තේජසින් මොහු ගේ තෙද මැඩ පවත්වන්නෙමි'යි සිතා බුදුරජාණන් වහන්සේ ද සෘඩි බලයෙන් දුම් විහිදුවූ සේක. ක්‍රෝධය නො ඉවැසිය හැකි වූ නාග තෙම ගින්නෙන් දිලිහුණේ ය. බුදුරජාණන් වහන්සේත් (සෘඩි බලයෙන්) ගින්නෙන් දිලිහුණු සේක. එයින් මුළු ගිනිහල් ගෙය ගිනි දැල් සහිත වූයේ, ගිනි ඇවිලැ ගත්තාක් මෙන් පෙනුණේ ය.

එය දුටු තවුසෝ රී වටා රැස්වී 'අහෝ! ශෝභාවත් මහා ශ්‍රමණයා නාගයා විසින් පෙළෙනු ලැබේ!'යි කීහ.

රැ පාන් වූ පසු බුදුරජාණන් වහන්සේ ඔද බිඳුණු නාගයා පාත්‍රයෙහි බහා ගෙන ගොස් 'කාශ්‍යපය, මෙන්න ඔබේ නාගයා! ඔහු ගේ තේජස මගේ තේජසින් මැඩ පැවැත්වීමි 'යි කියා උරුවිල්වාකාශ්‍යපයාට ඌ පෙන්වූ සේක. මෙය දුටු හේ 'එ තරම් චණ්ඩ පරුෂ සෘඩිමත් නයකු දැමූ මහා ශ්‍රමණයා මහත් සෘඩි ඇති මහානුභාව ඇති කෙනෙක් ම ය. එහෙත් මා සේ රහතෙක් නම් නො වේ' යැ යි සිතුයේ ය.

ඒ පෙළහර දැක්මෙන් සතුටු වූ උරුවිල්වාකාශ්‍යප ජටිල තෙම භාග්‍යවතුන් වහන්සේ කෙරේ ඉතා පැහැදී 'මහා ශ්‍රමණයාණෙනි, මෙහි ම වුසු වැ මැනැවි. හැමදම මම බතින් සංග්‍රහ කරන්නෙමි'යි කීය.

**උරුවිල්වා කාශ්‍යපයා මහණ වීම**

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උරුවිල්වා කාශ්‍යපයාගේ අසපුව සමීපයේ එක් ලැහැබෙක වුසු සේක්, තවත් බොහෝ පෙළහරවල්[118] දක්වා අන්තිමේ දී කාශ්‍යපයා තුළැ පැවැති 'තමා රහතෙක' යන මතය ද වැරැදි බව පෙන්වා වදළ සේක. එය පිළිගත් උරුවෙල් කසුප් තවුසා ප්‍රධාන කොට ඇති සියලු ජටිලයෝ භාග්‍යවතුන් වහන්සේ වෙතින් පැවිද්ද ඉල්ලූහ. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් ඒහි භික්ෂුපසම්පත්තියෙන් පැවිදි උපසපන් කළ සේක.

**නදී කාශ්‍යපයා පැවිදි වීම**

උරුවිල්වාකාශ්‍යපයා ප්‍රධාන කොටැති ජටිල පිරිස ශාසනයේ මහණ වීමේදී ජටා මඩුලු ආදි තවුස් පිරිකර ගඟේ පා කැරැ යැවූහ. නෙරංජරා නදිය අද්දර වුසු නදී කාශ්‍යප තවුසා ගඟේ පාවී යන තවුස් පිරිකර දැක, ගඟ ඉහළ වුසු

සිය සොහොයුරාට අනතුරෙක්වත් වූයේ දෝ යි සොයා බලනු පිණිස ජටිලයන් ඒ අතට යවා තෙමේත් එහි ගියේ ය. එසේ ගිය හෙ තෙම ශාසනයෙහි පැවිදි වැ සිටි සිය සොහොයුරා දැකැ 'මේ පැවිද්ද වඩා හොඳ දැ?'යි ඇසුයේ ය. 'එසේ ය. ඇවැත්නි, තාපස ප්‍රව්‍රජ්‍යාවට වඩා මේ උතුමැ'යි උරුවිල්වාකාශ්‍යපයන් වහන්සේ පිළිතුරු දුන් සේක. එවිට නදී කාශ්‍යපයා ප්‍රධාන කොටැති පිරිස ද ජටා මඩුලු ආදිය ගඟේ පා කැරැ යවා භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ ප්‍රව්‍රජ්‍යාව අයැදූහ. භාග්‍යවතුන් වහන්සේ ඒහිභික්ෂුපසම්පත්තියෙන් ඔවුන් ද පැවිදි උපසපත් කළ සේක.

**ගයා කාශ්‍යපයා මහණ වීම**

නදී කාශ්‍යපයා සිටි අසපුවටත් පහළැ ඒ නදිය අද්දර අසපුවෙකැ වුසූ ගයා කාශ්‍යපයා ද පාවෙන තවුස් පිරිකර දැක සිය සොහොයුරනට අනතුරක් වත් වීදෝ යි සොයනු පිණිස පිරිස හා ගඟ ඉහළ දෙසට ආයේ උරුවිල්වා කාශ්‍යපයන් වහන්සේ දැක 'කාශ්‍යපයන් වහන්ස, තාපස ප්‍රව්‍රජ්‍යාවට වඩා මේ උතුම් දැ?'යි ඇසුයේ ය. උරුවිල්වාකාශ්‍යපයන් වහන්සේ 'එසේ යැ'යි උත්තර දුන්හ. එවිට ගයා කාශ්‍යපයා ද සිය පිරිස කැටුව බුදුරජාණන් වහන්සේ වෙත ගොස් පැවිද්ද ඉල්වූයේ ඒහිභික්ෂුපසම්පත්තිය ලැබුයේ ය.

**භාග්‍යවතුන් වහන්සේ පුරාණ ජටිල භික්ෂූන් ගයාශීර්ෂයට ගෙන යෑම.**

භාග්‍යවතුන් වහන්සේ උරුවෙල් දනව්වෙහි ටික දවසක් වැස පෙර ජටිල වැ සිටි ඒ දහසක් භික්ෂූන් කැටුව **ගයා ශීර්ෂයට**[119] වැඩ එය මත්තෙහි ශිලාතලයෙහි හිඳ ඔවුන් අමතා මෙසේ වදළ සේක.

**අදිත්ත පරියාය සුත්ත දෙසනාව**

'මහණෙනි, සියල්ල ගින්නෙන් ඇවිලැ ගත්තේය. මහණෙනි, කවර සියල්ලෙක් ගින්නෙන් ඇවිලැ ගත්තේ ද? යත්: මහණෙනි, ඇස ගින්නෙන් ඇවිලැ ගත්තේ ය. රූප ගින්නෙන් ඇවිලැ ගත්තේ ය. චක්ෂුර් විඥානය ගින්නෙන් ඇවිලැ ගත්තේ ය. චක්ෂුඃස්පර්ශය ගින්නෙන් ඇවිලැ ගත්තේ ය. චක්ෂුඃස්පර්ශයෙන් පහළ වන සුඛ දුඃඛ උපේක්ෂා යන තුන් වේදනා ගින්නෙන් ඇවිලැ ගත්තේ ය.

ඒ කවර ගින්නෙකින් ද? යත් : රාග ගින්නෙන්, ද්වේෂ ගින්නෙන් මෝහ ගින්නෙන් ය. ජාති ජරා මරණ ශෝක දුඃඛ දෞර්මනස්‍ය උපායාස නැමැති දුක් ගිනිවලින් යැ යි කියමි.

කණ... ශබ්ද...ශ්‍රෝත්‍ර විඥානය... ඝ්‍රාණය... ගන්ධ... ඝ්‍රාණ විඥානය.... දිව ...රස... ජිහ්වා විඥානය.... කය ... ස්ප්‍රෂ්ටව්‍ය ....කාය විඥාන.... මනස....ධර්‍ම... මනෝ විඥානය.... මනඃ සංස්පර්ශ ප්‍රත්‍යයෙන් පහළ වන සුඛ දුඃඛ උපේක්ෂා යන තුන් වේදනා ද ගින්නෙන් ඇවිල ගත්තේය.

කවර ගින්නෙකින් ද? යත්: රාගාග්නි, ද්වේෂාග්නි, මෝහාග්නි යන කෙලෙස් ගිනිවලින් ඇවිල ගත්තේ ය. ජාති ජරා මරණ ශෝක පරිදේව දුඃඛ දෞර්‍මනස්‍ය උපායාස සංඛ්‍යාත දුක් ගිනිවලින් ඇවිල ගත්තේ යැ යි මම කියමි.

මහණෙනි, මෙ සේ නැණසින් දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම ඇස කෙරෙහි කලකිරේ. රූප කෙරෙහි ද කලකිරේ. චක්ෂූර් විඥානය කෙරෙහි ද කලකිරේ. චක්ෂුඃස්පර්ශයෙහිද කලකිරේ. චක්ෂුඃස්පර්ශ ප්‍රත්‍යයෙන් පහළ වන සැප දුක් උපේක්ෂා යන තුන් වේදනා කෙරෙහි ද කලකිරේ. ශ්‍රෝත්‍රය කෙරෙහි ද කලකිරේ. ශබ්ද... ශ්‍රෝත්‍ර විඥානය... ඝ්‍රාණය..... ගන්ධ...... ජිහ්වා... රස...... කාය..... ස්ප්‍රෂ්ටව්‍ය... මනස... ධර්‍මාලම්බන.... මනඃසංස්පර්ශ.... මනඃස්පර්ශයෙන් පහළ වන සැප දුක් උපේක්ෂා යන ත්‍රිවිධ වේදනා කෙරෙහි ද කලකිරේ. කලකිරෙන්නේ නො ඇලේ. මේ රහත් බව පිණිස වෙන කළ යුත්තෙක් නැත්තේ යැ යි දැන ගනී.

මේ ධර්‍ම දේශනාව අසා ඒ දහසක් භික්ෂූහු රහත් වූහ.

## සූවිසි වන පරිච්ඡේදය

**භාග්‍යවතුන් වහන්සේ ලක්දිව වැඩීම දුරුතු මැදි පෝද**

දුරුතු මස මැදි පෝය පැමිණියේ ය. මහා කරුණා ඥානයෙන් ලොව බලා වදරන භාග්‍යවතුන්වහන්සේ ලක්වැසියනට තමන් වහන්සේගෙන් විය හැකි ශාන්තිය දුටු සේක්, එදින අහසින් ලක්දිවට වැඩි සේක. එහි දී දැනට මහියංගන චෛත්‍ය පිහිටි තන්හි සම්කඩ අතුටැ වැඩ හිඳ, මහවැලිගඟ අසල මහානාග වනයෙහි කඳවුරු බැඳ දෙපක්ෂයක් වැ සංග්‍රාමයට සැරසුණු යකුන් ස්වීය ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍යයෙන් බිය ගන්වා පලවා, ඉක්බිති එහි නානා දිගින් රැස් වූ මහා සුමන දෙව් රජහු ප්‍රමුඛ ලක් වැසි භෞම දේවතා සමූහයාට දම් දෙසා[120] ඔවුන් සරණ සිල්හි පිහිටු වූ සේක. එදා ම සෝවාන් වූ මහසමන් දෙවිහු පූජ්‍ය වස්තුවක් ඉල්වූයෙන් ඔහුට ඉස පිරි මැද කේසධාතු මිටක් දී එදින ම උරුවෙල් දනව්වට පෙරළා වැඩි සේක.

**රජ ගහ පුර තල්වනයට වැඩීම**

භාග්‍යවතුන් වහන්සේ ඒ දුරුතු මැදි පෝද ම පුරාණ ජටිල භික්ෂූන් කැටුව උරුවෙල් දනව්වෙන් නික්මුණු සේක. එසේ වඩනා බුදුරජාණන් වහන්සේ රජගහ පුරයට තුන් ගව්වකට ඈත් හි වූ තල් වනයට[121] පැමිණ, එහි නුග රුක්මුලැ වුසූ සේක. උන්වහන්සේ එහි වසන බවත් උන්වහන්සේ ගැන රටේ පැවැති ගුණ ඝෝෂයත් ඇසූ බිම්සර රජ 120000 ක් පමණ වූ ජන සමූහයක් කැටුව ඔබ දක්නට ආයේ ය. අවුත් දැක ආදරයෙන් වැඳ පසෙක ඉඳ ගත්තේ ය.

රජු හා ගිය පිරිසේ සමහරු භාග්‍යවතුන් වහන්සේ හා පිළිසඳර බස් කථා කොට ද, තවත් කෙනෙක් උන්වහන්සේ දෙසට ඇඳිලි බැඳ හිස නමා ආචාර කොට ද, ඇතැම් කෙනෙක් උන්වහන්සේගේ සමීපයෙහි තමන් නම් ගොත් අස්වා ද, අන් සමහරු මේ කිසිත් නො කොට නිශ්ශබ්දව ද හිඳ ගත් හ. එසේ හුන් පිරිසට 'කිමෙක් ද? ශ්‍රමණ ගෞතමයෝ උරුවිල්වාකාශ්‍යපයන්ගේ ශිෂ්‍ය වැ මහණ දම් කරත් ද? නැතහොත් උරුවිල්වාකාශ්‍යපයෝ ශ්‍රමණ ගෞතමයන් ගේ ශිෂ්‍ය වැ මහණ දම් පුරත් දැ'යි සැකයෙක් විය. එය දුටු බුදුරජාණන් වහන්සේ 'කුමක් හෙයින් ගිනි පිදීම අත් හරින ලද දැ?'යි උරුවිල්වාකාශ්‍යපයන් ගෙන් විචාළ සේකි. එ විට බුධ වචන අසා ගිනි පිදීමේ නිෂ්ඵලතාව තේරුම් ගෙන එය හළ බවත්, තමන් බුඩශ්‍රාවක බවත් කාශ්‍යප තෙරණුවෝ පැවැසූහ. පැමිණ සිටි පිරිස ගේ සැක එයින් ම දුරු විය. මෙහි දී **වච්ඡපාල** බ්‍රාහ්මණ ආදී හූ පැහැදී තෙරුවන් සරණ ගියෝ ය.

ඉක්බිති උරුවිල්වාකාශ්‍යපයන් දමනය කිරීම ගැන පිරිස ස්තුති කළ විට ඒ අසා භාග්‍යවතුන් වහන්සේ ඉන් පෙරත් තමන් විසින් ඔහු දමිත කළ බව වදරා **මහානාරද කාශ්‍යප ජාතකය**[122] දෙසූ සේක.

**බිම්සර රජ හා පිරිස උපාසක වීම**

ඉන් පසු බුදුරජාණන් වහන්සේ ඒ රජ ප්‍රමුඛ පිරිසට දනකථාදි පිළිවෙළින් දම් දෙසූ සේක. එයින් ඔවුන්ගේ සිත් පහන් වූ කල්හි චතුස්සත්‍යය ප්‍රකාශ කළ සේක. ඒ ඇසීමෙන් රජු සහිත 110000 ක් පමණ පිරිස සෝවාන් වූහ. 10000 ක් පමණ උපාසක වූහ. මෙහි දී සිය මිතුරු වූ බිම්සර රජු දැකීමට අවුත් සිටි.[123] **මහාලි** නම් ලිච්ඡවී රජ ද සෝවාන් විය. රාජගෘහ පුර වැසි **සිරිවඩ්ඪ** බමුණු, **සමිද්ධි** සිටු පුත්, **වච්ඡ බ්‍රාහ්මණ** ආදිහු ද පැහැදුණුවුන් ගෙන් කීප දෙනෙකි. පසු කලෙකැ මොහු පැවිදි වූහ. මේ පිරිසැ සිටි **විශාඛ සිටු** සෝවාන් විය.

**බිම්සර රජු ගේ ප්‍රාර්ථනා පස**

ඉක්බිති බිම්සර රජතෙම 'තමා රජ වීමත්, ඉන් පසු තමාගේ රටට බුදුරජාණන් වහන්සේ ගේ පැමිණීමත්, උන්වහන්සේ ඇසුරුකිරීමත්, බණ ඇසීමත්, ධර්මාවබෝධය කිරීමත් යන බලාපොරොත්තු පසක් තමාට තුබුණු බවත් දැන් ඒ මුදුන් පැමිණි බවත් කියා තමා තිසරණ ගත උපාසකයකු බව වචනයෙන් ද දන්වා පසු ද දනයට වඩින ලෙස අයැද වැඳ පැදකුණු කොට නික්ම ගියේ ය.

**රජ ගෙදර දනය සහ වේළුවන පූජාව**

පසුදා දන් පිළියෙල කොට කාලය දන්වා එවූයෙන් භික්ෂු සංඝයා සහිත බුදුරජාණන් වහන්සේ තල් වනයෙන් පිටත් වූ සේක. භාග්‍යවතුන් වහන්සේ දැකීමේ රිසියෙන් අලුයම වේලේ සිට රැස්වන ජනයාගෙන් රජගහ පුරය ඇලලී ගියෙන් තල්වනයේ සිට තුන් ගව්වක් පමණ දුර රජගහ පුර මාවත අතුරු සිදුරු නැතිවිය. මේ වේලායෙහි එක් පුදුම එළවන සුලු රූපාලංකාරයෙන් යුත් තරුණයෙක්[124] බුදුගුණ ගී[125] කිය කියා භාග්‍යවතුන් වහන්සේට පෙරටුව මඟ අවසර ඇතිකරමින් ගියේ ය. 'තමා කාගේ කවුරුදැ' යි විචාරන ජනයාට 'මම ධීර වූ, හැම තන්හි දන්ත, ශුද්ධ, අප්‍රතිපුද්ගල, අර්හත් සුගතයන් වහන්සේ ගේ අතැවැස්සෙකිමි' යි හෙතෙම කියයි.

(මේ රාජගෘහ නගර ප්‍රවේශයේදී ද භාග්‍යවතුන් වහන්සේ දැක බොහෝ ජනයෝ පැහැදී ගියහ. **චිත්‍රා** සිටු දූ, බිම්සර රජු පුරෝහිතයාගේ දූ **සෝමා**, කෙළෙඹි දූ **ශුක්ලා, ශුභා** බ්‍රාහ්මණ කන්‍යා ආදී බොහෝ ස්ත්‍රීහු ද භාග්‍යවතුන් වහන්සේ ගේ දර්ශන මාත්‍රයෙන් පැහැද උපාසිකා වූහු. (පසු කාලයේ දී පැවිදි වූහ.)

බුදුරජාණන්වහන්සේ මහා සේනාව මැදින් යථොක්ත තරුණයා විසින් අවකාශ ඇති කොටදුන් මාර්ගයෙන් මාළිගාවට වැඩ එහි පණවන ලද ආසනයන්හි භික්ෂු සංඝයා සහිත ව හුන් සේක. රජ තෙමේ ප්‍රණීත ආහාර පානයෙන් සංග්‍රහ කෙළේ ය. දන් වළඳා අවසන් වූ පසු රජ පැත්තෙක හිඳ,

'ස්වාමීනි, බුදුන් දහම් සංඝයා ගෙන් තොර ව, ඉඳීම මට කළනො හැකි යි. එ බැවින් වේලායෙහිත් අවේලායෙහිත් එන්නෙමි. තල් වනය නම් රජ ගෙයින් ඉතා ඈත් ය. අපේ **වෙළුවන** නම් උයන මෙයින් වැඩි ඈත් නො වේ. වඩා ම කිට්ටුත් නො වේ,

යෑම ඊම ද පහසු ය, අධික ජනගහනයෙන් ඇති විය හැකි පීඩාත් කිසිත් නැත. විවේක පහසු ඇත්තේය, රුක් සෙවණිනුත් ජලාශයවලිනුත් යුක්ත ය, ගල්තලායෙනුත් සිත් කළු ය, රම්‍ය භූමිභාග ඇත්තේ ය, ගුරුළු පියාපත් වැනි සෙවණ ඇති ගෙවලින්, සඳලු සහිත ගෙවලින්, ප්‍රසාද මණ්ඩප ආදියෙන් ප්‍රතිමණ්ඩිත ය, ඒ උයන භාග්‍යවතුන් වහන්සේ පිළිගන්නා සේක් වා'යි කීයේ ය.

මෙසේ කියා රන් කෙංඩියෙන් බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රී හස්තයෙහි දිය වත් කොට ආරාමය පරිත්‍යාග කෙළේ ය. බුදුරජාණන් වහන්සේ විහාර දීමේ අනුසස් වදරා භික්ෂු සංඝයා සහිත ව වේළුවනයට වැඩි සේක. ඉන් පසු මේ කාරණය මුල් කොට ගෙන 'මහණෙනි, ආරාම පිළිගැනීමට අවසර දෙමැ'[126] යි වදළ සේක.

**ප්‍රෙතයනට පින් පෙත් දීමක්. තිරොකුඩ්ඩ සුත්ත දේශනාව**

වේළුවනය පූජා කළ ද රෑ මැදුම් යම්හි තමන් ඉදිරියේ සිට මහ හඬින් හඬා වැලපෙන ප්‍රෙත සමූහයක් බිම්සර රජ්ජුරුවෝ දුටු හ. ඔහු පසු ද උදසන ම ගොස් එ පවත් භාග්‍යවතුන් වහන්සේ ට සැළ කළහ.

ඔවුන් එ රජුගේ බොහෝ පෙර අත්බැවෙක නෑ සමූහයක් බවත්, සංඝයාට වෙන් කළ දන් හොරා කෑ පවින් නිරයේ ඉපැද දුක් විඳ ඉන් සැව ප්‍රෙතයෝනියේ ඉපැද තුන් බුඬාන්තරයක් කල් සා පවස් දෙකින් පෙළී ඒ තාක් ම දුක් විඳින බවත් පවසා 'ඔවුනට පින් පෙත් දෙව'යි සාමි දරුවන් වහන්සේ වදළ සේක.

බිම්සර රජ්ජුරුවෝ එ දුරුතු අවදියවක් ද ප්‍රෙතයන් නමින් බුඬ ප්‍රමුඛ මහා සංඝයාට මහ දන් දුන්හ. ප්‍රෙතයෝ දිව්‍ය භෝජන ලැබුවෝ ප්‍රීතිමත් ව එද රෑ වස්ත්‍ර නැති ව රජ්ජුරුවනට පෙනී සිටියහ. රජ්ජුරුවෝ එ පවත් ද පසු දා, භාග්‍යවතුන් වහන්සේ ට දන්වා බුඬ ප්‍රමුඛ සංඝයාට වස්ත්‍ර ශයනාසන සහිත භික්ෂාව දී, ප්‍රෙතයනට පින් දුන්හ. උහු ද එ අනුමෝදන් කොට ගත්තෝ සියලු දිව යස ඉසුරු ලදහ.

භෝජනාවසානයෙහි භාග්‍යවතුන් වහන්සේ රජහට අනුමෝදනා බණ වශයෙන් තිරෝකුඩ්ඩ සුත්ත[127] දේශනාව වදළ සේක.

---

# පස් විසි වන පරිච්ඡේදය

**භාග්‍යවතුන් වහන්සේ වෙත සැරියුත් මුගලන් දෙදෙනා පැමිණීම හා පැවිදිවීම නවම් මස පුර පැලවිය ද**

එ සමයෙහි **සංජය** නම් පරිව්‍රාජකයෙක් දෙසිය පනහක් පමණ වූ පිරිවැජි පිරිසකට නායකවැ රජගහ නුවර සමීපයෙහි පරිව්‍රාජකාරාමයෙකැ වෙසෙයි. රජගහනුවරට නො දුරු **උපතිස්ස කෝලිත** නම් ගම් දෙකේ අධිපති බමුණන්ගේ පුත් වූ හෙයින් එ ගම්වල නමින් ම ප්‍රසිඬ වූ කුල පුත්‍රයෝ දෙදෙනෙක් ගිහි සැපත්හි කලකිරී දුකින් මිදෙන මඟක් සොයමින් ඇවිදුණෝ යට කී සංජය පරිව්‍රාජකයාගේ ශිෂ්‍ය වැ ඔහු ගේ සමය ඉගෙන, ඔහු වෙත මහණකම කෙරෙමින් වුසූ හ. එහෙත් ඔහුගේ දහමින් ඒ දෙදෙනා තෘප්ත නො වූහ. 'අප දෙදෙනා ගෙන් යමෙක් පළමුවෙන් නිවන් ලැබුයේ නම් හේ අනෙකාට ඒ බව දන්වාවා'යි ඔහු කතිකාවක් ද කැරැ ගත්තෝ ය. මෙසේ කතිකා කොට ඔහු එතැනින් නික්ම දඹදිව පුරා ඇවිද්දහ, යලිදු පෙරළා රජගහ නුවරට පැමිණියාහ.

මෙසේ ඒ පිරිවැජි අරමෙහි ඔවුන් සිටිත අතර, ඉහත කී පරිදි ධර්මදූත මෙහෙයෙහි බුදුරජාණන් වහන්සේ විසින් දිශාවනට යැවුණු භික්ෂූන් අතුරෙන් **අස්සජි** තෙරුන් වහන්සේ නවම් පුර පැළවිය ද රජගහ නුවරට පැමිණ පෙරවරු කාලයෙහි පිඩු පිණිස හැසිරෙන සේක. වීථියට ආ උපතිෂ්‍ය පරිව්‍රාජකයා උන්වහන්සේ දිටි ය. ඒ දැක්මෙන් පරිව්‍රාජකයාට 'මේ ඒකාන්තයෙන් රහත් වූ හෝ රහත් මඟ පිළිපන් උතුමකු විය යුතු, මුන්වහන්සේ කරා එළැඹ තොරතුරු විචාළොත් මැනවැ'යි සිතිණ. ඉක්බිති 'මේ පිඩු පිණිස හැසිරෙන වේලාව එයට සුදුසු නො වේ යැ'යි හේ සිතීය. උන්වහන්සේ පසු පස්සෙන් ගියේ ය. ගොස් තෙරුන් පිණ්ඩපාතය ලැබ එක් තැනකට ගොස් ඉඳගනු කැමති බව දුටු පරිව්‍රාජක තෙම තමාගේ පරිව්‍රාජක පුටුව පිළියෙල කැර දුන්නේ ය. තෙරුන් වහන්සේ එහි වැඩහිඳ දන් වැළැඳූ සේක. ඉක්බිති පිරිවැජි තෙම කෙංඩියෙන් වතුර පිළිගැන්වී ය. මෙසේ ආචාර්‍ය්‍යයකුට කළ යුතු වත් කොට, ඉක්බිති තෙරුන් හා කථාවට බටුයේ ය.

'ආයුෂ්මත්නි, ඔබ ගේ ඇස් කන් ආදී ඉන්ද්‍රියයෝ සුප්‍රසන්නහ, ඇඟ පැහැය පිරිසිදු ය. ශෝභන ය. ඔබ කවරකු නිසා පැවිදි වූ කෙනෙක් දැ?' යි විචාළේ ය.

තෙරණුවෝ ද 'මොහුට ශාසනයේ ගැඹුරු බව පෙන්වන්නෙමි'යි සිතා තමා ගේ නවක භාවය (අළුත ශාසනයට වන් බව) දක්වන්නෝ,

'ආයුෂ්මත්නි, මම නවක වෙමි. ළඟ දී මහණ වූයෙකිමි'යි තෙරණුවෝ කීහ.

එ විට, පිරිවැජි තෙම,

'මම උපතිස්ස නම් වෙමි. ස්වල්ප කොට හෝ බොහෝ කොට හැකි පරිද්දෙකින් ධර්මය වදාළ මැනවි. එය ක්‍රම සියයෙකින් දහසෙකින් අවබෝධ කිරීම මට බාර වැඩෙකැ'යි කී ය.

එවිට **අස්සජි** තෙරණුවෝ මුළු බුඩ වචනය ම ඇතුළත් කොට,

'හේතුයෙන් පහළ වන යම් ධර්ම කෙනෙක් වෙද්ද, ඔවුන්ගේ හේතුව ඒ තථාගතයන් වහන්සේ වදරන සේක. ඔවුන්ගේ යම් නිරෝධයෙකුත් වේ ද එය ද වදරන සේක. ඒ මහා ශ්‍රමණයන් වහන්සේ මෙසේ වදරන කෙනෙකැ 'යි වදාළ හ.[128]

මෙහි පළමු දෙ පදය අසමින් ම සියදහස් නයින් එහි අර්ථ දුටු පරිව්‍රාජක තෙම දහසක් නයින්[129] යුත් සෝවාන් පලයෙහි පිහිටියේ ය. අන් පද දෙක දෙසුවේ සෝවාන් වූ පසු යි. සෝවාන් වූ පමණ මුත් ඉන් මත්තෙහි විශෙෂ ගුණයකට නො පැමිණි බැවින් එයට කාරණයක් ඇතැයි සිතූ පිරිවැජි තෙම තෙරුන් අමතා,

'ස්වාමීනි මේ පමණෙක් සෑහේ, අපේ ශාස්තෲන් වහන්සේ කොහි වසනා සේක් දෝ?'යි ඇසී ය.

'ආයුෂ්මත්නි, උන් වහන්සේ දැන් වේළුවනයෙහි වසන සේකැ'යි තෙරණුවෝ කීහ.

'ස්වාමිනී, එසේ වී නම් ඔබ වහන්සේ පළමු කොට වැඩිය මැනවි. අපේ යහළුවෙක් ඇත. 'පළමු ව නිවන් දුටුවහු විසින් අනෙකාට දැන්වියැ යුතු යැ'යි අප දෙදෙනා විසින් කතිකාවතක් කරන ලදී. ඒ පොරොන්දුවෙන් මිදී මගේ යහළුවාත් කැඳවා ගෙන ඔබ 'වහන්සේ වැඩි මගින් ම ශාස්තෲන් වහන්සේ වෙත එන්නෙමි'යි කියා පසහ පිහිටුවා වැඳ පැදකුණු කොට පරිව්‍රාජකාරාමය අතට ගියේ ය. ඔහු ඈත එන්නහු දුටු කෝලිත පිරිවැජි තෙම 'අද මා යහළුවා ගේ මුහුණ අන් දවස්වලැ මෙන්

නො වේ. ඒකාන්තයෙන් ඔහු විසින් නිවන් ලද්දේ වනැ'යි සිතා 'නිවන් ලැබුයෙහි දැ'යි විචාළේ ය. 'එ සේය. ආයුෂ්මත්නි, නිවන් ලදිමි'යි උපතිස්ස තෙම උත්තර දී තමාට අස්සජි තෙරුන් වදළ දහම් පද ම කී ය. එහි අවසනැ කෝලිත තෙම සෝවාන් පෙළෙහි පිහිටා 'අපේ ශාස්තෘන් වහන්සේ කොහි වසන සේක් දැ?'යි ඇසී ය. එ විටැ උපතිස්ස තෙම 'යහළු, වේළුවනයේයූ, මේ බව අපේ ආචාර්‍ය්‍ය අස්සජි තෙරණුවෝ වදළහ'යි කී ය. 'යහළු, එසේ වී නම් යම්හ, ශාස්තෘන් වහන්සේ දකින්නමු'යි කෝලිත කී ය.

'යහළුව, මේ පිරිවැජියෝ දෙසිය පණස අප නිසා. අප බලා, මෙහි වෙසෙත්. ඔවුනටත් අප නිවන් ප්‍රත්‍යක්ෂ කළ බව දන්වමු. එවිට ඔවුහු තමනට රිසියක් කරන්නා හ'යි උපතිස්ස කීය. ඉන්පසු ඒ දෙදෙන පිරිවැජි පිරිස කරා ගොස් තමන් බුදුරජාණන් වහන්සේ වෙත යන බව කීහ. 'අපි ඔබ දෙදෙනා බලා ඉඳුම්හ., ඔබ ඒ මහා ශ්‍රමණයන් වහන්සේ වෙත මහණදම් පුරතොත් අපිදු එසේ ම කරන්නමු'යි පිරිවැජියෝ කීහ.

ඉක්බිති කෝලිත උපතිස්ස දෙදෙන **සංජය** පරිව්‍රාජයා වෙත ගොස් තමන් අවබෝධ කළ ධර්‍මය ගැන දන්වා බුදුරජාණන් වහන්සේ වෙත යන්නට කැඳැ වූහ. 'ආයුෂ්මත්නි, එහි යෑමෙන් කමෙක් නැත. අපි තුන් දෙනා එක් වැ මේ පරිව්‍රාජක පිරිස පාලනය කරම්හ'යි **සංජය** කී ය. දෙවනුත් ඔහු සංජය පිරිවැජියහු කැඳවූහ. දෙවනුත් හේ පෙර සේ ම කී. තෙවනු කැඳවූ විට ද හෙතෙම පළමු සේ ම කියා ගමන ප්‍රතික්ෂේප කෙළේ ය. ඉන් පසු උපතිස්ස කෝලිත දෙ පිරිවැජියෝ දෙසිය පණසක් පමණ වූ පරිව්‍රාජක පිරිස හා වේළුවනයට ගියහ. ඈත එන ඔවුන් දුටු භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් බණවා,

'මහණෙනි, තෙල කෝලිත උපතිස්ස නම් දෙ යහළුවෝ එති, ඔහු දෙදෙන මගේ අග සවු යුවල වන්නාහ'යි වදළ සේක.

මෙහි කී **කෝලිත** තෙම **මොග්ගලී** නම් බැමිණියගේ පුත්‍ර බැවින් '**මොග්ගල්ලාන**' යන නමින් ප්‍රසිඬ විය. **උපතිස්ස** තෙම **රූපසාරී** බැමිණිය ගේ පුත් බැවින් **සාරිපුත්ත** නමින් හැඳින්විණ.

සාරිපුත්ත මොග්ගල්ලාන දෙදෙන භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ උන් වහන්සේ ගේ පා මුලැ හිස තබා වැඳ පැවිද්ද ඉල්ලූහ.

'මහණෙනි, මෙහි එවූ. ධර්මය මනා ලෙස ප්‍රකාශිත යි. දුක් මුල් සුන් කරනු පිණිස මාර්ග බ්‍රහ්මචර්යාව පුරවු'යැ යි බුදුරජාණන් වහන්සේ වදාළ සේක. එය ම ඒ දෙදෙනා ප්‍රමුඛ පිරිස ගේ මහණ උපසම්පදාව විය.

**සැරියුත් මුගලන් දෙදෙනාගේ පිරිවර රහත් වීම**

මෙයට පසු භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන් ගේ චරිතයට අනුකූල ධර්මයක් දේශනා කළ සේක. සැරියුත් මුගලන් දෙ නම හැර සෙසු සියල්ලෝ එහි නුවණ යවා රහත් වූහ.

**මුගලන් තෙරුන් කල්ලවාලමුත්ත ගමට වැඩීම**

මුගලන් තෙරණුවෝ වනාහි පැවිදි වූ ද ම භාග්‍යවතුන් වහන්සේගෙන් කමටහන් ඉගෙන මගධ රට **කල්ලවාලමුත්ත** නම් ගමට වැඩ එහි සමීපයේ කැලයෙකැ වැස විදර්ශනා වැඩූහ.

**භාග්‍යවතුන් වහන්සේ භග්ග රටට වැඩීම.**

මේ අතර භාග්‍යවතුන් වහන්සේ ද, සැරිසරා වඩනා සේක් **වත්ස** ජනපදයෙහි වූ **භග්ග** රට වැඩ එහි **සුංසුමාරගිර** නගරය අසල **භේසකලා** අඩවියෙහි වසන සේක.

**මුගලන් තෙරුන් රහත් වීම නවම් පුර අටවක් ද**

යටැ කී පරිදි කල්ලවාලමුත්ත ගමේ වෙනෙහි මහණ දම් පුරණ මුගලන් තෙරණුවෝ සත් දිනක් සක්මනෙහි යෙදුණෝ, සත් වන ද වෙහෙස වැ චිත්ත චෛතසිකයන් ගේ මැලි බවට බැස්සෝ ය. භාග්‍යවතුන් වහන්සේ දිවැසින් ඒ දැක සෘද්ධියෙන් එතැනට වැඩ ධාතු කර්මස්ථාන දේශනායෙන් දම් දෙසූ සේක. ඒ අනුව සිහි නුවණ යෙදූ තෙරණුවෝ එහි දී ම රහත් වූහ. මේ වනාහි උන්වහන්සේ පැවිදිවීමෙන් සත් වන ද යැ.

**භාග්‍යවතුන් වහන්සේ ගේ රාජගෘහ ප්‍රාප්තිය සැරියුත් තෙරුන් රහත් වීම නවම් පුර පසළොස්වක් ද**

එයින් තික්ම සැරි සරණ භාග්‍යවතුන් වහන්සේ ඊළඟ සතියෙහි රාජගෘහ පුරයට පෙරළා වැඩි සේක්, ගිජුකුළු පව්වෙහි **සූකරඛත** ලෙනට (ඌරන් හෑරූ ලෙනට) වැඩ එහි වුසූ සේක. මේ සැරියුත් තෙරුන් පැවිදිවීමෙන් පසොළොස්වන ද ය. භාග්‍යවතුන් වහන්සේ මෙදින තෙරුන්ගේ බෑනණු වූ උච්ඡේදවාදී **දීඝ නඛ** පරිව්‍රාජකයාට **වේදනා පරිග්‍රහ සූත්‍රය**[190] වදාළ සේක. භාග්‍යවතුන් වහන්සේ ට පවන් සලමින් සිටි **සැරියුත් තෙරණුවෝ** ඒ දේශනාව ඔස්සේ නුවණ යවා රහත් වූහ.

භාග්‍යවතුන් වහන්සේ එය දැන අහස් නැග ක්ෂණයෙන් වේළුවනයෙහි පිහිටි සේක. සැරියුත් තෙරණුවෝ 'භාග්‍යවතුන් වහන්සේ කොයි වැඩියෝ දැ?' යි ආවර්ජන කොට දැන, තුමු ද අහසින් වේළුවනයට ම වැඩිය හ.

**අගසවු තනතුරු දීම, මහා ශ්‍රාවක සන්නිපාතය පාමොක් දෙසීම්. නවම් මැදි පොහෝ ද**

මෙ දින වනාහි නවම් මස මැදි පොහෝ වී. එ ද සවස වේළුවනාරාමයෙහි මහා සංඝ සන්නිපාතයෙක් විය. උරුවේල කාශ්‍යපයන් වහන්සේ ආදි පුරාණ ජටිල භික්ෂුහු දහසක් ද, සැරියුත් මුගලන් දෙ නම ප්‍රධාන දෙසිය පනස දැ යි එක් දහස් දෙසිය පනසක් ක්ෂීණාස්‍රවයන් වහන්සේ එක් තැන රැස්වූහ. මෙහි දී භාග්‍යවතුන් වහන්සේ සැරියුත් මුගලන් දෙ නම අග්‍ර ශ්‍රාවක තනතුරට පත් කළ සේක. ඉක්බිති අවවාද ප්‍රාතිමෝක්ෂය දෙසූ සේක.

**අගසවු තනතුරු ගැන භික්ෂූන්ගේ වැරැදි අදහස් දුරලීම**

ඉක්බිති පසු ව පැමිණි සැරියුත් මුගලන් දෙ නමට අගසවු තනතුරු දීම ගැන සමහර පෘථග්ජන භික්ෂූන් අතර ඇති වූ කථා අසා, සියලු භික්ෂූන් කැඳවා භාග්‍යවතුන් වහන්සේ ඔවුනට පංචවර්ගික භික්ෂූන්, යස භික්ෂු. භද්‍රවර්ගික භික්ෂූන්, තුන් බෑ ජටිල භික්ෂූන් යන මොවුන් වහන්සේ අනෙකක් ම පතා පින් කළ බවත්, අගසවු බව නො පැතූ බවත්, සැරියුත් මුගලන් දෙ නම ම අගසවු බව පතා ම පින් කළ බවත් වදරා ඔවුන් වහන්සේ ගේ අතීත ප්‍රවෘත්ති ගෙන හැර දක්වා ඒ භික්ෂූන් ගේ විමති දුරු කළ සේක.

**සංජයයන් ගැන වදළ බණ**

මෙයින් පසු දෑගසව්වෝ භාග්‍යවතුන් වහන්සේ වැඳ තමන් ගිහි ගෙයි කලකිරී පැවිදි වූ සැටිත් අස්සජි තෙරුන් ගෙන් බණ අසන්නට ලැබුණු සැටිත් එයට පසු සංජය පරිව්‍රාජකයාට ශාස්තෘන් වහන්සේ දැකීම පිණිස එන්නට කථා කළ විට ඒ නො පිළිගත් සැටිත් සැළ කළහ. එ විටැ බුදුරජාණන් වහන්සේ **"මහණෙනි, සංජය තෙම තමා මිථ්‍යාදෘෂ්ටික බැවින් සාරය අසාරය ලෙසත්, අසාරය සාරය ලෙසත් සැලකී ය. එනෙකුදු වුවත් තෙපි තමන් නැණවත් බැවින් සාරය සාරය ලෙසත් අසාරය අසාරය ලෙසත් දැන, අසාරය හැර සාරය ම ගත්තහු"**[133] යැ යි වදරා,

"අසාර දැයෙහි සාර යැයි වැරැදි මත ඇති, සාර දැයෙහි අසාර යැයි වැරැදි දැකුම් ඇති, වැරැදි කල්පනා ගොදුරු කොටැති ඔහු සාර ධර්මය නො ලබත්. සාරය සාර ලෙසත්, අසාරය අසාර ලෙසත් දැන ගැන්මෙන් ඒ (දන්නා) පුද්ගලයෝ නිවැරැදි කල්පනා ගොදුරු කොට ඇත්තෝ සාර ධර්මය ලබත්" යැයි දහමක් වදාළසේක.

මේ ධර්මය ඇසීමෙන් බොහෝ දෙන ඥානය මුහුකුරුවා සෝවාන් ඵල ආදියට පැමිණියෝ ය.

**බුදුරජාණන් වහන්සේ භද්දිය පුර වැඩීම විශාඛාව සෝවාන් වීම**

භාග්‍යවතුන් වහන්සේ මෙසේ රජගහ පුර වසන සේක් මේ අතර කාලයෙහි ටික දිනක් මහත් භික්ෂු සංඝයා පිරිවරා අංග රට සැරිසරන සේක්, **භද්දිය** නගරයට වැඩි සේක. එහි අමිතභෝගී වූ **මෙණ්ඩක** සිටු ඒ පවත් අසා, සිය මිනිබිරිය වූ සත් හැවිරිදි **විශාඛා** ළදැරිය ඇගේ පිරිවරත් සමග භාග්‍යවතුන් වහන්සේ දක්නට යැවී ය. භාග්‍යවතුන් වහන්සේ ගේ ධර්ම දේශනාව ඇසූ බුද්ධිමත් **විශාඛා** තොම සෝවාන් පෙලෙහි පිහිටියා ය. **මෙණ්ඩක** සිටු ද, භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ බණ අසා සෝවාන් වූයේ, පසු ද බුද්ධ ප්‍රමුඛ සංඝයාට දන් දුන්නේ ය. මේ කෙමෙන් අඩ මසක් ම සිටු තෙමේ මහදන් පැවැත්වී ය. භාග්‍යවතුන් වහන්සේ ටික දිනක් එහි වැස ඉන් නික්ම වඩනා සේක්,

**කෙණිය - සේල දෙදෙනාට දම් දෙසීම**

අංගුත්තරාප දනව්වෙහි **ආපණ** නම් නිගමයට පැමිණි සේක. මෙහි දී **කේණිය** ජටිලයාට[133] බණ වදරා ඔහු පහදවා, **සේල** බ්‍රාහ්මණයාට දහම්දෙසා ඒහිභික්ෂු ප්‍රව්‍රජ්‍යාවෙන් ඔහු පැවිදි කොට, පෙරලා රජගහ පුරට ම වැඩි සේක.

---

## ස විසි වන පරිච්ඡේදය

**කිඹුල්වත් පුර වැඩීම**

බෝසතාණන් වහන්සේ ගිහි ගෙන් නික්ම පැවිදි වූ තැන් සිට ම ශුද්ධෝදන රජ තුමා උන් වහන්සේගේ තොරතුරු සොයා දැන අවුත් තමාට දැන්වීමට අසරු දූත පිරිසක් යෙදී ය. බෝසතාණන් වහන්සේ යන එන හැම තැනම උන්වහන්සේට නො දැනෙන සේ මේ දූත පිරිස වෙස්වළා හැසුරුණහ. දිනපතා කිඹුල්වත් නුවරට කිහිප දෙනෙක් පැමිණෙති.

රජුට තොරතුරු දන්වති, මෙසේ මාරුවෙන් මාරුවට කිඹුල්වත් පුරට යමින් එමින් සාවුරුද්දකට වැඩි කලක් ඔහු මේ රහස් සේවයෙහි යෙදුනාහ. බෝසතාණන් වහන්සේ බුදු වී දම්සක් පවත්වා රජගහ පුර වැඩ එහි වසන තොරතුරුත් ශුද්ධෝදන රජ තුමාට සැපයූවෝ ද මේ රහස් දූතයෝ ය. ශුද්ධෝදන රජතුමා ඔවුන් ගෙන් තොරතුරු දැන 'දැන් පුත්‍රයාණන් වහන්සේ තම නුවරට වැඩම කැරැවීමට කාලයැ'යි සිතී ය. සිතා එහි වඩින්නට ආයාචනා කරන පිණිස ඇමැතියකු රාජපුරුෂයන් දහසක් පිරිවර කොට දී රජගහ නුවර භාග්‍යවතුන්වහන්සේ වෙතට යැවී ය. හේ කිඹුල්වත සිට රජගහ පුර දක්වා වූ සැට යොදුන් මාර්ගය ගෙවා වේළුවනාරාමයට පැමිණියේ ය. එ වේලෙහි දම් දෙසමින් හුන් බුදු රජාණන් වහන්සේ ගේ කථාව අසා හේ පිරිවර දහසක් දෙනා හා රහත් බව ලබා පැවිද්ද ඉල්වූයේ ය. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් ඒහිභික්ෂු ප්‍රව්‍රජ්‍යායෙන් පැවිදි උපසපත් කළ සේක. රහත් වූවායින් පසු මධ්‍යස්ථ වීම ආර්‍යයන් ගේ ස්වභාවයක් බැවින් ඒ තෙරණුවෝ රජු එවූ පණිවුඩය භාග්‍යවතුන් වහන්සේට දැන්වීමෙහි යුහුසුලු නො වූහ.

සුදෙවුන් රජ ද කල් යනු දැක පළමු පරිද්දෙන් ම තවත් දහසක් පිරිවර සහිත වූ ඇමැතියකු යැවූයේ ය. ඒ පිරිස ද පළමු පිරිස සේ ම රහත් ව තුෂ්ණීම් භූත වූ හ. මෙසේ පුරුෂයන් දහස බැගින් පිරිවර කොට ඇති ඇමැතියන් නව දෙනකුන් වරින් වර යවා, ඒ සියලු දෙන ම රහත් වැ පැවිදි ව තුෂ්ණීම්භූත වූයෙන්, බෝසතුන් හා එක ද උපන් කාළුදායි නම් ඇමැතියා කැඳවා දරුව, 'කාළුදායි, මගේ පුත්‍රයා දකිනු කැමැත්තෙන් කැඳවා ගෙනෙනු පිණිස නව දහසක් පුරුෂයන් සහිත නව දෙනෙකුන් යැවූ මුත් කිසිවෙක් අවුත් ආරංචි මාත්‍රයකුත් නො කී ය. මරණය කවර ද වේ දැ යි නියම නැත. මැරෙන්නට පළමු පුත්‍රයාණන් දක්නා කැමැත්තෙමි. මගේ පුත්‍රයා කැඳවා ගෙන එන්නට නුඹට හැකි දැ'යි ඇසී ය. 'දේවයිනි. මහණ වෙන්නට අවසර දෙතොත් එය කරන්නෙමි' හේ කී ය. නුඹ කැමැත්තක් කැර ගෙන මා පුතු දැක්වුව මැනැව'යි රජ කී ය, හේ ද 'යහපතැ'යි කියා පුරුෂයන් දහසක් සහිත ව ගොස් බණ අසා රහත් වැ ඒ භික්ෂුප්‍රව්‍රජ්‍යායෙන් පැවිදි උපසපත් බව ලැබී ය.

**මහා කාශ්‍යපයන් වහන්සේ**

මගධ රට මහාතීර්ථ නම් බමුණුගමැ කපිල නම් මහා ධනවත් බමුණකු ගේ **පිප්පලී මානවක** නම් පුතෙක් විය. තුරුණු විය පත් ඔහුට බමුණු කුමරියක පාවා දෙන්නට පිය බමුණා නියම කැරගත්තේය. මේ පිප්පලී මානවක බඹලොවින් චුත වැ මිනිස් ලොවැ උපන්නෙකි. කාමාශාව නැත්තෙකි. එහෙත් පියාගේ පෙරැත්තයෙන් බේරෙන පිණිස මට කුමරියක ගෙනෙනොත් මෙබඳු එකියක සොයා ගෙනෙන්නැයි රන්රුවක් කරවා දුන. පිය බමුණා දූතයනට එය භාර දී මෙබඳු රුවක් ඇති බමුණු දැරියක සොයා බලා දන්වන්නැ යි කියා ගමන් වියදම් දී ඒ රන්රුව බමුණන් කිහිප දෙනෙකුට බාර දුන. ඔහු රටින් රට සොයා යන්නාහු මද්‍ර දේශයේ (මදුරටැ) සුරූපී ස්ත්‍රීන් ගැන ප්‍රසිඩ සාගල නුවරට පැමිණි ය හ. එහි දී රන්රුවට සරිලන **භද්‍රා** නම් බමුණු දැරියක දැක අවුත් කපිල බමුණාට දැන්වූහ. හේ ද ඇගේ මාපියනට පණිවුඩ යවා බමුණු සිරිත් පරිදි කුමරිය පිප්පලී මානවකයාට පාවා දුන්හ. භද්‍රා ද බඹ ලොවින් චුත වූ කෙනෙකි. එබැවින් කාමාශා නැත්තී ය. සරණ මඟුල් පැවැති දින ම රාත්‍රියේ තරුණ තරුණී දෙදෙන තම තමන්ගේ අදහස් එකිනෙකාට කීහ. සමාන අදහස් ඇති බැවින් ඔහු සතුටු වූහ. අඹුසැමියන් වශයෙන් පිටතට පෙණුනත් ඔහු දෙදෙනා ම සහෝදරයකුත් සහෝදරියකත් ලෙසින් උනුනට ළැදි ව බ්‍රහ්මචාරී ව ගෙදරදෙර කටයුතු ඉටු කරමින් වුසූහ. පිප්පලී මානවක සිය මාපියන් මළ පසු ගිහිගෙන් නික්ම පැවිදිවන්නට අදහස් කෙළේ ය. භද්‍රාවට එය දැන්වී ය. ඕ ද මටත් ගිහි සැප වුවමනා නැත. මමත් පැවිදි වෙමි යි කීවා ය. මෙසේ දෙදෙනා ම කතා බස් කොට වීදියේ කඩයෙකින් ගුරු රෙදි මැටි පාත්‍ර ආදි තවුස් පිරිකරගෙන්වා ගෙන තවුස් පැවිද්දෙන් පැවිදි ව තමන් සතු මහා ධනස්කන්ධය කැමැති කෙනකුට ගන්නට ඉඩ හැර තුමූ කාටත් නොදන්වා නික්ම ගියහ. බොහෝ දුර යන ඔහු දෙමංහන්දියකට පැමිණියහ. පිප්පලී තෙම 'පැවිදි වූ අපි එකට යනු නො වටී. ඔබ මේ මඟින් යන්න මම් අනිත් මඟින් යමි'යි භද්‍රාවට කී ය. ඕ ද එය පිළිගෙන වම් පසැ පාරට බැස ගොස් පරිව්‍රාජිකාවන්ගේ අසපුවකට ඇතුළත් වූවා ය. පිප්පලී මානවක ද යනුයේ රජගහ නුවරටත් නාලන්දවටත් අතරැ දික් මඟට බැස ගියේ ය.

භාග්‍යවතුන් වහන්සේ ඔහු එන්නාහු දිවැසින් දැක වේළුවනයෙන් පිටැත් වැ රජගහටත් නාලන්දවටත් අතර වූ **බහුපුත්තික** නමින් ප්‍රකට නුග රුක වෙත සෘධියෙන් වැඩ එහි සෙවණෙහි සිරුරෙන් රස් විහිදුවමින් වැඩහුන් සේක. පිප්පලී තෙම ඒ පැත්තෙන් එනුයේ භාග්‍යවතුන් වහන්සේ දැක 'මගේ ශාස්තෘ වන තැනැත්තෝ මුන්වහන්සේ' යැ යි ඈත සිට ම දෙහොත් මුදුන් තබා ගෙන අවුත් තුන් තැනෙක දී වැඳ වැටී 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මගේ ශාස්තෘ යැ, මම භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවකයෙමි'යි කී ය.

'කාශ්‍යපයෙනි, ඉඳගන්න. ඔබට දැවැද්දක් දෙමි'යි වදළසේක. '**ස්ථවිර මධ්‍යම, නවක භික්ෂූන් කෙරෙහි හිරිඔතප් ඇතිවැ සැළකිලිමත් වැ විසිය යුතු, අසන බණ සිත් කන් යොමුකොට එළැඹැ සිටු වූ සිහි ඇති වැ ඇසිය යුතු, අශුභ භාවනා ආනාපාන සති භාවනා යන කායගතාසති භාවනා ප්‍රථමධ්‍යානය පාදක කොට වඩමි යි පුහුණු වියැ යුතු** යැ'යි අවවාද කළ සේක. මේ අවවාදය පිළිගැනීම ම කාශ්‍යපයන් වහන්සේ ගේ උපසම්පදව විය. මෙය **ඕවාදූපසම්පද** නම්.

මේ කාශ්‍යපයන් වහන්සේ ගේ පියා කාශ්‍යප නම් බමුණු පරපුරට අයත් ය. එහෙයින් පැවිදි වූ තැන් සිට බුදුරජාණන් වහන්සේ ගොත්‍රනාමයෙන් ඔවුන් ඇමතූ බැවින් **පිප්පලී** යන නම අභාවයට ගියේ ය. **කාශ්‍යප** යන නමින් ම උන්වහන්සේ හැඳින්වුණහ.

මෙසේ ඔවුන් පැවිදි උපසපන් කොට භාග්‍යවතුන් වහන්සේ අනාගතය බලා තවත් කරුණක් සලකාගෙන කාශ්‍යපයන් වහන්සේ කැටුව මඳ දුරක් වැඩ රුකක් වෙත පැමිණ ඉඳගනු කැමැති සැටියක් දැක්වූ සේක. එවිට කාශ්‍යපයන් වහන්සේ තමා පෙරෙව් දෙපට සිවුර* සතර පටට නමා රුක්මුලැ එලූහ. භාග්‍යවතුන් වහන්සේ එහි හිඳගත් සේක. ඉක්බිති තමන් පිරිනිවි කල සිදුවන ධර්මසංගායනාව ද එහි තමන් වෙනුවට ප්‍රධාන ස්ථානය දැරීමට ඉතිරි වන එක ම මහා ශ්‍රාවකයා කාශ්‍යපයන් වහන්සේ යි ද දැක, 'දැන් ම එතැනට හිමි කරම්හ'යි තමන් වහන්සේ පෙරෙව් සිවුර කාශ්‍යපයන් වහන්සේට දෙන්නට අදහස් කොට සිතා එලා තුබුණු කාශ්‍යපයන්

---

* අධික ශීත සෘතු සමයෙහි පෙරැවීමට අවශ්‍ය ම බැවින් තවුසෝත් තනිපට දෙපට විසින් සිවුරු දෙකක් ද අඳනයක් දැ යි සිවුරු තුනක් දරති.

වහන්සේ ගේ සඟළ සිවුර අතගාමින් 'කාශ්‍යපයෙනි, තොප ගේ මේ පට සඟළ සිවුර මොළොකැ' යි වදළ සේක. 'භාග්‍යවතුන් වහන්සේ මගේ සඟළ සිවුර පොරවනු කැමැති සේක් වනැ'යි සිතා 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මගේ සඟළ සිවුර පිළිගෙන පොරවන සේක්වා'යි තෙරණුවෝ කීහ. 'ඔබ කුමක් පොරවන්නාහුදැ'යි භාග්‍යවතුන් වහන්සේ අසා වදළ සේක. 'භාග්‍යවතුන් වහන්සේ ගේ හඳනය ලැබුණොත්* පොරවන්නෙමි'යි කාශ්‍යපයන් වහන්සේ කීහ. භාග්‍යවතුන් වහන්සේ තමන් ඒ තාක් පරිභෝග කළ පාංශුකූල හඳනා සිවුර කාශ්‍යපයන් වහන්සේට දුන් සේක. මෙසේ සිවුරු මාරු කැරැ ගැනීමෙන් භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයන් අතුරෙහි කාශ්‍යපයන් වහන්සේට තමනට කිට්ටු ම තැන දුන්සේක. කාශ්‍යපයන් වහන්සේ ද 'ශාස්තෲන් වහන්සේගේ සිවුරක් දැරීමට මා ගුණයෙන් එයට සුදුසු වියැ යුතු යැ'යි සිතා එවේලේ ම ධුතාංග තෙළෙස ම සමාදන් ව ගත්හ. එයින් පසු භාග්‍යවතුන්-වහන්සේ කාශ්‍යප තෙරුන් කැටුව වේළුවනාරාමයට ම වැඩිසේක. භාවනානුයෝගී ව කල් ගෙවූ කාශ්‍යපයන් වහන්සේ සතියක් ගත වූ තැන අභිඥාලාභී සිවුපිළිසිඹියාපත් මහරහත් කෙනෙක් වූහ.

කාශ්‍යප යන නම දැරූ තවත් තෙරහු වූහ. ඔවුන් වහන්සේ ගෙන් වෙන් කොට ගනු පිණිස පසු කලෙක **"මහාකාශ්‍යප"** නාමින් අන් තෙරහු මුන්වහන්සේ හැඳුන්වූහ.

**විශාල භික්ෂු පිරිසක්**

බුදුරජාණන් වහන්සේ ගේ ප්‍රථම ධර්මදේශනාවේ සිට ගත වූ මේ අට මසක් පමණ වූ අතර කාලයෙහි නානා දිශාවලට යැවූ භික්ෂූන්ද පුරාණ ජටිල භික්ෂූන් එක් දහස් තුන් දෙනෙක් ද, සැරියුත් මුගලන් දෙදෙනා ඇතුළු පුරාණ පරිව්‍රාජක භික්ෂූන් දෙසිය දෙ පණසක් ද අංග මගධ දෙරට කුලපුතුන් මහණ වූවන් දස දහසක් පමණ ද, කිඹුල්වතින් අවුත් පැවිදි වූවන් දස දහස් දස දෙනෙක් දැ යි සියල්ලෝ ම එක් විසි දහස් තෙ සිය පස් පනසක් පමණ භික්ෂූහු වූහ.

**කාළුදායි තෙරුන්ගේ ගමන වර්ණනා**

කාළුදායි තෙරුන් ගේ පැමිණීමෙන් දින හත අටෙක් ගත වීය. මැදින් මස පසළොස්වක් පොහොය පැමිණි යේ ය. හේමන්ත ඍතුව ලැබූයෙන් කිඹුල්වත් පුරට භාග්‍යවතුන් වහන්සේ වැඩම කැරැවීමට සුදුසු කාලයැයි කාළුදායි ස්ථවිර සිතී ය. සිතා භාග්‍යවතුන් වහන්සේ වෙතැ එළැඹ ගමන වර්ණනා කරනුයේ [135]

---

* මෙයින් හඳනයත් පොරෝනාවත් ප්‍රමාණයෙන් සමාන බව දැක්වේ.

'එහන්ස, දැන් වෘක්ෂයෝ ගිනි අඟුරු වැනි රතු පැහැති මල් දලු ඇත්තෝ, පරණ කොළ වැටී පල දරන කාලයට පැමිණියෝ වෙත්. ඒ වෘක්ෂයෝ ගිනි දැල් සහිත වූවන් සේ බබලත්. මහා වීරයන් වහන්ස. භගීරථ පරම්පරායෙහි වූවනට (ශාක්‍යයනට) අනුග්‍රහ පිණිස වඩින්නට දැන් කාලය වේ.

'පිපුණු මල් ඇති වෘක්ෂයෝ හැම අතට සුවඳ විහිදුවත්. පුරාණ පත්‍ර හැර දමා (වැටීමෙන් පසු) ඵල බලාපොරොත්තුවෙන් සිටින්නෝ වෙත්. වීරයන් වහන්ස, දැන් මෙයින් පිටත් වන්නට කාලය යි.

'ඉතා ශීත හෝ උෂ්ණ නැත් ම ය, වහන්ස. ඍතුව සැප පහසු ගෙන දෙයි. ගමනකට යෝග්‍ය ය, ආපසු හැරී **රෝහිණී ගඟින්**[134] එතෙර වන ඔබ වහන්සේ ශාක්‍ය කෝලිය රජු හු දකිත් වා.'

'ගොවි තෙම මතු බලා ම කුඹුර හායි. හාන්නහු විසින් ද මතු බලා වී වපුරනු ලැබේ. ධන රැස් කරන වෙළෙඳහු මතු බලා සමුද්‍ර තරණය කරත්. මම ද ඔබ වහන්සේ කිඹුල්වතට වැඩම කරවන්නට යම් බලාපොරොත්තුවෙකින් සිටියෙමි ද ඒ මගේ ප්‍රාර්ථනාව 'සමෘද්ධ වේ වා.

'එක් වරෙකින් නො නැවැතී ගොවියො යළි යළි ධාන්‍ය වපුරත්. වැස්ස ද නැවැත නැවැත වසී. නැවැත නැවැත ද ගොවීහු කුඹුරු හාත්. නැවැත නැවැත හැල් ආදී ධාන්‍ය රටට ලැබේ.

'යාචකයෝ ද යළි යළි කුලයන් කරා එළඹෙත්. දනපතීහු ද යළි යළිත් දන් දෙත්. එසේ දීමෙන් නැවැත නැවැත ස්වර්ගයෙහි උපදිත්.

'යම් කුලයෙක මහා ප්‍රාඥ වූ වීර පුරුෂයෙක් වේ නම්, හෙතෙම මහා පිළිවෙතින් සත්වන මුතුන් මිත්තන් දක්වා පරම්පරා යුග සතක් ශුද්ධ කරයි. දෙලෝ වැඩ දන්නා හෙයින් මුනි යන නම සත්‍ය වශයෙන් ලත් දේවාතිදේව වූ භාග්‍යවතුන් වහන්සේ එයටත් වඩා පාප නිවාරණයෙහිත් යහපතෙහි අනුන් පිහිටුවා ලීමෙහිත් සමර්ථ සේකැ යි සිතමි.

'මහර්ෂින් වහන්සේ ගේ පියා ශුද්ධෝදන මහ රජාණෝ යි. යම් උත්තමාවක් බෝ සතුන් කුසින් දරා සිට මරණින් මතු දෙව්ලොවැ දෙව් පුතෙක් ව ඉපිද සැප විඳී ද, ඒ මායා දේවි පින්වතුන්

වහන්සේ ගේ මෑණියෝ යි. මෙයින් කළුරිය කළ ගෞතම ගෝත්‍රජ වූ ඕ තොමෝ දෙව් ලොවැ ඉපිද දේව සමූහයා පිරිවරා මහත් සැප විඳී'

යන ආදීන් ගමන වර්ණනා කොට කිඹුල්වත් පුරයට වඩින්නට ආයාචන කෙළේ ය.

**කිඹුල්වත බලා පිටත් වීම මැදින් දින මැදි පෝද, කිඹුල්වත් පුරයට පැමිණීම වෙසක් පසළොස්වක් ද**

භාග්‍යවතුන් වහන්සේ සිය ගමනින් වන මහදහිවෑඩිය දැක අංග මගධ දෙරටින් පැවිදි ව රහත් වූ දස දහසක් පමණ වූ ද, කිඹුල්වතින් අවුත් පැවිදි වූ දස දහසක් පමණ වූ දැයි විසිදහසක් වූ රහතුන් පිරිවරා පිටත් වූ සේක්, මහ දී බොහෝ දෙනා තමන් වහන්සේ ගෙන් බණ ඇසීම් ආදියෙන් අපමණ වැඩ සිදු කැරැගන්නා බැවින් පා ගමනින් ම දවසකට යොදුන බැගින් දෙ මසකින් වැඩ වෙසක් පසොළොස්වක් ද කිඹුල්වත් පුරයට සම්ප්‍රාප්ත වූ සේක. මේ කාලයෙහි කාළුදයි තෙරණුවෝ සියලු මැ දිනයෙහි සෑඩියෙන් කිඹුල්වත් පුර රජගෙට ගොස් දන් වළදා රජ ගෙයින් භෝජන පාත්‍රය බැගින් ගෙනවුත් භාග්‍යවතුන් වහන්සේට පිළිගැන්වූහ. ඒ ඒ ගමනේ දී භාග්‍යවතුන් වහන්සේ වැළැඳූ ආහාරය විය.

**න්‍යග්‍රෝධාරාමයට පැමිණීම යමා පෙළහර පෑම වෙසක් පුණු පෝද**

දිනපතා රජ ගෙට කලින් යමින්, බුදු ගුණ කියමින්, ඒ ස්ථවිර තෙම බුදුරජාණන් වහන්සේ ගේ නෑ සමූහයා උන්වහන්සේ කෙරෙහි පැහැද වූයේ ය. පැහැදුණු ශාක්‍යයෝ බුදුරජාණන් වහන්සේ වැඩි විට විසීම පිණිස **නිග්‍රෝධ** ශාක්‍යයාගේ උයන පිළියෙල කළහ.

බුදුරජාණන් වහන්සේ නගරයට වඩින විට සුවඳ මල් ආදිය ගෙන පෙර මහට යන ශාක්‍යයෝ මනා ලෙස සැරසුණු නගරවාසී ළදරු ළදැරියන් පළමු කොට ඉදිරියට යැවූහ. ඔවුනට පසු ව රජ කුමර කුමරියෝ ගමන් කළහ. රජහු ඔවුනට පසු ව තුමූ ම සුවඳ මල් ආදියෙන් පූජා කරමින් භාග්‍යවතුන් වහන්සේ නිග්‍රෝධාරාමයට වැඩම කරවා ගෙන ගියහ. බුදුරජාණන් වහන්සේ ද විසි දහසක් පමණ රහත්තු ද පනවා තුබුණු අසුන්හි වැඩහුන්හ. ස්වභාවයෙන් ම මානාධික ශාක්‍යයෝ 'සිදුහත් කුමරු අපට වයසින් බාලය. අපේ බැනණුවෝ ය, අපේ මුණුබුරෙකි' යන ආදීන් සිතනුවෝ තුමූ නමස්කාර නො කොට ළදරු කුමර කුමරියන් ලවා ම නමස්කාර කැරැවූහ.

ඔවුන් ගේ අදහස් දත් සර්‍වඥයන් වහන්සේ මාන මර්දනය කළ යුතු යැ යි සලකා, අභිඥපාදක[136] ධ්‍යානයට සමවැද ඉන් නැගිට අහස් නැඟ මහ පෙළහරක් දැක්වූ සේක. ඒ දුටු ශුද්ධෝදන රජතුමා 'පින්වතුන් වහන්ස, ඔබ උපන් දින අසිත තවුසා වන්දවන්නට එළවූ ඔබ ගේ පාද පෙරළී ඔහුගේ ජටා මස්තකයෙහි පිහිටියා දැක ඔබ වැන්දෙමි. ඒ මගේ පළමු වැඳීම යි. වප් මගුල් දින දඹ සෙවනැ සිරි යහනෙහි දී ඔබේ පෙළහර දැක දෙවෙනි වැඳීම කෙළෙමි. දැන් මින් පෙර කිසි කලෙකත් නොදුටු විරූ මේ පෙළහර දැක ද ඔබේ පා වඳිමි. මේ තුන් වන වැඳීම යැ'යි කියා බුදුරජාණන් වහන්සේට නමස්කාර කෙළේ ය. ඒ දුටු කිසි ද ශාක්‍ය රජකු විසින් නොවැඳ සිටිය හැකි නො වූයෙන් සියල්ලෝ ම උන්වහන්සේ වැන්දහ.

**මල්ල රජ කුමරුන් සිවු දෙනෙකුන් පැවිදිවීම**

පාවා නුවර මල්ල රජුන් සිවු දෙනෙකු ගේ පුත්‍ර වූ **ගෝධික සුබාහු වල්ලීය උත්තිය** නම් මිත්‍ර කුමරහු කිසි කටයුත්තක් නිසා ඒ දිනවල එහි විත් සිටියෝ එද භාග්‍යවතුන් වහන්සේ දැක් වූ පෙළහර දැක පැවිදි වූහ. විදසුන් වඩා නොබෝ දිනෙකින් රහත් වූහ.

**වෙස්සන්තර ජාතකය දෙසීම**

මෙසේ භාග්‍යවතුන් වහන්සේ නෑයන් ලවා වන්දවා ඔවුන් ගේ මානය බිඳ, පසඟවන ලද අස්නේ වැඩහුන් සේක. සියලු නෑ රජහු ද සඟහුන් ලීලායෙන් හුන්හ. එකල මහත් මල් වැස්සෙක් වට. ඒ මුල්කොට ගෙන භාග්‍යවතුන් වහන්සේ **වෙස්සන්තර** ජාතකය[137] වදළ සේක. ධර්ම කථාවසානයේ සියල්ලෝ වැඳ තමන් ගෙවල් කරා ගියහ.

---

## සත් විසි වන පරිච්ඡේදය

**වෙසක් අව පැලවිය ද**

බුදුරජාණන් වහන්සේ නෑයනට එද වදළ බණ ඇසූ ශාක්‍ය රජහු පෙරළා සිය නිවෙස් යන්නෝ ධර්ම ශ්‍රවණ ප්‍රීතියෙන් මත් වූවෝ, පසු ද දනට පැවරීමට සිහිමඳ ව ගියහ. භාග්‍යවතුන් වහන්සේ එද රෑ නිග්‍රෝධාරාමයෙහි දවස් යැවූ සේක.

**භාග්‍යවතුන් වහන්සේ කපිල පුරයෙහි පිඬු සිඟීම, යශෝධරාව සුදෙවුන් රජුට දැන්වීම**

පසු ද භික්ෂාචාර වේලාව පැමිණි විට විසිදහසක් රහතුන් පිරිවරා **කපිලවාස්තු පුර** වැද වහසල් දෙර සිට ගෙපිළිවෙළින් පිඬු සිඟා වැඩි සේක.

නුවර වැසියෝ ප්‍රසාදයන්හි සී මැදුරු කවුළු හැර 'අප ස්වාමි වූ සිද්ධාර්ථ කුමාරයෝ පිඬු සිඟති' යි විස්මය ප්‍රාප්ත ව බලා ගත් වණම උන්හ.

**යශෝධරා දේවී** භාග්‍යවතුන් වහන්සේ පිඬු සිඟා වඩනා පුවත්තිය අසා මේ මගේ ස්වාමි පුත්‍රයෝ පෙර මෙ නුවර රන්වන් රිය නැඟී සුසැටක් ආභරණ පැලැඳ මිණි රැසින් දිලෙන මහඟු වොටුන්නක් හිස ලා ලක්ෂයක් අගනා මුත්හරෙකින් උරමඩල සරහා දේවේන්ද්‍ර ලීලායෙන් මහ පෙළහරින් වැඩියෝ, දැන් කෙස් දැළි රවුළු ගා දමා, කසාවත් හැඳ පෙරව, පාත්‍රයක් අතින් ගෙන පිඬු සිඟත් ල. කිමෙක ! ඒ වෙස ඔබට හොබී දෝ නැද්දෝ' යි මා බැලුව මනා යැ'යි සිතා, සී මැදුරු කවුළුව හැර බලන්නී, ෂඩ්වර්ණ බුද්ධ රශ්මි මාලායෙන් දිලිසෙමින් ස්වීය ශරීරාලෝකයෙන් මුළු වීථිය හොබවමින් අනුපමෙය ශ්‍රීන් විරාජමාන ව වඩනා සාමිදරුවාණන් වහන්සේ දුටුවා ය. දැක ප්‍රීතියෙන් මත් වැ

**"අහෝ සිද්ධාර්ථයෙනි, එදා මධ්‍යම රාත්‍රියෙහි මා වැනි පක්ෂපාත ස්ත්‍රියකටත් නො දන්වා රාහුලයා වැනි ප්‍රිය දරු පැටියා දැක, අත ගා සිඹ සනසාලීම් පමණකුත් නො කොට, පලා ගියේ මෙ වැනි ආශ්චර්ය ශ්‍රියක් ලබනුවට වේ ද! මෙ බඳු ශරීර ප්‍රභාවක් පතා ඔබ ගිය දැ ද! මෙ බඳු ශාන්ත පිරිසක් බලා ගිය දැ ද! මේ නුවරත් රාජ්‍යශ්‍රියත් හැර ඔබ ගිය ගමන නම් යහපත් ම ය.! රාජශ්‍රිය හැර ඔබ මහණ වූ නියා යහපත්මය.! ඔබ ලත් සැප ඔබට හොබීමය. පෙර ඔබ වින්ද රාජ්‍ය ශ්‍රියට වඩා ඔබගේ මේ සිහන රාජ්‍යය මට නම් ඉතා රුචි යැ"යි** කියා ගාථා අටෙකින් කෙසග පටන් නිය අග තෙක් භාග්‍යවතුන් වහන්සේ ගේ රූපය වර්ණනා කොට, සිය මයිලණුවන් සුදොවුන් මහ රජාණන් කරා දිවැ, 'ඔබ පුතණුවෝ වීථියෙහි පිඬු සිඟා යෙති'යි කීවා ය.

**බුදු රජුන් හමු ව කථා කිරීම**

රජ ඒ බස් අසා කලබල වී සළුව හදිමින් ම යුහුසුළු වැ ගොස්, බුදුරජාණන් වහන්සේ ඉදිරියේ සිට, 'ස්වාමීනි, අපට ලජ්ජා ඇති කරවන්නේ ඇයි ද ? සිඟා ඇවිදින්නේ කුමට ද ? මේ භික්ෂු පිරිසට රජ ගෙයින් ආහාර ලැබිය නො හැකි යැ යි රටට අහවන සේක්දැ'යි ඇසී ය.

එවිටැ 'මහරජ, මේ අපේ වංශයේ සිරිත යැ'යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

'ස්වාමීනි, අපේ වංශය නම් මහා සම්මත ක්ෂත්‍රිය වංශය යි. එහි පිඬු සිඟා ඇවිද්ද කිසි රජෙක් නො වී යැ'යි රජ කීය. එවිට බුදුරජාණන් වහන්සේ,

'මහරජ, ඒ ඔබේ වංශය යි. අපේ වංශය නම් දීපංකර කොණ්ඩඤ්ඤ ආදී බුදුවරයන් ගේ වංශය යි. ඒ බුදුවරු ද සෙසු ඉත් පෙරැ සිටි නොයෙක් දහස් ගණන් බුදුවරු ද පිඬු සිඟා හැසුරුණෝ ය. පිඬු සිඟීමෙන් ම දිවි පැවැත්වූවෝ යැ'යි වදාරා වීථිය මැද සිට මැ රජුට දහම් දෙසන සේක්,

**රජුට බණ දෙසීම**

'නැඟී සිටින්න, පමා නො වන්න, සුචරිත ධර්මය පුරන්න, ධර්මචාරී තෙම මෙ ලොවැ ද පරලෙව්හි ද සුවසේ වෙසේ'[138] යැ යි වදාළ සේක.

මේ ධර්ම කථාව ඔස්සේ සිත යැවූ රජතුමා එහි සිටියේ ම සෝවාන් වී ය.

**සුදෙවුන් රජු සකෘදගාමී වීම ප්‍රජාවතී ගොතමී සෝවාන් වීම**

ඉක්බිති රජ්ජුරුවෝ භාග්‍යවතුන් වහන්සේගෙන් පාත්‍රය ලබාගෙන බුඬ ප්‍රමුඛ විසි දහසක් රහතුන් මාලිගාවට වැඩම කරවා ගෙන ගොස්, වඩා හිඳුවා දන් වැළැඳවූහ. වළඳා අන්තයෙහි භාග්‍යවතුන් වහන්සේ අනුමෙවෙනි බණ වදාරණ සේක්.

'සුචරිත ධර්මය පුරුදුකළ යුතු. දුසිරිතෙක් ලොව වේ ද, ඒ නො ම කළ යුතු. මෙසේ ධර්ම චාරී වූ පුද්ගල තෙම මෙ ලෝ පර ලෝ දෙක්හි ම සුව සේ කල් ගෙවා"[139] යැ යි වදාළ සේක.

එය අසා ශුඬෝදන රජ්ජුරුවෝ සකෘදාගාමී වූහ. ප්‍රජාවතී ගෞතමී දේවී සෝවාන් වූහ.

**නාටිකාවන්ගේ වන්දනා**

ඉක්බිති බෝසත් කලැ නාටිකා වැ සිටි රජ කුමරියෝ අවුත් භාග්‍යවතුන් වහන්සේ වැන්දහ.

ශුඬෝදන රජ්ජුරුවෝ යශෝධරාවට ද අවුත් වඳින සේ දන්වා යැවූහ. එය ඇසූ යශෝධරා තොමෝ,

**බුදු රජුන් යශෝධරාව දක්නට වැඩීම**

'සිඬාර්ථ කුමාරයෝ ඉතා දැඩි සිතැත්තෝ ය තපසට යන්නෝ නොකියා සොරා ම ගියහ. මා උන්වහන්සේට පක්ෂපාත වැ වුසුවා සැබෑ නම්, උන් වහන්සේ ම මගේ ගෙටත් වඩනා සේක. වැඩි කලැ ම වඳින්නෙමි'යි කියා නොගියා ය. ශුඬෝදන රජහු මෙ පවත් භාග්‍යවතුන් වහන්සේට සැළ කළහ. එවිට

භාග්‍යවතුන් වහන්සේ ඇය පෙරැ තමන් වහන්සේට පාරමී පිරීමට සහාය වූ නියාව සලකා, පිය රජුට පාත්‍රය දී ඔහු පළමු ව යවා තමන් වහන්සේ දෑගසව්වන් කැටුව යශෝධරාව ගේ ගෙට වැඩි සේක. එසේ වඩනා සාමිදරුවෝ දෑගසව්වන් අමතා, යශෝධරාව තමන් වහන්සේ කෙරෙහි බැඳගත් ප්‍රේමය ඇති බවත්, ඇය කෙලෙසුන් නසන තුරු ඇගේ ම චරිතයෙන් සතුටු කරවන්නට තමන් වහන්සේ ගේ අදහස ඇති බවත්, අද ඇයට තමා රිසි සේ හඬන්නට ඉඩ නැරියොත් ශෝකයෙන් ළය පැළී මියෙන බවත්, අස්වැසිල්ලක් ලදොත් ඇය සසුන් වැද අමා මහ නිවන් ලබන බවත්, එ හෙයින් රිසි සේ අඬා වැලැප ශෝකය නිවා ගන්නා තුරු කිසිවකු ඇය නවතන්නට උත්සාහ නො කළ මනා බවත් වදාළ සේක.

**යශෝධරාවන්ගේ ගෞරවාදරය**

යශෝධරා දේවී භාග්‍යවතුන් වහන්සේ තමාගේ ගෙට වඩනා බව අසා, කසාවත් හැඳ පෙරෙවැ බලා සිටියා ය. භාග්‍යවතුන් වහන්සේ දෑගසව්වන් හා එහි වැඩ, පණවා තිබුණු අසුන්හි හුන් සේක. යශෝධරා තොමෝ දෘඪ ප්‍රෙමය රඳවා ගත නො හී භාග්‍යවතුන් වහන්සේ ගේ පා මුලැ වැටී ගොප් මස අල්ලා ගෙන හඬ හඬා වැන්දා ය. ඇය පියකු ගේ පා අල්ලා හඬන දුවක කොට සලකා භාග්‍යවතුන් වහන්සේ මහා කරුණායෙන් තුෂ්ණීම්භූත ව හුන්සේක. මඳ වෙලාවකින් සිහි ලත් ඕ තොමෝ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහිත්, මයිල් රජහු කෙරෙහිත් ලජ්ජායෙන් තමා කළ දෑ සිහි කොට බියෙන් පසකට වී උන්හ.

රජ්ජුරුවෝ 'ඕ බුදුරජාණන් වහන්සේට අනාදරයක් කළ හැකි'යි කීය ව 'ඇයට කමවමි' යි සිතා යශෝධරාවන් ගේ ගුණ කියන්නෝ.

'ස්වාමීනි, මගේ දූ ඔබ කසාවත් හැඳ පෙරෙවැ ගත් බව අසා, තොමෝ ත් එ තන් සිට අලංකාර වස්ත්‍රාභරණ පාවිච්චි නො කොට කසා වත් ම හැඳ පෙරැවූවා ය. එක් වේලේ වළඳනු අසා තොමෝත් එක් වේලක් ම වළඳන්නියක් වූවා ය. ඔබ උස් අසුන් මහ අසුන් පාවිච්චිය හළබව අසා තොමෝත් උසසුන් මහසුන් අත්හැරියා ය. ඔබ මල් ගඳ විලෙවුන් හළ බව අසා තොමෝත් එය අත් හැරියාය. සම කුලයෙහි කුමාරයන් ඇය සරණ පාවා ගැන්මට අසා එවූ නමුත් ඕ ඒ කිසිත් නො පිළිගත්තා යැ'යි කීහ. එ විටැ බුදුරජාණන් වහන්සේ මේ කාරණය මුල් කොට ගෙන **චන්ද කින්නර ජාතකය**[140] වදාළ සේක.

**යශෝධරාවන් මහණ වන්නට අදහස් කිරීම**

රැස්ව සිටි නැයෝ යශෝධරාවන්ගේ ගුණ අසා ඇයට සාධුකාර දුන්හ. යශෝධරාවෝ ද නිශ්ශෝක වැ සතුටින් පිනා ගියහ. එදවස් ම මහණවනු කැමැති වූහ. භාග්‍යවතුන් වහන්සේ, මෙහෙණි සස්නට ඇය පළමුයෙන් නො ගත යුතු බවත්, මතු කුඩා මෑණියන් විසින් ම ඒ තනතුරු ලැබිය යුතු බවත් සලකා, ඇගේ ඉල්ලීම නො පිළිගත් සේක. රජ්ජුරුවෝ ද කරුණු කියා ඇය නවතා ලූහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ තැනින් නික්ම නිග්‍රෝධාරාමයට වැඩි සේක.

# අට විසි වන පරිච්ඡේදය

**නන්ද කුමරු පැවිදි කිරීම බුඩත්වයෙන් දෙ වැනි වසැ අව තියවක් ද.**

පසු දා **නන්ද** කුමරුගේ රාජාභිෂේක මංගලය ද, ගෙවදින මංගලය ද, සරණ මංගලය දැ යි උත්සව තුනෙක් විය. ඒ දිනැ භාග්‍යවතුන් වහන්සේ නන්ද කුමාරයාගේ මාලිගාවට වැඩ දන් වළඳා, **මංගල ධර්මය**[141] දේශනා කොට, නන්ද කුමරු අතට පාත්‍රය දී පෙරාතුව වැඩි සේක. කුමර තෙම 'බුදුරජුන් දැන් දැන් පාත්‍රය ගනිතැ'යි සිත සිතා නො කැමැත්තෙන් ම යන්නේ උන්වහන්සේ කෙරෙහි ඇති මහද් ගෞරවයෙන් කිසිත් නො කියා නිශ්ශබ්දව ම පස්සෙන් ගියේ ය. නන්ද කුමරුට සරණ පාවා දීමට නියමිත වූ **ජනපදකල්‍යාණි** කුමරි ඒ දැක, 'ස්වාමි පුත්‍රයාණනි, වහා ම අව මැනවැ' යි කියා බෙල්ල දිගු කොට නන්ද කුමරු දෙස බැලූවාය. මේ කථාව කුමරු ගේ සිත්හි තදින් වැදී ගියේ ය. එහෙත් කුමර තෙම 'පාත්‍රය ගත මැනැවැයි කීමට නො හැක්කේ බුදුරජාණන් වහන්සේ අනුව විහාරයට ම පැමිණියේ ය. එහි දී භාග්‍යවතුන් වහන්සේ 'නන්දය, මහණ වන්නෙහි දැ'යි ඇසූ සේක. හෙතෙම ජනපද කල්‍යාණිය කෙරේ ප්‍රේමයෙන් එයට නො කැමැති වීත්, බුඩ ගෞරවයෙන් ඒ බව නො කියා, 'එසේ ය, මහණ වෙමි'යි කීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහු මහණ කළ සේක. මෙසේ කිඹුල්වත් පුරයට බුදුරජාණන් වහන්සේ වැඩි තුන් වන දා **නන්ද** කුමරු ගේ ප්‍රව්‍රජ්‍යාව විය. මේ වනාහි බුඩත්වයෙන් දෙවෙනි වර්ෂයෙහි වෙසක් මස අව දියවක් දා ය.

**රාහුල කුමරුන් මහණ කිරීම. බුඩත්වයෙන් දෙවෙනි වසැ සැටවක් ද**

භාග්‍යවතුන් වහන්සේ, කපිලවාස්තු පුරයට වැඩීමෙන් සත් වන දවසෙහි භික්ෂු පිරිස පිරිවරා රජ ගෙට වැඩ, දන් වැළඳූ සේක.

යශෝධරා දේවී සත් හැවිරිදි වූ රාහුල කුමරුවා මනා කොට හඳවා පලඳවා 'පුත, විසි දහසක් ශ්‍රමණයන් වහන්සේ විසින් පිරිවරන ලදුව, රන් පැහැයෙන් බබලමින් තෙල වැඩ ඉන්නේ නුඹේ පියා ය.'[143] යන ආදීන් කියා පියා සතු ධනය ඉල්ලනු පිණිස භාග්‍යවතුන් වහන්සේ කරා යැවූ ය. හේ ද එහි පැමිණ ඉතා සතුටු සිතැති ව පිතෘස්නේහයෙන් 'ශ්‍රමණයන් වහන්ස, ඔබ වහන්සේගේ සෙවණ මට ඉතා සැප යි' යන ආදීන් නොයෙක් සුරතල් බස් කියමින් සිටියේ ය. භාග්‍යවතුන් වහන්සේ දන් වළඳා අන්තයෙහි අනුමෝදන බණ වදාරා, හුනස්නෙන් නැඟිට වැඩිසේක. රාහුල කුමාර තෙම 'ශ්‍රමණයන් වහන්ස, මට දායාද්‍යය දුන මැනවැ'යි කියමින් භාග්‍යවතුන් වහන්සේ පසු පස්සෙන් ගියේ ය. පස්සෙන් එන කුමරහු භාග්‍යවතුන් වහන්සේ නො ම නැවැත්වූසේක. බලා සිටි පිරිස ද කුමරු ගේ ගමන නැවැත්වීමෙහි නො හැකි වූහ. මෙසේ කුමරු භාග්‍යවතුන් වහන්සේ සමග විහාරයට ම ගියේ ය. භාග්‍යවතුන් වහන්සේ 'මා බෝ මැඩ දී ලත් සප්ත විධ ආර්‍ය්‍ය ධනය මොහුට දෙමි. ලෝකෝත්තර දායාද්‍යයට මොහු හිමි කරන්නෙමි'යි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ අමතා රාහුල කුමරු මහණ කිරීමට නියෝග කළ සේක.

'වහන්ස, කෙසේ රාහුල කුමරුවන් මහණ කරම් දැ?'යි සැරියුත් තෙරණුවෝ ඇසූහ. තිසරණ ගැන්වීමෙන් සාමණේර ප්‍රව්‍රජ්‍යාව[144] සිදු කරන ලෙසට භාග්‍යවතුන් වහන්සේ අවසර දුන් සේක. ඉක්බිති මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ කුමරුන් ගේ හිස කේ බා කසා වත් හඳවා තිසරණ සමාදන් කැරවූ සේක. මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ අවවාදාචාර්‍ය්‍ය වූ සේක. ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ උපාධ්‍යාය වූ සේක.

රාහුල කුමරුන් පැවිදි කිරීම සුදොවුන් රජු ගේ බලවත් කනගාටුවට හේතු වී ය. එ බැවින් රජහු බුදුරජාණන් වහන්සේ වෙත එළැඹ වැඳ, එක් පසෙක හිඳ මා පියන් ගේ අවසර නැති ව දරුවන් මහණ නො කරන ලෙස වරයක් ඉල්ලූහ. ශික්ෂාපදයක් පැණැවීමට මේ ආයාචනය බලාපොරොත්තුව හුන් බුදුරජාණන් වහන්සේ එයට ද අනුකූල වූ සේක. ඉක්බිති කාලෝචිත ධර්මාවවාදයෙන් රජුන් සතුටු කොට පින් දහම් කිරීමෙහි උත්සාහවත් කළ සේක. රජ බණ අසා සතුටු ව වැඳ නික්ම ගියේ ය. ඉන් පසු බුදුරජාණන් වහන්සේ භික්ෂූන් රැස් කරවා අවවාදානුශාසන කොට **'මහණෙනි, මා පියන්ගෙන් අවසර නො ලත් දරුවා මහණ කළ යුතු නොවේ යැ'** යි වදාළ සේක.

**මහා ධම්පාල ජාතකය දේශනා කිරීම, රජ අනාගාමී වීම**

බුදුරජාණන් වහන්සේ පසු දා උදයෑ රජ ගෙට වැඩි සේක. දන් වළඳා නිමැවූ විට සුදොවුන් රජහු භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණ,

**බුද්ධත්වයෙන් දෙවෙනිවසෑ වෙසක් අව සතවක් ද**

'වහන්ස, ඔබ දුෂ්කර ක්‍රියා කරන කාලයෙහි දිනක් එක් දේවතාවක 'මහරජ, තොප පුත්‍රයා මළේ ය' යි කී නමුත් 'මගේ පුත්‍රයා බුදු නො වී කළුරිය නො කෙරෙති'යි කියා ඒ දේවතාවාගේ කථාව නො පිළිගතිමි'යි කීහ. එ විට බුදුරජාණන් වහන්සේ,

'මහරජ, දැන් එ බඳු වචනයක් ඔබ කෙසේ නම් අදහත් ද? පෙර කලෙක 'මේ මළා වූ තුඹේ පුත්‍රයා ගේ ඇට කැබලි යැ'යි අනෙකකු විසින් පෙන්වා කරුණු කී කල්හිත් ඒ වචන ඔබ නො ම ඇදහූහ'යි වදාරා ඒ ප්‍රවෘත්තිය විස්තර කිරීම් වශයෙන් **මහා ධම්පාල ජාතකය**[145] වදාළ සේක. ධම් කථාවසානයේ දී රජහු අනාගාමී ඵලයෙහි පිහිටියහ.

**යශෝධරාවන්ගේ ශෝකය, ඇය පැවිදිවන්නට සැරැසීම**

භාග්‍යවතුන් වහන්සේ රාහුල කුමරු මහණ කැරැ වූ බව ඇසූ යශෝධරාවෝ දරු සෙනෙහසින් හටගත් ශෝකය ඉවසා ගත නොහී,

'ම පුතණුවන් මගෙන් උදුරා ගත් බැවින් මම ගිහි ගෙයි නො වසමි. මහණ වෙමි'යි සැහැසි වූහ.

ඒ අසා සුදොවුන් රජ්ජුරුවෝ ඇය කරා ගොස් මෙ සේ ඔවා දුන්හ.

**සුදෙවුන් රජු යශෝධරාවනට අවවාද කොට සනසාලීම**

'ලෙහෙළිණියෙනි, එදා වදාළ වෙස්සන්තර ජාතකයෙහි තොප වැදූ දරුවන් පූජක බමුණාට බැඳ දුන් කල පවා තොප දරු ශෝකය ඉවසා සිටි බව නො ඇසුවහු ද? දානපාරමිතාව පුරන අනන්ත ජාතීන්හි තොප වැදූ දරුවන් ඉල්ලා ආවුනට බැඳ දුන් වැල් පමණක් ගොඩ කළොත් මේරු පර්වතයටත් වඩා උස් වන බව වදාළා නො ඇසුවහු ද? මේ කිසි තැනෙක දී තොප දොම්නස් නොවූ බව වදාළා නො ඇසුවහු ද? මෙසේ කලැ දැන් උන් වහන්සේ බුදු වී, සිය පියා වූ මාත් ඇතුළු සකල ලෝකවාසීන් දරු කොට ගත් කලැ, තමන්ගේ ම දරුවා මහණ කැරැගත් බව ගැන කවර දොසක් කියමෝ ද ? රාහුල කුමරුන් මහණ කැරැවූ බව අසා අද මම උන්වහන්සේ කරා ගියෙමි.

ගොස් උන්වහන්සේ ගේ ධම් කථාව අසා, තොපට තවත් පුතකු නො සිටින හෙයින් මිස, සිටියි නම් ඔහුත් උන්වහන්සේ වෙතැ පැවිදි කරවා ලනු කැමැති වීමි. අද තෙපි ඒ බණ ඇසුවහු නම් මහණ කරවන්නට තවත් පුතක්හු ඇතොත් කොතරම් යසෙක් දැ'යි සිතන්නාහු ම ය. පෙරැ බොහෝ දරුවන් දන් දුන් උන්වහන්සේට දැන් එක පුතකු තිවන් සැප වින්දැවීමට තමන් වහන්සේ වෙතට ගැන්ම ගැන තොප ශෝක කිරීම අයෝග්‍ය ය. ඒ තොප වැන්නනට සුදුසු නො වේ. තොප පුතුට හොඳක් ම උන්වහන්සේ කළ සේක. පුත්‍රයා මහණ වී සිය පියාණන් ළඟ, සඳු පස්සේ යන නකත් තරුවක් සේ, සිටින්නාහු දක්නා දරුවන් ඇතියවුනට ලොවැ තවත් එ වැනි සතුටෙක් කොයින් ද ? තව ද ලෙහෙළිණියනි, මේ කාරණයෙහිදි තොප මහණ වුවොත් 'එය සැදැහැයෙන් නො වේ. දරු සොවින් ම කළ එකෙකැ'යි ලෝවැසි තෙම තොප හෙළා දකී. එ බැවින් දැන් ම මහණ නො වව.'

මෙ සේ කියා ඇගේ ශෝකය ද නිවා මහණ වියැ නොදී ඇය රඳවා ගත්හ.

**භාග්‍යවතුන් වහන්සේ කපිල පුරයෙන් නික්මීම.** භාග්‍යවතුන් වහන්සේ නො බෝ කලෙකින් ම කපිලවාස්තු පුරයෙන් නික්ම මල්ල රටට පැමිණ එහි සැරිසරන සේක්, අනෝමා නදී තීරයෙහි වූ අනුපිය නිගමයට සම්ප්‍රාප්ත වැ එහි අඹ වනයෙහි වසන සේක.

**භද්දියාදි ශාක්‍ය කුමරුවන් පැවිදි වීම.** ශුද්ධෝදන රජ්ජුරුවන් විසින් මෙහෙයන ලද ශාක්‍ය රජුන් විසින් යැවුණු කුමරුවෝ බොහෝ දෙනෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදි වූහ. ඉක්බිති තව ම නො පැවිදි ව සිටි **භද්දිය, අනුරුද්ධ, ආනන්ද,*** **භගු, කිම්බිල, දේවදත්ත** යන ශාක්‍යයන් සදෙනා දැක, පැවිදි වූවන් ගේ මා පියෝ 'මොවුන් බුදුනට නො නෑ හෙයින් වේද පැවිදි නො වන්නේ යැ'යි දොස් නැඟූහ. ඉක්බිති ඔහු ස දෙන සතියක් දෙවියන් සේ රජ සිරි විඳ අට වන දා උපාලි කපුවා එක්ක මහ සෙනඟින් පිරිවැරුණෝ කිඹුල්වතින් නික්ම ගියහ. ශාක්‍ය කෝලිය ජනපද ඉක්මී තැන දී සෙනඟ පෙරළා එවා ඔහු සත්දෙන අනුපිය අඹ වනයට වැදැ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ පැවිදි වූහ.

---

* මහායාන පොත්වල දැක්වෙන පරිදි ආනන්ද කුමරු හැමට ම බාලය. රාහුල කුමරාට සම වයසේ වූයේ ය. පාලි පොත්හි දැක්වෙනුයේ බෝසතාණන් උපන් දින ම උපන්නකු හැටියට ය.

# නව විසි වන පරිච්ඡේදය

## දෙ වෙනි තෙ වෙනි වස් රජගහ පුර වේළුවනයෙහි

**භාග්‍යවතුන් වහන්සේ රජගහපුර වැඩීම, විසල්පුර වැඩීම.**

භාග්‍යවතුන් වහන්සේ ටික කලක් අනුපිය නිගමයෙහි වැස ඉන් නික්ම රජගහ පුරයට වැඩි සේක. මෙ සමයෙහි විසාලා මහනුවර රෝග අමනුෂ්‍ය දුර්භික්ෂ යන තුන් හේතුයෙන් හට ගත් උපද්‍රවයෙන් පෙළුණේ විය. විසාලා මහනුවර රජුහු බුදුරජාණන් වහන්සේ ගැන අසා මහාලී ලිච්ඡවී රජුත් පුරෝහිත පුත්‍රයාත් රජගහ පුර යවා භාග්‍යවතුන් වහන්සේට විසල්පුර වඩින්නට අයදැවූහ. ඔවුන් ආයාචනා පරිදි භාග්‍යවතුන් වහන්සේ මහ පෙරහැරින් එහි වැඩ, රතන සූත්‍රය දෙසා සෙත් කොට පුරය නිරුපද්‍රුත කළ සේක. මෙය වූයේ පොසොන් මාසයෙහි ය.

**පෙරලා රජගහ පුර වැඩීම**

මෙසේ අඩ මසක් පමණ කල් එහි වැස පෙරලා රජගහ පුරයට ම වැඩි සේක.

**දෙවැනි වස රජගහ පුර වේළුවනාරාමයෙහි**

වැසි කාලය පැමිණියෙන් බුඩත්වයෙන් දෙ වෙනි ඒ වර්ෂතුව රජගහපුර සමීපයෙහි වූ වේළුවනාරාමයෙහි ම ගත කළ සේක.

**සුමන මාලාකාර සමාගමය**

මෙ සමයෙහි සුමන මාලාකාරයා තමා රජු පිණිස ගෙන යන මලින් බුදුරජාණන් වහන්සේ පිදීය. රාජ දණ්ඩනය ද නො තකා බලවත් ශ්‍රද්ධායෙන් ඔහු කළ ක්‍රියාවට සතුටු වූ බිම්බිසාර රජ තුමා ඔහුට එකවගෙන් අට බැගින් ඇතුන් අසුන් දාස දාසින් හා මහත් පළඳනා ද, කහවනු අට දාහක් ද සියලු අලංකාරයෙන් සැරසුණු ස්ත්‍රීන් අට දෙනෙකුන් ද ගම්වර අටක් ද දුන්නේ ය.

මාලාකාරයා ගේ ඒ පුෂ්ප පූජායෙහි දී මහත් පෙළහර ඇති විය. මේ සියල්ල දුටු අනඳ හිමියෝ සුමන මාලාකාරයා ගේ මතු ගතිය විචාළහ. භාග්‍යවතුන් වහන්සේ ඔහු දෙව් මිනිස් සුව විඳ ගොස් මතු සුමන නම් පසේ බුදු වන බව වදාළ සේක.

සවස් වේලේ දම්සභා මඩුයෙහි රැස්වූ භික්ෂූන් විසින් සුමන මල්කරුවා සම්බන්ධයෙන් කළ කතාව ඇසූ භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසන සේක්,

යම් කර්‍මයක් කොට සත්ව තෙමේ නො තැවේ ද, යම් කර්‍මයෙක විපාකය හටගත් ප්‍රීති සොම්නස් ඇත්තේ විඳින්නේ ද, එබඳු වූ ම කර්‍මය කරන ලද්දේ මැනැව[145] යි වදාරා විස්තර කොට සිවු සස් දෙසූ සේක.

මේ දේශනාව අවසන්හි අසූ දහසක් ප්‍රාණීනට ධර්‍මාභිසමය වී ය.

වස් වැස පවරා සැරි සරන භාග්‍යවතුන් වහන්සේ **චේති** දේශයට වැඩ එහි ප්‍රාචීනවංශ මෘගදායයට පැමිණි මහජනයා සග මොක් මංහි පිහිටුවා ඉන් **භේසකලා** වනයට වැඩ, යළි රාජගෘහ පුරයට ම පෙරළා වැඩි සේක.

**පුණ්ණයන් පැවිදි වීම**

මෙ සමයෙහි **අඤ්ඤාත කොණ්ඩඤ්ඤ** තෙරණුවෝ කිඹුල්වත් ගොස් එහි **දෝණවත්ථු** ගමැ දී සිය බෑනණු **(මන්තානිපුත්ත)** පුණ්ණයන් පැවිදි කළහ. පුණ්ණයෝ කොණ්ඩඤ්ඤ තෙරුන් හා එන්නාහු කිඹුල්වත රැඳී කමටහන් වඩා රහත් වූහු. ඔවුන් වෙත කිඹුල්වත් වැසි කුලපුත්තු පන්සියයක් පැවිදි වූහු. තෙරණුවෝ ඔවුනට **දශ කථා වස්තුයෙන්** [146] ඔවා දුන්හ. ඒ අසා උහු හැම රහත් වූහු. ඉක්බිති තෙරුන් විසින් මෙහෙයන ලදුවෝ ඔහු භාග්‍යවතුන් වහන්සේ දක්නට ගියෝ ය. භාග්‍යවතුන් වහන්සේ ද ඔවුන් සුව දුක් විචාරා 'කොහි සිට එවුදැ' යි ඇසූ සේක. 'ජාත භූමියෙහි* සිට එම්හ' යි කීහ. 'ජාත භූමියෙහි කවරෙක් නම් දශ කථා වස්තු ලාභී ද' එහි *වැසි භික්ෂූන් විසින් සම්භාවිත දැ?' යි භාග්‍යවතුන් වහන්සේ විචාළ සේක. 'මන්තානි පුත්ත පුණ්ණ තෙරණුවෝ යැ' යි ඔහු කීහු. මෙ කථාව අසා සිටි සැරියුත් තෙරණුවෝ පුණ්ණ තෙරුන් දක්නා කැමැති වූහු.

**තෙවෙනි වස රජගහ නුවර වේළුවනයෙහි**

භාග්‍යවතුන් වහන්සේ තෙවෙනි වර්‍ෂාවත් රජගහ නුවර වේළුවනයෙහි ම ගත කළ සේක. මෙ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ රජගහට නො දුරෙහි වුසූ ජම්බුක නම් අසූචි කන නග්න ආජීවකයකු දමනය කොට සසුන්හි පැහැද වූ සේක. හේ භාග්‍යවතුන් වහන්සේ ගේ ධර්‍ම කථා ශ්‍රවණයෙන් රහත් වූයේ ඒහි භික්ෂුප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වී ය.

**ජම්බුකාජීවක සමාගම**

මේ වනාහි ජම්බුකාජීවකයාට ප්‍රසන්න වැ සිටි අඟු මගද දෙ රට වැසි බොහෝ ජනයා ඔහුට සත්කාර ගෙන ආ දවස ය. භාග්‍යවතුන් වහන්සේ වෙත ජම්බුකයන් ඉන්නා දුටු මහජනයාට 'මෙ දෙදෙනා ගෙන් කවරෙක් මහත් දැ?' යි සැක ඇති වී ය. ඔවුන්ගේ පරිවිතර්කය දත් භාග්‍යවතුන් වහන්සේ ජම්බුක තෙරුන් අමතා,

* ජාතභූමිය නම් කිඹුල්වත් පෙදෙස යි.

'එ පිරිසේ සැකය දුරු කරව'යි වදාළ සේක. තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ ගේ පාමුලැ වැතිර වැඳ තමන් ශ්‍රාවක බව දැන්වූහ. ඒ ඇසූ මහජනයා බුඩ ගුණයේ මහත් බව ගැන පුදුමයට පත් වූහ. භාග්‍යවතුන් වහන්සේ ඒ පිරිස හා කථාව පටන් ගෙන, නොකා නො බී තපස් රැකීම නිෂ්ඵල ක්‍රියාවක් බව වදාරන සේක්,

**'දහම් පිරිසිඳ නො දත් යමෙක් මසකට වරක් තණ පත් කෙළවරින් බොජුන් බිඳක් ගෙන වළඳන්නේ නමුදු හෙතෙම සිවුසස් දහම් පිරිසිඳ දත් ආර්‍ය්‍ය පුද්ගලයන් ගේ සොළොස් වන කලාව පමණ වත් නො වටී** යැ' යි වදාළ සේක[147]

**අනේපිඬු සිටු භාග්‍යවතුන් වහන්සේ දක්නට යෑම**

එ සමයෙහි රාජගෘහික සිටුහුගේ සුහුරුබඩු වූ සැවැත් නුවර වැසි **සුදත්ත**[148] සිටු කිසි කාරියක් සඳහා රජගහ නුවරට පැමිණියේ ය. පෙර තමා එහි ආ දවස්වලැ මෙන් නො වැ එදා කටයුතු අධික බව ද රජගහ නුවර සිටු හට තමා හා පෙර සේ කතා බස් කැර කැර ඉඳීමට එදා කිසි අවකාශ පහසුවක් නැති බව ද සුදත්ත සිටු හට පෙනුණේ ය. 'පෙර මෙහි මා ආ විට, අන් මොන කටයුත්තක් වුව ද, ඒ ගැන වැඩිපුර නො සලකා මා හා සතුටු සාමීචි කතා බස් ඇති ව හිඳීම මොහුගේ සිරිත ය. අද එසේ නො කොට වැඩකාරයනට ඒ ඒ කටයුතු නියෝග කරමින් මෙ තෙම හැසිරේ. කිමෙක් ද? මෙහි කුමරකුට අන් තැනෙකින් කුමරියක පාවා ගෙන ඊමෙක් හෝ මෙහි කුමරියක අන් කෙනෙකුට පාවා දීමක් හෝ වන්නේ ද? නැතහොත් මහා පූජෝත්සවයක් ඇති වන්නේ ද? සෙට බලසෙන් සහිත වූ බිම්සර මහ රජුට මෙහි භෝජන සංග්‍රහයෙක් හෝ වන්නේ දැ?'යි අනේපිඬු සිටුහට විතර්කයෙක් විය.

රජගහ නුවර සිටු තෙම වැඩකරුවනට කටයුතු විධාන කොට අවුත් අනාථ පිණ්ඩික සිටුහු හා පිළිසඳර කතා කරන අතර අනේපිඬු සිටු ඒසා මහත් කටයුතු සම්පාදනයකට හේතුව විචාළේ ය. රජගහ නුවර සිටු තමා පසුදාට 'බුඩ ප්‍රමුඛ සංඝයාට දනට නිමන්ත්‍රණය කැර ඇති බවත් එ බැවින් එය සඳහා කටයුතු පිළියෙල කරවමින් උන් බවත් කීය. **'බුඩ'** යන වචනය කනැ වැටුණු පමණින් විස්මයට පත් **සුදත්ත** තෙම 'ගහපතිය, **බුඩ** යැ යි කියහිදැ?'යි ඇසීය. 'එසේ ය, බුඩ යැ යි කියමි'යි රජගහ නුවර සිටු කී ය. දෙවෙනි වරත් තෙවෙනි වරත් සුදත්ත සිටු පළමු සේ ම ඇසී ය, දෙවෙනි තුන් වන වාරයන්හිත් රජගහ නුවර සිටු පළමු සේ ම පිළිතුරු දුන. ඉක්බිති සුදත්ත සිටු 'ගෘහපතිය, **බුඩ** යන නම පවා ඇසීම දුර්ලභ යි. ඒ බුඩෝත්තමයාණන් දකින්නට දැන් යැ හැකි දැ?'යි ඇසී ය.

‘ගෘහපතිය, ඒ බුද්ධෝත්තමයාණන් වහන්සේ දක්නට යෑමට දැන් සුදුසු වේලාව නො වේ, හෙට උදෙන් ම උන් වහන්සේ දක්නට යෑ හැකි යැ’යි රජගහ නුවර සිටු කී ය. ඉන් පසු සුදත්ත තෙම ‘සෙට ඉතා උදෙන් ඒ බුද්ධෝත්තමයාණන් වහන්සේ දක්නට යන්නෙමි’යි අධිෂ්ඨාන කොට නිදා ගත්තේ රෑ තුන් විටක් ම ‘පහන් වී ඇතැ’යි සිතා නැගිට්ටේ ය. තෙවෙනි වාරයෙහි නැගී සිටි හෙතෙම බුදුරජාණන් වහන්සේ දක්නා පිණිස යනුයේ, නුවර පසු කොට සීවක වන දොරට පැමිණියේ ය. ඔහු එහි පැමිණි විට එහි දොර හැරුණේ ය. සීවක වනයටවත් කෙණෙහි ම කලින් වූ ආලෝකය අතුරුදහන් වී මහ කළුවරෙක් වී ය. ඒ දුටු සිටු තැති ගැන්මට, ලොමුදහ ගැන්මට පැමිණියේ ය. එ තැනින් එහා අඩියකුත් නො තබා ආපසු යන්නට අදහස් කෙළේ ය. එ කෙණෙහි ම,

**‘ලක්ෂයක් ඇතුන්, ලක්ෂයක් අසුන්, ලක්ෂයක් උතුම් අසුන් යෙදූ රථ, ලක්ෂයක් මිණිකොඬොල් ඈ පැලැඳි කන්‍යාවන් දීම බුඩාදි උතුමන් දැකීමට යෑමේදී එක් පියවරක් නැඟීමෙක සොළොස් වන කලාව පමණ වත් නො අගී ය’යි කිසිවකු කියන හඬෙක් ඔහුට ඇසිණ.** [149]

තවද ‘**ගෘහපතිය, ඉදිරියට යව, ආපසු ගියොත් යෙහෙක් නො වේ යැ’යි** කියන්නක් ද කනැ වැටිණ. අඳුරු දුරු වී ය. සිටු ද බිය සැක නැති ව ගියේ ය.

යළිත් අඳුර පැතිරිණ. සිටු බිය වැ පෙරළා යන්නට සිතීය. එ කෙණෙහි පළමු සේ ම ගමනේ අගයත් ඉදිරියට ම යන්නට කරන අවවාදයත් ඇසීය, අඳුරත් දුරු වි ය. බිය දුරු ව ගියෙන් සිටු ඉදිරියට ම ගියේ ය.

තෙවෙනි වර ද අන්ධකාර වී ය. බියටත් සැකයටත් පත් සිටු පෙරළා යමැ යි සිතී. එහෙත් එ කෙණෙහි ම පළමු සේ ම ඉදිරියට යෑමට නියෝගයත් යෑමේ යහපතත් කියනු ඇසුණෙන්, අඳුරත් දුරු ව එළිය වැටුණෙන්, මහ ඔස්සේ ම ගියේ අලුයම් වේලෙහි ශීත වනයට පැමිණියේ ය. සිරිත් පරිදි අලුයමැ නැගී සිට සක්මනේ යෙදුණු භාග්‍යවතුන් වහන්සේ ඈත එන සිටුහු දැක, සක්මන් මලුයෙන් බැස, භික්ෂූන් පණවා දුන් ආසනයේ වැඩ හුන් සේක. භාග්‍යවතුන් වහන්සේ වැඩ හිඳ ම ‘සුදත්ත, මෙහි එන්නැ’යි ඇමැතූ සේක. සිටු තෙම ‘බුද්ධෝත්තමයාණෝ මගේ නමින් මට හඬ ගසති’යි සතුටු ව භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ පා මුලැ හිස තබා වැතිර වැඳ ‘ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ, සුව සේ සැතැපුණු සේක් දැ!’යි ඇසී ය.

**බුදුරජාණන් වහන්සේ අනේපිඬු සිටුහට බණ දෙසීම. සිටුහු සෝවාන්වීම**

"**කෙලෙස් දුරු කළ, පවින් මිදුණු, කාමයන්හි නො ඇලුණු, එහෙයින් ම නිවී සැනැසුණු, කිසි උපක්ලේශයක් නැති තැනැත්තා සැම කල්හි ඒකාන්තයෙන් සුවසේ සැතැපේ. සියලු තෘෂ්ණා සිඳීමෙන්, සිතෙහි දුක් පීඩා දුරු කිරීමෙන් සිතේ සංහුන් බවට පැමිණ නිවී සැනැහුණු පුද්ගලයා සුව සේ සැතැපේ**" [150] යැ යි වදරා, ඉක්බිති දන කථාදි පිළිවෙළ කථායෙන් දම් දෙසූ සේක. ඒ ඇසීමෙන් සිටු තෙම උන් අස්නෙහි ම සෝවාන් විය. ඉක්බිති බණ වදළ සැටිය ගැන ප්‍රශංසා කොට, 'මා බුදුන් දහම් සඟ සරණ ගිය උපාසකයකු කොට සලකන සේක්වා'යි කියා පසු ද දනට ද ආයාචනා කෙළේ ය. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් එය ඉවැසූ සේක. ඉන්පසු සිටුතෙම වැඳ අවසර ගෙන පිටත් ව ගොස් පසුද රජගහ නුවර සිටුහුගේ ගෙහි දන් පිළියෙල කොට භාග්‍යවතුන් වහන්සේ ප්‍රමුඛ සංඝයා වැඩම කරවා ඛාද්‍ය භෝජ්‍යයෙන් මොනොවට සත්කාර කෙළේ ය. දන් වැළඳූ ඉක්බිති සිටු තෙම බුදුරජාණන් වහන්සේට එකත්පස් වැ හිඳ ගත්තේ ය. හිඳ සංඝයා හා සැවැත් නුවර වස් වසන්නට වඩින ලෙස බුදුරජාණන් වහන්සේට ආයාචනා කෙළේ ය.

"**ගෘහපතිය, තථාගතවරු ශූන්‍යාගාරයට සතුටුහ**"යි බුදුරජාණන් වහන්සේ වදළ සේක.

'ඒ සේ ය, මට වැටහුණේ ය, වහන්සැ'යි කියා සිටු තෙම සෙනසුන් පිළියෙල කළ යුතු සැටි තමාට වැටහුණු බව පැවැසීය. ඉන්පසු බුදුරජාණන් වහන්සේ ධර්ම කථායෙන් ගෘහපතියා සතුටුකොට පින් කිරීමෙහි උත්සාහවත් කොට, හුනස්නෙන් නැගිට වැඩි සේක.

**සැවැත්නුවරැ ආරාම පිළියෙල කිරීම**

සුදත්ත සිටු බොහෝ යහළු මිතුරන් ඇත්තෙකි. හේ රජගහ නුවරට තමා ආ කටයුත්ත අවසන්කොට සැවැත් නුවරට පෙරළා යන්නේ, මහදී හමු වන සියල්ලනට බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ බවත්, තමා උන්වහන්සේට සැවැත් නුවර වඩින්නට ආයාචනා කළ බවත්, උන් වහන්සේ ඒ මහාමාර්ගයෙන් වඩනා බවත්, එ බැවින් කලින් විහාරාරාම කොට දන් දීමට බලාපොරොත්තු විය යුතු බවත් කියා කහවනු සිය දහස් ගණන් ද එ පමණ වටිනා උපකරණ ද දී සතළිස් පස් යොදුන් මාර්ගයෙහි යොදුනක් පාසා විහාර කරවා සැවැත් නුවරට පැමිණියේ ය. ඉක්බිති සැවැත් නුවර හාත්පස පරීක්ෂා කැරැ බලනුයේ, **ජේතරාජ කුමාරයාගේ** උයන බුදුරජාණන් වහන්සේ ගේ වාසයට සුදුසු බව දුටුයේ ය.

ඉක්බිති සිටු තෙම ජේත කුමාරයා වෙත ගොස් ˙ආයඝ්පුත්‍ර ය, විහාරයක් කිරීමට උයන දිය හැකි දැ?˙යි ඇසීය. ˙ගෘහපතිය, කහවනු කෝටියක් ඇතුරුවත් නො දිය හැකි˙යි කුමර කී ය. ˙එ සේ නම් ආයඝ්පුත්‍රය, ආරාමය මා විසින් ගන්නා ලදැ˙ යි සිටු කීය. ˙නැත, එ පමණින් ආරාමය නො ගන්නා ලදැ˙යි කුමර කී ය. ඉක්බිති ඔහු විනිශ්චයකාර ඇමැතියන් විචාළහ. ˙ආයඝ් පුත්‍රය, ඔබ ඉඩමේ වටිනාකම කී බැවින් ඉඩම දෙන ලදැ˙යි ඔහු තීන්දු කළහ. ඉක්බිති සුදත්ත සිටු ගැල්වලින් කහවණු දහ අට කෝටියක් අදවා ඉඩමෙහි අතුළේ ය. තව ස්වල්ප කොටසකට මඳ වූයෙන් ගොස්, ඒ බිම් කොටස වැසීමටත් කහවනු ගෙනෙන ලෙස මෙහෙකරුවනට නියෝග කළේය. මෙ තරම් මහත් මුදලක් වියදම් කොටත් සිටුහු මඳකුදු අප්‍රසන්න නො වූවහු දුටු කුමාර තෙම ˙මෙය ඉතා වැදගත් වැඩෙකැ˙යි සිතා ˙ගෘහපතිය, ඔය ඇත. මේ ඉතිරි බිම් කැබෙල්ල මම මේ කටයුත්තට ත්‍යාග කරමි˙යි කී ය. ˙එතරම් ප්‍රසිඩ උසස් රාජ කුමාරයකුගේ පැහැදීම සසුන් දියුණුවට බලවත් උපකාරයෙකැ˙යි සිතූ සිටු එයට එකඟ වී ය. ඒ බිම් කොටසෙහි **ජේත රාජ කුමාර** තෙම තට්ටු සතක් ඇති විශාල ප්‍රාසාදයක් කැරැවීය. සිටු තෙම තවත් කහවණු දහ අට කෝටියක් වියදම් කොට ඒ ජේත කුමරුන්ගේ උයනෙහි (ජේතවනයෙහි) විහාර, පිරිවෙන්, උපස්ථාන ශාලා, ගිනි හල්, වැසිකිළි, කෙසකිළි, සක්මන් මලු, නාන ගෙවල් යන ආදිය කැරැවී ය.

# තිස් වන පරිච්ඡේදය

**සැවැත් නුවර වැඩීම**

අනාථ පිණ්ඩික (අනේ පිඩු) සිටු තුමා විහාර කර්මාන්තය නිමවා ˙දැන් සැවැත් නුවරට වඩින්නට කාලය යැ˙යි දන්වා භාග්‍යවතුන් වහන්සේ වෙතට දූතයකු එවී ය. භාග්‍යවතුන් වහන්සේ ද මහසඟ පිරිවරා ගමනාරම්භ කළ සේක. සැරි සරා වඩනා සේක් සති කිහිපයෙකින් සැවැත් නුවරට පැමිණ වදළ සේක. අනේ පිඩු සිටු භාග්‍යවතුන් වහන්සේ ගේ පැමිණීම බලාපොරොත්තු වැ ජේතවනයෙහි සිටියේ, ඉදිරියට ගොස් වැඳ සිය විහාරයට ම වැඩම කැරැවී ය. භාග්‍යවතුන් වහන්සේ එහි වැඩියේ සැන්දෑවේ ය. සිටු තුමා පසුදින බොජුන් පිණිස සිටු ගෙදරට වඩින ලෙස අයැද වැඳ පැදැකුණු කොට නික්ම ගියේ ය.

**ජේතවන පූජාව**

පසු ද භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා පිරිවරා එහි වැඩ, පණවා තුබුණු ආසනයෙහි හිඳගත් සේක. සිටු තෙමේ බුඬ ප්‍රමුඛ සංඝයාට ප්‍රණීත ආහාර පානයෙන් සත්කාර කොට ඉක්බිති එක් පසෙක හිඳ ගත්තේ ය. එසේ හිඳ ජේතවනය පූජා කළ යුතු සැටි විචාළේ ය. 'එසේ වී නම් ගෘහපතිය, මෙහි පැමිණි නො පැමිණි සතර දිසා වැසි සංඝයා ජේතවනයෙන් පුදව'යි බුදුරජාණන් වහන්සේ වදළ සේක.

'එහෙයි, වහන්සැ'යි කියා අනේ පිඩු සිටු තෙම බුඬ වචනය පිළිගෙන ඒ ජේතවනාරාමය සංඝ සන්තක කෙළේ ය. ඉන්පසු භාග්‍යවතුන් වහන්සේ විහාර දනයෙහි අනුසස් වදරා නැගිට ජේතවනාරාමයට වැඩි සේක.

මේ ජේතවන පූජා දවසෙහි **උසභ** කුලපුත් , **අධිමිත්ත** බමුණු කුමර, **හේරඤ්ඤකානි ගම් මුදලි, සබ්බමිත්ත බ්‍රාහ්මණ,** කොසොල් රජ පුත් **බ්‍රහ්ම දත්ත කුමරු, සිරිමන්ත** කුල පුත්, **සිරිවඩ්ඪ** කුලපුත්, **උපවාන** බ්‍රහ්මණ, අපර **ගෝතම** බ්‍රාහ්මණ, පසු කළ **ඒකුද්දානිය** නමින් ප්‍රකට වූ **කුලපුත්** ආදී බොහෝ ජනයෝ භාග්‍යවතුන් වහන්සේ දැක බණ අසා පැහැද පැවිදි වූහ. කොසොල් රජුගේ පෙරෙවි බමුණු ගේ දූ වූ **දන්තිකා** ද තවත් බමුණු දූවක් වූ **සකුලා** ද තවත් බොහෝ ස්ත්‍රීහු ද බුදු සසුන්හි පැහැදී තෙරුවන් සරණ ගිය උපාසිකාවෝ වූහ.

**අනේපිඬු සිටුතුමා**

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර පළමු වරයෙහි නව මසක් පමණ කල් වුසූ සේක. එ සෙමෙහි බොහෝ කුලපුත්තු සස්නෙහි පැහැදී පැවිදි වූහ. උපාසක පිරිස ද දින පතා වැඩි වූහ. මෙහි රත්නත්‍රයට දිවි පුද ක්‍රියා කළ අනේ පිඬු සිටු යැ යි ප්‍රසිඬ **සුදත්ත** ගෘහපති තුමා ඒ මුළු උපාසක පිරිසේ අග්‍රස්ථානයට පත් විය. දවසකට දෙවරක් භාග්‍යවතුන් වහන්සේ දක්නට යෑමේ සිරිත එ තුමා කිසි දිනෙකත් නො කැඩුවේ ය.

'බුදුරජාණන් වහන්සේ ඉතා සියුමැලි සේක. මා යමක් ඇසුවොත් 'මේ සිටු මට බොහෝ උපකාරී යැ' යි සලකා භාග්‍යවතුන් වහන්සේ දම් දෙසන සේක. ඒසේ වෙන්නට ඉඩ තැබීම සිවුමැලි වූ උන්වහන්සේට වෙහෙස කිරීමෙකි.' යනු එ සිටුතුමාගේ අදහස විය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි අධික ස්නේහ හේතුයෙන් හේ කිසි දිනෙකත් ප්‍රශ්න නො විචාරයි. සිටුහු ගේ අදහස දත් භාග්‍යවතුන් වහන්සේ ඔහු ආ සෑම වාරයෙහි කිසි ධර්ම කථාවක් කරන සේක.

**සිවු නිවස**

තවද සිටුතුමා ගේ ප්‍රාසාදය හැම භික්ෂූන් වහන්සේ ට සතර මං හන්දියෙක වූ ළිඳක් මෙන් වී ය. එහි නිතර ම දහසක් භික්ෂූනට අසුන් පණවා තුබුණේ ය. ආහාර පාන බේත් යන මේ දැයින් යමක් ලබනු රිසි භික්ෂුවට රිසි සේ ම ඒ සැපැයුණේ ය.

**නන්ද භික්ෂු**

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර වසන සමයෙහි ඉන් මාස කීපයකට පෙර කිඹුල්වත් නුවර දී නො කැමැත්තෙන් මහණ වූ **නන්ද** භික්ෂු තෙම **ජනපද කල්‍යාණි නන්දව** ගැන ම සිතමින් කල් ගත කරන්නේ සිවුරු හැර ගිහි වීමට අදහස් කොට ඒ බව භික්ෂූනට දැන්වී ය. භික්ෂූහු බුදුරජාණන් වහන්සේට එ පවත් දැන්වූහු. එවිට භාග්‍යවතුන් වහන්සේ **නන්ද** භික්ෂූහු කැඳවා එ පවත් සැබෑදැ'යි ඇසූ සේක. නන්ද භික්ෂු සියලු ප්‍රවෘත්තිය කී ය. එ විටැ බුදුරජාණන් වහන්සේ **නන්ද** භික්ෂූහු ගේ අත අල්ලාගෙන ඍද්ධි බලයෙන් තව්තිසා දෙව්ලෝ වඩනා සේක්, අතර මග ද ගිය හේනකැ ද ගිය ලී කොටයෙකැ ඉන්නා කන් නාසා නගුටු සුන් පුලුටු වැඳිරියක දක්නට සැලැස්සූ සේක. ඉක්බිති තව්තිසා භවනයට වැඩ එහි සක් දෙව් රජුට උපස්ථාන පිණිස ආ ශෝභාසම්පන්න පන්සියක් පමණ දෙවඟනන් පෙන්වූ සේක. පෙන්වා, 'නන්දයෙනි, දැන් තොප අදහස කෙසේ ද? මේ දෙවඟනන් ද ජනපද කල්‍යාණිය ද යන දෙපක්ෂයෙන් කවුරු වඩා ශෝභන දැ?'යි ඇසූ සේක. 'වහන්ස, මේ දෙවඟනක ගෙන් දහසයෙන් කල වකට ද ඕ නො වටී. ඈ මේ දෙවඟනකට සමාන කිරීමේදී මහදී දුටු පුලුටු වැඳිරිය මෙන් පෙනේ ය'යි කීය. 'නන්දයෙනි, ශාසන බ්‍රහ්මචර්‍ය්‍යායෙහි ඇලෙව. එවිට ඒ දෙවඟනන් ලැබිය හැකි බවට මම ඇප වෙමි'යි බුදුරජාණන් වහන්සේ වදාළ සේක.

'වහන්ස, ඉදින් භාග්‍යවතුන් වහන්සේ එයට ඇප වන සේක් නම් මහණ දම් පිරීමෙහි ඇලෙන්නෙමි'යි නන්ද භික්ෂු කී ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නන්ද භික්ෂූහු ගෙන දෙව්ලොවින් අතුරුදන් වැ ක්ෂණයෙකින් ජේතවනයට පැමිණි සේක. එදා නන්ද භික්ෂුව ද තමන් දවල් ලගිනා තෙනට ගිය විට උපස්ථානයට ආ භික්ෂූනට සිදු වූ ප්‍රවෘත්තිය වදරා 'මහණෙනි, නෙපි 'කුලීකාරයෙක, දෙවඟනන් නැමැති කුලිය බලා මහන දම් කරන්නෙකැ'යි කියා නන්ද භික්ෂුවට කියවූ'යැ යි වදාළ සේක. භික්ෂූහු ද එසේ කළහ. භික්ෂූන් විසින් කරනු ලබන නින්ද සහගත කවටකමින් ලජ්ජාවට පත් ආයුෂ්මත් නන්දයෝ ඉතා

උත්සාහයෙන් මහණ දම් පුරන්නෝ නො බෝ කලෙකින් සියලු කෙලෙස් නසා රහත් වූහ. පසු ද උදේ නන්ද රහත්හු භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ වැඳ, 'වහන්ස, මට දෙවඟනන් ලැබෙන බවට වූ ඇපයෙන් භාග්‍යවතුන් වහන්සේ දැන් නිදහස් සේකැ'යි කීහ.

'නන්දයෙනි, තොප රහත් වූ කෙණෙහිම ඒ ඇපයෙන් මම නිදහස් වීමි'යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. ඉක්බිති,

'ආර්‍ය මාර්ග නැමැති හේ දංඩෙන් සංසාර නැමැති මඩ වගුර යමකු විසින් තරණය කරන ලද්දේ ද, චිත්ත සන්තානය විදින සියලු ක්ලේශකාම නැමැති කටුව මාර්ග ඥාන නැමැති පොල්ලෙන් මැඩැ පොඩිකර දමන ලද්දේ ද, එසේ කිරීමෙන් රහත් ඵලයත් නිවනත්, ලැබූ ඒ භික්ෂු තෙම ශුභ අරමුණු නිසා ඇති විය හැකි සැප වේදනායෙන් ද, අශුභ අරමුණු නිසා ඇති විය හැකි දුක් වේදනායෙන් ද, (නොහොත්) අෂ්ටලෝක ධර්මයෙන් චංචල නොවේ.[151]

යන ප්‍රීති වාක්‍යය පහළ කළ සේක. එයින් පසු දිනෙක භික්ෂූහු ආයුෂ්මත් නන්ද මහ රහතුන් වහන්සේ වෙත එළැඹ 'ආයුෂ්මතුනි, ඔබ මහණකම ගැන කලකිරුණු බවක් කීවෝ නො වෙත්ද? දැන් කෙසේද?' කියා ඇසූහ. 'ඇවැත්නි, ගිහි කමට ඇල්මෙක් නැතැ'යි නන්ද හිමියෝ කීහු. භික්ෂූහු එය විශ්වාස නොකොට භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් එපවත් සැළ කළහ. එවිට බුදුරජාණන් වහන්සේ නන්ද තෙරුන් රහත් වූ බව වදරා.

**"නො නිසි සේ සෙවිලි කළ හෙවත් සිදුරු වූ පලය ඇති ගෙයට යම් සේ වැසි වතුර වදී ද, එසේ ම භාවනා වශයෙන් දියුණු නොවූ සිත විනිවිද ගෙන රාගය ද වැද ගනී. එහෙත් මනා සෙවිල්ලක් ඇති ගෙට වැසි වතුර යම් සේ නො වදී ද, එසේ ම ශමථ විදර්ශනා වශයෙන් මනා ව වැඩුණු සිත විදගෙන රාගය වදිනු හැකි නොවේ."**[152] යැ යි වදාළ සේක.

ඉක්බිති භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ නන්ද භික්ෂු නම හික්මැවූ සැටිය ගැන දම් සබා මඩුවෙහි කතා බස් කරමින් හුන්හ. බුදුරජාණන් වහන්සේ එහි වැඩ ඔවුන් අතර වූ කථාව අසා එය මුල් කොට **ගද්‍රභ ජාතකය** වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ සැවැත් නුවර දෙව්රම්හි වසන සේක්, විටින් විට ගම් නියම් ගම් හි සැරි සැරූ සේක. එක් වරෙක පසල් ගමකට වැඩ ඔවුන් මාර්ග ඵලයන්හි පිහිටුවා පෙරළා සැවතටම වැඩ එහි වුසූ සේක.

**ආමගන්ධ සෘෂීන් සහිත පිරිස පැවිදි වීම**

එකී පසල් ගම් වැස්සෝ වනාහි **ආමගන්ධ** නම් සෘෂියකුට පැහැදෑ සිටියෝ ය. එ සෘෂීහු ද කලින් කලැ සිය පිරිස හා හිමවතින් එ ගම් වැද මාස කීපයක් වැස යෙති. භාග්‍යවතුන් වහන්සේට එහි වැසියන් පැහැදුණු පසු ද සිරිත් පරිදි ඔහු ගේ පිරිස හා එහි ආ නමුත් පළමු පරිදි මහ පෙරහරින් සංග්‍රහ නො ලද්දෝ ය. මනුෂ්‍යයන් පෙර සේ උනන්දුවක් නො දැක්වීමට හේතුව ඔහු විචාළහ. මිනිස්සු 'බුදුරජාණන් වහන්සේ ලෝ පහළ වූ සේකැ'යි ද මෙහි වැඩිසේකැ'යි ද' කීහ.

එවිට ඔහු 'බුඩ' යන වචනය ඇසීමට පවා දුර්ලභ බව කියා 'කිමෙක් ද? ඒ බුදුහු ආමගන්ධය වළඳත් දැ'යි ඇසූහ.

'ආමගන්ධය යනු කුමක් ද වහන්සැ?' යි ඔහු ඇසූහු. 'ආමගන්ධ නම් දිය ගොඩ සතුන්ගේ මස් යැ'යි සෘෂිහු කීහු.

'එය නම් ඒ භාග්‍යවතුන් වහන්සේ වළඳන සේකැ'යි මිනිස්සු කීහු. සෘෂිහු 'එ සේ නම් හේ බුදුවරයෙක් නො වේ දෝ'යි විපිළිසර ඇති වී 'ගොස්, විචාරා දැන ගනිමු'යි සිතා භාග්‍යවතුන් වහන්සේ වැඩි අත ඒ මිනිසුන්ගෙන් අසා දැන, සිය පිරිස හා යුහු යුහු ව ගියෝ, සැවැත් නුවරට පැමිණියහ. ඔවුන් දෙව්රම් පිවිසෙන වේලායෙහි භාග්‍යවතුන් වහන්සේ ධර්ම දේශනා පිණිස ධර්මාසනාරූඪ වූවා පමණෙකි.

තවුසෝ එහි ගොස් භාග්‍යවතුන් වහන්සේ නො වැඳ පසෙක උන්හ. භාග්‍යවතුන් වහන්සේ වූ කලී ඔවුන් ගේ ගමන් බිමන් සුව දුක් ආදිය විචාළ සේක. ඔහු ද එයට තිසි උත්තර දුන්හ.

ඉක්බිති ආමගන්ධ තාපස තෙම 'භවත් ගෞතමයෙනි, ආමගන්ධය ඔබ වළඳත් ද, නැද්ද?' යි ඇසූහ.

'මේ තොප කියන ආමගන්ධය නම් කවරේ දැ?' යි භාග්‍යවතුන් වහන්සේ අසා වදළ සේක.

'මත්ස්‍ය මාංශය, භවත් ගෞතමයි' ති ඔහු කීහු.

**'බ්‍රාහ්මණය, මත්ස්‍ය (දිය මස්) මාංශ (ගොඩ මස්) ආමගන්ධ නොවේ. සියලු ලාමක අකුසල ධර්මයෝ ම ආමගන්ධ නම් වෙති'**යි වදරා,

'බ්‍රාහ්මණය, දැන් තෙපි පමණක් මෙය නො විචාළහු ය. පෙර **තිස්ස** නම් බමුණෙක් ද **කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ ගෙන්** මේ ප්‍රශ්නය විචාළේ යැ' යි වදරා එය විස්තර කිරීම් වශයෙන් **ආමගන්ධ සූත්‍රය*** වදළ සේක.

* මෙය සුත්ත නිපාතයෙහි දෙවැනි (චූල්ල වග්ගයේ) දෙවැනි සූත්‍රය යි. විස්තර එයින් දත යුතුයි.

එය අසා පැහැදුණු ආමගන්ධ ස්‍වාමිහු සිය පිරිස වූ පන්සියයක් පමණ ස්‍වාමීන් හා භාග්‍යවතුන් වහන්සේ පාමුලැ වැටී වැඳ පැවිද්ද ඉල්ලූහ. භාග්‍යවතුන් වහන්සේ ඒහිභික්ෂුප්‍රව්‍රජ්‍යායෙන් ඔවුන් පැවිදි කළ සේක. කීප දිනකින් උහු හැම රහත් වූහ.

**පූර්ණ තෙරුන් පැමිණීම**

**පුණ්ණ මන්තානි පුත්ත** මහ රහත්හු භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර වැඩි බව අසා, එහි වැඩ දෙවුරමිහි ගඳකිළිය කරා ගොස් උන්වහන්සේ දුටුහ. ශාස්තෲන් වහන්සේ ඔවුනට දම් දෙසූ සේක. තෙරණුවෝ බණ අසා භාග්‍යවතුන් වහන්සේ වැඳ අවසර ගෙන සැවැත සමීපයෙහි **අන්ධ වනයට** ගොස් රුකක් මුල හුන්හ. සැරියුත් තෙරණුවෝ පුණ්ණ තෙරුන්ගේ ඊම අසා ඔවුන් ගිය මග වැඩියෝ ඒ රුක මුලට එළැඹ පිළිසඳර කථා කොට **සප්ත විසුද්ධි ක්‍රමය** විචාළහ. පුණ්ණ තෙරණුවෝ ඒ විචාළ පැණ විසැඳූහ. දෙ තෙරණුවෝ ඔවුනොවුන් බස් සතුටින් පිළිගත්තෝ ය.[155]

**මංගල සූත්‍ර සමාගමය**

භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි වසන සමයෙහි ම එක් දිනක් රෑ දෙව් පුතෙක් අවුත් වැඳ එකත් පසෙක සිට භාග්‍යවතුන් වහන්සේ ගෙන් **උත්තම මංගලය** නම් කවරේදැ' යි විචාළේ ය. මෙහිදී භාග්‍යවතුන් වහන්සේ මහා මංගල සූත්‍රය දෙසූ සේක. දේශනාව අවසානයේදී කෙළ ලක්ෂයක් දේවතාවෝ රහත් වූහ. සෝවාන් සකෘදගාමි ඵලයනට පැමිණියන්ගේ ගණන අගණ්‍ය ය.

# එක් තිස් වන පරිච්ඡේදය

**සිවු වන වස**

භාග්‍යවතුන් වහන්සේ දනවු සැරිසරා වඩනා සේක් වර්ෂාණ කාලය ළං වූ විටැ රාජගෘහ නගරයට ම පැමිණි සේක. බුඩත්වයෙන් සිවු වන වසැ වර්ෂර්තුවත් එහි වේළුවනාරාමයෙහි ම ගත කළ සේක.

**බිම්සර රජ. පුක්කුසාති රජුට ධර්මය ලියවා යැවීම**

තක්සලා නුවර රජය කැරැ වූ **පුක්කුසාති** රජ මගධ රටට අධිපති **බිම්බිසාර** රජතුමාගේ අදෘෂ්ට මිත්‍රයෙකි. (නො දැක ආරංචියෙන් ලියුම් ගනුදෙනුයෙන් මිත්‍ර-වූයෙකි.), තම මිත්‍රයාට බුඩ ශාසනයේ තොරතුරු ලියා යවන අදහස ඇතිවූ බිම්බිසාර රජ රියන් සතරක් දිග ද වියතක් පුළුල

ද ඇති රන් පතක් තළවා එහි දැහිඟුල් දියෙන් (සාදිලිත්ගම් වලින් කරන ලද තීන්ත වැනි රස විශේෂයකින්) බුදුගුණ සංග්‍රහ කොට ලියන්නේ, පළමු කොට බුදු කෙනෙකුන් උපන් කළ ලොව ඇති වන කීර්ති ඝෝෂය වූ **"ඉධ තථාගතො ලොකෙ උප්පන්නො අරහං සම්මාසම්බුධො විජ් -ජාචරණ සම්පන්නො"** යන ආදි වූ සංක්ෂිප්ත බුදුගුණ කථාව ඇතුළත් කොට, දස පැරුම් පුරා උන්වහන්සේ තුසී ලොව ඉපිද වුසූ තන් සිට බුදුවීම ද, බුදු වී ප්‍රාතිහාර්‍ය පෑ තැන් ද දක්වා ලියුයේ ය.

ඊළඟට **"යංකිඤ්චිවිත්තං ඉධ වා හුරං වා"** යන ආදි ගාථාව ලියා ඉන් පසු **ස්වාක්ඛාතො භගවතා ධම්මො** යන ආදී ධර්‍ම ගුණ පාඨය ද, **සතර සතිපට්ඨාන, සතර ඍද්ධිපාද, සතර සම්‍යක්ප්‍රධාන, පඤ්චෙන්ද්‍රිය, පඤ්චබල, සප්ත බොධ්‍යංග, ආර්‍ය අෂ්ටාංගික මාර්‍ග** යන සත්තිස් බෝධිපාක්ෂික ධර්‍ම ද, සංක්ෂෙපයෙන් සඳහන්කොට **"යම්බුධසෙට්ඨො පරිවණ්ණයී සුචිං"** යන ආදී ගාථා ලියුයේ ය.

ඉන්පසු **"සුපටිපන්නො භගවතො සාවක සංඝො"** යන ආදී සංඝ ගුණ පාඨය ලියා කුලපුත්‍රයන් බුදුරජාණන් වහන්සේ ගේ ධර්‍ම කථාව අසා පැවිදි වන බව ද, සමහරුන් රජකම ද, සමහරුන් යුවරජකමද, සමහරුන් සේනාධිපතිකම ද තවත් සමහරුන් නානාප්‍රකාර තනතුරු ද ධන සම්පත් ද හැර දමා මහණ වන බව ද, එසේ පැවිදි වූවත් සුපටිපන්නතා ඤායපටිපන්නතා ආදි ගුණවලින් සමන්විත වන බව ද සඳහන් කොට, මෙසේ ක්ෂුද්‍ර ශීල, මධ්‍ය ශීල, මහා ශීලයන් සැකැවින් ලියා, සතර සංවර ශීල, නවාකාර සේනාසන, පංච නීවරණ දුරු කරන සැටි, කමටහන් වල තතු දැයි රහත් වීම තෙක් පිරියැ යුතු සියලු ගුණ රාශිය වූ ශීල සමාධි ප්‍රඥාවන් ද ලියැවූයේ ය.

එයින් පසු **ආනාපානස්මෘති භාවනා ක්‍රමය** විස්තර ලෙස සඳහන් කොට බුධ පුත්‍ර සංඝයා මේ ගුණවලින් යුක්ත යැයි දක්වා **"යෙ පුග්ගලා අට්ඨ සතම්ප සත්ථා"** යන ආදි ගාථාව ද ලියා ඉක්බිති,

> "එ භාග්‍යවතුන් වහන්සේ ගේ ධර්‍මය මනාව ප්‍රකාශිත ය නුවණැත්තන් විසින් පුරුදුකොට තිවන් ලැබිය යුතු ය. ඉදින් මගේ මිත්‍රයා හැකි නම් ගිහිගේ හැර එ භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයේ පැවිදි වේවා යැ'යි ද,

අවවාද සඳහන් කොට, මෙසේ ඒ ලියුම සම්පූර්ණ කැර. මැණික් රන් සඳුන් යන තුන් වර්ගයෙන් කළ හෙප්පු තුනක් එකින් එකක් වසා බහා ඊ තුළැ ලියුම ලා, ගෞරවයෙන් තක්සලා නුවර පුක්කුසාති රජු වෙත

යැවූයේ ය. ඒ රජ එය ලැබ කියවා වහා ම රාජ්‍යය හැර දමා පැවිදි වැ භාග්‍යවතුන් වහන්සේ දක්නා අදහසින් ම පිටත් වැ යොදුන් දෙසිය සත්තිසක් පමණ වූ දීර්ග මාර්ගය ගෙවා ගොස් **රජගහ** නුවර කුම්භකාර ශාලාවට පැමිණියේ, එහි වැඩි භාග්‍යවතුන් වහන්සේ ගෙන් බණ අසා අනාගාමී විය.

**තිස්ස රජුට යැවූ දහම් ලිපිය**

මධ්‍ය දේශයෙන් බොහෝ ඈත **සෞවීර** රටෙහි **රෞරව** පුර රජුගේ **තිස්ස*** නම් කුමාරයෙක් විය. වැඩි වයසට පත් හෙතෙම පියා මළ පසු රජ විය. ඒ රජ බිම්බිසාර නරපතීහු ගේ අදෘෂ්ට මිත්‍රයෙක් වූයේ ඒ රජුට මුතු මැණික් ආදි වූ බොහෝ පඬුරු යැවූයේ ය. ඒ ලැබූ බිම්සර රජ සිය මිතුරාට පඬුරක් යවන්නේ විසිතුරු වස්ත්‍රයෙක බුඩ චරිතය සලකුණු කරවා රන් පතෙක පටිච්චසමුප්පාද ධර්මය ලියවා යැවූයේ ය. එය ලැබ චිත්‍ර වස්ත්‍රයෙහි බුඩ චරිතය ද රන්පතෙහි පටිච්චසමුප්පාද ධර්ම ක්‍රමය ද බලා, කාරණය මනා ව තේරුම් ගෙන, ˙භාග්‍යවතුන් වහන්සේ ගේ ආකාරය මම දනිමි. ධර්ම චක්‍රය ද එක් අයුරෙකින් දනිමි. මේ කාම සම්පත් බොහෝ දුක් ඇත්තේ ය. බොහෝ හිරිහැර සහිත ය. මට ගිහිගෙයි සැපතින් කිම් දැ˙යි කියා රජ සැප අත් හැර දමා හිසකේ රවුලු බාවා කසාවත් හැඳ, භාග්‍යවතුන් වහන්සේ උදෙසා පැවිදි වැ, මැටි පාත්‍රයක් ගෙන, තමාගේ නගරවාසීන් හඬද්දීම එයින් නික්මැ, ක්‍රමයෙන් ගම් නියම්ගම් ගෙවා අවුත් රජගහ පුරයට පැමිණියේ ය. එහි **සප්පසොණ්ඩික පබ්භාර** නම් ගල්තල්ලේ වසන බුදුරජාණන් වහන්සේ වෙත එළැඹ දහම් අසා කමටහන් ගෙන වීර්‍ය්‍ය වඩා රහත් බවට පැමිණියේ ය.

**සැඬොලකු පැවිදිවීම**

රජගහ නුවර **සුනීත** නම් චණ්ඩාලයෙක් වී ය. හෙතෙම අශුචි ඇද විථි ශුඩ කිරීමෙන් දිවි පවත්වන්නෙකි. එහෙත් ඔහු රහත් වීමට හේතු සම්පත් ඇති බව දුටු බුදුරජාණන් වහන්සේ දිනක් රජගහ නුවර පිඩු පිණිස හැසිරෙන සේක්, ඒ සුනීත චණ්ඩාලයා ශුඩ කරන වීථියට වැඩිසේක. සුනීත තෙම ඒ ඒ තැනින් අශුචි හා කසල එක් රැස් කොට කදින් නුවරින් පිටත ගෙන යන්නේ, භික්ෂු සංඝයා හා වඩනා භාග්‍යවතුන් වහන්සේ දැක බියෙන් තැති ගැන්මෙන් ව්‍යාකුල වැ ඉවත් වැ යන්නට මඟක් හෝ සැඟැවෙන්නට තැනක් නැත්තෙන් කසල කද බිත්තියක් අද්දර තබා සිටියේ ය. කරුණාවෙන් තෙත් වූ ළයැති බුදුරජාණන් වහන්සේ ඔහු

* දිව්‍යාවදානයෙහි මේ රජුගේ නම රුද්‍රායණ යැ යි කියන ලදී

වෙත පැමිණ මෘදු වූ හඬින් 'සුනීත' කියා ආමන්ත්‍රණය කොට, 'මේ දුක සේ දිවි රැකීමෙන් කවර අර්ථයෙක් ද? පැවිදි වන්නට පිළිවන් දැ'යි ඇසූ සේක. සුනීත තෙම ඒ වචනය අසා ඔද වැඩී ගිය සිතැත්තේ, 'භාග්‍යවතුන් වහන්ස, මා වැනි නීචයනට මේ ශාසනයෙහි පැවිදි වන්නට ඉඩක් දෙතොත් පැවිදිවන්නට බැරි කිම? එසේ නම් භාග්‍යවතුන් වහන්සේ මා පැවිදි කරන සේක්වා'යි කීයේ ය.,

'බුදුරජාණන් වහන්සේ ඔහු ඒහිභික්ෂුභාවයෙන් පැවිදි කළ සේක. ඉන්පසු ඒ සුනීත භික්ෂුව විහාරයට කැඳවාගෙන ගොස් භාවනා පිළිවෙළක් කියා දුන් සේක. හෙතෙම ඒ අනුව භාවනා කොට පළමු පඤ්චාභිඥා අෂ්ට සමාපත්ති ලබා ඉන්පසු විදර්ශනා වඩා ෂඩ් අභිඥා ඇති රහතෙක් වූයේය. දෙවියෝ ද බ්‍රහ්මයෝ ද ඒ සුනීත රහතුන් වහන්සේ කරා එළැඹ වන්දනමානන කළහ. දේව සමූහයා පිරිවැරූ තෙරුන් දුටු බුදුරජාණන් වහන්සේ සිනා පහළ කොට ප්‍රශංසා කරන සේක්.

**'ඉන්ද්‍රිය සංවරයෙන්ද ප්‍රඥායෙන් ද මේ කී දෑ හැර අනෙකුත් ශ්‍රේෂ්ඨ හැසිරීමෙන් ද යන මෙයින් බ්‍රාහ්මණයෙක් වේ. මෙසේ බාහිත පාප වූ පුද්ගලයා ම උතුම් බ්‍රාහ්මණයකොට බුඬාදීහු කියාත්'** යැයි[156] වදාළ සේක.

නැවැත භික්ෂූහු 'ආයුෂ්මත් සුනීත, කිනම් කුලයකින් ඔබ නික්ම පැවිදි වූහුද? චතුස්සත්‍ය ප්‍රතිවේධය කළෝ දැ?'යි විචාළහ. එ විට සුනීතයන් වහන්සේ තමන් පෙර අශුචි අදින ඉතා නීච චණ්ඩාල කුලයෙක කෙනකු බව ද, භාග්‍යවතුන් වහන්සේ කරුණායෙන් තමා පැවිදි කළ බව ද, බුඬ වචනය පරිදි පිළිපැද කෙලෙස් නසා රහත් වූ බව ද, ඉක්බිති ශක්‍රාදීන් අවුත් තමාට නමස්කාර කළ බව ද, ඔවුන් පිරිවරා සිටි තමා දැක බුදුරජාණන් වහන්සේ සිනා පහළ කැර ඒ කාරණය මුල්කොට ගෙන දම් දෙසූ බව ද පැවැසූහ.

**මහලු සැඬොලියකට දැක්වූ කරුණාව**

භාග්‍යවතුන් වහන්සේ දිනක් අලුයම්හි මහා කරුණා සමාපත්තියට සමවැද ඉන් නැගිට ලොව බලා වදාරන සේක්, එ නුවර කුප්පායමෙකැ වසන ආයු පිරිහී සිටි, මරණින් මතු නිරයෙහි ඉපදීමට හේතු වූ අකුසල කර්මයක් එළැඹ ඇති මහලු චණ්ඩාල ස්ත්‍රියක දුටු සේක. දැක ඇය කෙරෙහි මහත් අනුකම්පායෙන් මෙහෙයුණු සිත් ඇති සේක්, ඇගේ දුගති ගමන වළක්වන අදහසින් භික්ෂු පිරිස හා රජගහ නුවර පිඬු පිණිස වැඩි සේක. එ කලැ යට කී මහළු සැඬොල් ස්ත්‍රී සැරයැටි

වාරුවෙන් ඇවිදින්නී, ඉදිරි මගින් වඩිනා බුදුරජාණන් වහන්සේ දැක නැවැතී සිටියා ය. භාග්‍යවතුන් වහන්සේ ද ඇගේ ගමන වැළැක්වීමට මෙන් ඉදිරි පසින් සිටි සේක. එ කල්හි ආයුෂ්මත් මහ මුගලන් තෙරණුවෝ බුදුරජාණන් වහන්සේගේ අදහස දැන, ඇගේ මරණය ළං බව ද දැක, භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කිරීමෙහි ඇය මෙහෙයනුවෝ,

'චණ්ඩාලිය, කීර්තිමත් ගෞතමයන් වහන්සේ ගේ පා වඳු, තුඹට මහා අනුකම්පායෙන් මේ මහර්ෂින් වහන්සේ ගමන නවතා දැන් මෙහි සිටින සේක් ය. පිරිසිදු සිත් ඇති, ලාභාලාභාදියෙන් කම්පිත නො වන මේ පූජ්‍ය මහෝත්තමයාණන් කෙරෙහි සිත පහදවා ගන්න, වහා දොහොත් මුදුන් තබා මුන් වහන්සේ වඳින්න, තුඹේ ආයුෂ ඉතිරි වැ ඇත්තේ ඉතා ම ටික යැ'යි වදාළහ.

ඕ එය අසා සිය මරණය ඉතා ළං යැයි සලකා, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි සිත පහදවා, පසඟ පිහිටුවා වැඳ, නැගිට දොහොත් මුදුන් තබා වැඳගෙන ම බුදුගුණ සැලකීමෙන් එකඟ සිතැති ව ප්‍රීතියෙන් සිටියා ය. බුදුරජාණන් වහන්සේ 'මෙය ස්වර්ගෝත්පත්තිය පිණිස මැට සෑහේයැ'යි දැක භික්ෂු සංඝයා හා එතැනින් නික්මී සේක. උන්වහන්සේ වැඩි පසුත් බලවත් ප්‍රීතියෙන් ඒ දෙසට වැඳගෙනම සිටි ඕ තොම, කුලප්පු වී ඒ අතට වේගයෙන් දිව ගිය දෙනක විසින් අගින් අනින ලද්දී, වැටී මළා ය. මරණින් මතු ඕ තව්තිසා දෙව් ලොව ඉපැද සැපත් විඳිමින් වුසූ තැනැත්තී, දිනෙක දිව්‍ය ලෝක චාරිකායෙහි වඩනා මුගලන් තෙරණුවන්ට තමා ගේ ඒ සියල් පවත් දැන්නුවා ය. මුගලන් තෙරුන් අවුත් එ පවත් දැන් වූ කල්හි බුදුරජාණන් වහන්සේ එය මුල් කොට පිරිසට දම් දෙසූ සේක.

**සෝපාක නම් අසරණ දරුවා**

රජගහ නුවර චණ්ඩාලයෙකුට දව පුක්කුස කුලයෙක ස්ත්‍රියකට දරුවෙක් ලැබුණේ ය. ඔහුට **සෝපාක** යන නම වීය. ඒ දරුවා සිවුමැසි කලැ පියා මළේය. ක්‍රමයෙන් වැඩුණු සෝපාක තෙම සත් ඇවිරිදි වීය. දිනක් සුලු පියා 'මු මගේ පුත්‍රයා හා කලහ කෙරේ' යැයි කිපී ඒ සෝපාක දරුවා අමු සොහොනට ගෙන ගොස් අත් දෙක ලණුවෙකින් එක් කොට බැඳ ඒ ලනුවෙන් ම ඔහු මළ කඳකට දැඩිකොට බැඳ 'මු සිවල්ලු කා දමත්ව'යි ඔහු තනි කැරැ දමා ගියේ ය. අසරණ කුඩා දරුවා රෑ මධ්‍යම යාමය පමණේ දී,

'අහෝ! මගේ කවර වරදෙක් ද? අනාථ මට අනේ! නෑයෙක් වත් පිහිට වෙන්නට නෑ! අනේ සොහොනේ බැඳි මා කවුරුවත් මුද හරින්න!'යි විලාප කියා හැඬුයේ ය.

'ඒ වේලෙහි ලොව බලා වදරන බුදුරජාණන් වහන්සේ අනාථ වැ වැලැපෙන දරුවා දැක ඔහු දෙසට ආලෝකය පතුරුවා හැර ඔහුට ප්‍රකෘති සිහිය උපදවා,

'දරුව සෝපාක, මෙහි එව. තථාගතයන් දෙස බලව. රාහු ගෙන් සඳුහු මිදුණාක් මෙන් මම් තුඹ ගලවා ගන්නෙමි'යි වදළ සේක.

දරු තෙමේ බුඩානුභාවයෙන් බන්ධනයෙන් මිදී ඒ බුදුරජාණන් වහන්සේ වැඩ උන් විහාරයේ පිළේ සිටියේ ය. සෝපාකයාගේ මව දරුවා නො දැක උහුගේ සුලු පියහු විචාළ නමුත්, ඔහු තමා කළ හිරිහැරය නොකීයෙන්, ඒ ඒ තැන ඇවිදත් සොයා ගත නො හැකි වැ 'බුදුවරු තුන් කාලය දන්නා තැනැත්තෝ ලු. එ බැවින් භාග්‍යවතුන් වහන්සේ ගෙන් ම දරුවා ගේ තොර තුරු දැන ගනිමැ'යි සිතා විහාරය දෙසට ගියා ය. ගොස් භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියා ය. භාග්‍යවතුන් වහන්සේ සෘඩි බලයෙන් දරුවා මවට නො පෙනෙන්නට සැලැස්සූ සේක. ඒ ස්ත්‍රී 'ස්වාමීනි, ම පුතා දකින්නට නැත. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ තොරතුරු දන්නා සේක් දෝ?යි බුදුරජුන් විචාළා ය බුදුරජාණන් වහන්සේ,

**'මරහු විසින් මඩනා ලද්දහුට පුත්‍රයෝ ද සෙසු බන්ධුහු ද පිහිට පිණිස නො වෙත්. නෑයන් කෙරෙහි ප්‍රතිෂ්ඨාවෙක් ද නැත. මෙම කරුණ දැන නුවණැත්තහු ශීලයෙන් සංවෘත ව නිවන් මග යුහුසුලු ව පිරිසිදු කළ යුතු යැ'යි** වදළ සේක.[157]

ධර්ම කථාව අසා ඕ සෝවාන් වූවා ය. සෝපාක තෙම රහත් විය. ඉක්බිති මවට දරුවා පෙනෙන්නට සැලැස්සූ සේක. ඕ පුතු දැක තුටු පහටු ව, ඔහු රහත් වූ බව අසා, පැවිදි කරවා ගියා ය. සෝපාක තෙම ගඳකිළිය සමීපයෙහි සක්මන් කරමින් සිටි භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ වැඳ උන් වහන්සේ පසු පස්සෙන් හක්මන් කෙළේ ය. භාග්‍යවතුන් වහන්සේ සෝපාක සාමණේර නමට උපසම්පදව දෙනු කැමැති සේක්, 'එක නම් කිමෙක් ද?' යන ආදින් ප්‍රශ්න දහයක් ඇසූ සේක. සාමණේර තෙම ඒ සියල්ලට ම හරියට උත්තර දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ ළදරුවකු වූ ඔහුගේ සමත්කමට සතුටු පඬුරක් වශයෙන් සත් හවුරුදු වයසේ දී ම උපසම්පදව දුන් සේක. මෙය පඤ්හව්‍යාකරණූපසම්ද නම් විය.

**භාරද්වාජයන් පැවිදිවීම**

රජගහනුවර භාරද්වාජ ගෝත්‍රයට අයත් බැවින් එ නමින් ම ප්‍රසිඬ වූ බමුණක්හු ගේ ධානංජානි නම් භාර්යාව තෙරුවන් කෙරෙහි පැහැදුණු උපාසිකාවක් වූවා ය. දවසක් ඕ සිය සැමියාට බත් පිළිගන්වන්නී පය ලිස්සා වැංවෙන්නට ගියා ය. එකෙනෙහිම ඕ භාග්‍යවතුන් වහන්සේ සිහිකොට 'නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුඬස්ස' යන්න තුන් වරක් කීවා ය. එ විට බමුණා කිපී 'මේ වසලී කොතැනැදීත් ඒ මුඩු මහණා ගේ ගුණ කියයි. වසලිය, මම් තිගේ ඒ ශාස්තෘහට වාද නගම්'යි කී ය.

'බ්‍රාහ්මණය, දෙවියන් ඇතුළු ලෝකයෙහි මහණ බමුණන් සහිත ජනතායෙහි ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුඬයන් වහන්සේට වාදාරෝපණයට සමතෙක් ඇතැයි නො සිතමි. උන්වහන්සේ වෙතට ගියා ම මා කියන්නේ ඇත්ත ද නැත්ත දැ?'යි වැටහේවි'යි බැමිණි කීවා ය.

එවිට බමුණා භාග්‍යවතුන් වහන්සේ කරා ගියේ ය. ගොස් භාග්‍යවතුන් වහන්සේ හා පිළිසඳර කතා කොට පැත්තෙක ඉඳ ගත්තේ ය. ඉඳගෙන මේ ප්‍රශ්න ඇසී ය :

'කුමක් නැසීමෙන් සුවසේ වැදහෙන හැකි ද? කුමක් නැසීමෙන් ශෝක නො කැර ඉඳින හැකි ද? මොන එක් දැයක් වැනැසීම ඔබට රිසියේ දැ?'

බමුණා ඇසූ මේ ප්‍රශ්නයට භාග්‍යවතුන් වහන්සේ,

'ක්‍රෝධය නැසීමෙන් සුව සේ වැදහෙයි, ක්‍රෝධය නැසීමෙන් ශෝක නො කැර ඉඳින හැකි වෙයි. බ්‍රාහ්මණය, අග මිහිරක් වැ පැනෙන, දුක් විසට මුල වූ ක්‍රෝධය වැනැසීම මැනැවැ'යි ආර්යයෝ පසසත්. ඒ ක්‍රෝධය නැසීමෙන් නිශ්ශෝක වේ'යැයි වදාළ සේක.

මෙය ඇසූ බමුණා තෙරුවන්හි පැහැද උපාසකයෙක් විය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ගෙන් පැවිද්ද හා උපසම්පදාව ඉල්ලී ය.

භාග්‍යවතුන් වහන්සේ ඔහුට පැවිද්දත් උපසම්පදාවත් දුන් සේක. පැවිදි වූ හෙතෙම විදසුන් වඩනුයේ නොබෝ දිනෙකින් කෙලෙස් නසා රහත් බවට පැමිණියේ ය.

භාරද්වාජගොත්ත බමුණා භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදි වීයැ යි ඇසූ ඒ ගෝත්‍රයට ම අයත් තව බමුණෙක් කුපිත වැ භාග්‍යවතුන් වහන්සේ කරා ගියේ ය. ගොස් අසභ්‍ය පරුෂ වචනයෙන් පරිභව කළේ ය.

භාග්‍යවතුන් වහන්සේ නිහඬ වැ ඔහුගේ බැණුම් අසා හුන් සේක. ඔහුගේ බැණුම අවසන් වූ පසු ඔහුට කතා කොට,

'බ්‍රාහ්මණයෙනි, ඔබ වෙතට නෑ මිතුරෝ අමුත්තෝ හෙම ඉඳහිට එත්දැ?'යි ඇසූ සේක.

'එසේ ය එති'යි බමුණා කී ය.

'ඔවුනට ඔබ කන බොන දෑ දෙත් ද?'

'එසේ ය, දෙමි'

'ඔබ ඔවුනට දෙන ඒ දෑ උන් නො පිළිගත්තොත් ඒවා කාට අයත් වෙත්ද?'

'වෙන කාටද? ඔවුන් ඒවා නො පිළිගත්තොත් ඒවා අපට ම යි.'

බමුණා මෙසේ කී කලැ, භාග්‍යවතුන් වහන්සේ ඔහුට කථා කොට,

'බ්‍රාහ්මණයෙනි, අප ඔබට බැණුමක් කිපීමක් කලහ නැගීමක් නැතිව නිහඬ වැ ඉන්දදී තෙපි අපට ආක්‍රෝශ පරිභව කළහු ය. තොපගේ ඒ ආක්‍රෝශ පරිභව අපි නො පිළිගනිමු. ඒවා ඔබට ම ආපහු ලැබෙයි. බ්‍රාහ්මණයෙනි, ආක්‍රෝශ කරන්නහුට පෙරළා ආක්‍රෝශ කරන්නාද, කිපෙන්නාහුට පෙරළා කිපෙන්නා ද, කලහ නගන්නහුට පෙරලා කලහ නගන්නා ද ඒ තැනැත්තා අනෙකාත් සමග එකතුව ඒවා වළඳන්නෙකි. අපි ඔබ හා එකතු ව නො වළඳමු. ඔබ කී දෑ ඔබ කරා ම පැමිණේ' යැ යි වදාළ සේක.

'රජු සහිත පිරිස 'ශ්‍රමණ ගෞතමයෝ රහත් කෙනෙකැ'යි රජුත් රට වැස්සාත් පිළිගෙන ඇත. එහෙත් ශ්‍රමණ ගෞතමයන් කිපෙන බවක් මට හැගේ'යැ යි බමුණා කී ය.

භාග්‍යවතුන් වහන්සේ,

'දාන්ත වූ සංසුන් පැවැතුම් ඇති මනා ව නුවණින් දැන සියලු කෙලෙසුන් ගෙන් මිදුණු, ලාභ අලාභ නින්දා ප්‍රශංසාදී අට ලෝ දහමින් නො සැලෙන ස්ථිර ගුණ ඇති ක්‍රෝධ නොකරන රහතකු තුළ ක්‍රෝධයෙක් කොයින්ද ?

'කිපුණාහුට පෙරළා කිපෙන්නා ඒ පළමු වැන්නාට වඩා ලාමක ය. කිපුණාහුට නො කිපෙන්නා ලෙහෙසියෙන් දිනත නො හැකි යුඩයෙකින් දිනුවෙක් වෙයි.

අනෙකා කිපුණා දැක සිහි ඇති ව ඉවසන තැනැත්තේ තමාටත් අනෙකාටත් යන දෙදෙනාට ම අභිවෘඬිය සලසන්නෙකි.

'මෙසේ ඉවැසීමෙන් තමාටත් අනුනටත් යහපත සලසන්නාට ධර්මය නොදන්නා අන්ධබාලයෝ 'මෝඩයෙකැ'යි හඟිත්',යැ යි වදාළ සේක.

මේ කථාව අසා සිටි, මුලදී භාග්‍යවතුන් වහන්සේට ආක්‍රෝශ පරිභව කළ ඒ භාරද්වාජ බමුණා පැහැදී තෙරුවන් සරණ ගිය උපාසකයෙක් විය. ඉක්බිති පැවිද්දත් උපසම්පදාවත් ඉල්ලී ය.

භාග්‍යවතුන් වහන්සේ ඔහු ද පැවිදි උපසපත් කළ සේක. හේ විවසුන් වඩනුයේ නොබෝ කලෙකින් සියලු කෙලෙස් නසා රහත් විය.

**මාතුපෝසක බමුණා**

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙවුරම්හි වසන සමයෙහි ම එක් බමුණෙක් අවුත් පිළිසඳර කථා කොට තමා ගේ වතගොත කියනුයේ 'භවත් ගෞතමයිනි, මම් දැහැමින් භික්ෂාව සොයා ගනිමි. එසේ සොයා ගෙනවුත් මගේ මවත් පියාත් පෝෂිත කරමි. භවත් ගෞතමයෙනි, මෙසේ ක්‍රියා කරන මම් සිය යුතුකම කරන්නෙකිම් වෙම්දැ?'යි ඇසී ය.

එ බසට භාග්‍යවතුන් වහන්සේ වදාරන සේක්,

'දැහැමින් ආහාරපානාදිය සපයා මවත් පියාත් පෝෂිත කරන්නා තමාගේ සත්පුරුෂ ධර්මය හේතුකොට ගෙන මෙ ලොවැදිත් පැසැසුම් ලබයි. පරලොවැ දීත් ස්වර්ගයෙහි සැප විඳිමින් සතුටු වේ', යැ යි වදාළ සේක. මෙය අසා පැහැදුණු බමුණා තෙරුවන් සරණ ගිය උපාසකයෙක් විය.

**උග්ගසේන සමාගම**

රජගහ පුර **උග්‍රසේන** නම් සිටු පුතෙක් එ නුවර පැමිණ ක්‍රීඩා දක්වන තරුණියක දැක ඇය කෙරේ පිළිබඳ සිතැති විය. මා පියෝ ඔහු අදහස වෙනස් කරන්නට හැකි සැම උපායම කළෝ ද නො හැකි වූහ, පුතු සනසනු කැමැත්තෝ එ තරුණිය ගේ පියාට දන්වා යවා ඇය සිය පුතුට පාවා දෙන්නට කථා කළහ. සිටු කුමරහු තමන් හා එකතු වැ හැසිරෙතොත් ම සිය දුව දිය හැකි බව තරුණිය ගේ පියා තරයේ කියා සිටියේ ය. උග්ගසේන තෙම සිය ධනස්කන්ධය ද හැර දමා තැන තැන නටා ඇවිදිමින් දිවි රක්නා ඒ නාටක ජනයාට එක් වන්නට කැමැති විය. හේ මා පියන් නො කැමැත්තෙන් නික්ම, නටන ජනයා කරා ගොස් ඇය පාවා ගෙන ඔවුන් හා ගම් නියම් ගම්හි ඇවිද්දේ ය. කලෙකින් ඉහ තෙමෙ ඔවුන් ගේ ක්‍රීඩා ද මොනවට උගත්තේ ය. තැනින් තැන ඇවිදුනා එ පිරිස යලි රජගහ නුවරට ආහ. 'උග්ගසේන සිටු පුතු ක්‍රීඩා ශිල්ප දක්වතැ'යි අසා නුවර වැස්සෝ එහි රැස් වූහ. උග්ගසේන තෙම හුණ ගසක් මත නැඟී අහසට පැන කරනම් සතක් ගසා බැස හුණ ගසෙහි ම පිහිටා සිටියේ ය. මේ වේලෙහි භාග්‍යවතුන් වහන්සේ පිඩු පිණිස නුවරට වඩනා සේක. ක්‍රීඩා බලා සිටි පිරිස උග්ගසේනයා නො තකා හැර භාග්‍යවතුන් වහන්සේ දෙස බලා ගත් වණ ම සිටියහ. උග්ගසේන තෙම මහජනයා තමා දෙස නො බලා භාග්‍යවතුන් වහන්සේ දෙස බලා සිටිනු දැක ශිල්ප දැක්වීමෙහි පසුබට වූයේ ය.

භාග්‍යවතුන් වහන්සේ සිටු පුතු ගේ චිත්තාචාරය දුටු සේක. දැක මුගලන් මහතෙරුන් අමතා 'මෞද්ගල්‍යායනය, ශිල්ප දක්වන්නට සිටු පුතුට කියන්නැ'යි වදාරා ඔහු වෙත යැවූ සේක. තෙරණුවෝ ද එහි වැඩ ශිල්ප දක්වන්නට කීහ. හෙතෙම 'ශාස්තෘන් වහන්සේ මගේ ශිල්ප දක්නා කැමති සේක් වනැ'යි සිතා 'එ සේ නම් බැලුව මැනැව වහන්සැ'යි කියා කරණම් ගසා හුණ ගස මත ම සිටියේ ය.

එ විට භාග්‍යවතුන් වහන්සේ උග්ගසේනයා අමතා,

**'හුණ ගස මුදුන සිට එයින් අහස් පැන කරණම් ගසන්නහු හුණ ගස පෙර පසු දෙ කොණ ද මැද ද යන තුන් තැන ම අතින් මුදන්නා සේ ස්කන්ධ සන්තතිය ගේ පෙර (ස්කන්ධ) කොටස් කෙරේ ඇල්ම මුදාලව (හැර දමව), පසු (අනාගත ස්කන්ධ) කොටස කෙරේ ඇල්ම ද හරුව. මැද (වර්තමාන ස්කන්ධ) කොටස කෙරේ ඇල්ම ද හරුව. මෙසේ හැම තන්හි ඇල්ම හැර මිදුණු සිතැත්තේ ජාති ජරා මරණයට නො පැමිණේයැ'යි**

වදාරා දම් දෙසූ සේක. [157]

දේශනාවසානයේ දී සුවාසූ දහසක් ප්‍රාණීනට ධර්මාභිසමය විය. සිටුපුත් තෙම එසේ හුණ ගස මතුයෙහි සිටියේ ම සිවුපිළිසිඹියා සහිත රහත් බවට පැමිණියේ, බැස අවුත් පසඟ පිහිටුවා භාග්‍යවතුන් වහන්සේ වැඳ පැවිද්ද අයැදී ය. භාග්‍යවතුන් වහන්සේ ඔහු ඒහිභික්ෂු ප්‍රව්‍රජ්‍යායෙන් පැවිදි කළ සේක.

# දෙතිස් වන පරිච්ඡේදය

## පස්වන වස විසාලා මහනුවර

**ශාක්‍ය කෝලිය යුඬය භාග්‍යවතුන් වහන්සේ සංසිඳුවීම**

වස් වසා පවරා ඉක්බිති සැරි සරා වඩනා සාමිදරුවන් වහන්සේ දෙවැනි වරෙකත් **කපිලවාස්තු** පුරයට පැමිණි සේක්, න්‍යග්‍රෝධාරාමයෙහි වුසූ සේක. එසමයෙහි ශාක්‍ය කෝලිය දෙ රට රජුන් ගේ සංග්‍රාමයෙක් විය. එය දත් භාග්‍යවතුන් වහන්සේ එහි වැඩ යුඬ පිණිස රෝහිණී නදිය දෙ තෙර රැස් වූ ඒ නැ රජුන් මැද අහස්හි හිඳ ඔවුනට **අත්තදණ්ඩ සූත්තය** දෙසූ සේක. ඒ ඇසූ ඔවුන් ගේ ක්‍රෝධය සංහිඳිණ. භාග්‍යවතුන් වහන්සේ ඔවුනට **ඵන්දන ජාතක, දද්දභ**

**ජාතක, ලටුකික ජාතක, වට්ටක ජාතක** යන මෙයින් දම්දෙසා එ රජුන් සමගි කැරැවූ සේක. මෙයින් පහන් වූ ඔහු එක් කුලයෙන් දෙ සිය පණස බැගින් ශාක්‍ය කෝලිය දෙ කුලයෙන් පන් සියයක් කුමරුන් භාග්‍යවතුන් වහන්සේ ට පිරිවර පිණිස දුන්හ. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් සියලු දෙනා ඒහිභික්ෂුප්‍රව්‍රජ්‍යායෙන් පැවිදි කළ සේක. එයින් පසු කිඹුල්වත් පුරට නො දුරු මහ වනයට ඔවුන් ගෙන වැඩි සේක. ඒ භික්ෂූන් ගේ පෙර අඹුවෝ නොයෙක් අයුරු පණිවුඩ යවන්නෝ ඒ භික්ෂූන් සිත් ගන්නට තැත් කළහ. භික්ෂූහු ද පැවිද්දෙහි ඇල්ම හළහ. භාග්‍යවතුන් වහන්සේ එ පවත් දැන ඔවුන් සෘඩියෙන් හිමාලය වනයට ගෙන ගොස් එහි දී **කුණාල ජාතකය** වදළ සේක. එය ඇසූ භික්ෂූහු ගිහි වීමේ අදහස දුරු හළහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ චතුස්සත්‍ය කථායෙන් ඔවුනට බණ වදළ සේක.

ඒ ඇසීමෙන් ඔවුන්ගෙන් බාල ම තැනැත්තේ සෝවාන් විය. වැඩිමාළු තැනැත්තේ අනාගාමී විය. සෙස්සෝ සෙදගැමි වූහ. තව ද මෙහි දී බුඩානුභාවය දැක පැහැදි **උසභ** ශාක්‍ය කුමාර, **ගෝතම** ශාක්‍ය කුමාර, ශුඩෝදන රජුගේ පුරෝහිත පුත් **සප්පදස**, කෝලිය පුත් නිසභ ආදී අන්‍ය බොහෝ ජනයෝ ද පැවිදි වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔවුන් ගෙන මහ වනයට ම පෙරළා වැඩ ඔවුනට බණ වදළ සේක. සියල්ලෝ ඒ දේශනාව ඔස්සේ සිත යවා විවසුන් වඩා රහත් වූහ.

ඉක්බිති ඔහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ පසෙක උන්හ, දස දහසක් සක්වල දෙවි බඹුහු ද ඉතා සියුම්වෙස් ගෙන එහි රැස් වූහු. මෙහි දී භාග්‍යවතුන් වහන්සේ **මහා සමය සූත්තය*** වදළ සේක. ඉක්බිති එහි වූ රාගචරිත, ද්වේෂචරිත, මෝහචරිත, ශ්‍රඩාචරිත, බුඩිචරිත, විතර්කචරිත යන චරිත සයින් ඒ ඒ චරිත ඇති දෙවියනට අවවාද කරනු පිණිස තමන් වහන්සේ ම වැනි බුදු රුවක් මවා, තමන් වහන්සේ ඉදිරියෙහි නැගෙන හිර පැත්තේ සම ආසනයෙක හිඳ ප්‍රශ්න අසන සේ සලස්වා, ඒ ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රාග චරිතාදිනට සුදුසු සේ පිළිවෙළින් **සම්මාපරිබ්බාජනිය සුත්ත, පුරාභෙද සුත්ත, කලහවිවාද සුත්ත, චූලවියුහ සුත්ත, මහාවියුහ සුත්ත, තුවටක සුත්ත** යන +දේශනා සයින් දහම් දෙසූ සේක.

---

* මෙය දික්සඟියේ සූත්‍රයෙකි.

\+ මේවා සුත්ත නිපාතයෙහි ඇතුළති.

බුදුරජාණන් වහන්සේ මෙසේ කිඹුල්වත් පුර වසන සමයෙහි මහා ප්‍රජාවතීගෞතමී දේවී උත්වහන්සේ කරා එළැඹ, වැඳ එක් පසෙක සිට, ස්ත්‍රීනට සස්නෙහි පැවිදි වීමට අවසර දෙන ලෙස තුන් වරක් ම අයැදූවා ය. තවම එයට කාලය නො වන බව දුටු භාග්‍යවතුන් වහන්සේ එයට අවසර නුදුන් සේක. එ විට ඕ තොමෝ ශෝක පත් වැ කඳුළු පිරුණු මුහුණ ඇතිව හඬමින් භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට පිටත් වැ ගියා ය.

**පස් වන වස විසාලා පුරයෙහි**

බුදුරජාණන් වහන්සේ ටික කලක් කිඹුල්වත් පුරයෙහි වැස ඉන් නික්ම පිළිවෙළින් සැරි සරන සේක් විසාලා මහනුවරට සම්ප්‍රාප්ත වූ සේක. එ කල වර්ෂර්තුව විය. එබැවින් විසල් පුර සමීපයෙහි මහා වනයෙහි කූටාගාර ශාලා නම් විහාරයේ වුසූ සේක.

**සුදෙවුන් රජු රහත් වීම**

එ සමයෙහි දිනක් අලුයමැ ලොව බලා වදරන සාමි දරුවන් වහන්සේ සුදෙවුන් රජ රෝගයෙකින් පෙළෙන බවත් රජුහු තමන් වහන්සේ දක්නා කැමැත්තෙන් ඉන්නා බවත් දැක, ශ්‍රාවක පිරිසකුත් කැටුව සෘඩියෙන් එහි වැඩි සේක. එහි රෝගාතුර වූ රජු සැතැපී උන් ඇඳ ඉස පැත්තේ පැණැවූ අස්නේ වැඩැ හුන් භාග්‍යවතුන් වහන්සේ රජු හිසැ දක්ෂිණ ශ්‍රී හස්තය තබා සත්‍ය ක්‍රියා බලයෙන් රිදුම දුරු කළ සේක. නන්ද මහ රහත්හු රජු දකුණත අල්ලා සත්‍ය ක්‍රියා කළහ. එ කෙණෙහි ම එ අතැ රුජාව ද දුරු වී ය. අනඳ තෙරණුවෝ රජහු වමතැ ද, සැරියුත් තෙරණුවෝ පිටෙහි ද, මුගලන් තෙරණුවෝ දෙපසෙහි ද, සිය අත් තබා සත්‍ය ක්‍රියා කළහ. එකෙණෙහි රජු සිරුරෙහි සියලු රුජාව මුළු මනින් දුරු වීය. මෙසේ රජ රෝගයෙන් මිදුණේ ය. එහෙත් ඉතා මහළු වූ එ තුමාගේ කයෙහි දුර්වල බව පැවැත්තේ ය.

මේ අවස්ථායෙහි දී භාග්‍යවතුන් වහන්සේ රජුට අනිත්‍යතා ප්‍රතිසංයුක්ත ධර්ම කථායෙකින් අවවාද කළ සේක. ධර්ම කතාවසානයේ දී රජ්ජුරුවෝ රහත් වූහ.

**ශුඬෝදන රහත් හු පිරිනිවන් පෑම**

එ තන් පටන් සතියක් කල් ශුඬෝදන රහත්හු විමු-ක්ති සැප විඳිමින් කල් ගෙවා, සත් දින අවසන්හි භාග්‍යවතුන් වහන්සේ වැඳ, ඒ මංචකයෙහි ම හිඳ සිය ඇමැති ගණයා කැඳවා, තමන් ගෙන් වූ වරදෙක් ඇත් නම් ක්ෂමා කරන ලෙස වදරා, කඳුළු ධාරායෙන් නැහැවෙමින්

වටා රැස්ව හඬා වැලපෙන ප්‍රජාවතීගෞතමී දේවී ප්‍රමුඛ රජ පවුලෙහි ලොකු කුඩා සියල්ලට ශෝක වීමේ නිෂ්ඵල බව දක්වා අනිත්‍යතා ප්‍රතිසංයුක්ත ධර්ම කථායෙන් අවවාද කොට, එ යහන් මතු සැතපී අනුපාදිශේෂ පරිනිර්වාණධාතුයෙන් පිරිනිවන් පෑහ.

භාග්‍යවතුන් වහන්සේ පීතෘ දේහය ආදහන කරවා රැස් වූ මහ පිරිසට දම් දෙසා ඉන් නික්ම පෙරළා විසාලා මහනුවරට ම වැඩි සේක.

**යශෝධරාව මහණ වෙන්නට තැත් කිරීම**

මෙයින් පසු යශෝධරා දේවී 'මහණ වෙමි'යි මෙ විටැ තැත් කළා ය. මහා ප්‍රජාවතී ගෞතමී එය අසා 'දුව, මා වැනි මවකට පවා තෙ වරක් යාච්ඤා කොටත් භාග්‍යවතුන් වහන්සේ පැවිද්දට අවසර නුදුන් සේක. උන් වහන්සේ බුදු වූ පසු තබා, ඉන් පෙරැ ගිහිගෙයි වසන කලැ අග මෙහෙසි ව සිටින සමයෙහි පවා, තෙපි උන්වහන්සේ ඉදිරියේ සිට එඩිතර වැ පුරා වචන දෙකක්වත් කියා ගත නුහුනු වූහ. එසේ කලැ දැන් තෙපි කෙසේ පැවිද්ද ඉල්ලා ගන්නට තරම් විශාරදවන්නහු ද? එය තොපට බැරි ය. මම ම ගොස් පැවිද්ද ඉල්ලා ගන්නෙමි. ඉන්පසු මහණවවු'යැයි කියා ඇය නවතා ලූ ය.

**ප්‍රජාවතී ගෞතමීන් පැවිදි වීම**

ඉක්බිති මහාප්‍රජාවතී ගෞතමී දේවී යළිත් පැවිදි වන අදහසින් ඉහත රෝහිණී නදී තීරයෙහි කලහ විවාද සූත්‍ර දේශනාවසානයේ දී පැවදි වූ කුමරුවන් ගේ භාර්‍යාවන් පන්සියය හා හිස් මුඩු කරවා ගෙන කසාවත් හැඳ පා ගමනින් ම විසාලා මහනුවරට ගියා ය.

**මෙහණී සස්න පටන් ගැනීම**

එ සේ ගොස් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ලවා භාග්‍යවතුන් වහන්සේ ට අයැදුම් කරවා ගුරුධර්ම අටක් පිළිගැණීමෙන් පැවිද්ද හා උපසම්පදව ලැබුවා ය. ඒ ගුරු ධර්ම අට නම් :

'උපසම්පදවෙන් වස් සියයක් වූ මෙහෙණිය විසින් ද එද ම උපසපන් වූ භික්ෂුව දැක වැඳුම් හුනස්නෙන් නැඟී සිටීම් ආදී සැලකිලි දැක්විය යුතු.

භික්ෂූන් නැති පෙදෙසකැ ආවාසයෙක මෙහෙණිය විසින් වස් නො විසිය යුතු.

අඩ මසක් පාසා මෙහෙණිය විසින් භික්ෂු සංඝයා ගෙන් පොහොය විචාළ යුතු. අවවාද දීමට භික්ෂුවක ගේ පැමිණීම ද බලාපොරොත්තු විය යුතු.

වස් අවසානයේ දී භික්ෂු භික්ෂුණී යන උභතෝ සංඝයා ඉදිරියේ පවාරණය කටයුතු.

ගරු ඇවැතකට පැමිණි මෙහෙණිය විසින් උභතෝසංඝයා කෙරෙහි මානත පිරිය යුතු.

දැවුරුද්දක් ශික්ෂමාණාවක ව සිට එයට පසු ම උපසම්පදව ලැබිය යුතු. මොන ම කාරණයෙකිනුත් මෙහෙණියක විසින් භික්ෂුවකට ආක්‍රෝශ පරිභව නො කළ යුතු.

මෙහෙණිය විසින් භික්ෂූනට අවවාද කළ නො හැකිය. භික්ෂූන් විසින් මෙහෙණියනට අවවාද කළ මනා ය. ඒ අවවාද මෙහෙණියන් විසින් පිළිගත යුතු ම ය.

මහා ප්‍රජාවතීගෞතමීන් මේ ගුරුදහම් අට පිළිගෙන පැවිද්දත් උපසම්පදවත් ලැබූ පසු ශාක්‍ය කුමාරිකාවෝ ද ඇය ගුරුකොට ගෙන උපසම්පදව ලැබූහ. උපසපන් වූ මහා ප්‍රජාවතී ගෞතමී තොමෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ වැඳ පසෙක සිටියා ය. එසේ සිටි ඇට භාග්‍යවතුන් වහන්සේ දම් දෙසූ සේක. ඉක්බිති ඕ තොමෝ කර්මස්ථාන ගෙන විදසුන් වඩා රහත් වූවා ය. සෙසු මෙහෙණියෝ පන්සියය ද නන්දක තෙරුන් කළ දේශනාවක් අසා රහත් වූහ. ඉන්පසු භද්‍රකාංචනා (යශෝධරාව) ද ප්‍රජාවතීගෞතමිය ගේ දූ වූ නන්ද ද තවත් බොහෝ ශාක්‍ය කුමාරිකාවෝ ද **ප්‍රජාවතී ගෞතමිය** කරා එළැඹ පැවිදි වූහ.

**භාග්‍යවතුන් වහන්සේ සැවැත්පුර වැඩීම**

භාග්‍යවතුන් වහන්සේ වැසි සාර මාස ගෙවුණු පසු වස් පවරා විසාලා මහනුවරින් නික්ම වඩනා සේක් සැවැත් පුරට පැමිණ වදළහ.

**කොසොල් රජ තෙරුවන් සරණ යෑම**

එහි ජේතවනයෙහි වසන භාග්‍යවතුන් වහන්සේ වෙත දිනක් කෝශලාධීශ්වර **ප්‍රසේනජිත්** රජ තුමා එළැඹියේ ය. එළැඹ පිළිසඳර කථා කොට පසෙක උන්නේ ය. එසේ හුන් රජ තෙම,

'භවත් ගෞතමයන් වහන්සේ තුමූ නිරුත්තර සම්‍යක්සම්බෝධිය ලැබූහ යි ප්‍රතිඥා කෙරෙත් දැ'යි භාග්‍යවතුන් වහන්සේ ගෙන් ප්‍රශ්න කෙළේ ය.

එයට උත්තර දෙන භාග්‍යවතුන් වහන්සේ,

තමන් වහන්සේ සම්‍යක්සම්බුඬත්වය ලැබූ බවත්, එබැවින් ම සම්‍යක්සම්බුඬයෙමි යි ප්‍රතිඥා කරන බවත් වදළ සේක.

එ විටැ 'ස්වාමීනි, මහ පිරිස් ඇති කීර්තිමත් පූරණකස්සප, මක්ඛලිගෝසාල, නාතපුත්ත නිගණ්ඨ, බෙල්ලට්ඨි පුත්ත සංජය, කකුධ කච්චායන, කෙසකම්බලී අජිත යන සදෙනා ගෙනුත්, 'ඔබ සම්‍යක්සම්බුඬ දැ?' යි මා විසින් ප්‍රශ්න කරන ලද නමුත් සම්‍යක්සම්බුඬ බවක් ඉඳුරා නො කීහ. කිමෙක් ද? උන් හැමට වඩා වයසින් බාල වූ මෑත පැවිදි වූ ගෞතමයන් වහන්සේ තුමූ සම්‍යක් සම්බුඬ හ යි ප්‍රතිඥා කෙරත් දැ'යි රජ ඇසී ය. එ විටැ භාග්‍යවතුන් වහන්සේ රජු අමතා,

"**රජ කුමරා ද, සර්පයා ද, ගින්න ද. භික්ෂුව ද යන සතර දෙන ළදරු යැයි පහත් කොට සැහැල්ලු කොට නො සිතිය යුතු යැ**'යි වදරා දහම් දෙසූ සේක. ඒ ඇසූ රජ පැහැදී තෙරුවන් සරණ ගිය උපාසකයෙක් විය. මේ රජ ජේතවනයෙහි බුදුරජුනට **රාජකාරාමය** නම් විහාරයක් ද කැරැ වී ය. බුදුරජාණන් වහන්සේ කොසොල් රජුට වදළ බණ අසා රජු ගේ නැන්දණියෝ **සුමනා දේවී** සරණ ශීලයන්හි පිහිටියහ. ඈ පැවිදි වනු කැමැති වුවත් රජුගේ මිත්තණියට උපස්ථාන කළ යුතු වැ තුබුණු බැවින් අවසර නො ලත්හ.

කලකට පසු රජු ගේ මිත්තණියෝ මළහ. රජ ශෝක පත් වැ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ ඒ බව දැන්වී ය. එ විට සියලු සත්ත්වයන් මරණයට යටත් බව වදරා භාග්‍යවතුන් වහන්සේ රජුගේ ශෝකය සංසිඳුවූ සේක. ඉක්බිති **සුමනා තොම** රජ කැටුව බොහෝ අනැගි භාණ්ඩ ගෙන ගොස් සඞ්ඝයාට දෙවූවා ය. භාග්‍යවතුන් වහන්සේ වදළ බණ අසා ඕ අනාගාමී ව පැවිද්ද ඉල්ලුවා ය. එ විටැ භාග්‍යවතුන් වහන්සේ වදළ ධර්මය අසා රහත් ව තොමෝත් එය ම කීවා ය. ඒ ම ඇගේ පැවිද්ද හා උපසම්පදව විය.

**භාග්‍යවතුන් වහන්සේ ලක්දිව වැඩි දෙ වෙනි ගමන**

සැවැත් නුවර වසන භාග්‍යවතුන් වහන්සේ බක් අව පසළොස්වක් ද අලුයමැ ලොව බලා වදරන සේක්, **චූලෝදර මහෝදර** නම් නා රජුන් අතර මිණි පළඟක් නිසා විය. හැකි යුඬයක් දැක ඔවුන් කෙරෙහි කරුණායෙන් සෘඬියෙන් ලක්දිව වැඩි සේක. දෙව්රම් වෙහෙර දොරටුව සමීපයෙහි කිරිපළු රුකට අධිගෘහිත **සමිද්ධිසුමන** නම් දේවතාවා එය උදුරා ඡත්‍රයක් මෙන් භාග්‍යවතුන් වහන්සේ මත්තෙහි දරමින් ගෙනායේ ය. එසේ වඩනා භාග්‍යවතුන් වහන්සේ මණිනාග දිවයින් වැඩ, යුදයට සැරැසී සිටි නාග සේනාවට පෙනෙමින් අහසැ හිඳ, පෙළහර පා ඔවුනට බණ වදරන සේක්,

සංසාර දෝෂය ද මක්ඛ පලාසාදීන්ගේ ආදීනවය ද කාකෝලූක ජාතක, එන්දන ජාතක, ලටුකික ජාතක, වට්ටක ජාතක යන මෙයින් වෛර බැඳීමේ දෝෂ හා සමගියේ අනුසස් ද ප්‍රකාශ කොට අවවාද කළ සේක.

ධර්ම කථා ශ්‍රවණයෙන් සතුටු වූ දෙ පක්ෂයේ නා රජුහු සමග ව ඒ මිණි පළඟින් භාග්‍යවතුන් වහන්සේ පිදූහ. භාග්‍යවතුන් වහන්සේ එහි හිඳ ගත් සේක, ඉක්බිති නාගයෝ මධුර භෝජනයෙන් භාග්‍යවතුන් වහන්සේ වළඳවා මනා ව බණ ඇසූහ. බොහෝ නාගයෝ සරණ සිල්හි පිහිටියහ.

මහෝදර රජු ගේ මයිල් මණිඅක්ඛික නා රජ කැලණිපුර සිට යුධ පිණිස එහි පැමිණ සිටියේ, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදී පූජ්‍ය වස්තුවක් ඉල්ලී ය. භාග්‍යවතුන් වහන්සේ ඒ මිණිපළඟ ද තමනට සෙවණ කළ සමිඬි සුමන දේවතාවා අරක් ගත් කිරිපළු රුක ද නාගයනට පූජ්‍ය වස්තු කොට දී යලි දූ අවවාදනුශාසන කොට පෙරළා ජේතවනාරාමයට ම වැඩි සේක.

භාග්‍යවතුන් වහන්සේ එක් සමයෙක සැවැත්නුවර වර්ෂා සෘතුව ගත කොට එයින් පසු දක්ෂිණාගිරි ජනපදයට වඩින්නට සැරැසුණු සේක. මෙ පවත් ඇසූ අනේපිඬු සිටාණෝ ද විශාඛා උපාසිකාවෝ ද පසේනදී කොසොල් රජතුමා ද නොයෙක් කරුණු කියා තව ටික කලක් භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ම නවත්වා ගන්නට උත්සාහ කළහ. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් ගේ ඉල්ලීම නො පිළිගෙන ගමන වඩින්නට ම සැරැසුණු සේක. අනේපිඬු සිටාණෝ මෙයින් මහත් කණගාටු වී ගෙයි පැත්තකට වී කල්පනා කරමින් හුන්නෝ ය. සිටු හුගේ බැල මෙහෙවර කරන පූණ්ණා නම් දසී එය දැක, ˋස්වාමීනි, කණගාටු ගතියෙකින් ඉන්නේ ඇයි දැ? යි ඇසුවා ය. සිටුතෙම කාරණය කීයේ ය. ˋස්වාමීනි, මමත් උත්සාහයක් කැර බලන්නෙමි, මගේ උත්සාහය සාර්ථක වුවොත් මට දෙන්නේ මොනවා දැ?ˊයි ඇසුවා ය. ˋතුඹ දසභාවයෙන් මුදා පවුලේ කෙනකුගේ තත්ත්වයට නංවමිˊයි සිටු කී ය.

එ විට ඕ වහා දිවැ ගොස් ජේතවනයෙන් වඩනා භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් ˋස්වාමීනි, මට අනුකම්පාකොට මේ ගමන නවත්තන්නැˊයි කීවා ය. ˋමේ ගමන මා නැවැත්වීමෙන් තුඹට වන යහපත කිමෙක් දැˊයි භාග්‍යවතුන් වහන්සේ අසා වදළසේක. ඕ සිටුතුමා කී වචනය සැළ කොට ˋභාග්‍යවතුන් වහන්සේ මේ ගමන ටික කලකට නැවැත්තුවොත් මම් දසිභාවයෙන් මිදීගත හෙන්නෙමිˊයි කීවා ය.

භාග්‍යවතුන් වහන්සේ අනාගතාංශඥානයෙන් බලා මතු ඇය පැවිදි වැ රහත් වන බව ද දුටු සේක. පුණ්ණා ගොස් සිටුතුමාට තමාගේ උත්සාහය සාර්ථක වූ බව පැවැසුවා ය. සිටුතෙම සොයා බලා භාග්‍යවතුන්වහන්සේ ආපසු වැඩි නියාව දැක සතුටු ව ඇයට ප්‍රශංසා කොට දසභාවයෙන් ඇය මිදූයේ ය. විශාඛාවෝ ද පසේනදී රජ තුමා ද ඇයට ස්තුති කොට සත්කාර කළ හ. ඕ මෙහෙණි සස්නේ පැවිදි වැ ස්වල්ප කලෙකින් රහත් වූවා ය.

## තෙ තිස් වන පරිච්ඡේදය.

**ස වන වස මකුල පර්වතයෙහි, සත් වන වස තව්තිසා දෙව්ලෝහි.**

**ස වන වස** භාග්‍යවතුන් වහන්සේ සැවැතින් නික්ම සැරිසරන සේක්, **මකුල** පර්වතයට වැඩ ස වන වර්ෂර්තුව එහි ගත කළ සේක.

**රජගහපුර වැඩීම** වස් පවරා ඉක්බිති සැරිසරන සේක්, රජගහපුර වැඩ එහි ටික කලක් වුසූ සේක.

**රූප මදයෙන් මත් වූ ඛෙමා** මද්‍රරට සාගල නුවර රජ කුලයෙහි විශිෂ්ට රූපශ්‍රීන් හෙබි **ඛෙමා** නම් කුමරියක් වූය. වැඩි විය පැමිණි ඕ බිම්බිසාර මහ රජුගේ මෙහෙසි වූවා ය. ඕ තොම රූප මදයෙන් මත් වූවා, බුදු රජුන් රූපයට නිග්‍රහ කරති යි අසා භාග්‍යවතුන් වහන්සේ දක්නට නො ගියා ය. රජ තෙම දේවිය බුදු රජුන් දැක්මට යවන අදහසින් උපායක් යොදන්නේ, වේළුවනයේ අලංකාරය වණ්ණ ගීතිකා බඳවා නෘත්‍යකාරාදීනට දෙවී ය. ඔවුන් ගයන ඒ ගී ඇසූ බිසවට වෙළුවනය පෙර නොදුටුවාක් මෙන් හැඟුණේ ය. දිනෙක වේළුවන දර්ශනාභිලාෂයෙන් ම එහි ගියා ය. 'භාග්‍යවතුන් වහන්සේ දක්නට නො පැමිණ, ආපසු එන්නට සැරසුනොත් බලාත්කාරයෙන් වත් ඇය උන්වහන්සේ වෙතට ගෙන යෑ යුතු යැ'යි රජු රාජ පුරුෂයනට අණකොට තුබුණේ ය. දේවි තොමෝ ද වේළුවනය බලා ඇවිද භාග්‍යවතුන් වහන්සේ දක්නට නො ගොස් ආපසු එන්නට සැරසුණා ය. රාජ පුරුෂයෝ ඇය බලාත්කාරයෙන් බුදුරජාණන් වහන්සේ ඉන්නා තැනට ගෙන ගියහ.

ශාස්තෘන් වහන්සේ ඇය එන්නිය දැක, සෘද්ධියෙන් දෙව්හනක වැනි ශ්‍රීමත් ස්ත්‍රියක තමන් වහන්සේ වෙත සිට විජිනිපතක් ගෙන පවන් සලන්නා සේ ඇයට පෙනෙන්නට සැලැස්සූ සේක. ඛේමා එය දැක 'මෙබඳු දෙව්හනන් වැනි රූප ශ්‍රී ඇති ස්ත්‍රීහු භාග්‍යවතුන් වහන්සේ සමීපයේ සිටිත්. මම මොවුන් ගේ මෙහෙකාරකමට වත් නො වටනා තරම් ය. භාග්‍යවතුන් වහන්සේ රූපශ්‍රීයට නිග්‍රහ කරන සේකැ යි රටේ පවත්නා කථාව බොරු චෝදනාවකැ'යි සිතුවා ය. සිතා, ඒ ස්ත්‍රී රූපය දෙස ම බලාගෙන සිටියා ය. ඇය බලා සිටියැ දී ම බුදුරජාණන් වහන්සේ ගේ අධිෂ්ඨානය පරිදි, ඒ ස්ත්‍රී රූපය ප්‍රථම වයස ක්‍රමයෙන් ගෙවා, මධ්‍යම වයසට ද, එය ද ඉක්මැ මහලු වයසට ද පැමිණ, ඉසකේ පැසුණු සම රැලි වැටුණු විරූප වූ කඩදත් මැහැල්ලක් වී, විජිනිපත හැර දමා බිම වැටුණේ ය. ඛේමා තොම ඒ බලා සිට 'මෙබඳු ශ්‍රීමත් ශරීරය පවා මෙසේ විනාශයට පැමිණියේ ය. මගේ ශරීරයත් මෙසේ ම වන්නේ නො වේ දැ'යි සිතුවා ය. ඇගේ රූප මදය හීන වී නුවණ මුහුකුරා ගිය බව දත් බුදුරජාණන් වහන්සේ ශරීරයේ පිළිකුල ප්‍රකාශ කොට දම් දෙසූ සේක. එය ඇසීමෙන් කෙලෙස් බර ගතිය තුනී ව නිරෝග වූ සිත් ඇති ඇයට මහානිදන* සූත්තය වදළ සේක. එය අසා ඕ සෝවාන් ව රජු ගෙන් අවසර ගෙන පැවිදි වූවා ය. එයින් අඩ මසක් ගිය තැන පහනක් ඇවිලීමත් නිවීමත් දැක ඒ අරමුණු කොට විවසුන් වඩා රහත් වූවා ය.

**විකුර්වණර්ද්ධි ප්‍රාතිහාර්‍ය පෑම තහනම්කිරීම**

භාග්‍යවතුන් වහන්සේ රජගහ පුර වසන සමයෙහි රාජගෘහික සිටු සැට රියන් පමණ ඉහළ රත්හඳුන් පාත්‍රයක් එල්වා 'සෘද්ධිමත් රහතෙක් ඇත්නම් මෙය ගනී වා'යි නුවර ප්‍රකාශයක් කැරැවී ය. ඔහු රවටා එය ගැන්මට පූරණකාශ්‍යපාදී තීර්ථකයෝ නොයෙක් උපාය කොටත් නො හැකි වූහු. සත් වන දින **පින්ඩෝලභාරද්වාජ** ස්ථවිරයන් වහන්සේ අහසින් වැඩ පෙළහර දැක්වූයෙන්, සිටු එය උන් වහන්සේට පිරිනැමී ය. මේ කාරණය ඇරැබ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් රැස් කරවා විකුර්වණර්ඩි ප්‍රාතිහාර්‍ය දැක්වීම තහනම් කළ සේක. එ විට තීර්ථකයෝ 'මෙයට පසු ශ්‍රමණ ගෞතමයනුත් තත් ශ්‍රාවකයනුත් ප්‍රාතිහාර්‍ය නො පාති'යි සිතා 'අපි පාත්‍රයක් ලබනු සඳහා අපේ රහත් ගුණය ප්‍රකට නො කෙළෙමු. එහෙත් මින් පසු ශ්‍රමණ ගෞතමයන් හා ම ප්‍රාතිහාර්‍ය පාන්නමු'යි කියා ඇවිද්දහ.

* මෙය දීඝසඟියේ සූත්‍රයකි.

බිම්සර රජු මේ ගැන භාග්‍යවතුන් වහන්සේ විචාළහ. එ විට භාග්‍යවතුන් වහන්සේ රජහු තමා ගේ අඹ උයනෙහි ඵල අනුභව කිරීම තහනම් කළොත් එය රජු හැර සෙස්සනට ම බවත්, එ මෙන් ම ඒ තහනම තමන් වහන්සේ ට නො වන බවත් ශ්‍රාවකයනට ම බවත් සතර මසෙකින් සැවැත් නුවර සමීපයේ ගණ්ඩම්බ රුක ළඟ දී පෙළහර පාන බවත් වදාළහ. එකී දිනැ රජගහ නුවර පිඩු පිණිස හැසිර දවල් දත් වළඳා, ඉක්බිති එයින් නික්ම සැවැත් පුර අතට වැඩිසේක. තීර්ථකයෝ ද 'ශ්‍රමණ ගෞතමයෝ අප හා ප්‍රාතිහාර්‍ය්‍ය නො පා පලායෙති'යි කියමින් බුඩ ප්‍රමුඛ භික්ෂු සඞ්ඝයා පසු පස්සෙන් ගමන් කළහ. ඔවුන් අනු ව බොහෝ ජනයෝ ප්‍රාතිහාර්‍ය්‍ය දක්නා අටියෙන් සැවැත් නුවර බලා ගියහ. භාග්‍යවතුන් වහන්සේ සැවැත් පුර වැඩ ගන්ඩම්බ රුක් මුල දී ඇසළ මස පුර පසොළොස්වක් ද සවස ප්‍රාතිහාර්‍ය්‍ය දැක් වූ සේක.

**යමා මහ පෙළහර**

පෙළහර පාමින් අතරින් පතර ඒ පිරිසට දහම් දෙසූ සේක. පෙළහර දක්වා ඉක්බිති එයින් ම තව්තිසා භවනයට වැඩි සේක. එකෙණෙහි ඒ සේනාව භාග්‍යවතුන් වහන්සේ නො දැක 'බුදුරජාණන් වහන්සේ කොහි වැඩි සේක් දෝ'යි කියා හැඬූහ. ඔහු මුගලන් තෙරුන් වෙත එළැඹ 'භාග්‍යවතුන් වහන්සේ කොහි වැඩිසේක් දැ'යි විචාළහ. උන් වහන්සේ තමන් කාරණය දත් නමුත් අන් තෙරුන්ගේ ගුණය ප්‍රකට කරනු අටියෙන් 'අනුරුඬ තෙරුන් ගෙන් ඇසුව මැනැවැ'යි වදාළ සේක. ඉක්බිති ඔහු අනුරුඬ තෙරුන් විචාළහ. තව්තිසා භවනයෙහි පාණ්ඩුකම්බල ශෛලාසනයෙහි වස්වැස **මාතෘ දෙව් රජුට** අභිධර්මය දෙසනු පිණිස වැඩි බව අනුරුන් තෙරණුවෝ වදාළහ. කවර ද පෙරළා වඩනා සේක්දැ'යි ඔහු විචාළහ. 'වස් තුන් මස ගත කොට පවාරණ දිනයෙහි යැ'යි තෙරණුවෝ වදාළහ. එ විට පෙළහර දැකීමට රැස් වූ මහ පිරිස කඳවුරු බැඳ එහි ම එ තුන් මස රැඳුණහ. චූල්ල අනාථපිණ්ඩික සිටුහු එ සියල්ලට ආහාර පාන බුලත් ආදියෙන් තෙ මස මුළුල්ලෙහි ම සංග්‍රහ කළහ. ඔවුනට බණ වදරන්නට මුගලන් තෙරුනට භාග්‍යවතුන් වහන්සේ කලින් ම නියෝග කර තුබුණෙන් උන්වහන්සේ එහි ම රැඳී එ තුන් මසෙහි එ පිරිසට ධර්ම කථායෙන් සංග්‍රහ කළ සේක.

**සත් වන වස තව්තිසා භවනයෙහි**

යටැ කී සේ තව්තිසා භවනයෙහි වස් වුසූ භාග්‍ය-වතුන් වහන්සේ එ තුන් මසෙහි නිතර දම් දෙසූ සේක. ඒ දේශනාකළ පරිදි නම් : භාග්‍යවතුන් වහන්සේ

පිණ්ඩපාත කාලය වන තෙක් ම දම් දෙසා, ඉක්බිති තමන් වහන්සේ වැනි ම බුදුරුවක් මවා, 'මා එන තෙක් මෙතෙක් ධර්මය දෙසා වා'යි අධිෂ්ඨාන කොට හිමාලයට වඩිනා සේක. එහිදී නාලිය දැවටු වළඳා උතුරුකුරු දිවයිනේ පිඬු පිණිස හැසිර හිමවු පව්වට ම ආපසු වැඩ, එහි අනෝතත්ත විල ළඟ හිඳ දන් වළඳන සේක. ඒ වේලාවේ දී සැරියුත් තෙරණුවෝ එහි පැමිණ භාග්‍යවතුන් වහන්සේට වත් පිළිවෙත් කරති, වළඳා අවසානයෙහි, 'සාරිපුත්‍රයෙනි, අද මම් මෙ තෙක් බණ කීම්, එය තමන් ඇසුරු කරන භික්ෂූනට උගත්වවු'යි නියෝග කොට තමන් එදිනෙද තව්තිසා භවනයේ දී වදළ බණ සැරියුත් තෙරුනට වදරන සේක. ඉන්පසු තව්තිසා භවනයට වැඩ නිර්මිත බුදුරුව අතුරුදන් කොට, එ බුදුරුව වදළ තැන් සිට දහම් දෙසන සේක. මේ නියායෙන් බුදුරජාණන් වහන්සේ ඒ තුන් මස ගත කළ සේක.

ධර්මදේශනාව තුන් මසෙකින් අවසන් විය. දේශනාවසානයේ දී මවු දෙව්පුත් සෝවාන් පෙලෙහි පිහිටියේ ය. අසූ කෝටියක් දෙවියෝ ද මාර්ග ඵල ලැබූහ.

පවාරණයට සත් දවසක් කලින් මුගලන් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ 'කවර ද වඩිනා සේක්දැ'යි ඇසූහ. ඉන් සත් වන ද සංකස්ස නගරද්වාරයට තව්තිසායෙන් බස්නා බවත් තමන් වහන්සේ දක්නා කැමැත්තන් එහි ඉයැ යුතු බවත් වදළ සේක. සැවැත් නුවර සිට සංකස්ස නගරයට දුර යොදුන් තිසක් වුවත් ඒ සැවැත් පුර රැස්ව සිටි පිරිසට එහි යෑම සමීප විහාරයකට යන ගමනක් මෙන් ඉතා ඉක්මන් ද පහසු ද විය.

භාග්‍යවතුන් වහන්සේ වප් මස මැදිපෝද පාණ්ඩුකම්බල ශෛලාසනයෙහි දී ම වස් පවරා, එදම, ශක්‍ර බ්‍රහ්මාදීන්ගේ පූජෝත්සවයෙන් ගෞරව ලබමින් මහ පෙරහැරින් සංකස්ස නගර ද්වාරයට බැස්ස සේක. ඒ දුටු සැරියුත් තෙරණුවෝ බුදුරජුන් වැඳ එ වැනි බුඩ ශ්‍රියක් ඉන් පෙර තමන් නුදුටු බව, ආදිය කී කල, එය ඇරැබ භාග්‍යවතුන් වහන්සේ ධර්ම දේශනාවක් කළ සේක. එය ඇසූ දෙවියන් ඇතුළු මහා පිරිසකට ධර්මාභිසමය විය. සැරියුත් තෙරුන්ගේ සඬිවිහාරික පන්සියයක් පමණ භික්ෂූහු රහත් වූහූ. මෙහිදී බුදුරජාණන් වහන්සේ ඒ ඒ තැනැත්තනට විෂය වූ ප්‍රශ්න පෘථග්ජන සෝවාන් ආදීන්ගෙන් පිළිවෙළින් අසා අන්තිමේ දී මේ සස්නෙහි මහාප්‍රාඥ වූ සැරියුත් තෙරුන්ගෙන් බුදුවරුන් විසින් ම විසඳිය හැකි ප්‍රශ්න විචාළ සේක. එය මුල දී උන්වහන්සේට නො හැකි

වූ නමුත්, ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ විසින් දෙන ලද නය ක්‍රමයෙහි සිට විසඳිය හැකි විය. මෙයින් සැරියුත් තෙරුන් සෙසු සියල්ලට ම වඩා නුවණින් අග තන් පත් බව භාග්‍යවතුන් වහන්සේ පැවැසූ සේක.

**මෛත්‍රෙය බෝසතුන් පැවිදි වීම**

දේවාවරෝහණ උත්සවය දැක්මෙන් පැහැදුණු අප්‍රමාණ ජනයෝ බුදු බව පැතූ හ. ඉනුත් විශේෂයෙන් ම මෛත්‍රෙය බෝසතාණෝ භාග්‍යවතුන් වහන්සේගේත් සැරියුත් තෙරණුවන් ගේත් අතර වූ ප්‍රශ්න විසර්ජන කථාව ඇසුවෝ එද ම පැහැදී පැවිදි වූහ.

මේ මෛත්‍රෙය බෝසතාණෝ වනාහි මෙයින් සොළොස් අසඞ්ඛ්‍යෙය කල්ප ලක්ෂයෙකින් යටැ මතු බුදු වනුවට නියත විවරණ සිරි ලැබුවෝ පෙරුම්දම් පුරමින් දෙව්මිනිස් දෙ ලෝහි සරතුවෝ, අප බුදු පියාණන් දවසැ දෙව් ලොවින් චුත ව, සැවැත් නුවරින් තිස් යොදුන් පමණ තන්හි සංකස්ස නුවර ගැහැවි මහසල් කුලෙක **සිරිවඩ්ඪ** නම් මහ කෙළෙඹියාට පුත් ව උපන්නෝ ය. සුව පෙරහරින් වැඩුණු එ තුමෝ දිසා පාමොක් ඇදුරක්හු වෙත ඉගෙන ශිල්ප ශාස්ත්‍රයන්ගේ කෙළවරට පැමිණ මා පියන් ඇවෑමෙන් කුටුම්බ ස්වාමීව, මහ පිරිවර ඇත්තෝ, ශ්‍රී සම්පත් විඳ වසන්නෝ, යටැ කී පරිදි දේවාවරෝහණ සමාගමයෙහි දී, සියලු ගිහි සැප හැර දමා, දහසක් පමණ පිරිවර ජනයා එක්ක එද ම භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදි වූහ, පැවිදි උපසපන් බව ලත් **ආයුෂ්මත් මෛත්‍රෙය** බෝධිසත්ත්ව භික්ෂූහු බුද්ධ වචනය මොනොවට ඉගෙන නොයෙක් සිය ගණන් භික්ෂු සමූහයාට එය ඉගැන්වූහ.

**මෛත්‍රෙය බෝසතුන් විවරණ ගැනීම**

නැවැත පසු කලෙක එ මහාසත්ත්වයාණෝ තමනට වස්සග්ගයෙන් ලැබුණු මහඟු වස්ත්‍ර යුගලයෙන් එකක් භාග්‍යවතුන් වහන්සේගේ ගන්ධකුටියෙහි වියන් කොට බැඳ අනිත් වස්ත්‍රය ඉරා වියන් කෙළවර පන්ති කොට එල්ලූහ.[160]

භාග්‍යවතුන් වහන්සේ **ආයුෂ්මත්මෛත්‍රෙය** බෝධිසත්ත්ව භික්ෂූන් ගේ අදහස් දැන භික්ෂු සංඝයා මධ්‍යයෙහි දී ඔබ පෙන්වා.

'මහණෙනි, උතුම් වස්ත්‍ර යුගලයෙකින් බුදුන් පිදූ මේ භික්ෂූහු බලවූ, මේ තෙමේ මතු මේ මහාභද්‍ර කල්පයෙහි ම මෛත්‍රෙය නම් සම්‍යක්සම්බුද්ධ වන්නේ ය. එ කලැ මෙ බරණැස් පුර කේතුමතී නම් රාජධානියෙක් වන්නේ ය. එහි **සංඛ** නම් සක්විති රජෙක් වන්නේ ය. ඔහු පුරෝහිත

සුබ්‍රහ්ම නම් බමුණා මෛත්‍රෙය බුදුන් ගේ පිය වන්නේ ය. එ පෙරෙවිහුගේ භාර්‍ය්‍යා වූ බ්‍රහ්මවතී බැමිණි මව වන්නී ය. නා රුකෙක් එ බුදුහු ගේ බෝරුක වන්නේ යැ'යි විවරණ සිරි දී වදළ සේක.

# සූ තිස් වන පරිච්ඡේදය

### අටවන වස භේසකලා වනයෙහි

**අට වන වස**

ශාස්තෲන් වහන්සේ **සංකස්ස** පුරයෙහි ටික දිනක් වැස සැරි සරන සේක්, භග්ග දේශයෙහි **සුංසුමාරගිර** පුරය අසළ වූ භේසකලා වනයට වැඩ අට වන වැසි සමයැ එහි වුසූ සේක.

**බෝධිරාජ කුමාරයාට දම් දෙසීම**

එ සමයෙහි **බෝධිරාජ** කුමාරයා ගේ **කෝකනද** නම් මහහු පායෙක් නිමවන ලද්දේ ය. ගෙවදින උත්සවය එළැඹ සිටි සමයෙහි කුමාර තෙම භාග්‍යවතුන් වහන්සේට නිමන්ත්‍රණය කෙළේ ය.

ඒ බෝධිරාජ කුමාරයා වනාහි දරුවන් නැත්තෙකි. එ බැවින් 'ඉදින් මට පුතෙක් හෝ දූවක් ලැබේ නම් භාග්‍යවතුන් වහන්සේ මේ පියවිල්ල ඈක්ම වඩනා සේකැ'යි සිතා රෙදි පියවිල්ලක් ද එලූයේ ය. කුමරුගේ අදහස දත් භාග්‍යවතුන් වහන්සේ එහි පා නො තැබූ සේක. එහි පා තබා වඩින සේ තුන් වරක් ම කුමරු අයැදූ නමුත් භාග්‍යවතුන් වහන්සේ එය නො පිළිගත් සේක.

කුමර තෙම ආනන්ද ස්ථවිරයන් වහන්සේ ගේ වචනය පරිදි ඒ පියවිල්ල අකුළා භාග්‍යවතුන් වහන්සේත් භික්ෂු සංඝයාත් ගෙට වැඩම කරවා මධුරාන්න පානයෙන් සංග්‍රහ කෙළේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වැඳ, පියවිල්ලෙහි පා නොතැබූ කාරණය විචාළේ ය.

'කුමක් සිතා ඒ පියවිලි එලූයෙහි දැ ?'යි භාග්‍යවතුන් වහන්සේ ඇසූ සේක.

'පුතෙක් හෝ දූවක් ලැබේ නම් භාග්‍යවතුන් වහන්සේ මෙය පා ගා වඩනා සේකැයි සිතිමි'යි කුමර කී ය.

'එ හෙයින් ම මම එහි පා නො තැබීමි'යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

'කිමෙක් ද වහන්ස, මට පුතෙක් හෝ දුවක් නො ලැබේ දැ?'යි කුමර විචාළේ ය.

'නො ම ලැබෙන්නේය. කුමාරයෙනි'යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

'කුමක් හෙයින් ද වහන්සැ?' යි කුමර පුළුවුත.

එ විට භාග්‍යවතුන් වහන්සේ ඔවුන් පෙර අත් බැවෙක කළ වරදෙක හේතුවෙන් දරුවන් නො ලබන බව වදරා අතීත කථාව ගෙනහැර පෑ සේක.

'පෙර පිරිසෙක් නැව් නැගී ගියේ ය. නැව මූද මැද දී බිඳිණ. එහි උන් අය අතුරෙන් අඹු සැමි දෙදෙනෙක් ලී කොටයෙකැ එල්බ ජීනන්නෝ, අතුරු දූවකට පැමිණ එහි වුසූහ. ඒ දිවයිනෙහි බොහෝ පක්‍ෂිහු වසති. ඒ දෙදෙනා පක්‍ෂි බිජුවට දැක ඒවා ගෙන ගින්නෙහි පලහා කෑහ. ඉන් පසු කුරුළු පැටියන් ද මරා කෑහ. තරුණ තලතුනා මහළු යන තුන්වයසෙහි ම ඔහු මෙසේ ප්‍රමත්ත ව කල් යැවූ හ.'

මෙහි ඒ අඹු සැමි දෙදෙනා නම් බෝධිරාජ කුමරුත් ඔහු දේවියත් යැ යි පවසා,

**'තමා ප්‍රිය කරන්නහු විසින් තුන් වයස් හි ම තමා නො පමාව රැක්ක යුතුයැ**[161]'යි වදාරා දහම් දෙසූ සේක.

දේශනාවසානයේ දී බෝධිරාජ කුමාරයා සෝවාන් විය.

**සැවැත් පුර වැඩීම. පුණ්ණ කෙළෙඹි පැවිදි වීම**

භාග්‍යවතුන් වහන්සේ වස් සමයෙන් පසු සැවැත් පුර වැඩ, කලක් එහි වුසූ සේක. එ සමයෙහි සුනාපරන්තයේ **සුප්පාරක** පටුනින් පන්සියයක් පමණ ගැලින් වෙළෙඳාම සඳහා සැවැත් පුර පැමිණි **පුණ්ණ** නම් කෙළෙඹියෙක් දිනක් භාග්‍යවතුන් වහන්සේ දක්නට යන පිරිස දැක, තෙමේ ද ඔවුන් කැටුව ජේතවනාරාමයට ගියේ ය. හෙ තෙම බණ අසා පැහැදුණේ පසු දා බුඩ ප්‍රමුඛ මහා සඞ්සයාට මහ දන් දී, තමා ඉපැයූ ධනය සිය මයිලණුවනට භාණ්ඩාගාරිකයා බාරේ යවා තෙමේ පැවිදි විය.

අප්‍රමත්ත ව මහණ දම් පුරන පුණ්ණ හිමියෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ වැඳ 'වහන්ස, මට සංක්‍ෂේපයෙන් අවවාදයක් කළ මැනැවැ'යි කීහ.

**පුණ්ණ තෙරුන් සුනාපරන්තයට යෑම**

භාග්‍යවතුන් වහන්සේ ද ඔවුනට රහත් බව තෙක් කර්මස්ථාන ක්‍රමය* සැකෙවින් වදාළ සේක. ඉක්බිති 'තෙපි ගොස්, කොහි වසවු දැ?' යි භාග්‍යවතුන් වහන්සේ පුණ්ණ තෙරුන්ගෙන් ඇසූහ.

පුණ්ණ : වහන්ස සුනාපරන්ත නම් ජනපදයෙක් ඇත. එහි ගොස් වසන්නෙමි.

භාග්‍යවතුන් වහන්සේ : පුණ්ණය, සුනාපරන්ත ජනපද වාසීහු දරුණු මිනිස්සු ය. ඔවුන් තොපට ආක්‍රෝශ කළොත්?

පුණ්ණ : වහන්ස, ඔවුන් මට ආක්‍රෝශ කළත් අතින් මිටින් පහර නුදුන්නොත් ඒත් යහපතැ යි සිතමි.

භාග්‍යවතුන් වහන්සේ : ඉදින් ඔවුන් අතින් මිටින් පහර දුන්නොත්?

පුණ්ණ : කැට කැබැලිත්තෙන් තො ගසා අතින් මිටින් තැළුවත් එයත් ඔවුන් ගේ ගුණයක් කොට සලකමි.

භාග්‍යවතුන් වහන්සේ : ඉදින් ඔවුන් කැට කැබිලිතිවලින් පහර දුන්නොත්?

පුණ්ණ: කැටින් පහර දුන්නත් දංඩෙන් පහර නො දෙත් නම් එයින් ඔවුන් හොඳ මිනිසුන් කොට සලකන්නෙමි.

භාග්‍යවතුන් වහන්සේ : ඉදින් දංඩෙන් පහර දුන්නොත්?

පුණ්ණ : මොහු යහපත් මිනිස්සු ය. මට ආයුධයෙන් පහර නො දෙති'යි සිතන්නෙමි.

භාග්‍යවතුන් වහන්සේ : ඉදින් ඔහු සැතින් පහර දෙත් නම්?

පුණ්ණ : මොහු තියුණු සැතින් පැහැර මා දිවි නො නසති. එ බැවින් මොහු මනා මිනිස් කෙනෙකැ යි සිතමි.

භාග්‍යවතුන් වහන්සේ : ඉදින් ඔහු තොප දිවි තොර කරත් නම් ?

පුණ්ණ : ඉදින් ඔහු එ සේ මා දිවි තොර කරත් නම්, 'ඇතැම් කෙනෙක් සිරුරෙහි කලකිරී, තමන් මරන කෙනෙකුන් සොයති. මම එනාහි නො සොයා ම එවැනි කෙනකුන් ලැබිමි'යි සිතමි, වහන්ස.

---

* මේ මජ්ඣිම නිකායයෙහි පුණ්ණෝවාද සූත්‍රය යි.

පුණ්ණ තෙරුන් ගේ කථාව අසා භාග්‍යවතුන් වහන්සේ තුන් යලක් සාධුකාර දී, 'පුණ්ණයෙනි, තෙපි සුනාපරන්තයෙහි වසන්නට නිස්සහ'යි වදාළ සේක.

පුණ්ණ තෙරණුවෝ ද භාග්‍යවතුන් වහන්සේ වැඳ අවසර ගෙන නික්ම ගියෝ, සුනාපරන්ත ජනපදයට පැමිණ එහි **අම්බාටක*** පර්වතයෙහි වසන්නෝ, දිනක් වෙළෙඳ ගමට පිඩු පිණිස වැඩියහ. තෙරුන්ගේ බාල සොහොයුරු කෙළෙඹි පුත් තෙම තෙරුන් හැඳින, ඇත යෑ නො දී එහි ම වස්වා සිවුපසයෙන් උපස්ථාන කෙළේ ය. තෙරණුවෝ එයින් මුදු තෙර **සමුද්‍රගිරි** නම් වෙහෙරකට වැඩියාහ. එහි සමුද්‍ර ඝෝෂය ඇසෙන බැවින් කමටහන් වැඩීමට ඒ නො සැප යැ යි සලකා, ඉන් **මාතුලගිරි** නම් වෙහෙරකට වැඩ එහි ලිහිණියන්ගේ අධික ශබ්දය ඇති බැවින් නො සැප යැයි සලකා, ඉනුත් නික්ම, සිය වෙළෙඳ ගමට නුදුරු නො ළං වූ ජනවිවික්ත, නිශ්ශබ්ද, යෑම ඊමට පහසු වූ **මකුලාරාම** නම් වෙහෙරකට පැමිණ එහි වස් වුසූහ. තෙරණුවෝ එහි දී රහත් වූහ. දිනක් පුණ්ණ තෙරුන් ගේ බාල සොහොයුරු වූ වෙළෙඳ තෙම අතවැසි පන්සියයක් පමණ වෙළෙඳුන් හා වෙළෙඳාම් පිණිස පිටරට යන්නට සැරසුණේ තෙරුන් ගෙන් පන්සිල් ගෙන වැඳ නැව් නැඟ පිටත් විය.

**සුප්පාරකයෙහි වෙළෙඳුන් සරණගතයන් වීම**

ඔහු මෙසේ යාත්‍රා කරන්නෝ එක් දිවයිනකට බටහ. එය පරීක්ෂාකර බලන්නෝ රත්සඳුන් වනයෙකැ යි දැන, 'මෙයට වැඩි වටිනා දෙයක් ඔබ්බෙන් නො ලැබිය හැකි. මේ ම ප්‍රමාණ යැ'යි කියා නැව හිස් කරවා රත් සඳුනෙන් පුරවා, පෙරළා සිය රටට යාත්‍රා කළහ. නැව මහත් උත්පතනයකට අසු වී ය. ප්‍රධාන වෙළෙඳ තෙම 'පුණ්ණ තෙරහු අපට පිහිට වෙත්වා'යි තෙරුන් සිහි කළහ. තෙරණුවෝ ද ආවර්ජන කොට බලනුවෝ. සොහොයුරා නැඟී ගිය නැව අන්තරායකට මුණ පෑ බව දැන එහි වැඩ ඔවුන් අස්වසා, මොවුන් කැමැති තෙනකට නැව යේ වා'යි අධිෂ්ඨාන කළහ. මෙසේ සියලු වෙළෙන්දෝ නිරුපද්‍රැතව සිය ගමට ආහ. ඉක්බිති ඔහු වඩාත් පැහැදී සිය බිරියන් හා අවුත් තෙරුන් හමුයෙහි දී තිසරණයෙහි පිහිටියහ.

**රත් සඳුනින් විහාර කැරැවීම**

ඉක්බිති වෙළෙන්දෝ නැවෙන් බඩු බා ගෙන කොට-සක් තෙරණුවනට දුන්හ. තෙරණුවෝ 'මට බඩු කොටසින් අර්ථයෙක් නැතැ' යි වදරා, 'තෙපි

---

* මේ 'අම්බහට්ථ' ය යි ඇතැම් පොතක පෙනේ.

බුදුරජාණන් වහන්සේ දුටුහු ද?'යි අසා, 'නැතැ'යි කී කල, 'එසේ නම් මෙයින් බුදුරජාණන් වහන්සේ ට විහාරයක් කරවූ, බුදුරජාණන් වහන්සේ දක්වන්නෙමි'යි වදළහ. ඔහු තෙරුනට වෙන් කළ කොටසින් ද තමනට අයත් කොටස්වලින් ද භාග්‍යවතුන් වහන්සේටත් සංඝයාටත් විහාර කළහ. විහාර කර්මාන්තය නිමවා ඒ බව තෙරුනට දැන්වූහ. තෙරණුවෝ සෘද්ධියෙන් භාග්‍යවතුන් වහන්සේ කරා ගොස් එහි වඩනට ආයාචන කළහ.

**භාග්‍යවතුන් වහන්සේ සුනාපරන්තයට වැඩීම. සච්චබද්ධ ජටිලයා පැහැදවීම**

භාග්‍යවතුන් වහන්සේ ද ඒ පිළිගෙන, පසුදා පන්සියයක් භික්ෂු සමූහයා හා අහසින් වැඩි සේක. එ සේ වඩින බුදුරජාණන් වහන්සේ අතර මඟ **සච්චබද්ධ** නම් පර්වතයකට බැස එහි උග්‍ර තපස් ඇති ජටිලයාට දම් දෙසා ඒහි භික්ෂුප්‍රව්‍රජ්‍යායෙන් පැවිදි කොට, ඒ භික්ෂු ද කැටි ව වෙළෙඳ ගම් වැඩි සේක.

ගම් වැස්සෝ බුද්ධ ප්‍රමුඛ සංඝයාට මහ දන් දී තමන් තැනැවූ ආරාමයට වැඩම කැරවූහ.

**සුනාපරන්ත වාණිජ සමාගම**

සවස් කාලයෙහි ගම් වැස්සෝ මල් පහන් ආදිය ගෙන ආරාමයට ගියහ. ඔවුනට භාග්‍යවතුන් වහන්සේ දම් දෙසූ සේක. ඔහු සෝවාන් ආදී මාර්ග ඵලයනට පැමිණියහ. ඔවුනට වැඩ පිණිස භාග්‍යවතුන් වහන්සේ එහි කිහිප දිනක් ම වුසූසේක.

**නර්මදා නදීතීරයෙහි පා සටහන තැබීම**

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පූර්ණ තෙරුන් එහි ම නවතා, ඉන් නික්ම **නර්මද** නදී තීරයට වැඩි සේක. **නර්මද** නා රජ පෙර ගමන් කොට, භාග්‍යවතුන් වහන්සේ, ස්වීය භවනයට පමුණුවා මහත් සත්කාර කෙළේ ය. ඒ නා රජුගේ ආයාචනයෙන් භාග්‍යවතුන් වහන්සේ නර්මද නදීතීරයෙහි පාද ලාංඡනය තැබූ සේක.

**සච්චබද්ධ පර්වතයෙහි පා සටහන**

ඉක්බිති සච්චබද්ධ* පර්වතයට වැඩ එහි සච්චබද්ධ තෙරුන් නැවැත් වූ සේක. පූජ්‍ය වස්තුවක් තෙරණුවෝ ඉල්ලූ හ. භාග්‍යවතුන් වහන්සේ ගල මත්තෙහි අලුත් මැටි පිඩෙකැ මෙන් පාද ලාංඡනය තැබූ සේක.

---

* කඳුහතක් එකට බැඳී පිහිටි බැවින් මෙය සත්තබද්ධ නම් වැ පසු වැ සච්චබද්ධ නම් විය. අද මෙය ඒඑ මලෙයි නමින් ප්‍රසිද්ධ ය. මදුරාසි දිස්ත්‍රික්කයට අයත් ය. තිරුපතිපුරය මේ කන්ද පාමුලය.

**බුදු රජුන් තෙවෙනි වරැ ලක්දිවැ වැඩීම**

භාග්‍යවතුන් වහන්සේ පෙරළා ජේතවනාරාමයට වැඩ එහි වසන සෙමෙහි, බුඬත්වයෙන් අටවන වර්ෂයෙහි **මණිඅක්ඛික** නම් ලක්වැසි නාගාධිපතියෙක් භාග්‍යවතුන් වහන්සේ කරා ගොස් ලක්දිව වඩනට ආයාවන කෙළේ ය. භාග්‍යවතුන් වහන්සේ ද ඒ අයැදුම පිළිගත් සේක.

නා රජ තෙම සතුටු ව ලක්දිව ගොස් ස්වකීය කැළණි පුරය සරසවා, බුඬ ප්‍රමුඛ සංඝයාට සෙනසුන් පිළියෙළ කරවා, භාග්‍යවතුන් වහන්සේ පිළිගැනීමට සිය නාග ජනයා හා පෙර මගට වුත් බලා සිටියේ ය.

මේ දවස වනාහි වෙසක් මස පුණු පොහෝ දා ය. භාග්‍යවතුන් වහන්සේ මහද්භික්‍ෂු සංඝයා පිරිවරා අප්‍රමේය බුඬානුභාවයෙන් බබලමින් ලක්දිව වැඩ කැළණියට බැස්ස සේක. නාගයෝ බුඬ ප්‍රමුඛ සංඝයා වඩා හිඳුවා දන් වැළඳැවූහ. වළඳා අන්තයෙහි භාග්‍යවතුන් වහන්සේ පහත සඳහන් අදහස් ඇති දහමක් දෙසූ සේක.

* [162] 'පින්වත් නාගයිනි, අසවු. සසර සත්ත්වයෝ බුදුවරයකු ලබා ද පිහිට කොට නොගත්තෝ අනාථ ව දුකෙහි ගැලෙති.'

'නාගයිනි, දුර්ලභ වූ බුඬෝත්පාද කාලය බොහෝ කලෙකින් ලබාගෙන සිටින තෙපි පමා නො වවු. සසර වසන්නහුට ජරා මරණ ශෝක පරිදේව දුඃඛ දෞර්මනස්‍යයෝ නියත හ. සසරින් මිදුණාහට එ කිසි දුකෙක් නො වේ.'

'සත්ත්වයන්ගේ තරුණ බව නෙලුම් මලෙක ස්වභාව සේ ස්වල්ප කලක් පවත්නා එකෙකි. ජීවිතය පිනිබිඳක් මෙන් නිස්සාර ය. ධන සම්පත් රළ බිඳීම මෙන් අස්ථිරය ය. සිත නිතර නන් වැදෑරුම් ශෝකයෙන් තැවේ.'

'පෙර ආකාශචාරී සෘ මත් සෘෂිහු ද ස්ත්‍රී රූපයෙහි ඇලුණෝ ධ්‍යානයෙන් පිරිහී විනසට පැමිණියහ. නුවණැත්තෙනි, තෙපි එ බැවින් රූපයෙහි නො ඇලෙවු.'

'පෙර එක් මොනරෙක් සෙබඩක ගේ හඬෙහි ඇලුණේ ඒ අනුව ගියේ වැද්දකුට අසු විය. එ හෙයින් ශබ්දයෙහි ඇල්ම ද මහත් දුකට කාරණ ය.'

---

* සමන්තකූට වණ්ණනා.

'මී මැසි තෙම මද ගන්ධයෙහි ඇලුණේ මල් පැණියෙහි ඇල්ම ද හැර දමා මතැතුන් ගේ කුම්භස්ථලයට පැමිණ කන් තල පහර ලබා සුන් බුන් ගාත්‍ර ඇත්තේ විනසට පැමිණේ. ගන්ධයෙහි අල්ම ද විනාශයට කාරණයෙකි.'

'ගැඹුරු ජලයෙහි බොහෝ ආහාර ඇත ද, රසයෙහි ගිජු වූ මත්ස්‍ය තෙම බිලිය ගිල මහත් දුකට පැමිණේ. රස කාමයෙහි දොස් සලකා ඒ හැර දමවු.'

පෙර ඇත්බැවෙක 'බඹ ලොවින් චුත ව වුත් මිනිස් ලොව ඉපිද පරිශුධ බ්‍රහ්මචාරී ව සිටි බෝධිසත්ත්ව තෙමේ ද ස්ත්‍රී සඞගමයෙහි ඇලුණේ තම සතු රාජ්‍යයෙන් ද පිරිහුණේ ය. ස්ප්‍රෂ්ටව්‍යකාමය මහත් ව්‍යසනයට කාරණයෙකි.'

එබැවින් මෙ කී පංචකාමයන්හි ඇල්ම හරිවු.

'පෙර කැනහිල් සා වඳුරු දියබලු යන අහේතුක ප්‍රතිසන්ධි ඇති සත්වයෝත් දාන පාරමිතාව පුරා ඉන් මිදී අවුත් නිවන් සැප ලදහ. නාගයිනි, නිවන් පතන කවරෙක් දානපාරමිතාව නො පුරා ද?'

'ඒ දාන ශීල හේතුයෙන් ලැබෙන ස්වර්ගය මහත් රත්න ප්‍රාසාදාදියෙන් ගැවැසි ගත්තේ ය. බොහෝ දෙවඟනන්ගෙන් සුන්දර ය. පිපි පුෂ්ප ජාතියෙන් යුත් පද්මාකර උද්‍යානාදීන් සිත් කළු ය. එහි දෙවියෝ මරණය නැත්තවුන් සේ නිතර සැපෙන් කල් යවත්.'

'පින්වත්නි, ඒ දිව්‍ය සම්පත්තියට වඩා බ්‍රහ්ම සම්පත්තිය රම්‍ය ය, එයටත් වඩා නිර්වාණ සම්පත්තිය ශ්‍රේෂ්ඨ ය. එ බැවින් සිය දියුණුව පතන නැණැතියෙනි, එ නිවන් ලබනු පිණිස නිතර වීයඝී කරවු.'

**සුමන දිව්‍ය රාජයාගේ ආයචනය**

නාග ජනයෝ මේ ධර්ම කථාව මොනවට පිළිගත්හ. ධර්ම දේශනාව ඒ පිරිසට සාර්ථක විය. ඒ මහා සභාවට පැමිණි සුමන දෙව්රජ තෙම භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ වැඳ, තමා වසන සමන්තකූට පර්වතයට ද වඩින ලෙස ආයාචන කෙළේ ය. එය පිළිගත් භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවක සමූහයා සහිත වැ එදා පස්වරුයෙහි අහසින් ඒ පර්වතය කරා ද වැඩි සේක. මහත් දේවගණයා රැස්වී ය. මෙහිදී සුමන දිව්‍ය රාජයා සිරිපා සටහන තබන මෙන් භාග්‍යවතුන් වහන්සේ ඇයැදී ය. භාග්‍යවතුන් වහන්සේ ද වම් සිරිපා ලකුණ එහි පිහිටු වූ සේක.

ඉක්බිති පර්වත ප්‍රාන්තයෙහි එක් ගල් ගුහායෙක දිවා විහරණය කළ සේක. ඒ භගවද්ගුහා නමින් දන්නා ලදී. ශ්‍රාවකයෝ පර්වතයෙහි තැන තැන දිවා විහරණය කළහ.

ඉන්පසු ශ්‍රාවක ගණයා සහිත බුදුරජාණන් වහන්සේ එ තැනින් නික්මැ අහසින් රුහුණු ජනපදයට වැඩ එහි දැන් දීඝවාපි ස්තූපය පිහිටි තැන නිරෝධ සමාපත්තියෙන් මඳ වේලාවක් හුන් සේක.

එයින් අහස් නැග අනුරාධපුරය වූ භූමිභාගයට වැඩ සිරිමහ බෝමැඩ, මහුල් මහසෑය, අකුදා නිදාන් කළ තැන යන මෙකී ස්ථානයන්හි මඳ මඳ වේලා නිරෝධ සමාපත්තියෙන් කල් යවා. දැන් ශෛල චෛත්‍යය වූ ස්ථානයට වැඩ, එහිදී දම් දෙසා ඉන් අහස් නැග දඹදිව සැවැත්පුර ජේතවනාරාමයට ම පෙරළා වැඩි සේක.

# පන් තිස් වන පරිච්ඡේදය

### නව වන වස කොසඹෑ පුර ඝෝෂිතාරාමයෙහි, දස වන වස පාරිලේය වනයෙහි

**භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ පුර වැඩීම**

භාග්‍යවතුන් වහන්සේ සැවැත්පුර වසන පළමු සමයෙහි හිමවත් පෙදෙසැ සිට එන තවුසන් සමූහයෙක් බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ බවත් ඒ සමයෙහි සැවැත් නුවර වසන බවත් අතර මඟදී අසා, සැවැත් පුරට යන අදහස් ඇති ව, තමන් ඇසූ ආරංචිය තමනට උපස්ථායක වූ කොසඹෑ නුවර සිටුවරුනට ද දන්වන පිණිස කොසඹෑ පුරයට පැමිණියහ. එහි **ඝෝෂිත කුක්කුට පාවාරික** යන මහාධන සිටුවරුන් තිදෙනාට බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ බව දන්වා ඒ තවුසෝ සැවැත් නුවර බලා ගමන් කළහ. ඔහු එහි ජේතවනාරාමයට පැමිණ පැවිදි ව රහත් වූහ. යට කී සිටුවරු තිදෙනා ද සැවැත් නුවරට ගොස් භාග්‍යවතුන් වහන්සේ ගෙන් බණ අසා සෝවාන් වූහ. ඔහු බුඬ ප්‍රමුඛ සංඝයාට අඩ මසක් මහදන් දී තමන් ගේ නුවරට වඩිනා ලෙස ආයාචනා කොට ගියෝ, කොසඹෑ නුවරට පැමිණ තම තමන් ගේ උයන්හි විහාර කැරවූහ. ඉන් ඝෝෂිත සිටුහු කැරවූ ආරාමය **ඝෝෂිතාරාම** යැ යිද, කුක්කුට සිටුහු කැරවූ ආරාමය **කුක්කුටාරාම** යැයි ද, පාවාරික සිටුහු කැරවූ ආරාමය **පාවාරිකම්බවන** යැ යි ද ප්‍රසිඬ වී ය. මෙසේ විහාර කරවා භාග්‍යවතුන් වහන්සේට වඩිනා ලෙසට පණිවුඩ යැවූහ.

බුදුරජාණන් වහන්සේ කොසඹෑ නුවරට වඩිනා පිණිස මහද්භික්ෂු සංඝයා සහිත ව පිටත් වූ සේක.

**මාගන්දිය බමුණා පැවිදි වීම**

පිළිවෙළින් සැරි සරන භාග්‍යවතුන් වහන්සේ මාගන්දිය නම් බමුණකු රහත් වීමට හේතු සම්පත් ඇති බව දැක අතර මගදී කුරු රට අතට යන පාරට බැස **කල්මාෂදම්‍ය** නම් නිගමයට වැඩ පසුද උදේ වරුයෙහි එහි පිඩු පිණිස හැසුරුණු සේක. එහිදී **මාගන්දිය*** බමුණා බුදුරජාණන් වහන්සේ දැක 'තම දූවට සුදුසු රූප ලක්ෂණයෙන් යුත් පුරුෂයෙක් ලැබිණැ'යි සතුටු ව දූව සරසවා කැඳවා ගෙන අවුත්, මැය 'බිරින් දෑ කොට ගත මැනැවැ'යි දැන්වූයේ ය. එ විට කාමසම්පත්තියෙහි තමන්වහන්සේ නෑලෙන බවත් මල මූත්‍ර පිරුණු මේ ශරීරයක් පයින් වත් ස්පර්ශ කරන්නට නො කැමැති බවත් වදළ සේක. එය අසා ඒ බමුණාගේ දූ වූ මාගන්දියා තොම ඇගේ සිරුර මල මූත්‍රයෙන් පිරුණු එකෙකැයි අවමන් කෙළේ යැ යි භාග්‍යවතුන් වහන්සේ කෙරේ වෛර බැන්ද ය. බුදුරජාණන් වහන්සේ එය නො සලකා ඇගේ මාපිය දෙදෙනාට බණ වදළ සේක. දේශනාවසානයේ දී ඒ දෙදෙන අනාගාමී වූහ. දූ වූ තරුණ මාගන්දියා බැමිණිය ඇගේ සුලු පියාට බාර කොට දී තුමූ පැවිදි වැ රහත් වූහ. තරුණ මාගන්දියා තොමෝ ද නොබෝ කලෙකින් ඇගේ රූපශ්‍රියෙහි ඇලුණු **උදේනි** රජහු විසින් ගෙන්වා අග මෙහෙසුන් කර ගන්නා ලද්දී ය.

යට කී පරිදි භාග්‍යවතුන් වහන්සේ මාගන්දිය බමුණු බැමිණි දෙදෙනාට අනුග්‍රහ කොට ආපසු වැඩ කොසඹෑ පුරයට යන දීර්ඝ මාර්ගයට බැස සැරිසරා වඩනා සේක්, නොබෝ කලෙකින් එහි පැමිණි සේක. කොසඹෑ පුර සිටුහු ද පෙර ගමන් කොට භාග්‍යවතුන් වහන්සේ වැඩම කරවා තමන් කැරවූ ආරාම තුන පිදූහ. ඉක්බිති පසු ද දනට වඩින ලෙස අයැද වැඳ පැදකුණුකොට තමන් ගෙවලට ගියහ. උදේන රජු ගේ භාර්‍යා වී සිටින මාගන්දියා තොමෝ, බුදුරජාණන් වහන්සේ එහි වැඩි බව අසා නුවර වැසි නො හික්මුණු මැරවැර කොලු ගැටයනට අල්ලස් දී භාග්‍යවතුන් වහන්සේ ට නින්ද අපහාස කරන්නට නියෝග කළා ය. එ සේම ඔහු පසු ද නුවර පිඩු පිණිස හැසිරෙන බුදුරජාණන් වහන්සේ දැක නොයෙක් අන්දමින් නින්ද සහගත බැණුම් දෙඩුම් කළහ. ඒ දුටු ආනන්ද ස්ථවිර තෙම 'මේ නගරය හැර යම්හ'යි භාග්‍යවතුන්

* මාර්කණ්ඩෙය

වහන්සේ ට සැළ කෙළේ ය. ආනන්දය, තථාගතවරු ලාභ අලාභ අයස යස ආදි අෂ්ට ලෝක ධර්මයෙන් චංචල නො වෙත් යැ යි ද, මේ නින්ද අපහාස කිරීම සතියකට වඩා නොපවත්නේ යැ යි ද වදරා බුදුරජාණන් වහන්සේ එහි ම වුසූ සේක. එ සිටුවරු තිදෙන මාරුවෙන් මාරුවට දන් දෙමින් මාසයක් ගත කොට සෙසු නගර වාසීනට ද දන් දීමට අවකාශ දුන්හ. නුවර ඒ ඒ වීථිවල වැසියෝ එක් ව මහ දන් පැවැත් වූහ.

**සාමාවතී ගේ මරණය**

එ සමයෙහි දිනක් බුදුරජාණන් වහන්සේ නුවර ප්‍රධාන මාලාකාරයා ගේ ගෙයි දනට වැඩි සේක. උදේන රජු ගේ **සාමාවතී** නම් අග මෙහෙසියක ගේ උපස්ථායිකා වූ **ඛුජ්ජුත්තරා** නම් ස්ත්‍රියක් මල් මිල දී ගැන්මට වෙන දා සේ ම එදාත් පැමිණ තැනැත්තී එහි දී බණ අසා සෝවාන් වූවාය. ඉක්බිති මාලිගාවට ගිය ඇගෙන් බණ අසා සාමාවතී ද ඇය පිරිවර ස්ත්‍රීහු ද සෝවාන් වැ, එතැන් සිට ඇය දසි භාවයෙන් මුදා මවු තනතුරෙහි ද ඇදුරු තනතුරෙහි ද තබා සත්කාර කළහ. ඛුජ්ජුත්තරා උපාසිකා තොමෝ ද සියලු දිනයෙහි ම භාග්‍යවතුන් වහන්සේගෙන් බණ අසා අවුත් සාමාවතී ආදීනට කියන්නී කල් යෑමේදී ත්‍රිපිටකධර වූවාය. සාමාවතිය භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදී සිටි බව දත් මාගන්දියා බිසව නොයෙක් අයුරින් ඇය කෙරේ රජු බිඳුවා ලීමට උත්සාහ කළා ය. කිසි විටෙක රජ ඒ විශ්වාස කළ නමුත් පසු ව සාමාවතියගේ නිදොස් බව තේරුම් ගත්තේ ය. ඉක්බිති සාමාවතී තොම රජු ගෙන් අවසර ගෙන ඇගේ මාලිගාවට ආනන්ද ස්ථවිරයන් වහන්සේ කැඳවා සත්කාර කොට බණ ඇසූවා ය. මේ කිසිවක් ඉවැසිය නො හී වඩ වඩා කෝපයෙන් දිලිහුණු මාගන්දියා තොම ඇගේ කුඩා පියා ලවා සාමාවතිය ගේ මාලිගාවට රහසින් ගිනි ලැව්වා ය. සාමාවතී සහිත පන්සියක් පමණ වූ ඇගේ පිරිවර ස්ත්‍රීහු එයින් දා මළහ. රජ තෙම පසු ව එය මාගන්දියාව විසින් කරවන ලද බව දැන ගෙන, දරුණු වද දී ඇය ද ඇගේ නෑදෑයින් ද මරවා දැමී ය.

**නව වන වස**

භාග්‍යවතුන් වහන්සේ බුඩත්වයෙන් නව වන වර්ෂයෙහි වැසි සාරමසෙහි ද ඉන් පසු ද කොසඹෑ පුර ඝෝෂිතාරාමයේ වුසූ සේක.

**හදුවතිකා ඇතින්න**

මෙ සමයෙහි උදේන රජු ගේ **භද්‍රවතිකා** නම් ඇතින්න රජු විසින් නො තකා අසරණ කොට අත් හැර දමන ලද්දී, තැන තැන යෙමින් දුක සේ කල් යැවූවාය.

ඕ ශක්තිමත් සමයෙහි ඒ රජු ගේ මඟුල් ඇතින්න වැ සිට මහත් සත්කාර ලැබුවා ය. යුද්ධවලදී ද රජුට ජය ලබන්නට සහාය වූවා ය. එහෙත් ඇය මහළු වැ දුර්වල වැ කිසිත් කරන්නට නො හැකි වූ විට, රජ අන් ඇතකු මඟුලැත් තනතුරට පත් කොට ඇය නො සලකා හැරියේ ය. ඒ තැන් සිට ඕ සුදුසු පමණ අහරක් හෝ ඉන්නට නිසි තැනක් හෝ නො ලැබ තැන තැන ඇවිදිමින් දුක සේ කල් ගෙවූවා ය. දවසෙක භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවර පිඩු පිණිස වඩින්නා දැක, ඕ උන් වහන්සේ වෙත අවුත් පා මුල වැටී තමා විඳුනා දුක අඟවන්නී, ශබ්ද නගා හැඬුවා ය. ඇය ඇඟැවූ අදහස භාග්‍යවතුන් වහන්සේ දත් සේක. දැන, 'සිතට දුක් නොගන්න. මම් ගොස් පළමුවෙන් ඔබට ලැබී තුබුණු ලෙසට ම සත්කාර සලස්වන්නෙමි'යි වදාළ සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ **උදේන** රජුගේ මාලිගාවට වැඩි සේක. රජ ද බුදු පාමොක් සඟනට දන් පැවැත්වීය. භාග්‍යවතුන් වහන්සේ දන් වළඳා අවසනැ 'මහරජ, ඔබේ භද්‍රවතිකා ඇතින්න කොයි දැ'යි විචාළ සේක. 'නො දනිමි වහන්සැ' යි රජ කීය.

ඒ විට භාග්‍යවතුන් වහන්සේ රජුට අවවාද කරන සේක්, 'මහරජ, තමනට උදවු කළ අයට ශක්තිමත් කාලයේ දී සත්කාර සම්මාන කොට, උන් මහළු වූ කලැ එය පැහැර ගැන්ම නො වටී. ඔබ හැම කළගුණ දන්නවුන්, කළ උපකාරයට ප්‍රත්‍යුපකාර කරන්නවුන් විය යුතු. භද්‍රවතිකා දැන් මහළු ය. ජරා ජීර්ණ ය. අසළ වෙනෙහි වැටකේ ආදී නීරස නිරෝජස්ක දෑ කමින් අනාථ වැ කල් ගෙවයි. මහළු වූ ඇය අනාථ වන්නට ඉඩ හැරීම ඔබට නො වටී. පෙර සේ ම ඇයට සත්කාර කරන්නැ'යි වදාළ සේක.

එයසා රජ තම වරද පිළිගෙන වහා ම කෙනකු යවා ඇතින්න ගෙන්වී ය. ඇයට පළමු සේ ම සත්කාර සැලැස්වී ය. භාග්‍යවතුන් වහන්සේ මෙ සේ ඇයට සෙත සලස්වා ඝෝෂිතාරාමයට වැඩි සේක.

**සංඝයාගේ භේදය**

ඒ සමයෙහි ඒ ඝෝෂිතාරාමයෙහි වැසි විනයධර ස්ථවිර නමක ගේත් ධර්ම කථික ස්ථවිර නමකගේත් විවාදයෙක් වී ය. ස්වල්පයෙන් පටන් ගත් විවාදය ඒ දෙදෙනා ගේ පක්ෂයට බොහෝ පෘථග්ජන ගිහි පැවිද්දන්ගේ බැඳීමෙන් ක්‍රමයෙන් දියුණු වී ය. භාග්‍යවතුන් වහන්සේ ඔවුනට කළහ විවාද අසමඟ බව්හි ආදීනව වදාරන සේක්, **ලටුකික ජාතක, වට්ටක ජාතක, දීඝිති කෝසල ජාතක** යන මෙයින් අවවාදානුශාසන කළ සේක. එහෙත් ඔහු ශමථයකට නො පැමිණියහ. බුදුරජාණන් වහන්සේ මතු ඔවුන් සමගියට පැමිණැවිය හැකි අයුරු ද ඊළඟ වස් කාලයෙහි පාරිලේය

හස්ති ආදී කීප දෙනෙකුනට තමන් වහන්සේ නිසා ලැබෙන අර්ථ සිඩිය ද දැක, විවේකය ද කැමැති වැ, **පාරිලේය** වනය දෙසට යන්නට අදහස් කළ සේක. එ සේ අදහස් කොට කොසඹෑ පුරයෙහි පිඩු පිණිස හැසිර කිසිවකුටත් නො දන්වා හුදෙකලා ව ම වැඩි සේක.

**බාලකලෝණකාර ගමට වැඩීම**

භාග්‍යවතුන් වහන්සේ නික්ම වැඩි පසු භික්ෂූහු අනඳ තෙරුන් වෙතැ එළැඹ 'ඇවැත්නි, බුදුරජාණන් වහන්සේ හුදෙකලා ව වැඩි සේක. අපිත් උන් වහන්සේ අනුව යම්හ'යි කීහ. 'ආයුෂ්මත්නි, භාග්‍යවතුන් වහන්සේ මෙසේ කාටත් නො දන්වා හුදෙකලාව වඩිනුයේ විවේකී ව තනි ව වසන අදහසිනි. ශ්‍රාවකයන් විසින් ශාස්තෲන් වහන්සේගේ අදහස අනුව හැසිරිය යුතු. එ බැවින් මෙ දින වල භාග්‍යවතුන් වහන්සේ පසු පසින් නො යා යුතු යැ'යි කියා අනඳ තෙරණුවෝ ඒ භික්ෂූන් වැළැක්වූහ. තුමූද නො ගියහ.

බුදුරජාණන් වහන්සේ ද ගම් නියම් ගම් පිළිවෙළින් සැරි සරන සේක්, **බාලකලෝණකාර** ග්‍රාමයට පැමිණ, එහි තනි ව වසන භෘගු ස්ථවිරයන් වහන්සේට මුළු පස්වරු කාලයේ ද, තුන් යම් රැය මුළුල්ලේ ද, හුදෙකලා වැ විසීමේ අනුසස් වදාරා, පසු දා තෙරුන් හා ගමේ පිඩු පිණිස හැසිර දන් වළඳා තෙරුන් එහි ම නතර කොට, තමන් වහන්සේ පළමු සේ ම හුදෙකලා ව එයින් පිටත් වූ සේක. එසේ වඩනා බුදුරජාණන් වහන්සේ චෙති රට ප්‍රාචීනවංශ මෘගදායයට පැමිණ, එහි දී **අනුරුද්ධ භද්දිය කිම්බිල** යන තෙරුන් තුන් නමට රෑ තුන් යම්හි ම සමගියේ අනුසස් වදාරා, ඉන් හුදෙකලා ව ම නික්ම කෝසල ජනපදයෙහි වූ පාරිලේය නම් නුවරට සම්ප්‍රාප්ත වූ සේක. එහි වැස්සෝ පෙර ගමන් කොට භාග්‍යවතුන් වහන්සේ වැඩම කරවා ගෙන අවුත් අසුන් පණවා වඩා හිඳුවා දන් දුන්හ. ඉක්බිති ඒ **පාරිලේය** නුවර සමීපයේ වන ලැහැබෙක පන්සලක් කොට, එහි වස්වසන්නට ආයාචනා කොට, භාග්‍යවතුන් වහන්සේ එහි වැඩම කැරවූහ.

ඒ පන්සල ළඟ රම්‍ය සල් රුකෙක් විය. දිනෙක ඒ වෘක්ෂය යට වැඩ ඉන්න බුදුරජාණන් වහන්සේ එක් ඇතකු විසින් දක්නා ලද සේක. ඒ ඇතාත් විවේකී වැ වසනු කැමැත්තෙන් රැළින් වෙන් වූයෙකි.

**ඇතකුගේ උපස්ථානය**

හස්ති තෙම බුදුරජාණන් වහන්සේ දුටු හැටියේ ම සොඬ අකුලා දන බිම ඇන නමස්කාර කෙළේ ය. ඉන් පසු වට පිට බලා කිසිවකු නො දැක එ රුක යටැ භූමිභාගය පයින් පැහැර අතු කැබැල්ලක් සොඬින් ගෙන හැමැද්දේ ය.

එතැන් පටන් හස්ති තෙම භාග්‍යවතුන් වහන්සේට බීමට ද මුහුණ දෙවීම් ආදී පරිභෝගයට ද වතුර පිළියෙල කැරැදෙයි. උණු දියෙන් ප්‍රයෝජන ඇතැයි හැඟුණු විට උණු දිය ද පිළියෙල කෙරෙයි. ඒ මෙසේ ය: ගිනි ඉපැද විය හැකි දඬු සොඬින් ගෙන එකට මැද ගිනි උපදවයි. ඉක්බිති දර කැබලි ගොඩ ගසා ගිනි දල්වා ඒ ඒ ලොකු ගල් ගෙනවුත් ඒ ගිනි ගොඩෙහි දමා රත් කරයි. ගල් රත් වූ පසු දඬු කැබැල්ලක් ගෙන ඒවා පෙරළාගෙන ගොස් දිය පිරුණු කුඩා ගල් වලෙක හෙලා ලයි. ඉන්පසු සොඬය බහා රත් වූ බව දැන භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් සොඬ අකුළා දන බිම ඇන හිඳියි. එවිට බුදුරජාණන් වහන්සේ එහි වැඩ ජලස්නානය කරන සේක. ඉක්බිති හස්තියා නොයෙක් ඵල වර්ග ගෙනවුත් පිළිගන්වයි. භාග්‍යවතුන් වහන්සේ ගමට පිඬු පිණිස වඩනා විට හස්ති තෙම පාත්‍රය හා දෙපට සිවුර කුම්භස්ථලයෙහි තබා ගෙන උන්වහන්සේ හා යයි. වනයෙන් ගමට බස්නා සීමායේ දී ඇතු නවත්වා බුදුරජාණන් වහන්සේ හුදෙකලා ව ම පා සිවුරු ගෙන ගමේ පිඬු පිණිස හැසිර ආපසු වඩනා සේක. ඇත් තෙම මග බලා සිට භාග්‍යවතුන් වහන්සේ එහි වැඩි කෙණෙහි පාත්‍රය හා දෙපට සිවුර ගෙන ඔබ කැටුව සල් රුක වෙතට යයි. ගොස් පාත්‍ර සිවුරු පන්සලෙහි තබා අත්තෙකින් පවසන් සලයි. නැවැත රාත්‍රී කාලයෙහි චණ්ඩ මෘගයන් ගෙන් උපද්‍රව වළක්වන අදහසින් මහත් දංඩක් සොඬින් ගෙන ඒ ලැහැබෙහි අතර තුරැ හැසිරෙයි. බුදුරජාණන් වහන්සේ රක්ෂිත කැරැ (රැක) ගන්නා අදහසින් ඒ ඇතු හැසිරුණු වන ලැහැබට එ තන් සිට රක්ෂිත වන ලැහැබ යැ යි නම් විය. එළි වූ කල්හි මුහුණ සේදීමට පැන් දීම් ආදී වශයෙන් මෙසේ ඒ හස්ති තෙම බුදුරජාණන් වහන්සේට සියලු වත් පිළිවෙත් කරයි.

**වඳුරකුගේ පූජාව**

ඇතු කරන උපස්ථාන දුටු එක් වඳුරෙක් 'මමත් සත්කාරයක් කෙරෙමි'යි සිතා දීමට සැහෙන යමක් සොයා ඇවිදින්නේ, මැස්සන් විසින් හරනා ලද දඬුවැල් බෑ මීයක් දුටුයේ ය. දැක එය ගෙනැවිත් කෙසෙල් කොළයක් කඩා එහි තබා භාග්‍යවතුන් වහන්සේට පිළිගැන් වූයේ ය. භාග්‍යවතුන් වහන්සේ එය පිළිගත් සේක. ඉක්බිති වඳුරු තෙම උන් වහන්සේ 'එය වළඳන සේක් දෝ, නැද්දෝ'යි බලා හිඳ, එය නො වළඳන බව දැක, එයට කරුණු කිම් දැ යි ඒ මීය බැඳි දඬු කැබැල්ල අල්ලා ඒ මේ අත පෙරළා බලන්නේ මළා වූ පිළවුන් දැක, අවුලා දමා යළිත් ඒ මධුපටලය

පිළිගැන්වූයේ ය. බුදුරජාණන් වහන්සේ එය පිළිගෙන වැළඳූ සේක. වඳුරු තෙම ඒ දැක සතුටු සිතැති ව අත්තෙන් අත්ත අල්ලමින් නටා ඇවිදුනේ, අල්ලා ගත් අත්තත් පා තැබූ අත්තත් අදිසියෙන් බිඳීමෙන්, කණුවක් උඩ වැටී කය සිදුරු ව මළේ ය. බුදුරජාණන් වහන්සේ කෙරේ පහන් සිතින් ඉන්දැදී ම මළා වූ හෙතෙම තව්තිසා භවනයෙහි දෙව් පුතෙක් වැ උපන්නේ ය.

**කොසැඹෑ වැසි භික්ෂුනට කළ දඬුවම්**

යටකී පරිදි බුදුරජාණන් වහන්සේ කොසඹෑ පුරයෙන් නික්මුණු පසු එහි වැසි උපාසකවරු 'භික්ෂූන් ගේ අසමගි බැවින් විවාද හේතුවෙන් බුදුරජාණන් වහන්සේ ඉන් පිටත් වූ සේකැ'යි සිතා කලහකාරී භික්ෂුනට සත්කාර නැවැත්වූහ. ඒ භික්ෂූහු ද ආහාර නැති බැවින් පීඩිත ව ටික දිනෙකින් ම සමග වූහ. ඉක්බිති උපාසකවරුනට ඒ බව දැන්වූ හ. 'භාග්‍යවතුන් වහන්සේ කමා කරවා ගත් පසු පෙර මෙන් ම අපි ඔබට සලකන්නමු'යි ඔහු කීහු. භික්ෂූහු ද වස් කාලය බැවින් පිටත යැනො හැකි වැ ඒ තුන් මස ආනන්දදි අන් තෙරුනට ලැබෙන ආහාර පානාදියෙන් යැපෙමින් දුක සේ ගත කළ හ.

භාග්‍යවතුන් වහන්සේ ඇතකු ගේ උපස්ථාන ඇති ව පාරිලේය්‍යක වනයෙහි වසන බව දඹදිව පතළ වී ය. සැවැත් නුවරින් අනේපිඬු සිටු, විශාඛා උපාසිකා ආදී ප්‍රභූහු භාග්‍යවතුන් වහන්සේ වැඩම කරවා ගෙනෙන ලෙස අනඳ තෙරණුවනට පණිවුඩ එවූහ. දිශාවාසි පන්සියයක් පමණ භික්ෂූහු ද වස් පවරා කොසඹෑ නුවර වුසූ අනඳ තෙරුන් වෙත එළැඹ 'ස්වාමීනි, අපට භාග්‍යවතුන් වහන්සේ ගෙන් දහම් අසන්නට සැලැස්සුව මැනැවැ'යි අයැදූ හ.

**භික්ෂූන් බුදුරජාණන් වහන්සේ දැකීමට යෑම**

ආනන්ද ස්ථවිර තෙම ඒ භික්ෂූන් හා කොසඹෑ නුවරින් නික්ම වැඩියේ ය. එ සේ ගමන් කොට පාරිලේය්‍ය වනයට පැමිණ භික්ෂූන් පිටත නවත්වා තෙමේ හුදෙකලා ව භාග්‍යවතුන් වහන්සේ වෙත ගියේ ය. හස්ති තෙම එ සේ එන තෙරහු දැක දංඩක් ගෙන ලුහු බඳින්නට සැරැසුණේ ය. එය දුටු භාග්‍යවතුන් වහන්සේ 'මෙ තෙම මගේ උපස්ථායකයෙකි. මහ හරුව'යි වදාළෙන් හස්ති තෙම දඬු කඩ හැර දමා පාත්‍ර සිවුරු පිළිගන්නට තෙරහු වෙත ගියේ ය. ස්ථවිර තෙමේ ද භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ පාත්‍ර සිවුරු බිම තබා වැඳ පසෙක හුන්නේ ය. 'ආනන්දය, ආයේ හුදෙකලාවදැ?'යි බුදුරජාණන් වහන්සේ වදාළ කලැ. තවත් පන්සියයක් පමණ භික්ෂු පිරිස ආ බව කීයෙන් 'ඔවුන්

කැඳවව'යි වදාළ සේක. තෙරණුවෝ ද ඒ භික්ෂූන් කැඳවාගෙන ආහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔවුන් හා සුව දුක් තොරතුරු කතාබස් කළ සේක. ඒ භික්ෂූන් ද උපස්ථායකයකු නැති වැ වනයෙහි තනි වැ විසීමෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් දුෂ්කර දැයක් කරන ලදැ යි කීකල, පාරිලේය වන වාසී ඇතු විසින් සියලු උපස්ථාන කළ බවද, ඒ වැනි යහළුවකු[163] ඇත්තහු විසින් ඔහු හා විසීම යුතු යැ යි ද, නැතහොත් තනි ව හැසිරීම උතුමැ'යි ද වදාරා සත් පුරුෂයන් හා එක් ව විසීමේත් බාලයන් ගෙත් වෙන් වීමේත් අගය වදාළසේක. දේශනාවසානයේ දී ඒ දිශාවාසී භික්ෂූහු රහත් වූහ.

**ඇතුගේ මහා දානය, බුදු රජ වනයෙන් පිටත් වීම**

ඉක්බිති අනේ පිඬු සිටු ආදීන් එවූ හසුන් දැන්වූ කල භාග්‍යවතුන් වහන්සේ පාත්‍ර සිවුරු ගන්වා ගෙන පිටත් වූ සේක. ඒ විට හස්ති තෙම ගොස් පාර සරස සිටියේ ය. 'වහන්ස, හස්ති තෙම කුමක් කෙරේ දැ'යි භික්ෂූහු විචාළහ. 'මහණෙනි, මේ තෙම තොපට භික්ෂාව දෙනු කැමැත්තේ ය. මේ ඇතා මට බොහෝ කලක් උපකාර කළ කෙනෙකි. ඒ බැවින් මොහු ගේ සිත රිදුවීම හොඳ නැත. මහණෙනි, ආපසු යම්හ'යි වදාළ සේක. ඒ සේ වදාරා ඒ භික්ෂූන් ගෙන ආපසු වැඩි සේක. හස්ති තෙමේ ද කැලෑයෙහි ඇවිද කොස් කෙසෙල් ආදී නානා ඵල ගෙන වුත් රැස් කොට තබා පසු දා බුඩ ප්‍රමුඛ භික්ෂූනට පිළිගැන්වූයේ ය. වළඳා ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් හා පිටත් වූ සේක. ඒ විට හස්ති තෙම භික්ෂූන් මැදින් ඉඩ ගනිමින් ගොස් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි හරස් ව සිටියේ ය. 'වහන්ස, ඇත් තෙම කුමක් කෙරේ දැ'යි භික්ෂූහු විචාළහ. 'මහණෙනි, තොප යවා මෙ තෙම මා නවතනු කැමැත්තේ යැ'යි වදාළ සේක. ඒ සේ වදාරා, ඇතුට කතා කොට 'පාරිලේයකය, මාගේ මේ ගමන නැවැත් විය නො හැකි ය. තුඹට මේ තිරිසන් ආත්මයේ සිට මේ පින් මීස මෙයට වැඩියෙන් ධ්‍යානයක් හෝ මාර්ග ඵලයක් ලැබිය නො හැකි ය, එබැවින් තුඹ මෙහි සිටින්නැ'යි වදාළ සේක. එය තේරුම් ගත් හස්ති තෙම සොඬය මුඛයෙහි බහා හඬමින් භාග්‍යවතුන් වහන්සේ පසු පස්සෙන් ගියේ ය. ශාස්තෘන් වහන්සේ ගම සමීපයට පැමිණ 'පාරිලේයකය, මෙ තැනින් එහා යෑම තුඹට අයෝග්‍ය යි. මිනිස් පියෙසට ගියොත් තුඹට හිරිහැර ඇතිවෙයි. ඒ බැවින් තුඹ මෙයින් එහා නො ගොස් නවතින්නැ'යි වදාළ සේක.

හස්ති තෙම බලවත් ශෝකයෙන් හඬමින්, බුදුරජාණන් වහන්සේ වඩිනු බලා ගත් වණම සිටියේ ය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට නො පෙනී ගිය කෙණෙහි හේ ඉසිලිය නො හැකි ශෝකයෙන් ළය පැළී මළේ, තව්තිසා භවනයෙහි දෙව් පුතෙක් ව උපන්නේ ය.

**සැවැත් පුරයට වැඩීම**

ශාස්තෘන් වහන්සේ ද පිළිවෙළින් සැරි සරා සැවැත් නුවර ජේතවනාරාමයට වැඩි සේක. කොසඹෑ පුර භික්ෂූහු එ බව අසා සැවැත් නුවර යෑමට පිටත් වූහ. ඒ භික්ෂූන් එන බව ඇසූ කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ 'මගේ රටට එන්නට ඒ භික්ෂූනට ඉඩ නො දෙමි'යි කීය. එවිටැ 'මහ රජ, **ඔවුනොවුන් විවාද කැර ගත්තත් ඒ භික්ෂූහු සිල්වත්තු ය.** දැන් ක්ෂමාව ලබා ගන්නට මා වෙත එති. එන්නට ඉඩ දෙව'යි වදාළ සේක. අනේපිඩු සිටු ද දෙව්රමට එන්නට ඉඩ නො දෙන්නට සැරසුණු නමුත් භාග්‍යවතුන් වහන්සේ පළමු සේ ම වදාරා විහාරයෙහි ඉඩ ලබා දෙවා ඒ භික්ෂූනට ඉඳුම් හිටුම් ආහාර පානාදිය තිසි සේ ලබා දෙවූ සේක. එහෙත් අන් කිසිදු භික්ෂුවක් ඒ කොසඹෑ පුර භික්ෂූන් හා එක් වැ නො උන්නේ ය. එහි පැමිණි පැමිණි තැනැත්තන් 'විවාදකාරී භික්ෂූහු මොහු දැ?'යි ඇඟිලි දික් කොට පෙන්වා ඇසීමෙන් ඒ භික්ෂූහු වඩ වඩා ලජ්ජාවට පත් වූහ. හිස් ඔසවා ගන්නට ද බැරි පමණට ලජ්ජාවට පත් වූ ඔහු භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ පා මුල වැදැ හෙවැ ක්ෂමාව ඉල්ලූහ. භාග්‍යවතුන් වහන්සේ ඔවුනට සමාව දී අවවාද කොට **දීඝිති කෝසල ජාතකය** වදාළ සේක.

# ස තිස් වන පරිච්ඡේදය

**එකොළොස් වන වස ඒකනාලා බමුණු ගමෙහි,**
**දොළොස් වන වස වේරංජා පුරයෙහි,**
**තෙළෙස් වන වස චාලිකා පර්වතයෙහි,**

**එකොළොස් වන වස**

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවරින් නික්ම දනවු සැරි සරන සේක්, මගධ රටැ දක්ෂිණාගිරි ජනපදයට වැඩි සේක. එකොළොස්වන වැසි සෘතුයෙහි **ඒකනාලා** නම් බමුණු ගමෙහි වුසූ සේක.

භාග්‍යවතුන් වහන්සේ කසීභාරද්වාජ [164] නම් බමුණකු හික්මවූයේ මෙහි දී ය. ශාසනය කෙරෙහි දෘඪ භක්ති ඇති **වේළුකණ්ටකී නන්දමාතු** උපාසිකාව මෙහි උපාසිකා පිරිසේ මාර්ගදෙශිකා වැ සිටියා ය.

**සිවුරු කැපීමට නියමය**

ප්‍රසිඩ වූ මගධ ක්ෂේත්‍රය මේ ගම නො දුරෙහි ය. ඒ සමීපයට වැඩි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූනට කුඹුර පෙන්වා එහි මියරවලින් ලියැදි වෙන් කොට ඇත්තා සේ සිටින්නට සිවුරු කඩ කපා මසා ගත යුතු බව වදාළ සේක.

**වේරංජා පුර වැඩීම**

වස්සාන කාලයේ අවසන්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් පුර වැඩ එහි වුසූ සේක. නැවැත සැරි සරා වඩනා සේක්, **ශූරසේන** ජනපදයෙහි **මධුරා පුරයට** වැඩි සේක. එහිදී පැමිණි පැමිණි කාරණයෙහි ධර්මානුශාසන කොට ඉන් නික්ම **වේරංජා පුරය** බලා පිටත් වූ සේක. අතර මගදී ගැහැවි පිරිසක් හමු වැ ගෘහ්‍ය ජීවිතය සම්බන්ධ ධර්ම කථාවෙකින් ඔවුනට අවවාද කළ සේක. ඉක්බිති ඉන් නික්ම වඩනා සේක් **වේරංජා** පුරයට සම්ප්‍රාප්ත වූ සේක.

වේරංජා පුරයෙහි **නලේරු** නම් යකකු විසින් අරක්ගන්නා ලදැ යි සලකා ඔහුට පුද පවත්වන දෙවොලක් වූ විශාල කොසඹ රුකෙක් විය, එය **නලේරු පුචිමන්ද** නමින් ප්‍රකට විය. වේරංජා පුර වැඩි භාග්‍යවතුන් වහන්සේ ඒ කොසඹ රුක් මුලැ ආවාසයෙහි වුසූ සේක.

**දොළොස් වන වස වේරංජායෙහි**

භාග්‍යවතුන් වහන්සේ එහි පැමිණීමත් උන් වහන්සේ ගේ ගුණ කීර්තියත් ඇසූ වේරංජා වාසී **උදය** නම් ධනවත් බමුණෙක් එහි ගියේ ය. ගොස් කථා කොට පැහැදී ඒ වර්ෂාණ කාලයෙහි එහි වස් වසන්නට ආයාචන කෙළේ ය. භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සහිත ව ඒ දෙළොස් වන වර්ෂයෙහි වේරංජා පුර. නලේරු කොසඹ රුක අසැ පන්සලෙහි වුසූ සේක.

භාග්‍යවතුන් වහන්සේ ට එහි වස් වසන්නට ආයාචනා කළ බව වේරංජා බමුණාට සිහි නො වීය. පුරවාසීනට ද එ ගැන නො සිහි විය. (එයට හේතුව මාරාවේශයෙකැ යි කියන ලදී) එ කාලයෙහි තද දුර්භික්ෂයෙක් ඒ පළාතේ ඇති විය. භාග්‍යවතුන් වහන්සේටත් භික්ෂූනටත් එහි නිවැසි කිසිවකු ගෙන් කිසි සංග්‍රහයෙක් නො ලැබුණේ ය. එහෙත් **උත්තරාපථයෙහි** සිට අස් වෙළෙඳාමෙහි යන වෙළෙඳුන් සමූහයෙක් ඒ වැසි සමයෙහි එහි නවාතැන් ගත්තේ ය. ඔහු භික්ෂූනට දින පතා එක නමකට යව නැළිය බැගින් දී සත්කාර කළහ. භික්ෂූහු

සත් අට දෙනා ද දස දෙළොස් දෙනා ද එකතුව ඒවා කොටා දියෙන් තෙමා වළඳමින් මහණ දම් පිරූහ. එ වෙලෙඳහු භාග්‍යවතුන් වහන්සේට දින පතා යව නැළියකුත් එයට සුදුසු පමණ ගිතෙල් මී හා සකුරුත් දුන්හ. අනඳ තෙරණුවෝ එය අඹරා පිටි කැර ගිතෙල් ආදිය හා නිසි ලෙස සංයෝග කොට භාග්‍යවතුන් වහන්සේට පිළිගැන්වූහ.

මෙසේ එ වස් කාලය ගත කොට, වස් පවරා ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් හා වේරංජ (උදය) බමුණාගේ ගෙදරට වැඩි සේක. බමුණාගේ මෙහෙකරුවෝ එ පවත් ඔහුට දැන් වූහ. බමුණු තෙමේ සිහි ලැබ කනගාටුවට පත් වැ වහා නැඟිට අගනා අස්නක් පණවා, පෙරගමන්කොට භාග්‍යවතුන් වහන්සේ කැඳවා, වඩා හිඳුවා, වැඳ පසෙක හිඳ, ගිහි ගෙයි කටයුතු බහුල බැවින් උන් වහන්සේට සත්කාර කළ හැකි නො වූ බව කියා, භාග්‍යවතුන් වහන්සේ ප්‍රමුඛ භික්ෂු සමූහයාට මහ දන් දී සත්කාර කළේ ය. භාග්‍යවතුන් වහන්සේ බමුණා සහිත පිරිසට දම් දෙසා උනස්නෙන් නැඟී සිට නික්මුණු සේක. බමුණු තෙමේ අඹුදරුවන් කැටු ව අවුත් භාග්‍යවතුන් වහන්සේටත් භික්ෂු සංඝයාටත් නමස්කාර කොට 'වහන්ස, මතුත් අප ට අනුග්‍රහ කළ මැනවැ'යි ආදීන් කියා මඳක් දුර පසුගමන් ගොස් කඳුළු පිරුණු මුහුණින් යුතු වැ නැවැතුණේ ය.

**වේරංජායෙන් පිටත්වීම බරණැසට වැඩීම**

භාග්‍යවතුන් වහන්සේ වේරංජා පුරයෙන් නික්ම මහා මණ්ඩලය මැදින් ගමන් ගත් සේක. පළාතේ දුර්භික්ෂ දෝෂ හේතුයෙන් භික්ෂූන් ක්ලාන්ත වැ සිටි හෙයින් අතරැ මඟැ වෙන වෙන දිසාවලට නො වැඩ සෘජු මාර්ගයෙන්ම වඩනා සේක්, **සෝරෙය්‍ය, කණ්ණකුජ්ජ** යන නගරයන් පසුකොට **ප්‍රයාගප්‍රතිෂ්ඨාන** තීර්ථයට පැමිණ එහි දී ගඞ්ගා නදියෙන් එ තෙරැ වී බාරාණසී පුරයට එළැඹි සේක. මේ වනාහි මෙයින් වර්ෂ දෙළොසකට පෙර පළමු වැසි සමයෙහි බරණැස සිට නික්ම වැඩියායින් පසු එහි පැමිණි වාරය යි.

**කච්චායන බමුණා පැවිදි වීම්**

භාග්‍යවතුන් වහන්සේ බරණැස ටික කලක් වැඩ වුසූ සේක. මෙ සමයෙහි **අවන්ති** රටට අධිපති **චණ්ඩප්‍රද්‍යෝත** මහ රජ ස්වකීය පුරෝහිත **කාත්‍යායන** බ්‍රාහ්මණයා අමතා භාග්‍යවතුන් වහන්සේ සිය රටට වැඩම කරවා ගෙන එන්නට නියෝග කෙළේ ය. හේ 'පැවිදි වන්නට අවසර දෙතොත් භාග්‍යවතුන් වහන්සේ ගෙන එන්නෙමි'යි කියා

පැවිදි වීමට රජුගෙන් අවසර ගෙන තවත් සත් දෙනෙකුත් සමග නික්ම බරණැස භාග්‍යවතුන් වහන්සේ වැඩ ඉන්නා බව අසා එහි පැමිණියේ ය. භාග්‍යවතුන් වහන්සේ ඔවුනට දම් දෙසූ සේක. දේශනාවසානයේ එ සත් දෙනා ද කාත්‍යායන බමුණා ද රහත් බව ලැබුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත ඒහිභික්ඛුප්‍රව්‍රජ්‍යායෙන් පැවිදි උපසපත් වූහ.

**කාත්‍යායන තෙරුන් අවන්ති රට සයුන් පිහිටුවීම**

ටික දිනෙකින් පසු කාත්‍යායන තෙරණුවෝ **උජ්ජේනි** පුරයට වැඩීමට කාලය සුදුසු බව කීහ. භාග්‍යවතුන් වහන්සේ තෙරුනට පළමුවෙන් යන්නට නියෝග කළ සේක. තෙරණුවෝ තමන් හා පැවිදි වූ සත් නම කැටුව උජ්ජේනි පුරයට වැඩ එහි රජහු ගේ **කාංචන වනෝද්‍යානයට** පැමිණිය හ. උයන් පල්ලා විසින් එ බව දන්වන ලද චණ්ඩප්‍රද්‍යෝත රජ එහි ගොස් කථාබස් කොට පැහැදී තෙරුන් එහි නවතා ගෙන සත්කාර කෙළේ ය. රජ මෙහෙසි තොම **කාංචන වනයෙහි** තෙරුන් පිණිස විහාරයෙක් කැරැවී ය. රජ තෙරුන් ගේ අවවාදයෙහි පිහිටා චණ්ඩ ගති හැර දමා අකතීව්‍යයෙන් වෙන් ව දැහැමි මඟ ගමන් ගත්තේ ය.

**ධර්මය ලියැවීමක් සෘෂිදත්ත**

අවන්ති රටැ **වර්ධග්‍රාම** නම් ගමෙහි එක් ගැල් නායකයකු ගේ **සෘෂිදත්ත** නම් පුතෙක් වී ය. තරුණ වයසට පත් හෙතෙම **මච්ඡිකාසණ්ඩ** නුවර චිත්‍ර ගෘහපතිහුගේ අදෘෂ්ට මිත්‍රයෙක් වි ය. චිත්‍ර ගෘහපති තෙම සරණ ගත උපාසකයෙකි. හෙතෙම සිය මිතුරාට බුද්ධ ධර්මය ගැන කරුණු දන්වා යවනු කැමති වූයේ, බුදුරජාණන් වහන්සේ ගේ රහත් බව, සම්‍යක්සම්බුද්ධ බව, විද්‍යාචරණ සම්පන්න බව ආදී ගුණ රාශිය විස්තර කොට ලියා දීර්ඝ ලියුමක් යැවූයේ ය. එ ලියුම ලැබ කියවා බැලූ **සෘෂිදත්ත** තෙම අප්‍රමාණ ප්‍රීතියටත් ශාසනය කෙරේ මහත් පැහැදීමටත් පැමිණියේ, ගිහිගේ හැර මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ වෙත පැමිණ පැවිදි වී ය. විදසුන් වැඩූ හෙතෙම නොබෝ කලෙකින් ෂඩභිඥාලාභි රහතෙක් වී ය.

මේ කාලයෙහි **කුටිකණ්ණසෝණ** සිටුපුත් ද පැහැදී කච්චායන තෙරුන් වෙත පැවිදි විය. **කණ්ඩරායන** බ්‍රාහ්මණ ආදී තවත් බොහෝ ප්‍රභූහු ද සස්නෙහි පැහැදුණාහ. බොහෝ කුලපුත්‍රයෝ ශාසන ගත වූහ. නො බෝ කලෙකින් උජ්ජේනි පුරය කසාවතින් බැබැලුණේ ය.

මෙ සමයෙහි **අවන්ති** රට **කුරරඝර** පුරයෙහි **ප්‍රපාත*** පර්වතයෙහි ද **මක්කරකටක** නම් නිගමයෙහි ද සස්නෙහි පැහැදුණු ජනයා විසින් ආරාමයෝ කරවන ලදහ.

---

* 'පවත්ත' පර්වතයැ යි ද කියත්.

**විසල් පුර වැඩීම සුදින්න කුලපුතුන් පැවිදි වීම**

භාග්‍යවතුන් වහන්සේ බරණැස ටික දිනක් වැස ඉන් නික්ම සැරි සරන සේක්, විසාලා මහනුවරට වැඩ එහි මහාවනයෙහි **කූටාගාරශාලා - විහාරයෙහි** වුසූ සේක.

**සුදින්න කුලපුත්‍ර මහණවීම**

එ සමයෙහි විසල් පුර අසල **කලන්දග්‍රාම** යැ යි ප්‍රසිද්ධ ගමෙක් විය. එහි ප්‍රධාන සිටු තෙම සතළිස් කෝටියක් ධන ඇත්තේ, රාජ සම්මත වූයේ, ගමේ නමින් ම කලන්ද සිටු යැ යි ප්‍රසිද්ධ විය. ඔහු පුත් **සුදින්න** නම් තරුණයෙකි. බුදුරජාණන් වහන්සේ එහි වැඩි කාලයෙහි කාර්තිකෝත්සවය පැවැත්තේ ය. කලන්ද පුත්‍ර සුදින්න තෙම උත්සව සඳහා එහි පැමිණියේ, උදේ බොජුනෙන් පසු සුවඳ මල් ගඳ විලෙවුන් ගෙන විහාරයට යන උපාසකයන් දැක ඔවුන් හා ගොස් පිරිස් කෙළවර හිඳ බණ ඇසුයේය. බණ අවසානයෙහි හෙතෙම පිරිස හා මඳක් තන් ගොස් යළි ආපසු අවුත් භාග්‍යවතුන් වහන්සේ වෙතින් පැවිද්ද ඉල්වීය. 'මා පියන් ගෙන් අවසර ලබා එව'යි බුදුරජාණන් වහන්සේ වදළෙන් හෙතෙම ගෙට ගොස් මා පියන් ගෙන් මහණ වන්නට අවසර ඉල්លුයේ ය. ඔහු අවසර නො දුන්හ. හෙතෙම දින කීපයක් නො කා නො බී බිමැ වැතිර හිඳ අමාරුවෙන් ඔවුන්ගෙන් අවසර ගෙන භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් පැවිදි උපසපන් වී ය. (මේ තෙම මින් අට වන වර්ෂයෙහි ප්‍රථම පාරාජිකා ශික්ෂා පදය පැණවීමට ආදිකර්මික වූයේ ය.)

**භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වතට වැඩීම**

බුදුරජාණන් වහන්සේ ටික දිනක් වෛශාලි පුරයෙහි වැස, ඉක් නික්ම කපිලවාස්තු පුරයට වැඩ එහි න්‍යග්‍රෝධාරාමයෙහි වුසූ සේක. උන් වහන්සේ වැඩි බව ඇසූ **මහානාම** ශාක්‍ය රජ ගොස් වැඳ, පසෙක හිඳ, 'ස්වාමීනි, භික්ෂු සඞ්ඝයා වහන්සේ වේරංජායෙහි දී භික්ෂාව නිසි සේ නො ලැබීමෙන් හිරිහැර වින්ද සේක් ලු. එ බැවින් සිවු මසක් මම උන්වහන්සේ පෝෂිත කරන්නෙමි' යි කියා අයැද ගොස්, පසුද සිට බුඩප්‍රමුඛ සංඝයාට මධුර වූ ඕජස් සම්පන්න ආහාර පානයෙන් සත්කාර කෙළේ ය.

**තෙළෙස් වන වස චාලිකා පර්වතයෙහි**

භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වතැ ටික කලක් වැස ඉන් නික්ම **චාලිකා** නගරයට වැඩ එය අසළ **චාලිකා පර්වතයෙහි** වූ විහාරයෙහි තෙළෙස් වන වස වුසූ සේක.

# සත් තිස් වන පරිච්ඡේදය

**තුදුස් වන වස සැවැත් පුර දෙව්රම්හි**
**පසොළොස් වන වස කිඹුල්වතැ නුග අරම්හි**
**සතළොස් වන වස ආළවියෙහි**
**සොළොස් වන වස රජගහ පුර වේළුවනයෙහි**

**තුදුස් වන වස**

වර්ෂාණ සමය ගත වූයෙන් භාග්‍යවතුන් වහන්සේ සැරි සරා සැවැත් නුවරට වැඩි සේක. තුදුස් වන වැසි සෘතුයෙහි එහි දෙව්රම් වෙහෙරෙහි වුසූ සේක.

**රාහුලයන් වහන්සේ ගේ උපසම්පදාව**

මෙ සමයෙහි රාහුල හෙරණ පිරුණ විසි වයස් ඇත්තේ උපසපන් බවට පමුණුවන ලද්දේ ය. මෙ වස් කාලය ඇතුළත දී ම භාග්‍යවතුන් වහන්සේ වදළ මහා **රාහුලෝවාද සූත්තය*** අසා රාහුල භික්ෂු නම රහත් විය.

වැසි සාර මස ගත වූ පසු සැරි සරා වඩනා භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩවදළ සේක.

**පසළොස් වන වස**

භාග්‍යවතුන් වහන්සේ පසොළොස් වන වර්ෂර්තුයෙහි වුසුයේ එහි න්‍යග්‍රෝධාරාමයෙහි ය. මෙ සමයෙහි **නන්දිය** ශාක්‍ය රජ සස්නෙහි පැහැදුණේ ය. සුප්‍රබුධ නම් කෝලිය රජ භාග්‍යවතුන් වහන්සේ ට සතුරු කම් කැර මහත් අකුසල් රැස් කොට පොළොවැ ගිලී විනාශයට පත් විය.

**ජේතවනයට වැඩීම**

භාග්‍යවතුන් වහන්සේ වසින් පසු කිඹුල්වතින් නික්ම සැරි සරන සේක්, සැවැත් නුවරට පැමිණ ජේතවනයෙහි වුසූ සේක.

**ශක ප්‍රශ්න සමාගම**

එ සමයෙහි දිනක් රෑ සක්දෙව් රජ මහත් දිව්‍ය සමූහයක් කැටුව අවුත්,

'වහන්ස, කවර දනයෙක් ශ්‍රේෂ්ඨ ද?

කවර රසයෙක් ශ්‍රේෂ්ඨ ද?

කවර රතියෙක් (ඇල්මෙක්) ශ්‍රේෂ්ඨ ද?

තෘෂ්ණාක්ෂයය (අර්හත් බව) කුමක් හෙයින් ශ්‍රේෂ්ඨ ද? යන ප්‍රශ්න සතර ඇසුයේ ය.

එය විසැඳීම් වශයෙන් භාග්‍යවතුන් වහන්සේ:

---

* මෙය මැදුම්සඟියෙහි මජ්ඣිමපණ්ණාසකයෙහි ඇතුළති.

**'ධර්ම දානය සියලු දීම් මැඩ ජය ගනී. ලෝකෝත්තර ධර්ම රසය සියලු රසයන් මැඩ ජය ගනී. ධර්මය කීම කියැවීම ඇසීම යන මෙහි ඇල්ම සියලු ඇලීම් මැඩ ජය ගනී. තෘෂ්ණාක්ෂයය (රහත් බව) සියලු බව දුක් මැඩ ජයගනී.**[165] යැ යි වදාළ සේක.

ධර්මදේශනාවසානයේ දී සුවාසූ දහසක් ප්‍රාණීනට ධර්මාභිසමය විය.

ශක්‍ර තෙම මේ ධර්ම කථාව අසා ප්‍රමුදිත ව 'ස්වාමීනි, මෙ සේ උතුම් වූ ධර්මදානය කිරීමේ දී ඒ කථිකයන් ලවා අපට පින් නො දෙවන්නේ මන්ද? 'වහන්ස, මෙ තැන් සිට භික්ෂු සඞ්ඝයා වහන්සේට වදරා අපට පින් දෙවනු මැනවැ'යි භාග්‍යවතුන් වහන්සේ ඇයැදී ය.

භාග්‍යවතුන් වහන්සේ එය පිළිගෙන භික්ෂු සඞ්ඝයා රැස්කොට 'ලොකු කුඩා මොන ම ධර්ම කථාවක් කළත් එයින් ලබන පින් ලෝවැස්සනට අනුමෝදන් කරවන්නැ'යි වදාළ සේක.

**ආළවක සමාගමය**

සැවැත් පුර වසන භාග්‍යවතුන් වහන්සේ කළුවර පක්ෂයේ පොහෝ දිනෙක අලුයම් කාලයෙහි මහා කරුණා සමාපත්තියෙන් නැගිට ලොව බලන සේක්, ආළවක කුමරු අනාගාමී වීමට හේතු සම්පත් ඇති බව ද, අළවු යකු සෝවාන් ඵලයෙහි පිහිටුවිය හැකි බව ද, ධර්ම දේශනාව අසා බොහෝ ප්‍රාණීනට ධර්මාභිසමය වන බව ද දැක, එද සවස හුදෙකලාව පයින් ම වැඩ **ආළවි පුරයට** ටික දුරෙක වනයේ වූ **ආළවක** යකු ගේ ප්‍රාසාදයට වැඩි සේක. වැඩ, ආළවක යකු ගේ පුටුයෙහි හිඳ එහි පැමිණි යක්ෂ ස්ත්‍රීනට අවවාද කළ සේක. ටික වේලාවෙකින් ආළවක යක් තෙම එහි පැමිණ නොයෙක් අයුරින් භාග්‍යවතුන් වහන්සේට හිරිහැර කරන්නට තැත් කෙළේ ය. ඒ කිසිවෙකින් ජයක් නො ලත් හෙතෙම භාග්‍යවතුන් වහන්සේ කුපිත කළ හැකියි සිතා නින්ද සහගත බසින් 'ශ්‍රමණය, මින් පිට වව'යි කීය. මෙතැන දී මෘදු බව දැක්වීමෙන් යකු ගේ තද කෝපය අඩු කළ හැකි බව සැලකූ බුදුරජාණන් වහන්සේ 'යහපත, ඇවැත්නි'යි කියා ගෙන් පිට වූ සේක. එවිට යක් තෙම 'මේ ශ්‍රමණයෝ සුවච කෙනෙක. එක් වචනයෙන් ම පිටත් වූහ. මෙසේ එක් වචනයකින් ම මෙයින් නික්මවන්නට හැකි වූ මොහු ට විරුඬ ව නිකරුණේ රෑ මුළුල්ලේ යුඬ කෙළෙමි'යි මෘදු වූ සිතැති වැ 'මේ තෙම ක්‍රෝධයෙන් නික්මියේ ද නැත හොත් සුවච බැවින් නික්මියේ දැ?'යි පරීක්ෂා කරමි'යි සිතා 'ශ්‍රමණය, ඇතුළට එව'යි කීයේ ය. 'යහපත, ඇවැත්නි'යි කියා බුදුරජාණන් වහන්සේ ගෙට වන් සේක. දෙවෙනි

තෙවෙනි වර ද යක් තෙම පිට වන්නටත් ඇතුළට එන්නටත් අණ කෙළේ ය. බුදුරජාණන් වහන්සේ ද පළමු සේම ඔහු කී පරිදි කළ සේක. කිසිවක් ඉල්ලා හඬන දරුවාට එය දී නලවන මවකසේ බුදුරජාණන් වහන්සේ (ක්‍රෝධයෙන් හඬන) අළවු යකු නලවන පිණිස ඔහු කී දෑ කළ සේක. එවිට යක් තෙම 'මේ ශ්‍රමණයා ඉතා සුවචය. එළිවන තුරු මෙසේ ම ඇවිදුවා වෙහෙසවම් යැ'යි අදහස් කොට සතර වන වරද 'මහණ, නික්මෙව'යි කීයේ ය. එවිට ඔහුගේ අදහස දත් බුදුරජාණන් වහන්සේ 'නො නික්මෙමි. තුඹට හැකි දෙයක් කරන්නැ'යි වදාළසේක. එ ඇසූ 'අළවු යක් තෙම, ප්‍රශ්න අසා මොහු වෙහෙසවන්නෙමි'යි සිතා, තමා මා පියන් ගෙන් උගත් ප්‍රශ්න සතරක් විචාළේ ය.[166] භාග්‍යවතුන් වහන්සේ ඒ විසඳීම් වශයෙන් ඔහුට දම් දෙසූ සේක. බණ ඇසීමෙන් යක් තෙම සෝවාන් විය.

පහන් වූ බැවින් වෙන ද මෙන් ම ඔහුට බිලි පිණිස ආළවි රජු ගේ ඇමැතියෝ කුඩා දරුවකු එහි ගෙනාහ. එ ආළවි රජුගේ පුත් කුමරුවායි. රාජපුරුෂයෝ භවනය ඇතුළට ම ගොස් භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කොට හුන් අළවු යකු දැක 'මහා යක්ෂය, මේ කුමරු තොපට බිල්ලට ගෙනාමු. මෙන්න පිළිගනුව, පිළිගෙන කව. තට කැමැත්තක් හෝ කරව'යි කීහ. සෝවාන් වූ හෙතෙම බුදුරජාණන් වහන්සේ ඉදිරිපිට දී ම ඇසූ වචනයෙන් ලජ්ජාවට පැමිණියේ, කුමරුවා දෑතින් පිළිගෙන, 'ස්වාමීනි, මේ කුමරා මට එවන ලද්දෙකි. මම මොහු භාග්‍යවතුන් වහන්සේට දෙමි. බුදුවරු හිතානුකම්පා ඇත්තෝ ය. වහන්ස. මොහුට හිත වැඩ පිණිස භාග්‍යවතුන් වහන්සේ මොහු පිළිගන්නා සේක්වා'යි කියා භාග්‍යවතුන් වහන්සේ අතට දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ 'මේ දරුවා පෝෂිත කොට නැවැත මට දෙවු' යැ යි වදරා කුමරා රාජපුරුෂයන් අතට ම දුන් සේක. මෙසේ අතින් අතට දෙන ලද බැවින් ඒ කුමරා එ තැන් සිට **හත්ථාළවක** නමින් ප්‍රකට විය. රාජපුරුෂයෝ ද කුමරහු ගෙන ආපසු අළවු නුවරට ම ගියහ. මේ ප්‍රවෘත්ති ය එහි පතළ වූයෙන් ඒ පෙදෙස නුවර වැස්සන් ගේ ප්‍රීති ඝෝෂයෙන් ඇලැළී ගියේ ය.

පිණ්ඩපාත වේලාව පැමිණි කල යක් තෙමේ පා සිවුරු ගෙන බුදුරජුන් පසු පස්සෙන් මාර්ගයේ අඩ දුරක් ගොස් නැවැතුණේ ය. භාග්‍යවතුන් වහන්සේ ද නුවර පිඬු පිණිස හැසිර වළඳා නුවර දොරටුව සමීපයෙහි රුකක් මුල පණවා දුන් අස්නේ වැඩ හුන්සේක. ආළවි රජ ද නුවර වැස්සෝ ද එහි එක් රැස් ව උන් වහන්සේ වැඳ පිරිවරා උන්නෝ

'එ බඳු දරුණු යකකු කෙසේ හික්මවා වදළ සේක් දැ?යි' විචාළහ. බුදුරජාණන් වහන්සේ සිදු වූ සියල්ල වදරා යකුට දෙසූ ධර්මය ම ඔවුනට වදළ සේක. එය ඇසීමෙන් අසූසාර දහසක් ප්‍රාණීනට ධර්මාභිසමය විය.

**සොළොස් වන වස ආළවියෙහි**

මෙසේ භාග්‍යවතුන් වහන්සේ ආළවක යකු හික්මවා රටට සෙත සලසා එ වස් කාලයෙහි ආළවි ජනපදයෙහි ම වුසූ සේක.

**සතළොස් වන වස රජගහ පුර**

ආළවියෙන් නික්ම සැරිසරා වඩනා භාග්‍යවතුන් වහන්සේ වර්ෂර්තුව ළං වැ සිටි කල රජගහ පුරයට වැඩ සතළොස් වන වස වේළුවනාරාමයෙහි වුසූ සේක එම කාලයෙහි ජීවක වෙද තුමා ගේ සොහොයුරි වූ **සිරිමා** නම් ගණිකා මළා ය. ඇය ජීවත්ව හින්දැදී දැක, ඇය කෙරේ ඇල්මෙන් නිරාහාර වූ තරුණ භික්ෂුවක් විය. බුදුරජාණන් වහන්සේ ඇගේ ශරීරය ආදහන නො කොට සොහොනෙහි ම බලු සිවල් ආදීනට ළං විය නො හැකි කොට රක්වන ලෙස රජුට පණිවුඩයක් යැවූ සේක. රජද එසේ ම කෙළේ ය.

**සිරිමා නගර සෝභිනී සමාගමය**

තුන් දිනක් ගිය පසු ඒ ශරීරය ඉදිමී කුණු වී පණුවන්ගෙන් ගැවැසී ගත්තේ ය. බුදුරජුන් වදළ පරිදි 'ගෙවල් රක්නා ළමයින් හැර සෙසු සියලුදෙනා එය දක්නට පැමිණිය යුතු ය යැ'යි රජ අණබෙර ලැවූයේ ය. බුඩ ප්‍රමුඛ සඞ්ඝයාට ද එහි වඩිනා ලෙස ආයාචනා කොට යැවූයේ ය. කෑම නො කා සිවු දිනක් ම වැතිර හොත් තරුණ භික්ෂු ද සිරිමාව දැක්මට යෑම පිණිස අන් භික්ෂූන් විසින් කැඳවනු ලදු ව වහා නැගිට්ටේ ය. බුදුරජාණන් වහන්සේ ඒ සියලු භික්ෂූන් කැටුව සොහොනට වැඩ සිරිමාව ගේ මළ සිරුර සමීපයෙහි පසෙක සිටි සේක. භික්ෂු සමූහයා ද රාජපුරුෂයෝ ද උපාසක උපාසිකාවෝ ද ඒ මළ සිරුර වටේ එක් එක් පාර්ශ්වයෙහි සිටියහ.

බුදුරජාණන් වහන්සේ රජුට කථා කොට 'මහරජ මේ කවුරු දැ?'යි ඇසූ සේක. 'වහන්ස, මේ සිරිමා යැ'යි රජ කීයේ ය. 'මේ සිරිමා දැ?'යි යළිත් බුදුරජාණන් වහන්සේ ඇසූ සේක. 'එ සේ ය වහන්සැ'යි රජ පිළිතුරු දුන්නේ ය.

'මහරජ, එසේ නම් රන් දහසක් දී සිරිමාව ගණීත්වා'යි නුවර වැස්සනට දැන්වුව මැනැවැ'යි වදළ සේක. රජ ද එසේ කැරවූයේ ය. එහෙත් කිසිවෙක් එය මිළයට ගන්නට කැමැති නො වීය. ඉක්බිති

ක්‍රමයෙන් කහවණු පන්සියය දෙසිය පනස එක්සිය පනස විසි පහ විස්ස දහය ආදී පිළිවෙළින් පණම දක්වා මිල පහත් කොට ඒ සිරුර ගන්නට කී නමුත් කිසි ම කෙනෙක් එයට කැමැති නො වූහ. එවිට 'නොමිළයේ එය ගන්නා ලෙස පිරිසට දැන්වුව මැනැවැ'යි වදාළ සේක. රජ එසේත් දැන්වීය. එහෙත් කිසිම කෙනෙක් එයට කැමති නොවූහ. එ විටැ බුදුරජාණන් වහන්සේ වදරන සේක්, '**මහණෙනි, බලවු. පෙර මහ ජනයා මැය රන් මිල දහසක් වුවත් දී එක දවසකට පමණ ද (භායර්‍යා වශයෙන්) ගත් හ. දැන් නොමිළයේ වත් ගන්නා කෙනෙක් නැත. මහජනයාට ප්‍රිය වූ එබඳු රූපය දැන් මෙසේ ක්ෂීණ ව විනාශයට පැමිණියේ ය. ගිලන් අත් බැවේ සැටි නුවණින් බලවු**' යැ යි වදරා.

'**යම් සිරුරෙක ස්ථිර පැවැත්මෙක් නැද්ද, වණ රැසක් වූ ඇට රැසින් ගළපා සිටුවන ලද්දක් වූ. ගිලන් වූ, බොහෝ දෙනා විසින් ශුභ වශයෙන් වරදවා කල්පනා කොට ගන්නා ලද, වස්ත්‍රාභරණාදියෙන් සරසන ලද ඒ මේ ශරීරය අශුචි දුගඳ පිළිකුල් දැයක් කොට ඇති සැටි ලෙස සලකා බලන්නැ**'යි වදාළ සේක. දේශනාවසානයේ දී සුවාසූ දහසකට ධර්මාභිසමය විය .සිරිමාව කෙරේ ඇලුම් කළ භික්ෂු ද, පියෙවි සිහිය ලැබී ය.[167]

**දුගියකුට ආහාර දෙවා දම් දෙසීම**

වස් කාලයෙන් පසු භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සඞ්ඝයා කැටුව වඩිනා සේක්, සැවැත් පුර පැමිණ එහි කලක් වුසූ සේක.

දිනක් සිරිත් පරිදි අලුයම් කාලයෙහි ලොව බලා වදරන භාග්‍යවතුන් වහන්සේ සෝවාන් ඵලයෙහි පිහිටීමට තරම් හේතු සම්පත් ඇති අළවු පුර වැසි දිළිඳු මිනිසකු දුටු සේක. දැක ඔහුට අනුග්‍රහ පිණිස භික්ෂූන් පිරිවරා එහි වැඩි සේක. ආළවි පුර වාසීහු බුධ ප්‍රමුඛ සඞ්ඝයා වඩා හිඳුවා දන් දුන්හ. දන් වළඳා ඉවර වූ පසු ඒ පිරිස අනුමෝදන ධර්මය අසනු අටියෙන් හුන්හ. එහෙත් දයාබර ලෝකස්වාමීන් වහන්සේ තිස් යොදුන් මග ගෙවා යම් අසරණ දුප්පත් මනුෂ්‍යයකු බලා එහි වැඩි සේක් ද, ඔහු එනතුරු ම දම් නො දෙසා බලාපොරොත්තු වූ සේක. ඒ දුප්පත් පුරුෂයාත් නැති වූ ගොනකු සොයනු පිණිස උදේ පිටත් වූයේ ගොනු සොයා ගාලට දමා, බලවත් බඩ ගින්නෙන් පීඩිත වූවත් ගෙට නො ගොස් භාග්‍යවතුන් වහන්සේ දක්නා පිණිස ගියේ ය. ගොස් වැඳ පසෙක සිටියේ ය. ඔහු බඩ ගින්නෙන් පීඩිත බව දුටු භාග්‍යවතුන් වහන්සේ එ දන් පලෙහි වතාවත් කළ අයකු කැඳවා 'සඞ්ඝයා වළඳා තවත් ඉතිරි වූ ආහාර ඇත් දැ'යි අසා වදාළ සේක. 'එසේ යැ'යි වතාවත්

කරු කීය, 'එසේ නම් අසුවල් තැන හිඳුවා මොහුට ආහාර දුන මැනවැ'යි වදළ සේක. හෙ තෙමේ ද බුදුරජාණන් වහන්සේ වදළ පරිදි ම කැඳ අවුළුපත් බත් ආදියෙන් මොනොවට ඔහු වැළැඳැවී ය. කැම කා මුව සෝද ඉවර ව බඩ ගිත්තත් වෙහෙසත් නිවාගෙන සුවපත් වූ ඔහුටත් එහි හුන් සෙසු මහ පිරිසටත් භාග්‍යවතුන් වහන්සේ දන කථාදි පිළිවෙළ කථාව වදරා ඉන්පසු චතුස්සත්‍යයන් ප්‍රකාශ කළ සේක.

ඒ පුරුෂයා දේශනාවසානයේ සෝවාන් වූයේ ය. භාග්‍යවතුන් වහන්සේ ද අනුමෝදන බණ වදරා හුනස්නෙන් නැගිට වැඩි සේක. මහජනතෙමේත් උන් වහන්සේ පසු පස්සෙන් ටික දුරක් ගොස් හැරී ආයේ ය. බුදුරජාණන් වහන්සේ හා වඩනා භික්ෂූහු 'ඉතිරි වූ ආහාර ඇද්දැ?'යි අසා ඒ පුරුෂයාට කෑම දෙවූ කාරණය ගැන කථා කරමින් ගියහ. බුදුරජාණන් වහන්සේ එය අසා ආපසු හැරී භික්ෂූන් දෙස බලා 'මහණෙනි, කුමක් කියවුදැ?'යි ඇසූ සේක. භික්ෂූන් එ පවත් කී කල, 'එසේ ය, මහණෙනි, තිස් යොදුන් දීර්ඝ මාර්ගය ගෙවා මා ආයේ එ උපාසකයා ගේ හේතු සම්පත් දැකීමෙන් ය. ඔහු ඉතා උදේ පටන් නැති වූ ගොනකු සොයමින් වනයේ හැසිර ආයේ බලවත් බඩගින්නෙන් පෙළෙමින් ය. බඩගිනි හෙයින් ධර්ම ප්‍රතිවේධය කළ නො හැකි බව සලකා ඔහුට ආහාර දෙවූයෙමි.

**"බඩගින්න සියලු රෝග අතුරෙන් දරුණු ම රෝගය යි. සංස්කාර දුක සියලු දුක් අතුරෙන් දරුණු ම දුකයි. මේ බව තත් වූ පරිදි අවබෝධ කොට නැණැතියෝ නිවන ප්‍රත්‍යක්ෂ කරති. ඒ නිවන වනාහි අග්‍ර ම සුවයයි. එයට වැඩි සුවයෙක් නැතැ"යි [168] වදළ සේක.**

# අටතිස් වන පරිච්ඡේදය

## අටොළොස් වන එකුන් විසිවන දෙවස චාලිය පර්වතයෙහි විසිවන වස රජගහ පුර වේළුවනයෙහි

**අටළොස් වන වස පෙෂකාර දුහිතෘ සමාගමය**

භාග්‍යවතුන් වහන්සේ වස් කාලයෙන් පසු ආළවියෙන් නික්ම සැරිසරා වඩනා සේක් ඊළඟ වැසි සමය ළංවැ තිබිය දී චාලිය පර්වතයට වැඩ එහි වුසූ සේක. මෙ සමයෙහි දිනක් අළවු නුවර වැඩ පෙහෙර දුවකට අනුග්‍රහ කළ සේක. මුල සිට ඇය ගේ ප්‍රවෘත්ති කථාව මෙසේ ය:

, පෙර එක් දිනෙක අළවු නුවර වැස්සෝ භාග්‍යවතුන් වහන්සේ එහි වැඩි කළ නිමන්ත්‍රණය කොට මහ දන් දුන්හ. දන් වළඳා අන්තයෙහි සාමිදරුවන් වහන්සේ අනුමෝදනා බණ වදරන සේක්,

"**ජීවිතය අනියත ය. මරණය නියත ය. කවරදක නුමුත් මරණය ඒකාන්ත ය. මේ ජීවිතය මරණයෙන් කෙළවර වන්නේ ය, දිවි පැවැත්ම මෙනෙක් කලැ යි නියම නැත. මරණය පැමිණෙන බව නම් නියත යැ යි මෙසේ මරණානුස්මෘතිය වඩවු. යම් කෙනෙක් එය නො වැඩූහු නම් ඔහු පසු ව මරණය පැමිණි විට බලාපොරොත්තු නැති වැ සර්පයකුට මුණගැහුණවුන් සේ බිය වැ තැති ගැන්මට පැමිණ බියෙන් මරහඬ දෙමින් මැරෙති. යම් කෙනෙක් වනාහි මරණානුස්මෘතිය වැඩූහු නම්, ඔහු ඈත දී ම දංඩක් ගෙන සිටි පුරුෂයක් හු මෙන් මැරෙන කාලයෙහි මහ බියකට නො පැමිණෙත්. එබැවින් මරණානුස්මෘතිය වැඩිය යුතු යැ**"යි වදළ සේක.

ඒ ඇසූ සෙස්සන් එය සිහි නො කොට තම තමන්ගේ එදඑද කටයුතුවල ම ව්‍යාවෘත වූ නමුදු පේශකාරයකු ගේ (රෙදි වියන්නකුගේ) දූ වූ සොළොස් හැවිරිදි තරුණියක් භාග්‍යවතුන් වහන්සේ ගේ අවවාදය සිතැ තබා නිතර මරණානුස්මෘතිය වැඩීමෙහි යෙදුණා ය. නැවත ඉන් වර්ෂ තුනකට පසු දිනක් අලුයම් වේලෙහි සිරිත් පරිදි ලොව බලා වදරන භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේගේ ඥානයට ඇය පෙනුණ බැවින් කිමෙක් දැ'යි නුවණින් බලා, ඇය සෝවාන් වීමට හේතු සම්පත් ඇති නියාව දැක පන්සියයක් පමණ භික්ෂූන් හා ජේතවනාරාමයෙන් නික්මැ පිළිවෙළින් වඩනා සේක් **ආළවි පුර අග්ගාලව** විහාරයට සම්ප්‍රාප්ත වූ සේක.

භාග්‍යවතුන් වහන්සේ වැඩිය බව අසා, අළවු වැසියෝ රැස් ව දනයට නිමන්ත්‍රණය කළහ. යටකී තරුණි ද භාග්‍යවතුන් වහන්සේ වැඩිය බව අසා 'පුන්සඳ මඬලක් වැනි මුහුණ ඇති මාගේ සාමිදරු ගෞතම සම්බුධයන් වහන්සේ වැඩිසේකැ'යි සතුටු ව 'මා රන්වන් ශාස්තෲන් වහන්සේ දුටුයේ මෙයින් වර්ෂ තුනෙකින් පෙර ය. අද උන්වහන්සේ ගේ රන්වන් ශරීරය දක්නටත් මිහිරි ධර්මය අසන්නටත් ලැබෙන්නේ යැ'යි සිතුවා ය.

ඇගේ පියා රෙදි වියන ශාලාවට යන්නේ, එද ම එක රෙද්දක් වියා නිම කළ යුතු වූයෙන්, ඒ සඳහා පිළි වියන දඬු අඹරා ඉක්මණින් පිළියෙල කොට ගෙනෙන්නට ඇයට අණකොට ගියේ ය. ඕ 'එය පිළියෙල කොට දී එයට පසු බණ අසමි'යි සිතා පුටුවෙක හිඳ දඬු

ඇඹරුවා ය. අළුවූ වැසියෝ දත් වළඳවා ඉක්බිති අනුමෝදනා බණ අසන අටියෙන් හුන්හ. එහෙත් භාග්‍යවතුන් වහන්සේ තමා එහි යම් තැනැත්තියකට සෙත් සලස්වනු වස් වැඩි සේක් නම්, ඇය එහි පැමිණෙන තුරු ම කිසිත් නො වදරා තුෂ්ණිම්භූත වූ සේක.

පෙහෙර දූ ද දඬු අඹරා පිළියෙල කොට පැසෙක ලා ගෙන පියා කරා යන්නී බණ අසන්නට රැස් වැ හුන් පිරිස වෙත එළැඹ පිරිස් කෙළවරින් භාග්‍යවතුන් වහන්සේ දෙස බලන්නී ම ගියා ය. එවිට භාග්‍යවතුන් වහන්සේ කර ඔසොවා ඇය දෙස බැලූ සේක. ඕ තොමෝ ඒ දැක භාග්‍යවතුන් වහන්සේ කරා ගියා ය.

මෙහි දී බුදුරජාණන් වහන්සේ කුමක් හෙයින් ඇය දෙස මෙසේ බැලූ සේක් ද? යත්: පෙර කළ අකුශල කර්මයක් හේතු කොට ගෙන තව ටික වේලාවකින් ඕ මැරෙන්නී ය. ඉන් මෙහා බණ ඇසුවොත් ඕ සෝවාන් පෙලෙහි පිහිටන්නී ය. එයින් මරණයෙන් පසු තුසිත දෙව් ලොව උපදින්නී ය. එබැවින් ඇයට දම් දෙසනු සඳහා ඇගේ පැමිණීම බලාපොරොත්තුවෙන් හිස ඔසොවා බැලූ සේක. ඕ තොමෝ ද බුදුරජුන් වෙත පැමිණ වැඳ පැත්තෙක සිටියා ය. එ කෙණෙහි ම බුදුරජාණන් වහන්සේ,

'කුමරිය, කොහි සිට ආයෙහි දැ'යි අසා වදළ සේක.

නිතර ම මරණ සතිය වඩන ඕ තොම තමා ගේ අදහසට අනුව උත්තර දෙන්නී.

'වහන්ස, කොයින් ආයෙම්දැ'යි නො දනිමි' කීවා ය.

'කොහි යන්නෙහිදැ?'යි භාග්‍යවතුන් වහන්සේ ඇසූ සේක.

'වහන්ස, නො දනිමි'යි ඕ පිළිතුරු දුන්නී ය.

'ඉක්බිති නො දන්නෙහි දැ?' යි ඇසූ සේක.

'දනිමි වහන්ස'යි ඕ කීවා ය.

'දන්නෙහි දැ'යි බුදුරජාණන් වහන්සේ ඇසූ සේක.

'නො දනිමි' යි ඕතොම පිළිතුරු දුන්නා ය.

මේ කථාව ඇසූ එහි රැස් ව සිටි පිරිස, භාග්‍යවතුන් වහන්සේ ඇසූ ප්‍රශ්නයට උත්තර වෙනුවට හිතුණු හිතුණු යමක් කීවා යැ යි ඇයට දොස් නඟන්නට වූහ. භාග්‍යවතුන් වහන්සේ පිරිස නිශ්ශබ්ද කොට,

'කොහි සිට ආයෙහි දැ?'යි ඇසූ විට, ඈ එසේ කීයේ මන්දැ?'යි ඇය ම පුළුවුත් සේක.

එවිට උත්තර දෙන්නී 'ස්වාමීනි, මා පේශකාරගෙහි සිට එන බව ප්‍රකට කාරණයෙකි, ඔබ විචාළේ 'කොයින් අවුත් උපන්නෙහි ද?' යන වග යි. එය මා නොදන්නා බැවින්, 'නො දනිමි'යි කීමි'යි උත්තර දුන්නී ය.

එ විටැ බුදුරජාණන් වහන්සේ සාධුකාර පවත්වා 'මා ඇසූ ප්‍රශ්නයට ම නිසි උත්තර දුන්නෙහි යැ'යි ඇයට ප්‍රශංසා කළ සේක.

'නැවත කොහි යන්නෙහි දැ?'යි ඇසූ විට, 'නො දනිමි' යි කීයේ මන්දැ?'යි විචාළ සේක.

'පේශකර්ම ශාලාවට යන බව ප්‍රකටයි. ඔබ වහන්සේ ඇසූයේ කොහේ උපදින්නෙහි ද' යන්න යි. ඒ ද මා නොදන්නා බැවින් 'නො දනිමි'යි කීමි'යි ඕ කීවා ය. එවරත් බුදුරජාණන් වහන්සේ පළමු සේම සාධුකාර දුන් සේක.

'නැවත නො දන්නෙහි දැ?'යි ඇසූ විට 'දනිමි'යි කීයේ මන්දැ?'යි ඇසූ සේක.

'වහන්ස, මා මැරෙන බව දනිමි. එ බැවින් එ සේ කීමි'යි කීවා ය. එ වරත් බුදුරජාණන් වහන්සේ සාධුකාර දුන් සේක.

ඉන් පසු 'දන්නෙහි දැ?'යි ඇසූ විට 'නො දනිමි'යි කීයේ මන්දැ?'යි ඇසූ සේක.

'වහන්ස, කිනම් වේලාවෙක මරණය වන්නේ දැ යි නො දන්නා බැවින් එසේ කීමි'යි ඕ කීවා ය.

'මා ඇසූ ඇසූ ප්‍රශ්නවලට ම නිසි පිළිතුරු දුන්නෙහි යැ'යි සතර වන වරද බුදුරජාණන් වහන්සේ සාධුකාර දුන් සේක.

**ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පිරිස අමතා, 'මේ සා මහ පිරිසේ කිසිවෙක් ම කාරණය තේරුම් නො ගත්තේ ය. එහෙත් දොස් නැඟීම නම් කළෝ ය. ප්‍රඥා ඇස නැති තැනැත්තෝ අන්ධයෝ ය. ප්‍රඥා ඇස ඇති තැනැත්තෝ ම ඇස් ඇත්තෝ ය. මේ ලෞකික ජන තෙම ප්‍රඥා නැමැති ඇස නො මැත්තේ අන්ධ ය. ඉතා ටික දෙනෙක් ම අනිත්‍යාදි වශයෙන් බලත්. ලිහිණි වැද්දගේ දැලෙන් මිදුණු පක්ෂියා මෙන් ටික දෙනෙක් ම සුගතියට ද නිවනට ද යන්නෝ යැ'යි වදළ සේක.**[169]

දේශනාවසානයේ දී කුමරිය සෝවාන් වූවා ය. මහ ජනයාට ද ධර්මදේශනාව සාත්ථක විය. ඒ තරුණී ද පැස ගෙන පියා වෙත ගියා ය. ඒ වේලායෙහි පෙහෙර තෙම ඉඳ ගෙන ම නින්දට බටුයේ ය. තරුණිය ඒ බව නො සලකා පැස තබන විට එය වෙමි කෙළවර වැදී ශබ්ද විය.

පෙහෙර තෙම හදිසියෙන් පිබිදුණේ පළමු වෙම් තැබූ පරිදි ම ඇද්දේ ය. වෙම් කෙළවර එයට එල්ලව සිටි තරුණිය ගේ ඇඟ ඇනී ඕ එතැනම මැරී වැටුණා ය. පෙහෙර තෙම නැගිට බැලූයේ වැටී මැරී මුළු ඇඟ ම ලෙයින් තැවරී හොත් තැනැත්තිය දැක අතිශය ශෝක ප්‍රාප්ත වැ තමා සනසාලීමට භාග්‍යවතුන් වහන්සේ මිස අන් කිසිවෙක් නැතැයි සලකා එහි ගොස් වූ පවත් දැන්වී ය. ශාස්තෲන් වහන්සේ ඔහු අස්වසා,

"**ශෝක නො කරව, දීර්ඝ වූ සසර මෙ පරිද්දෙන් ම දරුවන් මළ සොවින් වගුරුවාලූ කඳුළු සිව් මූදු ජලයටත් ඉතා වැඩියැ** "යි අවවාද කොට අනමතග්ග කථාව[170] වදළ සේක.

ඒ අසා තුනී වූ ශෝක ඇති හෙතෙම භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදි වැ උපසම්පදව ලබා නොබෝ කලෙකින් රහත් වූයේ ය.

**එකුන් විසි වන වස චාලිය පර්වතයෙහි**

වස් කාලයෙන් පසු සැරි සරා වඩනා භාග්‍යවතුන් වහන්සේ පෙරළා වැඩ බුඩත්වයෙන් එකුන් විසි වන වසෙහි වැසි සමයෙහි **චාලිය පර්වතයෙහි** ම වුසූ සේක.

**විසි වන වස**

යලි දු වර්ෂර්තුයෙන් පසු සැරිසරා වඩනා සේක්. නැවැත රජගහ පුර වැඩ විසි වන වර්ෂා සෘතුව එහි ගත කළ සේක.

**අංගුලිමාල දමනය**

කොසොල් රජුගේ පුරෝහිතයා භාර්ගව නම් බමුණෙකි. ඔහු බිරිය මන්තානි නම් බැමිණියක. ඔවුන් ගේ අහිංසක නම් පුතෙක් විය. හේ මා පියන් විසින් ඉගැන්ම පිණිස තක්සලා නුවර දිසාපාමොක් ඇදුරු වෙත යවන ලද්දේ ය. හේ දක්‍ෂ ලෙස ඉගෙන ගත්තේ ය. ඇදුරු ඔහු කෙරෙහි විශේෂ ලැදි බවක් දැක්විය. අන් සිසුවෝ අහිංසකයාත් ඇදුරුත් අතර භේදයක් ඇති කිරීමට උපායක් යෙදූහ. අහිංසකයා දිසාපාමොක් ඇදුරුගේ බිරිය හා රහස් මිත්‍රත්වයක් ඇති ව ඉදිතැ'යි බොරු ගොතා ඇදුරාට කියැවූහ. ඇදුරු තෙම එය හැදැහී ය. ඔහු මරවා දමන්නට සිතී ය. 'තමා වෙත හින්දැදී එ වැන්නක් වුවොත් එය හෙළි වුවොත් 'දිසාපාමොක් ඇදුරා තමා වෙත එන ශිෂ්‍යයන් මරවතැ'යි කථාවක් පැතිරෙන්නට පුළුවන. එසේ වුවොත් තමා වෙත එන ශිෂ්‍යයන් අඩුවෙන්නට පුළුවනැ'යි හේ සිතී ය. 'අනුන් ගෙන් මොහුට මැරුම්කන්නට මඟක් යොදම්'යි සිතී ය. අහිංසකයා ඉගෙන අවසන් කොට සිය ගමට යන්නට ඇදුරුහු ගෙන් සමු ගන්නට ගිය විට 'නුඹ උගත් සිප් සතර උපචාර පිණිස කළ යුතු හෝමයට එක් එක් මිනිසා ගෙන් ඇඟිල්ල බැගින් ඇඟිලි දහක් අවශ්‍ය

යැ යි කී ය. 'මිනිසුන්ගේ ඇඟිලි කපාගන්නට ගිය විට ඒ කවරකු ගෙන් හෝ මොහුට මැරුම්කන්නට සිදු වේතැ'යි සිතා දිසාපාමොක් ඇදුරු අනුන් ලවා අහිංසකයා මරවන්නට මේ උපාය යෙදී ය. අප ගෙහි කිසිම කෙනෙක් ප්‍රාණවධ නො කර තැ යි අහිසංක කී ය. 'එසේ වී නම් අවශ්‍ය බලි පූජාව නො කළ බැවින් නුඹ උගත් සියලු සිප් සතර නිෂ්ඵල වේතැ'යි ඇදුරු කී ය. අහිංසක තෙම ඇඟිලි දහසක් ගෙනෙමැ'යි පොරොන්දු විය. හේ තක්සලාවෙන් පිටත් ව ගොස් කොසොල් රටට පැමිණ කඩු දුනු ආදි ආයුධ සපයා ගෙන මහ මහට සමීප වන පෙදෙසෙක සැඟෙවී හිඳ මිනිසුන් මරා ඇඟිලි කපාගන්නට පටන් ගත්තේ ය. මෙයින් දර පිණිස පලා ආදිය පිණිස වත් එ වන පෙදෙසට මිනිසුන් ගේ පැමිණීම නැවැතිණ. ඒ මගින් මිනිසුන්ගේ යෑම ඊම ද නැවැතිණ. හේ රෑ ගෙවලට ගොස් දොරවල් කඩා නිදා හොත්ත වුන් මරා ඇඟිලි කපා ගන්නට විය. කපා ගන්නා ඇඟිලි තුබූ තැන්වලින් සතුන් ගෙන යන බැවින් ඇඟිලි විද හුයෙක අමුණා මාලාවක් මෙන් බෙල්ලේ බැඳගෙන සිටියේ ය. එයින් ඔහු දුටු මිනිස්සු අංගුලිමාල යැයි ඔහු හැඳුන්වූහ. ඔහුගෙන් ඒ පෙදෙස උපද්‍රැත විය.

මිනිස්සු සැවැත් නුවරට ගොස් පසේනදී කොසොල් රජු බැහැදැක අංගුලිමාලයාගෙන් වන උවදුරු සැළ කළහ. 'මම සෙට ඔහු අල්ලාගන්නට සේනාව රැගෙන එන්නෙමි' කියා ඔවුන් අස්වසා යැවී ය. මිනිසුන්ගේ කථාව ඇසූ පුරෝහිත තෙම මේ තමාගේ පුත් අහිංසකයා යයි දැන ගෙන ගොස් සිය බිරියට මෙ පවත සැළ කෙළේ ය. 'ස්වාමීනි, ඔබ ගොස් පුතු කැඳවා ගෙනෙන් නැ යි ඕ කීවා ය. බමුණා 'සොරා විශ්වාස කළ නො හැක්කැ'යි කියා එයට කැමැති නො වී ය. බැමිණි 'මම ගොස් මා පුතු කැඳවා ගෙන එමි'යි කීවා ය.

පසු දින අලුයම් වේලේ ලොව බලන භාග්‍යවතුන් වහන්සේ කලින් අංගුලිමාලයා වෙත තමන් වහන්සේ නො වැඩියොත් ඔහු මව මරා ආනන්තර්‍ය පාපයක් කොට අවීචිනිරයේ ඉපිද දීර්ඝ කාලයක් දුක් විඳින බව ද, තමන් වහන්සේ ඔහු කරා වැඩියොත් බණ අසා පැවිදි ව රහත් වන්නට තරම් පෙර කළ පින් ඇතියකු බව ද දුටුසේක්, එද පස් වරුයෙහි පියෙවි වෙසින් අංගුලිමාලයා වසන පෙදෙස අතට ගමන් කළ සේක. මිනිස්සු උන් වහන්සේ දැක 'ඔය පැත්තට නො වඩින්න ඔහි මිනීමරු අංගුලිමාලයා සිටිති'යි කීහ. භාග්‍යවතුන් වහන්සේ නිභඩව ම වැඩි සේක.

අංගුලිමාලයා මහ අද්දර සිටියේ මහ මඟ දිගේ වඩනා භාග්‍යවතුන් වහන්සේ දිටී ය. ආයුධයෙන් සැදී භාග්‍යවතුන් වහන්සේ පස්සෙන් ගියේ ය. භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේට ළං විය නො හෙන ලෙසට සෘ මය අධිෂ්ඨානයක් කළ සේක. අංගුලිමාලයා වේගයෙන් දිවෙයි. එහෙත් පියෙවි ගමනින් වඩනා භාග්‍යවතුන් වහන්සේට ළං විය නො හෙයි. මෙසේ බොහෝ දුරක් වැඩිසේක. අංගුලිමාලයා හති වැටී තවත් දිවිය නො හැක්කේ 'මහණ ඔහි නවතුව'යි කී ය. 'මම නම් නැවතී ඉඳිමි. නැවැතිය යුත්තේ තුඹයැ'යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

එය ඇසූ අංගුලිමාල තෙම මේ මහණ යෙමින් ම නැවැතී ඉඳිමි' යි කියයි. නැවතී සිටි, මට යන්නකුට මෙන් 'නවතින්න'යි කියයි. මෙය විචාරමි යි සිතී ය. 'ඔබ කෙසේ නැවති සිටිවු ද? මම කෙසේ නො නැවතී සිටිමි දැ?' යි හේ ඇසී ය. 'හිංසායෙන් වැළකී ක්‍ෂාන්ති මෛත්‍රිය පතුරුවමින් ඒ ගුණයන් හි රැඳී සිටින බැවින් මම නැවැතී සිටිමි. ඔබ එවැනි ගුණයෙක් නො සිටියෝ ය. ඔබ මරණින් මතු නිරය අතට යන ගමනෙහි යෙදුනෝ නො නැවැතී යෙති'යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

'මෙ වැනි ශ්‍රේෂ්ඨ නිර්භය වචන කිය හැකි එක් ම තැනැත්තෝ මායා දේවීන්ගේ පුත්‍ර සිඩාර්ථ ශ්‍රමණයෝ ය. මේ ඔවුන් වියැ යුතු යැ මට අනුග්‍රහ පිණිස වැඩිසේක් වනැයි අංගුලිමාලයා සිතී ය. හේ භාග්‍යවතුන් වහන්සේට ස්තුති කොට පව් නො කරන බවට පොරොන්දු විය. තමාගේ ආයුධ පල්ලමකට දමා ගැසී ය. ළඟට ගොස් වැඳ තමා පැවිදි කරන ලෙස අයැදී ය. භාග්‍යවතුන් වහන්සේ ඔහු ඒහිභික්ෂුප්‍රව්‍රජ්‍යායෙන් පැවිදි උපසපන් කළ සේක. ඔහු කැටුව ජේතවනයට වැඩි සේක.

අංගුලිමාලයාගේ මව ඒ වනයට ගොස් සොයා බලා ඔහු නොදැක පෙරලා සිය නිවසට ම ගියා ය.

පසේනදි රජු අංගුලිමාලයා අල්ලා ගනු සඳහා සිවුරඟ සෙන් ගෙන නික්මුණේ, යන ගමනේ ජේතවනාරාමයට ගියෝ ය. භාග්‍යවතුන් වහන්සේ වැඳ, තමා අංගුලිමාලයා අල්ලාගන්නට යන බව සැළ කෙළේ ය. භාග්‍යවතුන් වහන්සේ සමීපයේ ම සිටි අංගුලිමාල තෙරහු හඳුන්වා දුන් සේක. රජුගේ සේනාව තෙරුන් දැක බිය වැද පලා ගියහ. රජ ද බියපත්ව වෙවුලන්නට වන. භාග්‍යවතුන් වහන්සේ අංගුලිමාල තෙරුන් ගෙන් කුරාකුහුඹුවකුට වත් කිසිදු හිරිහැරයක් නොවන බව වදළහ. රජුගේ බිය දුරු විය. හේ තමා තෙරුනට උපස්ථායක වූ කැපකරුවූ බව කී ය. මෙසේ වූ චණ්ඩ පුද්ගලයකු හික්මැවූ නියාව ගැන තමාගේ විස්මය පවසා වැඳ මාලිගාව බලා පිටත් විය.

# එකුන්සාළිස් වන පරිච්ඡේදය

**එක් විසි වන වස පටන් සූසාළිස් වන වස අවසන් කොට සැවැත් පුරෙහි.**

**එක් විසි වන වස සැවැත් පුර ජේතවනයෙහි**

භාග්‍යවතුන් වහන්සේ විසිවන වර්ෂර්තුවෙහි රජගහ පුර වේළුවනයෙහි වැස වස් පවරා සැරිසරන සේක් ඊළඟ වර්ෂර්තුව සමීප වැ සිටි කලැ සැවැත් පුරයට එළඹි සේක. එක් විසි වන වස පටන් සූසාළිස් වන වස දක්වා මේ සූවිසි වස්සාන කාලයන්හි සැවැත් පුරම වුසූ සේක. ඉන් අටළොස් වසක් ජේතවනාරාමයේ ද ඉතිරි සවස පූර්වාරාමයෙහි ද ගත කළ සේක. වැසි සමය අවසන් වූ පසු පෙර සේ ම ජනපද චාරිකායෙහි යෙදෙන සේක. මේ අන්ත්‍ය කාලයෙහි සැවැත් පුර ම නිබඩ වාසය කොට ගත්තේ එහි වූ අනාථපිණ්ඩික ගෘහපති විශාඛා උපාසිකා යන දෙදෙනාගේ ගුණ මහත්ත්වය සැලැකීමෙනි.

**ස්ථිර උපස්ථායකයකු පත් කිරීම**

මුල් විසි වර්ෂයේදී **නාගසමාල**, **නාගිත**, **උපවාන**, **සුනක්ඛත්ත**, **සාගත**, **රාධ**, **මේඝිය**, යන තෙරහු ද **චුන්ද සාමණේර** ද යන මොවුන් වහන්සේ කලින් කල විශේෂයෙන් භාග්‍යවතුන් වහන්සේට උපස්ථායක වූහ. අනඳ තෙරණුවෝ ද නොයෙක් විට උවටන් කළහ. එහෙත් මෙ කිසිවෙක් තමාගේ උපස්ථායක භාවය අතර කඩ නො කොට දිගට ම රැක ගත හැකි නොවීය. එබැවින් විසි වන වසින් පසු දිනෙක භාග්‍යවතුන් වහන්සේ ගඳකිළි පිරිවෙණෙහි පණවන ලද බුධාසනයෙහි වැඩ හිඳ තමන් වහන්සේට නිත්‍ය උපස්ථායකයකු පත් කළ යුතු බව දැන්වූ සේක. සැරියුත් මුගලන් ආදී පිළිවෙළින් සියලු මහාශ්‍රාවකයෝ තම තමා උපස්ථායක වනු කැමැති බව පැවැසූහ. භාග්‍යවතුන් වහන්සේ ඒ සියල්ල ප්‍රතික්ෂේප කළ සේක. මේ වේලායෙහි තුෂ්ණිම්භූත ව හුන් ආනන්ද ස්ථවිරයන් වහන්සේ දැක 'ඇවැත්නි, ඔබ වත් භාග්‍යවතුන් වහන්සේට උපස්ථායක තනතුර ඉල්ලුව මැනැවැ'යි කීහ. එ විටැ ඉල්ලා ලත් තනතුර මා හැඟි නො වේ. ශාස්තෘන් වහන්සේ කැමැති නම් තමන් වහන්සේ ම වදරනවා ඇතැ'යි ආනන්ද ස්ථවිර කී ය. එවිට බුදුරජාණන් වහන්සේ 'මහණෙනි, ආනන්ද තෙම අනුන් විසින් මෙහෙයියැ යුතු නොවේ. තෙමේ ම දැන මට උපස්ථාන කරන්නේ යැ'යි වදළ සේක.

භික්ෂූහු 'ඇවැත් ආනන්දයෙනි, නැඟිට උපස්ථායක තනතුර බාරගත මැනැවැ'යි කීහ. අනඳ තෙරණුවෝ ද නැඟිට පොරොන්දු අටක් පිට භාග්‍යවතුන් වහන්සේට උපස්ථායක බව බාර ගත්තේ ය.

ඒ පොරොන්දු අට මෙසේ යි:

**ප්‍රතික්ෂේප සතර**

'භාග්‍යවතුන් වහන්සේ ලත් ප්‍රණීත සිවුරු තමාට (අනඳ තෙරුනට) නො දිය යුතු ය.

'භාග්‍යවතුන් වහන්සේ ලත් ප්‍රණීත පිණ්ඩපාතය තමාට නො දිය යුතු ය.

'භාග්‍යවතුන් වහන්සේ හා එක ගන්ධකුටියෙහි තමාට වසන්නට නො දිය යුතු ය.

'භාග්‍යවතුන් වහන්සේ නිමන්ත්‍රණ පිළිගෙන තමා හා නො වැඩි ය යුතු ය.'

**ආයාචන සතර**

'තමා පිළිගත් නිමන්ත්‍රණයට භාග්‍යවතුන් වහන්සේත් වැඩිය යුතු ය.

භාග්‍යවතුන් වහන්සේ දැකීමට පිටින් යම් කෙනෙකු ආ කෙණෙහි ම තමන් වහන්සේ වෙත ඔවුන් කැඳවා ගෙනෙන්නට අවසර තිබිය යුතු ය.

'තමාට සැකයක් ඇති වූ කොයිම විටෙක වුවත් භාග්‍යවතුන් වහන්සේ වෙත එන්නට අවසර තිබිය යුතුය.

තමා නැති තැන දෙසූ සෑම ධර්මය භාග්‍යවතුන් වහන්සේ විසින් තමාට වදාළ යුතු ය.' යන මේවා ය.

ඒ තන් පටන් කොට ආනන්ද ස්ථවිර තෙම ශීත උෂ්ණ යන දෙ වැදෑරුම් ජලය පිළියෙල කිරීමෙන් ද, හීන මධ්‍යම ලොකු යැ යි තුන් වැදෑරුම් දැහැටි දීමෙන්ද පා මිරිකීමෙන් හා පිට මිරිකීමෙන් ද, ගඳකිළි පිරිවෙන ඇමදීමෙන් දැ යි මේ ආදී වශයෙන් භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කිරීමෙහි යෙදුණේ ය. 'මේ වේලායෙහි මෙනම් දෑ භාග්‍යවතුන් වහන්සේට ලැබිය යුතු යැ'යි පරීක්ෂායෙන් දිවා කාලයෙහි උන්වහන්සේ ගේ සමීපයේ ම හැසිරේ. රාත්‍රියෙහි මහත් දඬුවැට පහණක් ගෙන නව වරක් ගඳකිළි පිරිවෙන වටේ ඇවිදියි. මෙසේ කරන්නේ භාග්‍යවතුන් වහන්සේ හදිසියෙන් කථා කළොත් පිළිවදන් දෙනු සඳහා නින්දට නො වැටී සිහියෙන් යුක්තව ඉඳිනු පිණිස ය.

**පූර්වාරාම පූජාව**

සැවැත් පුර **පූර්ණවර්ධන** සිටුහු ගේ බිරින්දෑ විශාඛා නමු. ඕ සත් හැවිරිදි වියෙහි දී තම ජන්ම භූමිය වූ **භද්දියපුර** දී භාග්‍යවතුන් වහන්සේ ගෙන් බණ අසා සෝවාන් වූවා ය. පතිකුලයට ආ නොබෝ දිනෙකින් සිය මයිලණු

මිගාර සිටු ආදි කොට ඇති මුළු සිටු කුලයම සස්නෙහි පැහැදවූවාය. එතන් සිට මයිලණුවන් විසින් මාතෘ ස්ථානයෙහි තබන ලද්දී මිගාරමාතෘ නමින් ද ප්‍රකට වූවා ය.

දිනක් ජේතවනයට බණ අසන්නට ගිය විශාඛා සිය **මෙහෙල පළඳනාව** සඳහන් නැති ව බණ මඩුවේ දමා ගියා ය. පසුව ඕ 'එය භාග්‍යවතුන් වහන්සේට ම අයත් යැ'යි කියා, එය විකුණා ගත් මුදලින් විහාරයක් කරවන්නට ඉටා ගත්තීය. ඉක්බිති කහවණු නව කෙළ ලක්ෂයක් වැය කොට මුදලින් සැවැත් පුර සමීපයේ නුවරට නැගෙනහිර පැත්තෙන් බිමක් ගෙන දෙමහල් පායක් කරවා භාග්‍යවතුන් වහන්සේට පැවැරුවා ය. ඒ පූර්වාරාම විහාර නම් විය.*

**ප්‍රථම පාරාජිකා ශික්ෂාපදය පැණැවීම**

විසිවන වස පමණේ දී **වජ්ජිරට** දුර්භික්ෂයෙක් විය. එයින් එහි වුසූ **සුදින්න** භික්‍ෂු වෛශාලි පුරයට නික්ම ගියේ ය. එහි **කලන්ද** ග්‍රාමයෙහි සිය පියා ගේ ගෙට පැමිණි දෙවෙනි දිනෙහි ම පෙර ගිහි කාලයෙහි භාර්‍යා වැ සිටි ස්ත්‍රිය ගේ උපායට හසු විය. ඒ කාරණයේ දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් රැස් කරවා ප්‍රථම පාරාජික ශික්ෂා පදය පැණැවූ සේක.

බුදු වූ තැන් පටන් කොට මුල් විසි වර්ෂයෙහි භාග්‍යවතුන් වහන්සේ **ඕවාදපාතිමොක්ඛය** දෙසූ සේක.

**ඕවාද පාතිමොක්ඛය නම්,**

**"සබ්බ පාපස්ස අකරණං - කුසලසස උපසම්පද**
**සචිත්තපරියොදපණං - එතං බුධාන සාසනං"**

**"ඛන්ති පරමං තපො තිතික්ඛා**
**නිබ්බානං පරමං වදන්ති බුධා**
**න හි පබ්බජිතො පරූපඝාතී**
**න සමණො හොති පරං විහෙඨයන්තො"**

**"අනුපවාදෙ අනුපඝාතො පාතිමොක්ඛෙ ච සංවරො**
**මත්තඤ්ඤුතා ච භත්තස්මිං පන්තං ච සයනාසනං**
**අධිචිත්තේ ච ආයෝගෝ එතං බුධාන සාසනං"**

යන මෙය යැ.

මෙහි අර්ථය : 'සියලු අකුසලින් දුරු වීම, කුසල් කිරීම හා දියුණු කිරීම, තමාගේ සිත පිරිසිදු කිරීම යන මේ බුදුවරයන්ගේ අනුශාසන යි.

---

* ඇතැම් පොතක පෙනෙන හැටියට මෙය වූයේ පස් විසි වන වසේදී පමණ යැ යි හැඟේ. විමසිය යුත්තෙකි.

'ඉවසීම මේ සස්නෙහි උතුම් තපස යි, බුදු පසේ බුදු මහ රහත් හු නිර්වාණය උතුම්කොට කියත්. අන්හට හිංසා පීඩා කරන්නා පැවිද්දෙක් ශ්‍රමණයෙක් නො වේ.

'උපවාද නො කිරීම, හිංසා පීඩා නොකිරීම, ප්‍රාතිමුඛ්‍ය (ශික්ෂාපද) ශීල ඉන්ද්‍රියසංවර ශීල දෙක රැකීම, භෝජනයෙහි පමණ දැනීම (ආජීව පාරිශුඬි ශීලය හා ප්‍රත්‍යය සන්නිඃශ්‍රිත ශීලය), විවේක සෙනස්නෙක විසීම, අෂ්ට සමාපත්තීන් ලැබීමෙහි වියඝ් වැඩීම යන මේ දැ කළ යුතු ය' යනු බුදුවරයන් ගේ අනුශාසන යි.'

බුඬත්වයෙන් විසි වන හවුරුද්දෙහි වෂ්ර්තුයෙන් පසු සැවැත් නුවර වසන සේක්, මේ ඔවාදපාතිමොක්ඛය නවත්තා ආණපාතිමොක්ඛය දෙසීමට අණ කළ සේක. එයට හේතුව නම්: සැවැත් නුවර පූර්වාරාමයෙහි පසොළොස්වක් පොහෝ දිනෙක රාත්‍රියෙහි බුදු රජාණන් වහන්සේ භික්ෂු සමූහයා පිරිවරා හුන්සේක. ප්‍රථම යාමය ගත වූ කල අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ වැඳ, ප්‍රථම යාමය ඉක්ම ගිය බවත් භික්ෂු සංඝයා බොහෝ වේලා ඉඳගෙන හුන් බවත් කියා, පාමොක් දෙසීමට ආයාචන කළහ. එහෙත් බුදුරජාණන් වහන්සේ තුෂ්ණිම්භූතව හුන් සේක. දෙවෙනි යාමය ගත වූ විටත් අනඳ තෙරණුවෝ එ බව දැන්වූහ. එහෙත් බුදුරජාණන් වහන්සේ තුෂ්ණිම්භූත වැ හුන්සේක. නැවත අන්තිම යාමය ගත වැ අරුණු නැඟී කල්හි ද, අනඳ තෙරණුවෝ පළමු සේ ම දැන්වූහ. තෙවෙනි වර 'ආනන්දය, පිරිස අපිරිසුදු යැ'යි බුදුරජාණන් වහන්සේ වදළ සේක.

එවිටැ කිනම් පුද්ගලයකු සලකා බුදුරජාණන් වහන්සේ මෙසේ වදළ සේක් දැයි නුවණින් බලන මුගලන් තෙරණුවෝ භික්ෂු සමූහයා අතරෙහි හුන් දුශ්ශීල පුද්ගලයකු දුටුහ. දැක උහු වෙත එළැඹ, 'ඇවැත, නැගිටින්න. ශූෂ්මතා භාග්‍යවතුන් වහන්සේ විසින් දක්නා ලද්දෙහි, භික්ෂූන් හා එක්වැ විසීමෙක් යුෂ්මත්හට නැතැ'යි වදළහ. හෙ තෙම නොම නැගිට්ටේ ය. දෙවෙනි තෙවැනි වාරයන්හි ද නැඟිට යන්නට කී නමුත් හේ එය නො තැකී ය. ඉක්බිති මුගලන් තෙරණුවෝ ඔහු අත අල්ලා දෙරින් පිටත යවා දෙර වසා යතුරු ලා භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ එ පවත් දන්වා පාමොක් දෙසීමට ආයාචන කළහ.

'මෞද්ගල්‍යායනය, ආශ්චර්‍ය යි! ඒ පින් මඳ පුද්ගලයා තම අත අල්ලා පිට කරන තුරුත් රැඳුණේ වේ දැ'යි වදරා දම් දෙසන සේක්, මුහුදේ ආශ්චර්‍ය ධර්ම අටක් ඇති තියාත් සස්නෙහිත් එසේ ම ආශ්චර්‍ය ධර්ම අටක් ඇති තියාත් දෙසූ සේක.

**මුහුදේ ආශ්චර්‍ය ධර්ම අට නම්:**

මුහුද ගොඩ පටන් ක්‍රමයෙන් ගැඹුරු වේ. මුහුදට වන් තැන ම ගැඹුරු නොවේ. මුහුද වෙරළ නො ඉක්මවයි. කිසි කුණපයක් මුහුදේ නො රැ දේ. ඒ ගොඩටම පැමිණෑවේ. නානා නම් ඇති නදීහු මුහුදට වන්නෝ, පළමු නම් හැර මුහුද යන එක ම නම ලබත්. වැසි වටත් නො වටත් ඇළ දොළ ගලා ගියත් නො ගියත් මුහුද අඩු වැඩි බවෙක් නො පැනේ. මුහුද ලුණු රසයි . මුහුදේ මුතු මිණි ආදී නානා රත්නයෝ වෙත්. විශාල සත්වයෝ ද වෙත්.

**ශාසනයේ ආශ්චර්‍ය අට :**

ශාසනයෙහිත් ශික්ෂාවත් ක්‍රමයෙන් වැඩිය යුතු යි. ඒ පිළිවෙළින් වඩා මිස නැතහොත් එක පැහැර රහත් විය නො හැකි ය.* සැබෑ බුධ ශ්‍රාවකයා බුධ ප්‍රඥප්ත සික පද දිවි නැසෙතත් නො බිඳියි.

දුශ්ශීල පුද්ගලයා හා සංඝ තෙම එක්වැ නො වසයි. දුශ්ශීලයා සංඝයාගෙන් ඈත් ම වේ. නානා නම් ගොත් ඇත්තෝ සසුන් වන්නෝ පළමු නම් ගොත් හැර ශාක්‍යපුත්‍රිය ශ්‍රමණ යන නම ලබත්. කො පමණ දෙනැ පිරිනිවියත් නිවනේ අඩුවෙක් හෝ වැඩියෙක් නො පැනේ. මේ ශාසනය විමුක්තිය රසය කොට ඇත්තේ ය. මේ ශාසනයේ සත් තිස් බෝධිපාක්ෂික ධර්ම නැමැති රත්නයෝ ඇත. මේ ශාසනයෙහි ශාරිපුත්‍ර මෞද්ගල්‍යායන ආදී මහ ගුණැති පුද්ගලයෝ ඇත්හ.

මෙ සේ මුහුදේ මෙන් ශාසනයේ ආශ්චර්‍ය ධර්ම අටක් ඇතැ ්යි වදළ සේක. ඉක්බිති භික්ෂූන් අමතා,

මහණෙනි, මෙයින් මතු මම් පොහෝ නොකරන්නෙමි. පාමොක් නො උදෙසන්නෙමි. තෙපිම පොහෝ කරවු, පාමොක් ද උදෙසවු ්

යන ආදීන් වදරා ආනාපාතිමොක්ඛය[170] උදෙසීම පැණැවූ සේක.

# සතළිස් වන පරිච්ඡේදය

**ආනන්ද බෝධි රෝපණය**

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවරින් පිටැත් වැ ජන පද චාරිකායෙහි යෙදුණු දිනයෙකැ බොහෝ උපාසක උපාසිකාවෝ සුවඳ මල් ආදිය ගෙන බුධ වන්දනා සඳහා දෙව්රම් වෙහෙරට ආවාහු, භාග්‍යවතුන් වහන්සේ නො දැක ශෝකී වැ, ඒ පූජා භාණ්ඩවලින් පිදිය යුතු තැනක් ද නැත්තෙන්, විහාර

* සමහරු දහම් ඇසූ කෙණෙහි ම රහත් වෙත්. ඔවුන් කෙරෙහි ද ශීල සමාධි ප්‍රඥා තුන මොහොතක් ඇතුළත ක්‍රමයෙන් සම්පූර්ණ වේ.

සමීපයෙහි රැස්කොට තබා ගියාහ. අනේපිඬු සිටු ආදීහු ඒ දුටුවෝ භාග්‍යවතුන් වහන්සේ පිටත වැඩි විට උන්වහන්සේ සිහිකොට පුදනු සඳහා පූජ්‍ය වස්තුවක් ඉල්ලා ගන්නට සිතූහ. භාග්‍යවතුන් වහන්සේ පෙරලා ජේතවනයට වැඩි විට ඔහු රැස් වැ පූජ්‍ය වස්තුවක් ඉල්ලීමෙහි අනඳ තෙරුන් මෙහෙයූහ. අනඳ තෙරණුවෝ ගොස් 'පූජ්‍ය වස්තු කවරේ දැ?'යි විචාරා භාග්‍යවතුන් වහන්සේ වෙනුවට පූජ්‍ය දැයක් ඉල්ලූහ.

**තුන් චෛත්‍යයෝ**

භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් අමතා 'ආනන්දය' **ශාරීරික, උද්දේශික, පාරිභෝගික** යැ යි පූජ්‍ය වස්තූහු තිදෙනෙකි. ඉන් **ශාරීරික ධාතු පූජාව** බුධ පරිනිර්වාණයෙන් පසු ව වන්නේ ය. **උද්දේශික පූජාව** නම් ධර්මයට බුධ ප්‍රතිමාදියට වෙයි. **පාරිභෝගික ධාතු පූජා** නම් පරිභෝග කළ පාත්‍ර චීවරාදියට ද බුධත්වයේ දී පිටදුන් බෝධිවෘක්‍ෂයට ද කැරෙන සත්කාරය යි. එබැවින් ජය ශ්‍රී මහා බෝධියෙන් ඵලයක් ගෙන්වා මේ ජේතවනාරාමයෙහි රෝපිත කරවා සත්කාර කරත් හොත් ඒ මට කළ සත්කාරය හා සම යැයි වදළසේක.

අනඳ තෙරණුවෝ මෙ පවත් කොසොල් රජු ආදීනට දන්වා ඒ වේලායෙහි ම ජේතවන දොරටුව සමීපයෙහි වළක් කණවා, ජයසිරි මහ බෝ රුකින් ඵලයක් ගෙනවුත් දෙන්නට මුගලන් තෙරුන් අයැදූහ. මුගලන් තෙරණුවෝ තමන් එය බෝ රුකින් ගෙනෙන සැටි සියල්ලට පෙනෙන සේ ඉටා එ කෙණෙහි සෘ යෙන් ගොස් **උරුවිල්වායෙහි** වූ ජයශ්‍රීමහාබෝධිවෘක්‍ෂය සමීපයට වැඩ එහි නටුයෙන් ගැළැවී එන ඵලයක් බිම වැටිය නොදී සිවුරු පටින් පිළිගෙන, එකෙණෙහිම ගෙනැවිත් අනඳ තෙරුනට දුන්හ. අනඳ තෙරණුවෝ එය කොසොල් රජුට බාර කළහ. රජ එය රුවන් කරඬුවෙකින් ගෙන හිස මත තබා ගෙන එය හිඳුවීමට කැරුණු වළ තෙවරක් පැදකුණු කොට අනේපිඬු සිටු අතට දුන්නේ ය. සිටුහු ගන රන් තලියෙක සුවඳ කලල් පුරා, තලියේ පතුල සිදුරු කොට වළ මැද තබා එහි බෝ පැළය සිටුවූ හ.

මෙය අනඳ තෙරුන් ගේ නියෝගයෙන් සිටුවන ලද බැවින් ද මහජනයාගේ සිතැ ආනන්දය ඇති කෙරෙමින් වැඩුණු හෙයින් ද **ආනන්ද බෝධි** නම් විය.

දිනෙක භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන්ගේ අයදනින් ඒ බෝරුක මුල රෑ තුන්යම්හි සමාපත්ති සැපයෙන් වැඩ හුන් සේක. මෙසේ ආනන්ද බෝධිය පාරිභෝගික චෛත්‍යයක් විය.

**ජීවකම්බ වනය පිදීම**

භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි අතිශයයෙන් පැහැදුණු රාජ වෛද්‍ය **කෝමාරභච්ච ජීවක තුමා** ස්වකීය අඹ වනයෙන් උන්වහන්සේ පිදුයේ මෙ සමයෙහි ය.

**සුන්දරී පරිව්‍රාජිකාව ගේ දුෂ්ට ක්‍රියා**

භාග්‍යවතුන් වහන්සේට ද භික්ෂු සංඝයාට ද රට වැස්සාගේ මහත් ගෞරවාදර සත්කාර දුටු තීර්ථකයෝ ඉවැසියැ නො හැකිව භාග්‍යවතුන් වහන්සේට අප කීර්තියක් ඇතිකිරීමෙහි **සුන්දරී** නම් රූපශ්‍රීයෙන් යුත් පරිව්‍රාජිකාවක මෙහෙයූහ. ඕ තොම සුදු වස්ත්‍ර හඳිනා පොරෝනා පරිව්‍රාජිකා නිකායකට අයත් තැනැත්තියකි. ඕ මනාව හැඳ පොරවා මල් ගඳ විලවුනෙන් සැරැහී ජේතවනාරාමයෙන් මහජනයා සවස බණ අසා එන වේලාව බලා විහාරය අතට යෙයි. 'කොහි යෙහි දැ?' යි ඔවුන් ඇසූ විට ජේතවනාරාමයට යන බව කියා ගොස් ආරාම ප්‍රාකාරයෙහි දෙරටුව සමීපයෙහි සක්මන්කොට දෙර වැසූවිට නුවරට යයි. නැවත පසු ද උදේම ජේතවනාරාමයට ගොස් ගඳකිළිය සමීපයේ මල් සොයන්නියක මෙන් හැසිරෙයි. බුධෝපස්ථානයට ආ මිනිසුන් 'මෙහි කුමට අවුදැ?' යි විචාළ විට යම් කිසිවක් කියා මඟ හරියි. මෙසේ අඩ මසක් පමණ ගත වූ පසු එක් රැයෙක තීර්ත්ථකයෝ රහසින් ඇය මරවා ජේතවන පොකුණ අද්දර වළැ ලා පාත් වූ කල 'සුන්දරී නැතැ' යි කලබල කළහ. කොසොල් රජුට ද දැන්වූහ. ඔවුන් කැමැති තැනක ඇවිද ඇය සෙවීමට රජ විසින් අවසර දෙන ලදින්, ජේතවනයට වැද ඇය සොයන්නවුන් සේ අඟවා, වළැලූ තැනින් සිරුර ගොඩ ගෙන ඇඳෙක තබා නුවරට ගෙන ගොස්, ශ්‍රමණ ගෞතමයන් හා භික්ෂු සංඝයා විසින් ඕ මරා සඟොවන ලද්දී යැයි චෝදනා කොට ඇවිද්දහ. එද අලුයම බුදු රජාණන් වහන්සේ නුවණින් ලොව බලා වදරන සේක්, එ දින තීර්ථකයන් අපකීර්තියක් උපදවන බව දැන 'ඔවුන් ගේ බොරු චෝදනා පිළිගෙන මහජනයා මා කෙරේ නිකරුණේ කිපී අපායාභිමුඛ නො වේවා' යි ඔවුන් කෙරේ කරුණායෙන් ගඳකිළියේ දොර වසා ඇතුළේ ම උන් සේක. පිඬු පිණිස වත් නො වැඩි සේක. භික්ෂූහු වනාහී පිඬු පිණිස හැසුරුණහ. මිනිස්සු භික්ෂූන් දැක නොයෙක් අයුරින් බැණ වැදුණහ. අනඳ තෙරණුවෝ බුදුරජාණන් වහන්සේට එපවත් සැලකොට, 'ස්වාමීනි, තීර්ථකයන් විසින් මහත් අපකීර්තියක් උපදවන ලදී. මෙහි විසිය නො හේ, ජම්බුද්වීපය විශාල ය. අන් තැනකට යම්හ' යි කීහ. 'ආනන්දය, එහි දී මෙසේ ම අපකීර්තියක් ඇති වූවොත් කොහි යන්නමු දැ?' යි බුදුරජාණන් වහන්සේ ඇසූ සේක. 'වෙන නුවරකට යන්නමු' යි තෙරණුවෝ කීහ. එවිට බුදුරජාණන් වහන්සේ,

'ආනන්දය, ඉක්මන් නො වච, බලාපොරොත්තු වච, මේ නින්ද ගර්හා ඝෝෂය පවත්නේ සතියක් පමණ ය. සමහරු දුෂ්ට සිතැති ව ද, තවත් කෙනෙක් ඇත්තක් ම යැ යි සිතා ද, ආක්‍රෝශ කෙරෙති. තීර්ථකයෝ දුෂ්ට සිතින් බොරුයෙන් දෙස් නඟත්. ඔවුන්ගේ කතා ඇසුවෝ ඒ සැබෑ යැ යි විශ්වාස කොට ගර්හා කෙරෙත්. එ හෙත් බුධ මුනි තෙම නිර්දෝෂ බැවිනුත්, නො කිපෙන බැවිනුත්, ඒ ගර්හා අපහාස නො සලකයි. නො පිළිගනියි. කිසිවක් කෙරෙහි රාගයෙන් රැඳීමකට ද්වේෂයෙන් විෂ්ට බවකට හෝ මෝහයෙන් මුළා බවකට නො පැමිණේ යැ'යි වදළ සේක.

**සියලු තැනදීම තුෂ්ණීම්භූත නො විය යුතු**

මෙ සේ වදරා 'ආනන්දය, මිනිසුන් නින්ද අපහාස කරන විට භික්ෂූහු කුමක් කියද්දැ'යි ඇසූ සේක. 'කිසිවක් නො කියතැ'යි අනඳ තෙරණුවෝ කීහ. එවිටැ 'ආනන්දය, මම් සිල්වතිමි'යි හැම විට ම නිහඬ වැ සිටිය යුතු නො වේ.

'නැති දෙස් නගා බොරු කියන්නා නිරයට යයි. තමා පව් කොට එය නො කෙළෙමි යි කියන්නා ද එසේ ම නිරයට යයි, නිහීන කම් කළ ඔහු දෙදෙනා ම පරලොවැ දී දුක් විඳින්නාහු සම වෙත් යැ'යි ඒ චෝදකයනට මෙසේ පෙරළා චෝදනා කරවු' යි වදළ සේක. භික්ෂූහු ද එසේ ම කළහ. නුවණැති මිනිස්සු ඒ අසා නිශ්ශබ්ද වූහ.

රජ තෙමේ ද රාජ පුරුෂයන් සැම තැන යවා පරීක්ෂා කොට තීර්ථකයන් ගෙන් අල්ලස් ගෙන සුන්දරිය මරා දැමූ ධූර්තයන් අල්ලා ඔවුනට නිග්‍රහ කොට ඔවුන් ගෙන් එ පවත් දැන තීර්ථකයනට ද නින්ද කෙළේ ය. මිනිස්සු ද තීර්ථකයනට දුටු දුටු තැන දී 'භාග්‍යවතුන් වහන්සේට මොහු අපහාස කළහ'යි කියා, ගලින් මුලින් ගැසූහ. එ පවත් අනඳ තෙරණුවෝ බුදුරජාණන් වහන්සේට දැන්වූහ. ඔවුන් කළ අපරාධය ඔවුන් පිට ම පැමිණි බව වදරා, බුදුරජාණන් වහන්සේ ඒ මුල් කොට ගෙන දම් දෙසූ සේක. සතිය ඉක්ම ගිය පසු රජ තෙම මළකුණ ඉවත් කරවා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ වැඳ 'ස්වාමිනි, මෙ වැනි අයසක් ඇති වූ විට මටවත් දැන්විය යුතු නො වන්නේදැ?'යි කීයේ ය. භාග්‍යවතුන් වහන්සේ 'මහරජ, මම සිල්වතෙක, ගුණ සම්පන්නයෙකැ'යි කියා අනුනට දැන්වීම ආර්‍යයනට නො වටී' යැ යි වදළ සේක. ඉක්බිති මෙය ඇරැබැ රජුට දහමක් දෙසූ සේක.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ කොසොල් රටැ සැරි සරා වඩනාසේක් කාලාම නම් ක්‍ෂත්‍රියයන් වසන **කේසපුත්ත** නම් නියම් ගමට වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ වැඩි බව ඇසූ **කාලාම**

ගොත්‍රිකයෝ ඔබ කරා පැමිණියහ. සමහරු වැඳ ද සමහරු තමන් නම අස්වාද සමහරුන් කිසිත් නො කොට නිහඬ ව ද පසෙක ඉඳගත්හ. එසේ හුන් ඔවුන් හැම වෙනුවෙන් එක් කාලාමයෙක් භාග්‍යවතුන් වහන්සේ ට මෙසේ කරුණක් සැලකෙළේ ය. 'වහන්ස මේ **කේසපුත්ත** නිගමයට කලින් කල නානාවිධ මහණබමුණෝ එති. ඔහු එකෙක් අනෙකා කී දැයට විරුඩව කියති. අනෙකා හෙලා දකිති. ඔවුන් ගේ කථා ඇසූ අපට කවුරු ඇත්ත කියද් ද? කාගේ බස පිළිගත යුතු දැ? යි සැක ඇති වෙයි, මෙය කෙසේ විසඳා ගනුමෝ දැ'යි කීහ.

එවිට භාග්‍යවතුන් වහන්සේ වදරන සේක්,

'කාලාමයෙනි, එබඳු එකට එකක් විරුඩ කථා අහන විට ඔබට සැක ඇති වනු සුදුසු ම ය. සැක කටයුතු කරුණෙහි ම ඔබ කාටත් සැක ඇති වී ඇත. කාලාමයෙනි, ළදරු කලැ සිට අසා ඇති පමණින් මේ ඒකාන්ත සත්‍යයෙකැයි නො පිළිගන්න.(කථාවල සැබෑත් ඇතිවිය හැක්ක, බොරුත් තිබිය හැක්ක) පරම්පරාවේ රැක ගෙන තිබුණු පමණිනුත් සත්‍ය ම යැ යි නො පිළි ගන්න (මුතුමිත්තන් පරම්පරාවේ රැක ගෙන ආ දැයෙහිත් හැබෑත් තිබිය හැක්ක), බොරුත් තිබිය හැක්ක. 'මෙන්න මෙහ ම ලු'යි යමක් ආරංචි වූ පමණෙනුත් නිගමනයට නො පැමිණෙන්න (එසේ තියෙන දැයේත් ඇත්තත් නැත්තත් තිබිය හැක්ක). අප ඉගෙන ගත් පොතේ දැක්වෙන දැය හා ගැළැපේ යැ යි කියාත් එපමණින් සත්‍ය යැ යි නො පිළිගන්න (පොතේ ඇති ඇතැම් දැ හරි වන්නටත් හැකි ය. ඇතැම් දැ වැරැදි වන්නටත් හැකි ය). කෙනෙකු තර්ක විතර්ක කොට කී ඔහුගේ සංකල්පය ඇසූ පමණින් නො පිළිගන්න (එහිත් හරි දැත් ඇතිවිය හැක්ක වැරැදි දැත් ඇති වියැ හැක්ක) මේ යුක්තිය අනුව මෙසේ වියැ යුතු යැ යි අනුමානයෙන් බැස ගත් නය ක්‍රමයක් පෙන්වා කී පමණිනුත් නො පිළිගන්න. .(අනුමානයෙන් සිතා ගන්නා දැයෙත් හරිදැ මෙන් ම වැරැදි දැත් ඇති විය හැක්ක). තමන් කල්පනා කරන ආකාරයෙන් එක එක දැ කියන්නහුගේ කථාත් එ පමණින් නො පිළිගන්න (ඇතැම් එවැනි කතා හරි වන්නටත් පිළිවන, ඇතැම් දැ වැරැදි වන්නටත් පිළිවන). කරුණු සිතා ගෙන යන විට තමනට රිසි වූ කරුණක් දැක එය ප්‍රත්‍යක්‍ෂ සත්‍යයක් සේ දැඩිකොට සිතින් ගෙන කියා පාන කථාවත් ඇසූ පමණින් නො පිළිගන්න (එවැන්නෙහි ද හරි දැත් තිබිය හැකි, වැරැ දි දැත් තිබියැ හැකි). පිටතට පැනෙන සැටිය බලා මේ තෙම පිදියැ යුතු ගුණ ඇත්තෙකැ යි සිතා ඔහු කී පමණිනුත් ඒ කී දැ නොපිළිගන්න

(සිල්වත්කම තුබුණු පමණින් ඔහු කියන සියල්ල ම හරි විය නො හැක්ක.) මේ මහණ තෙම අපේ ගුරුවරයා යි සලකා ඔහු කී පමණින් නො පිළිගන්න (මහණහට ද ගුරුනට ද වරදින දෑ කොතෙකුත් ඇත.)

මේ දෑ කුසල් යෑ යි මේ දෑ අකුසල් යෑ යි තම නුවණින් ම සලකා බලා තමන් අත්දැක්මෙන් ම දැන, මේ කුසල් යෑ මේ අකුසල් යෑ, මේ නුවණැත්තන් වැණූ දෑ යෑ මේ නුවණැත්තන් ගැරැහූ දෑ යෑ යි වැටැහුණු කල ඒ අකුසල් අත හරින්න, කුසල් කරන්න. කාලාමයෙනි, ලෝභය තමන් සිතැ ඇති වූ විට එයින් හොඳක් වේ ද නරකක් වේ දැ යි තුමූ ම සිතා බලවූ සිතැ හටගන්නා ලෝභයට වහල් වීම නිසා සතුනුත් මරයි සොරකමුත් කරයි පරදර සේවනයත් කරයි, බොරුත් කියයි, අනුන් ලවාත් ඒ දෑ කරවයි. එයින් ඔවුනට වන්නේ අවැඩක්ම ය.

දෙවෂයෙන් (තරහවෙන්) ඇවිස්සුණු තැනැත්තේ ත් ඒ ප්‍රාණවධාදිය කරයි, මුළාව (මෝඩ බව) ඇතිවූ කල ද එයට වහල් වූයේ ප්‍රාණවධාදී ඒ සියලු වැරැදි කරයි. එයින් අවැඩ ම වෙයි.

ඉතින් කාලාමයෙනි, මේ ලෝභ, දෙවෂ මෝහ යන තුන කුසල් ද අකුසල් ද?

'අකුසල් ය, වහන්ස.'

'ඉතින් කාලාමයෙනි, ළපැටි කල පටන් ඇහූ දෑ ය කියා එපමණින් නො පිළිගන්න යනාදීන් කීයෙත් තුමූ ම සිතා බලා වටහා ගන්නැයි කීවේත් මෙසේ කරුණු තවත් දුරට හිතා බලා ඒවායේ ආදීනව හෝ ආනිසංස හෝ සලකා බලා නිශ්චයයට බසිනු පිණිසය.

කාලාමයෙනි, අලෝභය අදෙවෂය අමෝහය සිතැ ඇති වූවොත් එකී ප්‍රාණ වධාදි නපුරු දෑ නොකරයි.

ඉතින් ඒ කුසල් ද අකුසල් ද වැරැදි දෑ ද, නිවැරැදි දෑද?'

'කුසල් ය, වහන්ස, නිවැරැදි දෑය, වහන්ස,'

'ළපැටි වියේ සිට අසා ඇති පමණින් නො පිළිගන්න යන ආදීන් මා කීයේ මෙසේ තමන් ම සිතා බලා ආදීනව එල විපාක සලකා බලා කුසල් අකුසල් හැඳින අකුසල් අතහැර කුසල් කරන්නට ය.

කාලාමයෙනි, මෙසේ තමා ම සිතා බලා කුසල් අකුසල් හැඳින ගත් ආයර්‍ය ශ්‍රාවකයා ඒ ලෝභ වේෂ මෝහයන් මැඩ, සිහිනුවණින් යුතු ව මෛත්‍රී කරුණා මුදිතා උපෙක්ෂා යන සතර බ්‍රහ්මවිහාර භාවනා වඩනුයේ ලෝ හැම දෙනා කෙරෙහි එකසේ ම පතුරුවයි. එය පළමු

දිසාවට දෙවෙනි දිසාවට තෙවෙනි දිසාවට සතරවන දිසාවට උඩ දිසාවට යට දිසාවට පතුරුවා සිහි නුවණින් යෙදී වෙසෙයි. මෙසේ භාවනා වඩනා ඔහුට හිතට සැනැසිලි සතරෙක් ඇති වෙයි.

පරලොවක් ඇත්නම්, කළ කර්මවලට විපාක ඇත්නම්, මරණින් මතු මට සුගති සැප ලැබේ යැයි සිතට සැනසිල්ලෙක් ඔහුට ඇති වෙයි. මේ පළමු වන සැනැසිල්ල යි.

පරලොව කියා එකක් නැත්නම්, කළ කර්මයට පරලොවදී විපාක ලැබීමක් නැත්නම්, මෙසේ මා ලොභාදියෙන් දුරු වැ මෛත්‍රී භාවනාදියෙන් යුතු ව ඉන්නා බැවින් මෙලොවැ සුවසේ සුවපත් සිතින් වෙසෙමි යි සිතෙයි. මේ දෙවෙනි සැනසිල්ල ය.

වරද කරන්නාට ය දඬුවම් ලැබෙන්නේ. මම් කිසි වරදක් සිතින් හෝ කයින් හෝ වචනයෙන් හෝ නො කරමි, එබැවින් මට කරදරයක් වෙතැ යි බිය ගන්නට කරුණෙක් නැතැ 'යි සිතයි. මේ තුන්වැනි සැනැසිල්ල යැ.

වරදක් නො කරන්නහුට දුක් විපාක නො ලැබෙතොත් ඒ අතින් ද වරදක් නො කරන මට කිසිසේත් දුකක් කරදරයක් ඇති නො වේ යැ'යි හේ සිතයි. මේ සතර වන සැනසිල්ල ය.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක. කාලාමයෝ ද 'එසේ ය වහන්ස, ඔබ වහන්සේ වදළ සේ මැනැ වැ'යි භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනාව පිළිගෙන පැහැද තෙරුවන් සරණ ගොස් තමන්ගේ උපාසක බව වචනයෙන් ද පවසා වැඳ පැදකුණු කොට නික්මියාහ.

**චූල්ලසුභද්‍රා සමාගමය**

අනේපිඬු සිටුහුගේ මිත්‍ර සිටුවරයෙක් **උග්‍ර** නම් නුවරෙක විසී ය. දිනෙක හේ අනේපිඬු සිටු වෙත අවුත් ඔහුගේ දියැණියන් වූ **චූල්ල සුභද්‍රාවන්** තම පුතුට පාවාදීමට කතා කෙළේ ය. උග්‍ර සිටු වනාහි නිර්වස්ත්‍ර නිගන්ඨයන් සරණ ගිය මිසදිටුවෙකි. එබැවින් අනේ පිඬු සිටු භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් තම දියැණියන් උග්‍ර සිටුහුගේ පුතුට පාවාදීම සුදුසුදැ?යි භාග්‍යවතුන් වහන්සේගෙන් ඇසුයේ ය. භාග්‍යවතුන් වහන්සේ අනාගතය බලා ඇය එහි යැමෙන් උග්‍ර සිටු සම්දිටු වන බව දැක 'ඇය එහාට පාවාදීමේ වරදක් නැතැ'යි වදළ සේක.

නොබෝ කලෙකින් **චූල්ලසුභද්‍රා** තොම උග්‍ර සිටුහු ගේ පුතුට විවාහ කොට දෙන ලද්දී ය.

මංගලෝත්සව දිනවලැ උග්‍ර සිටු තෙම සිය යෙහෙළිය ලවා අචේලකයන් වැන්දවීමට උත්සාහ කෙරෙයි. ඕ තොමෝ ලජ්ජායෙන් එ නග්න තීර්ථකයන් දක්නට යැමට පවා නො කැමැති වෙයි.

උග්‍ර සිටු තෙම ඇයට ඇප වශයෙන් එවන ලද ගෘහපතියන් අට දෙනාට මෙ පවත් කීය. ඔහු කාරණය පරීක්ෂා කොට ඇය නිදොස් බව සිටුහට දැන්වූහ. නැවත සිටු තෙම 'මැය මගේ ශ්‍රමණයන් වහන්සේ නිර්ලජ්ජිහු යැ යි නො වඳිති'යි සිය බිරින්දෑට කී ය.

ඕ තොම 'තොප ගේ ශ්‍රමණයෝ වනාහි කෙ බඳු වෙත් දැ'යි චූල්ලසුභද්‍රාව විචාළා ය. එ විට සුභද්‍රා තොම භාග්‍යවතුන් වහන්සේගේත් බුද්ධ ශ්‍රාවකයන්ගේත් ගුණ වණත්නී,

'මගේ ශ්‍රමණයන් වහන්සේ වනාහි සන්හුන් ඉඳුරන් ඇත්තෝ ය. ශාන්ත සිත් ඇත්තෝ ය. උන්වහන්සේ ගේ යෑම් ඊම් සිටීම් ශාන්ත ය. බිමට හෙලූ ඇස් ඇතියෝ ය. ප්‍රමිත වචන ඇතියෝ ය.

උන්වහන්සේ ගේ කාය කර්මය පිරිසිදු ය. වාක් කර්මය නොකිලුටු ය. මනඃකර්මය සුවිශුද්ධ ය.

උන්වහන්සේ ගේ ඇතුළ පිට දෙපස ම මල රහිත ය. සක් මුතු සේ ශුද්ධ ය. ශුද්ධ ගුණ දහමින් පුණි ය. මගේ ශ්‍රමණයන් වහන්සේ ඔ වැන්නෝ ය.

ලෝවැස්සා වනාහි ලාභයෙන් උස්ව නඟී, අලාභයෙන් මිටි ව පහත් වේ. එහෙත් මගේ ශ්‍රමණයන් වහන්සේ ලාභාලාභ දෙක්හිදීම නො වෙනස් ව සිටිති.

යසස් හේතුයෙන් ලෝවැස්සා උන්නත ද අයසින් අවනත ද වේ. මාගේ ශ්‍රමණයන් වහන්සේ වනාහි යස අයස දෙක්හි ම වෙනස් නොවී එකසේ ම සිටිති.

ලෝවැස්සා වනාහි ප්‍රශංසායෙන් උන්නත ද නින්දයෙන් අවනත ද වේ. මා ගේ ශ්‍රමණයන් වහන්සේ වනාහි නින්ද ප්‍රශංසා දෙක්හි ම අචලහ, සමහ.

සුවයෙන් ලොව උන්නත ද දුකින් අවනත ද වේ. මගේ ශ්‍රමණයන් වහන්සේ මෙ දෙක්හි දීම අකම්පිත ව සිටිති. මාගේ ශ්‍රමණයන් වහන්සේ ඔ වැනියහ.'

යන ආදීන් කියා සිය මයිලණුවන් විස්මිත කළා ය. හෙතෙම 'තොප ශ්‍රමණ යන් අපට දැක්විය හැකි දැ?'යි ඇසී ය .'හැකි යැ' ඕ කීවා ය.

'එ සේ නම් දක්වව'යි හේ කී ය.

ඕ ද බුද්ධ ප්‍රමුඛ සඞ්ඝයා පිණිස මහදන් පිළියෙල කරවා පාය මතු මහලට නැඟී දෙවුරම දිශාවට හැරී පසඟ පිහිටුවා වැඳ බුදු ගුණ අවජා, සුව දුම් මලින් පුද, 'වහන්ස, සෙට පිණිස බුද්ධ ප්‍රමුඛ භික්ෂු සඞ්ඝයාට

නිමන්ත්‍රණය කරමි. මේ ලකුණින් එ බව දැන වදරන සේක් වා'යි ඉටා සමන් මල් අට මිටක් අහසට දැමුවා ය. එ මල් ගොස් දෙව්රමැ සිටු පිරිස් මැද දම්දෙසන භාග්‍යවතුන් වහන්සේ මත්තෙහි මල් වියන් වැ දෘශ්‍යමාන වී ය.

ධර්මදේශනාවසානයෙහි අනේපිඬු සිටු තෙම පසු ද දනට භාග්‍යවතුන් වහන්සේට නිමන්ත්‍රණය කෙළේ ය. 'ගෘහපතිය, .සෙට දනට කළ නිමන්ත්‍රණයෙක් ඉවසන ලදැ'යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

'වහන්ස, මට පෙරාතු ව මෙහි කිසිවෙක් නායේ ය. කාගේ නිමන්ත්‍රණයක් ඔබ ඉවසූ සේක් දැ?'යි සිටු විචාළේ ය.

'ගැහැවිය. චූල්ල සුභද්‍රාව විසින් නිමන්ත්‍රිතය මිහැ 'යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

'වහන්ස. චූල්ලසුභද්‍රා මෙයින් එක්සිය විසි යොදුන් පමණ දුර වසන්නී නො වේ දැ?'යි සිටු ඇසී ය. මේ කාරණය මුල්කොට භාග්‍යවතුන් වහන්සේ දම්දෙසන සේක්,

එසේ ය, **'දුර වසතත් සත්පුරුෂයෝ හිමවත් පව්ව සේ බුදුවරයන් ගේ ඥාන පථයට වදින්නෝ ප්‍රකට වෙත්. අසාධුහු වනාහි මෙහි (දකුණු දන මඩල) සමීපයේ හුන්නෝ ද, දැඩි කළුවර රැයෙක විදි ශරයක් සේ නො පැණෙත්'** යැ යි වදාළ සේක. දේශනාවසානයෙහි බොහෝ ජනයෝ ස්‍රෝතආපත්ති ඵලාදියට පැමිණියහ.

පසු ද භාග්‍යවතුන් වහන්සේ පන්සියයක් රහතන් පිරිවරා සක්දෙව් එවූ පන්සියක් කුළුගෙවල්හි නැඟී උග්‍ර පුරයට වැඩි සේක.

උග්‍ර සිටු තෙම මහත් ගෞරවයෙන් බුධ ප්‍රමුඛ භික්ෂු සඞ්ඝයා පිළිගෙන දන් දී යලි නිමන්ත්‍රණය කොට සතියක් මහදන් පැවැත්විය. මෙහි දී භාග්‍යවතුන් වහන්සේ දෙසූ ධර්මය ඇසූ උග්‍ර ආදී බොහෝ ප්‍රාණීනට ධර්මාභිසමය විය.

භාග්‍යවතුන් වහන්සේ සුභද්‍රාවට අනුග්‍රහ පිණිස අනුරුධ තෙරුන් එ පුර රඳවා සැවැත්පුර වැඩි සේක. එතැන් සිට එ පුර වැස්සෝ සස්නෙහි පැහැදුණෝ වූහ.

**අසදෘශ මහා දානය**

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ පන්සියයක් පමණ භික්ෂූන් පිරිවරකොට ගෙන සැරිසරන සේක්, සැවැත් නුවර වැඩ දෙවුරමට පැමිණි සේක. කොසොල් රජ විහාරයට ගොස් භාග්‍යවතුන් වහන්සේට නිමන්ත්‍රණය කොට පසු

ද මහා ආගන්තුක දනයක් දුන්නෝ ය. නුවර වැසියෝ එය දැක පසු දිනයෙහි තුමූ ද මහ දන් පිළියෙල කොට භාග්‍යවතුන් වහන්සේ සහිත භික්ෂු පිරිසට සත්කාර කළහ. එහි 'අපේ දනයත් මහරජ තෙමේ දකීවා'යි කියා පණිවුඩ යැවූහ. රජ ද අවුත් ඒ දැක තමා දුන් දනට වඩා නගරවාසීන් දුන් දන උත්තරීතර බව සලකා එයටත් වඩා උසස් ලෙස පසු ද දන් පැවැත්වීය. එයට පසු නගර වාසීහු රජු ගේ දනටත් වඩා මහත් ලෙස දන් දුන්නෝ ය. මෙසේ රජු ද නගරවාසීහු ද දෙපක්ෂයෙක් වී ඔවුනොවුන් පැරැදවීමට දන් දෙන්නෝ ස වරක් මහදන් පැවැත්වූහ. ස වන වාරයේ දී මෙ නම් දෑ මෙහි නැතැ යි නො කිය හැකි පරිදි සියලු දනෝපකරණයෙන් සම්පූර්ණ කොට රජු ගේ දනයටත් වඩා සිය දහස් ගුණයෙන් මහත් ලෙස නාගරිකයෝ දන් පැවැත්තූහ. එයට වඩා උත්තරීතර ලෙස දන් දිය නොහැකි යැ'යි සිතූ රජ තෙම ලැජ්ජාවටත් කනගාටුවටත් පත් වැ ඇඳෙහි හෙව 'කුමක් කරම් දැ'යි සිත සිතා හුන්නේ ය. **මල්ලිකා** දේවී ඒ දැක තොරතුරු අසා කිසිසේත් නගරවාසීන් විසින් පිළියෙල නො කළැකි සේ දන් දිය යුතු සැටි කියන්නී, පහත සඳහන් පරිදි සැළ කළා ය. 'මහරජ, බුදුරජාණන් වහන්සේටත් උන් වහන්සේ ගේ නිත්‍ය පරිවාර පන්සියයක් දෙනා වහන්සේටත් ඉන්නට දන ශාලායෙහි සල් පුවරු පිට ම අසුන් පිළියෙල කළ මැනව. සෙසු වහන්සේට ඉන් පිටතින් අසුන් පිළියෙල කළ මැනව. ඒ පන්සිය නමට එක එක කුඩය බැගින් සුදු කුඩ පන්සියයක් අල්ලා ගෙන ඉන්නට ඇතුන් පන්සියයක් යෙදුව මැනව. මණ්ඩපය මැද රන් පුවරු අටක් හෝ දහයක් කරවාලුව මැනව. භික්ෂූන් වහන්සේ දෙදෙනෙකුන් අතරෙහි එක එක රජ කුමරියක බැගින් ඉඳ සුවඳ ඇඹරිය යුතු ය. සෙසු කුමරියක විසින් ඒ අඹරු සුවඳ ගෙන මඬුව මැද රන් පුවරුවලැ ලැ යුතු ය. ඔවුනතුරෙන් සමහර කුමරියන් විසින් නිල් මානෙල් මල් මිටිය බැගින් ගෙන රන් පෝරුවලැ ලූ සුවඳෙහි ගල ගලා සුවඳ ගැන්විය යුතු ය. එක එක කුමරිය භික්ෂූන් දෙනමකට විජිනිපතින් පවන් සලමින් සිටිය යුතු ය. මේ සියලු දැ සම්පූර්ණ කරන්නට ඔබ මිස නුවර වැස්සන් විසින් නො හැකි ය. මෙසේ කොට මහ දන් පිළියෙල කළ මැනව. එවිට නුවර වැස්සෝ පරදිති'යි කීවා ය.

බිසව කී බස් ඇසූ රජ සතුටු වැ එසේම සියල්ල පිළියෙල කැරවී ය. ඉක්බිති බුඩ ප්‍රමුඛ මහා සඞ්ඝයා වහන්සේ එහි වැඩම කරවා දන් වළඳවා භාග්‍යවතුන් වහන්සේ වැඳ 'ස්වාමීනි, මේ දන් හලෙහි ඇති බඩු සියල්ල ඔබ ට ම දෙමි'යි කීය. මේ එකම දවසෙහි දුන් මහදන් සඳහා

තුදුස් කෝටියක් ධනය වියදම් විය. භාග්‍යවතුන් වහන්සේට පිළියෙල කළ සුදු කුඩය ද, පුටුව ද පාත්‍රය තිබූ වළල්ල ද, පාපුටුව ද යන සතරේ අගය පමණ කළ හැකි නො වන තරම් ය. සතියක් ම රජ මෙසේ දන් පැවැත්වී ය. අන් කිසිවකු විසින් දිය නො හැකි තරම් වූ මේ මහ දනය **අසදෘශ** දන නමින් ප්‍රසිධ වී ය. ඉක්බිති එ පරිදිම අනේපිඬු සිටු තෙමේත් තුන් දිනක් දන් දුන්නේ ය. විශාඛා උපාසිකාව ද එසේම තෙ දිනක් දන් පැවැත්තුවා ය. මෙසේ පැවතුණ මේ අසදෘශ දනයේ තොරතුරු සියලු දඹදිවැ පතළ වී ය.

මෙයින් මහජනයා අතර,

**දන විපාක**

'මහත් ධනය වියදම් කළ පමණින් ම දන එල මහත් වන්නේ ද? නැත හොත් තමාට හැකි පමණින් දීමෙන් ම එල මහත් වන්නේ දැ?'යි කථාවෙක් ඇති විය. භික්‍ෂූහු ඒ කථාව අසා භාග්‍යවතුන් වහන්සේට දැන්වූහ.

**"මහණෙනි, දන වස්තුව මහත් වූ පමණින් දනය මහත් එල නො වේ. හිත පැහැදීමෙනුත් දන් ලබනා පුද්ගලයන්ගේ ගුණ මහත්වයෙනුත් මහත් එල ඇති වන්නේ ය. එබැවින් කුඩු මිටක්, රෙදි කඩක්, තණ හෝ කොළ ඇතිරියක්, ගෝමූත්‍ර අරළු කඩක් පමණ වුවද පිරිසිදු සිතින් දක්ෂිණාර්හ පුද්ගලයනට දෙන ලද්දේ නම් එය මහත් එල මහත් අනුසස් වන්නේ යැ"**යි වදළ සේක.

**දන් පැවැත්වීම**

ඒ කථාව රටේ පැතිරිණ. මිනිස්සු තම තමන් ගේ වත් පෝසත් කමේ හැටියට මහණ බමුණු දුගී මැගී යදියනට විශේෂයෙන් දන් දීම පටන් ගත්හ. තම තමන්ගේ ගෙ මිදුල් හි සැළිවලැ පැන් පුරවා යන එන්නන්ගේ ප්‍රයෝජනය පිණිස තැබ වූහ. එසේම දුගී මැගී යාචකාදීන් ගේ පහසුව සලකා දෙරටුවලැ අසුන් පණවා තැබූහ.

# එක්සාළිස් වන පරිච්ඡේදය

**දෙව්දත් තෙරණුවෝ**

භාග්‍යවතුන් වහන්සේ **මල්ල** රට මල්ල රජුන් ගේ **අනුපිය නම් නිගමය** සමීපයෙහි වූ අඹ වනයට වැඩ එහි වසන සමයෙක **භද්දිය, අනුරුධ, ආනන්ද, භගු, කිම්බිල, දේවදත්ත** යන ශාක්‍ය කුමරුහු සදෙනාද **උපාලි** නම් කපුවා ද එහි අවුත් පැවිදි වූහ. ඔවුන්ගෙන් ආයුෂ්මත් **ආනන්දයන් වහන්සේ** පුණ්ණ මන්තානිපුත්ත තෙරුන්ගෙන් බණ අසා සෝවාන් වූ සේක. **භගු, කිම්බිල** යන දෙනම පසු කාලයෙහි විදසුන් වඩා රහත් වූහ. **දේවදත්ත** තෙරණුවෝ ධ්‍යාන වඩා ලෞකික සෘ ය ලැබූහ.

පසු කලෙක කොසඹෑ නුවර වසන සමයෙහි ශ්‍රාවක සංඝයා සහිත වූ තථාගතයන් වහන්සේට මහත් ලාභසත්කාර ඇති විය. මහජනයා වස්ත්‍ර බෙහෙත් ආදිය ගෙන විහාරයට ගොස් ශාස්තෲන්වහන්සේ කොහි ද? ශාරිපුත්‍රයන් වහන්සේ කොහි ද? මහාමෞද්ගල්‍යානයන් වහන්සේ කොහි ද? යන ආදීන් භාග්‍යවතුන් වහන්සේත් අසූ මහ සව්වන් වහන්සේත් වසන තැන් සොය සොයා යයි. දෙව්දත් තෙරුන් අසා බලන කිසිවෙක් නැති. දෙව්දත් තෙරණුවෝ සිතන්නෝ "මමත් මොවුන් සමග ම පැවිදි වූයෙකිමි. මොහුත් රාජවංශයෙන් නික්ම පැවිදි වූවෝ ය. මමත් එසේ ම ය. ලාභ සත්කාර ගෙන එන මිනිස්සු මොවුන් ම සොයති. මගේ නම කියන කෙනෙක් නැත. කවුරුන් හා එක්ව කවුරුන් පහදවා ගෙන මම ලාභ සත්කාර නිපදවා ගන්නෙම් දැ?"යි සිතී ය. "මේ බිම්සර රජ බුදුරජාණන් වහන්සේ දුටු මුල් වතාවේ දී ම සෝවාන් වූවෙකි. එ බැවින් මොහු හා එකතු විය නො හැකි. කෙසොල් රජු හා ද එක් වීම හැකි නො වේ. මේ බිම්සර රජු පුත් අජාතශත්‍රු කුමාරයා නම් කිසිවකු ගේ ගුණ දොස් නො දනී. මොහු හා එක් වන්නෙමි" යැයි දෙව්දත් තෙරණුවෝ ඉටා ගත්හ. ඉක්බිති කොසඹෑ නුවරින් රජගහ පුර ගොස් ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍යයෙකින් අජාසත් *කුමරුන් තමන් කෙරේ පහදවා ගත්හ.

දෙව්දත් කෙරේ පැහැදුණු අජාතශත්‍රු කුමාර තෙම මහත් ධන වියදමින් ගයා ශීර්ෂයෙහි ආරාමයක් කරවා දුන්නේ ය. එහි ලාභ සත්කාර උපදවාගෙන වසන හෙතෙම දිනක් ජේතවනාරාමයට අවුත් භාග්‍යවතුන් වහන්සේ රජු සහිත පිරිසට බණ වදරන වේලෙහි එහි පැමිණ වැඳ භික්ෂු සංඝයා පාලනය කිරීම තමාට පවරන ලෙස අයැද සිටියේ ය. භාග්‍යවතුන් වහන්සේ අකැප ජීවිකාවෙන් දිවි පවත්වන ඔහුට එහි නින්දිත බව දක්වා ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ සේක. එයින් නො සතුටු වූ දෙව්දත් තෙර භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙසේ පළමු වන නො සතුට ඇති කැර ගත්තේ ය.

**දෙව්දත් බිම්සර රජ මරවන්නට තැත්කිරීම**

දිනක් දෙව්දත් තෙර අජාතශත්‍රු කුමරු වෙත එළැඹ ඔහු අමතා, "කුමාරය, පෙර මිනිස්සු දීර්ඝායුෂ ඇත්තෝ ය. දැන් අය වනාහි අල්පායුෂ්කහ. කුමාර වැ ම හිඳ, රජකම් කරන්නට නො ලැබ, ඔබ ගේ මරණය වන්නටත් පිළිවන. එබැවින් ඔබ පියා මරා රජවන්න, මම

* මෙ සමයෙහි අජාසත් කුමරු සොළසැවිරිදි වයස් ඇත්තේ යුව රජකම ලැබ සිටියේ ය.

බුදුන් නසා බුදුවන්නෙමි'යි කීය. දෙව්දතු ගේ වචනය පිළිගත් කුමර දිනක් දහවල් කිරිච්චියක් ඉනේ සඟවා ගෙන පිය රජු මරන අදහසින් ගියේ, තැති ගැනුම් සහිත ව සැක ඇති ව හදිසියෙන් අන්තඃපුරයට වැදිණ. අන්තඃපුර ඇමැතියෝ බියෙන් තැති ගැනුම් සහිත ව එන ඔහු දැක සැකකොට අල්ලා පරීක්ෂා කළහ. එ විට ඔහු ඉනේ සඟවා ගෙන තුබුණු කිරිච්චිය දැක. 'කුමක් කරනු කැමැත්තෙහි දැ'යි විචාළහ. 'පියා නසනු කැමැත්තෙමි යැ'යි හෙතෙම කීය. 'කාගේ අනුබලයෙන් දැ'යි ඇසූ කලැ 'දෙව්දත් තෙරුන් කී බැවින් යැ'යි කීයෙන් 'කුමාරයා ද දෙව්දත් තෙර ද තදනුවර සියලු භික්ෂූන් ද මැරිය යුතු යැ'යි සමහර මහාමාත්‍යයෝ කීහු. සමහර ඇමැතියෝ 'දෙව්දත් අජාසත් යන දෙදෙනා පමණක් මැරිය යුතුය'යි කීහු. සමහරු 'එ කිසිවක් නො කොට රජුට කාරණය දන්වා රජු කියන දැයක් කළ යුතු යැ'යි කීහු. සියල්ලෝ එයට ඒකමතික ව කුමරු ගෙන රජු කරා එළැඹ කාරණය දැන්වූහ. 'කුමට මා මරන්නට සිතුවෙහි දැ?'යි රජ තෙම කුමරහු විචාළේ ය. 'රජකම ලබා ගන්නට යැ'යි කුමරු කීය. 'පුත, රජකම ඕනෑ නම් මෙන්න රාජ්‍යය! බාර ගනුව'යි කියා බිම්සර රජ තම පුතු සිඹ සනසා ඔහුට රාජ්‍යය පැවරී ය.

අජාසත් තෙම දෙව්දත් තෙරට තමා රාජ්‍ය ලත් බව කී ය. දෙව්දත් ඒ අසා නො සතුටු ව 'කිහිප දිනෙකින් තොප පියා තොපගේ රාජ්‍යය පැහැර ගනිතැ'යි අජාසත් කුමරු කළඹා, රජහු මරා ලීමෙහි ඔහු මෙහෙයී ය. 'ආයුධයෙන් සිය පියා මැරිය නොහැකි යැ'යි අජාසත් කී විට 'ආහාර නොදී මරව'යි දෙව්දත් කී ය.

අජාතශත්‍රු රජ තෙම පිය රජාණන් සිරගෙයි ලා මෑණියන් මිස අන් කිසිවකුට එහි යෑ නොදී රකවල් ලැවූයේ ය. එද පටන් එ බිසෝ රජ දක්නට යන්නී බත් පුරා ලූ රන් තැටියක් හිණ ගන්නා ගෙන ගොස් දෙයි. රජ්ජුරුවෝ ඒ භෝජනයෙන් ජීවත් වෙති. අජාසත් රජ එපවත් අසා මෑණියනට කිසිවක් හිණින් ගෙන යෑමට ඉඩ නො දෙවු යැ'යි රකවලෙහි හුන් පුරුෂයනට අණ කෙළේ ය.

එ තන් පටන් බිසෝ බඳුනෙකින් ආහාර ගෙන යෑ නො හැක්කෙන් බොජුන් ටිකක් මුහුලස තුළ ලා ගෙන ගොස් රජ්ජුරුවනට දෙති. අජාසත් රජ එ පවත් අසා මවට මුහුලස බැඳ ගෙන යෑමට අවසර නැති කෙළේ ය.

ඉන් පසු බිසෝ රන් මිරිවැඩියෙහි අග්‍ර භෝජන සකස් කොට පියතින් වසා එ පය ලා ගොස් රජ්ජුරුවන් කවා එන්නී ය. අජාසත් එ පවත් ද අසා මිරිවැඩි ලා එහි යෑමට මෑණියනට ඉඩ නො තැබුයේ ය. එයින්

පසු ඒ දේවි අන් උපායක් නො දැක සුවඳ පැනින් නා සිරුරැ චතුමධුර ගල්වා උතුරු සළුවක් පොරොවා රජ්ජුරුවන් දකින්නට යන්නී ය. රජ්ජුරුවෝ ද ඇඟ ලෙවැ ජීවත් වෙති. අජාසත් ඒ දැන ගෙන මෑණියනට රජ්ජුරුවන් දක්නට යෑම මුළුමනින් ම තහනම් කෙළේ ය.

බිසෝ සිර ගෙය දොර වෙත ගොස් යන්නට අවසර නො ලැබ රජ්ජුරුවනට ඒ පවත් කියා අඬා වැලැප පෙරළා ආවා ය.

**බිම්සර රජුගේ මරණය භාග්‍යවතුන් වහන්සේ ගේ බුද්ධත්වයෙන් සත්තිස් වන වර්ෂයෙහි**

එ තැන් සිට රජ්ජුරුවෝ කිසි ආහාරයක් නො ලත්හ. එහෙත් සක්මන් කරමින් මාර්ගඵල සුඛයෙන් කල් යවති. අජාසත් රජ තෙම පියා තවමත් සක්මනින් ජීවත් වන බව අසා සක්මන් කරනු නො දෙනු පිණිස කරනැවැමියකු ලවා පිය රජහු පතුල් කරයෙන් පළවා ලුණු ඇඹුල් හා තෙල් ගල්ලවා ගිනි අඟුරෙන් පැසැවැවී ය. මෙයින් දැඩි දුක් වේදනා ඇති වුවත් රජ්ජුරුවෝ එ සියල්ල ඉවසා තෙරුවන් ගුණ සිහි කරමින් හිඳ නොබෝ වේලායෙන් මිය ගොස් චාතුර් මහාරාජික දෙවු ලොවැ **ජනවසභ** නම් දිව්‍ය රාජව උපන්හ. නො බෝ කලෙකින් රජ බිසවු ද ස්වාමියා මළ ශෝකයෙන් කළුරිය කළාය.

**ස්වාමිදරුවාණන් නසන්නට දෙව්දතු ගේ උත්සාහය**

බිම්සර රජු ගේ මරණය වූයේ භාග්‍යවතුන් වහන්සේට වයස දෙ සැත්තෑයෙහි දී ය. භාග්‍යවතුන් වහන්සේ ගේ අග්‍ර උපාසක වූ බිම්සර රජ මරවා සිය මනෝරථය සිදු කැර ගත් දෙව්දත් තෙම 'දැන් බුදුන් මරා බුධ රාජ්‍යය ගන්නෙමි'යි සිතී ය. සිතා රජු වෙත ගොස් සිය අදහස දැන්වී ය. රජ ද එයට කැමැතිව දෙව්දත් තෙරුන් කියන්නක් කරන්නට මිනිස්නට අණ කෙළේ ය.

ඉක්බිති දෙව්දත් තෙම මිනිසකු කැඳවා 'අසුවල් තැන ශ්‍රමණ ගෞතමයෝ වසති. ඔවුන් මරා මේ මාර්ගයෙන් එව'යි කියා දුනුවායකු යැවී ය. තවත් පුරුෂයකු ඒ මාර්ගයේ නවත්වා 'යමෙක් තනි ව මෙ මගින් ඒ නම් ඔහු මරා මෙ මගින් එවු යැ 'යි යට කී පුරුෂයා එන මඟ දෙදෙනෙකුන් නැවැත්වී ය. ඔවුන් දෙදෙනා මැරීමට ඒ මඟ අන් තැනෙක සතර දෙනෙකුන් ද, ඔවුනට පාරක් පෙන්වා ඒ මාර්ගයෙහි එන සතර දෙනා මරන්නට අට දෙනෙකුන් ද ඔවුන් එන මාර්ගය නියම කොට එහි ඔවුන් මැරීමට සොළොස් දෙනකුන් ද නැවැත්වී ය. මෙසේ බුදුරජාණන් වහන්සේ නැසීමට ගිය පුරුෂයාත් අණකළ තැනැත්තාත් දැන ගත නො හැකි වනු පිණිස මෙ උපාය දෙව්දත් යෙදී ය.

භාග්‍යවතුන් වහන්සේ නැසීමට අණ ලත් පුරුෂ තෙම දුනු ආදියෙන් සැරසී නික්මුණේ, උන් වහන්සේ දැක තැති ගැනීම් සහිත වැ බිය වැ සැක ඇති වැ තද වූ ශරීරය ඇති වැ නොදුරු තැනෙක සිටියේ ය. සාමිදරුවන් වහන්සේ ඔහු දැක කථා කොට 'භවත මෙහි එන්න. බිය නො ගන්නැ'යි වදළසේක. හෙ තෙම ඒ අසා ආයුධ පැත්තෙක දමා භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ වැඳ පසෙක හිඳ තමා කරන්නට ආ අපරාධය දන්වා භාග්‍යවතුන් වහන්සේ ගෙන් ක්ෂමාව ඉල්ලූයේ ය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට වරද වරද ලෙස පිළිගැනීමේ සුදුසු බව වදරා දන කථාදී පිළිවෙළ කථායෙන් බණ දෙසා චතුස්සත්‍යය ප්‍රකාශ කළ සේක. හෙතෙම බණ අසා සෝවාන් වූයේ ය. ඉන්පසු සාමිදරුවන් වහන්සේ ඔහු යන්නට අදහස් කළ මාර්ගයෙන් යා නොදී අන් මඟෙකින් යැවූ සේක. ඒ පුරුෂයා ගේ පැමිනීම බලා මහ රැක උන් දෙදෙන ඔහු නො එනු දැක 'මෙ තෙක් පමා මන්දැ'යි සිතා ඔහු හමු වන අටියෙන් මාර්ගයේ ඉදිරියට ගියහ. එ සේ ගිය ඔහු රුකක් මුල හුන් බුදුරජාණන් වහන්සේ දැක වෙත පැමිණ වැඳ පසෙක උන්හ. ඔවුනට ද පළමු පුරුෂයාට මෙන් ම බණ වදළ සේක. දේශනාවසානයේ දී ඔහු සෝවාන් වූහ. ඔවුන් ද යන්නට සිතූ මහ හැර අන් මඟෙකින් යැවූ සේක. ඒ දෙදෙනා එනතුරු මහ රැක උන් සිවු දෙන ද ඔවුන් පමා වන හෙයින් මාර්ගයේ ඉදිරියට ගියෝ, රුකක් මුල හුන් බුදුරජාණන් වහන්සේ දැක ගොස් පසෙක හුන්හ. ඔවුනට ද පළමු පුරුෂයනට මෙන් ම බණ වදළ සේක. ඔහු ද සෝවාන් වූහ. ඔවුන් ද බුදුරජාණන් වහන්සේ අන් මඟෙකින් යැවූ සේක. මේ පරිද්දෙන්ම මග රැක උන් ඉතිරි අට දෙනා ද ඔවුන් මැරීමට බලා උන් සොළොසදැ'යි යන මේ සියල්ල ම තමන් වහන්සේ වෙත එන්නට සලස්වා දහම් දෙසා හික්මවා යැවූ සේක.

**සාමි දරුවන් මත්තට ගලක් පෙරළීම**

යටැ කී පළමු පුරුෂයා දෙව්දතු කරා ගොස් 'ස්වාමීනී, ඒ භාග්‍යවතුන් වහන්සේ මහානුභාව ඇත්තෝ ය. මහර්ඩිමත්හ. නැසිය නො හැකියැ'යි කී ය. එවිට 'මම ම ශ්‍රමණ ගෞතමයන් නසන්නෙමි'යි හෙතෙම ඉටා ගත්තේ ය. එසේ සිතා දිනෙක ගිජ්ඣකූළ පව්වේ පාමුල භාග්‍යවතුන් වහන්සේ සක්මන් කරන අතර ඒ කන්ද නැග යන්ත්‍රයෙක මගින් මහත් ගලක් භාග්‍යවතුන් වහන්සේ දෙසට පෙරළා හැරියේ ය. මතු වූ අන් විශාල ගල් දෙකක රැඳී එ ගල යෑ නො හී නැවැතිණ. එහෙත් ඒ ගල්

එකට එක වැදීමේ දී පතුරක් කැඩී ගොස් භාග්‍යවතුන් වහන්සේ ගේ පිටි පතුලේ අගැ හැපී එ තත් හී ලේ පිරුයේ ය. බුදුරජාණන් වහන්සේ උඩ බලා දෙව්දත් හට 'අභාග්‍ය පුරුෂය, තෝ දුෂ්ට සිතින් තථාගතයන්ගේ ඇඟැ ලේ සැලීමෙන් බොහෝ පව් කෙළෙහි' යැ යි වදළ සේක. ඉක්බිති භික්ෂූනට ආමන්ත්‍රණය කොට මෙසේ දෙව්දත්හු ලෝහිතුප්පාදය කිරීමෙන් පළමු වන ආනන්තර්‍ය්‍ය පාප කර්මය කැර ගත් බව වදළ සේක. මේ කාරණය මුල් ව භික්ෂූන් අතර බොහෝ කථා ඇති විය. ඒ තන්හි දී භාග්‍යවතුන් වහන්සේ අවස්ථානුරූප වූ ධර්මදේශනායෙන් භික්ෂූනට අවවාද කළ සේක.

**ධනපාල සමාගමය**

ඒ කාලයෙහි රජගහ පුර **නාලාගිරි** (ධනපාල) නම් ඇතෙක් චණ්ඩ වූයේ මිනිසුන් මරයි. දෙව්දත් තෙම ඇත් හලට ගොස් ඇත් ගොව්වන් ගේ සිත් ගෙන භාග්‍යවතුන් වහන්සේ ඒ වීථියට වැඩි විට ඌ ලිහා උන් වහන්සේ ඉදිරියට යවන ලෙස නියෝග කෙළේ ය. ඔහු ද එය පිළිගත්හ.

දිනෙක බුදුරජාණන් වහන්සේ උදේ වරුවෙහි භික්ෂූන් හා පිඬු පිණිස රජගහපුර පිවිස ඒ වීථියෙන් වඩනාසේක. ඇත්ගොව්වෝ උන් වහන්සේ දැක නාලාගිරි ඇතු ලිහා ඉදිරියට යැවූහ. ඈත වඩනා සාමිදරුවන් දුටු ඇත් තෙම සොඬය ඔසොවා කෝපයෙන් උන් වහන්සේ දෙසට දිව්වේ ය. භික්ෂූහු ඒ දැක ඉවත් ව වඩනා ලෙස තුන් වරක් ම බුදුරජාණන් වහන්සේට දැන්වූහ. එ විටැ භාග්‍යවතුන් වහන්සේ බුදුවරයකු ගේ දිවි නැසීම අනිකකු විසින් නොකළ හැකි බව පවසා, 'මහණෙනි, එවූ බිය නො වවු' යැ යි වදරා භික්ෂූන් හා ඉදිරියට ම වැඩි සේක. මිනිස්සු කුපිත ව දුවන ඇතු දැක කලබල වී ප්‍රාසාදවලට නැග 'අහෝ විශිෂ්ට රූපශ්‍රීයෙන් යුත් මේ මහා ශ්‍රමණයන් වහන්සේට ඇතු පීඩා කරතැ!'යි කියමින් බියෙන් ද, බුඩ භක්තිකයෝ වනාහි 'පින්වත්නි, හස්ති නාගයකුත් මනුෂ්‍ය නාගයකුත් අතර බොහෝ කලෙකින් යුධයක් වන සැටි'! යැයි කියමින් භාග්‍යවතුන් වහන්සේ ඇතු මැඩ පවත්වන සැටිය දක්නට ද මහත් නො ඉවසිල්ලෙන් බලා සිටියහ. භාග්‍යවතුන් වහන්සේ ද ඇතු කෙරෙවූ මෛත්‍රිය පැතිරැවූ සේක. උන්වහන්සේ ගේ මෛත්‍රී බලයෙන් වශීකෘත හී ඇත් තෙම සොඬය අකුලා ගෙන වෙත පැමිණ ඉදිරියෙන් සිටියේ ය. එ විටැ භාග්‍යවතුන් වහන්සේ ඇතු ගේ කුම්භස්තලයෙහි අත තබා,

"මා කුංජර නාගමාසදෙ
දුක්ඛං හි කුංජර නාගමාසදෙ
න හි නාගහතස්ස කුංජර
සුගති හොති ඉතොපරං යතො

මා ච මදෙ මා ච පාම දෙ
න හී පමත්තා සුගතිං වජන්ති
තෙන ත්වඤ්ඤෙව තථා කරිස්සසි
යෙන ත්වං සුගතිං ගමිස්සසී"යි* වදළ සේක.

ඒ කෙණෙහි ඇත් තෙම භාග්‍යවතුන් වහන්සේ ගේ පාමුල වැටී දූවිලි සොඬින් ගෙන තම හිස් මුදුනෙහි විසුරුවා ගෙන උන් වහන්සේ පෙනෙන තෙක් මානයේ පසු පස්සෙන් ගොස් ආපසු හැරී ඇත් හලට ම ගියේ ය. නාලාගිරි හස්ති තෙම එ තන් පටන් හික්මුණේ ම විය. මේ දෙව්දතු භාග්‍යවතුන් වහන්සේ මරන්නට කැරැ වූ උපායෙකැ යි නුවරු දැනගත්හ.

ඔහු 'මේ තරම් මහර්ඩිමත් මහානුභාව සම්පන්න ශ්‍රමණ ගෞතමයන් නසන්නට තැත් කරන මේ දේවදත්ත ස්ථවිර කොතරම් පාපයෙක් ද! කාලකණ්ණියෙක් දැ!'යි කියමින් දෙව්දත් තෙරුනට බැණ වදින්නට වූහ.

ඇමැතියෝ ගොස් අජාතශත්‍රු රජුට දෙව්දතු ගේ දෝෂ දක්වා කරුණු කියා ලජ්ජාවට පත් කළහ. රජ තමා කළ මෝඩකම් සලකා ලජ්ජාවට පැමිණ දෙව්දතු කෙරේ කළකිරී ඔහුට ඒ තාක් තමාගෙන් දින පතා දෙන බත් වසුන් කත් පත්සීය ද නැවැත්තුයේ ය. එ තැන් පටන් දෙව්දත් ලාභයෙන් යශසින් පිරිහී ගියේ ය. එ හෙයින් හේ සිය පිරිස හා කුලයන් කරා ගොස් ඉල්වා ලත් ප්‍රත්‍යයයෙන් යැපුණේ ය. නො බෝ දිනෙකින් ඔහු ගේ ශ්‍රාවක පිරිස ද ඔහු හැර ගියහ. පිඩු සිඟීමට නුවරවත් කලැ මිනිස්සු ඔහු දැක, 'තවත් මෙ පුර ඉඳ බත් කවුදැ?'යි කියා ගල් ගසා පාත්‍රය බිඳ නුවරින් පලවාපූහ.

---

* මෙහි තේරුම :- හස්තිය, බුඩ නැමැති ඇත් රජහු පෙළන්නාට මතු යම් හෙයකින් සුගතියෙක් නො වන්නේ ද එ හෙයින් වධක සිතින් බුඩ නාගයා කරා නො එළඹෙව. බුඩ නැමැති හස්ති රාජයා වෙත ඒ සේ වධක චිත්තයෙන් පැමිණීම මතු දුක් විපාක ලැබීමට හේතු වේ. මත් නො වව. පමා නො වව. පමා වූවෝ සුගතියට නො යෙත්. එ බැවින් සුගතියට යා හැකි සෙයක් තෝ ම කරව.'

**සංඝ භෙදය** දෙව්දත් යනෙන අතක් නැත්තේ 'මට බුදුරජුහු මිස වෙන පිළිසරණෙක් නැතැ'යි සලකා භාග්‍යවතුන් වහන්සේ කරාම ගොස් වීසී ය.

එසේ වෙසෙමිනුත් ස්වභාවයෙන් මැ දුෂ්ට වූ හෙ තෙම 'පිරිස් බලය ලබමි'යි සිතා සංඝ භෙදය කරන අදහස් ඇත්තේ, සිය සවු වූ **කෝකාලික, කටමෝරක තිස්ස. සමුද්දදත්ත** යන භික්ෂූන් ද **ථුල්ලනන්ද** මෙහෙණිය ද හා සාකච්ඡා කොට භාග්‍යවතුන් වහන්සේ නො පණවතැ' යි තමා සැලකූ වස්තු පසක් ඉල්ලන්නට ඉටා ගත්තේ ය.

ඒ වස්තු පස නම්:

'ජීවිතාන්තය තෙක් භික්ෂූන් ආරණ්‍යක ම විය යුතු යි.

ජීවිතාන්තය තෙක් භික්ෂූන් පිණ්ඩපාතික ම විය යුතු යි.

ජීවිතාන්තය තෙක් භික්ෂූන් පාංශුකූලික ම විය යුතු යි.

ජීවිතාන්තය තෙක් භික්ෂූන් වෘක්ෂමූලික ම විය යුතු යි.

ජීවිතාන්තය තෙක් භික්ෂූන් මත්ස්‍ය මාංශයෙන් මුළුමනින් ම වැළකිය යුතු යි' යන මොහු යි.

එක් දිනෙක දෙව්දත් භාග්‍යවතුන් වහන්සේ කරා ගොස් මෙ කී වස්තු පස පණවා වදරන සේ ඉල්ලීමක් කෙළේ ය. එ විටැ භාග්‍යවතුන් වහන්සේ කැමැති කෙනෙක් ඒ ආරණ්‍යක වීම් ආදිය කෙරෙත්වා 'යි ද 'නො කැමැති කෙනෙකුන් ඒ නො කළාට වරදෙක් නැතැ'යි ද වදරා දෙව්දත් තෙරුන්ගේ ඉල්ලීම් ප්‍රතික්ෂිප්ත කළ සේක.

තමා අදහස් කළ සංඝ භේදයට මහ පැදුණ බව සැලකූ දෙව්දත් තෙම මහත් සතුටට පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට සිය පිරිස හා පිටත් වැ ගියේ, රජගහ පුර පිවිස තමන් වස්තු පසක් පණවන ලෙස ඉල්ලූ නමුත් බුදුරජාණන් වහන්සේ එය නො පිළිගත් බවත් නමුත් තමන් ඒ සමාදන් ව වසන බවත් කියා ඇවිද්දේ ය.

ඒ ඇසූ අනුවණ මිනිස්සු 'මේ ශ්‍රමණවරු හැල්ලු පැවතුම් ඇත්තෝ ය. ශ්‍රමණ ගෞතමයෝ සැප සේ කල් යවන්නෝ ය' යන ආදීන් කියා දෙව්දතුට ප්‍රශංසා කළහ. ඒ කථාව භික්ෂූහු අසා භාග්‍යවතුන් වහන්සේට දැන්වූහ. බුදුරජාණන් වහන්සේ දෙව්දතු කැඳවා 'සංඝ භෙදය කරන්නට තැත් කරන බව සැබෑ දැ?' යි ඇසූ සේක. 'සැබෑව, වහන්සැ'යි හේ කීය. එ විටැ කල්පයක් නිරයෙහි පැසෙන බලවත් අකුශලයක් බව වදරා එ බන්දක් නො කරන ලෙස අවවාද කළ සේක.

ඉන් නික්ම ගිය දෙව්දත් තෙම රජගහ පුර පිඩු පිණිස හැසිරෙන අනඳ තෙරුන් දැක සමීපයට ගොස් 'ඇවැත් ආනන්දය, අද පටන් භාග්‍යවතුන් වහන්සේ ගෙන් වෙන් ව පොහොය කරන්නෙමි. සංඝ කර්ම කරන්නෙමි'යි කීයේ ය. පිණ්ඩපාතයෙන් පසු අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ දෙව්දත් කී කාරණය දැන්වූහ.

ඒ විට භාග්‍යවතුන් වහන්සේ:

**'සත්පුරුෂයා විසින් හොඳ දෑ පහසුවෙන් කට හැක්ක. පාපී පුද්ගලයා විසින් හොඳ දෑ කට නො හැක්ක. පාපියා විසින් පාපය සුව සේ කට හැක්ක. ආර්යයන් විසින් පාපය නො කට හැකි යැ'යි**[168] වදාළ සේක.

නැවත දෙව්දත් තෙම එක් පොහෝ දිනෙක භික්ෂු සංඝයා මැද නැඟී සිට තමා භාග්‍යවතුන් වහන්සේ ගෙන් පංච වස්තූන් පණවන ලෙස ඉල්ලීම කළ නමුදු එය උන්වහන්සේ ප්‍රතික්ෂේප කළ බවත් ඒ පංච වස්තූන් සමාදන් ව විසීමේ වටිනා කමත් දන්වා 'මගේ මේ අදහසට එකමුතු තැනැත්තේ සලාක ගනීවා'යි කියා සලාක ගැන්වී ය. අළුත පැවිදි උපසපන් වූ පන්සියයක් පමණ වජ්ජිපුත්තක භික්ෂූහු දෙව්දතු ගේ වචනයට රැවැටී ඔහුට පක්ෂ වූහ. දෙව්දත් තෙමේ ද ඒ පන්සියය ගෙන ගයා ශිර්ෂයෙහි අරමට ගියේ ය.

ඉක්බිති සැරියුත් මුගලන් දෙනම භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ ඒ පවත් දැන්වූහ. ඒ භික්ෂූන් විනාශයට පැමිණෙන්නට පළමු කැඳවා ගෙනෙන ලෙස භාග්‍යවතුන් වහන්සේ ඒ තෙරුනට වදළහ. දැගසව්වෝ ද ගයා ශීර්ෂයට ගියහ. ඒ සමයෙහි දෙව්දත් තෙර මහා පිරිස් මැද බණ කියමින් හුන්නේ  තමන් වෙත එන සැරියුත් මුගලන් දෙ නම දැක 'මහණෙනි, බලවු. මගේ ධර්මය කොතරම් ස්වාඛ්‍යාත ද? ශ්‍රමණ ගෞතමයන් ගේ අග සවු සැරියුත් මුගලන් දෙදෙනාත් සතුටු ව මා වෙත එන්නෝ යැ' යි කී ය. ඒ විට **කෝකාලික** තෙම 'සැරියුත් මුගලන් දෙ නම නො ඇදහිය යුතු යැ'යි කී ය.' **දෙව්දත්** ඒ වචනය නො පිළිගත්තේ ය. ඉක්බිති දෙව්දත් තමා ගේ ආසනයට අඩක් මිටි ආසනයක් සැරියුත් තෙරුනට පෙන්වා එහි ඉඳ ගන්නට කීය. සැරියුත් තෙරණුවෝ එහි නො හිඳ අන් අස්නෙක ඉඳ ගත්හ. මුගලන් තෙරණුවෝ ද පසෙක අස්නෙක ඉඳ ගත්හ. දෙව්දත් රෑ බොහෝ වේලා බණ දෙසා තමා ගේ පිට රිදෙන බව කියා බණ කීම සැරියුත් තෙරුනට පැවැරී ය. සැරියුත් තෙරණුවෝ ආදේශනා ප්‍රාතිහාර්‍යයෙනුත් අනුශාසන ප්‍රාතිහාර්‍යයෙනුත් බණ

දෙසුහ. ඉන් පසු මුගලන් තෙරණුවෝ ඍද්ධිප්‍රාතිහාර්‍යයෙන් බණ වදළහ. ඒ අසා පන්සියයක් පමණ ඒ වජ්ජිපුත්‍රක භික්ෂූහු සෝවාන් වූහ. ඉක්බිති දෑගසව්වෝ ඒ භික්ෂු පිරිස ගෙන අහසින් භාග්‍යවතුන් වහන්සේ වෙත වැඩියහ. කුපිත වූ කෝකාලික තෙම දෑගසව්වන් ඒ භික්ෂූන් ගෙන ගිය බව කියා පරොස් බසින් දෙව්දතු පුබුදු වන්නේ, වැලමිටින් ඔහු ගේ ළය මැදට පහරක් දින. පිබිදුණු දෙව්දතුට එ තැන ම උණු ලේ වමන විය.

'වහන්ස, සැරියුත් තෙරණුවෝ තමන් දෙවෙනි කොට ගියෝ ය. දැන් මහ පිරිවර ඇති ව එන්නෝ හොබනෝ යැ'යි භික්ෂූහු කීහ. එය ඇරැබැ බුදුරජාණන් වහන්සේ **ලක්ඛණමිග ජාතකය** වදළ සේක.

දෙව්දතු දෑගසව්වන් දෙ පස හිඳුවා බුධ ලීලායෙන් දම් දෙසමියි භාග්‍යවතුන් වහන්සේ ට සම ව ක්‍රියා කරන්නට තැත් කළ සැටිය භික්ෂූන් කී විට ද එ වැනි කථා ඇති වූ ඉන් පසු දිනවල ද භාග්‍යවතුන් වහන්සේ බොහෝ ජාතක කථාවන් වදළ සේක.

භාග්‍යවතුන් වහන්සේ කලක් රජගහ පුර වැස ඉන් නික්ම සැවැත් පුර වැඩ එහි ජේතවනාරාමයෙහි වුසූ සේක.

**දෙව්දතු භාග්‍යවතුන් වහන්සේ දක්නට යෑම**

දෙව්දත් තෙර නව මසක් ගිලන් ව වැස කෝකා-ලිකයා ළයට දුන් වැලමිටි පහරින් මරණය ළංවූ බව දැක පශ්චිම කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ දක්නට යනු කැමැත්තේ තමා එහි ගෙන යන් නැ යි සිය සව්වනට දැන්වී ය. 'ඔබ ශක්තිමත් කාලයෙහි භාග්‍යවතුන් වහන්සේට සතුරු කම් කොට දැන් දුබල වූ විට උන් වහන්සේ දක්නට යනු කැමැත්තෝ ය. අපි ඔබ එහිගෙන නො යන්නම්හ'යි ඔහු කීහ. එවිටැ දෙව්දත් තෙම තමා උන් වහන්සේ කෙරෙහි වෛරී වැ සිටියත් උන් වහන්සේ තුළ නම් කෙසඟක් පමණත් තමා කෙරෙහි අමනාපයක් නැතැයි කියා, තමා එහි බුදුරජාණන් වහන්සේ වෙත පමුණුවන ලෙස නැවත නැවත ඉල්ලීය. ඔහු ගේ බලවත් ඉල්ලීම නිසා ඔහු ද දෙව්දත් තෙරහු ඇඳෙකින් ගෙන පිටත් වූහ. එසේ යන්නාහු සැවැත් පුර පැමිණියාහු ජේතවන පොකුණ සමීපයට වන්හ.

**දෙව්දතු පොළොවැ ගිලීම**

ඔහු එහි පොකුණු තෙර ඇඳ තබා නාන්නට දියට බටහ. දෙව්දත් තෙර ද ඇඳෙන් නැගිට දෙපා බිම තබා හුන්නේ ය. එ කෙණෙහි පොළොව පැළී ක්‍රමයෙන් දෙව්දත් එහි ගිලුණේ ය. බෙල්ල දක්වා ගිලී හනු ඇටය පොළොවැ සැපී සිටි කල්හි,

**"මේ හනුකාස්ථීන් නිමිතිකොට ගෙන නො හොත් මේ කරුණු කොට, අග්‍ර පුද්ගල වූ දෙවියනට අධිදේව වූ පුරුෂදම්‍ය සාරථී වූ සමතැස් ඇති සිය පින් ලකුණු ඇති ඒ සර්වඥයන් වහන්සේ දිවි හිමියෙන් සරණ ගියෙම් වෙමි." යි කියා බුදුන් සරණ ගියේ ය.** හෙ තෙම පොළෝහි ගිලී මැරී අවීචි නිරයෙහි උපන්නේ ය.

දෙව්දත් තෙරුන් පොළෝහි ගිලුණු බව භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ ට සැළ කළහ. මේ කාරණය ඇරැබ එයින් පෙරත් දෙව්දතු තමන් වහන්සේට ද්‍රෝහි ව පොළෝහි ගිලුණු බව දැක්වීම් වශයෙන් **ඡද්දන්ත ජාතකය** ද එ ගැන කථා ඇති වූ තවත් අවස්ථාවල දී **ක්ෂාන්තිවාදී ජාතකය** හා **චුල්ල ධම්මපාල ජාතකය** ද, දෙව්දතු ගේ මරණයෙන් බොහෝ නුවර වැස්සන් සතුටුවන බව භික්ෂූන් දැන් වූ විට, පෙරත් ඔහු මළ කල මහ ජනයා සතුටු වූ බව දක්වමින් **පිංගල ජාතකය** ද වදාළ සේක.

"දෙව්දත් තෙර කොහේ උපන්නේ දැ?" යි භික්ෂූහු ඇසූහ. අවීචි නිරයේ උපන් බව වදරා

**"පව් කරන්නා මේ ලොව ද තැවේ. පරලොව ද තැවේ. "මා විසින් පව් කරන ලදැ"යි සිත සිතා මෙලොව දී තැවේ. දුගතියට ගොස් දුක් විපාක විඳිමින් බොහෝ සෙයින් තැවේ."** යැයි[200] වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ දෙව්දතුද ඇරැබ ඒ අවස්ථාවෙක දී,

**දෙව්දතු ගේ අනාගතය**

"දෙව්දත් මෙසේ අපරාධකාරයකු වුවත් පෙර බොහෝ කල් පැරුම් පිරුවෙකි යි" ද නිරයෙන් මිදී අවුත් පින් දහම් පුරා මතු කලෙක **සට්ඨිස්සර** නම් පසේ බුදු වන්නේ [201] යැ"යි වදාළ සේක.

**අජාසත් රජු පැහැදීම**

පිය රජුගේ මරණයෙන් පසු අජාසත් රජුට කිසි ම දිනෙක සුවසේ නිද ගත හැකි නො වී ය. "නිදමි" යි ඇස් පියා ගත්තේ අඳිසියෙන් බිය ව ඇස් හරී. දෙව්දතු පොළො ගිලීම අසා රජ වඩාත් බිය විය.

මෙසේ කල් යවන රජ රාත්‍රියෙහි "කිසි උතුමකු දක්නට යමැ"යි සිතයි. නිගණ්ඨනාතපුත්තාදී ෂට් ශාස්තෲන් බැලීමට වෙන වෙන ම ස වරක් මෙසේ හෙ තෙම ගියේ ය. තමා ගේ සැක දුරු කැරැලීමට ඔවුන් අසමත්වූ බැවින් එයින් පසු ඔවුන් වෙත නො ගියේ ය.

හේ සඳ රැසින් යුත් එක් රැයෙක `කිසි උතුමකු දක්නට යමි`යි සිතා ඇමැතියන් විචාළේ ය. ඔවුන් නිගණ්ඨනාතපුත්තාදීන් ගේ නම් සඳහන් කළ විට රජ තුෂ්ණීම්භූත විය. **කොමාරභච්ච ජීවක** වෙදහු අතින් පුළුවුත් විටැ `බුදුරජුන් වහන්සේ දක්නට යෑම මැනැව`යි හේ කී ය.

ඉක්බිති රජ සිය පිරිස් කැටුව ගොස් භාග්‍යවතුන් වහන්සේ දැක පිළිසඳර කථා කොට, මහණ දම් පිරීමෙන් මෙ අත්බව්හි ලැබෙන ඵල විචාළේ ය. භාග්‍යවතුන් වහන්සේ එය විස්තර කොට වදළ සේක. මෙය දික් සඟියේ සාමඤ්ඤඵල සූත්‍රය නමින් ඇතුළත්ව ඇත. රජ ඒ ධම් කථාව අසා පැහැද තෙරුවන් සරණ ගිය උපාසකයෙක් විය. තමා කළ ද්‍රෝහිකම් සඳහන් කොට ඒවාට ක්‍ෂමාව ද ඉල්ලී ය. භාග්‍යවතුන් වහන්සේ ක්‍ෂමාව දී ආයතිසංවරයෙහි පිහිටීමේ අගය වදරා රජු සැනසූ සේක. රජ භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදැකුණු කොට පිටත් ව ගියේ ය. එ තැන් සිට රජුට රාත්‍රියේ නිදිවැරීම අවශ්‍ය නොවී ය. හොඳට නින්ද ගියේ ය. පියා නො මැරැවී නම් මෙ රජ එද ම සෝවාන් විය හැකි ව සිටියේ ය. මොහු තරම් ලෞකික ශ්‍රද්ධාවෙන් සමන්විත අන් කිසිවෙක් නො වීය.

## දෙ සාළිස් වන පරිච්ඡේදය

**උපාලි දමනය**

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර වස් වැස වස් පවාරණයෙන් පසු මහ සඟන පිරිවරා සැරිසරන සේක්, රජගහ පුරයට වැඩ එහි වේළුවන යෙහි වුසුම් ගත් සේක. මේ බුධත්වයෙන් සත්තිස් වන වස පමණේ දී ය. මෙ සමයෙහි කිසි දවසෙක වේළුවනයෙන් නික්ම එයට යොදුනක්[96] පමණ දුරැ වූ නාලන්ද නුවරට වැඩ එහි **පාවාරික** සිටුහුගේ අඹවනයෙහි වූ වෙහෙරට වැඩි සේක. එහි ටික දිනක් වුසුම් ගත් සේක.

මෙ සමයෙහි **නාත පුත්ත නිගණ්ඨ තෙම** මහත් සවු පිරිසක් සමග නාලන්ද නුවරැ සිය අසපුයෙහි වෙසෙයි. ඔහුගේ **දීඝ තපස් සී** නම් අග සවු නිගණ්ඨ තෙම දවසෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත ආයේ ය. භාග්‍යවතුන් වහන්සේ හා සතුටු සාමීචි කොට පසෙක ඉඳ ගත්තේ ය. එයට පසු භාග්‍යවතුන් වහන්සේත් දීඝතපස්සිහුත් අතර මෙසේ කථාවෙක් විය.

---

96. යොදුන (යෝජන) යනු වත්මන් වහරෙහි මයිල පහක් පමණ දුරෙකි. එක් කලෙක මයිල හතක් පමණ දුරට ද යෝජන (යොදුන) යැ යි ව්‍යවහාර වූ බව පැරැණි දුර මැනුම් විමැසීමේ දී පෙනේ. ඈත පුරාතනයෙහි විය ගහේ දිගට ද යෝජන යැ යි ව්‍යවහාරයක් පැවැති බව ද පෙනේ. රජගහ සිට නාලන්දවට මයිල 5 ක් 6කේ පමණ දුර ය.

**භාග්‍යවතුන් වහන්සේ** - තපස්නි, පාපක්‍රියායෙහි පාපකර්මයන් ගේ පැවැත්මෙහි ලා කර්ම කීයක් පණවත් ද?

**දීඝතපස්සී** - ආයුෂ්මත් ගෞතමයිනි, කර්මයැ යි කර්මයැ යි පැණැවීම නාත පුත්ත නිගණ්ඨයාණනට නො හුරු ය. ඔහු පණවනුයේ 'දණ්ඩය, දණ්ඩ යැ'යි කීයේ යැ.

භාග්‍ය. - තපස්සීනි, පව් කිරීමෙහි ලා නාත පුත්ත නිගණ්ඨයෝ දණ්ඩ කීයක් පණවත් ද?

දීඝ. - ආයුෂ්මත් ගෞතමයිනි, කාය දණ්ඩ, වචී දණ්ඩ, මනොදණ්ඩ යැයි පව් කිරීමෙහි ලා දණ්ඩ තුනක් ම නාතපුත්ත නිගණ්ඨයෝ පණවත්.

භාග්‍ය. - තපස්සීනි, කාය දණ්ඩ, වචී දණ්ඩ, මනො දණ්ඩ යනු වෙන් වෙන් තුනෙක් ම ද?

දීඝ. - එසේ ය, ආයුෂ්මත් ගෞතමයිනි, කාය දණ්ඩ ය එකෙක, වචී දණ්ඩ ය අන් එකෙක, මනොදණ්ඩය ඒ දෙකින් ම අන්‍ය වූ එකෙක.

භාග්‍ය.- තපස්සීනි, මේ දණ්ඩ තුනින් කවර එකෙක් මහත් ම සාවද්‍ය යැ යි ඔහු පණවත් ද?

දීඝ.- ආයුෂ්මත් ගෞතමයිනි, මේ දණ්ඩ තුන අතුරෙන් කාය දණ්ඩය නම් කිරීමෙහි ලා මහත් ම සාවද්‍ය එක යැ යි නාතපුත්ත නිගණ්ඨයෝ පණවත්. අනිත් දණ්ඩ දෙක මෙය තරම් බලවත් නො වෙයි කියත්.

භාග්‍ය.- දීඝ තපස්සීනි, කාය දණ්ඩය අන් දෙකට ම වඩා මහා සාවද්‍ය යැ යි ඔහු කියත් ද?

දීඝ.- එසේ ය, ආයුෂ්මත් ගෞතමයිනි, කාය දණ්ඩය ම එ තුනින් අතිශය සාවද්‍ය යැ යි නාතපුත්ත නිගණ්ඨයාණෝ පණවත්.

භාග්‍ය.- කාය දණ්ඩය ම අතිශය සාවද්‍ය යැ යි කියත් ද?

දීඝ.- එසේ ය, කාය දණ්ඩය ම අතිශය සාවද්‍ය යැ යි කියති.

භාග්‍ය.- කාය දණ්ඩය ම අතිශය සාවද්‍ය යැ යි කියත් ද?

දීඝ. - එසේ ය, කාය දණ්ඩය ම අතිශය සාවද්‍ය යැ යි කියත් යැ යි කියමි.

භාග්‍ය.- තපස්සීනි, කාය දණ්ඩය ම අතිශය සාවද්‍ය යැයි කියත් ද?

දීඝ. - එසේය, කාය දණ්ඩය ම අතිශය සාවද්‍ය යැයි, ඔහු කියත්'යි කියමි. ආයුෂ්මත් ගෞතමයිනි, පව් කිරීමෙහි ලා ඔබ දණ්ඩ කීයක් කියත් ද?

භාග්‍ය. - තපස්සීනි, දණ්ඩ යැ යි තථාගතවරු නො කියත්. කර්මය කර් යැ යි ම කියත්. පව් කිරීමෙහි ලා කායකම්ම වචී කම්ම මනො කම්ම යැ යි කර් තුනක් ම මම් කියමි.

දීඝ. - ආයුෂ්මත් ගෞතමයිනි, කිම? කාය කම්මය අන් එකෙක් ම වචී කම්ම ය අන් ම එකෙක් ද? මනො කම්මය ඒ දෙකින් ම අනෙකෙක් ද?

භාග්‍ය.- එසේ ය ඒ තුන ම වෙන් වෙන් කර් යැ යි කියමි.

දීඝ. - ආයුෂ්මත් ගෞතමයිනි, මේ තුනින් කවරෙක් අතිශයෙන් ම සාවද්‍ය ද?

භාග්‍ය. -මනො කම්ම ය අතිශයයෙන් ම සාවද්‍ය ය.

(දීඝ තපස්සී තුන් වරක් ම මේ ප්‍රශ්නය ඇසී ය. තුන් වර ම භාග්‍යවතුන් වහන්සේ මේ උඩ සඳහන් පරිදිම උත්තර දුන් සේක.)

මේ සාකච්ඡායෙන් පසු දීඝ තපස්සී ස්වකීය ශාස්තෘවරයා වෙත ගියේ ය. මේ වේලෙහි නාතපුත්ත නිගණ්ඨ තෙම මහත් නිගණ්ඨ පිරිසක් පිරිවරා ගෙන හුන්නේ ය. ඔවුන් ගේ දෙටු ගිහි සවු වූ උපාලි ගෘහපති ද මහත් ගිහි සවු පිරිසක් පිරිවරා එහි ආයේ ය. අවුත් වැඳ පසෙක හුන්නේ ය.

නාත පුත්ත තෙම එහි පැමිණි දීඝ තපස්සීන් දැක කොහි ගොස් ආවු දැ'යි පුළුවුත. 'ශ්‍රමණ ගෞතමයන් කරා ගොස් ආමි' යි හේ කී ය. 'කිසි කතා බහෙක් වී දැ?' යි නාත පුත්ත ඇසී. දීඝ තපස්සීහු භාග්‍යවතුන් වහන්සේත් තමාත් අතර පැවැති මුළු කථාව ම පැවැසූහ. එය ඇසූ නාතපුත්තයෝ සාධුකාර දී 'තොප ශ්‍රමණ ගෞතමයන් හට පිළිතුරු දුන් නියාව සරි ය. ශාස්තෘ ශාසනය දත්තෝ තෙපි ය, ලාමක වූ (සුළු වූ) මනෝ දණ්ඩය මහත් වූ කාය දණ්ඩය හා සම නො වෙයි. පව් කිරීමෙහි ලා කාය දණ්ඩ ය ම මහා සාවද්‍ය ය, වචී දණ්ඩ මනොදණ්ඩ දෙක මහා සාවද්‍ය නො වේ'යි කීහ. මෙය අසා හුන් උපාලි ගෘහපති නාතපුත්තයන් අමතා, 'වහන්ස, මම මේ කාරණයෙහි ශ්‍රමණ ගෞතමයන් හා වාද කරන්නට යෙමි. ශක්තිමත් එකකු දික් ලොම් ඇති එළුවකු, ඒ මේ අතට ඇද හල හප්පන්නා සේ ම ශ්‍රමණ ගෞතමයන් වෙහෙසවමි' යනාදීන් වහසි බස් කියා භාග්‍යවතුන් වහන්සේ හා වාද කරන්නට යනු කැමත්ත පැවැසී ය.

එයැසූ නාතපුත්ත තෙම 'ගෘහපතිය මෙහි ලා ශ්‍රමණ ගෞතමයන් හා වාද කරනුවට මම් ද දීඝ තපස්සී ද නිස්සම්භ, තෝ ද නිස්සෙහි ය. ගොස් වාදරෝපණය කරව'යි කීය. එවිට **දීඝතපස්සී** තෙම 'වහන්ස. උපාලිහු ශ්‍රමණ ගෞතමයන් හා වාදරෝපණයට යනු මට නො රිස්සෙයි. ශ්‍රමණ ගෞතමයෝ මහා මායාවී කෙනෙක, අනුන්ගේ සව්වන් තමන් අතට ඇදගන්නා මහා වශීකරණ විද්‍යාවක් (ආවට්ටනී මායාවක්) දන්නාහ. ඔහු යනු සුදුසු නො වේ'යි කීය.

එබස් ඇසූ නාතපුත්ත නිගන්ඨයෝ 'තපස්සී ය, උපාලි ගැහැවි ශ්‍රමණ ගෞතමයන් ගේ ශ්‍රාවක වෙයි යන්න සිදු විය නොහැක්ක, වැලි ශ්‍රමණ ගෞතමයෝ උපාලිහු ගේ ශ්‍රාවක වෙති යන්න වියැ හැක්ක, ගැහැවිය තෝ යව' යි කීහ.

තුන් වරක් ම දීඝ තපස්සී තෙම උපාලිහු නො යැවිය යුතු යැ යි කරුණු කී ය. ඔහු බස නො තකා නාතපුත්තයෝ උපාලි ගැහැවියාට යන්නට අවසර දුන්හ. උපාලි තෙම නාතපුත්තයන් වැඳ පැදැකුණු කොට පාවාරික අඹවන වෙහෙර බලා නික්මිණ.

උපාලි තෙම භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹැ වැඳ පසෙක හිඳ ගත්තේ ය. භාග්‍යවතුන් වහන්සේ හා සාකච්ඡාව ඇරැඹී ය.

**උපාලි** - වහන්ස, දීඝ තපස්සීහු මෙහි ආවෝ ද?

**භාග්‍යවතුන් වහන්සේ** - එසේ ය, ගැහැවිය.

**උපාලි** - ඔවුන් හා ඔබ හා අතර සාකච්ඡාවෙක් වී ද?

භාග්‍යවතුන් වහන්සේ තමන් හා දීඝ තපස්සීන් අතර පැවැති කථාව වදළ සේක. එයැසූ උපාලි ගැහැවි සාධුකාර දී ස්වකීය ශාස්තෘහුගේ ශාසනය දන්නෝ නම් ඔහු ය. ලාමක වූ මනෝ දණ්ඩය මහත් වූ කාය දණ්ඩය හා සම නො වෙයි, පව් කිරීමේ දී කාය දණ්ඩය ම මහා සාවද්‍ය ය වචී දණ්ඩ මනො දණ්ඩ එසේ නොවෙයි' කී ය.

**භාග්‍යවතුන් වහන්සේ** - ගැහැවියනි, සත්‍යයෙහි පිහිටා කථා කරවු නම් මෙහි ලා තොප හා කථා කරමි.

**උපාලි** - වහන්ස, සත්‍යයෙහි පිහිටා සිටිමි වදරන්නැ.

**භාග්‍ය.**- ගැහැවිය, සිහිල් දිය නො බොන, උණු දිය ම බොන නුවටෙක් දරුණු ලෙඩක් වැළැඳ උණු දියක් නො ලැබීමෙන් මෙළේ නම්,[97] හේ මරණින් මතු කොහි උපදී යැ යි නාතපුත්තයෝ කියද්ද?

**උපාලි** -වහන්ස, මනස්සත්ත්ව නම් දේව නිකායෙක් ඇත. ඒ වෙනුවට ඒ දෙවියන් අතුර උපදී, මනසෙහි බැඳී මළ බැවිනි.

**භාග්‍ය.**- ගැහැවියනි, ගැහැවියනි, සිහි එළවා කතා කරන්න. තෙපි කායදණ්ඩය මහත් යැ යි කිවූ හ. දැන් තොප දුන් පිළිතුරෙන් මනො දණ්ඩය මහත් යැ යි පැවසෙයි.

එයැසූ නාතපුත්ත නිගන්ඨ තෙම 'ගෘහපතිය, මෙහි ලා ශ්‍රමණ ගෞතමයන් වාද කරනුවට තෝ නිස්සෙහි, දීඝතපස්සී හෝ මම් හෝ නිස්සෙමි.

**උපාලි** -එසේ වුව ද වහන්ස, කාය දණ්ඩය ම මහත් ය.[98]

**භාග්‍ය.**- ගැහැවියනි, කිසි නුවටෙක් ප්‍රාණවධ නො කරයි. නො කරවයි. එය සමාදන් ද නො කෙරෙයි, සොරකම් නො කරයි, නො කරවයි, සමාදන් ද නො කරයි, බොරු නො කියයි. නො කියවයි, එය සමාදත් ද නො කරයි, පස්කම් සුව නො විඳී, නො විඳුවයි, එය සමාදන් ද නො කෙරෙයි. යනුයේ එනුයේ බොහෝ කුඩා ප්‍රාණීන් අපත්මෙයි, එයින් උහු මැරෙත්. ඔහුට නාතපුත්තයෝ කවර නම් විපාකයෙක් ලැබේ යැ යි කියත් ද?

**උපාලි** -වහන්ස, වධ චේතනා නැති බැවින් එය මහා සාවද්‍ය යැයි නො කියත්.

**භාග්‍ය** -ගැහැවියනි, හේ ඒ දෑ කරන්නෝ සිතා නම් චෙතනාව ඇත්තේ නම්, නාතපුත්තගේ ඒ චෙතනාව කවරක් හි කවර කොටසේහි ඇතුළත් කොට කියත් ද?

---

97. ජලය ජීවිතේන්ද්‍රියය ඇති ප්‍රාණියෙකැ යි කුඩා ජල බින්දු කුඩා ප්‍රාණීහු යැ යි ද මහත් ජල බින්දු මහත් ප්‍රාණීහු යැයි ද නිගණ්ඨයෝ හදහති. එබැවින් ගිහියන් හුණු කැරැ දුන් ජලය ම බොති. කිසි විටෙක එය නො ලදෙත් කාඩි

98. භාග්‍යවතුන් වහන්සේ වදළ බස ඇසූ උපාලි මෙසේ සිතී: 'මූර්ඡාවට පත් වුවහුට ආශ්වාස ප්‍රශ්වාස නැතත් සතියක් වුවද නො මැරී හිඳී. සිත ඇති බැවින් හේ මළේ යැ යි නො කියත්. සිත නැති වූ කල්හි ම මළේ යැ යි පිළිගනිත්. චුතියත් පටිසන්ධියත් සිතින් ම වෙයි. එ බැවින් මනෝ දණ්ඩය ම මහත් ය. නාතපුත්ත යන් ගේ වචනය අනෛකාන්තික යැ'යි ගෞතමයන් වහන්සේ ගේ දෙසුම නිවරද යැ යි හේ සිතිය. එහෙත් භාග්‍යවතුන් වහන්සේ වදරන දෑ අසනු රිසියෙන් වාද කථා ව්‍යාජයෙ හේ තව දුරට කථා කෙළේ ය.

උපාලි - වහන්ස. මනො දණ්ඩයෙහි ඇතුළත් කොට කියති.

භාග්‍ය. - ගැහැවියනි, සිහි එළවා කියන්න, තොප පළමු කී දැය හා පසුව කී දැ නො ගැළැපෙයි. පසුව කී දැය හා පළමු කී දැ නො ගැළැපෙයි.

උපාලි - භාග්‍යවතුන් වහන්සේ එසේ වදළත් පාප ක්‍රියාහි කාය දණ්ඩය ම මහත් යැ, වචී දණ්ඩ මනො දණ්ඩ දෙක එසේ මහත් නොවේ.

භාග්‍ය. - ගැහැවියනි, මේ නාලන්දාව සරුසාර නො වේ ද, බොහෝ ජනගහනය ඇතියේ නො වේ ද? කිසිවෙක් කඩුවක් ඔසොවා ගෙන මෙහි අවුත්, මම් ක්‍ෂණයෙන් මේ සියලු නාලන්දාව එක් ම මස් ගොඩක් කරමැ යි කියා නම් හේ තමා කියන පරිදි එය කළ හැකි වන්නේ ද?

උපාලි -වහන්ස, එකකු තබා දසයක් විස්සක් තිසක් සතලිසක් පණසක් මිනිස්සු ආ හු ද එය කළ නො හෙන්නාහ.

භාග්‍ය. -ගැහැවියනි, ඍද්ධිමත් චෙතොවශීප්‍රාප්ත මහණෙක් හෝ බමුණෙක් අවුත් කිපී මේ මුළු නාලන්දාව ම ක්‍ෂණයෙන් අළු කෙරෙමි යි කීවොත් එය කරනුවට හේ සමත් වෙයි ද?

උපාලි - එසේ ය, වහන්ස, හේ සමත් වෙයි. එහෙත් කාය දණ්ඩය මැ මහත් ය.

භාග්‍ය. - ගැහැවියනි, දණ්ඩකාරණ්‍යය, කාලිංගාරණ්‍යය, මෙධ්‍යාරණ්‍යය, මාතංගාරණ්‍යය යන මේවා ඇති වූ හැටි ඔබ අසා ඇද්ද?

උපාලි - එසේ ය, වහන්ස, අසා ඇත්තෙමි.

භාග්‍ය. - ඒවා කිමෙකින් එසේ වූහු ද?

උපාලි - වහන්ස, ඍෂීන් ගේ සිත්හි වූ දැහැවිල්ලෙන් යැ යි ඇසීමි.

භාග්‍ය. - ගැහැවියනි, සිහි එළවා කථා කරන්න, කාය දණ්ඩය මහතැ යි ඔබ මුලින් කී බස් හා දැන් මේ කියන කතාව නො ගැළපෙයි.

උපාලි - වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වදළ පළමු උපමායෙන් ම මම් පැහැදුනිමි. එහෙත් භාග්‍යවතුන් වහන්සේ වදරණ කථාව තව තවත් අසනු අටියෙන් ව්‍යාජ විරුද්ධත්වයක් පෑයෙමි. වහන්ස, සැහෙවි යට පත් ව තුබුණු දැයක් මතු කොට දැක්වූවා සේ ධර්මයන් ගේ යථාතත්ත්වය හෙළි කොට වදළා ඉතා මැනැවි.

වහන්ස, ඒ මම් භාග්‍යවතුන් වහන්සේ ද ඔබගේ ධර්මය ද ශ්‍රාවක සංඝයා ද සරණයෙමි. වහන්ස, අද සිට දිවි හිමි කොට සරණ ගිය උපාසකයකු කොට මා පිළිගන්නා සේක් වා.

**භාග්‍ය.** - ගැහැවියනි, සිතා බලා මෙවැනි දැය කළ මැනැව. ඔබ වැන්නන් මා දැක මා සරණ යන කලැ නැවැත නුවටු දැක ඔහු සරණ යන කලැ 'මෙ තෙම දුටු දුටුවන් සරණ යෙ'යි මිනිස්සු කියති, ඔවුනට එසේ කියන්නට අවකාශ නො තබනු මැනැව. තොප වැනි ප්‍රසිද්ධ මිනිසුන් කිසිවක් පිළිගැන්මෙහි ඉක්මන් නො වියැ යුතු. බොහෝ දුරට සිතා බලා ම ක්‍රියා කරනු ය සුදුසු.

**උපාලි** -වහන්ස, ඔබ ගේ ඒ වචනයෙන් මම් වඩාත් සතුටු වෙමි. තීර්ථකයෝ වූ කලි සව්වකු ලද විට 'අසෝ රජ, අසෝ ඇමැති, අසෝ සිටු, අප සරණ ගියේ යැ'යි ධ්වජ ඔසොවා හඬ නගා ඇවිදිති. තමන්ගේ මහත් බව ප්‍රකට කරනු පිණිස ය. මා ඔවුන් සවු වූ කල්හි ද එසේ කළහ. එහෙත් භාග්‍යවතුන් වහන්සේ 'ඉක්මන් නො වී සිතා පිරික්සා බලා මැ පිළිගන්නැ'යි වදරන සේක. වහන්ස, දෙවන වරට ද මම් ඔබ සරණ යෙමි.

**භාග්‍ය.** - ගැහැවියනි, බොහෝ කලක් ඔබෙ ගෙය නිගණ්ඨයනට සතර මං සන්ධියෙක ළිඳක් මෙන් විය. මත්තෙහි ද ඔවුන් ආ විට දන් දීම පෙර සේ ම කළ මැනැව, එය නොම නවත්තන්න.

**උපාලි** - වහන්ස, 'මට ම දිය යුතු යැ යි අන්හට නොදියැ යුතු යැ'යි මගේ සව්වනට ම දිය යුතුය, මට ම මගේ සව්වනට ම දුන් දැ මහත් පල ය. අන්හට දුන් දැ එසේ නො වේ යැ'යි ශ්‍රමණ ගෞතමයන් කියති'යි භාග්‍යවතුන් වහන්සේ ට දොස් කියනු මා අසා ඇත. එහෙත් භාග්‍යවතුන් වහන්සේ නිගණ්ඨයනට ද දන් දීමෙහි මා යොදන සේක. වහන්ස, මම් ඔබ ගේ මේ දෙසුම නිසා වඩාත් පැහැදුණෙමි, තෙවනු වරත් ඔබ ද ඔබ දහම ද ඔබ සව්මුළුවද සරණයෙමි.

මෙයට පසු භාග්‍යවතුන් වහන්සේ දාන කථාදි ආනුපුබ්බි කථායෙන් දහම් දෙසූ සේක. එය අසා නීවරණයන් යට පත් වැ පිරිසිදු වූ සිතැති උපාලිහට සිවුසස් පැවැසූ සේක. එය අසා හේ නුවණ මුහු කුරවා සෝවාන් විය. එයට පසු භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට සිය මැදුර බලා ගියේ ය. පැවිදි පිරිසද ඔහුගෙන් ඉවත්වැ ගියහ.

මෙයතරැ 'උපාලි ගැහැවි ශ්‍රමණ ගෞතමයන් වෙත ගොස්, කළ කී දෑ දැන ගෙන එම්'යි කියා නාතපුත්ත නිගණ්ඨයාණන් ගෙන් අවසර ගෙන උපාලිහුගේ මැදුර බලා ගියේ ය. හේ පෙර සේ ගෙය ඇතුළට යන්නට සැරැ සිණ. දොරොටු පල්ලා එය දැක, ඔහුට ගෙයැතුළ යන්නට නොදී 'සිටින්න, වහන්ස, අප මහ සිටාණෝ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ගේ ශ්‍රාවක විය. 'ඔබ බොජුන් කැමැත්තෝ නම්, මෙහි ම සිටින්න. මම් ගෙට ගොස් බොජුන් ගෙනෙන්නෙම්'යි කීය. 'මට බතින් කම් නැතැ'යි කියා හේ පෙරළා නාතපුත්තයන් වෙත ගියේ, 'උපාලි ගෘහපති ශ්‍රමණ ගෞතමයන් ගේ සවු බවට ගියේ 'යි සැළ කෙළේ ය.

නාතපුත්ත නිගණ්ඨයෝ ඔහු කී බස නො හදහා 'මම මැ ගොස් දැන ගනිම්'යි කියා මහත් නිගන්ථ පිරිසක් පිරිවරා උපාලි ගෘහපතිහු ගේ මැදුර කරා ගියේ ය. දොරොටුපල් තෙම ඔවුන් ගෙට වැද්ද නො දී 'මෙහි සිටින්න, අප මහ සිටාණෝ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ගේ ශ්‍රාවක බවට පැමිණියේ ය. ඇතුළට නොයන්න. බොජුන් කැමැති නම් මෙහි නවතින්න, බොජුන් මෙතැනට ගෙනෙති'කීය. 'තෝ ගොස් මහ සිටුහට මා අවුත් ඔහු දක්නට මෙහි පොරොත්තු වැ සිටිනා බව කියව'යි නාතපුත්ත කීය. හේ ද ගොස් සිටුහට එ පවත් සැළ කෙළේ ය. 'සතරවන දොරොටුයෙහි තමාට හිඳිනා ලෙසට අස්නක් පණවන්නැ යි සිටු නියෝග කෙළේ ය. හේ ද එය කොට, ගොස් නාතපුත්තයන් කැඳැවීය. නාතපුත්තයෝ සවු පිරිස සමග සතර වන දොරොටුව වෙත ගියහ. උපාලි ගැහැවි උස් මැ අස්නෙහි හුන්නේ, එහි ආ නාතපුත්තයන් දැක, 'ඉඳ ගනු කැමැත්තහු නම් තෙලැ අසුන්හි හිඳගන්නැ 'යි කීය. එය ඇසූ නාතපුත්තයෝ 'ඔබ ශ්‍රමණ ගෞතමයන් හා වාදයට ගොස් ඔවුන්ගේ ආවර්ටීනිමායාවට හසුව ආවාහු නොවෙද් දැ?' යි කී ය.

උපාලි තෙම, 'වහන්ස, ඒ ආවර්තීනි මායාව කල්‍යාණය. එය මා සෙනෙහැති සියලු නෑදෑයනට, සියලු කැත් බමුණු ගැහැවි සුදුරු හැමට, සැම දෙව් මිනිස්නට හද්‍ර ය, බොහෝ කල් හිත සුව පිණිස පවතී. ඔබේ ශාසනය නෛර්යාණික නොවේ. අප භාග්‍යවතුන් වහන්සේ ගේ සස්න ම නෛර්යාණික ය' යනාදීන් දීර්ඝ ලෙස කරුණු කියා බුදු සස්නැ අගය වැණී ය.

නාතපුත්තයෝ, 'මහ සිටාණනි, රජු සහිත සියලු පණිද් තොප අපගේ ශ්‍රාවක බව් දනී, දැන් තෙපි කාගේ ශ්‍රාවක දැ?'යි දැනගනු කැමැත්තම්හ'යි කීහ. එ විට උපාලි සිටු නැඟී සිට, උතුරු සළුව එකස්

කොට භාග්‍යවතුන් වහන්සේ වැඩ වසන දිශාවට හැරී දොහොත් මුදුන් තබා, "**ධීරස්ස විගත මොහස්ස**" යනාදී ගාථා දසයෙකින් බුදුගුණ කියා. මම් ඒ භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවකයෙකිමි'යි කී ය.

සිටුහුගේ කථාව ඇසීමෙන් නාතපුත්තයෝ බලවත් ශෝකයට වැටුණහ. ඉතින් අපි නටුවම් හැ'යි කී ය. බලවත් ශෝකයෙන් හුණු වූ බැවින් ඔවුන්ගේ මුවින් පාත්‍රයක් පමණ ලේ වමන විය. සව්වෝ ඔවුන් හැදෙකින් පාවා නුවර ඔවුන් අසපුවට ගෙන ගියහ. හේ නොබෝ දිනෙකින් මළේ ය.

භාග්‍යවතුන් වහන්සේ පාවාරිකම්බවනයෙන් නික්ම වඩනාසේක්. මල්ල රටැ පාවා පුර චුන්ද කම්මාර පුත්‍රයාගේ අඹවනයට වැඩි සේක. එහි වෙහෙරෙහි වැඩ ඉන්නා සෙමෙහි පාවා නුවර මල්ල රජුන් ගෙන් ඔවුන් විසින් අළුත ම කැරවුණ සත්ථාගාරයට වඩනට නිමැතුමක් ලද සේක. එහි වැඩ, රැස්වැ සිටි මල්ල රජුන් ප්‍රමුඛ මහ පිරිසට දහම් දෙසූ සේක. එදා සැන්දෑවෙහි ඔවුන් හැම නික්ම ගිය පසු භාග්‍යවතුන් වහන්සේ සැරියුත් මහතෙරුන් බණවා, 'සාරිපුත්තයෙනි, මේ භික්ෂු පිරිසට දහමක් දෙසන්න. මා පිට රිදෙයි,[99] මම් ටික වේලාවක් වැද හෙම් යි සැතැපුණු සේක.

පාවා නුවර දී නාතපුත්ත නිගණ්ඨයන් කලුරිය කළේ මෙ සමයෙහි ය. නාතපුත්තයන්ගේ මරණින් පසු ඔවුන් සව්වන් අතර ඔවුන් දෙසූ ධර්මවිනය පිළිබඳ ව විවිධ මත නැංගෙන් නිගණ්ඨ සව්වන් අතර කලහ විවාද ඇති විය.

සාරිපුත්ත තෙරණුවෝ නුවටන් අතර නැංග ගැටුම් සඳහන් කොට සම්‍යක්සම්බුධ නොවන්නකු ගේ අනෛර්‍යාණික වූ සස්නැ එසේ කලහ විවාද ඇති වනු ස්වභාව සිද්ධියෙක. එහෙත් අප භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුධයන් වහන්සේ වදාළ ධර්මවිනයය නෛර්‍යාණිකය, එහි ඔබ හැම ඒක මතික විය යුතු ය. එය එකට සංගායන කටයුතු ය. එය බොහෝ දෙනාගේ හිත සුව පිණිස වන්නේ යැ යි වදරා, එක් ධර්මය, ධර්මදෙක, ධර්ම තුන යනාදී පිළිවෙලින් ගලපා බුධ වචනය සැකෙවින් වදළහ. භාග්‍යවතුන් වහන්සේ එය අසා 'සාරිපුත්තයෙනි තොප මේ සංගීති පර්‍යාය දෙසූසේ මැනැවැ'යි එය අනුදත් සේක. මෙය භාග්‍යවතුන් වහන්සේ ධරමාණ කාලයෙහි ම ඔබ ඉදිරි යේ ම කළ ධර්ම සංගායනාවක් වැන්නෙකි. මෙය දෙසන ලදුයේ භාග්‍යවතුන් වහන්සේ ගේ පරිනිර්වාණයට අට වසකට පෙර නාතපුත්ත නිගණ්ඨයාණන් කලුරිය කළ අළුත ය.

99. දෙව කෝපයෙන් ඒවා අරණ්‍ය බවට පෙරළුණ ද මිනිසුන් සිතුවේ සිත් රිදුණු ඍෂීන් ගේ ශාපයෙන් ඒ නුවරවල් අරණ්‍ය වූ සැටියෙනි.

# තෙසාළිස් වන පරිච්ඡේදය

**ඡත්තපාණී උපාසක තුමා** සැවැත් නුවර ත්‍රිපිටකධාරී ඡත්‍රපාණී නම් අනාගාමී උපාසකයෙක් විය. හෙ තෙම දිනෙක ඉතා උදය ම භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් වැඳ බණ අසමින් උන්නේ ය. ටික වේලාවෙකින් **ප්‍රසෙනජිත් කෝශල** රජ තුමා ද භාග්‍යවතුන් වහන්සේ දැකීමට ආයේ ය. එන්නාවූ රජු දැක නැඟිටි ය යුතු ද නැද්දැයි සිතා බැලූ උපාසක තෙම 'අග්‍ර රාජ වූ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි හිඳ, මේ ප්‍රදේශ රජකු දැක නැඟිටීම යුතු නැත. රජු තරහ විය හැක්ක, එහෙත් නො නැඟිටිමි'යි ඉටා නො නැඟිට ම උන්නේ ය. රජු ඔහු නො නැඟිට හුන්නාහු දැක කිපී කිසිත් නොකියා භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක හිඳ ගත්තේ ය. රජු උපාසකතුමා කෙරේ කිපුණු බව දත් භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ තතු වදරන සේක්, මහරජ මේ ඡත්‍රපාණී උපාසක තෙම පණ්ඩිතය, සත්‍යාවබෝධය කළ කෙනෙක, ත්‍රිපිටකධර ය, වැඩ අවැඩ දැනීමෙහි සමත් නුවණැත්තෙකැ'යි වදළ සේක. එය ඇසූ රජු ගේ සිත මෘදු වූයේ ය.

නැවත දිනෙක රජ සිය පහයේ මතු මහල් තෙලෙහි සිට නුවර දෙස බලන්නේ දිවා භෝජනයෙන් පසු කුඩයක් ගෙන පා වහන් ලා රජ ගෙයි මිදුලින් යන ඡත්‍රපාණී උපාසකයා දැක කැඳවීය. හේ ද කුඩය හා පා වහන් ඉවත් කොට රජු වෙත ගොස් වැඳ පසෙක සිටියේ ය.

ඉක්බිති පහත සඳහන් පරිදි ඒ දෙදෙනා ගේ සල්ලාපයෙක් වී ය.

රජ - ඇයි, ඉසැ ලාගෙන ආ කුඩයත් පා වහනුත් ඉවත් කෙළේ.

**උපාසක** - ඔබ වහන්සේ මා කැඳවා යැවූ බව අසා.

රජ - අප රජ බව දැන ගත්තේ අද ද?

**උපාසක** - නැහැ දේවයන් වහන්ස, අපි කවදත් එ බව දනිමු.

රජ - එහෙනම් එද ශාස්තෘන් වහන්සේ සමීපයේ දී අප දැක නො නැඟිට්ටේ?

**උපාසක** - දේවයිනි, ලෝකාග්‍ර මහරජාණන් වහන්සේ ළඟ හිඳ ඔබ වැනි ප්‍රදේශ රජකු දැක නැඟිට්ටෙම් නම් එය උන් වහන්සේ ට ගෞරව කිරීමක් නොවේ. එබැවින් නො නැඟිට්ටෙමි.

රජ - එසේ වේවා! ඔබ පණ්ඩිත ධර්මධර උගත් කෙනෙකු බව අසා ඇත්තෙමි. එ බැවින් අපේ අන්තඃපුරයේ ස්ත්‍රීනට බණ උගන්වන්නට ඔබට හැකි ද?

---

* මේ පරිච්ඡේදයෙහි සඳහන් ප්‍රවෘත්තීන්ගේ කාල නියමයක් වෙන් වශයෙන් පෙන්විය නො හැකියි.

**උපාසක** - බැහැ ස්වාමිනී.

**රජ** - ඇයි බැරි?

**උපාසක** - රජ ගෙවල කටයුතු බැරෑරුම් ය. ඒවායේ හැසිර පුරුද්දකුත් අපට නැත. එ හෙයින් බැහැ මේ අමුතු නො පුරුදු කටයුත්තක් කරන්නට.

**රජ** - එසේ නො කියන්න. එ ද මා දැක නැඟී නො සිටියාට මගේ අමනාපයක් ඇතැ යි සැක නොකරන්න.

**උපාසක** - දේවයන් වහන්ස, ගිහින් වසන තෙන බොහෝ සම්බාධ සහිත ය. එක් ප්‍රව්‍රජිතයන් වහන්සේ නමක් කැඳවා ලා ම බණ කියැවීම වඩා මැනැවි.

**රජ** - හොඳා, ඔබ එහෙනම් යන්න.

ඉක්බිති, රජ භාග්‍යවතුන් වහන්සේ වෙත ගියේ ය. ගොස් පන්සීයක් භික්ෂූන් කැටිව රජ ගෙට වැඩ බණ උගන්වන්නට භාග්‍යවතුන් වහන්සේට ආයාචනා කෙළේ ය.

'මහරජ. නිතර එක් තැනට ම එළැඹීම බුදුවරයන්ගේ සිරිත නො වේ. බොහෝ දෙනාට වැඩ සිදු කරන්නට ඇති හෙයිනි'යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක. 'එසේ නම් එය එක් භික්ෂූන් වහන්සේ නමකට බාර කළ මැනැව'යි රජ කී ය.

**රජ ගෙයි බණ ඉගැන්වීම**

භාග්‍යවතුන් වහන්සේ එය අනඳ මහ තෙරුනට පැවැරූ සේක. එ තැන් පටන් අනඳ තෙරණුවෝ නිතර රජගෙට වැඩ බණ උගන්වති. රජුගේ ප්‍රධාන බිසෝ වූ **මල්ලිකා**, **වාසභක්ඛත්තියා** යන දෙදෙනා අතුරෙන් මල්ලිකා බිසව මනා ව ධර්මය උගනියි. නිසි සේ පාඩම් ද දෙයි. **වාසභත්ඛක්තියා** තොම ඉගැන්ම වත් සකසා නොකරයි. දිනෙක භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් අමතා 'ආනන්දය, කිමෙක් ද? බිසෝවරු බණ උගනිද්දැ?'යි ඇසූ සේක. 'එසේ ය ස්වාමීනි'යි තෙරණුවෝ උත්තර දුන්හ. උන් ගෙන් කවරෙක් වඩා හොඳට ඕනෑකමින් මනාව බණ උගනී දැ?' යි පුළුවුත් සේක. 'ස්වාමීනි, මල්ලිකාවෝ ඕනෑකමින් මනා ව බණ උගනිති. ඉගෙන ගන්නා සැටිත් පාඩම් කරන සැටිත් පාඩම් දෙන සැටිත් යහපත, ඔබ වහන්සේ ගේ නෑයන්ගේ දූ වූ වාසභක්ඛත්තියාවෝ ඕනෑකමින් ඉගැනීම නො කරති'යි තෙරණුවෝ කීහ. එවිට බුදුරජාණන් වහන්සේ,

**"ආනන්දය. මා දෙසූ ධර්මය ඕනෑ කමින් ඇසීම ඉගෙනීම පාඩම් කිරීම ඒ වූ පරිදි පිළිපැදීම නොකරන තැනැත්තට ඵල නැත. කෙසේ ද යත්? පැය ඇතත් සුවඳ නැති මල පැලැඳීමෙන් ශරීරයේ සුවඳ පැතිරීම නොවන්නාක් මෙනි. මනා ව ශ්‍රවණාදිය කරන තැනැත්තාට ම ය ශ්‍රවණාදියෙන් ප්‍රයෝජන ඇත්තේ "යි** [202] ආදීන් වදාළ සේක.

**කාල නම් සිටු පුත්‍රයා**

සැවැත් නුවර අනේ පිඬු සිටුහු ගේ කාල නම් පුත්‍රයෙක් විය. එ තරම් සැදැහැවත් උතුමකු ගේ පුතකු වුවත් විහාරයකට යන්නට වත් සිය ගෙට භාග්‍යවතුන් වැඩි විටෙක උන් වහන්සේ දක්නට ඊමට වත් බණ අහන්නට වත් සඞ්ඝයාට වතාවත් කරන්නට වත් හේ නො කැමැත්තේ ය. අනේපිඬු සිටුහු කොතරම් අවවාද කළත් හෙ තෙම එය නොතකයි. පුත්‍රයා හොඳ මගෙක යොදන උපායක් විමසන සිටුතෙම එක් දවසෙක මුදල් දීමෙන් වත් මොහු හොඳ මඟෙක යෙදවිය හැකි 'යි සිතා ගෙන පෙහෙවස් සමාදන් කොට ගෙන වෙහෙරට ගොස් බණ අසා ආවොත් කහවණු සීයක් දෙන්නෙමි'යැ යි කී ය. හෙ තෙම තුන් වරක් ම පියා ගෙන් ප්‍රතිඥා ගෙන පෙහෙවස් සමාදන් කොට ගෙන වෙහෙරට ගියේ ය. එහෙත් බණ ඇසීමට ඔහුට කිසි ඕනෑකමෙක් නැත. එ බැවින් හේ පහසු තැනෙක හෙව පසු ද ගෙට ගියේ ය. සිටුතෙම 'මගේ පුතා පෙහෙවස් වැස එන්නේ යැ'යි සතුටු වැ වහා ඔහුට කැඳ බත් ආදිය පිළියෙළ කරවා දුන්නේ ය. එහෙත් සිටු පුත් තෙම පොරොන්දු මුදල දෙනතුරු ඒ කිසි ආහාර පානයක් නො පිළි ගත්තේ ය. සිටුහු කහවණු සියය ඔහුට දුන් පසු ම වැළඳුයේ ය. නැවත දෙවෙනි දිනයෙක සිටු තෙම පුතුට කතා කොට'පුත, ශාස්තෘන් වහන්සේ ඉදිරියෙහි සිට එක බණ පදයක් ඉගෙන එතොත් කහවණු දහසක් දෙන්නෙමි'යි කියා ඔහු විහාරයට යැවී ය. සිටු පුත් ද විහාරයට ගොස් එක බණ පදයක් ම ඉගෙන පැන යන අදහස ඇත්තේ වී ය. භාග්‍යවතුන් වහන්සේ ඔහු අදහස් දැන ඔහුට අර්ථ මිස පද අවුලා ගත නොහෙන සේ බණ වදාළ සේක.

'අන් අත් පදයක් උගනිමි'යි සිත සිතා අසන තැනැත්තේ අවසානය දක්වා ම මොනොවට බණ ඇසුයේ ය. පද සිත තැබිය නො හැකි වුව ද සියලු ධර්ම කථාවේ අර්ථ අවබෝධ කැර ගත හැකි විය. මෙසේ දේශනාවසානයේ දී හේ සෝවාන් වී ය.

ඊ බණ අසා පසු ද උදේ බුධ ප්‍රමුඛ භික්ෂු සංඝයා කැටුව ම සැවැත් පුර ආ ඔහු දුටු අනේ පිඬු සිටු තෙම අද මා පුතාගේ සැටිය යහපතැ'යි

සිතුයේ ය. කාල තෙමේ ද ම පියාණන් භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි දී කහවණු නො දුන්නොත්, කහවනු කරුණින් පෙහෙවස් රැකි බව නොම ඇඟෙව්වොත් මැනැවැ'යි සිතුයේ ය.

සිටු තෙම බුඩ ප්‍රමුඛ සංඝයා වළඳවා පුත්‍රයාට ද ආහාර දෙවී ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හමුයෙහිදී ම කහවණු දහසින් බැඳි පියල්ලක් සිටු කුමරුට දුන්නේ ය. කාල තෙම ලජ්ජායෙන් හැකිලී'මට වුවමනා කහවණුවක් නැතැ'යි කී ය. 'ගනුව'යි පියා කියද්දීත් හේ නොම ගත්තේ ය.

'වහන්ස, අද මා පුතුගේ සැටිය මනා යැ'යි සිටු කී කල භාග්‍යවතුන් වහන්සේ 'ඒ කිම් දැ'?යි ඇසූ සේක. සිටු තෙම සියලු ප්‍රවෘත්තිය සැළ කෙළේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ,

'ගෘහපතිය, අද නුඹේ පුත්‍රයාට ඔබඳු මුදලක් සුළු වනු පුදුම නො වේ. "**චක්‍රවර්ති රාජ්‍යයටත් දිව්‍ය බ්‍රහ්ම සම්පත්තියකටත් මුළු ලොවේ අධිපතිකමටත් වඩා සෝවාන් බව ඔහුට උතුම් වේ**" [203] යැ යි වදරා මෙය මුල් කොට දහම් දෙසූ සේක. දේශනාවසානයේ දී බොහෝ දෙනා ස්‍රෝත ආපත්ති ඵලාදියට පත් වූහ.

**සුන්දරික භාරද්වාජයා දමිත කිරීම**

කොසොල් රට සුන්දරික භාරද්වාජ නම් බමුණෙක් විය. දිනෙක හෙ තෙම සුන්‍දරිකා නදිය සමීපයෙහි ගිනි දෙවියා කිරි බතින් පිදී ය. කිරිබත් ගිනි ගොඩේ ලා ගිනි දල්වා තවත් ඉතිරි වූ කිරිබත් දැක මෙසේ ගින්නේ ලූ මේ කිරිබත් මහාබ්‍රහ්මයා වැළැඳුයේ ය. තවත් ඉතිරි ව ඇත. ඒවා බ්‍රහ්මයා ගේ මුඛයෙන් උපන් බ්‍රාහ්මණයකුට ම දුන්නොත් පියාත් පුත්‍රයාත් සන්තර්පිත කළා නම් වේ එසේ කිරීම බඹලොව යන මහ හෙළි කළා නම් වේ'යැ යි සිතුයේ ය.

**බුදු රජුන් හිස පටන් වසා පොරොවා හිඳීම**

මෙසේ සිතා බමුණකු දක්නා පිණිස වට පිට බලන්නේ රුකක් මුල හිස සිට වසා පොරොවා ඉන්නා තැනැතකු දුටුයේ ය. ඒ හුන්නේ අන් කිසිවෙක් නොවේ. බුදු-රජාණන් වහන්සේ ය. එසේ කුමට උන් සේක් ද යත්: එ දින අලුයම් හි ලොව බලා වදරන භාග්‍යවතුන් වහන්සේ ඒ බමුණහු කරන නිෂ්ඵල ක්‍රියාව දැක 'ඔහු නිසි මහ යවමි'යි සිතා එහි වැඩියහ. ඇතදී ම භාග්‍යවතුන් වහන්සේ අඳුනා ගත්තොත් බමුණා ළහට නේ යි. ඇඳින ගත් සැටියේ නැවිත් ආපසු යයි. එ බැවින්

ඔහු ළඟට ගෙන්වනු පිණිස ඉහත සඳහන් පරිදි හිස සිට වසා පොරොවා හුන් සේක. භාග්‍යවතුන් වහන්සේ දුටු බමුණු තෙම 'මේ රෑ මුළුල්ලේ ධ්‍යාන වැඩූ බ්‍රාහ්මණයෙකැ'යි සිතා සතුටු වැ සමීපයට ආයේ ය. එ විට බුදුරජාණන් වහන්සේ හිස විවෘත කළ සේක. බමුණා ලුහුඬු හිසකේ දැක 'මේ හිස මුඬු කෙනෙකැ'යි කියා වැඩි දුරටත් පරීක්ෂා කරන්නේ හිසැ ශිඛාව පමණකුත් නො දැක, පිරිහෙළන්නේ 'මුණ්ඩකයෙක් මැ'යි කීයේ ය. මෙ සේ කියා එතැනින් ම ආපසු යන්නට හැරුණේ නැවත ද 'කොහොමටත් සමහර බමුණෝ හිස මුඬු කළෝත් ඇත. ගොස් ජාති විචාරන්නෙමි'යි සිතී ය. මෙ සේ සිතා භාග්‍යවතුන් වහන්සේට නවත් ළං වැ ඔබ මොන ජාතියෙක දැ'යි විචාළේ ය.

එ විට බුදුරජාණන් වහන්සේ, "**දනය මහත් ඵල කැරැ ගන්නා අදහස ඇත්තෙහි නම් ජාතිය නො විචාරව, ශිලාදී ගුණ විශේෂය ම විචාරව. එ විශේෂ ගුණය ම දක්ෂිණාර්හ බවට කරුණු වේ. දර කෙබඳු වූවත් ඉන් හටගන්නා ගින්න ම අග්නි කෘත්‍යය සිදු කරයි. එ බැවින් පහත් කුලයෙක උපන්නකු වුව ද මුනි ගුණයෙන් යුක්ත නම්, වීයර්‍යවත් නම්, කාරණාකාරණ දක්නා නුවණ ඇත්තේ නම්, පවට පිළිකුල් කොට පවින් දුරුව සිටී නම්, පරමාර්ථ සත්‍යාව බෝධයෙන් දන්ත වූයේ නම්, ඉන්ද්‍රිය දමනයෙන් යුක්ත නම් සතර මාර්ග ඥානයෙන් කෙලෙසුන් ගෙන් එ තෙරට ගියේ නම්, වැස නිම වූ මාර්ග බ්‍රහ්ම චර්‍ය්‍යා ඇත්තේ නම්, ඒ පරමාර්ථ බ්‍රාහ්මණයා ම යඥය පිළිගැනීමට, පිදිය යුතු දැ පිළියෙල කළ තැනැත්තේ කැඳවා වා ඉන්ද්‍ර දෙවියා කැඳවමු. සෝම දෙවියා කැඳවමු, වරුණ දෙවියා කැඳවමු යන ආදි වූ කැඳවීම් නිරර්ථක ය. 'වහන්ස, දැන් කාලයැ'යි කියා සුදුසු වේලායෙහි රහතුන් කැඳවා සිවු පසයෙන් සත්කාර කෙරේ නම් ඒ තැනැත්තේ පූජාර්හයන් යාගයෙන් පුදන්නේ නම් වේ. අචේතනික වූ ගින්නෙහි පූජා භාණ්ඩ හෙළීම නිසි යාග කිරීමක් නම් නො වේ**" යැ යි වදළ සේක.

මෙ කථාව ඇසූ බමුණා පැහැදී 'මේ තාක් ඔබ වැනි සැබෑ බ්‍රාහ්මණයන් නැති කමින් අනෙකෙක් දක්ෂිණාව පිළිගත්තේ ය' යන ආදීන් කියා භාග්‍යවතුන් වහන්සේ ට භෝජන පිළිගැන්වීය. ගාථා කියා ලත් භෝජනය නො වළඳන බව කියා භාග්‍යවතුන් වහන්සේ එය ප්‍රතික්ෂේප කළ සේක.

එවිට බමුණු තෙම යාගාවශිෂ්ට කිරිබත ජලයෙහි ලා අවුත් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පසෙක සිටියේ ය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට මතු සඳහන් පරිදි වදළ සේක.

"බ්‍රාහ්මණය, දර පිළිස්සීමෙන් ශුඩියෙක් නො වේ. දර පිළිස්සීම ආර්‍ය ධර්මයෙන් බාහිර වැඩෙකි. එයින් ශුඩියක් ලැබෙතොත් මිණී පුළුස්සන්නන් බොහෝ දර පුළුස්සන බැවින්, අන් අයට පළමුවෙන් ඔවුන් ශුඩ විය යුතු යි. බාහිර දඬු කැබැලි පුළුස්සා ශුඩියක් බලාපොරොත්තු වීමෙන් එය ලබන බවක් නුවණැත්තෝ නොකියත්. බ්‍රාහ්මණය, මම නම් දර කැබැලි ගොඩ ගසා එහි ගිනි දැල්වීම නො කරමි. මාගේ චිත්ත සන්තානයෙහි ම ඥාන නැමැති ගින්න දල්වමි. ආවර්ජන ප්‍රතිබඩ වූ සියල්ල දක්නා නුවණ නැමැති ගින්නේ නිතර දිලිසෙමි. නිතර මනා ව තැන්පත් වූ සිතැත්තෙමි. (බෝ මැඩ දී) සම්පූර්ණ කළ මාර්ග බ්‍රහ්මචර්‍යාව ඇත්තෙමි. පූජාර්හ වෙමි. බ්‍රාහ්මණය, නුඹේ මාන ය නුඹ උසුලා ගෙන තිබෙන මහත් යාග ද්‍රව්‍ය බරෙකි. නුඹේ සිතෙහි වූ ක්‍රෝධය ඥාන ගින්න කෙලෙසන දුම ය. මුසාවාදය ඥාන ගින්න ඇවිලෙන්නට නොදී වසා ගත් අළු ගොඩ ය.

බ්‍රාහ්මණය, ඔබේ යාගයට රන් රිදී ආදියෙන් කළ යාග හැන්දක් යම් සේ පාවිච්චි කෙරෙත් ද, එසේ ම මගේ ධර්ම යාගයටත් මගේ පුළුල් වූ දිව නැමැති යාග හැන්ද පාවිච්චි කරමි. ඔබේ යාගය නදී තීරයෙහිය. මගේ ධර්ම යාගය සත්වයන්ගේ හෘදයෙහි කරමි. ඒ ඒ තැනැත්තා ගේ දන්ත වූ සිත ගිනිදැල්ල නම් වේ. ඔබ යාගයෙන් පසු සුන්දරිකා නදියෙහි නාති. මම නම් ඒ ඒ සත්ත්වයන් ආර්‍යාෂ්ටාංගික මාර්ග නැමැති දිය වළෙහි නාවමි. ඒ දිය වළට බස්නා තොට නම් සතර පිරිසිදු ශීලය යි. ඔබ නාන දිය වළෑ කීප දෙනෙකුන් නාන විට කැළැඹෙතත් මගෙ ආර්‍යාෂ්ටාංගික මාර්ග නැමැති දිය වළ අසංඛ්‍ය ගණන් සත්ත්වයන් නැමෙනුත් නො කැළඹෙයි. ඒ ම උතුම් වේ. උතුමන් විසින් ප්‍රශස්ත ද වේ . එහි නෑ ප්‍රඥාවත්හු කෙලෙස් දූලි ඉවත් කැර. ගැන්මෙන් පිරිසිදු ව නිවන් නැමැති පරතෙරට යත්. ආර්‍යාෂ්ටාංගික මාර්ගය බ්‍රහ්මචර්‍යාව යි. සැබෑ බ්‍රහ්ම භූමිය ශාශ්වත උච්ඡේද යන දෘෂ්ටි දෙකට අතරවූ මධ්‍යම ප්‍රතිපත්තිය පිරීමෙන් ම ලැබිය යුතු වේ. මෙසේ තිසිමග ගොස් සිතේ කෙලෙස් වංක ගතිය දුරු කැර ගත් සෘජු වූ රහත්නට නමස්කාර කරව. යටැ කී සේ ගුණ දම් වැඩීමෙන් සැබෑ උතුම් මාර්ගය ම වැඩූ තැනැත්තාට "ධර්මසාරී" (කුසල් දහමින් අකුසල් ඉවත යවා දුරුකොට සිටි) පුද්ගලයා යැ යි කියමි."

මේ වචන ඇසූ බමුණා ඉතා ප්‍රසන්න වැ, භාග්‍යවතුන් වහන්සේට ප්‍රශංසා කොට තෙරුවන් සරණ ගොස් පැවිදි ව උපසම්පදව ලබා, විදසුන් වඩන්නේ නොබෝ කලෙකින් රහත් වූයේ ය.

**පාළු වූ කෙතක් ඇති මිසදිටු බමුණකු පැහැදවීම**

මිසදිටු බමුණෙක් **අචිරවතී** ගඟ අද්දර කුඹුරක් ඉදි කෙළේ ය. පිඬු පිණිස වඩනා බුදුරජාණන් වහන්සේ ඔහු ගේ ගොයම් නැසෙන බව ද එයින් ශෝකයට පත් වන ඔහු බණ අසා සෝවාන් වන බව ද නුවණින් දැක, තද මිසදිටුවකු වූ ඔහු ගේ සිත ක්‍රමයෙන් මෘදු කරනු පිණිස, ඔහු බිම් නගන කෙතට වැඩි සේක. බමුණු තෙම භාග්‍යවතුන් වහන්සේ දැකත් තුෂ්ණිම්භූත විය. එහෙත් භාග්‍යවතුන් වහන්සේ ඔහු අමතා 'බ්‍රාහ්මණය, කුමක් කෙරෙහි දැ?'යි ඇසූ සේක. එ විට 'පින්වත් ගෞතමය, කෙතෙක් ඉදි කරමි'යි හේ කී ය.

වපුරන නෙළන කාලයන්හි ද ගොයම් රක්නා කල්හි ද බුදුරජාණන් වහන්සේ එහි වැඩ 'කුමක් කෙරෙහි දැ?'යි අසන සේක. බමුණා ද තමා කරන කටයුත්ත මේ මේ යැයි දන්වයි. යලි යලි එහි වැඩ තොරතුරු විචාරන බුදුරජාණන් වහන්සේට දිනෙක 'පින්වත් ගෞතමයිනි, බිම් ඉදි කරන කාලයේ පටන් කොට ඔබ මෙහි යලි යලි වැඩ පිළිසඳර කථා කරති. එ බැවින් මෙය පැසුණු විට ඔබටත් කොටසක් දෙමි. ඔබට නොදී නො කමි. ඔබ මෙතන් පටන් මගේ යහළුවෙකැ'යි බමුණා කී ය.

කල් යෑමේ දී ගොයම් පැසුණේ ය. 'හෙට ගොයම් කපන්නෙමි'යි සිතා සැරැසී සිටි නමුත් රෑ මහ වැසි වැස ගොයම් සියල්ල වැහි වතුරෙන් ඉදිරී ගසා ගෙන ගියෙන් කුඹුර සැස්සාක් මෙන් හිස් විය. පසු ද එය දුටු බමුණා හටගත් බලවත් ශෝක ඇත්තේ 'මම කුඹුර ඉදි කිරීමේ සිට ම ශ්‍රමණ ගෞතමයෝ මෙහි ආහ. ගොයම් පැසුණු කල එ තුමනට කොටසක් දෙන බව ද කීමි. අහෝ ! ඒ මා තුළ වූ බලාපොරොත්තු දැන් සුන් වී යැ'යි සිතමින් කෑම ද නො කා තැවි තැවී ඇඳෙක වැද හොත්තේ ය.

එදින බුදුරජාණන් වහන්සේ ඒ ගෙ දොරට වැඩි සේක. එ බව ඇසූ බමුණා උන් වහන්සේ කැඳවා 'ඉඳ ගන්නට සලස්වවු'යැ යි පිරිවර ජනයාට අණ කෙළේ ය. ඔහු ද එසේ කළහ. බුදුරජාණන් වහන්සේ ද වැඩහිඳ 'බ්‍රාහ්මණයා කොයි දැ?'යි ඇසූ සේක. 'යහන් ගැබැය'යි කී කල 'කැඳවා ගෙන එවු යැ'යි වදාළ සේක. ඉක්බිති එහි පැමිණි බමුණාට 'කිමෙක් ද බ්‍රාහ්මණ යැ'යි වදාළ සේක. බමුණා ද කෙත ඉදිකිරීමේ පටන් කොට සියල් පවත් කියා, 'මම කුඹුර පැසුණු නම්

ඔබට කොටසක් දෙමි’යි කීමි, එය ඉටු කළ හැකි නො වමි. ගොයම් නැසුණාටත් වඩා ඒ ගැන මහත් ශෝකයට පත් ව හිඳිමි’යි කී ය. ‘බ්‍රාහ්මණය, ශෝකයට හේතුව දන්නෙහිදැ?’යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළ සේක. ‘නො දනිමි, ඔබ දනිත් දැ’යි බමුණා ඇසුයේ ය. ‘එ සේ ය. මම දනිමි යි වදාරා ‘බ්‍රාහ්මණය, ශෝකය හෝ භය හෝ කුමක් වුවත් ඒ සියලු දුක තෘෂ්ණා හේතුයෙන් උපදී[204] යැ’යි වදාරා දම් දෙසා ඔහු සැනැසූ සේක. දේශනාවසානයේ දී බමුණා සෝවාන් පෙලෙහි පිහිටියේ ය.

**රජ්ජුමාලා**

උරුවෙල් දනව්වේ ගයා නුවර බමුණු ගෙයක දාසියක් වීය. ඒ ගෙයි බමුණා ගේ ලේලියට ඒ දාසිය නොරුස්සන්නී ය. දාසිය පෙනෙන විට ඇයට දැඩි කෝප ඇති වේ. ඇතැම් විට ඕ කිසි ම වරදක් නැතිව, කොංඩයෙන් අල්ලා ගෙන ඇයට තළයි. නිතර ම පාහේ කැරෙන මේ අතෝරය ඉවැසිය නො හී දවසෙක ඒ දාසී අම්බැට්ටයකු ලවා තම දික් කෙස් වැටිය සිඳුවා හිස බාවා ගත්තාය. ස්වාමිනී ඇය හිස මුඩු කරවා ගත්තිය දැක කලටත් වඩා කිපී ඇය බෙල්ලෙහි ලනුවක් බැඳ එයින් අල්ලා ගෙන තැළුවා ය. බෙල්ලෙහි මාලාවක් සේ නිතර එල්ලෙන ලනු පට ඇති බැවින් එ තැන් සිට ඕ **රජ්ජුමාලා** නම් වූවා ය. දවසෙක ඕ ස්වාමිනිය ගේ තැළුම් පෙළුම් ඉවැසිය නො හී වතුර ගෙනෙන්නට යන්නියක සේ කළය ගෙන නික්මුණා ය. වන ලැහැබකට ගොස්, ‘අනේ මෙහෙ ම ජීවත් වීමෙන් මට මොන ප්‍රයෝජනයක්ද? මෙ තැනම දිවි නසා ගන්නෙමි’යි සිතුවා ය. ඉක්බිති ලනුවක් ගහක බැඳ මල පුඩුවක් ද සාදා බෙල්ලෙහි වැල ලා ගන්නට සැරසෙන්නී, ළඟ කිසිවෙක් ඇද්දෝ යි හාත්පස බැලුවා ය.

ඒ දා පාන්දොර නුවණින් ලොව බලා වදාරන භාග්‍යවතුන් වහන්සේ ඇය එල්ලී මැරෙන්නට සැරසෙනු දැක, කලින් ම එහි වැඩ ගසක් මුලැ හුන් සේක. වට පිට බැලූ **රජ්ජුමාලා** රන් පැහැති සිරුරින් බබළමින් ගසක් මුල ඉන්නා භාග්‍යවතුන් වහන්සේ දෙස බලා ගත් වණ ම සිටින්නී සිය ඇස උන් වහන්සේ වෙතින් ඉවතට ගත නො හැකි වූවා ය. මහා කාරුණිකයන් වහන්සේ ඇයට කතා කොට, ‘දුවේ රජ්ජුමාලා, එල්ලී මැරෙන්න එපා! දුවේ මා වෙත එන්න.’ කියා අඬ ගසා වදාළ සේක. එය ඇසුණු කෙණෙහි ම ඇගේ සියලු දුක් අමතක විය. අමා දහරින් නැවුණු කලෙක සෙයින් ඇය සිත මහත් සැනැසුම් ඇති විය.

ඕ මහත් ම භක්ති ප්‍රේමයෙන් භාග්‍යවතුන් වහන්සේ වෙතට ගොස් පා පියුම් වැඳ පැත්තකට වී හුන්නාය. භාග්‍යවතුන් වහන්සේ ඇයට ධර්මාවවාද කළ සේක. නිවී ගිය සිතැති ඕ ඒ දහම් අසා සත්‍යාවබෝධය කළාය. සෝවාන් පෙලෙහි පිහිටියා ය. දිවි යතත් සතකු නො පෙළන, තම දිවි නසන සතුරනට ද මෙත් වඩන දයායෙන් පිරි ආර්යාවක් වූවා ය.

ඉක්බිති ඕ භාග්‍යවතුන් වහන්සේ වැඳ සමු ගෙන, 'මගේ ස්වාමිනිය මට ගැසුවත් මැරුවත් කමෙක් නැත. මගේ, දුවකට මෙන් ඇයට මෙත් වඩමි'යි ඉටා ගෙන, කළයෙන් පැනුත් ගෙන, 'සියලු සත්හු සුවපත් වෙත්වා'යි මෙත් වඩමින් ගේ අතට ගියා ය. ගෙහි ප්‍රධාන බමුණා මෛත්‍රීන් බබළන මුහුණැති ඇය දැක, ඇගේ මෙත් බලයෙන් වසඟ වූයේ, 'දුව, වතුර ගෙනෙන්නට ගොස් මෙතෙක් වේලා ගත කෙළේ හැයි ද? අද තිගේ මුහුණ ඉතා ම බබළයි. අද වෙනද සේ නොව ආදරයෙන් ගෙයි කටයුතු කරනු පෙනෙයි. මෙසේ වන්නට කරුණු කිම් දැ?'යි ඇසී ය. එවිට රජ්ජුමාලා කියන්නී, 'අද මම් ලොවෙහි එක ම පියාණන් වහන්සේ වූ බුදු රජුන් සරණ ගියෙමි. තුනුරුවනට දිවි පිදීමි. එ බැවින් ස්වාමිනිය මා මරතත් මෛත්‍රිය ම වඩමි. මගෙන් මෙයින් පෙර සිදු වූ වරදට කමා වුව මැනැවැ'යි කීවා ය. එයැසූ බමුණා 'අපේ බුදුරජාණෝ මහෝත්තම කෙනෙක. රජ්ජුමාලා හොඳ තැනැත්තියක් වූවා'යි සිතා තම ලේලිය වෙත ගොස් 'දුවේ, අදින් පස්සේ මගේ රජ්ජුමාලාට මොන ම පීඩාවක් වත් නො කරන්නැ'යි අවවාද කෙළේ ය.

ඉක්බිති ඔහු භාග්‍යවතුන් වහන්සේ වෙත ගියහ. ගොස්, උන් වහන්සේ වැඩම කරවාගෙන අවුත් මහත් භක්තියෙන් දන් වැළැඳැවූහ. භාග්‍යවතුන් වහන්සේ වැඩි බව අසා නුවර වැසියෝ එහි රැස් වූහ. රජ්ජුමාලාවට පීඩා කළ තරුණී ද අවුත් වැඳ පසෙක උන්නී ය. භාග්‍යවතුන් වහන්සේ සියලු දෙනා ගේ සිත් නිවමින් දම් දෙසූ සේක. තරුණ බැමිණිය ගේ සිත මොළොක් විය. ඕ තෙරුවන් කෙරේ මහත් සේ පැහැදුනා ය. හැම සතුන් කෙරේ මෙත් කුළුණු වඩන්නියක් වූවා ය. 'මෙයින් පසු රජ්ජුමාලා මා මැරුවත් ඇයට සිතින් වත් අවැඩක් නො සිතමි'යි ඉටා ගත්තීය. මහළු බමුණා ඉතා සතුටුවැ, 'රජ්ජුමාලා, අද සිට තෝ මගේ දසියක් නො වෙයි. අද සිට තෝ මගේ දුවෙකැ'යි කියා ඇය දූ තන්හි තැබී ය. තරුණ බැමිණි ද රජ්ජුමාලාවට එක් කුස උපන් සොහොයුරියකට මෙන් ආදරයෙන් සැලැකුවා ය.

# සූ සාළිස් වන පරිච්ඡේදය

**පුත්‍රයන් විසින් පිටමං කරන ලද අනාථ බමුණාකුට පිහිට වීම**

සැවැත් නුවර ධනවත් බමුණෙක් විය. ඔහු ගේ පුත්තු සතර දෙනෙකි. හේ වැඩි වයසට පත් ඔවුනට කුමරියන් ආවාහ කොට දී වස්තුයෙන් සාර ලක්ෂයක් ද දුන්නේ ය. කල් යෑමේ දී බැමිණි කලුරිය කළා ය. ඉන් පසු බමුණා ගේ පුත්තු සිවුදෙන 'පිය බමුණා අන් බිරියක ගෙන්වා දෙ'යි සැක කොට එයට පළමු ඔහු රවටා ඉතිරි ධනය ද තමන් අතට ගන්නා අදහසින් හැම පරිද්දෙන් ඔහුට උපස්ථාන කරන්නෝ ය. දිනක් බමුණා දවල් නින්දෙන් නැඟී සිටි කල ඔහු සිවු දෙන ඔහු ගේ අත් පා මිරිකන්නෝ, එක එකා වෙන වෙන ම ගිහි ගෙයි විසීමේ දොස් දක්වමින් 'මෙ පරිද්දෙන් ම දිවි ඇති තෙක් අපි ඔබට උපස්ථාන කරම් හ. ඉතිරි වස්තුවත් දුන මැනැවැ'යි කීහ. බමුණා ද එක එකාට ලක්ෂය බැගින් ඉතිරි ධනය ද සිවු දෙනාට බෙදා දුන්නේ ය. ටික දිනකින් කියා ලූ පරිදිම වැඩි මහළු පුත් ඔහුට උපස්ථාන කෙළේ ය. කිහිප දිනකට පසු දවසෙක නාගෙන ගෙට එන බමුණාට වැඩි මාළු පුතු ගේ භාර්‍යාව කථා කොට 'වැඩි මාළු පුතාට සීයක් හෝ දහක් වැඩි පුර දුන්නෙහි ද? කාටත් වස්තුව බෙදා දුන්නේ සරි සරියේ නො වේ ද? ඇයි ද? සෙසු පුතුන් ගේ ගෙවලට පාර දන්නේ නැද්දැ?'යි ඇසුවා ය. එය ඇසූ බමුණා කුපිත වැ 'වසලි' යැයි බැණ වැදී අන් පුතකු ගේ ගෙට ගියේ ය. එ තැනිනුත් ටික දිනක් උපස්ථාන ලත් පසු එ පුතු ගේ භාර්‍යාව ද අන් පුතකු වෙත යන්නට කීයෙන් හේ කුපිත වැ පෙර සේ ම බැණ වැදී තෙවෙනි පුතු කරා ගියේ ය. මේ ක්‍රමයෙන් පුතුන් සතර දෙනාගේ ගෙවලින් ටික ටික උපස්ථාන ලැබ ඉන් නෙරපන ලද්දේ අන්තිමේ දී කිසි ගේකට නොගැනුණේ, සිඟා කමින් කල් ගෙවී ය. කල් යෑමෙන් ඉතා ජරාවට දුර්වල බවට පැමිණි හෙ තෙම මැලැවී ගිය සිරුර ඇත්තේ, දිනෙක සිඟා අවුත් පිළෙක වැද හෙව නිද නැඟිට, තමාට වූ දෙය සිතා බලා, බුදුරජාණන් වහන්සේ වෙත ගියොත් පිහිටක් ලැබිය හැකියැ'යි සිතා, සිඟන භාජනයත් සැරමිටියත් ගෙන භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ පිළිසඳර කථා කොට සියලු පුවත් දැන්වූයේ ය. එවිට බුදුරජාණන් වහන්සේ 'බ්‍රාහ්මණය, එසේ නම් මේ ගාථා ඉගෙන බොහෝ දෙනා රැස් වන තැන පුතුන් ද පැමිණ හුන් කලැ කියන්නැ'යි වදරා ගාථා පසක් බමුණාට කට පාඩම් කැරවූ සේක:

**යෙහි ජාතෙහි නන්දිස්සං - යෙසං ච භවමිච්ඡිසං**
**තෙ මං දරෙහි සම්පුච්ඡ - සා'ව වාරෙන්ති සූකරං**
**අසන්තා කිර මං ජම්මා - තාත තාතාති භාසරෙ**
**රක්ඛසා පුත්තරූපෙන - පජහන්ති වයොගතං**
**අස්සො'ව ජින්නො නිබ්භොගො - ඛාදනා අපනීයති**
**බාලකානං පිතා ථෙරො - පරාගාරෙසු භික්ඛති.**
**දණ්ඩො'ව කිර මෙ සෙය්‍යො - යං මෙ පුත්තා අනස්සවා**
**චණ්ඩම්පි ගොණං වාරෙති - අථො චණ්ඩම්පි කුක්කුරං**
**අන්ධකාරෙ පුරෙ හොති - ගම්භීරෙ ගාධමෙධති**
**දණ්ඩස්ස ආනුභාවෙන - ඛලිත්වා පතිතිට්ඨති".**

බමුණා ද මේ ගාථා ඉගෙන බ්‍රාහ්මණයන්ගේ රැස්වීමකට තම පුතුන් සැරසී අවුත් හුන් කල සභා මධ්‍යයට ගොස් අවසර ගෙන ඒ ගාථා ගැයී ය.

---

**ගාථාවල තේරුම :-** උපන් යම් කෙනෙකුන් කරණ කොට සතුටු වීම් ද, ඒ යම් කෙනෙකුන් ගේ දියුණුව පැතීම් ද, එ මගේ පුත්‍රයෝ සිය බිරියන් හා සාකච්ඡා කොට ඌරකු වළක්වන (හඹවන) සුනඛයකු සේ මා වළක්වත් (හඹවත්)

ලාමක වූ අසත්පුරුෂ වූ දරු වෙසින් සිටි එ රාක්ෂයෝ මට පියාණෙනි පියාණෙනි යි කීහ. එහෙත් ඔහු දැන් වයෝගත වූ මා අත්හරිත්.

ජරායෙන් දැදුරු වූ පරිභෝගයට අයෝග්‍ය වූ අශ්වයා කෑමෙන් ඉවත් කරනු ලබන්නාක් මෙන් එ බාලයන් ගේ පිය වූ මහලු තෙම කෑමෙන් ඉවත් කරන ලදුව අන් ගෙවල්හි සිඟයි.

මගේ පුත්‍රයෝ යම් හෙයකින් මට යටත් පැවතුම් ඇත්තෝ නොවෙත් ද, එ හෙයින් ඔවුනට වඩා සැරයැටිය ම උතුම්. කුමක් හෙයින් ද? සැරයටිය චණ්ඩ ගවයා වළක්වයි. රෞද්‍ර වූ සුනඛයා ද වළක්වා ලයි.

අඳුරේ යන විට පෙරටු වෙයි. ගැඹුරු දියෙහි යෑමේ දී පිහිට ලබා දෙයි. (පැකිලී වැටෙන්නට යන විට) සැරයැටියේ උපකාරයෙන් පිහිටා (නො වැටී) සිටී. එ හෙයිනි.

ඒ කාලයෙහි `පොහොසත් කම ඇති ව සිට සිය මවුන් පියන් නො රක්නහු නැසිය යුතු ය` යි පණතෙක් විය. එ හෙයින් ගාථා ඇසූ බ්‍රාහ්මණ පුත්‍රයෝ සිවු දෙන බියපත් ව පියා ගේ පා මුලැ වැටී `පියේ, අපට ජීවිතය දුන මැනැවැ`යි යාච්ඤා කළහ. බමුණු ද මෘදු වූ සිත් ඇති වැ `මගේ පුතුන් නො නසවු. ඔහු මා රක්නහ යි` කීය. එහි සිටියෝ ද `මින් පසු පියාට උවටන් නො කළොත් තොප වනසන්නමු`යි කියා ඔවුන් බිය ගැන්වූහු. ඔහු ද බිය ව පියා පුටුවෙක හිඳුවා තුමූ ම ඔසොවා ගෙන ගොස් බොහෝ සත්කාර කොට සිය බැමිණියනට ද ඔහුට මනා සේ සත්කාර කරන ලෙස අණ කළහ. මනා ආහාරපානාදියෙන් සංග්‍රහ ලබන බමුණා කීප දිනෙකින් ම සුවපත් වූයේ, හටගත් කාය බල හා පිනා ගිය ඉඳුරන් ඇත්තේ, `මේ සැපත මට ලැබුණේ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ගේ උපකාරයෙන් ය`යි සලකා දිනෙක ත්‍යාග පිණිස වස්ත්‍ර යුගලක් ගෙන භාග්‍යවතුන් වහන්සේ වෙත ගියේ ය. ගොස් සුව දුක් කථා කොට පසෙක හිඳ, වස්ත්‍ර යුගලය භාග්‍යවතුන් වහන්සේ ගේ පා මුල තබා, `ගුරු පඬුරු වශයෙන් මෙය පිළිගත මැනැවැ`යි කීයේ ය. භාග්‍යවතුන් වහන්සේ ද ඔහු කෙරේ කරුණායෙන් එය පිළිගත් සේක. පිළිගෙන ඔහුට දම් දෙසූ සේක. දේශනාවසානයෙහි බමුණු තෙම උපාසක භාවයෙහි පිහිටා, ගෞතමයන් වහන්ස, මගේ පුතුන් සිවු දෙනා ගෙන් මට නිති බත් සතරෙක් ලැබේ. ඉන් දෙකක් ඔබට දෙන්නෙමි`යි කීය. බුදුරජාණන් වහන්සේත්: `හොඳයි බමුණ, අදහස් කරන තැනකට එන්නමෝ වේ දැ`යි වදාළ සේක. බමුණා ගෙට ගොස් පුතුන් අමතා `දරුවනි, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මගේ යහළුවෝ ය. උන් වහන්සේට මම නිති බත් දෙකක් දුනිමි. තෙපිත් උන් වහන්සේ තොපගේ ගෙවලට වැඩි කල පමා නො වවු`යැ යි කීය. ඔහුද මැනැවැ යි පිළිගත්හ.

භාග්‍යවතුන් වහන්සේ පසු දා පිඬු පිණිස වඩනා සේක් බමුණා ගේ වැඩි මාළු පුතු ගේ ගෙදොරට වැඩි සේක. හෙතෙම භාග්‍යවතුන් වහන්සේ දැක වහා ගොස් පාත්‍රය ගෙන, ගෙට වැඩම කරවා අගනා අස්නෙක වඩා හිඳුවා, ප්‍රණීත භෝජනයෙන් සත්කර කෙළේ ය. බුදුරජාණන් වහන්සේ දෙවෙනි දවස් දෙවෙනි පුතු ගේ ගෙට දැ යි මෙසේ පිළිවෙළින් බමුණු පුතුන් සිවු දෙනාගේ ම ගෙවලට වැඩි සේක. ඔහු ද මනා සේ සත්කාර කළහ. දිනෙක වැඩි මාළු පුතු ගේ උත්සවයෙක් විය. මංගල භෝජනය කාට දෙමු දැ`යි හෙ තෙමෙ පිය බමුණුහු විචාළේය. `ශ්‍රමණ ගෞතමයන් වහන්සේ අපේ යහළුවෝ ය. උන්

වහන්සේ මිස වෙන දිය යුතු කෙනකු නො දනිමි'යි බමුණු කීය. එ සේ නම් පන්සියක් භික්ෂූන් සහිත ව ගෙට වඩින්නට නිමන්ත්‍රණ කළ මැනැවැ යි කීයෙන් බමුණා ද එසේ කෙළේ ය. දෙවෙනි දා ශාස්තෘන් වහන්සේ භික්ෂු සංඝයා සහිත වැ වැඩි සේක. වැඩි මාළු බමුණු පුත් තෙම මොනොවට සරසා ලූ ගෙහි උන් වහන්සේ වඩා හිඳුවා දිය නො මුසු මිහිරි කිරි බතින් හා ප්‍රණීත ඛාද්‍යයෙන් සංග්‍රහ කෙළේ ය. වළඳන අතර බමුණු පුත්තු සතර දෙනා භාග්‍යවතුන් වහන්සේ සමීපයේ හිඳ, 'ගෞතමයන් වහන්ස, අපි අපේ පියා පෝෂිත කරම්හ. එහි පමාවෙක් නැත. අප පියා ගේ පෙර සැටිත් දැන් සැටිත් බලා වදාළ මැනැවැ'යි කීහ. භාග්‍යවතුන් වහන්සේ ද 'ඒ යහපත, මාපිය උවටන නම් පෙර නුවණැත්තන් පුරුදු කළ උතුම් ගුණ ධර්මයෙක් මැ'යැ යි වදාරා, **මාතු පෝසක නාගරාජ ජාතකය** විස්තර කොට දම් දෙසූ සේක. ඉන් පසු චතුස්සත්‍යයන් ප්‍රකාශ කළ සේක. දේශනාවසානයේ බමුණා ද, ඔහුගේ පුත්තු සතර දෙන ද, ඔවුන් ගේ භාර්‍යාවෝ සිවු දෙන ද යන නව දෙන ම සෝවාන් වූහු.

**දුප්පත්ගොවියකු රාජ දණ්ඩනයෙන් මුදාලීම**

එක් රැයෙක සොර මුළෙක් ඈවැත් නුවර පෝසත් කෙනෙකු ගේ ගේකට උමගක් කැණ ගෙට වැද ධනය රැගෙන යනුවෝ, කුඹුරකට ගොස් ඒ සොරකම් කළ දෑ එහි දී බෙදාගත් හ. යුහු සුලුව ඔවුන් ඒවා බෙදා ගෙන නැගිට යන විට එකකු අතින් දහසින් බැඳි පියල්ලෙක් බිමැ වැටිණ.

අලුයම්හි බුදුරජාණන් වහන්සේ ලොව බලා වදාරන සේක් පසු දා උදේ යටැ කී කුඹුර සාන්නට එන දුප්පත් ගොවියාට ඒ රන් පියල්ල නිසා වන අන්තරාය දුටු සේක. දැක එහි යන්නට අදහස් කළ සේක.

සිරිත් පරිදි ගොවියා උදාසනින් කුඹුරට ගියේ ය. බුදුරජාණන් වහන්සේත් අනඳ තෙරුන් හා එහි වැඩි සේක. ගොවියා අවුත් වැඳලා සී සාන්නට පටන් ගත්තේ ය. බුදුරජාණන් වහන්සේ රන් පියල්ල වැටී තිබුණ තෙනට වැඩ අනඳ තෙරුනට එය පෙන්වා 'ආනන්දය, සර්පයා දුටු දැ'යි ඇසූ සේක. 'එ සේ ය, දිටිමි'යි අනඳ තෙරණුවෝත් කීහු. එ ඇසූ ගොවියා උන් වහන්සේ එ තැනින් වැඩි පසු කැවිට ගෙන එ තැනට ගියේ, එහි සර්පයකු නො ව රන් පියල්ලක් දැක, 'සර්පයනට මෙන් ළං නො විය යුතු හෙයින් බුදුරජාණන් වහන්සේ මෙය සර්පයකු කොට

වදාළ සේකැ'යි සිතා එය තුබුණු තැන තිබෙන්නට නැර, තමා සොරකම් නො දන්නා හෙයින් එ ළඟ ම තබා සාන්නට වන්නේ ය. උදේ වස්තු හිමියෝ සොරුන් උමං බිඳ බඩු ගෙන ගිය නියාව දැක, සොයා ඇවිදුණෝ, එ කුඹුරට පැමිණියහ. එහි දී සොරුන් වස්තු බෙදා ගෙන ගිය බව දැක, පරීක්ෂා කරන්නෝ එක් තැනෙක තුබුණු රන් පියල්ල දැක සමීප කෙතෙහි සිටි ගොවියා සොරෙකැ'යි බැඳ කොසොල් රජු වෙත ගෙන ගියහ. රජ එ පවත් අසා ඔහු මරන්නට නියම කළහ. රාජ පුරුෂයන් විසින් තළ තළා වධ ස්ථානයට පමුණුවනු ලබන හෙතෙම බුදුරජුන් වදාළ බස් සිහි කොට, 'ආනන්දය, සර්පයා දුටු දැ?'යි වදාළ වචනයත් 'එ සේය වහන්ස, දිටිමි'යි කී අනඳ තෙරුන් ගේ කථාවත් කිය කියා ගියේ ය. රාජ පුරුෂයෝ ඒ අසා 'තෝ කුමක් කීයෙහිදැ?'යි ඇසූහ. 'රජ්ජුරුවන් ළඟට ගෙන ගියොත් කියන්නෙමි'යි ගොවියා කී ය. 'ඔහු රජු වෙත ගොවියා ගෙන ගොස් එ පවත් කිවූය. රජ 'තගේ මේ කථාවේ තේරුම කිම් දැ?'යි විචාළේ ය. හෙතෙම තමා සොරකු නො වන බවත්, බුදුරජාණන් වහන්සේ එහි වැඩි බව ආදී සියලු ප්‍රවෘත්තියත් කී ය. රජ තෙම 'බුදුරජාණන් වහන්සේ සාක්ෂ්‍යකාරයකු කොට කියන සැටියෙන් මොහුගේ වරදක් කිය නො හැක්ක. කළ යුත්ත මම දනිමි'යි කියා ඔහු තමා වෙත රඳවා ගත්තේ ය. සවස ඒ පුරුෂයා හා භාග්‍යවතුන් වහන්සේ වෙත ගියේ ය. ගොස් වැඳ පසෙක හිඳ 'ස්වාමීනි, මූ සානා තෙනට අද භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් හා වැඩි සේක් දෝ'යි විචාළේ ය.

'එසේ ය, මහරජ ගියම්හ'යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

'එහි දී කුමක් වදාළ සේක් දැ'යි රජ පුළුවත.

දහසින් බැඳි පියල්ල දැක තමන් වහන්සේ වදාළ වචනයත් අනඳ තෙරුන් කී වචනයත් වදාළසේක.

එ විට රජ 'වහන්ස, මේ අහිංසකයා වෙනුවට සාක්කියට ඔබ වහන්සේ වැනි කෙනෙක් නො වූහු නම් අද මොහු දිවි නැත. ඔබ වහන්සේ ගේ වචනය නිසා අද මොහු ගේ දිවි රැකුණේ යැ'යි කී ය.

එ බසට භාග්‍යවතුන් වහන්සේ වදාරන සේක්, 'මොහු ඒ පියල්ල නො ඇල්ලුවත් වස්තු හිමියෝ මොහු අල්ලා ගන්නෝ යැ'යි වදාරා,

'පසු තැවිල්ලට හේතු වන දැ නො කට යුතු ය' යන්න මාතෘකා කොට දම් දෙසූ සේක.[205] ඒ ගොවි තෙම සෝවාන් විය. රැස් ව සිටි බොහෝ ජනයාට දේශනාව සාර්ථක විය.

**ද්‍රෝණ බමුණාට වදළ බණ**

එක් දවසක් භාග්‍යවතුන් වහන්සේ **උක්කට්ඨා** නුවරටත් **සේතව්‍යා** නුවරටත් අතර මහ මඟින් වඩනා සේක් රුක් සෙවණකට වැඩ ටික වේලාවක් විවේකී ව හුන් සේක. මේ වේලාවේදී ඒ මඟින් යන **ද්‍රෝණ** නම් බමුණෙක් එහි කිසි තැනෙක භාග්‍යවතුන් වහන්සේ ගේ අඩි සටහන දුටුයේ ය. අන් අයගේ පිය සටහන්වලත් මෙහිත් වෙනසක් දැක විමසනුයේ 'මෙය නම් අපූරු එකෙක. මෙය කාගේ පිය සටහනෙක් දැ'යි විපරම් කරනුයේ, ඒ අහළ රුක් සෙවණෙක වැඩ ඉන්නා භාග්‍යවතුන් වහන්සේ දිටී ය. 'පෙර කිසි කලෙක නොදුටු විරූ අපූර්ව රූපශෝභායෙන් යුත් ශාන්ත පෙනුමක් ඇති මේ තැනැත්තා කවරෙක් දැ?'යි දැනගනිමි'යි සිතා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළැඹ කථාකරනුයේ,

'ඔබ දෙවියෙක් දැ?'යි ඇසී ය.

'නැත'යි උත්තරය විය.

'ඔබ ගාන්ධර්වයෙක් ද?'

'නැත,'

'ඔබ යක්ෂයෙක් ද?'

'නැත.'

'ඔබ මනුෂ්‍යයෙක් ද?'

'නැත.'

භාග්‍යවතුන් වහන්සේ දුන් උත්තරවලින් ඔහුට කිසිත් වටහාගත නො හැකි වැ, 'මා ඇසූ හැම ප්‍රශ්නයටම ඔබ නැතැ'යි කියති. ඔබ ඒ කී 'දෙවි ආ කිසිවෙකුත් නො වෙත් නම් කවරෙක් දැ?'යි යළිත් බමුණා ප්‍රශ්න කෙළේ ය.

'ඔබ කියන දේව ගාන්ධර්ව යක්ෂ මනුෂ්‍ය යන නම් ලබන අය තුළ පවත්නා ආස්‍රව (කෙලෙස්) කිසිවකුත් මා තුළ නැත. එ බැවින් මම් ඒ කිසිවෙක් නො වෙමි. ඔවුන් තුළ පවත්නා ඒ සියලු ආස්‍රවයෝ මුලින් ම නැසූ, දත යුතු සියල්ල අවබෝධ කළ මම් 'බුද්ධ' නම් වෙමි. දියෙහි හැදුණු වැඩුණු නෙළුම් මල් දියෙන් ඉහළ නැඟ දිය ස්පර්ශ නො කොට (වතුරේ නො ගැවී ) සිටුනා සේ, ලොවැ මිනිසුන් මැද උපන්නත් ඔවුන් කෙරෙහි පවත්නා කෙලෙස් දුරු කොට ඔවුන්ගෙන් ඉහළ නැඟ ඔවුනට නොබැඳී සිටිමි. එසේ වූ මා බුද්ධ නැමැ'යි දත යුතු යැ'යි වදළ සේක. බමුණා පැහැද බුදුරජුන් සරණගිය උපාසකයෙක් වී ය.

# පන් සාළිස් වන පරිච්ඡේදය*

**මිසදිටු ළමයින් සමූහයක් පැහැදවීම**

එක් සමයෙක අන්‍ය තීර්ථකයන් ගේ උපාසකවරු තම පුත්‍රයන් බෞද්ධෝපාසකයන් ගේ දරුවන් හා රැස් ව ක්‍රීඩා කරන්නවුන් දැක ඔවුන් ගෙට ආ විට 'තොප ශාක්‍යපුත්‍රීය ශ්‍රමණයනට වැඳුම් පිදුම් නො කළ යුතුයි, ඔවුන් ගේ විහාරයට වත් නො යා යුතු යැ'යි කියා එය නොකරන ලෙසට ඔවුන්ගෙන් දිවුරුම් ගත් හ. දිනක් ඒ ළමෝ ජේතවන විහාර දෙරටුව සමීපයෙහි පිටත රැස් ව සෙල්ලම් කළහ. ක්‍රීඩා කොට වෙහෙසී පිපාසිත වූ ඔහු 'නුඹ ගොස් පැන් බී අපටත් ගෙනෙන්නැ'යි කියා එක් බෞඩ දරුවකු විහාරයට යැවූ හ. හෙ තෙම විහාරයට වැද බුදුරජාණන් වහන්සේ වැඳ පැන් බී, පැන් ගෙන යන්නටත් ඕනෑ බව දැන්වී ය. එ විට බුදුරජාණන් වහන්සේ 'නුඹ ගොසින් එහි සෙසු ළමයිනුත් පැන් බොන්නට මෙහි ම එවන්නැ'යි වදළ සේක. හෙ තෙමේ ද එ සේ ම කෙළේ ය. බුදුරජාණන් වහන්සේ එහි පැන් බීමට ආ මිසදිටු ළමුන් කැඳවා ධර්ම කථායෙන් අවවාද කොට පහදවා තිසරණ පන්සිල්හි පිහිටුවා ලූ සේක. එ ළමෝ ගෙවලට ගොස් එපවත් මා පියනට කීහ. ඔහු 'අපේ දරුවෝ නො මඟැ ගියහ'යි දොම්නස්ව හැඬුවෝ ය. සමීප ගෘහවාසීහු අවුත් ධර්මාවවාද කොට ඔවුන්ගේ ශෝකය නිවූ ය. ඔහු ද සතුටු ව 'මේ ළමුන් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ට ම දෙම්හ'යි මහත් නෑ සමූහයා හා එක් ව ඒ දරුවන් විහාරයට ගෙන ගොස් බුදුරජාණන් වහන්සේ ට බාර කළහ. බුදුරජාණන් වහන්සේ ද ඔවුනට දම් දෙසූ සේක. දේශනාවසානයෙහි එ සියලු මිසදිටු පිරිස තිසරණයෙහි පිහිටා බෞද්ධෝපාසක වූහ. ඉක්බිති ඔහු නැවත බණ දහම් ඇසීමෙන් නුවණ මුහුකුරුවා සෝවාන් පෙළෙහි පිහිටියහ.

**ගරඬියකු පෙළූ ළමයිනට දම් දෙසීම**

බුදුරජාණන් වහන්සේ දිනක් සැවැත් නුවර පිඩු පිණිස වඩිනා සේක්, ළමුන් සමූහයක් එක් ගරඬියකුට දංඩෙන් පහර දෙනු දැක, 'දරුවනි, තෙපි කුමක් කරවු දැ?' යි ඇසූ සේක.

'අපි මේ සර්පයාට දංඩෙන් පහර දෙමු'යි ඔහු කීහ.

'එ ඇයි දැ?'යි බුදුරජාණන් වහන්සේ පුළුවුත් සේක.

'මූ දෂ්ට කරන බැවින් යැ'යි ළමෝ පිළිතුරු දුන්හ.

---

* මේ පරිච්ඡේදයේ ඇතුළත් ප්‍රවෘත්තීන් සම්බන්ධ වර්ෂ නියමයක් කට නොහැකියි.

එවිට බුදුරජාණන් වහන්සේ "**දරුවෙනි, තමනට සැප පහසු සිදු කරන අදහසින් සතකු පෙළීමෙන් උපනුපන් තන්හි තෙපි සැපයක් නම් නො ම ලබන්නහු ය. තමන් ගේ සැප පතමින් අනුනට හිංසා පීඩා වධ බන්ධන කිරීම හරි නැතැ**"යි[206] වදරා අවවාද කළ සේක. දේශනාවසානයේ දී සියලු ළමෝ සෝවාන් පෙළෙහි පිහිටියා හ.

**කුමාර කාශ්‍යප මාතෘ, දෙව්දත් තෙරුන් පිට මං කළ මෙහෙණියක්**

රජගහ නුවර එක් සිටු දූවක් පැවිදිවනු කැමැත්තී මා පියන් ගෙන් එයට අවසර ඉල්ලූහ. එයට ඔහු කැමැති නො වූහ. නැවැත සිටු පුතකුට ඇය පාවා දෙන ලදු වැ කලක් පති කුලයෙහි වුසූ තැනැත්තී ගබ් ගත්හ. කුසයෙහි දරුවකු පිළිසිඳ ගත් බව නොදත් ඕ සැමියා ගෙන් පැවිදි වීමට අවසර ඉල්ලුවා ය. සිටු පුත් තෙම සතුටු ව මහත් සත්කාර සහිත ව ඇය මෙහෙණින් කරා පමුණුවා පැවිදි කැරැවීය. කල් යෑමේ දී මෙහෙණිහු ඈ ගර්භිණී බව දැන 'මේ කිම්දැ?'යි ඇසූහ. ඕ තොමෝ 'ආයසීාවනි, මේ කෙසේ වී දැ?යි නො දනිමි. මගේ ශීලය ඒකාන්තයෙන් පිරිසිදු යැ'යි කීවා ය. මෙහෙණිහු ඇය දෙව්දත් තෙරුන් කරා ගෙන ගොස් එ පවත් දැන්වූහු. තමා ගේ අවවාද පරිදි පිළිපදිනා මෙහෙණිනට ඇය හේතු කොට ගෙන අපකීර්තියක් විය හැක්කැ 'යි සිතා 'ඇය සිවුරු හරවා පිට මං කරවු'යැ යි දෙව්දත් තෙරණුවෝ මෙහෙණිනට අණ කළහ. එය ඇසූ තරුණ මෙහෙණි තොමෝ 'ආයසීාවනි, මා සිවුරු නො හරවවු. මම දෙව්දත් තෙරුන් උදෙසා පැවිදි නො වීමි. වැඩිය මැනැවි. මා ජේතවනයට ශාස්තෘන් වහන්සේ ගේ සමීපයට ගෙන යනු මැනැවැ'යි කීවා ය. මෙහෙණිහු ද ඇය ගෙන ගොස් භාග්‍යවතුන් වහන්සේට එ පවත් දැන්වූහු. බුදුරජාණන් වහන්සේ ඇය ගිහි කලැ ම දරුගබ පිහිටි බව දත් නමුත් අන්‍යයන් ගේ අපවාදයක් ඇති නො වනු පිණිස පසේනදී කොසොල් රජු ද මහ අනේපිඩු සිටු සුලු අනේපිඩු සිටු විශාඛා උපාසිකා ආදී ප්‍රභූන් ද කැඳවා භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිවු පිරිස මැද දී කාරණය විනිශ්චය කරන්නට විනයධර **උපාලි** තෙරුනට අණ කළ සේක. උපාලි තෙරහු රජු ඉදිරිපිට දී ම විශාඛාව කැඳවා මෙහෙණිය පරීක්ෂා කිරීම ඇට පැවැරූ හ. විශාඛා තොමෝ වට තිර ඇද මෙහෙණිය එහි ඇතුළට කැඳවා තොමෝ ම පරීක්ෂා කොට දින ගණන් බලා, ඇය පැවිදි වන්නට පෙර ලත් දරු ගබක් බව දැන, තෙරුනට එ පවත් දැන් වූහ. ඉක්බිති තෙරහු මෙහෙණිය ගේ නිර්දෝෂත්වය එ සභාවේ දී ප්‍රකාශ කළහ. 'නඩුව විසැඳූ සැටි යහපතැ'යි· කියා බුදුරජාණන් වහන්සේ සාධුකාර දුන් සේක.

මෙසේ ඒ මෙහෙණියට දෙව්දත් තෙරුන්ගේ දුර දිග නො බැලීමත් අනුකම්පාවත් හේතු කොට, වන්නට ගිය අන්තරායේ දී බුදුරජාණන් වහන්සේ පිහිට වූ සේක. පසු වැ ඈට ලැබුණ දරුවා පසේනදි කොසොල් රජහු රජ ගෙදරට ගෙන්වා පෝෂිත කරවන ලද්දේ ය. **කාශ්‍යප** යනු ඒ දරුවාට තබන ලද නම විය. වැඩුණු හෙ තෙම යලි යලි `මවු කවුරු දැ?`යි විචාරන්නේ, ඔහු රවටන්නට උත්සාහ කොටත් නො රැවැටිය හැකි වූ රජු විසින් `ඕ අසවල් මෙහෙණියැ`යි කියන ලද වචනය අසා පැවැදි වනු කැමැත්තේ, රජු ගෙන් අවසර ඉල්ලුයේ ය. රජු එ කුමරු සරසා භාග්‍යවතුන් වහන්සේ වෙත ගෙන ගොස් පැවිදි කැරැවීය. ළදරු කලැ මහණ වූ බැවින් බුදුරජාණන් වහන්සේ `කාශ්‍යපයා කැඳවන්නැ. මේ එල මේ කැවිලි කාශ්‍යපයාට දෙන්නැ`යි වදරන සේක. එවිටැ, `කුමන කාශ්‍යපයාට දැ?`යි භික්ෂූහු අසත්. කුමාර කාශ්‍යපයාට යැ යි භාග්‍යවතුන් වහන්සේ වදරන සේක. එ හෙයිනුත් රජ ගෙහි කුමරකු වශයෙන් ඇති දැඩි වූ හෙයිනුත් පසු කාලයේ දී හෙතෙම **කුමාර කාශ්‍යප** නමින් ප්‍රකට විය.

හේ මහණ වූ ද පටන් විදසුන් වැඩීමෙහි ව්‍යාවෘත විය. බුඩ වචනය ද උගත්තේ ය. පසු කලෙක අන්ධ වනයේ වසන එ හෙරණ වෙත එක් මිත්‍ර බ්‍රහ්මයෙක් පැමිණ ප්‍රශ්න තුදුසක් තබා ඒ වා බුදුරජාණන් වහන්සේ ගෙන් විචාරන්නට නියම කොට ගියේ ය. හේ ද එය කෙළේ බුදුරජාණන් වහන්සේ එකී ප්‍රශ්න විසඳීම් වශයෙන් දෙසූ ධර්මය අසා රහත් වූයේ ය. කුමාර කාශ්‍යපයන් වහන්සේ පැවිදිවූ ද සිට දොළොස් වර්ෂයක් ම මවු මෙහෙණි පුතු සිහි කරමින් විටින් විට කඳුළු වැගුරුවා ය. මෙසේ වසන ඕ තොම පුතුගෙන් වෙන් වූ ශෝකයෙන් කඳුළින් තෙත් වූ මුහුණ ඇති ව පිඩු පිණිස හැසිරෙන්නී දිනක් වීථිය මැද දී පුත්‍ර තෙරුන් දැක, `පුතා පුතා`යි කියා හඬමින් තෙරුන් දෙසට දුවන්නී පය පැකිලී වැටුණා ය. නැවැත පුත්‍ර ස්නෙහයෙන් දෙ තනින් කිරි වගුරුවමින් නැගිට කිරෙන් තෙත් වූ සිවුරු ඇත්තී ගොස් තෙරුන් ඇල්ලුවා ය. ස්ථවිර තෙම, මෑදු වචනයක් මගෙන් නොලදොත් මැය ශෝකයෙන් මිය යතැ`යි සලකා,

`මැණියනි, මේ කුමක් කරමින් ඇවිදින්නහු ද? තව ම ගේහසිත පුත්‍ර ස්නේහය වත් දුරු කළැකි නුවූහු ද?` යන ආදීන් කියා අවවාද කෙළේ ය.

එයින් ප්‍රබුඩ වූ සිතැති ඕ තොම ගේහසිත ප්‍රේමය දුරු කොට විවසුන් වඩා එ දින ම රහත් වූහ.

පසු දිනෙක 'මේ වැනි හේතු සම්පන්න කුමාර කාශ්‍යපයාණෝත් මුත් වහන්සේ ගේ මෑණියෝත් දෙව්දත් තෙරුන් විසින් පිට මං කරන ලද්දෝ ය. භාග්‍යවතුන් වහන්සේ වනාහි මෙ දෙ දෙනාට ම පිහිට වූ සේක. අහෝ! බුදුවරු ලොවට අනුකම්පා කරන්නෝ යැ'යි දම්සබා මඩුයෙහි භික්ෂූන් ගේ කථාවෙක් පහළ විය.

භාග්‍යවතුන් වහන්සේ එහි වැඩ එ පවත් අසා පෙරත් තමන් වහන්සේ ඔවුනට පිළිසරණ වූ බව ප්‍රකාශ කිරීම් වශයෙන් **නිග්‍රෝධමිග ජාතකය** වදාළ සේක.

**වාශිෂ්ඨී**

විසාලා මහනුවර කුල ගෙයෙක **වාශිෂ්ඨී** නම් තරුණියක් වූවා ය. වැඩිවිය පැමිණි ඕ තොම කුලපුතකුට පාවා දෙන ලද්දී ය. සුවසේ වසන ඒ ස්ත්‍රී කල් යැමේදී පුතකු ලැබුවා ය. යම්තම් දිවැ ඇවිද සෙල්ලම් කරන කාලයෙහි ඒ දරුවා මෙළේ ය. වාශිෂ්ඨී තොමෝ දරුවා මළ ශෝකයෙන් පීඩිත වූවා. උමතු වූවා ය. ඇගේ උමතුව සුව කිරීම පිණිස නෑයෝ නොයෙක් පිළියම් කළහ. දිනක් ඒ උමතු ස්ත්‍රී කිසිවකුටත් නො දන්වා ගෙන් නික්ම ගොස් තැන තැන මුළාව ඇවිදිනි මියුලු නුවරට පැමිණියා ය. බුදුරජාණන් වහන්සේ ද එ දවස මියුලු නුවර වැඩි සේක් වීථියෙහි දී ඇය විසින් දක්නා ලද සේක. දුටු කෙණෙහි බුඩානුභාව හේතුයෙන් ඇගේ උමතු බව දුරු විය. ඇයට ප්‍රකෘති සිහිය ලැබුණේ ය. ඉක්බිති බණ අසා ගිහි ගෙයි කලකිරී බුදුරජාණන් වහන්සේ ගෙන් අවසර ගෙන මෙහෙණි සස්නේ පැවිදි වූවා ය. උත්සාහවත් ව විදසුන් වඩන ඕ තොම නො බෝ කලෙකින් සිවු පිළිසිඹියාවන් හා රහත් බව ලැබුවා ය.

**පාටාචාරා**

සැවැත් පුර සිටුවරයකු ගේ දුවක් ගෙයි මෙහෙකරුවකු හා රහසින් මිත්‍ර වැ සිට දිනෙක ගෙන යෑ හැකි තරම් ධනයත් ගෙන ඔහු සමග පැන ගොස් ඈත ගමෙක වුසුවා ය. කල් යෑමේ දී ගර්භිණී වූ ඕ තොම දරු ගබ මේරූ කල මා පියන් වෙත යෑමට සැමියාට පෙරැත්ත කළා ය. 'අද යම්හ, හෙට යම්හ'යි කිය කියා හෙ තෙම කල් ගත කෙළේ ය. දිනෙක ඕ තොම තමා මා පියන් වෙත ස්වාමියා ගෙන නො යන බව සිතා, ඔහු ගෙයි නැති වේලාවක් බලා අසල් වැසියනට තමා මා පියන් වෙත යන බව කියා, හුදෙකලා ව නික්ම ගියා ය. ගෙට ආ සැමියා එ පවත් අසා 'අහෝ මා නිසා මේ කුල දුව අනාථ වූවා යැ'යි කණගාටුවට පත් ව යුහුව ගොස් ඇයට සම්මුඛ විය. මඟ දී පුත්‍ර ප්‍රසූතිය විය. එ හෙයින්

ඒ ස්ත්‍රී කුල ගෙට නො ගොස් සැමියා හා ආපසු ම ආවා ය. නැවැත දෙවැනි වරෙකත් ගර්භිණී වූ ඕ තොම වදන කාලය ළංව තිබැද්දී පෙර සේ ම මා පියන් වෙත යන අදහසින් නික්මුණා ය. සැමියා ඇය සොයා ගොස් දැක ඇය හා සැවැත් නුවර බලා ගමන් කෙළේ ය. එදා රෑද මගදී සිටු දූව පුතකු වැදූවා ය. තද අකල් වැස්සට ද ඔහු අසු වූහ. 'ස්වාමීනි, නො තෙමී ඉන්නට තෙනක් පිළියෙළ කළ මැනැවැ'යි ස්ත්‍රිය විසින් කියන ලද යථෝක්ත පුරුෂ තෙම පඳුරක් දැක එහි ගොස් අත තුබුණ කැත්තෙන් එක් රුකෙක අත්තක් කැපූයේ ය. ඒ කෙණෙහි ඒ රුක යට තණකොළින් වැසුණු තුඹසින් සර්පයෙක් පිට වී අවුත් ඔහු දෂ්ට කෙළේ ය. පුරුෂ තෙම ඒ තැන ම වැටී මළේ ය. ස්ත්‍රී මහත් දුකින් ඔහු ගේ ඊම බලාපොරොත්තු වන්නී වැස්සට තෙමී හඬන දරුවා බඩතුරෙහි කොට දෙ දනින් හා දෑතින් ම බිම වැතිර එළි වන තුරු ම ඉතා දුකින් උන්නා ය. එළි වූ කල බාල දරුවා අත් දෙකින් ලෙහි හොවාගෙන වැඩි මාළු පුතු හා සැමියා ගිය අතට යන තෙනැත්ති, මළා වූ ඔහු දැක විලාප කියා හඬ හඬා යන්නී, රෑ වැස්සෙන් තන මත්තක් උසට පිරී ගලන නදියක් වෙත පැමිණියා ය. එගොඩ යනු කැමැති ඕ තොම නුවණ මඳ බැවිනුත් දුර්වල බැවිනුත් දරු දෙදෙනාම එක විට ගෙන යන්නට බියව පළමු කොට කුඩා දරුවා ගෙන ගොස්, ඒ ගොඩැ අත්තක් බිම අතුරා එහි රෙදි කඩෙක හොවා, වැඩි මාළු පුතු ගෙන යනු පිණිස ගහට බැස නැවැත හැරී ආ පසු බල බලා යන්නී, ගඟ මැදට පැමිණියා ය. ඒ කෙණෙහි උකුස්සෙක් බලා දරුවා මස් කැටියකැ'යි සිතා ඒ අතට ආයේ ය. ඒ දුටු ඈ අත් ඔසොවා 'සූ සූ' යැ යි තුන් වරක් ශබ්ද කළා ය. ඈත බැවින් උකුසු තෙම එය නො තකා ළදරුවා ඩැහැ ගෙන ඉගිලී ගියේ ය. අත් ඔසොවා ශබ්ද කළා දැක මෙ ගොඩ හුන් වැඩි මාළු දරුවා මවු තමාට අඩ ගැසූහ යි සිතා වහා දියට පැන්නේ සැඩ පහරට අසු විය.

ඉක්බිති ඒ ස්ත්‍රී 'එක් පුතකු උකුස්සෙක් ගෙන ගියේ ය! අනෙකා ගං වතුරට අසු වී ය! මග දී සැමියා මළේ යැ!'යි හඬමින් වැලැපෙමින් යන්නී, සැවැත් නුවර සිට එන මිනිසකු දැක 'කොයි සිට එයි දැ?'යි ඇසූ ය. සැවැත් පුර සිට එන බව කී විට, සැවැත්හි අසුවල් වීථියෙහි අසුවල් පවුලේ තොරතුරු දන්නෙහිදැ?'යි ඇසූවා ය. 'දනිමි. එහෙත් එය හැර වෙන යමක් ඇසුව මැනැවැ'යි හේ කී ය. 'අනෙකක් මට ඕනෑ නැත. එය ම විචාරමි'යි ඕ කීවා ය. එවිට හෙ තෙම 'ඊයේ රෑ වැස්ස දුටු දැ?'යි ඇසී ය. 'දිටිමි. මමත් එයින් තෙමුණෙමි. මගේ තොරතුරු පසු ව කිය හැකි, සිටු පවුලේ ප්‍රවෘත්තිය කියන්නැ'යි ඕ අයැදූවා ය.

`රෑ වැස්සෙන් සිටු ගෙය කඩා වැටුණු බවත්, පිටාණන් ද ඔහු ගේ භාර්‍යාව ද පුත්‍රයා ද යන ති දෙන ම එයට යට වී මළ බවත්, ති දෙන ම එක දර සෑයෙහි දැවෙන බවත් කියා දර සෑයේ දුම ද පෙන්වී ය. ඒ කෙණෙහි ඇගේ ශෝකය වඩ වඩා දියුණු වූවෙන් ඇඳි වත ලිහී වැටෙන බව වත් සලකා ගත නො හැකි තරම් උමතු වූවා ය. එයින් පසු ඕ

`අහෝ මා දරුවෝ මළහ! සැමියා මග දී මළේ ය ! මෑණියෝත් පියාණෝත් සහෝදරයාත් එක ම දරසෑයේ දැවෙත්`යැ යි විලාප කියමින් බිම සැපි සැපි හඬ හඬා ඒ මේ අත දුව පැන ඇවිද්දා ය. එ තන් පටන් ඇට නිරුවතින් ඇවිදිනා බැවින් පටාචාරා* යන නම ඇති විය. මිනිස්සු ඒ උමතු ස්ත්‍රිය දැක `පිස්සිය දිවපියැ`යි කියමින් ගල් මුල් ආදියෙන් ගසා පලවා හැරියහ. හඬමින් වැළපෙමින් ඒ මේ අත දිව පැන ඇවිදුනා ඇය රහත් වීමට තරම් මේරූ පින් ඇත්තියක බව දුටු බුදුරජාණන් වහන්සේ ඇට විහාරය දෙසට එන්නට සැලැස්සූ සේක. හඬා වැලපෙමින් විහාරය දෙසට එන ඇය දුටු පිරිස `පිස්සියට මෙහි එන්නට නො දෙවු`යැ යි කියා ඇගේ ගමන නවතා ලන්නට තැත් කළහ. භාග්‍යවතුන් වහන්සේ `ඇගේ ඊම නො නවත්වවු`යැ යි වදාරා, ඇය සමීපයට ආ විටැ `නැගැණියනි, සිහි උපදවා ගන්නැ`යි වදාළ සේක. බුඬ තේජස් හේතුයෙන් ඕ ප්‍රකෘති සිහිය ලැබ තමා වස්ත්‍ර රහිත බව දැන විළි ඇති ව උත්කුටුක වැ බිම වැතිර හිඳ ගත්තී ය. එක් මිනිසෙක් තමාගේ උතුරු සළුව ඇය වෙතට වීසි කෙළේ ය. එය හැඳ ශාස්තෘන් වහන්සේ වෙත පැමිණ පසඟ පිහිටුවා වැඳ `ස්වාමීනි, මට පිහිට වුව මැනැව. මාගේ පුතකු උකුස්සෙක් ගෙන ගියේ ය. පුතෙක් දියේ වැටී නැසුණේ ය. මා පියෝත් සහෝදරයාත් කඩා වැටුණු ගෙට යටවී මළාහු එක දරසෑයෙහි ම දැවෙත්` යැ යි කීවා ය. මහා කාරුණිකයන් වහන්සේ ඇයට වදාරන සේක් `පටාචාරා, කනගාටු නො වන්න. උපකාර ලබා ගත හැකි තෙනට ම තෙපි ආවහු ය. තෙපි දැන් පුත්‍රාදීන් මළ සොවින් කඳුළු වගුරුවහු, මෙසේ ම පෙරත් අනවරාග්‍ර සංසාරයෙහි අනන්ත ජාතිවලැ පුත්‍රාදීන් මළ ශෝකයෙන් තොප වගුළ කඳුළු රැස සතර සාගරයේ ජලයටත් වැඩි[207] ය`යි වදාරා ධර්මාවවාද කළ සේක. එය ඇසීමෙන් ඇගේ ශෝකය තුනී විය. ඉක්බිති `පටාචාරාවෙනි, පරලොව යන්නාට පිහිට වන්නට පුත්‍රාදීහු සමත්

* අපට වාරා`යැ යි කිය යුත්ත `පට-අවාරා` යැ යි වී පටාචාරා` යැයි හැඳින් වූ බව පෙනේ.

නොවෙත්' යන ආදීන් වදාරා නුවණැත්තා විසින් ශීල ශුද්ධිය ඇති කොට ගෙන නිවන් මග ම සිඬ කටයුතු [208] යැ'යි අවවාද කොට දම් දෙසූ සේක. දේශනාවසානයේ දී ඕ සෝවාන් පෙලෙහි පිහිටා පැවිද්ද ඉල්ලුවා ය. භාග්‍යවතුන් වහන්සේ ඇය මෙහෙණියන් වෙත යැවූ සේක. පටාචාරා තොමෝ එහි පැවිදි උපසපන් ව උත්සාහයෙන් විදසුන් වඩන්නී දිනෙක බුදුරජාණන් වහන්සේ වදාළ ගාථාවක් අසා නුවණ මුහුකුරුවා පිළිසිඹියා හා රහත් බව ලැබුවා ය.

**පුණ්ණා දාසී** අනේපිඬු සිටුහු ගේ ගෙයි දාසියකට දුවක් ලැබුණා ය. ගණනින් දාසීන් සියය සම්පූර්ණ කරමින් උපන් ඇට පුණ්ණා යැ යි නම් කළහ. වැඩුණු ඕ තොම **සීහනාද සූත්‍ර දේශනාව** අසා සෝවාන් වූවා ය. ඕ උදක ශුද්ධික බමුණකු උදේ සවස දියේ ගැලී ගොඩ නැගෙන්නහු දැක ඔහු ගේ ක්‍රියාව නිෂ්ඵල බව කියා දී බමුණා හික්මැවූවා ය. බමුණු තෙම පැහැදී තිසරණ පන්සිල්හි පිහිටා පසු කලැ ශාසනයෙහි පැවිදි ව කමටහන් වඩා රහත් වී ය. බමුණා හික්මැ වූ ප්‍රවෘත්තිය අසා සතුටු වූ සිටු තෙම ඇය දාස බැවින් මිදූයේ ය. ඉක්බිති ඕ මෙහෙණි සස්නේ පැවිදි ව විදසුන් වඩා නො බෝ කලෙකින් සිවු පිළිසිඹියා හා රහත් බව ලැබූහ.

**කෘශා ගෞතමී** සැවැත් පුර දුප්පත් පවුලෙක **ගෞතමී** නම් ස්ත්‍රියක් වූවා. මඳක් කෘශ බැවින් ඕ කෘශා ගෞතමී නමින් ප්‍රකට වූවා ය. ඇය ගේ ස්වාමි කුලයෙහි අය දූගී තෙනැත්ති යැ යි ඇයට නිග්‍රහ කළහ. එහෙත් පුතකු ලැබුණු තන් සිට ස්වාමි කුලයේ කවුරුත් ඇයට සැලැකිලි දැක්වූහ. ඒ දරුවා යම්තම් ඇවිද සෙල්ලම් කළ හැකි තරම් වයසේදී කළුරිය කෙළේ ය. එයින් ඕ බලවත් ශෝකයට පැමිණියා ය. ශෝකාතුර වූ ඕ තොම දරුවාගේ මළ සිරුර ඇකයෙන් ගෙන දුටු දුටු අය ගෙන් බෙහෙත් ඉල්ලමින් ඇවිද්දා ය. 'මළ කඳට මොන බෙහෙත් දැ'යි කියමින් මිනිස්සු අත් පොළසන් දෙමින් සිනා සුණහ. ඕ වනාහි සිහි එළවා ගත නො හැකි වූවා ය. එක් නුවණැති පුරුෂයෙක් කාරණය තේරුම් ගෙන 'අම්ම, ඔබේ දරුවාට බෙහෙත් දෙන්නට බුදුරජාණන් වහන්සේ මිස අන් කිසිවෙක් නො දනී. උන් වහන්සේ ළඟැ විහාරයෙහි වසන සේක. එහි යන්නැ'යි කියා ඇය බුදුරජාණන් වහන්සේ වෙත යැවූයේ ය. කෘශා ගෞතමී තොම ජේතවනාරාමයට පැමිණ ධර්මාසනාරූඪ වූ භාග්‍යවතුන් වහන්සේ දැක දරුවාට බෙහෙතක් දෙන ලෙස යාච්ඤා කළා ය. ඇය රහත් වන්නට හේතු සම්පත් ඇති බව දුටු භාග්‍යවතුන් වහන්සේ 'ගෞතමිය, බෙහෙත්

සඳහා මෙහි තොපා ආවා යහපති. දැන් නුවරට ගොස් එහි කොනෙක සිට මුළු නුවර ම ඇවිද වත් කිසි කළෙක මරණයක් නො වූ ගෙයකින් අබැටක් ගෙනෙන්නැ'යි වදාළ සේක. ඕ ද සතුටු ව නුවර වැද එහි මුල්ගෙට ම පැමිණ තම දරුවාට බෙහෙත් සඳහා බුදුරජාණන් වහන්සේ වෙත ගෙන යෑමට අබැටක් ඉල්ලුවා ය. ඔහු ද එය ගෙනවුත් දුන්හ. එ විට ඕ 'මෙහි කවුරුත් පෙර නො මළෝ දැ?'යි විචාළා ය. 'මේ මොනවා කියයි ද? මෙහි මළවුන් ගණන් කරන්නට කාටවත් බැරි තරම් යැ'යි ගෙ වැසියෝ කීහ. 'එහෙනම් මෙය එපා. භාග්‍යවතුන් වහන්සේට ඕනෑ කෙළේ කිසිවකු නො මළ ගෙයෙකින් අබ ඇටෙකැ'යි කියා එයින් නික්මැ තවත් ගෙවල් දෙකකට ගියා ය. එ දෙ තැනැ දී ද 'මේ ගෙයි මෙපමණ මෙපමණ නෑදෑ මිත්‍රාදීහු මළහ' යන වචනයෙක්ම අසන්නට ලැබුණේ ය. තෙ වැනි ගෙට යෑමෙන් පසු කාරණය තේරුම් ගෙන 'මුළු නුවර ම ඇවිද්දත් කිසිවකු නො මළ තැනෙක් නො ලැබෙන්නේ ය. හිතානුකම්පා ඇති බුදුරජාණන් වහන්සේ මට කාරණය වටහා ලීමට නො මළ ගෙයෙකින් අබැටක් ගෙනෙන්නට වදාළ සේකැ'යි සිතා ශෝකය දුරු කොට එ තැනින් ම පිටත් ව සොහොන් පිට්ටනියට ගොස් පුතු ගේ මළ කඳ අතින් ගෙන 'පුත, මේ මරණය ඔබට පමණක් වූයේ යැ'යි මම සිතීමි. එ සේ නො වේ. මරණය නම් කාටත් පොදු වූ ස්වභාවයෙක් යැ'යි කියා එය සොහොනෙහි දමා භාග්‍යවතුන් වහන්සේ වෙත ගියා ය. එ විටැ බුදුරජාණන් වහන්සේ 'ගෞතමිය, අබැටෙක් ලැබුණේ දැ'යි විචාළ සේක. 'ස්වාමීන් වහන්ස, අබැටෙන් කළ යුත්ත ඉවර ය. ඔබ වහන්සේ මට පිහිට වුව මැනැවැ'යි කීවා ය. බුදුරජාණන් වහන්සේ මරණය සර්ව සාධාරණ බව වදාරා "**මහ වතුරක් නිදන ගම්වැසි සමූහයා ගසා ගෙන යන්නා සේ පුත්‍ර ගව මහිෂාදීන් ඇති බැවින් මහත් වූ පස් කම්හි ඇලුණු සිතැති පුද්ගලයා මරණයට හසුවේ**"යැ යි වදාළ සේක. ධර්ම දේශනාවසානයේ දී ඕ තොමෙ සෝවාන් ව පැවිද්ද ඉල්ලුවා ය. බුදුරජාණන් වහන්සේ එයට අවසර දුන් සේක. ඕ ද මෙහෙණියන් වසන ආරාමයට ගොස් පැවිදි වූවා ය. යළි උපසම්පදාව ලබා විදසුන් වඩා නො බෝ කලෙකින් රහත් වූවා ය.

**කුෂ්ට රෝගාතුරයකුට උපස්ථානයක්**

සැවැත් නුවර කුලපුත්‍රයෙක් බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා පැහැද පැවිද්ද හා උපසම්පදාව ලැබුයේ, තිස්ස ස්ථවිර නමින් ප්‍රසිධ විය. කලක් ගිය තැන උන් වහන්සේට කුෂ්ට රෝගයෙක් වැළඳුණේ ය. මුලින් අබ ඇට පමණින් පටන් ගත් පිළිකාවෝ ක්‍රමයෙන් වැඩී අන්තිමේදී බෙලි

ගෙඩි තරම් ලොකු වී බිඳුණාහ. එයින් මුළු ශරීරය ලේ සැරොව ගලන ලොකු කුඩා සිදුරු රාශියකින් වැසී ගියේ ය. මෙසේ රෝගය අසාධ්‍ය විය. ඇඳි පෙරෙව් සිවුරු ලේ සැරොවින් ඇඟේ බැඳී ගියේ ය. වෙහෙර වැසි සියල්ලෝ උපස්ථාන කළ නො හැකි ව උන්වහන්සේ හැර දමා [illegible]න් වූහ. මෙසේ ඒ ස්ථවිර අනාථව හුදෙකලා ව හොත්තේ ය. අලුයමෙහිත් සැන්දෑවෙහිත් නුවණින් ලොව බැලීම බුදුවරයන් ගේ සිරිතකි. ඒ දා නුවණින් ලොව බලා වදාරන බුදුරජාණන් වහන්සේ අනාථ ව හෝනා තිස්ස ස්ථවිරයන් වහන්සේ රහත් වීමට හේතු සම්පත් ඇති බව දුටු සේක. දැක 'මා මිස මෙ භික්ෂුවට පිළිසරණ වීමට සමත් අනෙකෙක් නැතැ'යි සලකා විහාර චාරිකායෙහි යෙදුණු සේක්, තිස්ස තෙරුන් ඉන්නා විහාරයට පැමිණි සේක. පැමිණ ගිනිහල් ගෙට වැඩ සැළියක් සෝ දා දියෙන් පුරා ලිප තබා වතුර උණු වන තුරු එහි ම සිටි සේක. රත් වූ පසු ලෙඩ භික්ෂුව වෙත පැමිණ ඒ භික්ෂු හොත් ඇඳ ඔසොවා ගෙනෙනු පිණිස එහි කෙළවරක් ගත් සේක. ඒ කෙණෙහි එය දුටු භික්ෂූහු 'ස්වාමීනී, ඉවත් වුව මැනැවි. අපි මෙය ගෙනෙන්නම්හ'යි කියා ඇඳ ඔසොවා ගිනිහල් ගෙට ගෙනාහ. ඉක්බිති බුදුරජාණන් වහන්සේ සිවුරු සෝදන ඔරුවක් ගෙන්වා එහි උණු දිය වත්කරවා කුෂ්ඨ රෝගී භික්ෂුව හැඳි පෙරෙව් සිවුරු උණු දිය ඉස සෝදවා මඳ අව්වේ වැනැවූ සේක. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ ම ඒ රෝගී භික්ෂුව ළඟට වී ඔහු ඇඟ උලා උණු දියෙන් නැවූ සේක. ස්නානාවසානයේ දී පොරෝනා සිවුර වේලුණෙන් එය හඳවා හැඳි සිවුර සෝදවා වැනැවූ සේක. තෙරුන් ගේ ශරීරයෙහි තෙත සිඳුණ විට, අව්වේ ලැවූ සිවුරු ද වේලී ගියෙන් එය ගෙන්වා දුන් සේක. ඒ ස්ථවිර තෙම එක් සිවුරක් හැඳ එකක් ඒකාංශ කොට පොරොවා හැල්ලු වූ ශරීර ඇත්තේ එකඟ සිතින් ඇඳෙහි හොත්තේ ය. බුදුරජාණන් වහන්සේ තෙරුන් ගේ ඉස පැත්තේ සිට ශරීරයේ අනිත්‍ය බව අසාර බව ප්‍රකාශ කොට බණ වදාළ සේක[210] දේශනාවසානයේ දී ඒ ස්ථවිර තෙම නුවණ මුහුකුරුවා සිවු පිළිසිඹියා සහිත රහත් බව ලබා නො බෝ වේලාවෙකින් පිරිනිවන් පෑයේ ය. තවත් බොහෝ දෙන සෝවාන් ආදී මාර්ග ඵලවලට පැමිණියහ. බුදුරජාණන් වහන්සේ තෙරුන් ගේ ශරීරය ආදාහන කරවා ධාතූන් ගෙන්වා චෛත්‍යයක් කැරැවූ සේක.

**කුක්ෂිරෝගී භික්ෂුවකට උපස්ථාන කිරීම**

එක්තරා විහාරයෙක භික්ෂු නමක් බඩ රුජායෙන් පෙළුණේ, කිසි උපස්ථානයකුත් නැත්තේ, දොරට පිළට වත් යෑ නො හැක්කේ, තමා ගේ මලමුත්‍රයෙහි ම ගැලී

හොත්තේ ය. භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් හා භික්ෂූන් වසන සේනාසනවලට වඩිමින් ඔවුනට අවවාද දීම් ආදිය කෙරෙමින් හැසිරෙන සේක්, යටැ කී ලෙඩ භික්ෂුව ගේ සේනාසනයට ද පැමිණි සේක. එහි පැමිණ 'භික්ෂුව, අසනීපය කිමෙක් දැ'යි වදාළ සේක. 'ස්වාමීනි, බඩ රුජාවෙකැ'යි හේ කී ය. 'උපස්ථායකයෙක් නැද්දැ'යි ඇසූ සේක. 'නැත වහන්සැ'යි හේ කී ය. 'කවර හෙයින් දැ'යි ඇසූ සේක. 'මම කිසිවකුට සත්කාර නො කෙළෙමි. එ හෙයිනැ'යි ඒ භික්ෂු කීය.

එ විට භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුනට වතුර ගෙනෙන්නට වදාළ සේක. තෙරුණුවෝ එය කළහ. භාග්‍යවතුන් වහන්සේ රෝගී භික්ෂුවට දිය වත් කළ සේක. අනඳ තෙරණුවෝ ඔහු ඇඟ සේදූහ. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ එ භික්ෂු හිස පැත්තෙන් ද, අනඳ තෙරණුවෝ පා පැත්තෙන් ද ගෙන ඔසොවා ඇඳෙක සැතැප්පූ හ.

භාග්‍යවතුන් වහන්සේ ඉන් නික්ම වැඩ භික්ෂූන් කැඳවා අනාථ භික්ෂුව ගේ තතු විචාරා 'මහණෙනි, යුෂ්මත්නට උපස්ථාන කරන මවක් පියෙක් නැත. යුෂ්මත්හු ම ඔවුනොවුනට උපස්ථාන නො කරවු නම් අන් කවුරු උපස්ථාන කෙරෙත් ද?

**'මහණෙනි, යමෙක් ගිලනාට උපස්ථාන කෙරේ නම් හේ මට උපස්ථාන කරන්නේ ය. මගේ වචනය පිළිපදින්නේ යැ'යි** වදාළ සේක.[211]

ඉක්බිති ග්ලානෝපස්ථාන කළ යුතු සැටි ද, ග්ලානෝපස්ථකයා තුළ විය යුතු ගති ගුණ ද වදාරා එයින් වැඩි සේක.

# සසාළිස් වන පරිච්ඡේදය

**කෝලිය මහාමාත්‍ය සමාගමය**

බරණැස් නුවර සමීපයෙහි නුවරට බටහිර දිගගංගා නදියෙන් එ ගොඩ **වාසභගග්ගාම** නම් ගමෙක් විය. එයට නොදුරු **චුන්දත්ථිකගග්ගාම** නම් ගමැ එක් මුව වැද්දෙක් විය. හේ වල් වැද මුවන් මරා, අඟුරෙහි පළහා කා සෙස්ස කද බැඳ ගෙන ගෙට යේ. බාල දරුවෝ ගම්දොර දී ඔහු දැක ළඟට දිව මස් ඉල්ලති. හේ ඔවුනට මස් ටික ටික දී යෙයි.

දිනෙක වැදි තෙම මස් නො ලැබ ඇසළ මලක් පැළඳ මල් රැසක් අතින් ගෙන එන්නේ පුරුදු පරිදි මස් ඉල්ලා ආ දරුවනට මල් පොකුර බැගින් දී ගියේ ය. හේ මැත භාගයෙහි මළේ ප්‍රෙත යෝනියෙහි උපන්නේ ය.

ඒ ප්‍රේත තෙම වනාහි නග්න ය. විරූප ශරීර ඇත්තේ ය. භය ජනක දර්ශන ඇත්තේ ය. ආහාර පාන නො මැත්තෙන් නිතර සා පවස් දෙකින් පීඩිත ය. එහෙත් හිස පැළඳි ඇසළ මල් කළඹක් ඇත්තෙකි.

දිනෙක හේ 'නෑයන් වෙතින් කිසි ආහරයක් ලැබිය හැකිදෝ'යි සිතා ගංගා නදිය මත්තෙන් උඩු ගංගා බලා යන්නේ ය. එ සමයෙහි කෝලිය මහාමාත්‍ය නමින් ප්‍රකට බිම්සර රජහු ගේ ඇමතියෙක් පිටිසර බද දනව්වෙක කැරැල්ලක් සංසිඳුවා, බලසෙන් ගොඩින් යවා තෙමේ නැවෙකින් ගංගා නදියෙහි යටි ගං බලා එයි. හේ යටැ කී ප්‍රේතයා දැක්කේ ය. දැක, ඔහු තතු විචාළේ ය. හේ තමා වූන්දපථික ගමට නෑයන් දක්නට යන බව කීය. ඇමති තෙම ඔහු 'ප්‍රේතයෙකැ'යි දැන හත් සුණු ද බත් ද රත්වත් වස්ත්‍ර දෙකක් ද නැවෙහි සිටි කපුවකුට දෙවා එහි පින් ඔහුට පැමිණැ වී ය. ප්‍රේත තෙම පින් අනුමෝදන් කොට ගත්තේ, පුණ්‍ය ඵල වශයෙන් දිව්‍ය අන්නපාන හා වස්ත්‍ර ලැබී ය.

කෝලිය මහාමාත්‍ය නැවින් එන්නේ පසු ද සූර්යෝදය සමයෙහි බරණැසට සම්ප්‍රාප්ත විය. භාග්‍යවතුන් වහන්සේ ද ඒ ඇමැතියා ප්‍රමුඛ පිරිසට අනුග්‍රහ පිණිස අහසින් වැඩ ගංතෙර සිටි සේක. මහාමාත්‍ය තෙම එ දැක සතුටු ව නැවින් ගොඩ බැස භාග්‍යවතුන් වහන්සේ නිමතා එ කෙණෙහි කොළ මඩුවක් තනවා වියන් බඳවා සුවඳ මල් ආදියෙන් පිදී ය. ඉක්බිති හේ පසෙක හිඳ තමාට එද්දී හමු වූ ප්‍රේතයා සම්බන්ධ ප්‍රවෘත්තිය කියා ඔහුට පින්පෙත් සඳහා දන් දෙන බව දැන්වී ය.

භාග්‍යවතුන් වහන්සේ 'භික්ෂු සංඝ තෙම වඩිවා 'යි අධිෂ්ඨාන කළ සේක. එ කෙණෙහි භික්ෂු පිරිස ද බුද්ධානුභාවයෙන් මෙහෙයන ලද්දේ සෘද්ධියෙන් අවුත් එහි භාග්‍යවතුන් වහන්සේ පිරිවරා හුන් හ.

'අද මහත් ධර්ම දේශනාවක් වෙතැ'යි සලකා මහ ජනයා ද එහි රැස් වූහ. එය දැකීමෙන් ඔද වැඩී ගිය සිතැති මහ මැති තෙම බුද්ධ ප්‍රමුඛ සංඝයා මනා ව වැළැඳැවී ය.

භාග්‍යවතුන් වහන්සේ දන් වළඳා ඉක්බිති 'බරණැස සමීපයේ ගම්හි වැස්සෝ ද පැමිණෙත් වා'යි ඉටු සේක. බුද්ධර්ද්ධි බලයෙන් ඒ මහජනයා ද රැස් විය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔවුනට බොහෝ ප්‍රේතයන් පෙනෙන්නට සලස්වා ඔවුන් ලවා ම ඔවුන් ගේ ප්‍රේත ව ඉපදීමට හේතු වූ අකුසල් ද කියැවූ සේක.

තමන්ගේ පව් හෙළි කරන ඒ ප්‍රේතයන් ගෙන් ඇතැම් කෙනෙක් තමන් ඊර්ෂ්‍යා මානාදියෙන් කල් ගෙවූ සැටි ද, ඇතැම් කෙනෙක් තමන් ගෘහ ස්වාමි ස්වාමිනීන් ව ඉඳත් දනක් පිනක් නො කළ සැටි ද, ඇතැම්

කෙනෙක් තමන් මිහිරි ආහාර පාන වර්ග ලබා යාචකයනට කිසිත් නො දී කමින් බොමින් ආත්මම්භර වැ මැ කල් යැවූ සැටි ද, ඇතැම් කෙනෙක් තමන් ප්‍රතිග්‍රාහකයනට කිසිත් දෙමිනුත් ඔවුනට අවමන් කළ සැටි දැ යි මෙ ආදීන් කළ පව්වල විපාක තමන් විඳිනා සැටි කියා පෑහ.

මෙය අසා සංවේගයට පත් කෝලිය මහාමාත්‍ය ප්‍රමුඛ මහා සමූහයාට භාග්‍යවතුන් වහන්සේ චරිතානුකූල ධර්ම දේශනාවෙකින් අවවාද කළ සේක. දේශනාවසානයෙහි සුවාසූ දහසක් ප්‍රාණීනට ධර්මාවබෝධය විය.

**සුලසා නගර ශෝභිනී**

රජගහ නුවර මහධන සිටුවරයෙක් වී. හේ සිප්සතර ඉගැන්ම සිය පුතුට මහත් වෙහෙසට කරුණු යැ යි සිතුයේ, ඔහුට කිසි සිප් සතරක් නො මැ ඉගැන්වී ය. සුකුමාර ව වැඩී තුරුණු විය පත් සිටු පුතුට එ වැනි ම ධනවත් කුලයෙකින් සිටු දුවක ආවාහ කොට දුන්හ.

ඔහු මාපියන් මළ පසු සුරාධූර්තාදීන් පිරිවරා ගෙන නැටුම් ගැයුම් ආදියෙහි ගැලී කිසි ගුණධර්මයෙක නොයෙදී කල් යැවූහ. එයින් සියලු ධනය විනාශ කොට ගෙන දුගී බවට පත් වූහ. ඔවුන් සතු සියලු කෙත් වත් ආදිය ණය හිමියන් සතු විය.

එක් කලෙක දෙව් කුමරකුත් දිව්‍යප්සරාවකත් ලෙසින් කල් යැවූ එ දෙදෙන, රැකෙන්නට අත් මහක් නැති ව කබල් ගත් අත් ඇත්තෝ, සිඟා කමින් දිවි රකිමින් අනත් හලෙක වුසූ හ.

දිනෙක සොරු එ සිඟන්නහු දැක `භවත, තට මේ දුඃඛ ජීවිතයෙන් මොන අත්ථියෙක් ද? තෝ ජවබල ඇත්තෙක, අප හා එකතුව සොරකමින් දිවි රකුව `යි කීහ. `මම සොරකම නො දනිමි`යි සිටුපුත් කීය. `අපි තට සොරකම් උගන්වන්නමු. තෝ අප කියනා දැයක් ම කරව`යි සොරු කීහ. හේද සොරුනට එක් විය.

දිනෙක සොරු ගෙයක් බිඳ ගෙට වන්නෝ `අත් කිසිවක් හු ආවොත් මින් ගසා මරව`යි සිටුපුතු අතට පොල්ලක් දී ගෘහ සන්ධිය සමීපයෙහි සිටුවූහ. සොරු වනාහි බඩු ගෙන පලා ගියහ. යථොක්ත මූඪ සිටුපුත් පිටතින් කිසිවකුගේ ඊම ම බලා එහි සිටි යේ, කලබල ව ඒ මේ අත දුවන ගෘහ ස්වාමීනට හසු විය. ඔහු සිටු පුතුට දඬු මුගුරින් බැට දී, ගෙන ගොස් රජුට දැක් වූහ. රජු නඩු අසා ඔහු වධයට පමුණුවන ලෙස නගර ගුප්තික ඇමැතියාට අණ කෙළේ ය.

පිටිතල හයා බැඳ වද බෙර ගසමින් වධ භූමියට පමුණුවනු ලබන ඒ පුරුෂ තෙම සිය පායේ ජනෙල් කවුළුයෙන් නුවර දිසාව බලන සුලසා නම් නගර ශෝභිනියක විසින් දක්නා ලද්දේ ය. ඕ පෙර ඔහු හා පුරුදු වාසය ඇත්තී ඔහු හැඳින 'අහෝ මෙ තෙම මෙ වැනි අනතුරකට පැමිණියේ යැ'යි අනුකම්පා උපදවා අග්ගලා සතරකුත් පැනුත් මෙහෙකරුවකු අත ඔහුට යවා, මොහුට මේ අග්ගලා කා පැන් බොන තුරු ස්වාමීහු පොරොත්තු වෙත් වා 'යි කියා නගර ගුත්තිකයාට ද දන්වා යැව්වා ය.

මේ අතුරෙහි මුගලන් තෙරණුවෝ දිවැසින් ලොව බලනුවෝ වධයට නියත වූ කළ පිනක් නැත්තෙන් මරණින් මතු අපාය ගත වන ඔහු දැක, කරුණායෙන් මෙහයුණ සිතැත්තෝ, 'මොහුගෙන් දන් ලබා අන්තිම මොහොතේ සැනසිල්ලක් ඇති කොට සුගතිගාමී කරන්නෙමි'යි සිතා එහි වැඩියාහ.

ඒ පුරුෂ තෙම තමා වෙත පැමිණි මුගලන් තෙරුන් දැක පැහැදී 'දැන් මරණයට නියත මට මේ අග්ගලායෙන් කවර වැඩෙක් ද? මෙයින් තෙරුන් පුදමි. ඒ පින පරලොව යන මට මහ වියදම් වන්නේ යැ'යි සිතීය. එ සේ සිතා එයින් තෙරුන් පිදීය. තෙරණුවෝ ඔහු සිතේ පැහැදීම වඩනු පිණිස ඔහුට පෙනෙන තැනෙක හිඳ එය වැළඳූහ.

සිටු පුත් නො බෝ වේලායෙකින් වධකස්ථානයට පමුණුවන ලද්දේ හිස සිඳ මරන ලද්දේ ය. මළ හෙ තෙම එක් පර්වත ප්‍රදේශයක මහ නුග රුකෙක රුක් දෙවියෙක් ව උපන්නේ ය.

දිනෙක යටැකී සුලසා තොමෝ උයනට ගියා ඒ රුක් දෙවියා විසින් දක්නා ලද්දී ය. රුක් දෙව් ඇය පිළිබඳ සිතැතිව අඳුරක් මවා ඇය සිය විමනට ගෙන ගියේ ය. ඇයට සිය තොරතුරු ද කී ය.

සුලසාව ගේ මව ඇය නො දැක හඬමින් සොයා ඇවිදින්නී, 'මුගලන් තෙරනුවෝ සෘඩිමතෙක, ඇය ගතිය දනිතැ'යි මහ ජනයා විසින් කියන ලද වචනය අසා, තෙරුන් කරා ගොස් විචාළා ය.

'අදට සත් වන ද වේළුවනාරාමයේ බණ පිරිස් කෙළවර දී ඇය දැක්ක හැකියැ'යි තෙරණුවෝ වදළහ.

සුලසාවෝ සතියක් රුක් දෙවියා හා සැපැත් විඳ, තමා නැති බැවින් මව ශෝක කරතැ යි සිතා, එ බව කියා තමා සිය නිවසට පමුණුවා ලන සේ ඔහු ඇයැදුවා ය. දෙව් තෙම ඇය ගෙන ගොස් වේළුවනාරාමයෙහි බණ අසන පිරිස් කෙළවර නවතා නො පෙනී සිටියේ ය.

බොහෝ දෙනා සුලසාව දැක ඇය ගිය තන් විචාළහ. ඕ ද සිදු වූ පවත් කීහ. 'පින් නො කොට පව් කළ ඒ පුරුෂයා අන්තිම මොහොතෙහි මුගලන් තෙරුනට දන් දී පැහැදී දෙව්යෙක් ව උපන්නේ යැ'යි ඇය කී බස් අසා 'රහත් හු ලෝ වැස්සාට උතුම් පින් කෙත් යැ'යි කියමින් මිනිස්සු ප්‍රසාදය පළකළහ.

භික්ෂූහු එහි ධර්මදේශනා පිණිස වැඩ හුන් භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් දැන්වූහ. එ විටැ මෙය මුල් කොට ගෙන භාග්‍යවතුන් වහන්සේ ධර්ම දේශනා කරන සේක්,

**"රහත්හු මොනවට සකස් කළ කෙත් වැනියහ. (ප්‍රත්‍යයය දෙන) දයකයෝ ගොවීන් වැන්නහ, දන වස්තුවට බිජුවට වැන්න. මේ (ප්‍රතිග්‍රාහක, දේය ධර්ම, දයක යන) අංගත්‍රය සම්පූර්ණ වීමෙන් මහත් සුබ විපාක උපදියි (හෙවත් සැප දෙමින් විපක ශක්තිය දීර්ඝ කාලයක් පවතී.)**

**මෙ සේ කියන ලද පරිදි වූ පුණ්‍ය බීජය ද, පින් බිජු වට වැපිරීම ද. පින් කෙත ද යන මේ කරුණු ති දෙන ප්‍රේතයනට ද දයකයාට ද වැඩ පිණිස පවතී. එ දනමය පුණ්‍ය කර්මයේ විපාක ඵලය ප්‍රේතයෝ පරිභෝග කෙරෙත් දයක තෙමේ ද ඒ පින්කම් හේතුයෙන් වැඩීමට පැමිණේ. මෙහි කුසල් කොට ප්‍රේතයනට පින් දෙන පුද්ගල තෙම ඒ මහා කුසල කර්ම හේතුයෙන් සුගතිගාමී වේ" යැයි වදළ සේක.**

දේශනාවසානයේ දී සුවාසූ දහසක් ප්‍රාණීනට ධර්මාභිසමය විය.

**සාකේත බ්‍රාහ්මණ සමාගමය**

බුදුරජාණන් වහන්සේ දිනක් භික්ෂු සංඝයා හා සාකේත නගරයෙහි පිඩු පිණිස හැසුරුණු සේක. එ කල කිසි කටයුත්තක් සඳහා නුවරින් නික්මුණු ධනවත් මහළු බමුණෙක් නුවර දෙර සමීපයේ දී භාග්‍යවතුන් වහන්සේ දැක පුත්‍ර ස්නේහය උපදවා 'පුත, බොහෝ කලෙකින් දැක්කෙමි'යි කියා හඬමින් ඉදිරියට ගියේ ය. බුදුරජාණන් වහන්සේ භික්ෂුන් අමතා, 'මහණෙනි, මේ බමුණා කැමැත්තක් කරා වා. ඔහු නො වැළැක්විය යුතු' යැ යි වදළ සේක. බමුණු තෙමේ ද ළඟට වුත් 'පුතා, බොහෝ කාලෙකින් නුඹ දිටීමි බොහෝ කලක් අපෙන් වෙන් ව සිටියහු යැ 'යි කියා උන් වහන්සේ ගේ ශ්‍රී ශරීරය හාත්පසින් වැළැඳ ගත්තේ ය. එයට ඉඩක් නො ලැබුණේ නම්, ඒ බමුණා ශෝකයෙන් මැරෙන්නේ ය. එබැවින් ඔහු කැමැත්තක් කරන්නට භාග්‍යවතුන් වහන්සේ ඉඩ දුන්

සේක. ඉන්පසු බ්‍රාහ්මණ තෙම 'භාග්‍යවතුන් වහන්ස, ඔබ හා වැඩි මේ සියලු භික්ෂූන් වහන්සේට භික්ෂාව දීම මා විසින්ම කළ හැකි යි. එබැවින් මට අනුග්‍රහ කොට මෙ ඉල්ලීම පිළිගත මැනැවැ'යි කී ය. භාග්‍යවතුන් වහන්සේ එය තුෂ්ණිම් භාවයෙන් පිළිගත් සේක. බ්‍රාහ්මණ තෙම පාත්‍රය ගෙන පෙරටුව යමින් 'පුතා ආයේ ය. ආසන පණවන්නැ'යි ගෙට පණිවුඩයක් යැවී ය. බැමිණි ද ඉතා සතුටු ව අසුන් පණවා බලාපොරොත්තුව හුන් තැනැත්තී, වීථියේ වඩනා බුදුරජාණන් වහන්සේ ඈත දීම දැක, පුත්‍ර ස්නෙහය ඉසිලිය නො හී ඉදිරියට දිව ගොස් 'පුතා , බොහෝ කලකට පසු දිටීමි'යි කියා පා මුලැ වැටී හඬා ගෙට වැඩම කරවා ගෙන ගොස් සකසා වැළැඳැවූවා ය. දන් වළඳා ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔවුනට දම් දෙසූ සේක. බණ අසා දෙදෙනා ම සෝවන් වූහ. ඉන් පසු ඔහු එ නුවර වසන තාක් කල් ඔවුන් ගේ ම ගෘහයෙන් භික්ෂාව ගන්නා ලෙස අයැදූ හ. භාග්‍යවතුන් වහන්සේ 'බුදුවරු එකම තෙනකට නිතර නො වඩිත්' යැ යි වදරා ඒ ආයාචනය ප්‍රතික්ෂේප කළ සේක. 'එසේ නම් ස්වාමීනි, භික්ෂු සංඝයා හා පිඬු පිණිස හැසිරෙ මෙහිදී ම දන් වළඳා වත් අපට බණ වදරා විහාරයට වැඩිය මැනැවැ'යි කීහ. භාග්‍යවතුන් වහන්සේ ඔවුනට අනුග්‍රහයෙන් එය පිළිගත් සේක. මිතිස්සු ඒ බමුණු බැමිණි දෙදෙනාට බුධපිතෘ බුධමාතෘ යැ යි කියා ව්‍යවහාර කළහ. එ පවුලට ද බුදුකුලයැ යි නම් වීය.

'මම භාග්‍යවතුන් වහන්සේ ගේ මා පියන් දනිමි. මේ දෙදෙනා තුමූ බුදුරජාණන් වහන්සේ ගේ මා පිය බවක් කුමට කියත් දැ?'යි අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ ගෙන් ඇසූහ. එබසට වදරන සේක්, 'අනන්දය, මේ බමුණු බැමිණි දෙදෙන බොහෝ පෙර පිළිවෙළින් ම පන්සියයක් පමණ ජාතීන්හි මගේ මවු පිය ද, එ පමණ කල් ලොකු මවු පිය ද, සුළු මවු පියද වූහ. ඒ පූර්ව ස්නේහය මතු වීමෙන් ඔවුන් මෙසේ කියති'යි වදළ සේක.

ඉන්පසු කලක් එහි වැස නැවතත් සැරිසරන සේක් සැවැත් නුවරට ම වැඩි සේක. ඒ බමුණු බැමිණි දෙදෙන ද භික්ෂූන් වෙත එළැඹ බණ අසා සකෘදගාමී අර්හත් යන ඉතිරි මාර්ග තුනටත් පැමිණ අනුපාදිශේෂ නිර්වාණ ධාතුයෙන් පිරිනිවිය හ. නුවර වැසි බමුණෝ ද උපාසකවරු ද මහත් සත්කාර සහිතව මෘත ශරීර කූටාගාරයක බහා නුවරින් ආදහනස්ථානයට ගෙන පිටත් වූහු. බුදුරජාණන් වහන්සේ අලුයම්හි ලෝ බලන සේක්, තමන් වහන්සේ ගේ එහි වැඩීමෙන් බොහෝ දෙනාට ධර්මාභිසමය වනු දැක, සැවැත් නුවරින් නිකම ඒ සොහොන් බිමට

වැඩි සේක. මිනිස්සු උන්වහන්සේ දැක, ‘සිය මා පියන් ගේ ශරීරාදහනෝත්සවයට භාග්‍යවතුන් වහන්සේ වැඩි සේකැ.’යි කියා අවුත් වැඳ සිටියා හ. නගර වැසිහු ද මෘත ශරීර ලූ කූටාගාරය පෙරහැරින් ගෙන ආදහන භූමියට පැමිණිය හ. ඉක්බිති ‘ගෘහස්ථ ආර්‍යශ්‍රාවකයන් කෙසේ පිදිය යුතු දැ?’යි ඔහු විචාළ හ. එවිට භාග්‍යවතුන් වහන්සේ ‘අශෛක්ෂනයට (රහත් ඵලයට පැමිණියනට) පූජා කළ යුතු පරිදිම ඔවුන් පිදිය යුතුයැ’ යි දක්වන සේක් ඒ දෙදෙන රහත් වූ බව ප්‍රකාශ කොට ඉක්බිති **ජරා සූත්‍රය*** දෙසූ සේක.

**ජාත්‍ර මානවක සමාගමය**

**සේතව්‍යා** නගරයෙහි බමුණකුගේ පුතෙක් වී ය. ඉගැන්මට නිසි වයස පැමිණි විට හෙ තෙම පිය බමුණහු විසින් **උක්කට්ඨා** නගරයෙහි ප්‍රසිද්ධ ආචාර්‍යවරයකු වූ **පොක්ඛරසාදී** නම් බමුණු පඬිවරයා වෙත යවන ලද්දේ ය. නුවණැති බැවින් වැඩි කල් යන්නට පෙර හේ වේදයෙහි ද සෙසු විද්‍යා ශිල්පයන්හි ද සමත් වී ය. ඉන් පසු **ඡාත්‍ර** තෙම ඇදුරු බමුණා වෙත එළැඹ ‘ඔබ වෙත මම උගත්තෙමි. ගුරු පඬුරු වශයෙන් කුමක් දෙම් දැ?’යි ඇසීය. ‘ගුරු පඬුරු නම් ගෝලයන් ගේ වත් පොහොසත්කමේ හැටි හැටියට ය, එබැවින් කහවණු දහක් ගෙනෙව’යි ඇදුරු බමුණා කී ය. ඡාත්‍ර තෙම ගුරු පඬුරු ගෙන එන්නට ගුරුවරයා වැඳ සමුගෙන පිටත් ව ගියේ ය. ගොස් මාපියනට එ පවත් දන්වා කහවණු දහසක් ලබා ගෙන පොදියක් බැඳ පසු ද ආචාර්‍යවරයා වෙත එන්නට පිටත් වීය. තරුණයාගේ ගමනේ තොරතුරු කලින් දැනගත් මං පහරන සොරු ඔහු යන මහ අසළ ලැහැබකැ සැහැවී සිටියහ.

සැවැත් නුවර වසන බුදුරජාණන් වහන්සේ එදින අලුයම්හි බුදු ඇසින් ලොව බලන සේක්, ඡාත්‍රයාට වැළැක්විය නො හැකි බර අකුසල විපාකයක් එළැඹ සිටි බවත් එයින් ඔහු සොරුන් ගෙන් මැරුම් කන බවත් දැක, එයට පෙර ඔහු තිසරණ පන්සිල් ගන්වා ස්වර්ග මාර්ගයෙහි පිහිටුවන අදහස් ඇති ව, කලින් ම වැඩ මාණවකයා යන පාර අද්දර රුකක් මුලැ හුන් සේක. මාණවක තෙමේ ද කහවණු පසුම්බියත් ගෙන පිටත් ව යන්නේ රුක් මුල හුන් බුදුරජාණන් වහන්සේ දැක සමීපයට ගොස් සිටියේ ය. එ විට ‘ඡාත්‍ර, කොහි යන්නෙහි දැ’යි බුදුරජාණන් වහන්සේ ඇසූ සේක. ‘ගෞතමයන් වහන්ස, **උක්කට්ඨා** පුරයට යමි, මගේ ආචාර්‍ය වූ පොක්ඛරසාදි බමුණුතුමාට ගුරු දක්ෂිණාව දෙන්නට යැ’යි මාණවක තෙම පිළිතුරු දුන. ‘මාණවකය, තිසරණත් පංච

* මෙය සුත්ත නිපාතයෙහි ඇතුළති

ශීලයත් දන්නෙහි දැ?'යි භාග්‍යවතුන් වහන්සේ ඇසූ සේක. 'ඒ කිම් ද? ඒ කුමට දැ?' යි මාණවක ඇසී. බුදුරජාණන් වහන්සේ තිසරණ ගමනයත් පංච ශීලයත් මේ මේ යැයි දක්වා එය සමාදන් කොට ගැන්මේ ඵලයත් අගයත් දක්වා 'මාණවකය, සරණ ගමන විධිය උගනුව'යි වදළසේක. 'උගන්නෙමි වහන්ස, වදරන්න'යි ඔහු කීයෙන් ඔහුට රුචි වන පරිදි වූ ගාථා බන්ධනයක් කොට දුන් සේක. මාණවක තෙමේ ද ඒ අනුව කියා ගාථා කටපාඩම් කැර ගත්තේ ය.

ඒ ගාථාවෝ,

**යෝ වදතං පවරො මනුජේසු සක්‍යමුනී භගවා කතකිච්චෝ**
**පාරගතෝ බල විරිය සමඞ්ගී තං සුගතං සරණත්තමුපේමි**

**රාග විරාගමනේජමසෝකං ධම්මමසංඛතමප්පටිකූලං**
**මධුරමිමං පගුණං සුවිභත්තං ධම්ම මිමං සරණත්තමුපේමි**

**යත්ථ ච දින්නමහප්ඵලමාහු චතූසු සුචීසු පුරිසයුගේසු**
**අට්ඨ ච පුග්ගල දම්මදසා තේ සංඝමිමං සරණත්තමුපේමි.**

මේ ගාථා තුන කියා සරණ පිහිටි ඡාත්‍ර මානවකයාට පඤ්චශීලයේ සැටි, පල හා අනුසස් ද වදළ සේක. එය සිතට ගත් හෙ තෙම පන්සිල් ඉටා ගෙන 'ඉතින් භාග්‍යවතුන් වහන්ස, මම් යන්නෙමි' යැ යි කියා අවසර ගෙන තෙරුවන් ගුණ සිහි කෙරෙමින් ම මං බැස්සේ ය. ඉක්බිති බුදුරජාණන් වහන්සේ 'මොහුට දෙව් ලෝහි ඉපදීමට මේ කුසල් ම සෑහේ යැ'යි සලකා ජේතවනයට ම පෙරළා වැඩි සේක.

මහා මාර්ගයෙන් යන ඡාත්‍ර තෙම සොරුන් වසන පෙදෙසට පැමිණියේ ඔවුන් ගැන කිසිත් නො සලකා තෙරුවන් ගුණ සිහි කෙරෙමින් ම ගියේ ය. එ කලැ හෙ තෙම පඳුරෙකැ සැහෙවී සිටි සොරකු විසින් විෂ පෙවූ ඊයෙකින් හදිසියෙන් විදුනා ලද්දේ එ තැන ම මැරී වැටුනේ ය. සොරු කහවනු පොදිය ගෙන පලා ගියහ. මළා වූ ඡාත්‍ර තෙම නිඳ පිබිදියකු සේ තව්තිසා දෙව් ලොවැ රන්විමනෙක උපන්නේ ය.

සේතව්‍යා පුරයට යන මිනිස්සු මළා වූ ඡාත්‍රයා දැක ඔහු ගේ මාපියනට ද, උක්කට්ඨා පුරයට ගිය තැනැත්තෝ පොක්ඛරසාදී බමුණාට ද එ බව දැන්වූහ. ඒ දෙනුවරින් ඡාත්‍රයා ගේ මවු පිය නෑ මිතුරෝ අවුත් රුස්ව අඩා වැළැපී මාර්ගය සමීපයේ දර සෑයක් කොට මළ සිරුර ආදහන කරන්නට ආරම්භ කළහ. එහි දී සිදු වන යහපත

දැක බුදුරජාණන් වහන්සේ එහි පැමිණ ගසක් මුල හුන් සේක. ඡාත්‍ර දෙව් පුත් ද තමා ලත් සැපතට හේතුව බලනුයේ බුදුරජාණන් වහන්සේ නිසා ඒ සා මහත් සැපත් ලත් බව දැක, එහි පැමිණ භාග්‍යවතුන් වැඳ පසෙක සිටියේ ය. එ දුටු මහජනයා විස්මිත ව භාග්‍යවතුන් වහන්සේ පිරිවැරූහ. මෙහි දී බුදුරජාණන් වහන්සේ දෙව් පුතු ලවා ඔහු ගේ සියලු ප්‍රවෘත්තිය ප්‍රකාශ කරවා ඉක්බිති දහම් දෙසූ සේක. ඒ ඇසූ දෙව් පුත් තෙමේ ද ඔහු ගේ පෙර අත් බැවැ මා පියෝ ද තවත් බොහෝ දෙනා ද සෝවාන් වූහ. දෙව්පුත් තෙම භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදැකුණු කොට භික්ෂු සංඝයා වහන්සේට යටත් පැවතුම් දක්වා මාපියන් ගෙන් සමුගෙන දෙව්ලොවට ම ගියේ ය. භාග්‍යවතුන් වහන්සේ ද භික්ෂු සංඝයා සහිත ව නික්මී සේක. ඡාත්‍රයා ගේ මා පියෝ ද සෙසු මහජනයා ද භාග්‍යවතුන් වහන්සේට පසු ගමන් කොට නැවතුණහ.

**බකබ්‍රහ්ම සමාගමය**

භාග්‍යවතුන් වහන්සේ **උක්කට්ඨා** නගරය අසල සුභග වනයෙහි සල් රුක මුලැ වසන සේක. එ සමයෙහි බක නම් බ්‍රහ්මයා හට ‘මේ බඹලෝ නිත්‍යය, ධ්‍රැවය, ශාශ්වතය, කෛවල්‍යය, නොනැසෙන සුලුය. මෙය නො සෑදේ, නො දිරයි. නො මැරේ, නූපදී, මෙයින් අන්‍ය නිඃශරණයෙක් (මෙයින් මිදී යන තැනෙක්) නැතැ’යි මිථ්‍යාදෘෂ්ටියෙක් උපන. භාග්‍යවතුන් වහන්සේ එ බඹහු ගේ අදහස දැන, උන් තැනින් අතුරුදහන් ව ක්ෂණයෙකින් බඹ ලොවැ පහළ වූ සේක. බඹා භග්‍යවතුන් වහන්සේ දැක,

‘නිදුකාණනි, වඩිනු මැනැව. ඔබගේ මෙහි ඊම ස්වාගත ය. ඔබ මෙහි වැඩියේ කලෙකිනි. නිදුකාණෙනි, බඹ ලොව වනාහි නිත්‍ය ය, ධ්‍රැව ය. ශාශ්වත ය, කෛවල්‍ය ය, නො නැසෙන සුලුය, මෙය නො සෑදේ. නො දිරයි, නො මියෙයි, නො සැවේ, නූපදී, මින් ච්‍යුත ව යැමෙක් නැතැ’යි කී ය.

භාග්‍යවතුන් වහන්සේ ඔහු ගේ ප්‍රකාශය වරද බව, ඔහු අවිද්‍යායෙන් අන්ධ ව මෙසේ සිතන බව වදළ සේක. එ කල මාර තෙම එක්තරා බඹක් හු සිරුරැ ආවිෂ්ට ව ‘මොහුට ගර්හා නො කරව. මහණ, මේ බ්‍රහ්මයා ය, මහා බ්‍රහ්මය, සියල්ල මැඩැ ගෙන ඉන්නේ ය. කිසිවක් හු විසිනුත් අනභිභූත ය, සියල්ල ඒකාන්තයෙන් දන්නේ ය. වශවර්ත්තී ය. ඊශ්වර ය, කාරක ය, නිර්මාපක ය, ශ්‍රෂ්ටා (සියල්ල සාදන්නා) ජ්‍යේෂ්ඨ ය, සියලු උපනුන් උපදනාවුන්ගේ පීතෘ ය. මහණ, තට පූර්වයෙහිත් පෘථිව්‍යාදියට ගැරැහුවෝ, පිළිකුල් කළ මහණ බමුණෝ

වූහ. එහෙත් පෘථිවි අප්, තේජස්, වායු, භූත, දේව, ප්‍රජාපති, බ්‍රහ්ම යන මොවුනට ගරහා මරණින් පසු අපාය භාග් වූහු. එහෙත් ඒ පෘථිව්‍යාදීන් නො ගැරැහූ මහණ බමුණෝ මරණින් පසු බඹ ලොව්හි උපන්හ. එ බැවින් මම් තට කාරණයක් කියමි. එය කරව, පින්වත, මෙ බඹහු කියන්නක් කරව. මොහු ගේ වචන නහමක් ඉක්මව. ඉදින් තෝ එය ඉක්මවන්නෙහි නම්, වෙත එන ශ්‍රීය දැක මොහොලක් ගෙන පලවා හරින්නා වැන්න. මහණ ප්‍රපාතයක වැටෙන්නේ, අතින් ගන්නට හෝ පය රඳවන්නට කිසික් නොලදෙත්, එහි වැටෙන්නේ මය. එසේ ම තා බඹහු කියන්නක් ඉක්මුවහොත් තට වනසෙක් වන්නේ ය. එබැවින් මෙ බඹහු කියන්නක් කරව. මොහු බස නො ඉක්මෙව. මෙ බඹහු පූද යශසින් හා ශ්‍රීයෙන් බැබළෙව`යි කී ය.

එ විටැ භාග්‍යවතුන් වහන්සේ ඔහු දැන, `පාපීය, තා අඳුනමි, මං තා නො දනිතැ යි නො සිතව. මේ බඹාත් සෙසු බඹ පිරිසත් තා අත් අඩංගුයෙහි ය. තා වශයෙහි ය. ඒ තෝ මා තගේ අතට හසු වූයෙකැ යි නො සිතව. මම් වූ කලී, පාපීය, තා අතට නො හසු වූයෙකිමි. තා වශයට නො ගියෙකිමි` වදළ සේක.

මෙ සේ වදළ කළ බක බ්‍රහ්ම තෙම,

`නිදුකාණෙනි, මම් වනාහි නිත්‍යයක් ම නිත්‍ය යැ යි, ධ්‍රැවයක් ම, ධ්‍රැවයැ යි, ශාශ්වතයක් ම ශාශ්වත යැ යි, කෛවල්‍යයක් ම කෛවල්‍ය යැ යි, නො මැරෙන සුල්ලක් ම නො මැරෙන සුලු යැයි, දැනුම් දිරුම් මැරුම් සැවුම් නැත්තක් ම ඒ නැතැ යි, මින් අන්‍ය වූ මත්තෙහි නො මැති නිඃශරණයක් නො මැතැ`යි. කියමි. යුෂ්මත් ද මින් අන්‍ය නිඃශරණයක් නො ම දක්නෙහි ය. එය සොයන්නට යැමෙන් තොර වැ යුෂ්මත් පෘථිවි අප් තේජස් වායු භූත දේව ප්‍රජාපතී බ්‍රහ්ම යන මොවුන් දැඩි කොට ගෙන සිතින් එහි ලග්නෙහි නම්, මට ළංව අරක් ගෙන සිටින්නෙහි ය. මම් ද යුෂ්මත්හු කැමැතියක් කරන්නෙමි. සෙස්සන් හැර යුෂ්මත්හු ඇතුළත් කර ගන්නෙමි`යි කී ය.

එ විටැ භාග්‍යවතුන් වහන්සේ `මොහු ගේ මානය බිඳිමි`යි සිතා, `බ්‍රහ්මය, පෘථිවි අප් තේජස් වායු භූත දේව ප්‍රජාපති බ්‍රහ්ම යන මොවුන් දැඩි කොට සිතින් ගෙන මොවුන් කෙරෙහි සිත ලග්වම් නම් මා තට ළංව ඉන්නකු බව, තට අරක් ගත්තකු වන බව, තා සිය කැමැත්තක් මට කැර ලන බව, සෙස්සන් පිටත් කොට මා ඇතුළත් කැර ගන්නා බව දනිමි. එහෙත්, බ්‍රහ්මය. බක බ්‍රහ්ම මේ තරම් තෙදැත්තෙකැයි නො සිතමි. මම තාගේ ගතිය ද ච්‍යුතිය ද දනිමි` යි වදළ සේක.

'නිදුකාණෙනි, යුෂ්මත් කෙසේ මගේ ගතිය ච්‍යුතිය දන්නෙහි දැ?'යි බක බ්‍රහ්ම ඇසී.

එ බස් අසා භාග්‍යවතුන් වහන්සේ 'රිවි සඳු දෙදෙනා දිශාවන් බබුළුවමින් ඇවිදිනා තාක් වැනි දහසක් ලෝක ධාතුව තාගේ වශයෙහි පවතී. තෝ මෙතෙක් තන්හි හීන ප්‍රණීත සත්ත්වයන් දනිහි. සරාග විරාග ද සතුන් දනිහි. උපදනවුන් මැරෙනවුන් දනිහි. අත් බවට ඊමත් ඉන් යෑමත් දනිහි. තා දන්නේ මෙතෙක් ය බ්‍රහ්මය, මෙසේ තගේ ගති ච්‍යුති ඍද්ධ්‍යනුභාව ප්‍රමාණයෙන් මම දනිමි. බ්‍රහ්මය, තා නොදන්නා නොදක්නා කාය තුනෙක් ඇත. එය මම් දනිමි. බ්‍රහ්මය, තා සිට ආ තැන වූ, බොහෝ කල් ගත වූ බැවින් තට සිහි නැති ආභස්සර නම් බ්‍රහ්මකායයෙක් ඇති. මම් වනාහි එය දනිමි, දකිමි, මෙ සේ එ දැනීමෙන් තෝ මට නො සමය. එසේ කලැ එයින් මගේ තට මිටි බවෙක් කොයින් වන්නේ ද? බ්‍රහ්මය. සුභකිණ්හ නම් බ්‍රහ්ම කායයෙක් ඇත. එ ද තෝ නො දනිහි. නො දකිහි. මම් වූ කලි එය දනිමි, දකිමි. වේහප්ඵල නම් බ්‍රහ්ම කායයෙක් ඇත. එය තෝ නො දනිහි, නො දකිහි. එය මම් දනිමි. දකිමි. මෙසේත් බ්‍රහ්මය, තෝ මට නොසම ය. මගේ තට මිටි බවෙක් කොයින් ලැබේ ද? මේ හැම දෙයින් මම් තට වැඩි ම යැ'යි වදාළසේක. වදරා, පෘථිවි අප් ආදීන්ගේ තත්ත්වය තමන් වහන්සේ අවබෝධ කැර ඇති බවත්, බඹහු එය නොදත් බවත්, ඒ බඹහු තමන් වහන්සේට එයිනුත් පහත් බවත් වදාළ සේක.

බඹා කිසිත් කැරැ ගත නො හී 'එසේ නම් මම තට අතුරුදන් වෙමි'යි කීය.

'හැකි නම් අතුරුදන් වව'යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

බඹ තෙම 'අතුරුදන් වෙමි' යි තැත් කළේ ද, නො හැකි විය. කෙසේ සැඟෙවුණත් භාග්‍යවතුන් වහන්සේ ඔහු දක්නා සේක.

භාග්‍යවතුන් වහන්සේ වනාහි තමන් වහන්සේ අතුරුදන් වන බව වදරා සිය කථාව ඔවුනට ඇසෙන්නටත් රූපය නො පෙනෙන්ටත් සැලැස්වූ සේක.

බක බ්‍රහ්මයා ආදි සියලු බඹ පිරිස භාග්‍යවතුන් වහන්සේ ගේ මහර්ධිකතාව ගැන පුදුමයට හා විස්මයට පැමිණියහ.

ඉක්බිති මාර තෙම එක් බඹකුට ආවිෂ්ට ව 'ඉදින් නිදුකාණෙනි, තෙපි මෙසේ දන්නහු නම්, තෙපි සම්‍යක්සම්බුධ නම්, ශ්‍රාවකයන් ඇති නො කරවු. පැවිද්දන් ඇති නොකරවු. ඔවුනට දම් නො දෙසවු. ඔවුන්

කෙරෙහි ඇල්ම නො කරවු. යුෂ්මත්නට පෙරත් 'සම්‍යක්සම්බුධයම්හ'යි ප්‍රතිඥා කළ මහණ බමුණෝ වූහු. ඔහු සච්චන් ඇති කොට ඔවුනට දහම් දෙසා ඔවුන් කෙරෙහි ඇල්ම ඇතිකොට මැරී පහත් අත් බව්හි උපන්හ. එහෙත් යුෂ්මත්නට පෙර පහළ වූ සම්‍යක්සම්බුධ යැ යි ප්‍රතිඥා කළ සච්චන් ඇති නො කළ මහණ බමුණෝ වූ කලි උසස් අත්බව්හි පිහිටියහ. එ බැවින් මම් , මහණ, තොපට කියම්, මන්දෝත්සාහ වවු. දෘෂ්ට ධර්ම සුඛවිහාරී ව වසවු. අන් හට බණ නො කීම යහපති. අන්හට ඔවා නො දෙවු'යි කී ය.

එ විට භාග්‍යවතුන් වහන්සේ 'පාපිය, තා මම් දනිමි. නො දනිතැයි නො සිතව,තෝ පාපිය, මාරයෙහි ය. තෝ වැඩ කැමැති ව දයායෙන් මෙසේ නො කියහි ය' යන ආදීන් මාරයා ගරහා පලවා හැර. එ බඹ පිරිසට චතුස්සත්‍යය ප්‍රකාශ කළ සේක. දහසක් බඹුහු රහත් වූහ.

**මණ්ඩුක දේවපුත්‍ර සමාගමය**

භාග්‍යවතුන් වහන්සේ එක් සමයෙක **චම්පා** පුරයෙහි **ගර්ගරා** පොකුණ අසළ ආරාමයෙහි වුසූ සේක. නුවර පිඩු පිණිස හැසිර වළඳා දවල් කාලය ඵලසමාපත්ති සැප යෙන් ගෙවා සවස දම් සබා මඩුයෙහි සිවු පිරිස මැද දම් දෙසන සේක.

එ කෙණෙහි මැඩියෙක් පොකුණින් අවුත් 'මේ මනා කථාවකැ'යි යන සංඥායෙන් භාග්‍යවතුන් වහන්සේ ගේ මධුර ස්වරයට කන් යොමු කොට පිරිස් කෙළවර හුන්නේ ය.

එක් ගොපල්ලෙක් ද එහි අවුත් බණ අසන පිරිස දැක, සැරයටිය බිම ගසා, එහි එල්බ එයට බර වැ සිට බණ ඇසී ය. හේ මැඩියා නො දුටුයේ ය. ඔහු සැරයැටිය තුබුයේ මැඩියා මත්තෙහි ය. මැඩි තෙම වනාහි ඉන් තෙරැපීත් භාග්‍යවතුන් වහන්සේ ගේ කටහඬෙහි යැවූ සිතැත්තේ, ප්‍රසන්න සිතින් මළේ, තව්තිසා දෙව්ලොවැ දෙව් පුතෙක් ව උපන්නේ ය. දෙව්ලොවැ උපන් කෙණෙහි හේ 'කොහි සිට කවර පිනෙකින් මෙහි උපන්නෙම් දැ?'යි බැලූයේ, වූ සියලු පවත් දැක විමානය පිටින් ම එකෙණෙහි යථෝක්ත බණ අසන පිරිස සමීපයට අවුත් විමනින් බැස මහ ජනයා බලා හින්දැ දීම, දෙව් පිරිස කැටිව භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ, පාමුලැ වැටී වැඳ ඇඳිලි බැඳ ගෙන නමස්කාර කරමින් සිටියේ ය.

කර්ම ඵලය දෙව් පුතු ලවා ම මහජනයාට ප්‍රකාශ කරවා ලන අදහසින් භාග්‍යවතුන් වහන්සේ 'මා පා වඳින මේ තෙම කවරේ දැ'යි අසා වදාළ සේක.

දේව පුතු තමා පෙර මැඩියකු ව සිටි බවත්, තමා භාග්‍යවතුන් වහන්සේ ගේ කථා ශබ්දයෙහි නිමිත්ත ග්‍රහණය කරමින් සිටින විට ගොපළු දරුවකු ගේ සැරයටියට අසු වී තෙරැපී මළ බවත්, ප්‍රසන්න සිතින් කළුරිය කොට තව්තිසා දෙව්ලොව දෙව් පුතකු ව උපන් බවත් කී ය.

එ විටැ භාග්‍යවතුන් වහන්සේ මෙය ඇරැබ, පැමිණ සිටි මහ පිරිසට විස්තර වශයෙන් ධර්ම දේශනාවක් කළ සේක.

දේශනාවසානයෙහි දෙව් පුත් සෝවාන් වී ය. සුවාසූ දහසක් ප්‍රාණනට ධර්මාභිසමය වී ය.

දෙව් පුත් භාග්‍යවතුන් වහන්සේ වැඳ සිය පිරිස හා දෙව්ලොවට ම ගියේ ය.

**ආනන්ද ශ්‍රෙෂ්ඨි සමාගමය**

සැවැත් පුර සතළිස් කෙළක් ධනය ඇති **ආනන්ද** නම් මහ සිටෙක් වී ය. හේ මහ මසුරෙකි. හේ සිය පුතුට අවවාද කරන්නේ, 'මේ සතළිස් කෙළක් ධනය බොහෝ යැ යි නො සිතව. ඇති ධනය නො දිය යුතු ය. ධනය වැඩීම නම් කළ යුතු ය. එක කහවණුවකුත් වියදම් කරන්නහු ගේ ධනය එ පමණට ගෙවේ යැ' යි කිය යි. හේ කිසි දිනෙකැත් තමා සතු මහා නිධාන පස අසුවල් තැන යි පුතුට නො දැන්වී ය. මැත භාගයෙහි හේ මළේ නුවර සමීපයෙහි සැඩොල් ගමෙක සැඩොලියක කුස පිළිසිඳ ගත්තේ ය.

පියා ගේ මරණින් පසු ඔහු පුත් **මූලසිරි** තෙම සිටු තනතුරට රජහු විසින් පත් කරන ලද්දේ ය.

යටැකී සැඩොලිය ගබ් ගත් ද සිට ම එ ගම සැඩොලුනට කුලී වැඩකුත් නො ලැබෙන තරම් විය. ඔහු කාලකණ්ණියා සොයා බලනුවෝ ඒ සැඩොලිය කුස උපන් දරු යැයි සලකා ඇය සැඩොල් ගමින් නෙරැපූහ. සැඩොලි දුක සේ කල් ගත කොට පුතකු වදපු දැය. එ උපන් දරු තෙමේ වනාහි අංග විකල පාංශුපිසාචයකු වැන්නෙකි. එහෙත් පුත්‍ර ස්නේහය බලවත් බැවින් මවු ඔහු පෝෂිත කළහ. සිඟා කෑමට තරම් වයස් වූ විට එ දරු අතට කබලක් දී 'පුත, තා නිසා අපි මහත් දුක් වින්දම්හ. දැන් තා පෝෂණය අපට නො හැකිය. මේ නුවර දුගියනට මගියනට බත් දෙන තන් ඇත. එහි ගොස් සිඟා කා දිවි රකු' යැ යි කියා ඔහු යැවූ ය.

එ දරු තෙම නුවර ගෙ පිළිවෙලින් හැසිරෙන්නේ පෙර තමා ආනන්ද සිටුව උන් සමයෙහි වුසූ සිටු මාලිගාව දැක ජාතිස්මරණය කොට සිය ගෙට පිවිසියේ ය. තුන් දොරටුවල සිටි කිසිවෙක් ඔහු නො තැකුයේ ය.

සතරවන දෙරටුවට ඔහු වන්නාහු දැක මූලසිරි සිටුහු ගේ දරුවෝ බිය වැ කෑ ගැසූහ. සිටුහු ගේ ඇමැතියෝ ඔහු දැක පිටත යව, කාලකණ්ණියැ'යි කියා තළා කසළ ගොඩට හෙළා ලූහ.

මේ වේලායෙහි ශාස්තෘන් වහන්සේ අනඳ තෙරුන් හා පිඬු පිණිස වඩනා සේක්, එ තැන දී තෙරුන් දෙස බලා, කසළ ගොඩැ උන් දරුවාගේ ප්‍රවෘත්තිය වදාළ සේක. එවිට තෙරණුවෝ මූලසිරියා කැඳවූහ. මහ ජන සන්නිපාතයෙක් ද වීය.

'භාග්‍යවතුන් වහන්සේ මූලසිරි සිටු අමතා, ඒ දරුවා පෙන්වා 'මේ කවර යි දනිහි දැ?'යි ඇසූ සේක.

'නො දනිමි' යි සිටු පිළිතුරු දුන්නේ ය. 'මෙ තොප පියා ආනන්ද ශ්‍රෙෂ්ඨී' යැ යි වදාළ සේක. සිටු නො ඇදහී ය. එ විටැ භාග්‍යවතුන් වහන්සේ සැඩොල් දරු අමතා 'ආනන්ද සිටාණෙනි, තොප පුත්‍රයාට තොප ගේ පංච මහා නිධානය 'ඇති තැන් කියවු' යැ යි වදාළ සේක. සැඩොල් දරු එය පෙන් වී ය. ඉක්බිති සිටු තෙම භාග්‍යවතුන් වහන්සේ ගේ වචනය අදහා පැහැදී තෙරුවන් සරණ ගියේ ය.

භාග්‍යවතුන් වහන්සේ සිටු පාමොක් ජන සමාගමයට දම් දෙසන සේක්,

**'මගේ පුත්තු ඇත, ධනය ඇතැ'යි පුත්‍ර තෘෂ්ණායෙන් ද ධන තෘෂ්ණායෙන් ද ලාමක පුරුෂ තෙම වෙහෙසේ. තෙමේ ද තමාට නැත. මරණය හෝ අකුශල කර්ම විපාකය හෝ එළැඹ සිටි පුද්ගලයාට පුත්‍රයෝ කොයින් ද? ධනය කොයින් ද?'** යි වදරා දම් දෙසූ සේක.

දේශනාවසානයෙහි සුවාසූ දහසක් ප්‍රාණීනට ධර්මාභිසමය වී ය.

**ගරහදින්න සමාගමය**

සැවැත්හි **සිරිගුත්ත** යැ යි **ගරහදින්න** යැ යි යහළුවෝ දෙදෙනෙක් වූහු. සිරිගුත්ත තෙම බෞද්ධෝපාසකයෙකි. ගරහදින්න තෙම නිර්ග්‍රන්ථ ශ්‍රාවකයෙකි. නිර්ග්‍රන්ථයෝ ගරහදින්නයා ලවා නිතර සිරිගුත්තයාට තෙරුවන් දෙස් කියවා නිර්ග්‍රන්ථයන් ගේ අගය වර්ණනා කරවා තමන් කෙරෙහි පහදවා ගන්නට තැත් කෙරෙති.

සිරිගුත්ත තෙම කීප වරක් තුෂ්ණීම්භූතව සිට දිනෙක ගරහදින්නයා තමාට රත්නත්‍රයයේ අගුණ කියන්නට ආ විට,

'තෙපි මට 'ශ්‍රමණ ගෞතමයන් කරා ගොස් කුමක් ලබන්නෙහි ද, මගේ ආයර්‍යයන් වෙත ගොස් දන් දෙව'යි නිතර කියවු, කිව මැන, තොප ගේ ආයර්‍යයෝ කුමක් දනිත් දැ?'යි ඇසී ය.

ගරහදින්න තෙම 'අහෝ ස්වාමීනි, එසේ නො කිව මැන. මගේ ආර්යයන් නො දත් දැයෙක් නැත. සියල්ල දනිති'යි කීය.

එ විට සිරිගුත්ත 'එ සේ නම් මෙතුවක් කලක් මෙ බව නො කියා සඟොවා ගෙන සිටියා ලොකු වරදෙකි. අද තොප ගේ මගින් ආර්යයන් ගේ ඥනානුභාවය මම දතිමි. යන්නැ, මගේ වචනයෙන් ආර්යයනට නිමන්ත්‍රණය කරන්නැ'යි කී ය.

ගරහදින්නයා ගොස් එ පවත් කියා නිර්ග්‍රන්ථයන් පසු ද බතට නිමැතුයේ ය. නිර්ග්‍රන්ථයෝ 'සිරිගුත්තයා තමන් කෙරේ පැහැදුණේ යැ'යි තුටු පහටු ව එය පිළිගත් හ.

සිරිගුත්තයාගේ වාසස්ථානය විශාල ය. හේ එහි ගෙවල් දෙකක් අතර දිගට ම අගලක් සාරවා එහි අශුචි හා මඩ පුරවා ඊ පිට දෙ පසැ කණු සිටුවවා, ලනු බඳවා ආවාටය අද්දරැ ආසන පණවා ලූයේ ය. ඒ ආසනවලැ ඉදිරි පා වළ අද්දර ද පසු පා වළ මත්තෙහි ලනු උඩ ද තැබැවී ය. එසේ කෙළේ අසුන්හි හුන් විට ලනු පෑගී ආසනවල පසු පා පහත් ව බැස ඒ නිගණ්ඨයන්, පිටි අතට හිස යටිකුරු වැ වැටෙනු පිණිස ය. මෙසේ කොට වළ නොපෙනෙන සේ ආසනත් වළ මුව විටත් වසා ඇතිරී අතුරුවාලූයේ ය. මහත් සැළි සෝදවා කෙසෙල් කොළින් ද කඩවැස්මෙන් මුව වසා බඳවා ඒ හිස් බඳුන් පිට පැත්තේ බත්කුළු ගිතෙල් පැණි ආදිය ඉස්වා ගෙයි පිටිපස තැබ්වී ය.

ගරහදින්නයා උදේ අවුත් බලා දන් පිළියෙල වූවා දැක සතුටු ව ගියේ ය. ඔහු ගිය පසු පන්සියක් පමණ නිර්ග්‍රන්ථයෝ එහි ආහ. සිරිගුත්ත තෙම ගෙන් නික්ම පසඟ පිහිටුවා වැඳ ඔවුන් ඉදිරියේ දෙහොත් මුදුන් තබා සිට 'ඔබ වහන්සේ අතීතාදී සියලු කාලය දන්නෝ ල. ඔබ එය දනිතැ'යි ඔබ ගේ උපස්ථායකයා මට කීය. ඉදින් තුන් කල් නො දනිත් නම් මා ගෙට නො එනු මැනැව. මා ගෙට ගියත් කැඳ බතෙක් නො ලැබේ. නො දැන, පිවිසියොත් ඔබ හැම අසූචි වළැ හෙළා තළවන්නෙමි'යි සිතීය. ඔවුන් ඉඳගත් කල්හි ලනු වසා එළු පසතුරුණු ඉවත් කරන්නට පුරුෂයනට සංඥා කෙළේ ය.

ඉක්බිති හේ නිවටුන් කැඳැවී ය. උහු ද වැද අසුන්හි ඉඳගන්නට ආරම්භ කළ කෙණෙහි එහි සිටුවා ලූ පුරුෂයෝ ස්වාමීනි, ටිකක් සිටිනු මැනවැයි කීහ. ඒ මන්දැ?යි නිවටහු ඇසූහ. 'අප ගෙට පැමිණියවුන් වත් දැන ඉන්ද යුතු ය. ඔබ වහන්සේ තම තමනට පැමිණ ආසන ළඟ සිට එක් විට ම ඉන්ද යුතු' යැ යි ඔහු කීහ. 'මැනැවැ'යි ගිවිස උහු

ද එක විට ම ඉඳ ගත්හ. ඔවුන් ඉඳගන්නට නැමෙන විට ම එහි වූ ඇතිරි එක විට හැර ගත් හ. ඔවුන් ඉඳගනුත් සමග ම ලනු පිට තුබූ අසුන් පා පහත බැස්සේ ය. නිගණ්ඨයෝ පිටි අතින් පා උඩුකුරු කොට වළෑ වැටුණහ. සිරිගුත්ත තෙම දෙරවල් පියවා ඔවුන් වලින් නැගුණ නැගුණවුන් තළවා වළට හෙළවා 'තොපට මෙතෙක් සෑහේ' යැයි කියා දොරවල් හරවා ලූයේ ය. පලා යන ඔවුන් යන මහ සුණු පිරියම් කළ බිමෙහි නානු බෙලසුල් වත් කරවා තුබුණු බැවින් එහි ද වැටී ගියහ. එහි නවතා ලූ පුරුෂයෝ වැටුණ වැටුණවුන් තළා පලවාපූහ.

නිගණ්ඨයෝ හඬා ගෙන ගොස් වූ පවත් ගරහදින්නයාට දැන්වූහ. හේ කිපී නඩු දැමූයේ ය. එහෙත් එයින් සිරිගුත්තයාට ම ජය වී ය.

ගරහදින්නයා ටික දිනක් සිරිගුත්තයා හා කථා මාත්‍රයකුත් නො කොට ඉඳ, යලිදු කපට අදහසින් ඔහු හා යහළු වීය. දිනෙක සිරිගුත්ත තෙම බුදු ගුණ කියා භාග්‍යවතුන් වහන්සේ ට දන් දීමෙහි ගරහදින්නයා මෙහෙයී ය. ගරහදින්නයා ද 'යහපතැ' යි ගිවිස ඔහු ලවා ම භාග්‍යවතුන් වහන්සේ ප්‍රමුඛ භික්ෂු සංඝයාට නිමන්ත්‍රණය කැරැවී ය. ඉක්බිති හේ ගෙවල් දෙකක් මැද මහ වළක් කණවා, කිහිරි දර පුරවා ගිනිකොට අඟුරු බස්වා වළ මත්තෙහි පෝරු අතුරුවා ඊ මතුයෙහි කළාල හා පැදුරු එළැවී ය. එහි අතුළ පෝරු අතුරෙන් භාග්‍යවතුන් වහන්සේ වඩනා ප්‍රදේශයෙහි පා තැබූ කෙණෙහි කඩා වැටෙන පරිදි දිරා ගිය ලෑලි අතුරුවා තැබී ය. වසන ගේ පැත්තෙහි සිරිගුත්තයා කළ පරිදිම හිස් බඳුන් බත් ආදිය ඉස කෙසෙල් කොළ ආදියෙන් වස්වා තැබීය.

නිමන්ත්‍රිත පරිදිම භාග්‍යවතුන් වහන්සේ භික්ෂු පිරිස හා වැඩි සේක. මහ ජනයා ද එහි රැස් විය, ගරහදින්නයා ගෙයින් පිටත අවුත් පසඟ පිහිටුවා වැඳ, දෙහොත් මුදුන් තබා, පෙර සිරිගුත්තයා සිතූ ලෙසින් 'ඔබ තෙකල් දන්නා සේක්ල. නො එසේ නම් මෙහි පිවිසි විට දැනේ යැ'යි සිතා භාග්‍යවතුන් වහන්සේ වැඩම කරවාගෙන ගියේ ය.

භාග්‍යවතුන් වහන්සේ ගෙට වැද ශ්‍රී පාදය අඟුරු වළ මත්තෙහි තැබූ විට ම රිය සක් සා පියුම් නැඟුණෙන් ඊ මත්තෙන් වැඩ ප්‍රඥප්තාසනයෙහි හුන් සේක. භික්ෂු පිරිසත් ඒ පියුම් මත්තෙන් ගොස් ආසනවලැ හිඳ ගත්හ.

ගරහදින්නයා මෙය දැක තැති ගත්තේ ය. සිරිගුත්තයා වෙත ගොස් වූ සියලු පවත් කියා, තමා පිදූ දනක් නැති බව දැන්වී ය. එවිට සිරිගුත්ත තෙමේ 'යව, ගොසින් බලව, බුධානුභාවය ඉන් ම දත

හැක්කැ'යි කියා ඔහු එය බලන්නට යැවී ය. ගරහදින්නයා ගොස් බැලුයේ ය. ඒ සියලු භාජන කැඳ බත් ආදියෙන් පිරී තුබුණු තියා දැක, විස්මිත ව ගොස් සියතින් ම දන් වැළැඳැවී ය. භෝජනාවසානයෙහි හේ අනුමෙවෙති බණට අයැද පසෙක හුන්නේ ය.

භාග්‍යවතුන් වහන්සේ අනුමෝදන බණ වදරන සේක්, "**මේ සත්ත්වයෝ ප්‍රඥා ඇස නැති බැවින් මගේ ශ්‍රාවකයන්ගේත්, බුධශාසනයේත් ගුණ නොම දනිත්, ප්‍රඥා ඇස නැත්තහු අන්ධයෝ නම. ප්‍රඥාවත්හු ම ඇසැත්තෝ නමැ**"යි වදරා.

"**මාවතක් අද්දර හළ කසළ ගොඩෙක සුවඳැති සිත්කළු පියුමෙක් යම්සේ පැන නගී ද, එසේ ම කෙලෙස් කුණින් පිරුණු ඥානාන්ධ වූ ලෞකික ජනයා අතුරෙහි උපන්නේ වී නුමුදු සම්‍යක්සම්බුධශ්‍රාවක තෙම ගුණයෙන් ඒ සියලු ලෞකික ජනයා මැඩ අතිශයයෙන් බැබැළේ**[21] යැ "යි වදරා දහම් දෙසූ සේක.

දේශනාවසානයෙහි සුවසූ දසක් ප්‍රාණිනට ධර්මාභිසමය විය. ගරහදින්න සිරිගුත්ත දෙදෙනා ද සෝවාන් වූහ.

නැවැත සවස් කාලයෙහි දම් සබායෙහි රැස් වූ භික්ෂූන් කිහිරඟුරු මැදින් පියුම් පැන නැඟීම ගැන කථා කරමින් උන් විට, භාග්‍යවතුන් වහන්සේ එහි වැඩ, එ පවත් අසා 'පෙරත් බෝධිසත්ත්ව සමයෙහි ගිනි අඟුරු මැදින් පියුම් පැන නැංගේ වේ දැ'යි වදරා, භික්ෂූන් විසින් ආයාචිත සේක්, **ඛදිරංගාර ජාතකය** වදාළ සේක.

**මට්ටකුණ්ඩලී සමාගමය**

සැවැත් පුර කිසිවකුට කිසිත් නුදුන් විරූ ධනවත් මසුරු බමුණෙක් වී ය. හෙ තෙම **අදින්නපුබ්බක** නමින් මහජනයා විසින් දන්නා ලද්දේ ය. ඔහුට පුතෙක් විය. කුන්ඩලාභරණ සාද දිය යුතු වූ විට කර්මාන්තකාරයනට වියදම් දිය යුතු යැයි බියෙන් තෙමේ ම රන් කැබැලි ගෙන කපා මට කොට කුන්ඩලාභරණ දෙකක් තනා පුතුට පැළැන්දැවී. ඒ කුමර තෙමේ මට වූ කුණ්ඩලාභරණ දෙකක් තනා පුතුට පැළැන්දැවී. ඒ කුමාර තෙමේ මට වූ කුණ්ඩලාභරණ දරන්නේ මහජනයා අතුරෙහි **මට්ටකුණ්ඩලී** යන නමින් ප්‍රකට විය.

සොළොස් වයස් පත් මට්ටකුණ්ඩලී හට පාණ්ඩු රෝගයෙක් වැළැඳුනේ ය. අදින්නපුබ්බක තෙම එය දැකත් ධනය වියදම් වෙතැයි බියෙන් කිසි වෙදකු නො ගෙන් වී ය. රෝගය අසාධ්‍ය වැ මට්ටකුණ්ඩලී

මරණ මඤ්චකයෙහි හොත්තේ ය. ඔහු දක්නට එන්නවුනට ගෙ තුළැ ඇති ධනය පෙනෙතැයි සැලකූ බමුණා මරණාසන්න වූ සිය පුතු ගෙයින් පිටතැ පිල් කඩෙහි ඇඳක් මත සැතැප් වී ය.

එද අලුයම්හි මහ කුළුණු සමවතින් නැගිට ලොව බලා වදරන භාග්‍යවතුන් වහන්සේ මට්ටකුණ්ඩලියා දැක, ඔහු ඉන්න ගෙය සමීපයට වැඩි සේක. බ්‍රාහ්මණ කුමාර තෙම භාග්‍යවතුන් වහන්සේ දැක සිත පහදවා ගත්තේ ය. නොබෝ වේලාවෙකින් මළ හෙ තෙම දෙව්ලොවැ උපන්නේ ය.

අදින්න පුබ්බක තෙම පුතු ගේ මළ සිරුර දවා ආදහන භූමියට ගොස් සැම දවසෙහි පුතුගේ නම කියා හඬන්නේ ය. මට්ටකුණ්ඩලී දෙව් පුත් ද තමා දෙව් ලොව උපදින්නට හේතුව බලන්නේ 'සිය පියා මසුරු බැවින් තමාට වෙදකම් නො කරවා මළ පසු සොහොනේ හඬා ඇවිදී' යැ යි ද, 'භාග්‍යවතුන් වහන්සේ කෙරේ ප්‍රසාදයෙන් තමාට දෙව් සැපත් ලැබුණේ යැ'යි ද දිටී ය. දැක අදින්න පුබ්බක බමුණා හඬා ඇවිදිනා සොහොනෙහි පැත්තෙක පළමු මට්ටකුණ්ඩලී වේශයෙන් ම සිට හඬන්නට වන.

බමුණු ඔහු දැක 'කුමට හඬයි දැ' යි ඇසී. තමාට රථයක් ලැබුණු බවත් එයට රෝද දෙකක් නැති හෙයින් හඬන බවත් කීය. එ විට සිය පුතුගේ රූපාකාරය ඇති එ තරුණයා කෙරෙහි ප්‍රේමයෙන් බමුණු තෙම 'වුවමනා පරිදි වූ රිය සක් දෙකක් රිදියෙන් හෝ රනින් වුව ද සපයා දෙන්නෙමි. නො හඬව 'යි කී ය.

'ලෙඩින් පෙළුණු සිය පුතුට ධනව්‍යය භීතියෙන් වෙදකමකුත් නො කැරූවූ මෙ තෙම පුත්‍ර වේශයෙන් ආවකු කෙරෙහි දැන් සෙනෙහෙ කොට මෙසේ කියයි. මොහුට නිග්‍රහකොට වරද පෙන්වා දෙමැ'යි දෙව් පුත් සිතී. සිතා තමාගේ රථයට අන් කිසි රෝදයකින් අර්ථයක් නැති බවත් රිවි සඳු දෙදෙනා ම සුදුසු වූ රෝද බවත් කී ය.

එවිට බමුණා රිවි සඳ නොලද හැකි බවත්, එය පැතීම මෝඩ කමක් බවත් කීය. දෙව් පුත් තෙම 'මේ රිවි සඳුහු ඇත්හි වුවත් ඇසට පෙනෙති. මැරී පරලොව ගියහු නම් දක්නට නැත් ම ය. මෙසේ කලැ අපි දෙදෙනා ගෙන් කවරෙක් මුඪතර ද? ඇසට පෙනෙන්නට වත් ඇති රිවි සඳුන් පතන්නේ ද, නැත හොත් කොයි අත ඉඳී දැයි නො දැක්ක හැකි පරලොව සිටියහු පතා ශෝක කරන්නේ දැ' යි ඇසී.

බමුණු ඒ දෙව් පුතු ගේ කතාව අසා තමා වඩා මුඪ බව තේරුම් ගෙන ඒ වචනයෙන් ම තුනී වූ ශෝක ඇත්තේ 'භවත, මා සෝ දුක් නිවූ යුෂ්මත් කවරෙහි දැ?'යි විචාළේ ය.

තමා මට්ටකුණ්ඩලියා ම බවත් දෙව්ලොව උපන්න බවත් හේ කීය. දන් දීම් ආදි කිසි කුසලක් ඔහු කිසි දිනෙක කරන්නා තමා නො දුටු බව කියා එසේ කලැ දෙව් ලොව උත්පත්තිය කවර හෙයින් වී දැයි බමුණා ඇසී ය.

මරණ මංචකයෙහි හුන් තමා කෙරෙහි දයාවෙන් වැඩි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි උපදවා ගත් ප්‍රසාද මාත්‍රයේ හේතුයෙන් දෙව් ලෝහි උපන් බව හේ කීය. කියා, බමුණාට භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹෙන ලෙස අවවාද දී දෙව් පුත් අතුරුදහන් විය.

බමුණා ද ගෙට ගොස් දන් පිළියෙළ කරවා පසු ද බුධ ප්‍රමුඛ භික්‍ෂු සංඝයා වැඩම කැරැවී ය. අබෞධයකු භාග්‍යවතුන් වහන්සේ වැඩම කැරැවූ කලැ අබෞධයෝ 'අද ප්‍රශ්න ඇසීමෙන් ශ්‍රමණ ගෞතමයන් වෙහෙසවන හැටි බලම්හ'යි ද සෞගතයෝ 'අද මහා ධර්මයාගයක් වෙතැ'යි ද සිතා එහි රැස් වෙති, මෙසේ එදු මහා ජනසන්නිපාතයෙක් විය.

භාග්‍යවතුන් වහන්සේ වැඩම කරවා සත්කාර කොට ඒ අදින්න පුබ්බක තෙම 'ඔබ වහන්සේට දන් නො දී වැඳීම් මාත්‍රයකුත් නො කොට ස්වර්ගයේ උපන්නෝ ඇත් දැ?'යි විචාළේ ය.

භාග්‍යවතුන් වහන්සේ 'තොප පුත්‍රයා ම මෙයට සාධක යැ' වදරා 'මට කොඩොල් දෙව් පුත් විමානය සහිත ව මෙහි පැමිණේ වා'යි ඉටූ සේක. දෙව් පුත් ද එසේ අවුත් ඔබ වැඳ සිටියේ ය.

මෙහි දී භාග්‍යවතුන් වහන්සේ ඒ දෙව් පුතු සාක්ෂ්‍ය ස්ථානයෙහි තබා බමුණා සහිත පිරිසට ධර්මාවවාද කළ සේක. බමුණු තෙම සරණ ගත උපාසකයෙක් විය.

ඉක්බිති මට්ටකුණ්ඩලියා ගේ චිත්තප්‍රසාද ඵලය ඇරැබ දම් දෙසන සේක්,

**"සියලු චේතනාදීහු සිත පූර්වංගම කොට ඇත්තාහ. සිත ශ්‍රේෂ්ඨ කොට ඇත්තාහ, සිතින් නිපදනා හ.** ඉදින් පහන් සිතින් කියන්නේ කරන්නේ හෝ **සිතන්නේ වේ ද, එහි ඵලය වූ සුඛවිපාක තෙම වෙන් වී නො යන සෙවණැල්ලක් සේ ඒ කුශලකාරී පුද්ගලයා අනුව ම යෙතැ"**[213] වදළ සේක.

මේ ධර්ම කථාව ඇසීමෙන් අදින්නපුබ්බක බමුණු ද මට්ටකුණ්ඩලී දෙව්පුතු ඇතුළු සුවාසූදහසක් ප්‍රාණීහු ද ධර්මාභිසමය කළෝ ය.

**සරභ පරිව්‍රාජකාදි සමාගමය**

සරභ නම් භික්‍ෂු සිවුරු හැර පරිව්‍රාජක ව බුධ ධර්මය තමා හොඳින් දත් බවත්, එය දැන ම තමා බුදු සස්න හළ බවත් මහජනයා මැද කියා ඇවිදී. රජගහ පුර පිඬු පිණිස හැසිරෙන භික්ෂූහු ඒ කථාව අසා අවුත්

භාග්‍යවතුන් වහන්සේට සැළ කළහ. සැළ කොට **සප්පිනිකා නදී තීරයෙහි** වූ ඒ පිරිවැජියන් ඉන්නා ආරාමයට වඩින්නට අයැදූහ. භාග්‍යවතුන් වහන්සේ ද එහි වැඩ පැණවූ අස්නෙහි හුන් සේක.

හිඳ සරභ පරිව්‍රාජකයා අමතා ඔහු එසේ කියන බව සැබෑ දැ යි විචාළ සේක. පිරිවැජි තෙම නිශ්ශබ්ද විය. 'සරභය, කියව, තොප විසින් ශ්‍රමණශාක්‍ය පුත්‍රයන් ගේ ධර්ම ය කුමක් හැටියට දැන ගන්නා ලද ද? ඉතින් තොප ගේ දැනීම අසම්පූර්ණ නම් ඒ අඩු හරිය මම් සම්පූර්ණ කැර දෙන්නෙමි. ඉදින් තොප ගේ දැනීම සම්පූර්ණ නම් මම එය මැනැවින් පිළිගන්නෙමි. කියව'යි වදළ සේක.

තුන් වන වර දක්වා ඇසූ නුමුත් හේ කර බා ගෙන ම නිහඬව උන්නේය. සෙසු පිරිවැජියෝ සරභයා අමතා 'ඔබ ශාක්‍ය පුත්‍රීය ධර්මය තේරුම්ගත් නියාව කියන්නැ'යි කීහ. හේ නිහඬව ම බිම බලාගත් වන ම හුන්නේය.

එවිට භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේ ගේ සම්‍යක් සම්බුද්ධත්වයේ අඩුවක් හෝ ආස්‍රව ක්ෂයයේ අඩුවක් හෝ ධර්මයේ අනෛර්‍යාණික බවක් කිසි ද කෙනකු විසින් සකාරණව පැවැසිය නොහැකි නියාව වදරා දහම් දෙසා එ තැනින් ම අහස් නැඟ නික්මි සේක. භාග්‍යවතුන් වහන්සේ නික්ම වැඩි පසු පිරිවැජියෝ සරභයාට රළු පරොස් බසින් බැණ වැදූණහ.

ඒ පිරිස් මැද දී භාග්‍යවතුන් වහන්සේ වදළ ධර්මය අසා මහත් පිරිසක් ධර්මාභිසමය ලැබූ හ.

**චිංචි මානවිකාව**

බුදු පාමොක් සඟනට දිනෙන් දින මහාජනයා ගේ සත්කාර වැඩි වනු දුටු තීර්ථකයෝ 'ශ්‍රමණ ගෞතම යනට ලැබෙන ලාභ සත්කාර නැති කරමු'යි කුමන්ත්‍රණ කොට එයට මහත් යොද ගත්හ.

ඔවුන්ගේ **චිංචා** නම් වූ රූමත් පරිව්‍රාජිකාවක් වූ ය. දවසෙක ඕ තීර්ථකාරාමයට අවුත් වැඳ සිටියා ය. කිසි ම තීර්ථකයෙක් ඇය හා කථා නො කෙළේ ය. ඕ තුන් වරක් ම වැඳ 'ස්වාමීනි, කථා නොකරන්නට මා කළ වරදෙක් ඇද්දැ?'යි ඇසුවා ය. 'ඇයි, ශ්‍රමණ ගෞතමයන් ලොව තමන් වෙතට ඇද ගනිමින් අප නිෂ්ප්‍රභ කෙරෙමින් ඇවිදිනා නියාව නො දනු දැ?'යි ඔහු කීහ. 'ස්වාමීනි, මුසුප්පු නො වුව මැනැව, මම් ශ්‍රමණ ගෞතමයනට අයස උපදවන නියාව දනිමි'යි කියා ඔවුන් සතුටු කළා ය.

එ තන් පටන් කොට ඕ සැම සැන්දෑවෙක ම රතු පිළී හැඳ පෙරෙව ගෙන සුවඳ මල් ආදිය රැගෙන ජේතවනය බලායෙයි. ඇය අඳුරෙහි යන්නිය දැක 'කොහි යවු දැ?'යි විචාළ වුනට 'මා යන එන තැන් දැන

ගන්නට තොපට වුවමනාව කිමෙක් දැ?'යි ඔවුනට සැක උපදනා ලෙසට සැඩ බසින් කියා යයි. ජේතවනයට නොදුරු වූ තීර්ථකාරාමයෙක රෑ ලැග පසු දින උදෑසන ම ජේතවනයේ සිට යන්නියක සේ යන්නියක සේ ඒ පැත්තේ සිට නුවර අතට යෙයි. උදෙන් ම ජේතවනයට එන උපාසකවරුන් 'රෑ කොහි ලැග්ගෙහි ද මේ තරම් පාන්දෙරින් එන්නේ?'යි ඇසූ විට 'මා කොයි ලැග්ගත් එයින් තොපට ඇති වැඩේ මොකක් දැ?'යි බැණවැදී යෙයි.' මාස දෙක තුනකට පසු වැ පහන් දොරෑ ම තීර්ථකාරාමයේ සිට ජේතවනය අතට ටික දුරක් ගොස් නුවර අතට එන්නී ජේතවනයට උදෙන් ම එනවුන් 'මේ උදේම කොයි සිට එවුද'යි ඇසූ විට 'දෙව්රමැ ශ්‍රමණ ගෞතමයන්ගේ ගඳකිළියේ නිද හෙව එමි'යි කියයි. ඇගේ විහිලු බසෙකැ යි කිසිදු කෙනෙක් එය නො තකති. තව තුන් සාර මසක් ගිය තැන දවසෙක ඕ දර සුඹුල් ආදිය ලා ඊ වටා බඩ මහත් ව තිබෙන ලෙසට රෙදි කඩ වෙළා බඩදරු ලියක සෙයින් රත් පිළියක් පොරවා ගෙන සවස භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසන වේලෙහි දම් සභාවට ගොසින් ඉදිරියේ සිටියා ය. එසේ සිට 'ශ්‍රමණයෙනි, ඔබ දහම්දෙසති, ඔබට ද ව මා බඩැ දරුවෙක් ඇත. වදන අවස්ථාව ළං ව ඇත. වදන ගෙයක් නියම නැත. අවශ්‍ය වුවොත් ගන්නට තෙල් මිරිස් ආදී බෙහෙත් ද නැත. ඔබේ උපාසක ව සිටිනා කොසෙල් මහ රජ්ජුරුවනට හෝ අනේ පිඬු සිටාණනට හෝ විශාඛාවනට හෝ කළමනා දෑ කරන්නට විධාන නො කරනුයේ හැයි ද?' යනාදීන් ආඩාපලි කියන්නට වන.

භාග්‍යවතුන් වහන්සේ දෙසූ ම නවතා, 'තොප කියන දැයේ ඇත්ත නැත්ත තෙපි දනිවු අපිත් දනිමු'යි වදළ සේක. එය හා සමග ම ඇය බැඳ බඩ වෙළා තුබුණු ලනු හා කඩ රෙදි ලිහී ගිලිහින. දර සුඹුළුත් කඩ රෙදිත් ඇගේ පා මුල ම වැටිණ.[98]

රැස් ව සිටි මිනිස්සු එය දැක 'කාලකණ්ණි කෙල්ල, භාග්‍යවතුන් වහන්සේට මෙසේ අභූත දෝෂාරෝපණ කරන්නට කාරණ කිම් දැ!'යි බැණ වැදී ඇය එ තැනින් පලවා හළහ. භාග්‍යවතුන් වහන්සේට නො පෙනෙන තෙක් මානයට ඇය ගිය විට පොළොව පැලී විවෘත විය, ගිනි දැල් නැගිණ. ඕ එයට හසු ව ගිලී මැරී අවීචි නිරයේ උපන්නීය.

චිංචාව කළ ක්‍රියාව තීර්ථකයන් ගේ කුමන්ත්‍රණ යෙක ප්‍රතිඵල යැයි හෙළි වූයෙන් ඔවුනට තවත් මහජනයා කළ කිරුණහ. ලබමින් තුබුණු සත්කාර ටික ද නැති විය.

---

98. සක්දෙවිඳු සිවුවරම් දෙවියන් යොදා මී වෙස් ගන්වා ඇය බඩ බැඳි ලනු සිඳුවා ලූහයි ධම්මපදට්ඨ කථාවේ දැක්වේ.

# සත් සාලිස්වන පරිච්ඡේදය

**කොසොල් රජු ගේ මරණය**

පසේනදි කොසොල් රජ කේලම් බස් හදහා තමාට හිතවත් ව සිටි බන්ධුල සේනාධිපතියාත් ඔහු ගේ පුතුන් දෙතිසත් රහසින් මරවාපී ය. තමා අනුන් ගේ බොරු කථා හදහා තමාට පක්ෂපාත ව සිටි තිස් තුන් දෙනකුන් මරවා ලීමෙන් කෙළේ මහත් වරදෙකැ යි පසු ව දැනගත්තේ මහත් පසුතැවිල්ලට පත් විය. පිළියම් වශයෙන් කළ යුතු අන් කිසිත් නො දුටුයේ බන්ධුල සෙනෙවියාගේ බෑනණු දීඝ කාරායණයා මහ සෙනෙවි ධුර යේ තැබී ය. එහෙත් දීඝ කාරායණ තෙම තම මයිලණුවනුත් ඔහු දරුවනුත් මැරීමේ පලිය ගැන්මට අවස්ථාවක් බලා සිටියේ ය. රජ ද තමා කළ බලවත් අපරාධය නොයෙක් විට සිහි කෙරෙමින් මහත් නො සැනසිල්ලෙන් කල් ගෙවී ය.

දවසෙක හේ කිසි රාජ කාර්‍යයක් සඳහා කොශල රටේ සීමාවේ වූ ගමකට මහ සෙන් පිරිවරා ගියේ ය. ඒ අතර එයට නො දුරෙහි වූ මේදුලුම්ප නම් ශාක්‍ය ගමෙහි භාග්‍යවතුන් වහන්සේ වැඩ වසන නියාව අසා තමා ගේ පංච කකුධ භාණ්ඩයන් දීඝ කාරයණයා අතට දී තෙමේ මද දුරෙක වූ මේදුලුම්ප ගමට ගියේ ය. දීඝ කාරායණ තෙම සතුරා පිටු දක්නට අවස්ථාව පැමිණියේ යි සිතා අශ්වයකුත් සේවිකාවකුත් කඳවුරෙහි රඳවා තමන් සැවැත් නුවරට ගිය බව රජුට දන්වන් නැ යි කියා සේනාව ගෙන සැවැත් නුවරට ගොස් විඩූඩභ කුමරුට වොටුනු පළඳවා රජ කමට පත් කැරැවී ය.

රජ භාග්‍යවතුන් වහන්සේ හමු ව කතා බස් කොට සිය කඳවුරට ආයේ ය. සේවිකාව දීඝ කාරයණයා සේනාව හා ආපසු ගිය බව කීවා ය. රජ ඔහු සිය පුතු හා කුමන්ත්‍රණ කොට කළ දෑ තේරුම් ගෙන සිය බෑනණුවන් එක්ක ගොස් ඔවුනට දඬුවම් කරමි යි සිතා ඒ සැන්දෑවේ ම සේවිකාව හා අසු නැඟ රජගහ පුරය බලා පිටත් විය.

රජගහ පුරයට ඔවුන් යන විට රාත්‍රිය විය. නුවර දොරොටු වසා තුබුණේ ය. අන් යෑ යුතු තැනක් නො දුටුයේ නුවරින් පිටතැ වූ ශාලාවෙක රෑ ලැගුම් ගත්තේ ය. සිත රිදුම ද නිරාහාර බව ද ගමන් වෙහෙස ද බලවත් ශීතය ද නිසා මහත් පීඩාවට පත් අසූ වයස් වූ රජ එළිය වැටෙන්නට පෙර ම කලුරිය කෙළේ ය.

කොසොල් රජු මළ පවත කියා හඬන සේවිකාව ගේ කථාව ඇසූ මිනිස්සු අජාසත් රජුට එපවත් සැළ කළහ. රජ එහි අවුත් සේවිකාව ගෙන් සියලු පවත් අසා දැන සුදුසු ගෞරව සහිත කොට රාජ දේහය ආදහන කැරැවී ය.

විඩූඩභ තෙමේ රජ වූ නොබෝ දිනෙකින් ම තමාව පහත් කොට සැලකූහ යි ශාක්‍යයන් හා බැඳ ගත් වෛරය නිසා, දැන් එහි පලිය ගන්නට කාලයැ යි සිතා මහ යුද සෙනඟක් ගෙන ශාක්‍ය රට අතට යන්නට නික්මුණේ ය. සැවැත් නුවර වසන භාග්‍යවතුන් වහන්සේ එදා අලුයමැ මහ කුළුණු සමවතින් නැගී දිවැසින් ලොව බලන සේක්, ශාක්‍යයනට වන්නට යන විපත දැක ඉදුහයෙන් කිඹුල්වත් පුරට මෙපිට තැනක ට වැඩ, තුනී සෙවන ඇති රුකක් මුල හුන් සේක.

කිඹුල්වත බලා යන විඩූඩභ රජ භාග්‍යවතුන් වහන්සේ දැක, වෙතට ගොස් වැඳ 'වහන්ස, මේ සෙවණ හරියට නැති ගසක් මුල තුඩ හිඳුනේ හැයි ද ! තෙල සනවූ සෙවණ ඇති මහ රුක මුලට වැඩ හිඳුනේ මනා නොවේ දැ! යි කී ය. 'මහරජ, එසේ වුවද නෑ සෙවණ සිසිල් වේ 'යි වදළ සේක. විඩූඩභ තෙම 'භාග්‍යවතුන් වහන්සේ නෑයන් කෙරෙහි අනුකම්පායෙන් වැඩි සේක් වනැ'යි සලකා පෙරලා සැවැත් නුවරට ම ගියේ ය. තවත් දවසෙක විඩූඩභ තෙම ශාක්‍යයන් තමාට කළ අවමානය සිහි කොට 'උන්ගෙන් පලි ගනිමැ'යි මහා සේනාවක් ගෙන කිඹුල්වත බලා නික්මියේ ය. භාග්‍යවතුන් වහන්සේ කල් තබා ම එය දැක පළමු සෙයින් ම වැඩ යටකී ගස මුලැ හුන් සේක. එදත් විඩූඩභ තෙම භාග්‍යවතුන් වහන්සේ දැක පෙරලා සැවැත් නුවරට ම ආයේ ය. තුන්වන වරකත් 'ශාක්‍යයන් මරමි'යි බලසෙන් හා නික්මුණු විඩූඩභ තෙම භාග්‍යවතුන් වහන්සේ පළමු සේම වැඩ හිඳුනු දැක පෙරලා සැවැතට ම ආයේ ය.

ටික දිනකට පසු සතර වන වර ද විඩූඩභ රජ කිඹුල්වත බලා පිටත් වූ නියාව දුටු භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යයන් කළ අතීත අකුශලයක් පල දෙන්නට ළං වූයේ වනැ යි සිතා ඔවුන් කළ අකුසල් කවරේ දැ? යි අතීතාංශඥානය යොමා බැලූ සේක. බොහෝ දෙනකුන් ශාක්‍යයන් අතීත අත් බැවෙක එකතු ව නදියකට වස දමා මසුන් මැරූ අකුසලය ඉදිරි පත් වැ ඇති බවත් එහි විපාකය නො මැඩලියැ හැකි සේ බලවත් ව මුහුකුරා එළඹැ සිටින බවත් දුටු සේක. ඒ ශාක්‍යයනට වන විපත නො වැළැක්විය හැකි නියා දැක මේ සතර වන වර එහි නො වැඩි සේක.

**විඩූඩභයා ශාක්‍යයන් ගෙන් පලි ගැනීම**

විඩූඩභ තෙම මහ සෙනගක් සහිත ව කිඹුල්වතට ගියේ ය. භාග්‍යවතුන් වහන්සේ ගේ නෑයෝ තමන් මිය යතත් අනුන් නො මරති. එහෙත් තමන් ධනු ශිල්පයෙහි දක්ෂ බැවින් 'සතුරන් ගේ ඇඟැ නො වදින සේ ඔවුන් අත් අස්සෙන් හෝ කන් අද්දරින් යන ලෙසට හී විද ඔවුන් බිය ගන්වා පලවා හරිමු'යි කතිකා කොට ගෙන යුධයට සැරසුණු නියාවක් දක්වා සිටියහ.

විඩූඩභ රජ සටන් ඇරඹීය. ශාක්‍යයන් විදි හී දඬු විඩූඩභයාගේ පිරිසේ භටයන්ගේ අත් අස්සෙන් කන් අගින් හෝ යෙයි. විඩූඩභ තෙම ශාක්‍යයන් හී විදිනු දැක, 'හැයි, ශාක්‍යයෝ 'ප්‍රාණවධ නො කරම්හ' යි කියම්, තෙල කුමක් කෙරෙත් ද? බලවු, ශාක්‍යයෝ විද මගේ පිරිස වනසා ලති'යි කීය. එහි සිටි පවිටු එකෙක්, 'ඔබ සෙනගෙහි එකෙකුත් නො මළේ ය. පිරිස ගණන් කරවා බලන්නැ'යි කීය. රජ බල සෙනග ගණන් කැරවීය. එකෙකුත් අඩු නැත. යුද්ධය හැර පෙරලා යන්නට සිතා සිටි රජ එය දැක, නැවත සටන අරඹනුයේ, 'අප මුත්තනුවන් මහානාම ශාක්‍ය රජුනුත් ඔවුන් ළඟ සිටියනුත් හැර 'ශාක්‍යයම්හ'යි කියන සෙසු සියලු දෙනාම මරා දමවු' යැ යි විධාන කෙළේ ය. ශාක්‍යයෝ ද දිවි රැක ගන්නා උපදෙසක් නො ලද්දෝ බොරු නො කියන්නාහු සමහරු තණ ගස් ඩැහැගෙන ද සමහරු හුන දඬු අල්ලා ගෙන ද සිටියාහ. විඩූඩභයාගේ භටයෝ ගොස් 'මොහු ශාක්‍යයෝ ද නො වහු දැ?'යි අසති. තුමූ බොරු නො කියන්නාහු, තමන් ඩැහැ ගත් තෘණ දක්වා මේ තෘණ යැ ශාක්‍යයෝ නො වෙති යි කියති. හුණ දඬු අල්ලා සිටියෝ මේ හුන ය, ශාක්‍යයෝ නො වෙති යි කියති. විඩූඩභයාගේ භටයෝ ඔවුන් ද මහානාම රජු හා ඔහු වෙත සිටියවුන් ද හැර කිඹුල්වතැ සිටි ඉතිරි සියලු ශාක්‍යයන් මරා දැමූහ. තෘණ පෙන්වා රවටා දිවි රැක ගත්තෝ තෘණ ශාක්‍ය නමින් ද හුණු දඬු පෙන්වා රවටා දිවි රැක ගත්තෝ එ තන් සිට නළ ශාක්‍ය නමින් ද හැඳින්වුණහ.

විඩූඩභ තෙම මෙසේ ශාක්‍යයන් බොහෝ දෙනකුන් මරා කිඹුල්වත පාලු කොට පෙරලා සැවැත් පුර බලා තික්මුණේ ය. ඔවුන් අචිරවතී නදියට ළං වූයේ අඳුරේය. කලුවර බැවින් තවත් ඉදිරියට යැ නො හැක්කාහු නදිය අද්දර කඳවුරු බැඳ ගත්හ. නියං සමය බැවින් සමහර කෙනෙක් වැලි තලාව මත්තෙහි වැද හොත්හ. සමහරු ගොඩ වැද හොත්හ. වැලි තලාවේ හොත් සමහරු වැල්ලෙහි කඩි මතු වී ඇඟ වැද ගත් බැවින් එතැනින් නැගී ගොඩට ගොස් වැද හොත්හ. ගොඩ ද කිසි තැනෙක කඩි මතු වූයෙන් උහු නැගිට වැල්ලට ගොස් නිදා ගත්හ. මේ එද ඔවුන්ගේ මතු වූ පෙරකම්ය ක් නිසා වූ දැයෙක. මෙසේ පෙර කළ පවක් මතු වූවෝ වැල්ලට ගියහ. සෙස්සෝ ගොඩ රැඳුණහ.

ඔවුන් හැමට නින්ද ගිය නොබෝ වේලායෙහි නදීශීර්ෂයට මහ වැස්සෙක් වට. නදිය ගලන්නට විය. විඩූඩභයා සහිත භට සේනාවේ බොහෝ දෙනෙක් ගං වතුරෙන් ඇද ගෙන යන ලද්දාහු දියේ ගිලී මළාහ.*

---

* විඩූඩභ යුධයේ පුවත සර්වාස්තිවාදීන්ගේ පොත්හි එනුයේ මෙයට වෙනස්ව ය. උපග්‍රන්ථය බලන්න

මෙසේ කාසි කෝශල දෙරට ද අරාජක විය. වූ පවත් අසා අජාසත් රජ සැවැතට අවුත් සියලු කාශි කොශල දෙරටෙහි ද පාලනය තමා යටතට ගත්තේ ය.

# අට සාලිස් වන පරිච්ඡේදය

**භික්ෂුනට අපරිහානිය ධම් දෙසීම**

ටික කළක් **උළුම්ප** ගම වැස ඉන් නික්ම සැරිසරා වඩනා භාග්‍යවතුන් වහන්සේ රජගහ පුර වැඩ එහි ගිජුකුළු පව්වෙහි වූසූ සේක. ඒ කාලයෙහි අජාතශත්‍රැ රජ ලිච්ඡවි රජුන් නසනු කැමැත්තේ ස්වීය රාජ්‍යයත් ලිච්ඡවි රාජ්‍යයත් අතර සීමාව වූ ගංගා නදිය අද්දර පිහිටි පාටලී ග්‍රාමය සියලු නගරාංගයෙන් සම්පූර්ණ බලකොටු සහිත මහා නගරයක් කිරීමෙහි ස්ව අග්‍රාමාත්‍ය වූ **සුනිධ** වස්සකාර දෙ දෙනා යෙදී ය. ඔවුන්ගෙන් වස්සකාර බමුණා දිනක් භාග්‍යවතුන් වහන්සේ වෙත අවුත් පිළිසඳර කථා කොට පසෙක හිඳ ගත්තේ ය.

මෙ වේලෙහි භාග්‍යවතුන් වහන්සේ, පවන් සලමින් පිටු පස සිටි අනඳ තෙරුන් අමතා ලිච්ඡවිනට තමන් වහන්සේ වදාළ සප්ත අපරිහාණිය ධර්ම සත ඔහු රකිත් දැ යි අසා, ඔවුන් ඒ රකිනා බව තෙරුන් කී විට, සත ම තබා ඉන් එකක් රැක්කත් පිරිහීමක් නො වන බව වදාළ සේක. වස්සකාර බ්‍රාහ්මණයාට ද ආමන්ත්‍රණය කොට තමන් වහන්සේ පෙර විසල් පුරයේ සාරන්දද චෛත්‍යයෙහි වසන සමයෙහි ලිච්ඡවි රජුනට සප්ත අපරිහාණිය* ධර්ම වදාළ බවත් එ සප්ත ධර්මයන්හි පිහිටා සිටින තාක් ඔවුනට කිසි පිරිහීමක් නො වන බවත් වදාළ සේක.

වස්සකාර බමුණා නික්ම ගිය නොබෝ වේලාවකින් භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුනට රජගහ පුර සමීපයේ ඉන්නා සියලු භික්ෂූන් උපස්ථාන ශාලාවට රැස් කරන්නට නියෝග කළ සේක. තෙරණුවෝ

---

* වජ්ජිනට දෙසූ අපරිහාණිය ධර්ම සත:- 1 නිතරම පාහේ රැස්වීම් පැවත්වීම; 2. සමග ව රැස්ව හිදීම; සමගව නැගිටීම, සමග ව කටයුතුවල යෙදීම; 3 නො පැණවූවක් නො පැණැවීම, පැණවූ නීති කඩ නො කිරීම, පෞරාණික වජ්ජි ධම් පිළිගෙන එ අනුව පැවැත්ම, 4 වැඩිමහල්ලනට ගරු බුහුමන් කිරීම, ඔවුන්ගේ වචනයට ඇහුම් කන් දීම, 5 ඒ ඒ කුල ස්ත්‍රීන් කුල කුමරියන් බලාත්කාරයෙන් තම තමන් වෙත වාසයට නො පැමිණැවීම, 6 වජ්ජීන් පරම්පරා ගත ව ධාර්මික පූජායෙන් පිදූ දේවාලයනට ඒ පූජා නො කඩව කිරීම; 7 දක්ෂිණාර්හ වූ මහණ බමුණන් නිසි සේ රැක බලා ගැනීම.

එය කළහ. භාග්‍යවතුන් වහන්සේ ද උපස්ථාන ශාලාවට වැඩ පැනැවුණු අස්නේ හිඳ භික්ෂූන් අමතා අපරිහාණීය ධර්ම සප්තක පසක් හා ෂට්කයක් වදාළ සේක. ඒ මෙහි දැක්වේ.

### ප්‍රථම අපරිහාණීය ධර්ම සප්තකය.

1. භික්ෂූන් නිතරම පාහේ බොහෝ සෙයින් එක් රැස්වීම, 2. සමග ව රැස්වීම හා නැඟී සිටීම, සමග ව සංඝ කර්ම කිරීම, 3. තථාගතයන් වහන්සේ නො පැණැවූවක් නො පැණැවීම, පණවන ලද ශික්ෂා ධර්ම නො පිරිහෙළා මනා කොට රැකීම, 4. පැවිදි උපසපත් ව බොහෝ කල් වූ වැඩි සිටි මහ තෙරුනට ගරු බුහුමන් කිරීම, උන් වහන්සේගේ වචනයට ඇහුම් කන් දිය යුතු යැ යි සිතීම, 5. තෘෂ්ණාවට වාල් නො වීම, 6. අරණ්‍ය සේනාසනයන්හි භාවනායෙහි යෙදී විසීම, 7. එළැඹ සිටි සිහි ඇති ව විසීම, නොපැමිණි ප්‍රියශීල සබ්‍රම්සරුන්ගේ පහසුව පැතීම.

### දෙවැනි අපරිහාණීය සප්තකය.

1. සිවුරු දෙවීම් මැසීම් ආදී කර්මයන්හි ම මුළු කාලය නො යොදා ඒ ඒ කටයුතු පැමිණි වේලායෙහි ම එය කිරීම, 2. ආලාප සංලාප කථායෙහි ඇලී නො ඉඳීම, 3. නිද්‍රායෙන් කල් නොගෙවීම, 4. ගණ සඞ්ගණිකායෙහි නො ඇලීම, 5. පහත් අදහස්වලින් වෙන් වීම, එසේ වූ අදහස් ඇත්තන්ගෙන් වෙන් වීම, 6. පාප මිත්‍රයන් නො සෙවීම, ඔවුනට නො නැමීම, 7. ප්‍රථම ධ්‍යානාදියක් ලද තරමින් නො නැවතී මතු ගුණයන් ද ලැබීමට තැත් කිරීම.

### තෙ වෙනි අපරිහාණීය ධර්ම සප්තකය.

1. ශ්‍රද්ධාවත් වීම. 2. පවට ලජ්ජා ඇති වීම. 3. පවට බිය ඇතිවීම. 4. බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව. 5. පටන් ගත් කායික චෛතසික වීර්‍ය්‍ය ඇති වීම. 6. එළැඹ සිටි සිහි ඇති වීම. 7. ප්‍රඥාවත් වීම.

### චතුර්ථ අපරිහාණීය ධර්ම සප්තකය.

1. ස්මෘති සම්බෝධ්‍යඞ්ගය වැඩීම. 2. ධර්මවිචය සම්බෝධ්‍යඞ්ගය වැඩීම. 3. වීර්‍ය්‍ය සම්බෝධ්‍යඞ්ගය වැඩීම. 4. ප්‍රීති සම්බෝධ්‍යඞ්ගය වැඩීම. 5. ප්‍රශ්‍රබ්ධි සම්බෝධ්‍යඞ්ගය වැඩීම. 6. සමාධි සම්බෝධ්‍යඞ්ගය වැඩීම. 7. උපේක්ෂා සම්බෝධ්‍යඞ්ගය වැඩීම.

### පංචම අපරිහාණීය ධර්ම සප්තකය

1. අනිත්‍ය සංඥාව වැඩීම. 2. අනාත්ම සංඥාව වැඩීම. 3. අශුභ සංඥාව වැඩීම. 4. ආදිනව සංඥාව වැඩීම. 5. ප්‍රහාණ සංඥාව වැඩීම. 6. විරාග සංඥාව වැඩීම. 7. නිරෝධ සංඥාව වැඩීම.

## අපරිහාණි ධර්ම ෂට්කය

*1. සබ්‍රහ්මචාරීන් කෙරෙහි සම්මුඛාසම්මුඛ තන්හි මෛත්‍රී කාය කර්මය එළැඹීම. 2. සබ්‍රහ්මචාරීන් කෙරෙහි සම්මුඛාසම්මුඛ දෙතන්හි ම මෛත්‍රී වාක් කර්මය එළැඹවීම. 3+ සබ්‍රහ්මචාරීන් කෙරෙහි සම්මුඛාසම්මුඛ දෙතන්හි ම මෛත්‍රී මනඃකර්මය එළැඹැවීම.

4. ‡ දැහැමෙන් ලත් සිවුපසය සබ්‍රහ්මචාරීන් හා සාධාරණ පරිභෝගයෙන් පරිභෝග කිරීම. 5. සබ්‍රහ්මචාරීන් හා ශීලයෙන් සමව විසීම. 6. සම්‍යග් දෘෂ්ටියෙන් සබ්‍රහ්මචාරීන් හා සම ව විසීම.

බුදුරජාණන් වහන්සේ රජගහපුර ගිජ්ඣකූළ පව්වෙහි වසමින් මේ අපරිහාණීය ධර්මයන් ම බෙහෙවින් වදාළ සේක.

**රජගහෙන් අම්බලට්ඨිකාවට**

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රජගහ පුරයෙන් භික්ෂු සඞ්ඝයා සහිත ව පිටත් ව චාරිකායෙහි යෙදුණු සේක්, රාජගහ නාලන්දා යන දෙ නුවර අතර වූ **අම්බලට්ඨිකා** නම් උයනෙහි රජහු පිණිස කරවා තුබුණු ගෘහයට වැඩි සේක. පිරිනිවන් පෑමට සමීප වූ කාලය බැවින් 'ශීලය මෙ සේ ය. ප්‍රඥාව මෙසේ ය. ශීලයෙහි පිහිටා වැඩූ (විදර්ශනා) ප්‍රඥාව මහත් ඵල ඇත. (විදර්ශනා) ප්‍රඥායෙහි වැඩූ සිත කාමාශ්‍රව, භවාශ්‍රව, දෘෂ්ට්‍යාස්රව, අවිද්‍යාශ්‍රව යන මොවුන්ගෙන් මනා ව මිදෙතැ'යි මේ කථාව ම බෙහෙවින් වදාළ සේක.

**අම්බලට්ඨි කායෙන් නාලන්දවට**

නැවැත අම්බලට්ඨිකායෙන් පිටත් ව භික්ෂු පිරිස සහිත වූ භාග්‍යවතුන් වහන්සේ නාලන්දා පුරයට වැඩ එහි පාවාරික අඹ වනයෙහි වුසූ සේක. එහිදී බොහෝ සෙයින් ශීල සමාධි ප්‍රඥා කතාව ම වදාළ සේක.

---

* මෛත්‍රී කාය කර්මය නම්: මෛත්‍රී සිතින් කටයුතු කාය කර්ම යි. වාක් කර්ම මනඃ කර්ම ද මේ අනුසාරයෙන් දත යුතු. ආභිසමාචාරිකවත් පිරීම භික්ෂූන් ගේ මෛත්‍රී කාය කර්මයි. චෛත්‍ය වැඳීමට බෝධි වන්දනාවට සංඝයා වැඩම කැරැවීමට යෑම, පිඩු පිණිස වැඩි භික්ෂූන් දැක 'පෙර ගමන් කිරීම, පාත්‍රය පිළි ගැනීම, අසුන් පැණවීම් ආදිය ගිහියන් ගේ මෛත්‍රී - කාය කර්ම යි. මෛත්‍රී සිතින් බණ දහම් ඉගැන්වීම, කමටහන් කීම භික්ෂූන්ගේ මෛත්‍රී' වාක් කර්මයි. වැඳුම් පිදුම් සඳහා යමු, බණ අසන්නට යමු, යන ආදී වශයෙන් පින් කිරීමෙහි තමන් අනුන් යෙදැවීම සඳහා කරන ගිහියන්ගේ කථාව ගෘහස්ථයන්ගේ මෛත්‍රී වාක් කර්ම නම්.

+ 'මේ සබ්‍රහ්මචාරීන් වහන්සේ සුවපත් වෙත්වා' යන ආදීන් හිත චිත්තය පැතිරැවීම භික්ෂූන් ගේ මෛත්‍රී මනඃ කර්ම නම්. 'අපේ ස්වාමීන් වහන්සේ සුවපත් වෙත්වා' යන ආදීන් සිතන ගිහියන් ගේ ඒ සිතීම් ගෘහස්ථයන්ගේ මෛත්‍රී මනඃකර්ම නම්.

‡ කුහක කම් ආදියෙකින් නොව පිඩු පිණිස හැසිරීමෙන් යුතු ලෙස ලැබූ සිවුරු, පිණ්ඩපාත සෙනසුන් ගිලන් පස යන මේවා දහැමෙන් සෙමෙන් ලත් සිවු පස නම්.

**නාලන්දවෙන් පාටලිගමට පාටලිපුත්‍ර නුවරේ ආරම්භය**

ඉක්බිති නාලන්දායෙන් පිටත් ව භික්ෂු පිරිස හා පාටලි ගමට වැඩි සේක. පාටලී ගම්වැසි උපාසකයෝ භාග්‍යවතුන් වහන්සේ එහි වැඩි බව අසා ඔබ වෙත පැමිණියහ. පැමිණ තමන් ගේ ආවාස ගෘහය පිළිගන්නා ලෙස ආයාචන කළහ. භාග්‍යවතුන් වහන්සේ ද තුෂ්ණීම් භාවයෙන් ඒ ඉල්ලීම පිළිගත් සේක. ඉක්බිති උපාසකවරු ආවාස ගෘහය වෙත ගොස් එය අසුන් පැණැවීම ආදියෙන් පිළියෙල කොට අවුත් එහි වඩින ලෙස භාග්‍යවතුන් වහන්සේට දැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ ද භික්ෂු සංඝයා හා එහි වැඩි සේක. එහි දී පාටලි ග්‍රාමීය උපාසකයනට සිල් රැකීමේ අනුසසුත් දුශ්ශීල බවේ දොසුත්* වදාළ සේක.

මේ කාලයෙහි අජාතශත්‍රු රජුගේ ප්‍රධාන අමාත්‍ය වූ සුනීධ වස්සකාර දෙදෙන ලිච්ඡවීන් මැඩලීම පිණිස පාටලී ගමෙහි නුවරක් කරවන්නෝ වූහ. බුදුරජාණන් වහන්සේ දිවැසින් බලා එහි ඒ ඒ තන්හි මහායශස්ක අල්පයශස්ක දෙවියන් අධිගෘහිත වන සැටිත් එය **පාටලීපුත්‍ර** නම් මහා නගරයක් වන සැටිත් මතු ඒ නගරයෙන් කොටසක් ගින්නෙන් ද, තව කොටසක් ගංගා නදිය ගැලීමෙන් ද, තවත් කොටසක් නුවර වැසියන්ගේ අන්‍යෝන්‍ය භේදයෙන් ද විනාශ වන සැටිත් අනඳ තෙරුනට වදාළ සේක.

**ගෞතම වාරය ගෞතමතීර්ථය**

**සුනීධ වස්සකාර** දෙදෙන බුදුරජාණන් වහන්සේ කරා එළැඹ තමන් ගේ දානය භික්ෂු සංඝයා සහිත ව පිළිගන්නා ලෙස අයැදූහ. බුදුරජාණන් වහන්සේ එය පිළිගෙන ඔවුන් කල් දැන්වූ විට ඔවුන් ගේ ආවාසය කරා වැඩි සේක. ඒ අමාත්‍යවරු භාග්‍යවතුන් වහන්සේ ප්‍රමුඛ භික්ෂු සංඝයා වඩා හිඳුවා දන් දුන්හ. වළඳා අවසන්හි ඒ ඇමැතියන් පසෙක උන් කල්හි **"යස්මිං පදෙසෙ කප්පෙති"** ආදී ගාථාවලින් අනුමෝදන බණ

* ප්‍රාණඝාත අදත්තාදනාදි දුශ්ශීල කමෙහි යෙදීමෙන් ධාර්මික රැකී රක්ෂාවක් කැර ගන්නට ඉඩ නො ලැබීම, බන්ධනාගාරයෙහි දුක් විඳින්නට සිදුවීම යන ආදී වශයෙන් මහත් වූ සම්පතින් හානියට පැමිණී ම ද, මෙ තෙම දුශ්ශීලයෙකැ යි රටේ මහත් අපකීර්තියක් පැතිර යෑම, සභාවට තේජස් රහිත ව පැමිණීම, සිහිමුළා ව කළුරිය කිරීම, මරණින් මතු දුගතියෙහි ඉපැදීම යන මොහු දුශ්ශීල බවේ දෝෂයෝයි. සිල් රක්නාහු නො පමා බැවින් ධන රැස් කර ගෙන දියුණුවීම. මේ සිල්වතෙකැයි කීර්තිය පැතිරීම. සභාවට අභීත ව තේජස් සහිත ව එළැඹීම. සිහිමුලා නොවී කළුරිය කිරීම. මරණින් මතු සුගතියේ ඉපැදීම යන මොහු සිල්වත් බවේ අනුසස් ය.

වදාරා වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ නගර භූමියෙහි යම් දොරෙකින් නික්මුණු සේක් ද, එ දෙරට **ගෞතමද්වාර** යැයි නම් කළහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂු පිරිස හා ගංගා නදිය අද්දරට වැඩි සේක. එහි උන් වහන්සේ පැමිණි තොටට **ගෞතමතීර්ථ** යැ යි ද නම් කළහ.

එ සමයෙහි ඒ ගඟ පිරි ගලයි. මිනිස්සු එතෙර වනු පිණිස නැව් ඔරු ආදිය සොයමින් ද පසුරු බඳිමින් ද සිටියහ. එහෙත් භාග්‍යවතුන් වහන්සේ භික්ෂු පිරිස සහිත ව ඍද්ධි බලයෙන් ක්ෂණයෙකින් එතෙර වූ සේක. ඉක්බිති,

**"ගැඹුරු සසර සයුරින් ද තෘෂ්ණා නදියෙන් ද එ තෙර වන උතුමෝ ආර්‍ය මාර්ග නැමැති හෙය කොට මඩ වගුරු ස්පර්ශ නො කොට එ තෙර වෙත්. ස්වල්ප දිය කඩෙකින් එතෙර වියැටි මේ ජන තෙම පසුරු බඳී. එහෙත් ආර්‍ය මාර්ග නුවණින් යුත් තථාගත තෙමේ ද තත්ශ්‍රාවකයෝ ද පසුරක් නො මැති ව එ තෙර වත්හැ"**යි මෙසේ උදන් ඇනූ සේක.

**කෝටි ග්‍රාමයට වැඩීම**

ඉක්බිති **කෝටිග්‍රාමයට** වැඩ එහි වසන සේක්, දිනෙක භික්ෂූන් අමතා, **"ආර්‍ය ශීල, ආර්‍ය සමාධි, ආර්‍ය ප්‍රඥා, ආර්‍ය විමුක්ති යන සතර ධර්මයන් අනුබෝධ ප්‍රතිවේධ නො කළ හෙයින් පෙර දීඝ සසරෙහි තමන් වහන්සේත් එ භික්ෂූනුත් ඇවිද්ද බවත්, නමුත් මේ අත්බව්හි එ දෙ පක්ෂය විසින් ම එය අනුබෝධ ප්‍රතිවේධ කළ බවත් එ හෙයින් ඔබට පුනර්භවයක් නැති බවත්** වදාළ සේක. මෙහි වෙසෙමින් බෙහෙවින් ශීල සමාධි ප්‍රඥා කථාවම වදාළ සේක.

**ඥාතික ගමට වැඩීම**

කෝටිග්‍රාමයේ ටික කලක් වැස ඉන් **ඥාතික** ගමට වැඩි සේක. එහි උළු ගෙයි (**ගිංජකාවසථ** යැ යි සම්මත ආවාසයෙක) හිඳ එ ගමෙහි කළුරිය කළ **සාළ්හ භික්ෂු, නන්දා මෙහෙණි** ආදීන් ගේ පරලොව ගතිය විචාළ අනඳ තෙරුනට එය විස්තර කොට එයම අරභයා **ධර්මාදර්ශ** නම් ධර්ම ක්‍රමය වදාළ සේක. භාග්‍යවතුන් වහන්සේ **ජනවසභ සූත්‍රය** දෙසූයේ ද මෙහි දී ම ය.

**විසල් පුර වැඩීම**

**ඉන්** නික්ම වෛශාලි පුරයෙහි **අම්බපාලි ගණිකාව ගේ** උයනට වැඩ එහි දී භික්ෂූනට **සතිපට්ඨාන දේශනාව** වදාළ සේක. **අම්බපාලි** ද* භාග්‍යවතුන් වහන්සේ වැඩි බව අසා යුහුසුලු ව

* මෝ තොම **භො බෝ** දිනකින් පැවිදි වී මහණ දම් පුරන්නී සිය පුත් **විමල කොණ්ඩඤ්ඤ තෙරුන්** ගෙන් බණ අසා රහත් වූවාය

ගොස් පසු දා දනට නිමතා එ දින බුධ ප්‍රමුඛ සංඝයා වැඩම කරවා දන් දී භාග්‍යවතුන් වහන්සේ සිය අඹ වනයෙන් පිදූහ. ස්වල්ප කලක් භාග්‍යවතුන් වහන්සේ විසල් පුර වුසූ සේක. මෙ සමයෙහි විසල් පුරය සමීපයෙහි නුවරින් පැසිම් දිග වන ලැහැබෙහි දී **මහා සිංහනාද*** සූත්‍රය වදාළ සේක.

# එකුන් පනස් වන පරිච්ඡේදය

## පරිනිර්වාණ වර්ෂය

**පාඨික පුත්‍රයාගේ පෙළහර දක්නට රැස් වුවන්ගේ සමාගමය**

විසල් පුර **සුනක්ඛත්ත** නම් ලිච්ඡවියෙක් සස්නෙහි පැහැදී පැවිදි වීය. හේ භාග්‍යවතුන් වහන්සේගෙන් කමටහන් ගෙන වඩා දිවැස් ලද්දේ දිව කනත් ලබන්නට පිළිවෙත් විචාළේ ය. පෙර පැවිදි කෙනෙකුගේ කම්මුලට ගසා බිහිරි කළ පවින් ඔහුට දිවකන් නො ලැබෙන බව දුටු භාග්‍යවතුන් වහන්සේ එයට පිළිවෙත් නො වදාළ සේක. භාග්‍යවතුන් වහන්සේ තමාට දිව කන් ලබනුවට පිළිවෙත් නුදුන්නේ ඊර්ෂ්‍යායෙනැ යි වරදවා සිතූ සුනක්ඛත්ත තෙම භාග්‍යවතුන් වහන්සේ කෙරේ වෛර බැන්දේ ය.

භාග්‍යවතුන් වහන්සේ බුළු ජනපදයෙහි **උත්තරකා** නම් නිගමයෙහි වසන සමයෙහි දිනෙක සුනක්ඛත්ත තෙම එහි බලු තපස් කරන **කෝරක්ඛත්තිය** නම් තීර්ථකයකු දැක 'මේ රහතෙකැ'යි සිතී ය. භාග්‍යවතුන් වහන්සේ ඒ දැක ඔහු සිතූ සැටි වරදයැ යි වදාරා කෝරක්ඛත්තිකයා රහතක්හු නො වන බවත්, තව සත් දිනෙකින් අධිකාහාරසේවන හේතුයෙන් මියැ කාලකංජක අසුර නිකායෙහි උපදනා බවත්, මළ කල මිනිසුන් ඔහු **බීරණත්ථම්භ** නම් සොහොනට ඇද දමන බවත් වදාළ සේක.

සුනක්ඛත්ත තෙම කෝරක්ඛත්තියයා වෙත ගොස් එ පවත් කී ය. හේ ඒ කතාව බොරු කරමි යි සිතා නිරාහාරව සිටියේ ය, සත් වන දා ඔහුගේ උපස්ථායකයෙක් සත් දිනක් ම අප ශ්‍රමණයන් වහන්සේ ගෙට නො වැඩි සේකැ'යි කියා මිහිරි බොජුන් ගෙන්වා ගෙන ගොස් උහු ඉදිරියේ තැබී ය. නිර්ග්‍රන්ථ තෙම එ භෝජන දැක 'ශ්‍රමණ ගෞතමයන් කී දෑ සැබෑ වතත් බොරු වතත් කා සුවසේ මළත්

---

* මෙය මැදුම් සඟියේ සූත්‍රයෙකි

මැනැවැ`යි සිතා නො දිරවා ගත හැකි තාක් කා දිරවා ගත නො හැකි ව මියැ කාලකංජක අසුර නිකායෙහි උපන. ඔහු මළ සිරුර වෙන අනෙක ඇද දමන්නට තීත්ථිකයෝ උත්සාහ කළෝ නො හැකි ව බීරණත්ථම්භ සොහොනට ම ඇද එ තැනින් එය නො සෙලැවිය හැකි ව එහි ම ලා ගියහ.

සුනක්ඛත්තයා මෙය දැක විස්මිත ව `ඔබ කාලකංජක අසුර නිකායයේ උපන්නා සැබෑ දැ?`යි එ මළ සිරුරින් ම පිළිවිසී. භාග්‍යවතුන් වහන්සේ අසුරයා ඔහු සිරුරට ආවිෂ්ට කරවා, ඔහු අසුර යෝනියේ උපත් බව කියැවූ සේක.

නැවැත කලෙක භාග්‍යවතුන් වහන්සේ විසල් පුර කූටාගාර ශාලායෙහි වසන සේක. එ නුවර **කළාරමට්ඨුක** නම් නිගණ්ඨයෙක් වෙසේ. සුනක්ඛත්ත මහණ උහු කරා ගොස් පැන පුළුවත. හේ `අවසර නැති ව ප්‍රශ්න විචාරහි යැ`යි පලවාපී ය. සුනක්ඛත්තයා `රහතකුට ද්‍රෝහ කෙළෙමි`යි බියව ඔහු කමා කැරැවී ය.

භාග්‍යවතුන් වහන්සේ සුනක්ඛත්තයා ගේ ක්‍රියා දැක, ඔහු මිථ්‍යා තපෝව්‍රත රක්නා නො රහතකු රහතැ යි වරදවා ගැන්මේ දොස් දැක් වූ සේක. කළාරමට්ඨුකයා ද මිථ්‍යා තපස් කොට ලාභයෙන් යශසින් පිරිහී මෙළේ ය.

තව ද විසල් පුර පාථික පුත්‍ර නම් නිර්ග්‍රන්ථයෙක් ලාභයෙන් යසසින් අගපත් ව වෙසේ. හේ භාග්‍යවතුන් වහන්සේ හා වාද කැර පෙළහර කැර පරදවනු සමත් බවත් මහ පිරිස් මැද දී කියයි. ඇතැම් නුවරු `මේ කියන්නේ හැකි බැවින් ම ය. මේත් රහතෙකැ`යි සිතා ඔහුට මහත් සත්කාර කළහ.

සුනක්ඛත්ත තෙම පාථික පුත්‍රයා ගේ කථාව අසා උහු කරා ගියේ ය. ගොස් භාග්‍යවතුන් වහන්සේ හා වාදයට සැරැසියක්හු සේ හඟවන්නටත් තමා භාග්‍යවතුන් වහන්සේ වාදයට අව නො දී අන් තැනකට ගෙන යන බවත් කියා ඔහු පොළොඹවා ආයේ ය. හේ භාග්‍යවතුන් වහන්සේ කරා අවුත් `පාථික පුත්‍රයා ඔබ වහන්සේ හා පෙළහර කරන බව කීයේ යැ`යි දැන්වී ය.

තමා `බුඩ` ය යන කථාව නො හැර ඔහු තමන් වහන්සේ කරා ඉයැ නොහැකි බව භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

`වහන්ස, ඔය වදාළ බස රැක්ක මැනැව`යි සුනක්ඛත්ත කීය.

`කුමට එසේ කියහිදැ?`යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළහ.

'ඔහු තමා බුදුහු යැයි යන කීමත් දෘෂ්ටියත් නො හැර සිය වෙසින් පෙනී හෝ නො පෙනී, සිංහ ව්‍යාඝ්‍රාදි වේශයෙකින් හෝ භාග්‍යවතුන් වහන්සේ වෙත ආවොත්, භාග්‍යවතුන් වහන්සේ ඔය වදාළ වචනය බොරු වේ. එවිට භාග්‍යවතුන් වහන්සේට මම් බොරුයෙන් නිග්‍රහ කරම්'යි කී ය.

තමන් වහන්සේ වදාළ දෑ බොරු නො වන බව භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ එදා පස්වරු පාථික පුත්‍රයාගේ ආරාමයට වැඩි සේක. සුනක්ඛත්ත තෙම විසල් පුරැදී 'ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේත් පාථික පුත්‍රයා ගේත් ප්‍රාතිහාර්‍ය්‍ය බලම්හ'යි කී ය. මහජනයා පාථික පුත්‍රයා ගේ ආරාමයෙහි රැස් වූහ. පාථික පුත්‍ර තෙම කලින් ම මෙ පවත් අසා බිය වැද පලා ගොස් තිම්බරුක පරිව්‍රාජකයා ගේ ආරාමයට වැදැ එහි සැඟෙවෙන තෙනක් සොයා බලා ආරාමයේ පිටිපස කුඩා ලැහැබෙක ගලක් මත්තේ උන්නේ ය.

'මේ අන්ධබාල තැනැත්තේ කිසිවකු ගේ පෙරැත්තයෙන් ඉදින් ආයේ නම් මොහුට වන්නේ මහත් විනාශයෙකැ'යි දැන භාග්‍යවතුන් වහන්සේ 'ඔහු හුන් ගල ඇහැ ඇලේවා'යි ඉටූ සේක. ඒ එසේ මැ වී ය.

මහජනයා පාථික පුත්‍රයා සොයන්නේ ඔහු තිම්බරුක පරිව්‍රාජකයාගේ ආරාමයෙහි ඉදිනැ යි අසා ඔහු කැඳවා පණිවුඩ යැවී ය.

හේ 'එම්'යි කියා හුන් ගලෙහි ම ඇලෙයි. ඒ පුරුෂ තෙම එ දැන ගොස් මහජනයාට එ බව කීය.

භාග්‍යවතුන් වහන්සේ ඔහු තමන් වහන්සේ දක්නට ඊමට නො සමත් බව වදාළ සේක.

එ කල ලිච්ඡවි ඇමැතියෙක් පාථික පුත්‍රයා කරා ගොස් එ පවත් කියා ඔහු ගෙන එන්නට තැත් කොටත් බැරි වැ අවුත් රැස් වූ පිරිසට එ බව කී ය.

ඔහු තමන් වහන්සේ දක්නට ඊමට නො තිසි බවත් කිසිවකුට ඔහු නො ගෙනා හැකි බවත් භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

**ජාලිය** නම් දාරුපත්තිකයකු* ගේ අතවැස්සෙක් එය අසා 'මම් ඔහු ගෙනෙන්නෙම්'යි කියා ගොස් උත්සාහ කෙළේ, උන් තැනින් නැඟී සිටින්නටද නො හැකි ව ගලෙහි ම ඇලී ඉන්නහු දැක, ඔහුට බැණ වැදී අවුත් එ පවත් මහ පිරිසට සැළ කෙළේ ය.

---

* 'දරුපත්තික' යනු ලී පාත්‍රයක් දරන පිරිවැජියෙකි.

භාග්‍යවතුන් වහන්සේ පාථික පුත්‍රයා එහි ඊමට අසමත් බව වදාරා පිරිසට දම් දෙසූ සේක.

දේශනාවසානයේ දී සුවාසූ දහසක් ප්‍රාණීහු සත්‍යාධිගමය කළහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ තේජෝ ධාතු සමාපත්තියට සමවැද අහස් නැග රස් විහිදුවා බැබළී මෙසේ පෙළහරක් කොට කූටාගාරශාලා විහාරයට වැඩි සේක.

**අන්තිම වස බේලුව ගමෙහි, භාග්‍යවතුන් වහන්සේට ලොහිත පක්ඛන්දිකා රෝගය වැළඳීම**

භාග්‍යවතුන් වහන්සේ අම්බපාලි වනයෙන් නික්ම බේලුව ගමට වැඩ, කැටු ව ගිය භික්ෂූනට විසල් පුර හාත් පසැ යහළු භික්ෂූන් ගේ සෙනසුන්හි වස් එළැඹෙන්නට නියෝග කොට තමන් වහන්සේ බේළුව ගමෙහි වස් එළැඹි සේක. එහි දී 'තව දස මසෙකින් පිරිනිවන් පාන්නෙමි'යි ඉටා ගත් සේක. මෙ සෙමෙහි භාග්‍යවතුන් වහන්සේට දරුණු ලෝහිත පක්ඛන්දිකා* රෝගයෙක් ඇති වී ය.

**සක්දෙව් රජ භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කිරීම**

එය දැන ගත් සක්දෙව් රජ රාත්‍රියෙහි එහි මිනිස් වෙසින් පැමිණ සිය අතින් භාග්‍යවතුන් වහන්සේගේ පා මිරිකුයේ ය. මේ කවුරුදැ'යි බුදුරජාණන් වහන්සේ විචාළ කල 'මම ශක්‍ර වෙමි'යි සක්දෙව් කී ය. 'කුමට ආයෙහි දැ?'යි බුදුරජාණන් වහන්සේ ඇසූ සේක. 'වහන්ස, ගිලන් වූ ඔබට උපස්ථානයට' යැ යි සක් දෙව් කී ය. 'ශක්‍රය, මිනිස් ගඳ යොදුන් සියක පටන් ගෙලේ බැඳි කුණපයක් මෙන් දෙවියනට ඉසිලිය නොහේ. ඔබ යන්න. මට ග්ලානෝපස්ථානයට භික්ෂූහු ඇතැ'යි බුදුරජාණන් වහන්සේ වදාළ සේක. 'වහන්ස, මම් යොදුන් අසූ සාර දහසක් තරම් ඉහළ සිට ඔබේ ශීල සුගන්ධය ආඝ්‍රාණය කොට ආමි. මම ම උපස්ථාන කරන්නෙමි' යැ යි සක්දෙව් කී ය. මෙසේ කියා හෙතෙම භාග්‍යවතුන් වහන්සේ ගේ ශරීර වලංජන භාජනය අනෙකකුට අල්ලන්නටත් නො දී සිය හිසේ ම තබා ඉවත ගෙන යන්නේ මුව හැකිළීම් පමණකුත් නො කෙළේ ය. සුවඳ බඳුනක් ගෙන යන කලෙක මෙන් ඉතා සතුටින් ගෙන ගියේ ය. භාග්‍යවතුන් වහන්සේ ද වීර්‍ය්‍යයෙන් ඒ රෝගය මැඩ පවත්වා, තව දස මසක් ම එය මතු නො වන ලෙස සමාපත්ති බලයෙන් යටපත් කළ සේක.

* මෙහි ලෝහිතපක්ඛන්දිකා යනු ලේ අර්ශසයැ යි සිතමු.

භාග්‍යවතුන් වහන්සේ ගිලන් බැවින් නැඟී සිටි පසු ම ශක්‍රයා නික්ම ගියේ ය. ශක්‍රයා ගේ උපස්ථාන ගැන භික්ෂූන් අතර කථා ඇති වූ විට භාග්‍යවතුන් වහන්සේ ඒ මුල් කොට ගෙන "**සාහු දස්සන මරියානං**"[215] ආදී ගාථා වදාළ සේක.

**බුදු සස්නේ ගුරුමුෂ්ටි වශයෙන් සැඟෙවූ කිසිත් නැති බව**

යට කී පරිදි ගිලන් බැවින් නැඟී සිටි භාග්‍යවතුන් වහන්සේ විහාරයෙන් නික්ම වෙහෙර අද්දර සෙවණෙහි පණවන ලද අස්නෙහි වැඩහුන් සේක. අනඳ තෙරණුවෝ ද එහි පැමිණ පසෙක උන්හ. එසේ හිඳ භාග්‍යවතුන් වහන්සේ ගේ අසනීපය දැක්මෙන් තමන් තුළ බලවත් ශෝක ඇති වූ බවත්, භාග්‍යවතුන් වහන්සේ පශ්චිමාවවාදය වදාරා මිස නැත හොත් පිරිනිවන් නො පාන සේක් යි සිතීමෙන් ම යන්තම් අස්වැසිල්ලක් ඇති කැර ගත හැකි වූ බවත් කීහ. එ විට භාග්‍යවතුන් වහන්සේ තමන්ගේ ධර්මය කිසිත් සැඟෙවිල්ලක් නොකොට සියල්ල ම එළිදරව් කොට වදාළ බව පවසා ආත්මයය (තමාම)* (ධර්මය ම) පිහිට කොට ගෙන විසිය යුතු බව විස්තර කොට වදාළ සේක.

**බේලුව ගමින් සැවතට වැඩීම ධර්මාරාම භික්ෂු**

ඉක්බිති වස් කාලයෙන් පසු බේළුව ගමින් නික්ම සැවැත් පුරයට වැඩ එහි වුසූ සේක. එහිදී පිරිනිවන් පෑමට මාස සතරක් තිබියැ දී තව මාස හතරෙකින් මගේ පිරිනිවීම වෙතැ යි වදාළ සේක. ඒ ඇසූ නොයෙක් දහස් ගණන් භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ පිරිවරා හැසුරුණහ. පෘථග්ජන භික්ෂූහු කඳුළු පිරුණු ඇස් ඇත්තෝ වූහ. රහත්නට ධර්ම සංවේගය පහළ විය. සියලු භික්ෂූහු කුමක් කරමෝ දැ යි සිත සිතා සමූහ සමූහ වී හැසිරෙත්තෝ වූහු. එහෙත් **ධර්මාරාම** නම් භික්ෂුවක් භික්ෂූන් වෙත ද නො යයි. ඇවැත්නි, කිමෙක් දැ'යි අන් භික්ෂූන් ඇසූ විට පිළිතුරු ද නො දී, භාග්‍යවතුන් වහන්සේ ධරමාණ කල්හි ම රහත් වන්නෙමි'යි හුදෙකලා ව වසමින් බුධ වචනය ආවර්ජනය කරයි, සිතයි. නැවැත නැවැත සිහි කරයි. භික්ෂූහු ගොස් 'ධර්මාරාම තෙරුන් තුළ ඔබ වහන්සේට ස්නේහ මාත්‍රයකුත් නැතැ'යි බුදුරජාණන් වහන්සේට දැන්වූහු. එ විට භාග්‍යවතුන් වහන්සේ ධර්මාරාම තෙරුන් කැඳවා 'ඒ සැබෑ දැ'යි විචාළ සේක. ධර්මාරාම තෙරණුවෝ තමන් ගේ අදහස කීහ. භාග්‍යවතුන් වහන්සේ සාධුකාර දී '**මහණෙනි, මට ස්නේහ ඇති තවත් අන්‍ය භික්ෂුවක් ඇත්නම් ඔහුත් ධර්මාරාම භික්ෂු මෙන් විය යුතු.**

---

* මෙ තැන 'ආත්ම' යනු ආර්යමාර්ගය හා නිවන යි.

**මල් සුවඳ ආදියෙන් මා පුදන්නෝ ප්‍රධාන පූජායෙන් පුදන්නෝ නම් නො වෙත්. ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි පිළිපදනාහු ම මා ප්‍රධාන පූජායෙන් පුදන්නෝ නම් වෙති"**[216] යි වදාළ සේක.

**සැරියුත් තෙරුන් පිරිනිවන් පෑම, කාර්තික පෞර්ණමී දිනයෙහි**

බුදුරජාණන් වහන්සේ සැවැත් පුර වසන සමයෙහි සැරියුත් තෙරණුවෝ දිනක් තමන් **ජීවත්විය හැකි** කාලය බලා 'තව ජීවිත කාලය සතියෙකැ'යි දැන මවු සම්‍යග්දෘෂ්ටියෙහි පිහිටුවා, තමන් උපන් ගෙයි දී ම පිරිනිවන් පෑ යුතු යැ යි සනිටුහන් කොට භාග්‍යවතුන් වහන්සේට ඒ බව දන්වා, වැඳ අවසර ගෙන, මහද්භික්ෂු පිරිසක් හා තමන්ගේ උපන් ගම වූ **නාලක** නම් ගමට වැඩියහ. උන්වහන්සේ වදාළ බණ අසා මවු සෝවාන් පෙළෙහි පිහිටියහ. එදා අලුයම්හි සැරියුත් තෙරණුවෝ පිරිනිවන් පෑහ. ආයුෂ්මත් **චුන්ද** ස්ථවිරයන් වහන්සේ සැරියුත් තෙරුන්ගේ පාත්‍ර සිවුරු ද ධාතු ඇතුළත් පෙරහන ද ගෙන ජේතවනයට පැමිණ අනඳ තෙරුන් කැටුව භාග්‍යවතුන් වහන්සේ වෙත ගියහ. භාග්‍යවතුන් වහන්සේ ධාතු බහාලූ පෙරහන පිළිගෙන සැරියුත් තෙරුන් ගේ ගුණ වදාරා, ඒ ධාතුන් නිදන් කොට චෛත්‍යයක් කරවා, ඉක්බිති භික්ෂු පිරිස පිරිවරා රජගහ පුරයට වැඩි සේක.

**මුගලන් තෙරුන් පිරිනිවන් පෑම**

'මුගලන් තෙර දෙව්ලොව ද නිරයේ ද ඇවිද අවුත් සත්වයන් කළ පින් පව් හා ඒවායේ විපාක මිනිස්නට කියයි. එ හෙයින් මිනිස්සු ශ්‍රමණ ගෞතමයනට මහත් සත්කාර කරති. එ බැවින් මුගලන් තෙරහු මරා දැමීම යුතු ය'යි කියා තීර්ථකයෝ කුමන්ත්‍රණ කළහ. ඉක්බිති ඔහු සිය දායකයන්ගෙන් සමාදන් කොට කහවණු දාහක් ලබා පල් සොරුනට දී ඒ සමයෙහි **කාලසිලා** පර්වතයෙහි වුසූ මුගලන් තෙරුන් මැරීමෙහි ඔවුන් මෙහෙයූහ. සොරු ද එහි ගොස් උන් වහන්සේගේ වාසස්ථානය පිරිවැරූහ. උන් වහන්සේ ඒ බව දැන ස්විය ඍද්ධි බලයෙන් කෙසි සිදුරෙන් නික්ම වැඩියහ. සොරහු ද තෙරුන් නො දැක ගොස් තවත් දිනෙක අවුත් එ සේම වැටැලූහ. එදා පන්සලෙහි කැණිමඩල බිඳ අහස් නැඟැ වැඩියහ. මෙසේ ඒ දෙ වරෙහි ම සොරුනට සිය අදහස සිදු කළ හැකි නො විය. තුන් වන වාරයෙහි තෙරහු තමන් කළ පාප කර්මයෙක නො වැළැක්විය හැකි සේ විපාකය එළැඹ සිටි බව දැන පිටත නො ගොස් එහි ම හුන්හ. එ කල සොරු විත් උන් වහන්සේ තළා ඇට පොඩි කොට දමා 'මළහ'යි සිතා පඳුරක් මත්තේ හෙළා පලා ගියහ. තෙරණුවෝ ධ්‍යාන බලයෙන් ශරීරය ස්ථිර කොට ගෙන අහසින් රජගහ

පුර වැඩ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ වැඳ තමන් කාලශිලා ප්‍රදේශයෙහි දී පිරිනිවන් පානා බව දැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ ද ධර්මයක් දේශනා කරන ලෙස තෙරුනට වදාළහ. තෙරණුවෝ ද නොයෙක් සෘද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය දක්වා බණ වදාරා භාග්‍යවතුන් වහන්සේ ගේ පා මුලැ වැටී වැඳ අවසර ගෙන කාලශිලා වනයට වැඩ එහි දී පිරිනිවන් පෑහ. මෙය වූයේ සැරියුත් තෙරුණුවන් පිරිනිවුණු තන් පටන් දෙ සතියෙකින් පසු අව පසළොස්වක් දා ය.

**සැවතින් රජගහ පුර වැඩීම**

බුදුරජාණන් වහන්සේ මුගලන් තෙරුන් ගේ ද ධාතූන් ගෙන චෛත්‍යයක් කරවා රජගහ පුරයෙන් පිටත් ව පිළිවෙළින් වඩනා සේක්, ගංගානදී තීරයට පැමිණ එහි හිඳ සැරියුත් මුගලන් දෙ නම ගේ පිරිනිවීම මුල් කොට ගෙන බණ වදාරා නැඟී සිට එහි දකුණු දිග උක්කවේලා නිගමයට වැඩි සේක.

**විසල් පුර වැඩීම චාපාල චෛත්‍යයේදී මරුගේ ආයාචනය**

ඉන් නික්ම වඩනා භාග්‍යවතුන් වහන්සේ උදය කාලයෙහි විසල් පුරයට සම්ප්‍රාප්ත ව එහි පිඬු පිණිස හැසිර සවස් වේලෙහි චාපාල චෛත්‍යය වෙත එළැඹුණ සේක. එළැඹ පැණැවූ අස්නේ හුන් සේක්, එහි දී අනඳ තෙරුන් අමතා සතර සෘද්ධිපාදයන් වැඩූ තැනැත්තහු විසින් කැමැති නම් කල්පයක් හෝ එයට වැඩියක් කල් සිටිය හැකි බව තුන් වරක් ම වදාළ සේක. වසවත් මරු අනඳ තෙරුනට භයංකර අරමුණක් දැක්වීමෙන් උන් වහන්සේ එය බලා හුන්හ. භාග්‍යවතුන් වහන්සේට තව දීර්ඝ කාලයක් වැඩ ඉන්නා ලෙස ආයාචනය කිරීමට අමතක විය. ඉක්බිති අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වැඳ අවසර ගෙන ගොස් රුක් මුලෙක හුන්හ.

අනඳ තෙරුන් නික්ම ගිය නො බෝ වේලාවෙකින් වසවත් මර භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ පසෙක සිට පරිනිර්වාණයට කාලය බව දැන්විය. භාග්‍යවතුන් වහන්සේ ද මරහු අමතා එ තන් පටන් තුන් මසක් ගතවූ තැන පිරිනිවන් පානා බව වදාළ සේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ 'මෙ තුන් මසෙහි පමණක් සමවත් සමවැද ඉන් පසු එයට නො සමවදින්නෙමි'යි සිතින් නියම කැරැ ගත් සේක. (ආයුස්සංස්කාරය හළ සේක.) එ කෙණෙහි බිහිසුණු භූමිකම්පාවක් වි ය. අහස් ගිගුරුම් ද ඇති විය. එ බව සලකා භාග්‍යවතුන් වහන්සේ එ වේලෙහි,

'බුඩ මුනි තෙම පුනර්භවය ඇති කරන කර්ම නිරාලය ව හැර දැමී ය. රණ බිමෙක මහා යෝධයකු සන්නාහයක් බිඳ ලන්නා සේ විදර්ශනා භාවනායේ ඇලුණේ ශමථ භාවනා වශයෙන් සංහිඳුණේ ආධ්‍යාත්මික ක්ලේශ රාශිය බිඳැලී ය. ප්‍රහීණ කෙලෙස් ඇත්තහුට බියෙක් නැත. එ බැවින් අභීත ව ම බුඩ මුනි තෙම ආයුස්සංස්කාරය හළේ යැ'යි [217] මේ ප්‍රීති වාක්‍යය පහළ කළ සේක.

**භූමිකම්පා හේතු අට**

සිදු වූ භූමිචලනය දැක අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් භූමිකම්පාවට හේතු විචාළහ. එවිට භාග්‍යවතුන් වහන්සේ ධාතු ක්ෂෝභයෙන් ද, මහ පින්වතුන් ගේ ඍද්ධ්‍යනුභාවයෙන් ද, බෝධිසත්ත්වවරුන් ගේ ප්‍රතිසන්ධියෙහි දී ද, බිහිවීමේ දී ද, බුදු වීමේ දී ද, ධම්සක් පැවැත්වීමෙහි දී ද, බුදුරදුන් ගේ ආයුස්සංස්කාර හරණයෙහි දී ද, පරිනිර්වාණයෙහි දී දැ'යි යන අට කාරණයෙන් පෘථිවි චලනය වන බව වදාළ සේක.

**අනඳ තෙරුන් ගේ ඉල්ලීම**

ඒ අසා අනඳ තෙරණුවෝ ශෝක භරිත ව කපක් ජීවත් වන ලෙස ආයාචන කළහ. 'ඒ ආයාචනය කළ යුතු වූයේ එයට පෙර ආයුස්සංස්කාරය හරින්නට පළමු වෙනැ'යි වදරා එය ප්‍රතික්ෂේප කොට තුන් මසෙකින් පිරිනිවන් පාන බව වදාළ සේක.

**කූටාගාර ශාලාවට වැඩීම**

මෙයට පසු භාග්‍යවතුන් වහන්සේ මහා වනයෙහි කූටාගාර ශාලාවට වැඩි සේක. වැඩ, විසාලා පුර හාත්පස සිටින සියලු භික්ෂූන් උපස්ථාන ශාලාවට රැස් කරවන්නට අනඳ තෙරුනට නියෝග කළ සේක. භික්ෂූන් රැස් වූ පසු භාග්‍යවතුන් වහන්සේ උපස්ථාන ශාලාවට වැඩි සේක. එ හිදී ඔවුනට සතර සතිපට්ඨාන, සතර සම්‍යක් ප්‍රධාන, සතර ඍද්ධිපාද පඤ්චෙන්ද්‍රිය, පඤ්චබල, සප්තබොධ්‍යංග, ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ග යන මේ තමන් වහන්සේ ම දැන වදාළ බෝධි පාක්ෂික ධර්ම මනාව ඉගෙන පුරුදු පුහුණු කටයුතු බව විශේෂයෙන් වදරා.

'මහණෙනි, කරුණායෙන් ඔබ හැම දෙනාට කියමි. සියලු සංස්කාරයෝ නැසෙන ස්වභාව ඇත්තෝ ය. එළැඹ සිටි සිහි ඇතිව ගුණ දම් වඩවූ. ළඟ දී තථාගතයන් ගේ පිරිනිවීම වන්නේ ය. මෙයින් තුන් මසක් ගිය තැන තථාගත තෙම පිරිනිවෙන්නේ යැ'යි [218] වදළ සේක.

**ප්‍රජාවතී ගෞතමී යශෝධරා දෙනම පිරිනිවන් පෑම**

මේ සමයෙහි ම **ප්‍රජාවතීගෞතමී** මහා ස්ථවිරි ද එයින් පසු **යශෝධරා මහාස්ථවිරි** දැ යි යන දෙනම ද අවුත් භාග්‍යවතුන් වහන්සේ වැඳ අවසර ගෙන පෙළහර පා දම් දෙසා පිරිනිවන් පෑහ.

**භාණ්ඩ ග්‍රාමයට වැඩීම**

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වේසාලියෙන් පිටත්ව **භාණ්ඩග්‍රාමයට** වැඩි සේක. වැඩ එහි දී ආයර්‍ය ශීල, ආයර්‍ය සමාධි, ආයර්‍ය ප්‍රඥා, ආයර්‍ය විමුක්ති යන සතර ධර්මයන් අනුබෝධ ප්‍රතිවේධ නො කිරීම් හේතුයෙන් තමන් වහන්සේත් භික්ෂු සමූහයාත් දික් සසර හැසුරුණු බවත්, එහෙත් දැන් එ සතර ධර්මයෙන් අනුබෝධ ප්‍රතිවේධ කළ බවත්, තෘෂ්ණාව සුන් කළ බවත්, එ හෙයින් ඉන් මතු භවයක් නැති බවත් වදළ සේක. එහි වැඩ හිඳිමින් ශීල සමාධි විමුක්තීන් පිළිබඳ කථායෙන් ම කල් ගෙවූ සේක.

**අම්බග්‍රාමාදිය පසු කිරීම**

එයින් පිටත්ව පිළිවෙළින් **හස්තිග්‍රාමය, ආම්‍රග්‍රාමය, ජම්බුග්‍රාමය** යන ගම් පසු කොට **භෝගනගරයට** වැඩ එහි **ආනන්දචෛත්‍ය** ස්ථානයෙහි වුසූසේක. එහි දී භික්ෂූනට සතර **මහා අපදේශයන්** [219] වදළ සේක.

**පාවා නුවරට වැඩීම**

එහි ටික දිනක් වැස ඉන් පිටත්ව **පාවා නුවරට** වැඩ එහි **චුන්දකාර්මාර පුත්‍රයා** ගේ අඹ වනයෙහි වූ විහාරයෙහි වුසූ සේක. චුන්දකාර්මාර පුත්‍රයා බුදුරජාණන් වහන්සේ වැඩි බව අසා එහි ගොස් වැඳ පසෙක උන්නේ ය. ඔහුට බුදුරජාණන් වහන්සේ බණ වදළ සේක. සතුටු වූ **චුන්ද** තෙම දනට නිමන්ත්‍රණය කොට ගොස් පසු ද බුඩ ප්‍රමුඛ භික්ෂු සංඝයාට මධුර වූ ඛාද්‍ය භෝජ්‍යයෙන් සංග්‍රහ කෙළේ ය. භාග්‍යවතුන් වහන්සේ භෝජනාවසානයෙහි චුන්දයාට අනුමෝදන බණ වදරා එයින් නික්ම වැඩි සේක.

**රෝගය මතුවීම**

පෙර **බේලුව** ගම දී ලෝහිත පක්ඛන්දිකා රෝගය හට ගත් විට භාග්‍යවතුන් වහන්සේ එය දස මසක් ම නො හට ගන්නා ලෙස අධිෂ්ඨාන කොට සමාපත්ති බලයෙන් මැඩලූ සේක. ඒ දස මස ගත වූ බැවින් සැහැවී තුබුණු රෝගය මතුවිය. ඒ මතු වූයේ චුන්දයා ගේ දනය වැළැඳීමෙන් පසුය. එහෙත් චුන්දයාගේ සිතිඳුවූ බොජුන් වැළැඳි හෙයින් රෝගය මුල දී මෙන් බලවත් ව නො නැංගේ ය. එ භෝජනය නො වැළඳූ සේක් නම් එ දින රෝගය ඉතා

බලවත් ව දරුණු ලෙස නැගෙන්නේ ය. සමාපත්ති බලයෙන් එ දිනත් එය මැඩ පැවැත්විය හැකි වුවත්, බුඩ ශරීරය පවා රෝග පීඩාවනට ගොදුරු වන බවට සිය සිරුර ම ආදර්ශ කොට පෙන්වා භවය කෙරෙහි සිය සව්වන් කළකිරුවීමෙහි අදහසින් ටික වේලාවක් රෝගය එසේ ම තිබෙන්නට ඉඩ හැරි සේක.

**පුක්කුස නම් මල්ලරාජ පුත්‍රයා පැහැදීම**

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂු පිරිස කැටුව කුසිනාරා පුරයට වඩනා සේක්, ක්ලාන්ත බව දන්වා මහ රුකක් මුල හිඳගත් සේක. එසේ හිඳ පිපාසා ඇති බව වදරා අනඳ තෙරුන් ලවා පැන් ගෙන්වා වැළඳූ සේක. එ කල්හි ආළාරකාළාම තවුසාගේ ශ්‍රාවකයෙක් වූ **පුක්කුස** නම් මල්ල රාජ පුත්‍රයෙක් කුසිනාරාවේ සිට පාවා නුවරට යන්නේ රුක් මුල හුන් බුදුරජාණන් වහන්සේ දැක වැඳ පසෙක හිඳ ගත්තේ ය. එසේ හුන් ඔහුට භාග්‍යවතුන් වහන්සේ බණ වදරා ඔහු ශරණ ශීලයෙහි පිහිටුවා, ඔහු පිදූ රන්වන් මට සිලුටු වස්ත්‍ර දෙකින් එකක් තමන් වහන්සේ පිළිගෙන අනෙක අනඳ තෙරුනට පිළිගන්නවා ඔහුට බණ වදළ සේක. ඔහු ගිය පසු අනඳ තෙරණුවෝ තමා ලත් වස්ත්‍රයත් භාග්‍යවතුන් වහන්සේට එළැවූහ. බුදුරජාණන් වහන්සේ එකක් හැඳ අනෙක පෙරෑ වූ සේක. එ කලැ උන් වහන්සේ ගේ ශරීරය එද වැළඳූ විශිෂ්ට ආහාර හේතුයෙනුත් 'පෙර බුදුවරයන් වැඩි අමාමහ නිවන් පුරට අද ප්‍රවිෂ්ට වන්නෙමි'යැ යි හටගත් බලවත් සොම්නසිනුත්, බුදු වූ දිනයෙහි මෙන් ම, ගිනි දැල් නැතිව දිලිසෙන ගිනි අඟුරු රැසක් මෙන් අතිශයයෙන් දීප්තිමත් ව බැබැළුණේ ය.

**කුකුත්ථා නදිය කරා වැඩීම**

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහත් වූ භික්ෂු පිරිස හා **කුකුත්ථා** නම් නදිය වෙත වැඩි සේක. වැඩ, නදියට බැස ජලස්නානය කොට පැන් වළඳා ඉන් නැඟී නදී තීරයෙහි වූ අඹ වනයට එළැඹි සේක. ඒ වේලායෙහි අනඳ තෙරණුවන් භාග්‍යවතුන් වහන්සේ ගේ ජලශාටිකාව (නාන කඩ) මිරිකමින් ගඟෙහි පරක්කු වූ බැවින්, සමීපයෙහි සිටි චුන්දක ස්ථවිරයන් අමතා සඟළ සිවුර සතර පටක් කොට පණවා සිංහ ශය්‍යායෙන් සැතැපුණු සේක. ඉක්බිති එහි වැඩි අනඳ තෙරුන් අමතා. බුදු වන දාට පෙර දා සුජාතාව දුන් භෝජනය ද ඒ පිරිනිවන්පාන දිනට පෙර දා චුන්ද කාර්මාරපුත්‍රයා දුන් භෝජනයද සමඵල බව[220] වදාළ සේක.

**කුසිනාරා පුර වැඩීම**

ඉක්බිති බුදුරජාණන් වහන්සේ ඉන් පිටත්ව **හිරණ්‍යවතී** ගඟින් එතෙර වී කුසිනාරා පුරයට වැඩි සේක. වැඩ, එහි වූ මල්ල රජුන් ගේ **උපවර්තන** නම් සල් උයනට

පැමිණි සේක. පැමිණ එහි රජුන් ගේ සැතැපීමට සාදා තිබුණ ඇඳ යමක ශාල වෘක්ෂයන් අතුරෙහි තබා පිළියෙල කරන්නට අනඳ තෙරුනට නියම කළ සේක. අනඳ තෙරණුවෝ ද එ සේ ම ශයනය පැණැවූහ. භාග්‍යවතුන් වහන්සේ එහි සිංහ ශය්‍යායෙන් සැතැපුණු සේක.

**පිරිනිවන් මංචකයෙහි සැතපීම**

එ විට දිව්‍ය බ්‍රහ්ම සේනාවෝ අහස්හි සිට සුවඳ සුණු මල් ආදිය වගුරුවා ලීමෙන් ද දිව්‍ය ගීත වාදිත පැවැත්වීමෙන් ද පුද පෙළහර කළහ. එය දුටු භාග්‍යවතුන් වහන්සේ ආනන්ද ස්ථවිරයන් අමතා, **"ආමිස පූජා මාත්‍රයෙකින් පිදීම තථාගතයන් වහන්සේට කරන නිසි ගරු බුහුමන් නො වන බවත් යම් භික්ෂුවක් හෝ මෙහෙණියක හෝ උපාසකයකු හෝ උපාසිකාවක නවලෝකෝත්තර ධර්මයට අනුධර්ම වූ පූර්වභාග ප්‍රතිපත්තියට පිළිපන්නකු ව වසතොත් ඒ පුද්ගලයා නිසි උතුම් පූජායෙන් තථාගතයන් පුදන්නකු බවත්"** [221] වදාරා අවවාද කළ සේක.

එ වේලෙහි ආයුෂ්මත් උපවාන තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පවන් සලමින් සිටියාහ. මහානුභාව සම්පන්න රහතකු වූ උන් වහන්සේ ගේ ශරීරය විනිවිද දැකීමට දෙවියෝ පවා අසමර්ථ්‍යහ. එ බැවින් එහි භාග්‍යවතුන් වහන්සේ තමන් දැකීමට රැස්වන දෙවතාවන් ගේ සිත් රිදෙනුවට අවකාස නො තබන සේක් එ තැනින් ඉවත් වන්නැයි ඒ තෙරුනට වදාළ සේක. දෙවියනට ඉඩ දී තෙරණුවෝ ඉන් ඉවත් වූහ, අනාගාමී ද රහත් ද දේවතාවන් හැර සෙසු දෙවියෝ නොයෙක් අයුරින් හඬමින් වැලැපෙමින් බිම ඇද වැටෙමින් පෙරැළෙමින් භාග්‍යවතුන් වහන්සේ පිරිවරා සිටියහ.

ඉක්බිති අනඳ තෙරුන් ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු දෙන භාග්‍යවතුන් වහන්සේ,

**"ශ්‍රද්ධාවත් කුලපුත්‍රයා විසින් දැක්ක යුතු වූ, දැකීමෙන් සංවේග ඇති වීමට හේතු වූ ස්ථාන සතර බුදුරජුන් උපන් භූමිය, බුදු වූ තැන, දම්සක් පැවැත්වූ තැන, පිරිනිවන් පෑ තැන" යැයි ද,**

වදාරා ඉක්බිති ස්ත්‍රීන් කෙරෙහි භික්ෂූන් විසින් පිළිපැදිය යුතු සැටි ද වදාළ සේක. නැවැත භාග්‍යවතුන් වහන්සේ ගේ මෘත දේහය කෙරේ පිළිපැදිය යුතු සැටි විචාළ විට, **තථාගත ශරීරය පිදීම පිණිස කාලය මිඩංගු නො කළ යුතු යැ යි ද ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදීන් බුද්ධ ශරීරය පුදති යි ද වදාළ සේක.**

'බුද්ධ ශරීරය කෙරෙහි ඔවුන් විසින් කෙසේ පිළිපැදිය යුතු දැ යි ද විචාළ විට 'චක්‍රවර්ති රජුගේ ශරීරය කෙරෙහි පිළිපැදිය යුතු ලෙස යැ'යි වදාරා, එහි ක්‍රමය ප්‍රකාශ කළ සේක. ඉන් පසු බුද්ධ ශරීරයට සත්කාර

කිරීමෙන් මහත් පින් ලැබෙන බව ද, **බුදු පසේ බුදු රහත් සක්විති රජ යන සතර දෙනා ස්තූපාර්හ පුද්ගලයන් බවද** වදාළ සේක. මේ කරුණු ගැන සලකා බලන අනඳ තෙරුනට භාග්‍යවතුන් වහන්සේ එ දින ම පිරිනිවන් පාන සේකැ යි වැටැහුණේ ය. එ හෙයින් හටගත් බලවත් ශෝක ඇත්තේ ඉන් ඉවත් ව ගොස් මණ්ඩල මාලයෙහි දොරබා කෙලවරැ අගුල් කණුවැ එල්බ ගෙන,

**"අහෝ මම් තව ම රහත් වීමට කළ යුතු දැ අවසන් නො කෙළෙකිම්. මට දයායෙන් අවවාදානුශාසන කරන භාග්‍යවතුන් වහන්සේ අද පිරිනිවන් පානා සේක. අනේ ! හෙට සිට මුහුණ සේදීමට කාට වතුර දෙන්නෙම් ද? කාගේ පා සෝදන්නෙම් ද? කාගේ සේනාසනය අරපරිස්සම් කොට තබන්නෙම් ද? කාගේ පාත්‍ර සිවුරු ගෙන ඇවිදින්නෙම්ද?"**

යන ආදීන් විලාප කිය කියා හඬමින් සිටියහ. භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා 'මහණෙනි, ආනන්ද කොයි දැ'යි විචාළ සේක. 'ස්වාමීනි, මණ්ඩල මාලයෙහි අගුල් කණුයෙහි එල්බගෙන හඬන්නේ යැ'යි භික්ෂූහු කීහ. එ විට බුදුරජාණන් වහන්සේ අනඳ තෙරුන් කැඳවා ගෙන එන්නට නියම කළ සේක. අනඳ තෙරණුවෝ ද භික්ෂූන් විසින් දන්වන ලද්දෝ ආහ. අවුත් වැඳ පසෙක උන්හ.

භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් අමතා,

**"ආනන්දයිනි, නො හඬන්න. ශෝක නො කරන්න. හැම ප්‍රිය මනාප දැයින් වෙන්වීම කලින් ම මා කීවා නො වේ ද? හැදුණු දැ කැඩෙන බිඳෙන සුලු ය. එ සේ කලැ එය පලුදු නො වේ වා යි සිතා ඒ පෙරැ ලීම් වළකා ලන්නට කිසිවකුටත් නො හැක්ක.** 'ආනන්දයිනි, තෙපි බොහෝ කල් හිත කැමැති ව, හමුයෙහිත් නො හමුයෙහිත් එක හිතින් ම මෛත්‍රීසහගත අප්‍රමාණ කාය වාග් මනඃ කර්මයෙන් තථාගතයනට උවටන් කොළෝ ය. ආනන්දයෙනි, තෙපි පෙර ද බොහෝ පින් කළ කෙනෙක. එ බැවින් පමා නො වවු. නොබෝ කලෙකින් ම තෙපි රහත් බව ලබන්නහු යැ'යි වදාළ සේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූනට ආමන්ත්‍රණය කොට අනඳ තෙරුන් ගේ ගුණ රාශිය ප්‍රකාශ කළ සේක.

**මහා සුදර්ශන සූත්‍රය දෙසීම**

ඉක්බිති අනඳ තෙරණුවෝ 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මේ දුර්ගම ස්ථානයක් වූ කුඩා නුවර දී නො ම පිරිනිවන් පානා සේක් වා. **චම්පා රාජගෘහ**

**ශ්‍රාවස්ති සාකේත කොසඹෑ බරණැස්** යන මෙකී නගරයෙක පිරිනිවන් පානා සේක්වා යි කී හ. එ විට භාග්‍යවතුන් වහන්සේ ඒ එසේ පහත් කුඩා නුවරෙකැ යි නො සිතිය යුතු බවත්, පෙර එය මහාසුදර්ශන චක්‍රවර්ති රජු ගේ වාසස්ථානය වූ බවත් ප්‍රකාශ කිරීමෙන් **මහා සුදර්ශන සූත්‍රාන්තය*** වදාළ සේක.

**මල්ල රජුන්ගේ රැස්වීම**

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ තමන් එ දින රෑ පශ්චිම යාමයෙහි පිරිනිවන් පානා බව මල්ල රජුනට අනඳ තෙරුන් අත දන්වා යැවූ සේක. කුසිනාරා පුර සියලු මල්ලයෝ එ පවත් අසා ශෝක හරිත ව භාග්‍යවතුන් වහන්සේ වෙත අවුත් නමස්කාර කැර සිටියහ.

**අන්තිම ශ්‍රාවකයා**

එ සමයෙහි කුසිනාරා පුර වුසු **සුභද්‍ර** නම් පරිව්‍රාජකයෙක් ද භාග්‍යවතුන් වහන්සේ එදා රෑ පශ්චිම යාමයෙහි පිරිනිවන් පානා බව අසා තමා ගේ සැක දුරු කැර ගනු සඳහා එහි ගොස් භාග්‍යවතුන් වහන්සේ දක්නා කැමැති බව දැන්වූයේ ය. 'භාග්‍යවතුන් වහන්සේට වෙහෙස නො කළ මැනැවැ'යි කියා අනඳ තෙරණුවෝ එය ප්‍රතික්ෂේප කළහ. ඒ දෙදෙනා ගේ කථා සංලාපය ඇසූ භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් අමතා, සුභද්‍ර පිරිවැජියා හට තමන්ගෙන් ප්‍රශ්න අසන්නට ඉඩ ඇති කළ සේක. පිරිවැජියා ද ගොස් ප්‍රශ්න විචාරනුයේ, 'පූරණකාශ්‍යපාදී තීර්ථකයෝ තමන් ප්‍රතිඥා කළ පරිදි දුකින් මිදීමට මාර්ගය දත්තෝ ද? ඔවුන් ගේ ධර්මය නෛර්‍යාණික ද නැද්දැ'යි විචාළේ ය.

එ විට භාග්‍යවතුන් වහන්සේ 'ඔවුන් ගේ කරුණු අහක තිබේ වා. මම් නුඹට ධර්මය දෙසන්නෙම්, එය අසන්න, සිත තබා ගන්නැ'යි වදාරා මෙසේ දම් දෙසූ සේක.

**"සුභද්‍රය, යම් සස්නෙක ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය නැත්නම් එහි පළමු ශ්‍රමණයා (සෝවාන් පුද්ගලයා) ද නැත්තේ ය. දෙ වෙනි ශ්‍රමණයා (සකෘදාගාමී පුද්ගලයා) ද නැත්තේ ය. තෙවෙනි ශ්‍රමණයා (අනාගාමී පුද්ගලයා) ද නැත්තේය. සිවු වන ශ්‍රමණයා (අර්හත් පුද්ගලයා) ද නැත්තේ ය. යම් සස්නෙක වනාහි අරි අටැඟි මඟ ඇත්තේ නම් එහි ම එකී සතර ශ්‍රමණයෝ ඇත්හ. සුභද්‍රය, මේ සස්නෙහි අරි අටැඟි මඟ ඇත් ම ය. එ බැවින් මෙහි එ සතර ශ්‍රමණයෝ ම ඇත්හ. සෝවාන්**

* මෙය දීඝ් සඟියේ ඇතුළතී.

**ආදි සතර ඵල පිණිස විදසුන් වඩන සිවු දෙනා ද මාර්ගස්ථ සිවු දෙනා ද ඵලස්ථ සිවු දෙනා දැයි මෙකී දොළොස් ශ්‍රමණයන් නැති පාරවාදයෝ (අන්‍ය දෘෂ්ටිහු) හිස් හ. තුච්ඡහ. සුභද්‍රය, මේ දොළොස් ආකාර භික්ෂූහු නිසි සේ වසත් නම් (ඒ සෝවාන් ආදීහු අන්‍යයනට ද තමන් ලත් මාර්ග ඵලාදිය කියා දී නවත් මාර්ගස්ථ පුද්ගලයන් ඇති කරන්නට තැත් කරත් නම්) ලෝකය රහතුන් ගෙන් හිස් නො වන්නේ ය.**

'සුභද්‍රය, එකුන් තිස් වයස් ඇති ව සිටි මම කිංසත්‍යගවේෂී ව යම් දිනෙක පැවිදි වීම්ද, එදා පටන් අද තෙක් අතර කාලය හවුරුදු එක් පණසක් පමණ වේ. මේ කාලයෙහි ආර්‍ය මාර්ග ඵල ප්‍රාප්තිය පිණිස විදසුන් වැඩීම පමණකුත් කරන කිසි ම පුද්ගලයෙක් මේ (ආර්‍ය අෂ්ටාංගික මාර්ගය ඇති) සස්නෙන් පිටත් හි නො වීය. මතුත් නො වන්නේ ය. ඒ හෙයින් ම මෙ ආර්‍ය අෂ්ටාංගික මාර්ගයෙන් බාහිර වූ කිසි ම ශාසනයෙක්හි ආර්‍ය මාර්ගයකට පැමිණි ශ්‍රමණයෙක් කිසි ම කලෙකත් ඇති නො වේ.[222]

මෙය ඇසූ සුභද්‍ර තෙම පැවිද්දත් උපසම්පදාවත් ඉල්ලුයේ ය. අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ ගේ අවසර පරිදි සුභද්‍රයා පැවිදි කළහ. බුදුරජාණන් වහන්සේ ඔහු උපසපන් කොට කර්මස්ථානයක් දුන් සේක. සුභද්‍ර භික්ෂු තෙම උයනේ පැත්තකට ගොස් කර්මස්ථාන වඩන්නේ නො බෝ වේලාවෙකින් සියලු කෙලෙස් නසා සිවු පිළිසිඹියා හා රහත් බව ලබා භාග්‍යවතුන් වහන්සේ වෙත වැඳ පසෙක ඉඳ ගත්තේ ය. මේ තෙම භාග්‍යවතුන් වහන්සේ ගේ පශ්චිම ශ්‍රාවකයා යි.

**ධර්මයේ ශාස්තෘ භාවය**

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනඳ තෙරුන් අමතා '**තමන් වහන්සේ ගේ ඇවෑමෙන් ධර්ම විනය දෙක ශාස්තෘ (අනුශාසකයා) වෙතැ**'යි ද තමන් වහන්සේ ධරමාණ කාලයෙහි භික්ෂූන් ඔවුනොවුනට 'ආවුසෝ' (ඇවැත්නි) යන වචනයෙන් ආමන්ත්‍රණය කළ නමුත් ඉන් පසු වැඩිමාලු 'භික්ෂුව නවක භික්ෂුවට නමින් හෝ 'ආවුසෝ' යන වචනයෙන් ආමන්ත්‍රණය කළ යුතු යැ යි ද නවක භික්ෂුව වයසින් වැඩි මහළු භික්ෂුවට 'ස්වාමීනි' කියා හෝ 'ආයුෂ්මතුන් වහන්ස' කියා ආමන්ත්‍රණය කළ යුතු යැ යි ද ආදීන් වදාළ සේක. ඉක්බිති,

**භාග්‍යවතුන් වහන්සේ ගේ අන්තිම වචනය**

'මහණෙනි, යුෂ්මත්නට කරුණායෙන් අවවාද කරමි. සියලු සංස්කාරයෝ නැසෙන සුල්ලෝ ය. ඒ බැවින් එළැඹ සිටි සිහියෙන් සියලු පැවිදි කිස සම්පූර්ණ කරවු'[218] යැ යි මේ අන්තිම වචනය වදාළ සේක.

**මහා පරිනිර්වාණය ජන්මයෙන් අසූවන වියෙහි වෙසක් පසොලොස්වක් ද**

මින් පසු ප්‍රථම ධ්‍යානයට සමවත් සේක. ඉක්බිති ඉන් නැගිට ද්විතීය ධ්‍යානයටද, ඉන් නැගිට තෘතීය ධ්‍යානයට ද, ඉන් නැගිට චතුර්ථ ධ්‍යානයට ද, ඉන් නැගිට ආකාශානන්තායතන සමාපත්තියට ද, ඉන් නැගිට විඥානානන්තායතන සමවතට ද, ඉන් නැගිට ආකිඤ්චන්‍යායතන සමාපත්තියට ද, ඉන් නැගිට නෛවසංඥානාසංඥායතන සමාපත්තියට ද, එයින් නැගිට නිරෝධ සමාපත්තියට ද සමවත් සේක. යළිත් නිරෝධ සමාපත්තියෙන් නැගිට නෛවසංඥානාසංඥායතන ආකිඤ්චන්‍යායතන විඥානානන්තායතන ආකාශානන්තායතන චතුර්ථධ්‍යාන තෘතීය ධ්‍යාන ද්විතීය ධ්‍යාන ප්‍රථම ධ්‍යානය යන මේවාට ද පිළිවෙළින් ද්විතීය තෘතීය චතුර්ථ ධ්‍යානයට ද සමවැද චතුර්ථ ධ්‍යානයෙන් නැගී සිටි සේක.

එ දා අලුයම්හි අරුණෝද්ගමනයට පෙරටු ව චතුර්ථ ධ්‍යානයෙන් නැගී සිට අනතුරු ව, ඒ මහාකාරුණික වූ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුධ අංගීරස ශාන්ති නායකයන් වහන්සේ සියලු සංස්කාර ධර්මයන් ගේ අනිත්‍යතාවට තමන් වහන්සේ ද ආදර්ශ කෙරෙමින් නිරුපාදිශෙෂ පරිනිර්වාණ ධාතුයෙන් පිරිනිවන් පා වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑ කෙණෙහි භය ජනක වූ මහද් භූමි කම්පාවෙක් විය. බලවත් වූ අහස් ගිගුරුම් ද විය.

බුධ පරිනිර්වාණ ක්ෂණයෙහි ම සහම්පතී මහ බඹ තෙම "**ලොවැ මෙ වැනි අප්‍රතිපුද්ගල වූ මේ ජගදාචාර්‍ය්‍යයන් වහන්සේ යම් සේ පිරිනිවන් පෑ සේක් ද, එ සේ ම ලෝක ධාතුවේ සියලු ම සත්ත්වයෝ ජීවිතේන්ද්‍රිය විනාශයෙන් සිය සිරුරු මෙහි බහා ලන්නෝ**"* යැ යි ද,

ශක්‍ර දේවේන්ද්‍ර තෙම:

"**අහෝ සංස්කාරයෝ අනිත්‍යයහ. හැදෙන නැසෙන සුලුහ. ඔහු ඉපිද නිරුධ වෙත්. එ බැවින් ඔවුන්ගේ සංසිඳීම සැප වේ**" + යැ යි.

අනුරුධ තෙරුණුවෝ:

"**ආයුෂ්මත්නි, ස්ථිර සිත් ඇති, අට ලෝ දහමින් කම්පිත නො වන ස්වභාවය ඇති, නිවන් සෙත් පුර අරමුණු කොට කළුරිය කළ මාගේ ශාස්තෘ වූ බුධ මුනිවරයාණන් වහන්සේ ගේ ආශ්වාස ප්‍රශ්වාසයෝ**

---

* සබ්බෙ'ව නික්ඛිපිස්සන්ති භූතා ලොකෙ සමුස්සයං
යථා එතාදිසො සත්ථා ලොකෙ අප්පටිපුග්ගලො.

\+ අනිච්චා වත සංඛාරා, උප්පාදවයධම්මිනො
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති, තෙසං වූපසමො සුඛො.

**නිරුඩ වූහ. නො හැකුළුණු (පිබිදි) සිතින් ඒ ස්වාමි දරුවන් වහන්සේ වේදනාව ඉවසූ සේක. ප්‍රදීපයෙක නිවීමක් සේ ඒ ස්වාමි දරුවන් වහන්සේ ගේ චිත්ත විමෝක්ෂය* වී යැ යි ද,**

අනඳ තෙරුණුවෝ:

**+"සකල උත්තම ගුණයෙන් සමන්විත සම්බුධයන් වහන්සේ ගේ පිරිනිවන් පෑම හා එක් විට ම බිහිසුණු ලොමු දහ ගන්වන සුලු භූමිචලනයෙක් වී ය. අහෝ ! ආශ්චර්‍ය්‍යයෙකි !!"** යි ද වදාළහ.

භාග්‍යවතුන් වහන්සේ පිරිනිවී කෙණෙහි අවීතරාග භික්ෂූහු හැඬීමට වැලැපීමට පටන් ගත්හ. වීතරාග භික්ෂූහු අනිත්‍යතාව සලකමින් ඉවැසූහ. අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ හඬන භික්ෂූනට සංස්කාරයන් ගේ අනිත්‍යතාව ප්‍රකාශ කොට, හැඬීමෙන් ශෝක කිරීමෙන් කම් නැතැ යි අවවාද කළ සේක. තථාගතයන් වහන්සේ පිරිනිවන් පෑ ඉක්බිති, ඉතිරි කාලය අනුරුධ තෙරණුවෝ ද අනඳ තෙරණුවෝ ද ධර්ම කථායෙන් ගත කළහ.

**සර්වඥ දේහය ආදහන කිරීම**

පාන් වූ කල අනඳ තෙරණුවෝ අනුරුධ තෙරුන් ගේ නියමයෙන් කුසිනාරා පුර වැඩ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑ බව දැන්වූහ. මල්ල රජුන් ප්‍රමුඛ කොට ඇති නගර වාසීහු එ පවත් අසා හඬා වැලැප ආදාහන කෘත්‍යයට වුවමනා සියලු උපකරණ ගෙන්වා ගෙන උපවර්තන ශාලාවනෝද්‍යානයට රැස් වැ බුධ ශරීරයට නෘත්‍ය ගීතාදියෙන් පූජා කරමින් සත් දිනක් ගෙවා, ඉක්බිති මහ පෙරහැරින් උතුරු දොරින් පිවිස කුසිනාරා නුවර මැදින් පිටතට වැඩම කරවා නැගෙනහිර පැත්තෙහි වූ මල්ල රජුන් ගේ මුකුටබන්දන නම් චෛත්‍ය ස්ථානයෙහි තැබූහ. ඉක්බිති මල්ල රජහු සර්වඥ දේහය කෙරෙහි පිළිපැදිය යුතු සැටි ආනන්ද ස්ථවිරයන් වහන්සේ ගෙන් අසා දැන අළුත් කසී වස්ත්‍රයෙන් බුධ ශරීරය වෙළා ඉන් පසු මනා ව නෙළූ කපු පුළුනින් වෙළූහ. ඉන් පසු නැවැතත් කසී වතින් වෙළූහ. මේ නියායෙන් පන්සිය වරක් පන්සියක් පමණ කපු

---

* නාහු අස්සාසපස්සාසා, ඨිත චිත්තස්ස තාදිනො
අනෙජො සන්තිමාරබ්භ යං කාලමකරී මුනි.
අසල්ලීනෙන චිත්තෙන, වෙදනං අජ්ඣවාසයි
පජ්ජොතස්සෙව නිබ්බාණං, විමොක්ඛො චෙතසො අහු.

\+ තද' පි යං හිංසනකං තදසි ලොමහංසනං
සබ්බාකාරවරූපෙතෙ, සම්බුධෙ පරිනිබ්බුතෙ.

පුළුනෙන් ද පන්සියක් කසී වතින් ද බුධ ශරීරය වෙළා සුවඳ තෙල් පිරූ රන් දෙණෙක බහා එ බඳු ම රන් දෙණෙකින් වසා සුවඳ දරින් එක් විසි රියන් උසැති කොට කරවන ලද දරසෑයෙහි රන්දෙණ නැංවූහ. ඉක්බිති බාල මධ්‍යම වයස් ඇති මල්ල රජ්හු සිවු දෙනෙක් සුවඳ දියෙන් ඉස් සෝදා නා අලුත් වස්ත්‍රයෙන් සැරැසී චිතකයට ගිනි තැබූහ. ගිනි නො දැල්විණ. මල්ල රජුන් එයට හේතුව විචාළ විට මහා කාශ්‍යප තෙරුන් එන තෙක් එය දැල්වෙන්නට දෙවියන් ඉඩ නො දෙන බව අනුරුධ තෙරුන් වහන්සේ වදාළ සේක. ස්වල්ප වේලාවෙකින් කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ එහි වැඩි සේක. වැඩ සිවුර ඒකාංශ කොට පොරොවා වැඳ තුන් වරක් දර සෑය ප්‍රදක්ෂිණා කොට ශ්‍රී පාදය පැත්තෙන් චිතකය හා රන් දෙන විවෘත කොට සිරිපා යුවල වැන්ද සේක. උන් වහන්සේ හා වැඩි පන්සියක් පමණ වූ භික්ෂූහු ද වැන්දහ. ඉන් පසු දර සෑය දේවතානුභාවයෙන් තෙමේ ම හාත්පස එක් පැහැර ගිනි දැල්වී ගියේ ය.

දැ බුධ ශරීරයෙහි භාග්‍යවතුන් වහන්සේ ගේ අධිෂ්ඨානය පරිදි සතර දන්ත ධාතු, දෙ අකු ධාතු, නලාට ධාතු යන ධාතුහු සත් දෙන නො විසිරුණහ. ඉතිරි ධාතුහු අබ කඩ සාල් මුං බියලි පමණට විසිර ගියහ. මෙසේ ධාතුන් පමණක් ශේෂ වූ කළ, අහසින් ද පිරිවරා සිටි සල් රුක්වල කඳ අතු අතරින් ද දිය දහර නැඟ සෑයේ ගිනි නිවී ය. මල්ල රජ්හු ද සුවඳ දිය ඉස්සහ.

**ධාතු පූජාව**

ඉක්බිති මල්ල රජ්හු නුවර දෙව් පුරයක් සේ සරසා සර්වඥ ධාතු රන් දෙණක තබා, එය මනා ව සැරැසූ ඇතකු පිටින් නුවරට වැඩම කරවා, එහි සන්ථාගාර ශාලායෙහි මහඟු පර්යඞ්කයකට පැමිණැවූහ. ඉක්බිති එහි වටේ රකවල් තබවා මල්ල රජුන් ප්‍රමුඛ කුසිනාරා නුවර වස්සෝ නෘත්‍යගීතාදියෙන් සත් දිනක් ධාතුන් පිදූහ.

**ධාතු බෙදීම**

මගධෙශ්වර අජාතශත්‍රු රජ ද, විසාලා පුර වැසි ලිච්ඡවී රජ්හු ද, කපිලවාස්තුපුර වාසි ශාක්‍ය රජ්හු ද, අල්ලකප්පරට වැසි බුලි රජ්හු ද, රාමග්‍රාම වාසි කෝලිය රජ්හු ද, වේඨදීපක නුවර වැසි වේඨදීපක බමුණා ද, පාවා නුවර වැසි මල්ල රජ්හු ද, එහි ගොස් කුසිනාරාව වට කොට ගෙන අයිතිවාසිකම් කියා ධාතු කොටස් ඉල්ලා, තමන් ද ස්තූප කරනු කැමැති බව දන්වා කුසිනාරා පුර මල්ල රජුනට වෙන වෙන ම පණිවුඩ යැවූහ. මල්ල රජ්හු ද තමන් රටෙහි පහළ වූ රුවන් පිටතට නො දෙන බව දන්වා 'තෙපි

යුධ කරනු කැමැති නම් අපිත් යුද්ධ කරම්හ´යි කියා පණිවුඩ යැවූහ. මෙයින් ඔවුන් අතර මහත් කැලැඹීම් හට ගත් විට ඒ සියලු දෙනා ගේ ආචාර්‍ය්‍ය වූ **ද්‍රෝණ** නම් බ්‍රාහ්මණයා ඔවුනට කරුණු කියා සමාදාන කොට ඒ ධාතූන් අට කොටසකට බෙදා දුන්නේ ය. ඉක්බිති ඒ බමුණා ද තමාටත් පූජ්‍ය වස්තුවක් ඕනෑ බව කියා ධාතූන් බෙදූ ස්වර්ණමය නාළිකාව ඔවුන්ගෙන් ඉල්ලා ගත්තේ ය.

පිප්පලීවන පුර වැසි **මෝරිය** රජහු භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑ බව අසා පසු ව එහි ආහු, ධාතු නො ලැබ ආදාහන ස්ථානයෙන් අඟුරු ගෙන ගියහ. ධාතු ගෙන ගිය ඒ ඒ රජහු ඒවා නිදන් කොට ස්තූප කරවා පිදූහ. ද්‍රෝණ බමුණා ද තමා ලත් ස්වර්ණ නාළිකාව නිදන් කොට **කුම්භස්තූප** නම් චෛත්‍යයක් කෙළේ ය.[224]

මෝරිය රජුන් දර සෑයේ අඟුරු නිදන් කොට කැරවූ අංගාර ස්තූප දෙක ද සමඟ සර්වඥ ධාතු නිදන් කළ චෛත්‍ය අට දැ යි සියලු චෛත්‍යයෝ දස දෙනෙක් වූහ.

---

# නිමි

### චාරිකා විධි ආදී නානා කරුණු ඇතුළත්

# ප්‍රකීර්ණක කාණ්ඩය

## පනස් වන පරිච්ඡේදය

**බුද්ධ කෘත්‍ය පස**

කොතැනක වුසුව ත් බුදුරජාණන් වහන්සේගේ එක ම චර්‍යාවෙක් වීය. දවස කොටස් පසකට බෙදා ඒ කාල පසේ සැටියට පූර්වභක්ත කෘත්‍යය, පශ්චාද් භක්ත කෘත්‍යය, ප්‍රථම යාම කෘත්‍යය, මධ්‍යම යාම කෘත්‍යය, පශ්චිම යාම කෘත්‍යය යැ යි බුඩ කෘත්‍යය පඤ්ච විධ විය.

**පූර්වභක්ත කෘත්‍යය**

ඉන් පූර්වභක්ත කෘත්‍යය නම් භාග්‍යවතුන් වහන්සේ ඉතා උදේ නැගිට උපස්ථායකයනට අනුග්‍රහ පිණිසත් ශරීර පහසුව පිණිසත් මුහුණ සේදීම් ආදිය කරන සේක. ඉන් පසු පිඩු පිණිස හැසිරිය යුතු වෙලාව වන තුරු විවේකයෙන් කල් ගත කරන සේක. ඉක්බිති සිවුරු පොරොවා පාත්‍රය ගෙන, සමහර දවසෙක හුදෙකලා ව හෝ භික්ෂු සංඝයා සහිත ව හෝ පිඩු පිණිස වඩනා සේක. කිසි දිනෙක ප්‍රකෘති වේශයෙන් ද, කිසි දිනෙක බොහෝ ප්‍රාතිහාර්‍ය ඇති ව ද වඩනා සේක. ඒ ආශ්චර්‍ය දැක 'අද බුදුරජාණන් වහන්සේ වඩිනා සේකැ'යි එහි වැස්සෝ කල් ඇතිවම දැන ගනිත්. තුමූ ද මනාව හැඳ පොරොවා සුවඳ මල් ආදිය ගෙන වීථිය අතුරට පැමිණ භාග්‍යවතුන් වහන්සේට පූජා සත්කාර කොට වැඳ 'ස්වාමීනි, අපට මෙ පමණ මෙ පමණ භික්ෂූන් වහන්සේ ඕනැ' යැ යි කියා තම තමනට හැකි පරිදි භික්ෂූන් දස නම විසි නම ආදී වශයෙන් ඉල්ලා භාග්‍යවතුන් වහන්සේත් වැඩම කරවාගෙන ගොස් අසුන් පනවා දන් දෙත්. භාග්‍යවතුන් වහන්සේ ද දන් වළඳා එ පිරිසේ සිටියවුන් ගේ අදහස් නුවණින් බලා ඔවුන් ගේ චරිතවලට සුදුසු සේ දහම් දෙසන සේක. ඒ බණ අසා සමහරු තිසරණයෙහි ද සමහරු පන්සිල්හි ද, සමහරු සෝවාන් ආදී මාර්ග ඵලයන්හි ද පිහිටත්. මෙ සේ ඔවුනට අනුග්‍රහ කොට ඉන්පසු හුනස්නෙන් නැගී සිට විහාරයට වඩනා සේක. වැඩ, එහි මණ්ඩල මාලයේ පණවන ලද ආසනයෙහි හිඳ භික්ෂූන් දන් වළඳා එන තුරු බලාපොරොත්තු වන සේක. භික්ෂූන් වළඳා අවසන් වූ විට එ බව උපස්ථායක භික්ෂුවක් අවුත් දැන් වූ කල ගන්ධකුටියට පිවිසෙන සේක. මේ වනාහි භාග්‍යවතුන් වහන්සේ ගේ **පෙර බත් කිස යි.**

**පශ්චාද්භක්ත කෘත්‍යය**

ඉන් පසු එහි දී උපස්ථායක භික්ෂුව විසින් පණවා තබන ලද ආසනයෙහි හිඳ පා සෝදා, පා පුටුයෙහි තබා භික්ෂූන් අමතා, 'මහණෙනි, නො මුළා වූ සිහියෙන් සියලු කටයුතු සම්පාදනය කරවු. ලෝකයෙහි බුද්ධෝත්පාදය දුර්ලභ යි. මනුෂ්‍යත්වය ලැබීම දුෂ්කර යි, ක්ෂණ සම්පත්තිය දුර්ලභ යි. මහණකම දුර්ලභ යි. බණ ඇසීම දුර්ලභ යැ'යි මෙ සේ වදාරා ඉතා දීර්ඝ ධර්ම කථාවෙකින් අවවාද කරන සේක. එ තැන දී සමහරු උන්වහන්සේ ගෙන් කර්මස්ථාන විචාරත්. බුදු රජාණන් වහන්සේත් ඔවුනට චරිතානුකුල කර්මස්ථාන දෙන සේක. ඔහු ද භාග්‍යවතුන් වහන්සේ වැඳ තම තමන් ගේ රාත්‍රී ස්ථාන දිවාස්ථානයනට යෙත්. ඒ ස්ථාන නම් අරණ්‍ය වෘක්ෂමූල පර්වත ගුහා ආදිය යි. ඉන් පසු බුදුරජාණන් වහන්සේ ගඳ කිළියට වැඩ ඉදින් ශයනය කරන අදහසක් පහළ වූවොත් දකුණැලයෙන් සිහි නුවණින් යුක්තව මොහොතක් සිංහ ශය්‍යාව කරන සේක. ඉක්බිති ඉන් නැගිට එ පස්වරු කාලයේ දෙ වන කොටසේ දී ලෝ වැස්සා දෙස නුවණින් බලන සේක. තුන් වන කොටසෙහි වේලාවට සුදුසු පෙළහරින් ධර්ම සභාවට වැඩ රැස්වූ පිරිසට දහම් දෙසන සේක. පස්වරු කාලය ගෙවුණු විට, ඉන් නික්මියැ යුතු කාලය බව දන්වන සේක. පිරිස ද භාග්‍යවතුන් වහන්සේ වැඳ නික්ම යෙත්. මේ පස්වරු වැඩ පිළිවෙළ යි.

**ප්‍රථම යාම කෘත්‍යය**

එ විට රාත්‍රිය ළං වේ. බුදුරජාණන් වහන්සේ ඇඟ සෝදා ගන්නා අදහස ඇති වූවොත් නාන කොටුවට වැඩ උපස්ථායක භික්ෂුව පිළියෙල කැරැ දුන් ජලයෙන් ඇඟ සෝදන සේක. ඉන් පසු උපස්ථායක භික්ෂු තෙම බුධාසනය ගෙන ගොස් ගඳකිළි පිරිවෙනේ ඉස්තෝප්පුවේ පණවයි. නා අවසන් වූ භාග්‍යවතුන් වහන්සේ සිවුර ඒකාංශ කොට පොරොවා එහි වැඩ ආසනයෙහි හිඳගෙන මොහොතක් කල් චිත්ත විවේකයෙන් ගත කරන සේක. ඉන් පසු භික්ෂූහු ඒ ඒ තැනින් අවුත් භාග්‍යවතුන් වහන්සේ දැකීමට එහි රැස්වෙත්. සමහරු ප්‍රශ්න විචාරත්. සමහරු කර්මස්ථාන ගනිත්. සමහරු බණ දෙසීමට ආයාචනා කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේ ද භික්ෂූන් ගේ අදහස් සිදු කරමින් රෑ පෙර යම ගත කරන සේක. මේ ප්‍රථම යාම කෘත්‍යය යි.

**මධ්‍යම යාම කෘත්‍යය**

ප්‍රථම යාමය ගෙවුණ පසු දිව්‍ය බ්‍රහ්මයෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ තමන් ගොතා ගත් ප්‍රශ්න අසත්. භාග්‍යවතුන් වහන්සේ ද ඔවුන් ගේ පැන විසඳමින් දම් දෙසීමෙන් මධ්‍යම යාමය ඉක්මවන සේක. මේ මධ්‍යම යාම කෘත්‍යය යි.

**පශ්චිම යාම කෘත්‍යය**

පශ්චිම යාමය කොටස් තුනක් කොට ඉන් ප්‍රථම කොටසෙහි සක්මන් කරන සේක. එසේ කරනුයේ ශරීර විඩාව සංසිඳුවීම පිණිස යි. දෙවෙනි කොටසේ ගඳකිළියට වැද සිහි නුවණින් යෙදී සිංහ ශය්‍යාවෙන් දකුණැලයෙන් සැතැපෙන සේක. ඉක්බිති ඉන් නැගිට හිඳ තුන්වන කොටසේ දී පෙර බුදුවරුන් ළඟ දී පින් කළ පුද්ගලයන් දක්නා පිණිස බුදු ඇසින් ලොව බලන සේක. මේ රෑ එළි වෙන යාමයේ වැඩ පිළිවෙළ යි.

## චාරිකා චරණය

**තුරිත චාරිකා**

තුරිත චාරිකා අතුරිත චාරිකා යැ යි බුදුරජාණන් වහන්සේ ගේ ගමන් දෙකෙකි. ධර්මාවබෝධයට තරම් මේරූ නුවණ ඇති පුද්ගලයකු ඉතා ඈත වසන්නහු දැක ඔහුට දම් දෙසීම පිණිස සෘද්ධි බලයෙන් ඉක්මනින් යෑම තුරිත චාරිකා (ඉක්මන් ගමන) නම් වේ. භාග්‍යවතුන් වහන්සේ පිප්පලි මානවකයා හමු වීමට තුන් ගවු පමණ මාර්ගය එක් මොහොතෙකින් ම ඉක්ම වැඩි සේක. ආළවක යකු හික්මවීම් ආදිය පිණිස තිස් යොදුන් මාර්ගය ද, අංගුලිමාල සොරහු හික්මවීමටත් එ පමණ ම දුර ද, පුක්කුසාති රජු හමුවීමට යොදුන් පන් සාළිසක් පමණ දුර ද, මහාකප්පින රජු සඳහා යොදුන් එක්සිය විස්සක් පමණ දුර ද, ධනිය ගෝපාලයා හමුවීමට යොදුන් සත් සියයක් තරම් ඈත ද, වනවාසී තිස්ස සාමණේරයන් වහන්සේ දැකීමට යොදුන් එක්සිය තෙ විස්සක් දුර ද මොහොතෙකින් වැඩි සේක. මෙ සේ පියෙවි ගමනින් නො වැඩ සෘද්ධි බලයෙන් ඉතා ඈත ස්ථානයකට වැඩීම තුරිත චාරිකා නම්.

**අතුරිත චාරිකා**

ගම් නියම් පිළිවෙළින් දින පතා යොත්ත ආදී වශයෙන් පිඬු පිණිස හැසිරීම් ආදියෙන් ලෝකානුග්‍රහය කෙරෙමින් වඩනා ගමන අතුරිත චාරිකා ( නො යුහු සුලු ගමන) නම්. මෙම අතුරිත චාරිකායෙහි යෙදුණ භාග්‍යවතුන් වහන්සේ දඹදිව මහා මණ්ඩල මධ්‍ය මණ්ඩල අන්තර්මණ්ඩල යන ප්‍රදේශ තුනෙන් එකෙක වඩනා සේක. ඉන් මහා මණ්ඩලය යොදුන් ස සියක් පමණ විශාල වේ. අන්තර්මණ්ඩලය යොදුන් තෙ සියක් පමණ වේ.

යම් කලෙක මහා මණ්ඩලයෙහි වඩනා කැමැති සේක් නම් මහා පවාරණයෙන් පවරා පැලවිය දවසෙහි මහත් භික්ෂු සමූහයා පිරිවර කොට පිටත් වන සේක. බුදු රජාණන් වහන්සේ මහාමණ්ඩලයෙහි ගමන ආරම්භ කළ බව ඉක්මනින් ම රටේ ආරංචි වීමෙන් යොදුන්

සියයක් තරම් ඇත මිනිසුන් තුළ උන් වහන්සේ දැක්මට දන් දීමට බණ ඇසීම් ආදියට මහත් උනන්දුවක් ඇති වන්නේ ය. බුදු රජාණන් වහන්සේ ගේ පැමිණීම කවර දා වේ දෝ යි ඔහු නිතර උන් වහන්සේ පිළිගැන්මට සැරසී සිටිත්. අන්‍ය ලබ්ධික පරිව්‍රාජකාදීහු අපගේ භක්තිමත්හු බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය පිළිගනිත් දෝ යි කැලැඹීමට පත් වෙත්. සම්‍යග්දෘෂ්ටිකයෝ භාග්‍යවතුන් වහන්සේ පිළිගැනීමට පෙර ගමන් කරත්. අනිත් අන්තර්මණ්ඩල මධ්‍ය මණ්ඩල දෙක්හි ම කැරෙන සත්කාර රාශිය මහාමණ්ඩලයෙහි ම එක් තන් වේ. භාග්‍යවතුන් වහන්සේ එහි ගම් නියම් ගම් ආදියේ දවස දෙක තුන ආදී වශයෙන් මහජනයා ගේ ආමිස පූජා පිළිගෙන, ඔවුනට අනුග්‍රහ කෙරෙමින්, ධර්ම දානය කිරීමෙන් ස්වර්ග මාර්ග මෝක්ෂ මාර්ග දෙක්හි ඔවුන් පිහිටුවමින් සැරි සරන සේක්, ඒ ගමන නව මසෙකින් අවසන් කරන සේක. ඉදින් වස් කාලය තුළ දී භික්ෂුන්ගේ ශමථ විදර්ශනා නො මේරුයේ නම් මහාපවාරණය නො කොට පවාරණ සංග්‍රහය දී, ඉල් පුර පසළොස්වක් දා පවාරණය කොට, උඳුවප් පැලවිය දා මහා භික්ෂු පිරිස හා මධ්‍ය මණ්ඩලයට වඩින්නට පිටත්වන සේක. එ ගමන අට මසෙකින් අවසන් වේ. එ ගමන් කාලයේ දී අන් මණ්ඩල දෙකෙහි ම සත්කාර සම්මාන රාශිය මධ්‍ය මණ්ඩලයෙහි ම එක් තන් වේ. වස් සාර මසේ දීත් භික්ෂූන් ගේ කර්මස්ථාන භාවනා නො මුහු කෙළේ නම් තවත් මසක් දෙ මසක් හෝ තුන් හාර මසක් එහි ම වැස පෙර පරිද්දෙන් ම භික්ෂු සංඝයා සහිත වැ අන්තර් මණ්ඩලයෙහි ගමනට පිටත් වන සේක. අන් දෙ මඬුල්ලෙහි පූජා සත්කාර අන්තර් මණ්ඩලයෙහි ම රැස් වේ. භාග්‍යවතුන් වහන්සේත් පළමු පරිද්දෙන් ලෝකානුග්‍රහය කරමින් සත් මසෙකින් පස් මසෙකින් හෝ සිවු මසෙකින් චාරිකා ගමන අවසන් කරන සේක.

**චාරිකා ගමනට හේතුව**

මෙ සේ චාරිකා චරණයට හේතුව කිමෙක්ද ? යත් : දුප්පත්තු ද, බාලයෝ ද, මහලු වූවෝ ද, රෝගාතුරයෝ ද, භාග්‍යවතුන් වහන්සේ දැකීමට පැමිණීමෙහි නො හැක්කෝ ඇත්හ. එහෙත් බුදු රජාණන් වහන්සේ ඔවුන් වෙතට පැමිණි විට, ඔහු වැඳුම් පිදුම් කොට පින් සිදු කැර ගනිත්. බණ අසා ස්වර්ග මාර්ගයෙහි හෝ මොක්ෂ මාර්ගයෙහි පිහිටත්. මේ ආදී කරුණු සලකා ලෝකානුකම්පායෙන් චාරිකායෙහි යෙදෙන සේක.

**චාරිකා ගමනට තවත් හේතු**

එක් තැනෙක්හි ම ඉඳීමට වඩා ඇවිදීමෙන් ශරීර පහසුව ලැබෙන හෙයින් ද, ධර්ම දේශනා කිරීමට යම් කාරණයක් මුල් කැර ගැනීමට එ බන්දක් හමු වන පිණිස ද

භික්ෂුනට ශික්ෂා පද පැණවීම පිණිස ද, ඒ ඒ ගම් නියම් ගම් නුවර ආදියෙහි නුවණ මේරූ පුද්ගලයනට චතුස්සත්‍යය අවබෝධ කරවනු පිණිස ද යන සතර කාරණයෙන් ද,

බුදුරජාණන් වහන්සේ, ධර්මය, සංඝයා සරණ ගැන්වීම, මහත් වූ ධර්ම වැස්සෙන් සිවු පිරිස සනසාලීම යන සතර කාරණයෙන්ද,

සත්ත්වයන් ප්‍රාණඝාතයෙන් මුදාලීම, අදත්තාදානයෙන් මුදාලීම, කාම මිථ්‍යාචාරයෙන් මුදාලීම, මුසාවාදයෙන් මුදාලීම, රහමෙර පානයෙන් මුදා ලීම යන කරුණු පසින් ද,

ලෝකයා තමන් වහන්සේගෙන් බණ අසා පිළිපැද, ප්‍රථම ධ්‍යාන, ද්විතීය ධ්‍යාන, තෘතීය ධ්‍යාන, චතුර්ත්ථ ධ්‍යාන, ආකාශානන්තායතන ධ්‍යාන, විඥානානන්තායතන ධ්‍යාන, ආකිඤ්චන්‍යායතන ධ්‍යාන, නෛවසංඥානාසංඥායතන ධ්‍යාන යන අෂ්ට ධ්‍යාන සමාපත්තීන් ලබන බව සලකා ද,

මහජනයා තමන් වහන්සේ ගෙන් බණ අසා විදසුන් වඩා ශ්‍රෝත ආපත්ති මාර්ග, ශ්‍රෝත ආපත්ති ඵල, සකෘදාගාමී මාර්ග, සකෘදාගාමී ඵල, අනාගාමී මාර්ග, අනාගාමී ඵල, අර්හත්ව මාර්ග, අර්හත්ත්ව ඵල යන මොවුන් ප්‍රතිවේධ කරතැ යි දැන ඒ අභිවෘඩිය සලසන අටියෙන් ද සැරි සරන සේක.

**අතුරිත චාරිකා ප්‍රභේද දෙක**

අතුරිත චාරිකාව වනාහි නිබධ චාරිකා (නිබඳ හැසිරීම) අනිබධ චාරිකා (නො නිබඳ හැසිරීම) යැ යි විවිධ යි. කෙනෙකු නියම කොට නො ගෙන ගම් නියම් පිළිවෙළින් හැසිරීම අනිබධ චාරිකා නම්. ධර්මාවබෝධයට තරම් නුවණ මේරූ කෙනෙකු හමුවීම ම සලකා ඔහු කරා වැඩීම නිබධ චාරිකා නම්.

## බුදුරජාණන් වහන්සේ ගේ ධම්දේශනා ක්‍රම

තමන් වහන්සේ ගේ ම අදහසිනුත් භාග්‍යවතුන් වහන්සේ දම් දෙසන සේක. අනුන් ගේ අදහස් බලා එයට සුදුසු සේත් දම් දෙසන සේක. යම් කාරණයක් සිදු වූ විට එය මුල් කොට ගෙනත් දම් දෙසන සේක. කෙනෙකුන් ගේ ප්‍රශ්න විසඳීම් වශයෙනුත් දම් දෙසන සේක.

ධර්මය අසන පිරිස යම් තැනක දී සාධුකාර ශබ්දය පවත්වා නම් ඒ කෙණෙහි ම ඵලසමාපත්තියට සමවැද, සාධු නාදය නැවැතුණු කෙණෙහි සමවතින් නැගිට නැවැත්වූ තැන් සිට බණ වදාරණ සේක.

යමකු බණ අසා මේ ආත්මභාවයෙහි යටත් පිරිසෙයින් තිසරණ පිහිටීම් මාත්‍ර ගුණය වත් නො ලැබුවත් ඒ දේශනාව ඇසීම ඔහුට මතු භවයකට යහපත පිණිස පවත්නේ නම් ඒ බඳු තැන දීත් දම් දෙසන සේක. සච්චකයාට බණ දෙසීම මෙයට නිදසුනකි.

යමකු ගේ මරණය ඉතා ළංවී ඇත්නම්, පිඬු පිණිස හැසිරෙන විට වුව ද හමු වූ ඔහුට දම් දෙසන සේක. දාරුචීරිය වස්තුව මෙයට නිදසුනි.

**සමහරුන්ගේ ප්‍රශ්නවලට නිශ්ශබ්දව හිඳීම**

සමහරු තමන්ගේ නුවණට විෂය නො වන කරුණු ගැන ප්‍රශ්න ගොතා ගෙන බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ කිසි ඉගැණීමේ බලාපොරොත්තුවක් නැති ව නො කරුණේ ප්‍රශ්න අසත්. ප්‍රශ්නයට දෙන පිළිතුරු හරි ලෙස අවබෝධ කැරගත හැකි නො වූ එ බඳු පුද්ගලයාට උත්තර දීම නිෂ්ඵල බැවින්, එ වැනි පුද්ගලයනට උත්තර නිසි සේ අවබෝධ කරන්නට තරම් නුවණ මෝරන තුරු තුෂ්ණිම්භූත වන සේක. එය තේරුම් ගැනීමට තරම් නුවණ මුහුකළ විට ම ඔවුනට නිසි පිළිතුරු දෙන සේක.

**තේරුම් ගත නො හැකි වන සේ දම් දෙසීම**

සමහරු පණ්ඩිත මානයෙන් මත් ව ප්‍රශ්න ඇසීමට භාග්‍යවතුන් වහන්සේ කරා එති. මානාදී පාප ධර්මයන් ගෙන් පිරී ඉන්න තුරු කිසි උසස් ගුණයකට පැමිණිය හැකි නො වන බැවින් ඔවුන්ගේ මානය දුරු වන ලෙස කාලෝචිත පරිදි සුදුස්සක් කරන සේක. සමහර පණ්ඩිත මානීන්ගේ ප්‍රශ්නයනට ඔවුන් විසින් තේරුම් ගත නො හැකි ගැඹුරු අර්ථ ඇති පිළිතුරක් දෙන සේක. එය තේරුම් ගැන්මට අසමර්ථ පුද්ගලයා තමා ගේ මානය ඉවත ලා සිය නුගත් බව තේරුම් ගත් විට, සුවච වූ විට, ඔහුට කාරණය ලිහිල් කොට තේරුම් කැර දෙන සේක. **ඕඝතරණ සූත්‍රය** මෙයට නිදර්ශන යි.

---

## භාග්‍යවතුන් වහන්සේ වස් වුසූ ස්ථාන

(පෙළ අටුවා දෙකේ පෙනෙන හැටියට)

1 බුදු වූ වර්ෂයේ වැසි සමයෙහි බරණැස ඉසිපතන්හි
2 වන වසැ රජගහපුර වේළුවනයෙහි
3 " "
4 " "
5 විසල් පුර කූටාගාර ශාලා විහාරයෙහි
6 මකුල පර්වතයෙහි
7 තව්තිසා භවනයෙහි
8 සුංසුමාර ගිර පුර අසල භේෂකලා වනයෙහි
9 කොසැඹෑ පුර ඝෝෂිතාරාමයෙහි

10 පාරිලේයක ගම අසල වනයෙහි
11 දක්ෂිණාගිරියෙහි ඒකනාලා බමුණු ගම
12 වේරඤ්ජා නුවර
13 චාලිය පර්වතයෙහි
14 සැවැත් පුර ජේතවනයෙහි
15 කිඹුල්වත් පුර නුග අරමෙහි
16 අළවු රටෙහි
17 රජගහ පුර
18 චාලිය පර්වතයෙහි
19 " "
20 රජගහ පුර
21-44 සැවැත් පුර
45 විසල් පුර අසල බේලුව ගමෙහි

(සිංහල ජාතක පොතෙහි)

6 කොසඹෑ පුර කෝසම්බියාරාමයෙහි
11 නාලකාරාමයෙහි
18 සිට දස නව වසක් ජේතවනාරාමයෙහි
37 සිට ස වසක් පූර්වාරාමයෙහි
43-44-45 තුන් තැනෙක්හි

සෙස්ස ඉහත සඳහන් පිළිවෙළ හා සැසැඳේ.

(සඬර්මාලංකාරයෙහි ශාඛමාල වස්තුයෙහි)

9 කොසඹෑ පුර කොසම්බියාරාමයෙහි
11. නාලකාරාමයෙහි
14. දෙවියන් ගේ ආයාචනයෙන් චාලිය පර්වතයෙහි
15. කිඹුල්වත් පුර මැණික් ලෙනෙක්හි
16. සිට එකුන් විසි වසක් සැවැත් පුර ජේතවනයෙහි
37. සිට සාවුරුද්දක් සැවැත්පුර පූර්වාරාමයෙහි
43-44-45 තුන් තැනෙක්හි

සෙස්ස අටුවායෙහි ආ සැටියට සම යි.

# සූවිසි මහ සමාගම්

| සමාගමය | | සිදුවූ කාලය | ස්ථානය |
|---|---|---|---|
| 1. ධර්මචක්‍රප්‍රවර්ත්තන සමාගමය | | ප්‍රථම වර්ෂය | බරණැස |
| 2. නාලක සූත්‍ර | " | " | " |
| 3. ගංගාවරෝහණ | " | " | ගංගානදී තීරය |
| 4. බුද්ධ වංශ දේශනා | " | දෙවෙනි වර්ෂය | කපිලවාස්තු පුරය |
| 5. චරියා පිටක | " | " | " |
| 6. මහා මංගල සූත්‍ර | " | තෙවෙනි වර්ෂය | සැවැත් නුවර |
| 7. පරාභව සූත්‍ර | " | " | " |
| 8. මහාසමය සූත්‍ර | " | පස්වන වර්ෂය | කපිලවාස්තු පුරය |
| 9. සම්මාපරිබ්බාජනීය සූත්‍රය | " | " | " |
| 10. චූල්ල වියූහ | " " | " | " |
| 11. මහා වියූහ | " " | " | " |
| 12. තුවටක | " " | " | " |
| 13. පුරාභෙද | " " | " | " |
| 14. කලහ විවාද | " " | " | " |
| 15. යමක මහා පාටිහාරිය | " | සත්වන වර්ෂය | සැවැත් පුර |
| 16. අභිධර්ම දේශනා | " | " | තව්තිසා පුර |
| 17. දේවෝරෝහණ | " | " | සංකස්ස නගරය |
| 18. පාරායණ සූත්‍ර | " | එකොළොස්වන වර්ෂය | මාගධ ක්ෂේත්‍රය |
| 19. සක්කපඤ්හ | " | තුදුස් වන වර්ෂය | සැවැත් නුවර |
| 20. චූල්ලරාහුලෝවාද සූත්‍ර | " | " | " |
| 21. ආළවක සූත්‍ර | " | සොළොස් වන වර්ෂය | ආළවි පුර |
| 22. සමචිත්තපරියාය | " | විසි වන වසින් පසු | සැවැත් නුවර |
| 23. බ්‍රහ්මනිමන්තනිය සූත්‍ර | " | (කාලය අවිනිශ්චිතයි) | බඹලොව |
| 24. මාරතජ්ජනීය සූත්‍ර | " | " | සුංසුමාරගිරිපුරය |

## සාමාන්‍ය දේශනා සමාගම් කීපයක්

| | | | |
|---|---|---|---|
| 1. ඒරකපත්‍ර නාගරාජාදී | සමාගමය | ප්‍රථම වස් කාලය තුළ | ඉසිපතනය |
| 2. සුමන මාලාකාරාදි | " | දෙවෙනි වර්‍ෂය | රජගහ පුර |
| 3. ජම්බුකාජීවකාදී | " | තෙවෙනි වර්‍ෂය | " |
| 4. උග්‍රසේනාදී | " | සිවු වන වර්‍ෂය | " |
| 5. සුන පරන්තක වාණිජ | " | අටවන වර්‍ෂය | සුනාපරන්තයෙහි |
| 6. ශ්‍රීමතිදර්‍ශනාභිලාෂීන්ගේ | " | සතළොස් වන වර්‍ෂය | රජගහ පුර |
| 7. පේශකාර දුහිතෘ ආදී | " | අටළොස් වන වර්‍ෂයෙහි | ආළවිපුරයෙහි |
| 8. චූලසුභද්‍රා | " | විසි වන වසින් පසු | උග්ග පුරයෙහි |
| 9. ධනපාල | " | අන්තිම දශ වර්‍ෂය ඇතුළත | රජගහ පුර |
| 10. පාථික පුත්‍ර | " | පරිනිර්‍වාණ වර්‍ෂයෙහි | වෛශාලිපුරයෙහි |
| 11. කොලිය මහාමාත්‍යාදි | " | කාලය අවිනිශ්චිතයි | බරණැස් පුර |
| 12. සුලසා නගරශෝභිනී ආදී | සමාගමය | කාලය අවිනිශ්චිතයි | රජගහ පුර |
| 13. සාකේත බ්‍රාහ්මණාදී | " | " | සාකේතපුරයෙහි |
| 14. ගරහදින්නාදි | " | " | සැවැත් පුර |
| 15. ආනන්ද සෙට්ඨි ආදී | " | " | " |
| 16. මණ්ඩූක දේවපුත්‍රාදි | " | " | චම්පාපුරයෙහි |
| 17. මට්ටකුණ්ඩලී දේවපුත්‍රාදී | " | " | සැවැත් පුර |
| 18. සරභ පරිබ්‍රාජකාදී | " | " | විසාලාපුරයෙහි |

# අසූ මහ සව්වෝ

1. අඤ්ඤාත කොණ්ඩඤ්ඤ මහාථෙර
2. වප්ප "
3. භද්දිය "
4. මහානාම "
5. අස්සජි "
6. නාලක "
7. යස "
8. විමල "
9. සුබාහු "
10. පුණ්ණජි "
11. ගවම්පති "
12. උරුවෙලකස්සප "
13. නදීකස්සප "
14. ගයාකස්සප "
15. සාරිපුත්ත "
16. මොග්ගල්ලාන "
17. මහාකස්සප "
18. මහාකච්චාන "
19. මහාකොට්ඨිත "
20. මහාකප්පින "
21. මහාචුන්ද "
22. අනුරුධ "
23. කඞ්ඛාරේවත "
24. ආනන්ද "
25. නන්දක "
26. භගු "
27. නන්ද "
28. කිම්බිල "
29. භද්දිය මහාථෙර
30. රාහුල "
31. සීවලී "
32. උපාලි "
33. දබ්බ "
34. උපසේන "
35. ඛදිරවනිය රේවත "
36. පුණ්ණමන්තානිපුත්ත "
37. පුණ්ණ (සුනාපරන්තක) "
38. සොණ (කුටිකණ්ණ) "
39. සොණ (කෝළිවිස) "
40. රාධ "
41. සුභූති "
42. අංගුලිමාල "
43. වක්කලි "
44. කාළුදායි "
45. මහා උදායි "
46. පිලින්දිවච්ඡ "
47. සෝභිත "
48. කුමාරකස්සප "
49. රට්ඨපාල "
50. වඞ්ගීස "
51. සභිය "
52. සේල "
53. උපවාන "
54. මේඝිය "
55. සාගත "
56. නාගිත "

| | | | |
|---|---|---|---|
| 57. ලකුණ්ටක භද්දිය | මහාථෙර | 69. ධෝතක | මහාථෙර |
| 58. පිණ්ඩෝලභාරද්වාජ | " | 70. උපසීව | " |
| 59. මහාපන්ථක | " | 71. නන්ද | " |
| 60. චූල්ලපන්ථක | " | 72. හේමක | " |
| 61. බක්කුල | " | 73. තෝදෙය්‍ය | " |
| 62. කොණ්ඩධාන | " | 74. කප්ප | " |
| 63. දාරුචීරිය | " | 75. ජතුකණ්ණි | " |
| 64. යසෝජ | " | 76. භද්‍රාවුධ | " |
| 65. අජිත | " | 77. උදය | " |
| 66. තිස්සමෙත්තෙය්‍ය | " | 78. පෝසාල | " |
| 67. පුණ්ණක | " | 79. මෝඝරාජ | " |
| 68 මෙත්තගූ | " | 80. පිංගිය | " |

# ස්ථානාන්තර ලත් භික්ෂූහු

| | | | |
|---|---|---|---|
| 1. අඤ්ඤාත කොණ්ඩඤ්ඤ තෙරණුවෝ | | චිරරාත්‍රඥයන් | අතුරෙන් අග්‍රයි |
| 2. සාරිපුත්ත | " | මහාප්‍රාඥයන් | " |
| 3. මොග්ගල්ලාන | " | සෘද්ධිමතුන් | " |
| 4. මහාකස්සප | " | ධූතවාදීන් | " |
| 5. අනුරුද්ධ | " | දිවැස් ඇත්තන් | " |
| 6. කාලිගොධාපුත්ත භද්දිය | " | උසස් කුලයෙහි උපන්නන් | " |
| 7. ලකුණ්ට භද්දිය | " | මධුරස්වර ඇත්තන් | " |
| 8. පිණ්ඩෝල භාරද්වාජ | " | සිංහනාද කරන්නන් | " |
| 9. පුණ්ණ (මන්තානි පුත්ත) | " | ධර්ම කථිකයන් | " |
| 10. මහාකච්චායන | " | කොටින් කී දෙයක් විස්තර කිරීමෙහි සමතුන් | " |
| 11. චූල්ලපන්ථක | " | මනෝමය රූප නිර්මාණයෙහි සමර්ථයන් | " |
| 12. මහාපන්ථක | " | අරූපධ්‍යානයෙන් නැගිට රහත් වූවන් | " |
| 13. සුභූති | " | නොකිලිටි විහරණ ඇත්තන් | " |

| | | | |
|---|---|---|---|
| 14. සුභූති | තෙරණුවෝ | දක්ෂිණාර්හයන් | අතුරෙන් අග්‍රයි |
| 15. රේවත (ඛදිරවනිය) | " | ආරණ්‍යකයන් | " " |
| 16. කඞ්ඛාරේවත | " | ධ්‍යානයෙහි ඇලුණවුන් | " " |
| 17. සෝණ (කෝළිවිස) | " | ආරබ්ධ වීර්ය ඇත්තවුන් | " " |
| 18. සෝන (කුටිකණ්ණ) | " | මනාප කථා ඇත්තවුන් | " " |
| 19. සීවලී | " | ලාභීන් | " " |
| 20. වක්කලී | " | අධික ශ්‍රද්ධා ඇත්තවුන් | " " |
| 21. රාහුල | " | ශික්ෂාකාමීන් | " " |
| 22. රට්ඨපාල | " | ශ්‍රද්ධායෙන් පැවිදි වූවන් | " " |
| 23. කොණ්ඩධාන | " | පළමු කොට සලාකා ගන්නන් | " " |
| 24. වංගීස | " | වැටහෙන නුවණ ඇත්තවුන් | " " |
| 25. උපසේන (වංගන්ත බ්‍රාහ්මණ පුත්) | " | සියල්ලෙන් ප්‍රසාද එලවන සුලු තැනැත්තන් | " " |
| 26. දබ්බ(මල්ල පුත්ත) | " | සෙනසුන් පණවන්නන් | " " |
| 27. පිළින්දිවච්ඡ | " | දෙවියනට ප්‍රිය වූවන් | " " |
| 28. බාහිය (දාරුචීරිය) | " | වහා අභිඥා ලද්දන් | " " |
| 29. කුමාරකස්සප | " | විචිත්‍ර කථිකයන් | " " |
| 30. මහා කොට්ඨිත | " | ප්‍රතිසංවිත් ප්‍රාප්තයන් | " " |
| 31. ආනන්ද ස්ථවිර | " | උපස්ථායකයන් | " " |
| | | ධාරණ ස්මෘති ඇත්තන් | " " |
| | | භාග්‍යවතුන් වහන්සේ වදාළ තාක් එ සේ ම දැනගැන්මෙහි සමර්ථයන්, වීර්යවතුන් | " " |
| 32. උරුවේල කස්සප | " | මහ පිරිස් ඇත්තවුන් | " " |
| 33. කාළුදායි | " | කුලයන් සස්න කෙරේ පහදවන්නන් | " " |
| 34. බක්කුල | " | නීරෝගයන් | " " |
| 35. සෝභිත | " | පූර්වනිවාසය සිහි කරන්නන් | " " |
| 36. උපාලි | " | විනයධරයන් | " " |

| | | |
|---|---|---|
| 37. නන්දක | තෙරණුවෝ | මෙහෙණියනට අවවාද කරන්නන් අතුරෙන් අග්‍රයි |
| 38. නන්ද | " | ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වූවන් " " |
| 39. මහාකප්පින | " | භික්ෂවවාදකයන් " " |
| 40. සාගත | " | තේජෝධාතු සමවතට සමවදන වූන් " " |
| 41. රාධ | " | ධර්මදේශනා වැටැහීමට ප්‍රත්‍යය වූ දෘෂ්ටි සමුදාචාරාදිය ඇත්තන් " " |
| 42. මෝඝරාජ | " | රූක්ෂ සිවුරු දරන්නන් " " |

# ස්ථානාන්තර ලත් මෙහෙණහු

| | | |
|---|---|---|
| 1. ප්‍රජාවතී ගෞතමී | චිරරාත්‍රඥාවන් | අතුරෙන් අග්‍රයි |
| 2. ඛෙමා | මහ නුවණැතියන් | " " |
| 3. උප්පල වණ්ණා | සෘ මතීන් | " " |
| 4. පටාචාරා | විනය ධරාවන් | " " |
| 5. ධම්ම දින්නා | ධර්ම කථිකාවන් | " " |
| 6. නන්දා | ධ්‍යායිනින් | " " |
| 7. සෝණා | ආරබ්ධ වීර්‍ය්‍යාවන් | " " |
| 8. සකුලා | දිව්‍යස් ඇත්තියන් | " " |
| 9. භද්දා කුණ්ඩලකේසා | වහා ලත් අභිඥා ඇත්තියන් | " " |
| 10. භද්දා කාපිලානි | පෙර ජාති සිහි කරන්නන් | " " |
| 11. භද්ද කච්චානා (යසෝධරා) | මහත් අභිඥා නුවණ ලැබූවන් | " " |
| 12. කිසා ගෝතමී | රූක්ෂ සිවුරු දරන්නන් | " " |
| 13. සිගාල මාතා | අධික ශ්‍රද්ධා ඇත්තියන් | " " |

## තනතුරු ලත් උපාසකවරු

1. තපස්සු භල්ලික සහෝදර වෙළෙඳ දෙදෙන මුලින් ම සරණ ගිය උපාසකවරු
2. සුදත්ත (අනාථ පිණ්ඩික)සිටු අග්‍ර දායක.
3. චිත්ත ගහපති (මච්ඡිකා·සණ්ඩ නගරවාසි) අග්‍ර ධර්ම කථික

| | |
|---|---|
| 4. හත්ථකාළවක රජ | සිවු සඟරා වතින් රට වැසියාට සංග්‍රහ කරන්නන් ගෙන් අග්‍ර යි |
| 5. මහානාම ශාක්‍ය රජ | අග්‍ර ප්‍රණීත දායක |
| 6. උග්ග ගහපති (විසල් පුරවැසි) | සිතට රිසි දෑ දෙන්නවුන් ගෙන් අග්‍රයි |
| 7. උග්ගත ගහපති | අග්‍ර සංඝෝපස්ථායක |
| 8. සූර අම්බට්ඨ | අචල ශ්‍රද්ධා ඇත්තවුන් ගෙන් අග්‍රයි |
| 9. ජීවක කොමාර භච්ච | පෞද්ගලික ප්‍රාසද ඇත්තන්ගෙන් අග්‍රයි |
| 10. නකුලපිතු ගහපති | විශ්වාස කථා ඇතියන් ගෙන් අග්‍රයි |

## තනතුරු ලත් උපාසිකාවරු

| | |
|---|---|
| 1. සුජාතා (සේනානි සිටු දූ) | බුදුරජාණන් වහන්සේ දැක සරණ ගිය පළමු උපාසිකාව |
| 2. විශාඛා (මිගාර මාතු) | අග්‍ර දායිකාව |
| 3. ඛුජ්ජුත්තරා | බහුශ්‍රුතාවන් ගෙන් අග්‍රයි |
| 4. සාමාවතී | මෛත්‍රී විහාර ඇත්තියන් ගෙන් අග්‍රයි |
| 5. උත්තරා (නන්ද මාතු) | ධ්‍යායිනීන් ගෙන් අග්‍ර උපාසිකාව |
| 6. සුප්පවාසා (කෝලිය දූහිතෘ) | ප්‍රණීත දෑ දෙන්නන් ගෙන් අග්‍රයි |
| 7. සුප්පියා | අග්‍ර ග්ලානෝපස්ථායිකා |
| 8. කාතියානි | අචල ප්‍රසාද ඇත්තවුන් ගෙන් අග්‍රයි |
| 9. නකුලමාතා | විශ්වාසිකාවන් ගෙන් අග්‍රයි |
| 10. කාලි (කුරරඝර නුවර වැසි) | ආරංචියෙන් බුදුගුණ අසා පැහැදුණවුන් ගෙන් අග්‍රයි. |

## බුද්ධ චරිතයේ අග්‍ර දවස්

| | |
|---|---|
| වෙසක් පුණු පෝ දා | බෝධි සත්ත්වෝත්පත්තිය, බුදු වීම, බුද්ධත්වයෙන් පසු කිඹුල්වත් පුරයට මුලින් වැඩි දිනය. (තුන් වන වර) ලක්දිව වැඩීම, පිරිනිවන් පෑම. |
| වෙසක් පුණු පෝදා | කාලදේවල තවුසාට බෝසතුන් දැක්වීම |
| වෙසක් අව විසේනිය දා | බෝසතාණනට නම් තැබීම |
| ඇසළ පුණු පෝ දා | බෝසතාණන් මවු කුසැ පිළිසිඳ ගැනීම |
| " " | ගිහිගෙයින් නික්මීම? |
| " " | දම්සක් පැවැත්වීම. |

| | |
|---|---|
| ඇසළ අව අටවක දා | මුලින් ම බිම්සර රජුට බෝසතාණන් හමුවීම. |
| වප් පුණු පෝ දා | දේවාවරෝහණය, මෛත්‍රෙය බෝසතාණන් පැවිදි වීම. |
| නවම් පුණු පෝ දා | මහා සංඝ සන්නිපාතය (අග සව්වන් පත්කැර ගැනීම, අවවාද ප්‍රාතිමෝක්ෂෝද්දේශය) |
| බක් අව පසළොස්වක | ලක්දිව් වැඩීම (දෙ වෙනි වර) |
| දුරුතු පුණු පෝ දා | ලක්දිව වැඩීම (පළමු වර) |

---

## සස්නෙහි දීර්ඝායුෂ් කාලයක් ඇති වැ සිටියෝ

| | | | | | |
|---|---|---|---|---|---|
| විශාඛා උපාසිකාව | වර්ෂ | 120 | පාවාරිය භික්ෂු | වර්ෂ | 120 |
| පොක්ඛරසාදි බ්‍රාහ්මණ | " | " | ආනන්ද ස්ථවිර | " | " |
| බ්‍රහ්මායු බ්‍රාහ්මණ | " | " | මහාකාශ්‍යප ස්ථවිර | " | " |
| සෙල | " | " | අනුරුධ ස්ථවිර | " | 150 |

බක්කුල ස්ථවිර වර්ෂ 160

---

# බුද්ධ චරිතය

## උපග්‍රන්ථය

1. සිංහහනු රජතුමාට **සුද්ධෝදන**, **ශුක්ලෝදන**, **අශුක්ලෝදන**, **ධෝතෝදන**, **අමිතෝදන** යැ යි පුත්තු පස්දෙනෙක් ද **අමතාවී** නම් දුවක් ද වූහ යි මැදුම් සඟි අටුවායෙහි කියන ලදි. ශුද්ධෝදන, ශුක්ලෝදන, ධෝතෝදන, අමිතෝදන යැ යි පුතුන් සිවු දෙනෙකුන් ද **අමිතා**, **ප්‍රමිතා** යැ යි දූන් දෙදෙනෙකුන් ද වූ බව මහා වංශයෙහි දැක්වේ. ශුද්ධෝදන, අමිතෝදන, ශුක්ලෝදන, අශුක්ලෝදන යැ යි සොහොයුරන් පස් දෙනා ගේ නම් සූත්‍ර නිපාත අටුවායෙහි දක්නා ලැබේ. වප්ප රජු ද බුදු රජු ගේ සුළු පියෙකැ යි අංගුත්තර අටුවාහි පෙනේ.

ශුද්ධෝදන, ශුක්ලෝදන, ද්‍රෝණෝදන, අමෘතෝදන යැ යි සොහොයුරෝ සිවු දෙනෙක් ද, ශුධා, ශුක්ලා, ද්‍රෝණා යැයි සොහොයුරියෝ තිදෙනෙක් ද වූහ යි අවදානකල්ප ලතා පල්ලව නම් සංස්කෘත ග්‍රන්ථයෙහි සඳහන් වේ.

ශුද්ධෝදන රජු ගේ දරුවෝ තිදෙනෙකි, ඔහු නම් නන්දා කුමරිය, සිද්ධාර්ථ කුමාරයන් වහන්සේ, නන්ද කුමරු යන තිදෙනා යි. මෙයින් **නන්දා** තොමෝ සිද්ධාර්ථ කුමරුටත් වැඩි මහලු යි. නන්ද කුමරු තිදෙනාගෙන් ම වයසින් බාලයා යි. **නන්දා** **නන්ද** දෙදෙනා ප්‍රජාවතී ගෞතමියගෙන් ද **සිද්ධාර්ථ** කුමරු මහාමායා බිසොව ගෙන් ද සුදොවුන් රජුට ලැබුණු දරුවෝ යැ යි දත යුතු.

## සූර්ය වංශයෙහි
# රාජ පරම්පරාව

මහාසම්මත (මනුරජ)
රෝජ
වරරෝජ
කල්‍යාණ
වරකල්‍යාණ
උපෝසථ
මන්ධාතු
වර
උපවර
චේතිය
මුචල
මුචලින්ද
සාගර
සාගර
භරථ
භගීරථ (භගීරස)
රුචි
සුරුචි
ප්‍රතාප
මහා ප්‍රතාප
පනාද
මහා නාද
සුදර්ශන
මහා සුදර්ශන
නේරු
මහා නේරු
අර්චිෂ්මත්
(මේ රජහු අට විසි දෙන **කුසාවතී** රාජගෘහ **මිථිලා** යන නුවර තුනෙහි රජය කැරවූහු)
අර්චිෂ්මත්
සාගර
මඛාදෙව (මිථිලායෙහි)
(මේ පරපුරෙහිම)
නිමි
කාලරජන
ප්‍රේමකර
අශෝක
(මේ පරපුරෙහි රජුහු බොහෝ දෙනෙක් බරණැස රජය කැරවූහ.)
දිලීප
රඝු
අජ
දශරථ
රාම
(මේ පෙළපතෙහි මැ)
විජය
(පිළිවෙළින් දරු මුණුබුරු පසළොස් දෙනෙක්)
ඔක්කාක
කුස
සුජාත

ශාක්‍ය වංශය:


ඉක්ෂ්වාකු
උල්කා මුඛ ආදි සතර දෙනෙක්
(කපිල වාස්තු පුරාරම්භය)
තිපුර
(දරු මුනුබුරු අට දෙනෙක්)
සීහසුර
(දරු මුනුබුරු පරපුරෙහි)
**ජයසේන**
සිංහහනු
ශුද්ධෝදන
සිද්ධාර්ථ
(භාග්‍යවතුන් වහන්සේ)

මේ මහා බෝධිවංශ ග්‍රන්ථි පද විවරණයේ ආ පරිදියි. දික්සභි අටුවා ආදියේ රජ පෙළපත මෙයට මදක් වෙනස් ලෙස පෙනේ.

## ශාක්‍ය රාජ වංශය. (ජයසේන රජු පටන් කොට)




## මවු පෙළපත




(-) මේ ලකුණින් අඹුසැමි බව දැක්වේ.

* අනුරුධ කුමරා අමිතෝදන රජුගේ පුතෙකැයි අංගුත්තර අටුවායෙහි පෙනේ.

2. මායා දේවී නකත් කෙළි උළෙලට සම්බන්ධ නොවී රජුගෙන් අවසර ගෙන පෙහෙවස් වුසුවා යි මහායාන පොත්හි දැක්විණ.

3. මායා බිසව දුටු ස්වප්නය ගැන **ලලිත විස්තර** සූත්‍රයෙහි මෙසේ සඳහන් වේ :- මායා දේවී සුඛශයනප්‍රසුප්තා ඉමං ස්වප්නමපශ්‍යත් :-

හිමරජතනිභශ්ච ෂඩ්විෂාණඃ සුචරණචාරුභුජඃ සුරක්තශීර්ෂඃ

උදරමුපගතො ගජප්‍රධානො ලලිතගතිර් දෘඪවජ්‍රගාත්‍රසන්ධිඃ

4. බෝසතාණන් තුසීලොවින් ච්‍යුත වන්නට පෙර ස්වකීය ඔටුන්න මෛත්‍රෙය බෝසතාණන් හිසෙහි පළඳවා එ තුමනට දිව්‍ය රාජ්‍යය පවරා ඉන් චුත වූ බව **ලලිත විස්තරයෙහි** පෙනේ.

තව ද පසු දා උදය මායාදේවී පිරිවර ස්ත්‍රීන් කැටුව අශෝක වනයට ගොස් සුදොවුන් රජුට පණිවුඩයක් යැවූ බව ද, රජ එය අසා ගියහු අශෝක වන ද්වාරයේ දී සිය සිරුර උසුලා නො ගත හැකි සේ බරක් දැනී 'මේ කිමෙක් දැ?'යි විස්මිත වූ බව ද, එ කෙණෙහි ශුද්ධාවාසකායික දෙව් පුතකු අර්ධ ශරීරයෙන් පෙනී සිට බෝසතාණන් උපන් බව කී වගත් **ලලිතවිස්තර සූත්‍රයෙහි** පෙනේ.


5. බෝධි සත්ත්ව මාතාව ගේ පහසුව සඳහා විශේෂ ප්‍රාසාදයක් සුදොවුන් රජු කැරැවූ බව ද ශක්‍ර සුයාමාදී දෙවියනුත් කපිල පුරයෙහි තන්හි තන්හි ප්‍රාසාද මැවූ බව ද බෝධිසත්ත්වයන් වහන්සේ **මහාව්‍යූහ** නම් සමාධියේ ආනුභාවයෙන් ඒ සියලු ප්‍රාසාදයෙක ම මැණියන් සහිත ව පෙනෙමින් මවු කුස දකුණු පසෙහි බඩපයඞ්කයෙන් හුන් බව ද **ලලිතවිස්තර සූත්‍රයෙහි** දැක්වේ.


6. මේ ප්ලක්ෂ වෘක්ෂයෙකැ' යි ලලිත විස්තරයෙහි දැක්වේ. **අශෝක** රුකෙකැ යි **ය්වංඡ්ශ්වාං** ගේ භ්‍රමණ වාර්තායෙහි පෙනේ.

7. බෝසතාණන් බිසව ගේ දකුණැලයෙන් සෘඩියෙන් නික්මුණු බවත් **ලලිතවිස්තරයෙහි** දක්වන ලදී. යශෝධරා දේවී, ඡන්නාමාත්‍ය, කාළුදායි අමාත්‍ය, ආජානීය ඇත් රජ, කන්ථක අස්රජ, මහ බෝරුක, සතර මහා නිධාන යන මොවුන් ද මෙ දින ම උපන්හ යි **ජාතකට්ඨ කථා** ආදියෙහි දැක්වේ.

මායා දේවීන් ඇඳෙක සැතැපුණු පසු බෝසත් උපත වී යැ යි අශ්වඝෝෂයන් ගේ බුද්ධචරිත (සමහර) පිටපතෙක සඳහන් වේ.

8. කලියුග වර්ෂ 2478 හි වෙසක් මසැ පුණු පොහෝ ලත් ඉරිදා උදයාදි එකොළොස් පැ විනාඩි හතරට විසානැකතින් කටක ලග්නයෙන් සිංහ නවාංශකයෙන් බෝසතාණන් උපන්හයි කෞමාර නාඩිවාක්‍යයේ සඳහන් වේ. උන්වහන්සේ ගේ ජීවිත කාලය අවුරුදු 80 මාස 10 දින 15 කැ යි ද එහි ම සඳහන් වේ. එහි දැක්වෙන බුද්ධ කේන්ද්‍රය මෙසේ ය.




හෙළදිව බැවහාර වන බුධකෝන්ද්‍රයේ දස වැන්නේ බුධ රවි එකට සිටුනා බව දැක්වෙතත් නාඩිපොත්හි එන කේන්ද්‍රයේ ඒ දෙදෙනා ගෙන් බුද දසයේත් රවි එකොළොසේත් ඇතැයි දැක්වේ. කාකයර්නාඩි

බුඩචරිතයේ ද කේන්ද්‍ර මේ සැටිම ය. බාග විට භාව වශයෙන් වෙනස් ව ඇති සැටියක් මෙයින් දැක්වෙතැයි සිතිය හැක්ක. ජ්‍යොතිර් විද්‍යාඥයෝ විමසත්වා.

9. උපන් කෙණෙහි බෝසතුන් කීදැ 'අග්ගොහමස්මි ලෝකස්ස' යන ආදීන් අටුවාහි දැක්වේ. සකු බණ පොත්හිද මෙය දැක්වේ. බෝසතාණන් ගේ උත්පත්තිය ගැන **අච්ඡරියබ්භූත** සූත්‍රාදියෙහි තුසී ලොවින් චුත වූයේ සිහි ඇතිව මැ යි ද පිළිසිඳ ගත්තේත් දැනුම ඇතිව යැ යි ද සඳහන් වේ. මෙසේ හෙයින් බෝසතාණෝ ජාතිස්මරණ (ගිය ජාතිය සිහිකරන) නුවණ ඇත්තෝ වූහ. මව කුසැ වුසුවේත් සිහිනුවණ ඇතිව ම ය. එ බැවින් උපන් කෙණෙහි කථා කිරීම අවිශ්වාසයට කරුණු නො වේ. උපන් කෙණෙහි සත් පියක් පියුම් පිටින් යෑම ද අවිශ්වාසයට කරුණක් නො වේ. ගව ආදී සමහර සතුන් ද උපන් හැටියේ ම දිව ඇවිදී. මව් කුස තුළ දී ම සිරුර එ පමණට වැඩුණ බැවිනි. කලාතුරෙකින් කිසි මනුෂ්‍යයකුටත් එබඳු ශක්තිය ඇති ව ඉපදීමට බැරිකමෙක් නැත.

උපන් හැටියේ කථා කළ තවත් අය ගැන ලෝක වාර්තා ඇත.

1875 දී එංගලන්තයේ පළ වූ Loydi's Weekly නම් සති පතා පත්‍රයේ උපන් කෙණෙහි කථාකළ දරුවකු ගැන සඳහන් වේ. ප්‍රංශයේ සා ලුයි (Zaar - Louis ) නම් ගමේ ගෙයක දරුවෙක් උපන. මිතුරෝ රැස්ව දරුවාගේ පියාට ප්‍රීතිය පවසමින් හුන්හ. මේ අතර දරුවා උපන. එහි සිටියෙක් දැන් වේලාව කීය දැ? යි ඇසී ය. එ කෙණෙහි ම උපන් දරුවා පැහැදිලි වචනයෙන් දැන් දෙකයි' කී ය. සියල්ලෝ විස්මිත ව නිහඬව බලා හුන්හ. එවිට දරුවා කථා කරමින් 'මේ 1875 වන වර්‍ෂය ශුභ යි. 1876 දී මේ රටේ ලේ වැගිරීම් ඇති වෙයි. මෙය දන්වන්නට මෙ ලොවට ආමි' යි කී ය.

මේ ප්‍රවෘත්තිය ඒ පත්‍රයෙන් උපුටා ගෙන Isis Vnveiled නම් පොතෙහි 438 වැනි පිටේ දක්වා ඇත. තවද උපන් අළුත දරුවන් නෙළුම් මල් අතුරා ඊපිට තබාගෙන යෑම ද ඉන්දියාවේ සමහර පළාත්වල අද ද දක්නට ලැබෙන සිරිතෙකි. මේ සිරිත පැරණි එකෙකි. එදා බෝසතාණන් උපන් බිමැ නෙළුම් මල් අතුරා තුබුණා නම් ඊ පිටින් සත් පියක් වැඩියා යන්න අවිශ්වාස කටයුත්තෙක් නො වේ.

සාරාසැකිකප් ලක්ෂයක් පැරුම් පිරූ බෝසතාණන් සෙසු සාමාන්‍ය මිනිසුන් ගේ ගණයෙහි ලා සැලැකීම වැරැදි ය. ලොව පහළ වූ හැම දැයින් ම සෙස්සනට වැඩි දෙවියනටත් වඩා උසස් ආශ්චර්‍ය්‍ය පුද්ගලයෙකි මහා බෝසතාණෝ.

10. පුත්‍ර ප්‍රසූතිය අසා සුදොවුන් රජ ලුම්බිනියට ගියහ යි ද පෙරළා එන ගමනේ ශාක්‍යයන් ගේ දෙවි වූ ශාක්‍යවර්ධන දෙවියාගේ කෝවිලට ආ හයි ද ප්‍රජාවතී ගෞතමීන් බෝසතාණන් වඩාගෙන එහි ඇතුල් වූ හයි ද එ කෙණෙහි දේව රූපය නැගිට නමස්කාර කළ හයි ද ය්වාංජිශ්වාං ගේ ගමන් වාර්තායෙහි පෙනේ. මේ දෙවොල **අභයා** නම් දෙවඟනක ගේ කෝවිලක් බව ද මේ සිද්ධියෙන් පසු බෝසත් **දේවාධිදේව** නම් වී යයි ද **මහාවස්තුයෙහිත්** ටිබැට් පොත්වලත් පෙනේ. ලුම්බිනියෙන් පෙරළා ඊම සතියෙකින් පසුවී යැ යි සමහර සංස්කෘත පොත්හි පෙනේ.

ශාක්‍යවර්ධන නම් දේවතාවා ගේ දේවාලයට ශාක්‍යයන් තම දරුවන් ගෙන ගොස් නමස්කාර කරවන බව ද, එ සිරිතට අනුව බෝසතාණන් ලවා ද වන්දවන්නට තැත් කළ බව ද එ කෙණෙහි දේව රූපය උන් වහන්සේ ගේ පා මුල වැටුණු බව ද **අවදාන කල්පලතාපල්ලවයෙහි** පෙනේ.

බෝසතුන් දකුණු පය දෙවොල ඇතුළෙහි තබනු සමග ම එහි තුබූ ශිව, ස්කන්ධ, නාරායණ, කුවේර, චන්ද්‍ර, සූර්‍ය, වෛශ්‍රවණ, ශක්‍ර, බ්‍රහ්මාදි දේවරූප බෝසතුන් ගේ පා මුළ වැටී බෝසත්නට ගාථාවලින් ස්තුති කළ බව **ලලිතවිස්තරයෙහි** දැක්වේ.

11,12 කාලදේවල නමින් අටුවායෙහි දක්වන ලද්දේ අසිත තවුසා ම ය. මෙ තෙම **අසිතදේවල** නමින් දන්නා ලද්දේ ය. අසිත තවුසා ගේ බෑණනු වූ **කිෂ්කින්ධා** පර්වත වාසී **නාරද** තපස්විහු බෝසතුන් උපන් ද ඇති වූ මහත් එළිය දැක ඒ කිම් දැ යි අසිත තවුසහු ගෙන් ප්‍රශ්න කළ බව ද, එහි තොරතුරු අසිත තවුස් විස්තර කළ බව ද, ඉක්බිති එ දෙදෙන බෝසතුන් දක්නට ආ බව ද **අවදන කල්පලතා පල්ලවයෙහි** කියන ලදී. උතුරේ හිමාලය පර්වතයෙහි සිට අසිත තවුසා සිය බෑනණු වූ **නරදත්ත** මානවකයා හා ආ බව **ලලිත විස්තරයෙහි** සඳහන් වේ. ඒ තවුසා දකුණෙහි **වින්ධ්‍යා** පර්වතයෙහි සිට නාලකයා කැටුව ආ බව **මහා වස්තුයෙහි** දර්ශිත යි.

13. බෝසතාණන් ගේ ලක්ෂණ පරීක්ෂා කළ බමුණන් අට දෙනා ගේ **නාම: රාම, ධජ, ලක්ඛණ, මන්ති, කොන්ඩඤ්ඤ, භොජ, සුයාම, සුදත්ත** යැ යි අටුවාහි පෙනේ. මිලිඳු පැනයෙහි මඳක් වෙනස් ලෙස **රාම, ධජ, ලක්ඛණ, ජාතිමන්ත, යඤ්ඤ, සුයාම, සුභොජ, සුදත්ත** යැ යි දක්වන ලදී.

14. මහාවස්තු ආදී සංස්කෘත පොත්හි බෝසතාණන් ගේ නම **සර්වාර්ථසිධ** යැ යි පෙනේ. **ලලිත විස්තරයෙහි සිධාර්ථ** යැ යි ද සඳහන් වේ.

15. අන්තඃකල්පාරම්භයේ දී දෙවියන් ඍෂීන් මගින් මහාපුරුෂ ලක්ෂණ විද්‍යාව දුන්හයි අම්බට්ඨ සූත්ත අටුවාහි දැක්වේ. මෙහි යටත් පිරිසෙයින් මහා පුරුෂ ලක්ෂණ එකක්වත් ඇති පිනැතියන් උපදනා කාලය මා පියන්ගේ නම් ගම් ආදිය දැක්වේ. මේවා අද නාඩි වාක්‍ය නමින් ප්‍රසිධය. සමහර ඍෂින්ගේ වාක්‍යවල මතු සිදුවන සමහර දෑ අනියමින්ද සමහරුන්ගේ වාක්‍යවල නිශ්චය කොටද දැක්වේ. මහ පටැහිල්ල බලාද සම්පූර්ණ ඵල කියන හැකි ක්‍රම සමහරෙක දැක්වේ.

16. බෝසත් උපන් පසු සතියක් ඇතුළත දී මායා දේවියගේ මරණය වී යැයි සමහර සංස්කෘත ග්‍රන්ථවල පෙනේ. මායා බිසව දෙව් පුතකුව පුත්‍ර ස්නේහ හේතුවෙන් බෝසත් කුමරු හුන් කාමරයට අරක් ගත් බව **ලලිත විස්තරයෙහි** පෙනේ.

17. වප්මඟුල් වේලෙහි බෝසතාණන් යහනෙහි ම හිඳ ප්‍රථම ධ්‍යානය ඉපදැවූ බව අටුවාහි කියන ලදී. අහස් වැඩි බවක් කිසි අටුවාවෙක නොපෙනේ. මිලිඳු පැනයෙහි සතරවන ධ්‍යානය වඩා අහස් හි පළක් බැඳ හුන් බව කියන ලදී. බෝසතාණන්ට ඇවිදින්නට පුලුවන් තරම් කාලයේදී දිනක් පිය රජු හා උයනට යන ගමනේදී ගොවිපලකට පැමිණි බවද, එහිදී නඟුලට අසුවී මළ සර්පයෙකුත් මැඩියකුත් දැක බොහෝ සංවේගයට පැමිණ පසෙක දඹරුකක් යටට වී ඉඳ ධ්‍යාන වඩා ප්‍රථම ධ්‍යානයට සමවත් බවද. එ වෙලායෙහි හිමාලයේ සිට වින්ධ්‍යා පර්වතයට අහසින් යන ඍෂීන් පස් දෙනෙක්නට එ පෙදෙසින් යා නොහී බැස බෝසතුන් දැක වැඳ ප්‍රශංසා කොට ගිය බවද හෝජන සමයෙහි කුමරු නො දැක සොයා ඇවිදුනා ඇමතියන් බෝසතුන් ඒ රුක් මුල ඉන්නා දැක රජුට දැන්වූ බවද රජු අවුත් එහි ඡායාව වෙනස් නොවීම් ආදී ආශ්චර්ය දැක වැන්ද බවද **මහාවස්තුයෙහි** සඳහන් වෙ. මෙය වූයේ වයස විසි නවයේදී යැයි **දිව්‍යාවදානයේ** ද ටිබැට් බෞධ පොත්හි ද පෙනේ. මේ සම්බන්ධයෙන් ඇතැම් මහායාන පොත්හි ප්‍රවෘත්තිය අටුවාවට සම යි.

18. බෝසත් කුමරා යහපත් ධන්‍ය පුණ්‍ය ගුණ ඇති ඉතා හොඳ මිතුරන් ඇති ව සැප සේ කල් යැවූයේ ය. **වත්ස** නම් බ්‍රාහ්මණ කුමරා වැලි කෙළියෙහි පටන් එක් ව කල් යැවූ බෝසතාණන් ගේ හිත මිතුරෙකි.

19. සබ්බමිත්ත (සර්වමිත්‍රයා) බෝසත්නට ඉගැන්වූ බව මිලින්ද ප්‍රශ්නයෙහි පෙනේ. බෝසත්හට ශිල්ප ඉගැන් වූ ඇදුරා **විශ්වාමිත්‍ර** නමැ යි සංස්කෘත බෞධ පොත්හි පැනේ. 'සර්ව මිත්‍ර' 'විශ්වා මිත්‍ර' යනු සමානාර්ථ නාම යි.

20. බෝසතාණන් සියලු විද්‍යාවන් මනා ව ඉගෙන නිමවා ඉක්බිති 'බ්‍රාහ්මී' නම් අක්ෂර විශෙෂයෙක් නිපැද වූ හයි **ක්ෂේමේන්ද්‍ර** පඩිහු කළ **බුධ ජන්ම** නම් පොතේ සඳහන් වේ. 'බ්‍රාහ්මී අක්ෂර' යනු අශෝකාක්ෂරයනට නමෙකි.

'වර්ධමානඃ කුමාරො'ථ
සර්වවිද්‍යාසු පාරගඃ
ලිපිප්‍රවීණො' හිතවාං
ලිපිං බ්‍රාහ්මීං විනිර්මමෙ' (බුධජන්ම)

'වැඩෙනා ඒ (සර්වාත්ථ සිධ) කුමරු සියලු විද්‍යාවන්හි පරතෙරට පැමිණියේ ලිවීමෙහි සමත් වූයේ **බ්‍රාහ්මී** නම් අභිනව ලිපි විශේෂයක් (අකුරු වගයක්) නිපදැවූයේ ය' යනු එහි තේරුම යි.

21. සුදොවුන් රජතුමා ප්‍රාසාද තුනක් කරවා තම පුත්‍රයාට කුමරියක ආවාහ කොට දෙනු සඳහා ශාක්‍යයනට හසුන් පත් යැවී ය. 'සිදුහත් කුමරු රූපසම්පන්න වුවත් ශිල්පයක් නො දනිති' යන ආදීන් ඔහු බෝසතාණන් ලඝු කොට සලකා තමන් අදහස් කියා එවූහ. එ පවත් පිය රජ සිදුහත් කුමරුට දැන්වී ය. එවිට නෑයන් රැස් කරවා ඔවුන් මධ්‍යයෙහි, බෝසත් තමා දත් ශිල්ප දැක්වූයේ ය. එයින් සතුටු වූ ශාක්‍ය රජ්ජු තම දූ දරුවන් සරසා එවූහු. සුප්‍රබුධ ශාක්‍ය රජු ගේ දූ වූ **භද්‍රකාංචනා** (හෙවත් යශෝධරා) කුමරිය බෝසතාණන් ගේ අග මෙහෙසි කොට අභිෂේකය කරන ලදී. නෑ රජුන් එවූ **ධීරා, වීරා, භද්‍රා, උපශමා උත්තරා** ආදී ශාක්‍ය කුමරියන් සතළිස් දහසක් පමණ අන්තඃ පුරයෙහි වූහ. ඉන් එක් පායෙක දස දහසක් පමණ කුමරියෝ යශෝධරා වගේ පිරිවර වූහ. දණ්ඩපාණී ශාක්‍ය රජු ගේ දූ වූ **ගෝපා** නොම බෝසතාණන් ගේ අගමෙහෙසි වී යැ යි **ලලිත විස්තරයෙහි** පෙනේ. බෝසත්නට යශෝධරා, කිසාගෝතමී, මනෝහරා යැයි මෙහෙසියෝ තුන් දෙනෙක් වූහ යි චීන පොත්හි සඳහන් වේ. කිසාගෝතමී 'දණ්ඩපාණී ශාක්‍ය රජු ගේ දූ යැ යි ද, යශෝධරා මාහානාම ශාක්‍ය රජු ගේ දූ යැ යි ද චීන බෞධ ග්‍රන්ථ කාරක මතයි. එහෙත් ගෝපා භද්දකච්චානා මනොහරා බිම්බා සහ සියලු නම් යශෝධරා දේවීන් සඳහාම බැවහර වී යයි සමහර මහායාන පොතෙක දැක්වේ. නාඩි ග්‍රන්ථවල යශෝධරා පමණක් බෝසතාණන් ගේ දේවී වූ හ යි දැක්වේ. **ඇලෙක්සැන්ඩර් ක්සොමා** විසින් ටිබැට් බෞධ ග්‍රන්ථවලින් කරුණු ගෙන ලියූ ලියවිල්ලක ගෝපා, යශෝධරා. උත්පලවර්ණා යැ යි මෙහෙසියන් තිදෙනකුන් ගේ නම් ද මෙහි උත්පලවර්ණා යනු මෘගජා නම් කුමරිය

බව ද කියන ලදී* යශෝධරා රාහුල මාතා නමින් ද, බිම්බාදේවී නමින් ද භද්දකංචනා නමින් ද ප්‍රකට වූවා ය. **භද්දකංචනා** යනු **භද්දකච්චානා** යැ යි ව්‍යවහාරයේ දී වෙනස් ව ආ බව පෙනේ.

22. මෙය නාඩිග්‍රන්ථවලැ එන පුවතෙකි.

23. ජරාවේශාදියෙන් පෙනුණේ දිව්‍ය පුත්‍රයෙකැ යි ලලිත විස්තරයෙහිත් අර්ථ කථාහිත් දැක්වේ.

24. 'රාහුලො ජාතො' යන්නෙහි තේරුම නම් රාහු වැනි ග්‍රාහකයෙක් උපනි. රාහු ඉර සඳ අල්ලා ගන්නාක් මෙන් මා පැවිදි වීමට යැ නොදී අල්ලා ගන්නෙක්, ගිහිගෙයි මා නවත්වන්නෙක් පහළ වීය යනු සමහරුන්ගේ විවරණ යි. **වාසවදත්තා** යන්න පාළියෙහි **වාසලදත්තා** යි පෙනේ. මෙයින් **වාසව** යන්න **වාසුල** යැ යි වූ සේ ම **රාසව** යන්න **රාසුල රාහුල** යැ යි වීය යනු අප අදහසයි. එ විට රාහුල යනු රජු පරපුරෙ දරුවෙක් ය යන අරුත දෙයි. ශාක්‍ය රජහු රාසවයෝ යි.

25. **නිබ්බුතා නූන සා මාතා**
**නිබ්බුතා නූන සො පිතා**
**නිබ්බුතා නූන සා නාරී**
**යස්සායං ඊදිසො පති'**

මෝ තොම දණ්ඩපාණිශාක්‍ය රජුගේ දූ යැ යි චීන පොත් හි සඳහන් වේ. මෝ තොම **මෘගී** නම් වූ අනඳ තෙරුන්ගේ මෑණියෝ යැ යි මහා වස්තුයෙහි ද බෝසතුන් ගිහි ගෙන් නික්මෙන්නට සතියකින් පෙර බෝසතුන් ගේ මෙහෙසියක් වූ හැ යි ටිබැට් පොත්හි ද පෙනේ.

26. ශාක්‍යක්‍රෞඩ්‍ය (කෝලිය) මල්ල රාජ්‍යය ඉක්මවා මෛනෙය (මෙනක) යන් ගේ **අනුවෛනේය** නම් නිගමයට බෝසත් පසු ද පාන්දොර පැමිණි බව ද එය කපිලවාස්තුයෙහි සිට **යොදුන් සයක් දුර** පිහිටි බව ද එහි දී අසු පිටින් බැස **ඡන්දකයා** අසු හා පෙරළා එවූ බව ද පසුව එහි ඡන්දක නිවර්තන නම් චෛත්‍යයක් වූ බව ද **ලලිත විස්තරයෙහි** දැක්විණ.

27. බෝසතාණන් තමන් කැපූ හිසකේ වැටිය ගෙන 'මම බුදුවන්නෙම් නම් මෙය අහස රැඳෙවා'යි අධිෂ්ඨාන කොට අහසට විසි කළ කෙණෙහි සක් දෙව් රජ එය රන් කරඬුවෙකින් තවුතිසා භවනයට ගෙන ගිය බව ද ඉක්බිති එය නිදන් කොට **සිළුමිණි** සෑය කළ බව ද බෝසතාණන් හැන්ද කසී සළු දෙක ඝටීකාර බඹහු ගෙන ගොස් බඹලොව **සිළුමිණි සෑය** කළ බව ද අටුවාහි පෙනේ.

---

* Asiatic Researches XX. 380, 309.

28. ශුද්ධාවාසයෙහි දෙව් පුතකු වැද්දකු ගේ වේශයෙන් ශ්‍රමණ පරිෂ්කාර ගෙන එහි පැමිණි බව ද බෝසතාණන් එ පිරිකර ඔහුගෙන් ලබා ගත් බව ද **ලලිතවිස්තරයෙහි** පෙනේ.

29. බෝසතාණන් තාපස ප්‍රව්‍රජ්‍යායෙන් පැවිදි වීමේ දී සමාදන් කළේ **ආජීවාෂ්ටමක** ශීලය යි. ආජීවාෂ්ටමක ශීලය නම් ත්‍රිවිධ කාය දුශ්චරිතයෙන් ද චතුර්විධ වාග් දුශ්චරිතයෙන් ද **මිථ්‍යාජීවයෙන්** දැ යි මෙසේ මෙකී අට වැදෑරුම් වරදින් වැළැකීම සමාදන් කොට ගෙන රකිනා ශීලය යි. එහි ත්‍රිවිධ කාය දුශ්චරිත යන තන්හි කාම මිථ්‍යාචාරය වෙනුවට අබ්‍රහ්මචර්‍යාව හෙලා මේ තන්හි දී අතවී ගත යුතු යි.

30. **රජගහ** නුවර එකල මගධ රට ප්‍රධාන නගරය යි. එයට **ගිරිව්‍රජ** යන නමෙක් ද වී ය. **පාණ්ඩව, ගෘධ්‍රකූට, වෛභාර, වෛපුල්‍ය, ඍෂිගිරි** යන පර්වතවලින් වට ව (වැටෙකින් වට වූ) ගාලක් මෙන් පිහිටි හෙයින් **ගිරිව්‍රජ** යයි බැවහර වී ය.

30. **සෙනානි නිගමය** - මහාමන්ධාතු රජු ගේ සේනාපති සෙනානී නම් විය. එ රජ දිව්‍යලෝකයට ගොස් රජය කරවන කල්හි ඔහු ගේ සේනානිහු වුසූ ඒ ස්ථානය උපචාර වශයෙන් සෙනානි නම් වී ය. එයට සර්වදිශාභාගයෙන් ජනයා එළඹෙන්නෙන් නිගම නම් වී. **සෙනානි** නම් ගම්හි නායක කුටුම්බික සෙනානී නම් වී යැයි **මහාබෝධිවංශ** ගැටපදයේ සඳහන් වේ.

**ලලිතවිස්තරාදියෙහි** මෙයට **සෙනාපතිග්‍රාම** යැ යි කියන ලදී.

31. බෝසත් මළේ යැ යි සමහර දිව්‍ය පුත්‍රයෙක් ගොස් **තව්තිසායෙහි මහාමායා** දෙව්පුතුට දැන් වී ය. හේ දිව්‍යප්සරාවන් හා එහා බෝසත් වැටී හුන් තෙනට අවුත් බලා ඇසින් කඳුළු වගුරුවමින් මතු සඳහන් විලාප කියා හැඬී යැ යි **ලලිතවිස්තරයෙහි** පෙනේ.

> යද ජාතො'සි මෙ පුත්‍ර වනෙ ලුම්බිනිසාහ්වයෙ
> සිංහවච්චාග්‍රහීත් සත්වං ක්‍රාන්තඃ සප්තපදන් ස්වයම්.
>
> දිශශ්චාලොක්‍ය චතුරො වාචා ප්‍රව්‍යාහෘතා ශුභා
> ඉයංමේ පශ්චිමා ජාතිඃ සා තෙන පරිපූරිතා
>
> අසිතෙන සි නිර්දිෂ්ටො බුධො ලොකෙ භවිෂ්‍යති
> ක්ෂුණ්ණං ව්‍යාකරණං තස්‍ය න දෘෂ්ටං තෙන නිශ්චිතං.

චක්‍රවර්තිශ්‍රියං පුත්‍ර නපි හොක්තා මනොරමාම්
න ච බොධිමනුප්‍රාප්තො යාතො'සි නිධනං වනෙ.

පුත්‍රාපෙථි කං ප්‍රපද්‍යාමි කංච ක්‍රන්දමි දුඃඛිතා
කො මෙ දද්‍යෙක පුත්‍රස්‍ය කිංචිත් ප්‍රාණස්‍ය ජීවිතම්.

බෝසතාණෝ ප්‍රකෘති සිහිය ලැබ තමන් ඉදිරියෙහි හඬන්නාහු අසා කවුරු දැ?'යි ඇසූහ. එවිට මායා දෙව් පුත්,

'මයා තු දශමාසාන් වෛ
කුක්ෂෞ වජ්‍ර ඉවා ධෘතඃ
සා තෙ'හං පුත්‍රක මාතා
විලපාමි සුදුඃඛිතා'යි

ඉක්බිති බෝසත් දෙව්පුතු සනසා යැවී ය.

32. බෝසත් මුළු මනින් ම ආහාර පාන හළේ යැ යි ජාතක අටුවා ආදියෙහි සඳහන් වෙතත් කොල්ලු ආදි යමක් තම්බා ගත් දියෙන් යැපීමෙන් ආහාර අඩු කිරීම සීමා කළ බව මැදුම් සඟි අටුවා ආදියෙන් පෙනේ.

33. දිනා මිස නැත හොත් රණ බිමැ වැටී මැරෙතත් පසු නො බසින බවට ලකුණක් වශයෙන් මුදු තෘණ ගසක් හිස පැළැඳ යෑම දක්ෂ යෝධයන්ගේ සිරිතෙක් වී ය.

34. මෙහි වැටුණු හෝ බැස (නික්ම යෑ නොහී) ඉන්නා මහණ බමුණෝ දක්නා ලැබෙත් යනු **ලලිතවිස්තරානුගත** අපථ වාචනය යි.

ඵෂා හි නමුචෙඃ සෙනා
කෘෂ්ණබන්ධොඃ ප්‍රතාපිනඃ
අත්‍රාවගාඪා දෘශ්‍යන්තෙ
ඵකෙ ශ්‍රමණ බ්‍රාහ්මණාඃ (ලලිත විස්තරයෙහි)

35. **සතානුසාරිවිඥානං** - 'මෙ දුෂ්කර ක්‍රියාව බුඩත්වයට මග නො වේ ආනාපාන ධ්‍යානය නම් එයට මග ය'යි මෙ සේ වරක් දෙකක් උපන් සිහියට අනතුරුව උපන් සිත සතානුසාරිවිඥානං (ස්මෘත්‍යනුසාරිවිඥාන) නම්.

36. දුෂ්කර ක්‍රියා කරන බෝසත්හට **බලා, බලගුප්තා, සුප්‍රියා, විජයසේනා, අතිමුක්ත කමලා, සුන්දරී, කුම්භකාරී, උළුවිල්ලිකා, ජටිලිකා, සුජාතා** යන ග්‍රාමික දුහිතෘන් දස දෙන එම අවස්ථාවෙහි බොජුන් සාදා ගෙනවුත් පිළිගන්වමින් උපස්ථාන කළහයි **ලලිතවිස්තරයෙහි**

පෙනේ. තවද බෝසතාණන් ගේ යහපත පතා සුජාතාව එ ස වර්ෂයෙහි ම දින පතා බමුණන් 108 දෙනකුට දන් දී පින් අනුමෝදන් කළ බව ද මගේ භෝජන වළඳා බෝධිසත්ත්ව තෙමේ බුදු වේවා යි පතා සිටි බව ද **ලලිතවිස්තරයෙහි** ම දැක්වේ. දිනක් කෞපින මාත්‍ර වස්ත්‍ර කැබෙල්ලක් ලදෙත් මැනැවැ යි බෝසත් සිතී ලු,

එ සමයෙහි සුජාතාවගේ රාධා නම් දසියක මළ කල ඒ සිරුර රෙද්දක ඔතා අමු සොහොනෙහි දැමිණ. බෝසත් ඒ පාංශුකූල වස්ත්‍රය ගෙන දෙවියන් මැවූ පොකුණින් හෝ ද හැත්දේ යැ යි **ලලිතවිස්තරයෙහි** කියන ලදී.

37. මෙය කිමිදී නා ලොව ගිය බවත් නා රජහු එ මහින් කාරණය දැන නා සෙන් පිරිවරා බෝ මැඩ වෙත ආ බවත් අටුවාහි කියන ලදී.

38. සුජාතාව රන් තලිය පිටින් කිරිබත පිළිගැන්වූ විට 'නැහෙණියනි, මේ රන් තලියට කුමක් කරම්දැ'යි බෝසත් ඇසී. එය ඔබ වහන්සේට ම වේවා යි ඕ කීවාය. මෙ වැනි බඳුනෙකින් මට ප්‍රයෝජන නැතැ යි බෝසත් කී. 'කැමැත්තක් කරන සේක් වා'යි සුජාතා කී. ඉක්බිති බෝසත් ඒ පිණ්ඩ පාත්‍රය ගෙන නෙරඤ්ජරා නදිය වෙත ගොස් දෙවියන් විසින් ප්‍රක්ෂිප්ත ගන්ධ පුෂ්පයෙන් සුවඳ කැවුණු දියෙන් නා ගොඩ වුත් එහි වැසි නාග කන්‍යාවක ගෙනවුත් පිරිනැමූ මිණිමුවා පුටුයෙහි හිඳ දන් වළඳා රන් තලිය කෙරෙහි අපේක්ෂා රහිතව එය නදියට දැමී ය. එය සාගර නා රජු බහුමාන පෙරටුව ස්ව භවනයට ගෙන ගොස් පූජ්‍ය වස්තු කොට තැබී ය. සක්දෙව් එය දැන ගුරුළු වෙසින් එහි ගොස් ගන්නට උත්සාහ කොට නො හැකි ව ප්‍රකෘති වේශයෙන් සිට යාච්ඤා කොට ඉල්ලා ගෙන දෙව්ලෝ ගෙන ගොස් පිදී ය. බෝසතු හුන් මිණි පළඟ එ නාග කන්‍යාව පූජ්‍ය වස්තුවක් කොට පිදුවා ය. සුජාතා තොම දුෂ්කර ක්‍රියා සමයෙහි බෝසතු ගේ සිරුරෙන් ගිලිහුණු කේශ මශ්‍රැන් මඩගල වස්තු වශයෙන් ගෙන චෛත්‍යයක් කොට පිදුවා ය. මේ **ලලිත විස්තරාගත** ක්‍රමයයි.

39. **චිත්ත විශු නම්** - උපචාර සමාධි අර්පණා සමාධි දෙකින් සිත භාවනා අරමුණෙහි පිහිටුවා නීවරණයන් කෙරෙන් ශුධ කැරැ ගැනීම යි.

ස්වස්තික (සොත්ථිය) බමුණා, බමුණුවෙසින් ආ තැනැත්තේ සක්දෙව් යැ යි ශ්වාංජශ්වා - යාත්‍රා වාර්තාවේ සඳහන් වේ. ඔහු හමුවූයේ බෝරුකට දකුණින යැ යි එහි ම කියන ලදී.

**40. අපරාජිත පයඞ්කයෙන් චතුරංග වීයඞ්ය ඉටා වැඩ ඉඳීම.**

1. සම ගැලැවී විසිර ගියත් බුදු වී මිස මින් නො නැගිටිමි.
2. නහර ගැලැවී විසිර ගියත් බුදු වී මිස මින් නො නැගිටිමි.
3. ඇට ගැලැවී විසිර ගියත් බුදු වී මිස මින් නො නැගිටිමි.
4. මස් ලේ වියැලී ගියත් බුදු වී මිස මින් නො නැගිටිමි.

මෙසේ අංග සතරින් යුත් වීයඞ්ය චතුරංග වීයඞ් නම්.

41. ආසන - ආසන චනාහි ගණනින් අසුසාර ලක්ෂයකැ යි ද එයින් සුචාසුවක් මැනැවැ යි ද ඉනුත් දෙ තිසක් ම වඩා යෝග්‍ය යැ යි දක්වා ඒ ආසන දෙ තිසේ නම් ඝෙරණ්ඩසංහිතායෙහි මෙසේ දැක්වේ:

සිඬං පද්මංතථා භද්‍රං මුක්තං වජ්‍රඤ්ච ස්වස්තිකම්
සිංහඤ්ච ගොමුඛං වීරං ධනුරාසනමෙව ච

මෘතං ගුප්තං තථා මත්ස්‍යං මත්ස්‍යෙන්ද්‍රාසන මෙව ච
ගොරක්ෂං පශ්චිමොත්තානං උත්කටං සඞකටං තථා

මයූරං කුක්කුටං කූර්මං තථෛවොත්තාන කූර්මකම්
උත්තානමණ්ඩුකං වෘක්ෂං මණ්ඩුකම් ගරුඬං වෘෂම්

සලභං මකරං චොෂ්ට්‍රං භුජඞ්ගං යොගමාසනං
ද්වාත්‍රිංශදසනානං තු මර්ත්‍යලොකෙ හි සිඞ්දම්.

යෝගීනට සිඞ්දනය කරන ආසන දෙ තිස මින් කියැවේ.

| | |
|---|---|
| 1. සිඬාසන | 17. උත්කටාසන |
| 2. පද්මාසන | 18. සංකටාසන |
| 3. භද්‍රාසන | 19. මයූරාසන |
| 4. මුක්තාසන | 20. කුක්කුටාසන |
| 5. වජ්‍රාසන | 21. කූර්මාසන |
| 6. ස්වස්තිකාසන | 22. උත්තාන මණ්ඩුකාසන |
| 7. සිංහසන | 23. උත්තාන කූර්මකාසන |
| 8. ගෝමුඛාසන | 24. වෘක්ෂාසන |
| 9. වීරාසන | 25. මණ්ඩුකාසන |
| 10. ධනුරාසන | 26. ගරුඬාසන |
| 11. මෘතාසන | 27. වෘෂාසන |
| 12. ගුප්තාසන | 28. සලභාසන |
| 13. මත්ස්‍යාසන | 29. මකරාසන |
| 14. මත්ස්‍යෙන්ද්‍රාසන | 30. උෂ්ට්‍රාසන |
| 15. ගෝරක්ෂාසන | 31. භුජඞ්ගාසන |
| 16. පශ්චිමෝත්තානාසන | 32. යෝගාසන |

මෙයින් වජ්‍රාසන නම් :

ජඞ්ඝාභ්‍යඃ වජ්‍රවත් කෘත්වා ගුදපාර්ශ්වෙ පදවුභෞ
වජ්‍රාසනං භවෙදෙතත් යොගිනාම් සිඩ්දයකම්

කොංඩා දෙක වජ්‍ර (දියමන්ති) මෙන් දැඩිකොට දෙපතුල් ගුද මාර්ගය දෙ පස තැබීමෙන් මේ යෝගීනට සිද්ධි දයි වූ වජ්‍රාසනය වන්නේ යැ යි දක්වන ලදී. වජ්‍රාසනය යනු සිධාසනයට නමෙකැ යි ද හඨයෝගප්‍රදීපිකායෙහි කියන ලදී. සිධාසනය මෙහි දැක්වූ වජ්‍රාසනයට සමාන යි. ලක්දිව ඔත් පිළිමවල පෙනෙන බධපයඞ්ංකය යෝගශාස්ත්‍රයෙහි සුඛාසන නමින් දන්නා ලදී.

**42. විංශද්වස්තුක සත්කායදෘෂ්ටිය**

1-5 රූපාදී ස්කන්ධ පසින් එකක් ආත්ම යැ යි ගැනීම.

6-10 ඒ ආත්මය. රූපය,වේදනාව, සංඥාව සංස්කාර හෝ විඥානය ඇත්තෙකැ යි ගැනීම.

11- 15. රූපාදී පසින් යමක් කෙරහි ආත්මය පිහිටියේ යැ යි ගැනීම.

16- 20 ඒ ආත්මය කෙරෙහි රූප. වේදනා, සංස්කාර හෝ විඥානය පිහිටියේ යැ යි ගැනීම.

**43. සොළොස් වැදෑරුම් සැකය නම්:**

1. අතීත භවයෙහි වීම් ද?
2. අතීත භවයෙහි නො වීම් ද?
3. අතීත භවයෙහි කවරෙක් වීම් ද?
4. අතීත භවයෙහි කෙසේ වීම් ද?
5. අතීත භවයෙහි කවරෙක් ව කවරෙක් වීම් ද?
6. මතු භවයෙහි වන්නෙම්ද?
7. මතු භවයෙහි නො වන්නෙම් ද?
8. මතු භවයෙහි කවරෙක් වන්නෙම් ද?
9. මතු භවයෙහි කෙසේ වන්නෙම් ද?
10. මතු භවයෙහි කවරෙක් ව කවරෙක් වන්නෙම් ද?
11. දැන් වෙම් ද?
12. දැන් නො වෙම් ද?
13. දැන් කවරෙක් ව ඉඳිම් ද?
14. දැන් කෙබඳු ව ඉඳිම් ද?
15. කොයින් ආයෙම් ද?
16. කොහි යන්නෙම් ද?

මෙ සේ මේ සොළොස් තන්හි සැකය යි.

44. **සත්තානුදස්සනාවීථී:** මෙහි විස්තර විශුඩිමාර්ගයේ මග්ගාමග්ගදස්සන විසුඩි නිද්දේසයේ මුල් කොටසින් දත යුතු යි.

45. විසුඩි මාර්ගයේ මග්ගාමග්ගඤාණදස්සන විසුඩි නිද්දේසයෙන් විස්තර දත යුතු යි.

45. **උදයව්‍යය ඥානය :** උදය යනු හට ගැනීමයි. ව්‍යය යනු විනාශය යි. ස්කන්ධයන්ගේ පහළ වීමත් බිඳීමත් දැකීම උදය වය ඥාන (උදයබ්බය ඤාණ) නම්.

46. **භංගානුපස්සනා ඤාණය :** හට ගැනීම හැර භංග (බිඳීම්) මාත්‍රය දැකීම (බලන නුවණ) භංගානුදර්ශන ඥාන (භංගානුපස්සනා ඤාණ) නම්.

47. **භයතොපට්ඨාන ඤාණය :** භංග (බිඳීම්) වශයෙන් ඉදිරියෙහි පෙනි පෙනී සිටිනා ත්‍රෛභූමක ධර්මයන් භය වශයෙන් උවදුරු වශයෙන් දැකීම භයතො පට්ඨාන ඤාණ නම්.

48. **ආදීනවඤාණය :** භය වශයේ දුටු ත්‍රෛභූමක ධර්මයන් ගේ දෝෂ අගුණ දැකීම ආදීනව ඥාන (ආදීනව) ඤාණ නම්.

49. **මුච්චිතුකම්‍යතා ඤාණය :** දොස් දුටු ත්‍රෛභූමක ධර්මයන් කෙරේ කලකිරීමෙන් ඉන් මිදෙනු කැමතිව එය දැකුම මුච්චිතුකම්‍යතා ඤාණ නම්.

50. **පටිසංඛානුපස්සනා ඤාණ :** මිදෙන උපාය සම්පූර්ණ කරනු පිණිස යලි යලි සම්මර්ශනය කිරීම් වශයෙන් පවත්නා නුවණ පටිසංඛානුපස්සනා ඤාණ නම්.

51. **සංඛාරුපෙක්ඛා ඤාණය :** දොස් දුටු සංස්කාරයන් මධ්‍යස්ථ ව බලා ඉන්නාක් මෙන් පහළ වන නුවණ සංඛාරුපෙක්ඛා ඤාණ නම්.

52. මෙහි ශ්‍රඩා නම් චිත්තචෛතසිකයන්ගේ ඉතා පැදුණු බව යි.

53. **සච්චානුලෝමික ඤාණය :** සච්චානුලෝමික ඤාණය හෙවත් අනුලෝම ඥාන නම් අනිත්‍යාදි තිලකුණු විවිධාකාරයෙන් දැකීම් වශයෙන් යටැ පහළ වූ විදර්ශන ඥාන අටටත් මත්තෙහි මාර්ග චිත්තක්ෂණයෙහි ලැබිය යුතු බෝධි පාක්ෂික ධර්මයනටත් යන දෙ පක්ෂයට ම ගැළැපෙන පරිදි ගෝත්‍රභූඥානයට මුලින් ඇති වන පරිකර්ම උපචාර අනුලෝම යන තුන් කාමාවචර මහා කුසල සිත්හි

පහළ වන නුවණ යි. මෙයට සානුලොම විපස්සනා, සිඛාප්පත්ත විපස්සනා, සංඛාරුපෙක්ඛා විපස්සනා, උට්ඨානගාමිනි විපස්සනා යි ද කියති. දුඃඛානුදර්ශනය පටන්, කොට සත්‍යානුලෝම ඥානය තෙක් මේ නවය නව විදර්ශනඥාන නම්. මොහු පටිපදඥාණ දස්සන විසුඩියේ අවයවයෝ යි.

54. **ගෝත්‍රභූ ඥාණය** : පෘථග්ජන ගෝත්‍රය ඉක්මෙමින් ආර්‍ය්‍යගෝත්‍රයට පැමිණෙන සන්ධියෙහි (අනුලෝම ඥානයටත් සෝවාන් මාර්ග ඥානයටත් අතර) නිවන මුලින් ම දකිමින් පහළ වන ඥානය. මෙය අන්‍ය මාර්ගවලට මුලින් ද පහළ වෙතත් සෝවාන් මග හැර අන් සකෘදගාමී ආදී මාර්ගවලට මුලින් පහළ වීමේ දී **වෝදන** නමින් හඳුනනු ලැබේ.

55. **ඥාණදර්ශන විශුඩිය** : සොතාපත්ති ආදී සතර මාර්ග චිත්තයන්හි නුවණ ඥානදර්ශන විශුඩි නම්.

55. **සෝතාපත්තිමග්ග ඥාණය** : විපස්සනාව (අනිත්‍යාදි ලක්ෂණත්‍රය) දැකීම මුකුරුවා මාර්ග වීථියට පැමිණීම වශයෙන් පහළ වන සිත සෝතාපත්ති මග්ග චිත්ත නම්. මෙහි සෝත (ස්‍රෝතස්) නම් ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය යි. එයට බැසීම. මුලින් ම පැමිණීම - සෝතාපත්ති (ස්‍රෝතඅාපත්ති) නම්.

56. **සෝතාපත්ති ඵලය** : ස්‍රෝතආපත්ති මාර්ග චිත්තයාගේ විපාක සිත ස්‍රෝතආපත්ති ඵල නම්.

57. **මග්ගපච්චවෙක්ඛණ ඵලපච්චවෙක්ඛණ පහීණකිලෙසපච්චවෙක්ඛණ සෙස කිලෙසපච්චවෙක්ඛණ** : යනු ප්‍රත්‍යාවෙක්ෂාඥාන යි.

58. **සකදගාමී මග්ග ඥාණය** : යලිදු සම්මර්ශන ඥානයේ පටන් විවසුන් වඩා කලටත් වඩා නුවණ මුහුකුරුවා ලබන, දෘෂ්ටිගත විප්‍රයුක්ත සිත් සතෙරෙහිත් දෙම්නස් සහගත දෙ සිතෙහිත් දළ කාමරාග ව්‍යාපාදයන් දුබල කරන නුවණ යි. මේ නුවණ ලැබීමෙන් උත්පත්ති වශයෙන් එක් වරක් ම මෙ භවයට ඉයැ හැකි පුද්ගලයෙක් වේ. එයට වැඩියෙන් කාම භවයෙහි උපදවන තෘෂ්ණාවේගය ගෙවාලූ බැවිනි. එ බැවින් තව වරක් මෙහි එන තෙනැත්තේ ය. යන අපථි ඇති සකෘදගාමී යන නම ඒ ආර්‍ය්‍ය පුද්ගලයාට ව්‍යවහාර යි.

59. **අනාගාමී මග්ග ඤාණය** : පළමු සේම සංමර්ශන ඤානයේ පටන් විවසුන් වඩා නුවණ මුහුකුරුවා කාමරාග ව්‍යාපාදයන් අනවශේෂ ප්‍රහාණයෙන් නසමින් මතු කාම භවයට ඊමට අවකාශ නැති කෙරෙමින් පහළ වන මාර්ග චිත්තය. ආගාමී යනු එන තැනැත්තා යි. අනාගාමී යනු නො එන තැනැත්තා යි.

60. **ප්‍රත්‍යවේක්ෂණ ඤානය** : 'මෙ නම් මගින් මම් ආයෙමි' යි මාර්ගය ද, මෙ නම් ආනිසංසයන් ලදිමි'යි ඵලය ද , 'මෙ නම් නිවන පසක් කෙළෙමි'යි නිවන ද 'මෙ නම් කෙලෙසුන් නැසීමි'යි නැසූ කෙලෙසුන් ද, 'මෙ නම් කෙලෙස් ඉතිරිව ඇතැ'යි වධ්‍ය කෙලෙස් ද පිරික්සා බලන කාමාවචර ඤානය යි. මෙය සෝවාන් සකෘදගාමී අනාගාමී ඵලයනට පසු ව පහළ වන විට කාමාවචර මහා කුසල ජවන වශයෙන් ද, රහත් ඵල සිතට පසුව පහළ වන විට මහා ක්‍රියා ජවන වශයෙන් ද පහළ වේ.

61."**අනෙක ජාති සංසාරං**
**සන්ධාවිස්සං අනිබ්බිසං**
**ගහකාරකං ගවෙසන්තො**
**දුක්ඛා ජාති පුනප්පුනං**
**ගහකාරක දිට්ඨො'සි**
**පුනගෙහං න කාහසී**
**සබ්බා තෙ ඵාසුකා භග්ගා**
**ගහකූටං විසංඛිතං**
**විසංඛාරගතං චිත්තං**
**තණ්හානං ඛයමජ්ඣගා**"

**අනෙක ජාති සංසාරං** ආදි ගය ප්‍රථම ධර්ම දේශනා යැ යි **ධම්මපද අටුවා** හි ද "**යදා හවෙ පාතුභවන්ති ධම්මා**" ආදි ගය ප්‍රථම බුධ වචන යැ යි **අභිධර්ම අටුවා** හි ද කියන ලදී. මේ එකිනෙකට විරුධ මත දෙකක් මෙන් පෙනෙතත් පොත් දෙකේ ම කීම අන්‍යොන්‍ය ප්‍රතිවිරුධ නොවන බව කියන ලදී. 'අනේක ජාති' ආදී ගාථාව බුදු වී මුලින් ම සිතින් සිතූ දේශනා ව බැවින් **මනසා චින්තික දේශනා** වශයෙන් ප්‍රථම බුධ වචනය විය. "**යදා හවෙ**" ආදී ගාථාව කීම් වශයෙන් කළ දේශනාවලින් ප්‍රථම දේශනාව විය යනු අර්ථ කථාචාර්‍ය්‍ය මත යි.

62. මෙහි විමුක්ති සැප නම් අර්හත්ත්ව ඵල සමාපත්තිය යි.

63. **පටිච්චසමුප්පාදය** : අනුලෝම වශයෙන් මෙනෙහි කිරීම ය; මෙ නම් ධර්ම ස්වභාවය ඇති බැවින් මෙ නම් ඵලය ඇති වේ. එය ඇති බැවින් මෙ නම් ස්වභාවය වේ යැ යි මෙ සේ හේතුඵල පරම්පරාව හැදි හැදී යන සැටි මෙනෙහි කිරීම යි.

**පටිච්චසමුප්පාදය** ප්‍රතිලෝම වශයෙන් මෙනෙහි කිරීම නම්: මෙ නම් ධර්මයාගේ හටගැන්ම නැවැතීමෙන් (නො හටගැනීමෙන්) එ හෙයින් පහළ විය යුතු මෙ නම් ධර්මයා ගේ හට ගැන්මෙක් නොවේ යන ආදීන් හේතුව නිරුද්ධ වීමෙන් ඵලය නිරුද්ධ වන සැටි නුවණින් සැලැකීම යි.

**64. යදා හවෙ පාතුභවන්ති ධම්මා**
**ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස**
**අථස්ස කංඛා වපයන්ති සබ්බා**
**යතො පජානාති සහෙතු ධම්මං**

**65. යදා හවෙ පාතුභවන්ති ධම්මා**
**ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස**
**අථස්ස කංඛා වපයන්ති සබ්බා**
**යථො ඛයං පච්චයානං අවෙති.**

**66. යදා හවෙ පාතුභවන්ති ධම්මා**
**ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස**
**විධූපයං තිට්ඨති මාරසෙනං**
**සූරියො'ව ඔභාසයමන්තලික්ඛං**

මෙයට පසු තවත් ගාථා පහක් වදරන ලදැ යි මහා වස්තුයෙහි පෙනේ.

67. දෙවෙනි සතියෙහි අනිමිස ලෝචන පූජාව කළ බවත් එයින් සැකයට පත් දෙවියන් ගේ විමති දුරු කරනු පිණිස (**දෙ වෙනි සතියෙන් පසු**) අහස් නැඟ යමා මහ පෙළහර කොට බෝ පළඟටත් වැඩ සිටි තැනටත් අතර අහසින් බැස සතියක් සක්මන් කළ බවත් **අභිධර්ම** අටුවායෙහි පෙනේ.

බුදු වී බෝ මුළ සතියක් උන් බැවින් තවමත් බුදු නොවී දෝ යි සැකයට පත් ඇතැම් දේවතාවන්ගේ විමති දුරු කරනු පිණිස **අටවනදා** සමවතින් නැගිට අහස් නැඟ යමා මහ පෙළහර කොට බෝ පළඟට විකක් ඊසාන දිග සිට අනිමිස ලෝචන පූජාව දෙ වෙනි සතියෙහි කළ බව ද තෙ වෙනි සතියෙහි සක්මන් කළ බව ද **විනය (මහාවග්ග)** අටුවායෙහි දැක්වේ.

ජිනාලංකාර ටීකායෙහි මහාවග අටුවාවට සම යි. දෙ වෙනි සතියෙහි චංක්‍රමණය ද තෙ වෙනි සතියෙහි අනිමිස ලෝචනය ද සතර වන සතියෙහි සක්මනෙහි යෙදී සිටින විට මරු අවුත් පිරිනිවනට අයැදූ බව ද **ලලිතවිස්තර** යෙහි පෙනේ.

68. අභිධර්ම සප්තප්‍රකරණ නැමැති රුවන් විමසා බැලූ ස්ථානය බැවින් **රුවන් ගේ** යැ යි කී බවත් රුවනකින් නිමා ලූ බවක් නිසා එසේ නො කියන ලද බවත්, අභිධර්ම අටුවායෙහි පෙනේ. මෙය බෝ මැඩට පශ්චිම දිගැ දෙවියන් මවාලූ රත්න ගෘහයක් මැ යැ යි විනය (මහාවග්ග) අටුවායෙහි දැක්වේ.

69. මෙයින් පෙර තෙ සතියේ බුධ ශරීරයෙන් ෂඩ්වර්ණ රශ්මිහු නො නික්මියහ.

70. "යො බ්‍රාම්හණො බාහිතපාපධම්මො
නිහුංකකො නික්කසාවො යතත්තො
ධම්මෙන සො බ්‍රම්හවාදං වදෙය්‍ය
යස්සුස්සදා නත්ථි කුහිංචි ලොකෙ"

(විනය මහාවග්ග)

කිසි පාලි පොතෙක **නිහුංක** ජාතික යැ යි ද කිසිවෙක හුහුංක ජාතික යැ යි ද දැක් වේ. මාන වශයෙන් අන්හට හුං හුං යැයි හෙලා දකින බමුණෙකැයි අටුවාවේ සඳහන් වේ.

**න්‍යූංඛජාතික** බ්‍රාහ්මණ යනු ශාම වේදාංග වූ ෂට්ප්‍රණව මන්ත්‍රයන් හදාරන බමුණාට වෛදිකයන් ව්‍යාවහාර කරන නාමයෙකි.

71. තපො කම්මා අපක්කම්ම යෙ න සුජ්ඣන්ති මානවා
අසුධො මඤ්ඤසි සුධො සුඩිමග්ගමපරධො

72. අනත්ථසංහිතං ඤත්වා යං කිංචි අමරං තපං
සබබානත්ථවහං හොති පියා රිත්තංච වම්මනි
සීලං සමාධිං පඤ්ඤඤ්ච මග්ගං බොධාය භාවයං
පත්තෝස්මි පරමං සුඩිං නිහතොත්වමසි අන්තක

73. සංසරං දීඝමධානං වණ්ණං කත්වා සුභාසුභං
අලං තෙ තෙන පාපිම නිහතො ත්වමයි අන්තක

74. යෙ ච කායෙන වාචාය මනසා ච සුසංවුතා
න තෙ මාර වසානුගා නතෙ මාරස්ස පච්චගූං

75. පස් වන සතියේ දී මාර දූන් ආ ප්‍රවෘත්තිය ජාතක අටුවා ආදියෙහි පෙනේ. මෙය පස්වන සතියෙහි නො වන බවත් බුධත්වයෙන් වර්ෂයක් ඉක්මැ ගිය පසු වූවක් බවත් සංයුත් සඟියේ මාර සංයුත්තකයේ පෙළ අටුවා සසඳා බැලීමේදී පෙනේ. මෙ සේ ම ජිනාලංකාර ටීකායෙහිත් පෙනේ. විමසා, ගත යුත්තක් ගනිත්වා.

ඒ ප්‍රවෘත්තිය එයින් ගෙන මෙහි බහා ලමු.

**මරහුගේ ශෝකය මාර දූන් ගේ උත්සාහයක්**

නැවැත දිනක් මාර තෙම භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියේ ය. එහිදී මරහුගේත් බුදුරජාණන් වහන්සේගේත් පහත දැක්වෙන දෙ බස විය.

**මාර:** 'ශෝකයට බැස ගත්තෙක් ව වෙනෙහි සිතිවිලි සිතයි ද? වස්තු සියයෙකින් හෝ දහසෙකින් පැරදුණෙහිද? නො හොත් අන් යමක් පතමින් ඉන්නෙහිද? වෙනෙහි හැසිරෙන්නේ කිමෙක? ගමෙහි අනුන් මුහුන දැක්මටත් නො හැකි තරම් බර පතළ අපරාධයක් වත් කෙළෙහි ද? ජනයා හා මිත්‍ර බවක් ඇස් හමු බවක් නො කරන්නේ මන් ද?.

**බුදුරජ:** 'ශෝකයේ සියලු මුල් උදුරා නිර්දොෂව ඒ හෙයින් ශෝක නො කරමින් ධ්‍යාන කරමි. ප්‍රමත්තයන් ගේ මිතුර, සියලු තෘෂ්ණාව සිඳ, තෘෂ්ණා රහිතයෙක් ව, ධ්‍යානයෙහි යෙදී හිඳිමි.

**මාර:** 'තමන්ට අයිති යැ යි කියනු ලබන දෑ කෙරෙහිත් එසේ කියන්නන් කෙරෙහිත් යුෂ්මත්හු ගේ සිතෙක් වේ නම්, ශ්‍රමණය, ඒ යුෂ්මතා මගෙන් නො මිදුණෙහි ය.

**බුදුරජ:** 'යමක් ගැන සත්ත්වයෝ මෙය මා ගේ යැ යි කියත් ද, එය මගේ නො වේ, යම් කෙනෙක් එ සේ කියත් ද, මම ඒ කිසිවෙක් නො වෙමි.'

'පාපි පුද්ගලය, යුෂ්මතා මා ගිය මඟ වත් නො දන්නෙහි ය.'

**මාර:** 'ඉදින් ඔබ අමෘතගාමී ක්ෂෙම මාර්ගය අවබෝධ කෙළෝ නම් ඔබ මින් දුරු වුව මැන. හුදෙකලාව තමන් ම වැඩිය මැනැව. අන්හට කුමන අනුශාසන කෙරෙත් ද?'

බුදුරජ: '(සසරින් පර තෙර යනු කැමැත්තෝ මරහට ඉඩක් නැති තෙන (නිවන) මා විචාරන්නාහ, එ සේ විචාරනු ලැබූ මම් ඔවුනට සියලු ස්කන්ධ සන්තතිය ගේ කෙළවර වූ උපදි රහිත සැපය (නිවන) ප්‍රකාශ කරන්නෙමි.

මාර: 'වහන්ස, ගමක් හෝ නිගමයක් අසල පොකුණක් වේ නම්. එහි කකුළුවෙක් වෙසේ නම්, ඒ ගමින් හෝ නිගමයෙන් බොහෝ ගැහැනු පිරිමි ළමෝ නික්ම යථෝක්ත පොකුණ වෙත අවුත්, එ කකුළුවා දියෙන් ගෙන ගොඩ තබන්නෝ ද, එ විට ඉදින් කකුළුවා අඬු විදහතොත් එ කල ඔහු දඬු කැට කැබිලිතිවලින් ගසා ඒවා සිඳ බිඳින්නෝය. එසේ කලැ කකුළු තෙම සිඳුණු බිඳුණු සියලු අඬු ඇත්තේ එ පොකුණට පෙර සේ යලිත් බැසීමට යම් සේ අපොහොසත් ද, එසේම, වහන්ස, මා කළ සියලු අවුල්, සියලු විරුද්ධ කම්, සියලු පෙරළි භාග්‍යවතුන් වහන්සේ විසින් සිඳින බිඳින ලදී. සුණු විසුණු කරණ ලදී. වහන්ස, මින්පසු ඒ මම් සිදුරු සොයන අදහසින් භාග්‍යවතුන් වහන්සේ කරා එන්නට නො පොහොනෙමි'.

'කවුඩෙක් මේද තෙලට සම පැහැ ගලක් දැක, මෙහි මෘදු යමක් රසවත් යමක් ඇතැයි සිතා එහි වටා ඇවිද, එහිදු කිසිත් නො ලැබ, කඩ වූ බලාපොරොත්තු ඇතිව, යම් සේ ඉන් ඉගිලී යාද, අපිත් එ කවුඩා මෙන් ගෞතමයන් වහන්සේ නැමැති පර්වතය කරා අවුත් සිදුරු සෙවීම් සංඛ්‍යාත බලාපොරොත්තු කඩවී යෑමෙන් ආස්වාද මාත්‍රයක් නො ලැබ කළකිරීමට පත්ව උන්වහන්සේ හැර යම්හ'.

මාර තෙම මෙ සේ තමාගේ බලාපොරොත්තු කඩ වූ සැටි කියා එ තැනින් නික්ම ගොස් භාග්‍යවතුන් වහන්සේ උන් තෙනට නො දුරෙන් බිම පළක් බැඳ තුෂ්ණිම්භූත ව තෙද රහිත ව කරබා ගෙන, බිම බලාගත් වන ම සිතිවිල්ලෙහි යෙදී කිසිත් නො වට හා ගත හැකි ව කෝටු කැබෙල්ලකින් බිම ඉරි අඳිමින් උන්නේ ය.

'පියාණෝ දක්නට නැත්තෝ කොහි ගියෝ දැ' යි සොයන මාර දූහිතෘහු ඔහු බිමැ ඉරි අඳිමින් එහි දුර්මුඛ ව උන්නහු දැක වෙත පැමිණ,

'පියාණනි, ඔබ මොන කරුණෙකින් දොම්නස් කෙරෙත් ද? කවරකු ගැන සිතත් ද? යමකු ගැන ශෝක කෙරෙත් නම්, ඇතින්නක වෙතෙහි ඇතකු මෙන් අපි ඔහු රාග පාශයෙන් බැඳගෙන එන්නම්හ. හේ ඔබට වශග වන්නේ' යැ යි කීහ.

එ විට මාර තෙම ඔවුන් අමතා, ˊලොව අර්හත් වූ සුගත තෙමේ කිසිවකු විසිනුත් රාගයෙන් බැඳ ගෙනා හැකි නොවේ. හෙ තෙමේ මරු ගේ විෂය ඉක්මී ය. එ බැවින් බෙහෙවින් තැවෙමි,ˊයි කී ය.

එ කල **තෘෂ්ණා**, අරති, රගා නම් එ මාර දූහිතෘහු තිදෙන භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් ˊශ්‍රමණයන් වහන්ස, අප ඔබ ගේ පාදපරිචාරිකා වම්හˊ යි කීහ. භාග්‍යවතුන් වහන්සේ ඒ කිසිත් නො තකා නො මෙනෙහි කොට තුෂ්ණීම්භූත ව හුන් සේක.

එවිට උහු තිදෙන පුරුෂයන් ගේ අදහස් නන් අයුරු ය. අපි එකි එකියක් කුමාරිකා වේශ සියයක් බැගින් ගෙන එම්හ යි සිතූහ. සිතා එසේම කොට ගෙන අවුත් වහන්ස, ඔබ ගේ පාදපරිචාරිකා වම්හˊ යි කීහ. භාග්‍යවතුන් වහන්සේ එය නො තකා තුෂ්ණීම්භූත ව හුන් සේකි. එ විටැ ඔහු පුරුෂයන් සරණ ගිය නමුත් දරුවන් නො ලත් තරුණ ස්ත්‍රීන්ගේ වේශ සියය බැගින් ගෙන පළමු පරිදි ම අවුත් පාදපරිචාරිකා භාවය යැදූහ.

භාග්‍යවතුන් වහන්සේ එයට ද තුෂ්ණීම් ව ඒ නො තකා හිඳිනු දැක, ඔහු වරක් දෙවරක් දරුවන් වැදූ ස්ත්‍රීන්ගේ ද මැදුම් වයසට පත් ස්ත්‍රීන්ගේද, මැදුම් වයස ඉක්මි ස්ත්‍රීන්ගේ දැ යි පිළිවෙළින් එකියක් සියය බැගින් අත් බව් මවා ගෙන භාග්‍යවතුන් වහන්සේ වෙත අවුත් පාද පරිචාරිකා භාවය යැදූහ. ඒ කිසිත් නො තකා භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම් ව හුන් සේකි. එ දුටු මාර දූහිතෘහු පැත්තකට ගොස් සිය පියාණන් කී බස සැබෑ ම යැ යි කීහ.

ඉක්බිති මාර දූහිතෘහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ පහත සඳහන් ද කීහ. භාග්‍යවතුන් වහන්සේ ද පහත දැක්වෙන පිළිතුරු වදාළ සේක.

**තෘෂ්ණා:** ˊශෝකයට පත් ව වෙනෙහි සිතිවිලි සිතත් ද? සියයෙකින් හෝ දහසෙකින් පැරැදුනෝද, නොහොත් අන් යමක් පතන්නෝද? අනුන් මුහුණ දක්නටත් නොහැකි වන තරම් බරපතල අපරාධයක් මිනිස් පියෙහිදී කොළෝ වත්ද? ජනයා හා ඇස් හමු බවත් කුමක් හෙයින් නො කෙරෙත්ද? ජනයා හා ඔබ ඇස් හමු බවත් (මිත්‍රත්වයක්) නො සිතත්ද?

**බුදුරජ:** මම හුදෙකලාව ධ්‍යාන කරමින් ප්‍රිය සුබ ස්වරූප වූ (ක්ලේශ) සේනාව නසා, හිතාර්ථ ප්‍රාප්තිය හෘදය ශාන්තිය වූ රහත් සුවය අවබෝධ ප්‍රතිවේධ කෙළෙමි. එ හෙයින් ජනයා හා මිත්‍ර සංස්තවය නො කරමි. එ හෙයින් කිසිවකු හා මගේ මිත්‍ර සංස්තවයෙක් නො සැපැයේ.

**අරති:** මෙහි කවර නම් විහරණයකින් බෙහෙවින් වසන සුලු භික්ෂුවක් පඤ්චද්වාරික කෙලෙස් මහ වතුරෙන් එතෙර වූයේ ස වන මනෝද්වාරික කෙලෙස් මහ වතුරෙන් එතෙර වීද? කාම සංඥාවෝ කවර නම් ධ්‍යානයක් බහුල කොට ඇති ඒ පුහුලකු නො ලැබ හාත්පසින් බැහැර වෙත්ද?

**බුදුරජ:** (චතුර්ථ ධ්‍යානයෙන්) සංහිඳුණු කය ඇති (අර්හත්ත්ව ඵල විමුක්ති යෙන්) මොනවට මිදුණු සිත් ඇති පුණ්‍යාභි සංස්කාරාදීන් අභිසංස්කරණය නොකරන, සිහි ඇති උතුම් පුද්ගලයා චතුස්සත්‍යය දැන, විතර්ක රහිත (චතුර්ථධ්‍යානයෙන්) ධ්‍යාන කරන සුලු වූයේ ද්වේෂ වශයෙන් නො කිපේ. ඔහුට රාගයෙක්ද ස්ත්‍යානාදියෙක් ද නැත. ස්ත්‍යානමිද්ධාදි සෙසු නීවරණ රහිත වූයේ සියලු කෙලෙස් නැසීමෙන් රහතෙක් වේ.

මේ සස්නෙහි මෙසේ බෙහෙවින් වසන සුලු භික්ෂු තෙම පංචද්වාරික ක්ලෙශෞඝය (පංචෝරම්භාගිය සංයෝජන) තරණය කොට සවන මනෝද්වාරික ක්ලෙශෞඝය (පංචුද්ධම්භාගිය සංයෝජන) ද තරණය කෙළේ ය. කාම සංඥාවෝ මෙ සේ ධ්‍යාන කරන සුලු වූ ඒ ධ්‍යාන බහුල කොට ඇති, උතුම් පුගුලා කාම පාශයෙන් ගන්නට නො ලැබ, ඔහු කෙරෙන් හාත්පසින් බැහැර වෙත්.'

**රගා :** 'අහෝ! මේ ගණසංගචාරී තෙම තෘෂ්ණාව සින්දේ ය. ශ්‍රද්ධා ඇති අන් බොහෝ ජනයෝ ද මුන් වහන්සේ අනුගමනය කොට කෙලෙස් මහ වතුර තරණය කරන්නෝය. තිරාලය වූ මේ තෙම මෘත්‍යුරාජයා ගේ අතින් බොහෝ දෙන පැහැර ගෙන පරතෙරට (නිවනට) පමුණුවන්නේය. ඛේදයකි !

**බුදුරජ:** 'මහා වීර වූ තථාගතවරු වූ කලී සද්ධර්මය කරණ කොට ගෙන ජනයා (නිර්වාණ පරතෙරට) පමුණුවත්මය. චතුස්සත්‍යය දන්නා මනා ධර්මයෙන් ජනයන් (නිර්වාණ පුරයට) පමුණුවන්නාට කවර දොස් නැඟීමෙක් ද?'

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ කල්හි මාර දූහු තිදෙන මරු කරා ගියහ. එන උන් දුර දීම දැක,

'අන්ධ බාල ස්ත්‍රීනි, කුමුදු නළවලින් පර්වතයක් මථනය කරවුද? පර්වතයක් සාරවුද? දතින් යකඩ විකන්නහුද? මහ ගලක් හිසෙහි තබා පාතාලයෙහි පිහිට සොයන්නවුන් සේ වහු ය. ළයෙහි කණුවක් පැහැර මෙන් (ගිය කරුණෙහි) කලකිරී ගෞතමයන් වහන්සේ කෙරෙන් පහ ව එවුදැ?' ල කීය. මෙසේ කියා. දූන් කැටුව සිය භවනයට ම ගියේය.

76. සුඛො විවෙකො තුට්ඨස්ස
සුත ධම්මස්ස පස්සතො
අබ්‍යාපජ්ජං සුඛං ලොකෙ
පාණ භූතෙසු සංයමො
සුඛා විරාගතා ලොකෙ
කාමානං සමතික්කමො
අස්මි මානස්ස යො විනයො
ඒතං වෙ පරමං සුඛං

මෙහි අන්තිම දෙපදය:

අස්මින් මාත්‍රුෂ්‍යාවිෂයෙ
ඒතද් වෛ පරමං සුඛම් යැ'යි

**ලලිත විස්තරයෙහිද මහා වස්තුයෙහිද** පෙනේ.

77. තපස්සු භල්ලික දෙදෙන පුෂ්කරවතී නුවර ශාර්ථවාහකයකු ගේ පුත්තු යැයි ද ඔවුන් පන්සියයක් පමණ ගැලින් වෙළෙඳාම් යන විට බුදු වීමෙන් අට වන සතියෙහි කිරිපලු රුක මුල බුදුරජාණන් වහන්සේ වැඩ ඉන්නා සමීපයෙන් යන්නට ආ බවද, එහි වියැලි බිමෙහි ගැල් පැද්ද විය නො හැකිව කරුණු කිම් දැයි සිතා බලන ඔවුනට පෙර අත් බැවේ නෑයකු වූ දේවතාවක රුක් වෙළෙප් අතුරේ පෙනී සිට බුදුරජාණන් වහන්සේගේ තොරතුරු කියා උන් වහන්සේට ආහාරයෙන් සංග්‍රහ කරන ලෙස දැන් වූ බවද **පරමත්ත දීපනියෙහි** කියන ලදී. මෙයට මඳක් වෙනස් ලෙස, ඒ වෙළෙඳ දෙබෑයන් **අසිතංජන** නුවර කෙළෙඹි ගේක උපන් බවද ඉහත සඳහන් පරිදි ඔවුන් බුදුරජාණන් වහන්සේ වැඩ ඉන්නා සමීපයෙන් යන විට එක් දේවතාවක්හු ගොනුනට ගැල් ඇද යෑ නොහැකි සේ සැලැස්සූ බව ද ඔවුන් ගැල් ගෙන යෑ නොහැකිව කරදරන දුටු දේවතාවා එ පිරිසේ එක් පුරුෂයකුට ආවිෂ්ට වී අතීත ආත්මයෙහි තමා ඔවුන් ගේ මවු බව කියා භාග්‍යවතුන් වහන්සේ ගේ තොරතුරු ද දන්වා දන් දීමෙහි ඔවුන් මෙහෙයූ බව ද **මනෝරථ පූරණියෙහි** කියන ලදී.

78. බුදු රජාණන් වහන්සේ බරණැසට වැඩ දම්සක් පවත්වා පිළිවෙළින් රජගහපුර වැඩ එහි වසන සමයෙහි **තපුස්ස භල්ලික** දෙදෙනා එහි අවුත් භාග්‍යවතුන් වහන්සේ වැඳ පසෙක උන්හ. ඔවුනට බුදුරජාණන් වහන්සේ දම් දෙසූ සේක. තපුස්ස තෙම සෝවාන් ඵලයෙහි පිහිටා උපාසකයෙක්ම වූයේ ය. භල්ලික තෙම පැවිදි ව රහත් වූයේ ය.

79. කිච්ඡෙන මේ අධිගතං හලං දානිපකාසිතුං
රාගදොසපරෙතෙහි නායං ධම්මො සුසම්බුධො
පටිසොතගාමිං නිපුනං ගම්භිරං දුද්දසං අණුං
රාගරත්තා න දක්ඛින්ති තමොක්ඛන්ධෙන ආවුතා

80. පාතුරසො සි මගධෙසු පුබ්බෙ
ධම්මො අසුද්ධො සමලෙහි චින්තිතො
අවාපුරෙතං අමතස්ස ද්වාරං
සුණන්තු ධම්මං විමලෙනානුබුඩං

සෙලෙ යථා පබ්බත මුඩනිට්ඨිතො
යථා පි පස්සෙ ජනතං සමන්තතො
තථූපමං ධම්ම මයං සුමෙධ
පාසාදමාරුය්හ සමන්තචක්ඛු

සොකාවතිණ්ණං ජනතමපෙතසොකො
අවෙක්ඛස්සු ජාති ජරාභිභූතං
උට්ඨෙහි වීර, විජිතසංගාම,
සත්ථවාහ, අනණ, විචර ලොකෙ

දෙසස්සු භගවා ධම්මං
අඤ්ඤාතාරො භවිස්සන්ති.

මෙහි බුදුරජාණන් වහන්සේ ලොව පහළ වීමට සමීප කාලයෙහි (උන්වහන්සේ පහළ වීමට පෙර) **පූරණ කස්සප, නිගණ්ඨනාත පුත්ත, මක්ඛලිගෝසාල, අජිතකේසකම්බල, කකුධකච්චාන, සංජය බෙල්ලට්ටි පුත්ත**, යන තීර්ථකයෝ සදෙනා මගධ රටෙහි පහළ වූහ. ඔවුන් නිපැද වූ **ධර්ම** පැතිර පවත්නා සමයෙහි භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සේක. එ බැවින් කෙළෙස් සහිත පුද්ගලයන් විසින් සිතන ලද ධර්මයෙක් පෙර මගධ රට පහළවී යැයි කියන ලදී.

81. මේ සතර පුද්ගලයෝ **උග්ඝටිතඤ්ඤු, විපංචිතඤ්ඤු, නෙය්‍ය, පද පරම** නමින් දන්නා ලදහ.

82. අපාරුතා තෙසං අමතස්ස ද්වාරා
යෙ සොතවන්තො පමුංචන්තු සඬං
විහිංසසඤ්ඤී පගුණං න භාසි
ධම්මං පණීතං මනුජේසු බ්‍රම්හෙ.

83. බුදුරජාණන් වහන්සේ ගේ අදහස් දත් දෙවියෙක්ද ආළාර උද්‍රක දෙදෙන මළ බව උන්වහන්සේට දැන්වී. ඒ දැන්වූයේ බුදුරජාණන් වහන්සේ කාරණය සිය නුවණින් බලා දැන ගත් කෙනෙහි මැයි. පළමු කොට බැලුයේ උද්‍රකරාම පුත්‍රයා ගැන යැයි ද ඔහු මැරී දින 7 ක් වී යැයි ද ඉක්බිති ආළාර ගැන බැලූ බවද ඔහු මැරී දින 5 ක් වී යැයිද ය්වංජ්ශ්වාන් ගමන් වාර්තායෙහි සඳහන් වේ. උද්‍රකාරාම පුත්‍ර මැරී සතියෙකැයි ද ආළාර කාලාම මැරී දින තුනක් වී යැයිද **ලලිත විස්තරයෙහි** සඳහන් වේ.

84. බෝ මැඩටත් ගයාවටත් අතර තුන් ගව්වක් ඇතුළත දී හමු වූ බව පපංචසුදනී පාසරාසි සූත්‍ර අටුවායෙන් පෙනේ. **උපක ආජීවකයා** වංගහාර ජනපදයට ගොස් එහි වැදි ගමෙක, තමා අර්ධපාල නම් රහත් කෙනෙකැයි හඟවා කලක් වැස ඉක්බිති ඔවුන් කෙරේ කලකිරී බුදුරජාණන් වහන්සේ ජේතවනයෙහි වසන කල එහි ගොස් පැවිදිව විදසුන් වඩා අනාගාමි විය.

85. බුදුරජාණන් වහන්සේගේ පිළිතුර:

**සබ්බාභිභූ සබ්බ විදූහමස්මි**
**සබ්බෙසු ධම්මේසු අනූපලිත්තෝ**
**සබ්බඤ්ජහො තණ්හක්ඛයෙ විමුත්තො**
**සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං**
**න මෙ ආචාරියො අත්ථි සදිසො මෙ න විජ්ජති**
**සදෙවකස්මිං ලොකස්මිං නත්ථි මෙ පටිපුග්ගලො**
**අහං හි අරහා ලොකෙ අහං සත්ථා අනුත්තරො**
**එකො'ම්හි සම්මා සම්බුධෝ සීතිභූතො'ස්මි නිබ්බුතො**
**ධම්මචක්කං පවත්තෙතුං ගච්ඡාමි කාසිනං පුරං**
**අන්ධභූතස්මිං ලොකස්මිං ආහඤ්ජං අමතදුන්දුභිං**

**මාදිසා වෙ ජිනා හොන්ති**
**යෙ පත්තා ආසවක්ඛයං**
**ජිතා මෙ පාපකා ධම්මා**
**තස්මා හං උපකා ජිනො.** (විනය මහාවග්ග)

මෙය **ලලිත විස්තරයෙහි** තිබෙන සැටි මෙසේයි:

ආචායෙ‍්‍යා න හි මෙ කශ්චිත් සදෘශො මෙ න විද්‍යතෙ
එකො'හ්‍යමස්මි සම්බුධශ්ශීතිභූතො නිරාශ්‍රවං

සො (උපකාජීවකො) වොචත්;

අංර්හන්ඛලු ගෞතමාත්මානං ප්‍රතිජානිෂෙ?
තථාගතො' වොචත්;

අහමෙවාර්හන් ලොකෙ ශාස්තා හ්‍යහමනුත්තරඃ
සදෙවාසුරගන්ධර්වෙ නාස්ති මෙ ප්‍රතිපුද්ගලඃ

සො, වොචත්;

ජිනං ඛලු ගෞතමාත්තමානං ප්‍රතිජානිෂෙ?

තථාගතො' වොචත්:

ජිනා හි මාදෘශා ඥෙයාමෙ ප්‍රාප්තා ආස්‍රවක්ෂයම්
ජිතා මෙ පාපකා ධර්මාස්තෙනොපක ජිනො හ්‍යහම්

සො' වොචත්;

ක්ව තර්හ්‍යායුෂ්මන් ගොෟතම, ගමිෂ්‍යයි?

තථාගතො' වොචත්,

බාරාණසිං ගමිෂ්‍යාමි ගත්වා වෛකාශිනං පුරීම්
අන්ධභූතස්‍ය ලොකස්‍ය කර්තාස්ම්‍යසදෘශාං ප්‍රභාම්
බාරාණසීං ගමි.........................................................
ශබ්දහීනස්‍ය ලොකස්‍ය තාඩයිෂෙ' මෘත දුන්දුභිං
බාරාණසිං ගමි.........................................................
ධර්මචක්‍රං ප්‍රවර්ත්තිෂ්‍යෙ ලොකෙෂ්වප්‍රවර්ත්‍යකම්

තද්භවිෂ්‍යසි ගෞතම ඉත්‍යුක්ත්වා ස ආජීවකො දක්ෂිණමුඛඃ ප්‍රාක්‍රාමත් තථාගතො' ප්‍යුත්තරමුඛඃ ප්‍රාක්‍රාමත්.

ඔහු ගියේ **වංගහාර** ජනපදයට යි. මෙය බෙංගාලයේ පිටිසර පළාතකි.

86. 'ඇවැත්නි' (ආවුසො) යනු වර්තමානයේ 'ඕයි' යන්නට සමාන යි.

87. අඩ්ග අට **ශීල**, **සමාධි**, ප්‍රඥා යන ගුණ තුනෙහි ඇතුළත් වේ. මෙසේ යි :

**ශීල** {
සම්මා වාචා
සම්මා කම්මන්ත
සම්මා ආජීව

**සමාධි** {
සම්මා වායාම
සම්මා සති
සම්මා සමාධි

**ප්‍රඥා** {
සම්මා දිට්ඨි
සම්මා සංකප්ප

88. **දුඃඛ සත්‍යය :** ලෞකික සිත් 81 ද, ලෝභය හැර ඉතිරි චෛතසික 51 ද, අට විසි රූපය ද යන මොහු දුක **(දුඃඛ සත්‍යය)** නම්.

89. ලෝභ චෛතසිකය (තෘෂ්ණාව) දුකට හේතුව, **(දුඃඛ සමුදය සත්‍ය)** නම්.

90. ඒ දුඃඛ සමුදය දෙකින් මිදීමට කාරණ වූ නිවන **(දුඃඛ නිරොධ සත්‍ය)** නම්.

91. එයට උපාය වූ අංග අට **මාර්ග සත්‍ය** නම්.

92. මේ දුකය, මේ දුක් හේතුව ය, මේ දුඃඛ නිරෝධ ය, මේ එයට මාර්ග යැ යි මෙසේ සත්‍ය සතර තත්ත්වාකාරයෙන් දැනීම සත්‍යඥාන නම්.

93. ඉන් `දුක බෙද විභාග කොට දත යුතු යි. දුඃඛ සමුදය (තෘෂ්ණාව) ප්‍රහීණ කළ යුතු ය. දුඃඛ නිරෝධය (නිවන) තමා ගේ ම නුවණින් දැක්ක යුතු ය. ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය වැඩිය යුතු ය`යි මෙසේ සතර සත්‍යයන් විෂයයෙහි කළ යුත්ත (කෘත්‍යය) දන්නා නුවණ **කෘත්‍යඥාන** නම්.

94. එ කෘත්‍ය කළ බව දන්නා නුවණ **කෘත ඥාන** නම්.

95. මෙ සේ එක එක සත්‍යයෙහි **සත්‍යඥාන, කෘත්‍යඥාන, කෘතඥාන** යැයි තුන් තුන් ආකාර වශයෙන් සත්‍ය සතර ම දොළොස් ආකාරයෙන් දන්නා ඥානය **ත්‍රි පරිවර්තයක්** ද ආකාර දොළොසක් ද ඇති ඥානදර්ශනය යැ යි කියන ලදී.

96. කොණ්ඩඤ්ඤ තෙර මුලින් ම මාර්ගඵල ප්‍රාප්ත ශ්‍රාවක යා යි. අඤ්ඤකොණ්ඩඤ්ඤ, අඤ්ඤාසිකොණ්ඩඤ්ඤ යැ යි ද කියත්. ආඥාතකොණ්ඩිණ්‍ය යනු දඹදිව සියලු සංස්කෘත පොත්හි එක සේ ම පෙනේ. එහි තේරුම (දැන ගත් කොණ්ඩඤ්ඤ) යනු යි.

97. බුදුරජහු දකුණත මැත් කොට `මහණ, මෙහි එව, දුක් කෙළවර කරනු පිණිස මනා ව බ්‍රහ්මචර්‍ය්‍යායෙහි යෙදෙව` යන වචනයෙන් යමකුට ආමන්ත්‍රණය කළ පමණින් හෙ තෙම සෘඩිමය අට පිරිකරින් සම්පූර්ණ වූ සැට අවුරුදු වයස් මහතෙර කෙනෙකුන් වැනි මනා ඉරියව්වෙන් යුක්ත වූ හිසි ප්‍රව්‍රජිත වේශය ඇත්තෙක් වෙයි. ඔහු ගේ ප්‍රව්‍රජ්‍යාවත් උපසම්පදවත් ඒ මැයි මේ. `ඒහි භික්ඛුපසම්පද` යැ යි කියනු ලැබේ.

98. සාතාගිර තෙම **සාතාගිරි** නම් පර්වතයේ වැසියෙකි. හේමවත හිමවත් පර්වත වැසියෙකි. එහෙයින් හිමවතට සාතාගිර තෙම මිතුරා දැකීමට ගියේ ය.

99. **අලාමක නම් ඇති** - චතුස්සත්‍යාවබෝධය. භග්න ක්ලේශ ඇති බව ආදි අවමක නුවූ ශ්‍රෙෂ්ඨ ගුණ හේතුයෙන් ලත් බුධ, භගවත් ආදී ශ්‍රෙෂ්ඨ නම් ඇති.

100. **සියලු සතුන් කෙරේ සම සිත් ඇත්තේ** - අචල බැවින් සම සිත් ඇති බව මෙහි කියන ලදී.

101. **ධ්‍යානය සිස් නොකෙරේ ද** - මෙයින් ත්‍රිවිධ කාය දුශ්චරිතයෙන් වැළැක්මේ බලවත් බව විචාරන ලදී. ධ්‍යානයෙහි යෙදුණහු ගේ දුශ්චරිත විරතිය ශීල මාත්‍රයෙහි සිටියහු ගේ දුශ්චරිත වීරතියට වඩා බලවති.

102. මෙයින් හෙතෙම භාග්‍යවතුන් වහන්සේ ගේ වාග්චාර ශුධිය විචාළේ ය.

103. නො නුවණින් කථා කිරීමෙක් බුදුවරුන් ගේ නැතැ යි මෙයින් හැඟැවී ය.

104. ද්වාරත්‍රය පිරිසිදු වූ පමණෙකින් සර්වඥ නොවන බව සලකා මෙය ඇසී ය.

105. ඒනිජංඝ - භාග්‍යවතුන් වහන්සේ ඒණිමුවකු ගේ මෙන් ක්‍රමයෙන් වටව පිරිණු කෙංඩා ඇති සේක.

106. භාග්‍යවතුන් වහන්සේ උස් මිටි සම වට විය යුතු තන්හි එ සේ ම වූ අඟ පසඟ ඇති සේක. ඇතැම් පුරුෂයන් මෙන් තර බාරු නොවන සේක.

107. ප්‍රමිත භෝජන ඇති, ඒකාසන භෝජී වූ මුනි ගුණය මෝනෙය්‍ය නම්. අනාගාරික බව - විවේකයට නැමුණු සිතැති බව.

108. අවිද්‍යා තෘෂ්ණා දෙක (දුඃඛ සමුදය) මරහුගේ මල (මාරපාශ) නම් වේ.

109. චක්ෂුරාදි ආධ්‍යාත්මිකායතන සය ද රූපාදි බාහිරායතන සය ද යන ආයතන ෂට්ක යුගලය ඇති බැවින් ඔවුන් ගේ ස්පර්ශය වේ. එ හෙයින් වේදනාව වේ. මෙ සේ මේ ආයතන ෂට්කද්වය ඇති කල්හිම සත්ත්ව සංස්කාර ලෝකය පෙළෙ යි.

110. කාම, භව, දිට්ඨි, අවිජ්ජා යන සතර ඕඝ (වතුර) සතර නම්.

111. **ධර්මසුධර්මත්වය,** ධර්මය ස්වාක්ඛ්‍යාතය, සාන්දෘෂ්ටිකය, අකාලිකය ආදි වශයෙන් වූ ධර්මයා ගේ සුධර්ම භාව ය. (හෙමවත සූත්‍රය).

112. **"භගවා අත්ථංගතෙ ච සුරියෙ දෙසනං න නිට්ඨපෙසි"** යන්නෙන් ඉර බැස්ස පසුත් දම්සක් දෙසූ බව සුත්ත නිපාතයේ හෙමවත සූත්‍ර අටුවායෙහි පෙනෙතත් එ තෙක් නො දෙසූ බව මැදුම්සඟි **පාසරාසි** සූත්‍ර අටුවාහි **"සුරියෙ ධරමානෙයෙව දෙසනා නිට්ඨාසි"** යන්නෙන් පෙනේ. භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයේ ම ධර්මචක්‍ර දේශනය ආරම්භ කළ සේක.

113. සතර නමක් පිඩු පිණිස ගිය විට ඉතිරි නමට භාග්‍යවතුන් වහන්සේ බණ වදළ බව සමහර පොත්හි පෙනේ.

114. **මෝනෙය්‍ය චත:** මෙය සුත්ත නිපාතයෙහි නාලක සූත්‍රයෙහි විස්තර ලෙස පෙනේ. පසු කලෙක මහාකච්චාන ථෙර නමින් සිටියෝ මේ තෙරණුවෝ ම යැයි සංස්කෘත බණ පොත්හි පෙනේ. ඒ අප පොතට හැම අතින් විරුධයි. නාලක තෙරණුවෝ දෙ දිනක් එක් තැනක නො සිට අන් අන් තෙනකට යමින් සත් වර්ෂයක් පමණ ජීවත් වූහ. මෝනෙය්‍යවත් ඉගෙන ගියායින් පසු කිසි දිනෙක ත් පෙරළා නාහ. (මොනෙය්‍ය සූත්‍රය)

115. උත්තරගීතය

116. මුල යහපත් වූ ධර්ම දේශනා කිරීමේ දී බුදුරජාණන් වහන්සේ මුලින් ශීල සමාධි දෙක ද මධ්‍යයෙහි විදර්ශනා මාර්ගයන් ද. අවසානයෙහි ඵල හා නිවන ද ප්‍රකාශ කරන සේක. මෙ සේ ශීල සමාධි සංඛ්‍යාත කල්‍යාණ (යහපත්) කරුණු ඒ දේශනාවගේ මුල කොටසේ ඇතුළත් බැවින් එය මුල යහපත් (ආදිකල්‍යාණ) යැයි ද, විදර්ශන භාවනාවත් සෝවාන් ආදී සතර මාර්ගයත් විස්තර කැරෙන බැවින් එහි මැද කොටස ද යහපත් යැ යි ද, සෝවාන් ආදී ඵල සතරත් නිවනත් අවසාන කොටසෙහි ඇතුළත් වන බැවින් කෙළවර යහපත් (අවසාන කල්‍යාණ) යැ යි දැ යි මෙ ආදී බොහෝ කරුණින් ධර්මය ත්‍රිවිධ කල්‍යාණ වේ.

වප් මස මැදි පොහෝ ද වස් පවරා භික්ෂූන් ධර්මදූත මෙහෙයෙහි පිටත් කැරැවූ බව පූජාවලී මුද්‍රිත පොතේ (199 පිටේ) පෙනේ.

117. භද්‍රවර්ගිය කුමරුවෝ: රූපයෙන් ද සිතෙන් ද භද්‍ර (යහපත්) බැවින් **භද්‍ර** නම් වූහ. වර්ග බන්ධනයෙක් (එක් ව ) හැසිරෙන බැවින් **වර්ගීය** නම් වූහ. වචන දෙක එක් කොට **භද්‍රවර්ගී** ය යැයි ඔවුනට නමෙක් වී ය. මොහු කොසොල් රජු ගේ සහෝදරයෝ යි. ධර්මය ඇසීමෙන් පහළ මාර්ග ඵලයට පැමිණි මුත් කිසිවෙක් රහත් නො වී ය.

118. තවත් බොහෝ පෙළහරවල් : දිනක් රෑ සතර වරම් මහ රජදරුවන් බුදුරජාණන් වහන්සේ හමු වීමට පැමිණීම, තවත් දිනෙක සක්දෙව් රජුන් බණ ඇසීමට පැමිණීම, තවත් දිනෙක **සහම්පතී** බඹහු ද එසේ ම පැමිණීම, මහා යාගයක් එළැඹ සිටි කළ භාග්‍යවතුන් වහන්සේ ගේ එහි පැමිණීම නුනොත් යහපතැ යි සිතූ උරුවේල කාශ්‍යපයා ගේ අදහස දැන උතුරුකුරු දිවයින් වැඩ පිඬු පිණිස හැසිර දන් වළඳා ආපසු වැඩි විට නායේ මන් දැයි ඇසූ කාශ්‍යපයාට ඔහු සිතූ අදහස් ආදිය ප්‍රකාශ කිරීම, භාග්‍යවතුන් වහන්සේ පාංසුකූල වස්ත්‍රයක් ලැබුණ විට එය සේදීමට පොකුණක් කැණීම ද, මැඩීමට ගලක් ළංකිරීම ද, පොකුණෙන් ගොඩ නැහෙනු පිණිස අල්ලා ගැනීමට පොකුණ අසැ රුකෙක අත්ත නැමීම ද, වස්ත්‍රය වේලීම පිණිස වැනීමට ගලක් ළං කොට තැබීම දැයි යන මෙකී මෙහෙවර දෙවියන් ගෙන් ලැබීම, එක් දිනෙක හිමවත්හි මහ දඹ රුකින් ඵලයක් ක්ෂණයකින් ගෙන වුත් කාශ්‍යප තවුසාට දීම, දිනක් එ තවුසන් දර පළනු නො හැකිව වෙහෙසෙන විට බුදු රජහු එක් වචනයෙන් ම දර පැළෙන්නට සැලැස්වීම, එසේ ම ගිනි දැල්විය නො හැකිව ඔවුන් වෙහෙසෙන විට එක වචනයෙන් ගිනි දැල්වීම, ගිනි නිවිය නො හැකිව ඔවුන් වෙහෙසෙනු දැක එක වචනයෙන් ම ගිනි නිවීම, ශීත සෘතු කාලයේ දී ඔවුනට ගිනි කබල් පන්සීයක් පමණ (ගිනි තැපීමට) මවා දීම, මහා වැසි වැස වතුර ගලන විට තමන් වහන්සේ ඉන්නා ප්‍රදේශයට ජලය නේන්නට සෘද්ධිබලයෙන් සැලැස්වීම යන මෙකී භාග්‍යවතුන් වහන්සේ සම්බන්ධ වූ ද, භාග්‍යවතුන් වහන්සේ විසින් දක්වන ලද්ද වූ ද ප්‍රාතිහාර්‍ය්‍ය දැකත් උරුවෙල කාශ්‍යපයා ශ්‍රමණ ගෞතමයෝ මහානුභාව ඇත්තෝ ය. එහෙත් අප මෙන් රහත් නො වෙතියි කීයේ ය. අන්තිමේ දී භාග්‍යවතුන් ඒ කාශ්‍යපයා රහත් වූ හෝ රහත් මඟට බැස්ස හෝ කෙනෙකු නො වන බව වදරා ඔහුගේ මානය දුරු කළ සේක.

119. "**ගයා ශිර්ෂ**" නම් ගයා තොටපලේ ඉස්මත්ත යි. **ගය නම්** වූ රාජර්ෂින් විසින් කරවන ලද නගරය බැවින් ගයා යි නම් වී ය. මෙය නේරංජරා ගඟ අසබඩ පිහිටියේ ය. එහි තොටුපල ගයාතීර්ථ නම්. බමුණන්ගේ **පාපධෝවන** (පව්සෝදන) ස්ථානයෙකි.

120. ඔවුනට කෙබඳු ධර්මයක් දේශිත ද යනු සමන්තකූට වර්ණනායෙන් දත හැකිය. ලංකාවට භාග්‍යවතුන් වහන්සේ වැඩ වදළ බණ ආදිය ගැන විස්තරයක් ලංකාවතාර සූත්‍ර නම් සංස්කෘත ධර්ම ග්‍රන්ථයෙහි පෙනේ.

121. මේ තල්වනයෙහි නුගරුක මිනිසුන් දෙවියන් පුදන දෙවොලෙකි.

122. **මහා නාරදකාශ්‍යප ජාතකය:** මේ කර්ම ඵල ඇති බව ගැන ඇති වූ සාකච්ඡාවක් ඇතුළත් මහඟු කථා වස්තුවකි. ජාතක පොතින් දනිත්වා.

123. මෙ තෙම බිම්සර රජු හා එකට උගත් ඔහුගේ මිත්‍රයෙකි. පසු කාලයෙක භාග්‍යවතුන් වහන්සේ විසාලා පුරයට වැඩම කරවා ගෙන යන්නට ආයේත් මෙ තෙමේ යි.

124. මේ සක්දෙව් ය.

125. සක්දෙවිඳු ගේ බුදු ගුණ ප්‍රකාශිත ගී.

**සන්තො සන්තෙහි සහ**
**පුරාණජටිලෙහි විප්පමුත්තො විප්පමුත්තෙහි**
**සිංගීනික්ඛ - සවණ්ණො**
**රාජගහං පාවිසි භගවා**

**දන්තො දන්තේහි සහ පුරාණ.................**
**මුත්තො මුත්තෙහි සහ පුරාණ................**
**තිණ්ණො තිණ්ණෙහි සහ පුරාණ..........**

**දසවාසො දස බලො**
**දසධම්මවිදූ දසහි චුපෙතො**
**සො දසසතපරිවාරො**
**රාජගහං පාවිසි භගවා**

**යො ධීරො සබ්බධි දන්තො**
**තිණ්තො අප්පටිපුග්ගලො**
**අරහං සුගතො ලොකෙ**
**තස්සාහං පරිචාරකො**

126. **අනුජානාමි භික්ඛවෙ ආරාමං**

127. තිරෝකුඩ්ඩ සූත්‍රය. මෙය කුදුගත් සභියෙහි ඛුද්දක පාඨයෙහි ඇතුළති.

128. අස්සජි තෙරුන් වදළ ගාථාව.

**යෙ ධම්මා හෙතුප්පභවා**
**තෙසං හෙතුං තථාගතො ආහ**
**තෙසං ච යො නිරොධො**
**එවංවාදී මහාසමණො**

129. සුඩ්ක පටිපදා, සුඩ්ක සුඤ්ඤතා සුඤ්ඤත පටිපද, සුඩ්ක අප්පණිහිත පටිපද යන කොටස් පසෙහි එක් එක් කොටස චතුෂ්ක පංචක නය විසින් ගුණිතව ලෝකෝත්තර ධ්‍යානයෙහි නය දශයෙකි. ධ්‍යාන, මාර්ග සතිපට්ඨාන, සම්‍යක්ප්‍රධාන, ඍද්ධිපාද, ඉන්ද්‍රිය, බල, බොධ්‍යංග, සත්‍ය, ශමථ, විදර්ශනා, ධර්මස්කන්ධ, ආයතන, ධාතු, ආහාර, ස්පර්ශ, වේදනා, සංඥා, චේතනා, චිත්ත, යන ධර්ම විස්ස කෙරෙහි එකි එකී ධර්මයකට යට කී දස දස නය වන බැවින් සියල්ල ම නය 200 කි. ඒ ඡන්ද චිත්ත විරිය විමංසා විසින් ගුණිත ව මිශ්‍රක නය 800 ක් වේ. ඡන්ද චිත්තාදින් මිශ්‍රිත නුවූ අමිශ්‍ර නය ද දෙසීයකි. එවිට සියල්ල නය දහසෙකි. විස්තර විභංග ප්‍රකරණයෙහි සත්‍යවිභංගාදියෙන් දත යුතු.

130. වේදනාපරිග්‍රහ සූත්‍රය මෙය දීඝනඛසූත්‍ර යැයි ද දන්නා ලදී. මැදුම් සඟියේ මජ්ඣිමපණ්ණාසකයෙහි ඇතුළති.

131. අවවාද ප්‍රාතිමෝක්‍ෂය

132. **අසාරෙ සාරමතිනො සාරෙ වා සාර දස්සිනො**
**තෙ සාරං නාධිගච්ඡන්ති මිච්ඡාසංකප්ප ගොචරා.**
**සාරං ච සාරතො ඤත්වා අසාරංච අසාරතො**
**තෙ සාරමධිගච්ඡන්ති සම්මාසංකප්පගොචරා.**

133. කෙණිය ජටිලයාට වදළ බණ හා සෙල බ්‍රාහ්මණයාට වදළ බණ සුත්ත නිපාත සෙල සුත්ත අටුවා ආදියෙහි පෙනේ.

134. රෝහිණී නදිය ශාක්‍ය කෝලිය ජනපද මැදින් උතුරේ සිට දකුණු දිගට ගලා යයි. රජගහ පුර ඒ නදියට නැගෙනහිරින් වේ. එ බැවින් රජ ගහෙන් කිඹුල්වතට යන තැනැත්තේ එ නදිය තරණය කරන්නේ, ආ දිගට ම මුහුණ ලයි. එ බැවින් මෙ සේ කියන ලදී.

135. කාළුදායි තෙරුන් ගේ ගමන වණ්ණනා ගාථා:

1. **අංගාරිනො'දනි දුමා හදන්තෙ**
**ඵලෙසිනො ඡදනං විප්පහාය**
**තෙ අච්චි මන්තො'ව පභාසයන්ති**
**සමයො මහාවීර භගීරසානං**

2. **දුමානි ඵුල්ලානි මනොරමානි**
**සමන්තතො සබ්බදිසා පවන්ති,**
**පත්තං පහාය ඵලමාසසානා**
**කාලො ඉතො පක්කමනාය වීර**

3. නෙවාතිසීතං න පනාතිඋණ්හ
සුඛා උතු අද්ධනියා භදන්තෙ,
පස්සන්තු තං සාකියා කොලියා ච
පච්ඡා මුඛං රෝහිණිං තාරයන්තං

4. ආසාය කස්සතෙ ඛෙත්තං, බීජං ආසාය වප්පතෙ
ආසාය වාණිජා යන්ති, සමුද්දං ධනහාරකා
යාස ආසාය තිට්ඨාමි, සා මෙ ආසා සමිජ්ඣතු

5. පුනප්පුනං චෙව වපන්ති බීජං
පුනප්පුනං වස්සති දෙවරාජා
පුනප්පුනං ඛෙත්තං කසන්ති කස්සකා
පුනප්පුනං ධඤ්ඤමුපෙති රට්ඨං

6. පුනප්පුනං යාචනකා චරන්ති
පුනප්පුනං දානපතී දදන්ති
පුනප්පුනං දනපතී දදිත්වා
පුනප්පුනං සග්ගමුපෙන්ති ඨානං

7. ධීරෝ හවෙ සත්තයුගං පුනාති
යස්මිං කුලෙ ජායති භූරිපඤ්ඤො
මඤ්ඤාමහං සක්කති දෙවදෙවො
තයා'භිජාතො මුනි සච්චනාමො.

8. සුද්ධොදනො නාම පිතා මහෙසිනො
බුද්ධස්ස මාතා පන මායනාමා,
යං බොධිසත්තං පරිහරිය කුච්ඡිනා
කායස්ස භෙද තිදිවම්හි මොදති.

9. සා ගොතමී කාලකතා ඉතො චුතා
දිබ්බෙහි කාමෙහි සමංගිභූතා
සා මොදති කාමගුණෙහි පංචහි
පරිවාරිතා දෙවගණෙහි තෙහි.

136. අභිඥාපාදක ධ්‍යානය. අභිඥාවට පාදක වූ සතර වන රූපධ්‍යානය. මෙහි දී යමා මහ පෙළහර කළ සේක. එසේ ම දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍ය සතර අපාය ඇති සැටි ලෙස ම බලා උන්නවුනට පෙනෙන්නට සැලැස්වීම් වශයෙන් **ලෝක විවරණ** නම් පෙළහරක් ද කළ සේක.

ඉක්බිති අහස්හි සක්මනක් මවා එහි සිට දහම් දෙසූ සේක. ගිජ්ඣකූළ පව්වෙහි සිටි සැරියුත් තෙරණුවෝ එය දිවැසින් දැක සිය භික්ෂු පිරිස් කැටිව එහි වුත් වැඳ භාග්‍යවතුන් වහන්සේ අතින් **මහාභිනීහාරයත්** පාරමී පූරණයත් විචාළහ. එය විසදීම් වශයෙන් **බුධවංශය** ද ඉක්බිති **චරියාපිටකය** ද වදළ සේක.

137. වෙස්සන්තර ජාතකය. ජාතක පොත හෝ පාලි චරියාපිටකය බලනු. මෙය විස්තර ලෙස විලේගොඩ ධම්මානන්ද තෙරුන් වහන්සේ විසින් සිංහලෙන් ලියන ලදින් එච්.එස්. කුලරත්න නීතිඥ මහතා විසින් මුද්‍රාපිත **සිංහල චයහීපිටකාර්ථ කථායෙහි** 80 වැනි පිට බලා දත යුතු යි.

138. **උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය**
**ධම්මං සුචරිතං චරෙ**
**ධම්මචාරී සුඛං සෙති**
**අස්මිං ලොකෙපරම්හි ච.** (ජාතක, ධම්මපද අට්ඨකථා)

මෙය ටිබැට් රට වැහැරැවෙන සංස්කෘත ධර්මපදයෙහි
**උත්තිෂ්ඨේත් න ප්‍රමද්‍යෙත ධර්මං සුචරිතං චරෙත්**
**ධර්මචාරී සුඛං ශෙතෙ හ්‍යස්මින් ලොකෙ පරත්‍ර ච** යැයි පෙනේ.

139. **ධම්මං චරේ සුචරිතං න තං දුච්චරිතං චරෙ**
**ධම්මචාරි සුඛං සෙති අස්මිං ලොකෙ පරම්හි ච**
(ජාතක, ධම්මපද)

140. බෝසත් සඳ කිඳුරු ව ඉපද සිටි කල කිඳුරිය කෙරේ ඇල්මෙන් බරණැස් රජකු බෝසත් කිඳුරහු විද්ද බවත් කිඳුරිය දෙවියනට දෙස් කියමින් ඉන්න කල සක් දෙව් අවුත් කිඳුරා සුව කැරැදී ගිය බවත් මෙහි සාරාංශය යි.

141. භාග්‍යවතුන් වහන්සේ නන්ද කුමරුන් ගේ මාලිගාවට වැඩ දන් වළඳා "**තපො ච බ්‍රම්හ චරියං ච**" යන ආදී ගයින් අනුමෝදනා බණ වදරා කුමරු අතට පාත්‍රය දී වැඩි බව පූජාවලියෙන් පෙනේ.

142. යශෝධරා ව ශෝකයෙන් කල් යවමින් ගොතා ලූ ප්‍රබන්ධයක් වූ **නරසීහ ගාථා** නම් ගාථා පෙළක් රාහුල කුමරුට උගන්වා යවා ලූ බව **ථෙරී අපදානාදියෙහි** කියන ලදී. (පූජාවලී යශෝදරා වස්තුව ද බලනු.)

143. සරණගමන ප්‍රව්‍රජ්‍යාව මුලින් ම ඇති වූ අවස්ථාව මෙය වේ.

144. මහා ධර්මපාල ජාතකය. බෝසත් මෙළේ යැ යි ඇදුරහු පිය බමුණාට කී බවත් පිය බමුණු එය නො පිළිගත් බවත් එයට හේතුව පුළුවුත් විට එ කුලයෙහි අය ප්‍රාණඝාතාදී අපරාධ වලින් මුළුමනින් වෙන් ව වසන බවත් ධර්මපාල කුමරු ගේ පියා කී බව මේ ජාතකයෙහි සඳහන් වේ.

145\. යඤ්ච කම්මං කතං සාධු යං කත්වා නානුතප්පති
යස්ස පතීතො සුමනො විපාකං පටිසෙවති.

(ධම්මපද)

146 දශ කථා වස්තු

147\. මාසෙ මාසෙ කුසග්ගෙන බාලො භුඤ්ජෙථ භොජනං
න සො සංඛතධම්මානං කලං අග්ඝති සොළසිං

(ධම්මපද)

148\. සුදත්ත යනු අනේ පිඬු සිටාණන් ගේ නම යි. අනාථයනට පිණ්ඩදානය කරන කරුණින්, පසු කලැ අනාථපිණ්ඩික (අනේපිඬු) නමින් හේ ප්‍රකට විය.

149\. සතං හත්ථී සතං අස්සා සතං අස්සතරී රථා
සතං කඤ්ඤා සහස්සානි ආමුත්තමණිකුණ්ඩලා
එකස්ස පදවීතිහාරස්ස කලං නාග්ඝති සොළසිං

(විනය චුල්ලවග්ග, සෙනාසනක්ඛන්ධක) මෙ සේ කීයේ සීවක යක්ෂයා යි.

150\. සබ්බද වෙ සුඛං සෙති බ්‍රාහ්මණො පරිනිබ්බුතො
යො න ලිප්පති කාමෙසු සීතිභූතො නිරූපධි.
සබ්බා ආසත්තියො ඡෙත්වා විනෙය්‍ය හදයෙ දරං
උපසන්තො සුඛං සෙති සන්තිං පප්පුය්‍ය චෙතසො

151\. යස්ස නිත්තිණ්ණො පංකො ච මද්දිතො කාමකන්ටකො
මොහක්ඛයං අනුප්පත්තො සුඛදුක්ඛෙසු න වෙධති.

(ධම්මපද)

152\. යථා'ගාරං දුච්ඡන්නං වුට්ඨී සමතිවිජ්ඣති
එවං අභාවිතං චිත්තං රාගො සමතිවිජ්ඣති.
යථා'ගාරං සුච්ඡන්නං වුට්ඨී න සමතිවිජ්ඣති.
එවං සුභාවිතං චිත්තං රාගො න සමතිවිජ්ඣති.

153 තපෙන බ්‍රම්හචරියෙන සඤ්ඤමෙන දමෙන ච
එතෙන බ්‍රාම්හණොහොති එතං බ්‍රාම්හණ මුත්තමං

(ථෙරගාථා)

154\. න සන්ති පුත්තා තාණාය න පිතා න පි බන්ධවා
අන්තකෙනාධිපන්නස්ස නත්ථි ඤාතීසු තාණතා

(ථෙරගාථා සොපාක වත්ථු)

155.

156.

157. මුංච පුරෙ මුංච පච්ඡතො මජ්ඣෙ මුංච භවස්ස පාරගූ
සබ්බත්ථ විමුත්ත මානසො න පුන ජාති ජරං උපෙහිසි
(ධම්මපද)

158.

159.

160. ප්‍රජාවතීගෞතමීන් විසින් සියතින් වියා සකසන ලද බව කිසි තැනෙක පෙනේ. ඇය විසින් ඒ පුදන ලද්දේ පැවිදිවත්නට පළමු ය. එහෙත් ඒ කාලයෙහි මෙතේ බෝසත් පැවිදි වී නැත. ඒ වස්ත්‍ර කාශ්‍යප තෙරුන් විසින් කුක්කුටගිරි පර්වතයෙහි තබා පසුව මෙතේ බෝසත්නට පැමිණුවූ බව ය්වාංජශවාං ගේ යාත්‍රා වාර්තායෙහි පෙනේ.

161. අත්තානං චෙ පියං ජඤ්ඤා රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං
තින්නමඤ්ඤතරං යාමං පටිජග්ගෙය්‍ය පණ්ඩිතො

162. භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනාවෙක අදහස ඇතුළත් කොට සමන්තකූට වර්ණනා කර්තෘ කළ රචනාවෙක අදහස යි. සමන්තකූට වර්ණනාව බලනු.

163. සචෙ ලභෙථ නිපකං සහායං සද්ධිං චරං සාධුවිහාරි ධීරං
අභිභූය්‍ය සබ්බානි පරිස්සයානි චරෙය්‍ය තෙනත්තමනො සතීමා.

නො චෙ ලභෙථ නිපකං සහායං සද්ධිං චරං සාධුවිහාරි ධීරං
රාජා'ව රට්ඨං විජිතං පහාය එකො චරෙ මාතඞ්ග රඤ්ඤෙ'ච-
නාගො

එකස්ස චරිතං සෙය්‍යො නත්ථි බාලෙ සහායතා
එකො චරෙ න ච පාපානි කයිරා අප්පොස්සුක්කො මාතංග
රඤ්ඤෙ'ච නාගො

(මහාවග්ග කොසම්බකක්ඛන්ධක, ධම්මපදට්ඨ කථා කොසම්බිය-
වත්ථු)

164. මෙහි දී කසී භාරද්වාජ සූත්‍රය දෙසූ සේක. මෙය සුත්තනිපාතයෙහි ඇතුළති.

165. සබ්බදනං ධම්මදානං ජිනාති
සබ්බ රසං ධම්මරසො ජිනාති
සබ්බ රතිං ධම්මරතී ජිනාති
තණ්හක්ඛයො සබ්බදුක්ඛං ජිනාති (ධම්මපද)

166. 'කිංසුධ විත්තං පුරිසස්ස සෙට්ඨං' යන ආදීන් මේ ප්‍රශ්න සතරත් උත්තරත් සුත්තනිපාතයේත් සංයුත්සඟියේ යක්ඛසංයුත්තයේ ආළවකසුත්ත යෙන් ද දත හැකි ය.

167. **පස්ස චිත්තං කතං බිම්බං අරුකායං සමුස්සිතං**
**ආතුරං බහු සඞ්කප්පං යස්ස නත්ථි ධුවා ඨිති.** (ධම්ම පද)

168. "**ජිඝච්ඡාපරමා රොගා සංඛාරපරමා දුඛා**
**එතං ඤත්වා යථාභූතං නිබ්බානපරමං සුඛං**"යි ද දක්නා ලැබේ.

169. **අන්ධභූතො අයං ලොකො තනුකෙත්ථ විපස්සති**
**සකුන්තො ජාල මුත්තො'ව අප්පොස්සග්ගාය ගච්ඡති.**

170. ආණා පාතිමොක්ඛ

171. අනවරාග්‍ර සසර අනන්ත ජාතිවලැ සිය දූ මළ සොවින් වගුළ කඳුළු ගොඩක් වූවොත් සිවු මුහුද දියටත් වැඩියැ යි ආදීන් වදළ කථාව අනමතග්ග කථා නම්.

172. **ඨිතො අහං අංගුලිමාල සබ්බදා**
**සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං**
**තුවං ච පාණෙසු අසඤ්ඤතො"සි**
**තස්මා ඨිතො'හං තුවමට්ඨිතො'සි**
(ථෙර ගාථා අංගුලිමාල වත්ථු, මජ්ඣිම නිකාය අංගුලිමාල සුත්ත.)

173. **දූරෙ සන්තො පකාසන්ති**
**හිමවන්තො'ව පබ්බතො**
**අසන්තො නප්පකාසන්ති**
**රත්තික්ඛිත්තා යථා සරා**

174. **සුකරං සාධුනා සාධු**
**සාධු පාපෙන දුක්කරං**
**පාපං පාපෙන සුකරං**
**පාපමරියෙහි දුක්කරං** (ධම්මපද)

175. **ඉමෙහි* අට්ඨෙහි තමග්ගපුග්ගලං**
**දෙවොතිදෙවං නරදම්මසාරථිං**
**සමන්තචක්ඛුං සතපුඤ්ඤලක්ඛණං**
**පාණෙහි බුධං සරණං ගතො"ස්මි**
(ධම්මපදට්ඨ කථා දෙවදත්ත වත්ථු)

---

* අට්ඨීහි කියා ත් පාඨයි

176. ඉධ තප්පති පෙච්ච තප්පති පාපකාරී උභයත්ථ තප්පති
පාපං මෙ කතන්ති තප්පති භියෝ‍ය තප්පති දුග්ගතිං ගතො

177. දෙව්දත් තෙර දේවරාජ නම් සම්‍යක් සම්බුදු වන බව සද්ධර්මපුණ්ඩරීක නම් සංස්කෘත බණ පොතේ පෙනේ. අජාතශත්‍රු රජු ද බුදුවන බව එහි කියා තිබේ.

178. 'ආනන්ද. මයා කථිත ධම්මො නාම සංක්කච්චං අසුණන්තස්ස අගණ්හන්තස්ස අසජ්ඣායන්තස්ස අදෙසෙන්තස්ස වණ්ණසම්පන්නං අගන්ධකපුප්ඵං විය අඵලො හොති. සක්කච්චං පන සවණාදිනි කරොන්තස්ස මහප්ඵලො හොති මහානිසංසො' (ධම්මපදට්ඨ කථා ඡත්තපාණි වත්ථු)

179. පඨව්‍යා එකරජ්ජෙන
සග්ගස්ස ගමනෙන වා
සබ්බලොකාධිපච්චෙන
සොතාපත්ති ඵලං වරං (ධම්මපද)

180. තණ්හාය ජායතෙ සොකො
තණ්හාය ජායතෙ භයං
තණ්හාය විප්පමුත්තස්ස
නත්ථි සොකො කුතො භයං (ධම්මපද)

181. න තං කම්මං කතං සාධු යං කත්වා අනුතප්පති
යස්ස අස්සුමුඛො රොදං විපාකං පටිසෙවති. (ධම්ම පද)

යම් කර්මයක් කොට සිහි කරන තැනැත්තේ ඒ හේතුයෙන් තැවේ නම්, යම් කර්මයක විපාකය කඳුළු පිරුණු මුහුණ ඇති ව විඳී නම් එසේ වූ කර්මය කරන ලද්දේ නො මැනැවි.)

182. සුඛ කාමානි භූතානි
යො දණ්ඩෙන විහිංසති
අත්තනො සුඛමෙසානො
පෙච්ච සො න ලභතෙ සුඛං (ධම්මපද, උදාන)

183. චතූසු සමුද්දෙසු ජලං පරිත්තකං
තතො බහුං අස්සු ජලං අනප්පකං
දුක්ඛෙන ඵුට්ඨස්ස නරස්ස සොචතො
කිං කාරණා සොකවසා පමජ්ජසි.

(අනවරාග්‍ර සසර හැසිරෙන පුත්‍ර ශෝකයෙන් දුකට පැමිණ හඬන්නහුගේ කඳුළු රැස එක් කට හැකි නම් සතර මුදුවල ජලය එයට අඩුවෙයි. ඒ බොහෝ වූ කඳුළු රැස සතර මුදුවල ජලයට වැඩිවෙයි. එ බැවින් ශෝක කිරීම වශයෙන් කුමට පමා වෙහි ද?)

මේ ගාථාව ඇසීමෙන් පටාචාරාව ගේ ශෝකය තුනී විය.

184. "න සන්ති පුත්තා තාණාය න පිතා න පි බන්ධවා
අන්තකෙනාධිපන්නස්ස නත්ථි ඤාතීසු තාණතා
එතං අත්ථවසං ඤත්වා පණ්ඩිතො සීලසංවුතො
නිබ්බානගමනං මග්ගං ඛිප්පමෙව විසොධයෙ" (ධම්ම පද)

මරහු විසින් මඩනා ලද තෙනැත්තහුට පුත්‍රයෝ ද පියා ද සෙසු නෑයෝ ද පිහිට පිණිස නැත්තාහ. (පිහිට වීමෙහි අසමර්ථ හ) නෑයන් කෙරෙහි ප්‍රතිෂ්ඨා භාවයෙක් නැත යන මේ අර්ථවත් කාරණය, ශීල සංවරය ඇති පණ්ඩිත පුද්ගල තෙම දැන, නිවනට යන මග යුහුසුලු ව පිරිසිදු කරන්නේ ය.)

185. තං පුත්තපසුම්මත්තං
ව්‍යාසත්තමනසං නරං
සුත්තං ගාමං මහොඝො'ව
මච්චුරාදාය ගච්ඡති.

186. වදාළ බණ : අචිරං වත'යං කායො
පඨවිං අධිසෙස්සති
ඡුද්ධො අපෙතවිඤ්ඤාණො
නිරත්ථං'ව කලිංගරං (ධම්මපද)

("මේ ශරීරය සිතින් පහවූයේ වැඩකට නැති දඬු කඩක් සේ හිස් වූයේ නිස්සාර වූයේ, නො බෝ කලෙකින් ම පොළෝ මත හෙන්නේ ය.")

187. යො භික්ඛවෙ මං උපට්ඨහෙය්‍ය
සො ගිලානං උපට්ඨහෙය්‍ය (මහාවග්ග චීවරක්ඛන්ධක)

188. යථා සංකාරධානස්මිං - උජ්ඣිතස්මිං මහාපථෙ
පදුමං තත්ථ ජායෙථ - සුචිගන්ධං මනොරමං
එවං සංකාරභූතෙසු - අන්ධභූතෙ පුථුජ්ජනෙ
අතිරොචති පඤ්ඤාය - සම්මාසම්බුද්ධසාවකො

189. මනොපුබ්බංගමා ධම්මා - මනොසෙට්ඨා මනොමයා
මනසා චෙ පසන්නෙන - භාසති වා කරොති වා
තතො නං සුඛමන්වෙති - ඡායා'ව අනපායිනී

190. යෙ තරන්ති අණ්ණවං සරං - සෙතුං කත්ව විසජ්ජ පල්ලලානි
කුල්ලං හි ජනො පබන්ධති - තිණ්ණා මෙධාවිනො ජනා

191. **සාහුදස්සනමරියානං - සන්නිවාසො සදා සුඛො**
**අදස්සනෙන බාලානං - නිච්චමෙව සුඛී සියා**

**බාලසංගතචාරිහි - දීඝමද්ධාන සොචති.**
**දුක්ඛො බාලෙහි සංවාසො - අමිත්තෙනෙව සබ්බදා**

**ධීරොහි සුඛසංවාසො - ඤාතීනංව සමාගමො**
**තස්මාහි ධීරං ච පඤ්ඤං ච බහුස්සුතඤ්ච**
**ධොරය්හ සීලං වතවන්තමාරියං**
**තං තාදිසං සප්පුරිසං සුමෙධං**
**භජෙථ නක්ඛත්ත පථේ'ව චන්දිමා**

බුධාදි ආයෳීයන් දැකීම ද උන් වහන්සේ හා එක් ව විසීම ද මැනැවි. ලාමකයන් නො දැකීමෙන් ( එ නොදක්නා තෙනැත්තේ ) නිතරම සුව ඇත්තේ වන්නේ ය.

ඒ එ සේ මැයි. ලාමකයන් හා එක් ව ගැවසෙන පුද්ගල තෙම ඔහු හා අපරාධ කිරීම් හේතුයෙන් දුක් කම්කටොලු ලැබ දීර්ඝ කාලයක් ශෝක කෙරේ. ලාමකයන් හා එක්ව විසීම සියලු කල්හිම සතුරකු හා එක්ව විසීමක් මෙනි. පණ්ඩිතයන් හා ඒකතෝවාසය නෑයන් හා එක් ව විසීමක් සේ සුව එළවයි.

එ බැවින් ලොව් ලොවුතුරා නුවණ ඇත්තා ද, ආගමාධිගම සම්පන්නයා ද රහත් ඵලයට පමුණුවන ප්‍රතිපත්ති ධූරය උසුලන්නා ද, ශීල ධූතාංග සංඛ්‍යාත මහා ව්‍රත ඇත්තා ද, කෙලෙස් දුරු කළහු ද යන මහා නුවණැති එ බඳු පුද්ගලයකු සඳු අහස සෙවුනාක් මෙන් සේවනය කරන්නේ යහපත.

(මහාපරිනිබ්බාන සුත්ත)

192. භික්ඛවෙ, අස්සෙනාපි මයි සිනෙහවන්තෙන භික්ඛුනා ධම්මාරාමසදිසෙනෙව භවිතබ්බං, න හි මය්හං මාලාගන්ධාදිහි පූජං කරොන්තා පූජං කරොන්ති නාම. ධම්මානුධම්මං පටිපජ්ජන්තා එව පන මං පූජෙන්ති නාම.

(ධම්මපදට්ඨ කථා ධම්මාරාම වත්ථු)

193. **තුලමතුලංච සම්භවං - භවසංඛාරමවස්සජි මුනි**
**අජ්ඣත්තරතො සමාහිතො - අභින්දිකවචමිවත්ත සම්භවං**
(මහාපරිනිබ්බාන සුත්ත)

194. හන්ද දානි භික්ඛවෙ ආමන්තයාමි වො. වයධම්මා සංඛාරා. අප්පමාදෙන සම්පාදෙථ. න චිරං තථාගතස්ස පරිනිබ්බාණං භවිස්සති. ඉතො තිණ්ණං මාසානමච්චයෙන තථාගතො පරිනිබ්බායිස්සති. (මහාපරිනිබ්බාන සූත්ත)

195. භාග්‍යවතුන් වහන්සේ වෙතින් මෙය අසන ලදැ යි කී පමණින් නො ගෙන ධර්ම විනය හා ගැළැපේ දැ යි බලා ගැළැපේ නම් බාර ගැනීම; සංඝයාගෙන් මෙය අසන ලදැ යි කී පමණින් නො ගෙන ධර්මවිනය හා සසඳා ගැළැපෙතොත් පිළිගැනීම; බොහෝ පණ්ඩිත තෙරුන් වෙතින් මෙය ශාස්තෘ ශාසන යැ යි කියා අසන ලදැයි කී පමණින් නො ගෙන ධර්ම විනය හා ගැළැපේ දැ යි බලා ගැළැපෙතොත් පිළිගැනීම; එක් උගත් තෙර කෙනෙකු ගෙන් මෙය ශාස්තෘශාසන යැ යි කියා අසන ලදැ යි කී පමණින් නො ගෙන එය ධර්ම විනය හා ගැළැපේ දැයි බලා ගැළැපෙතොත් බාරගැනීම යන මේ සතර මෙහි (සූත්‍රපිටකයෙහි) දැක්වුණු සතර මහාපදෙසයෝ යි.

196. සුජාතා චුන්ද යන දෙදෙනා පිදූ භෝජනයන්ගේ සමඵල ඇති බව කෙ සේ ද? යත්: සුජාතා දුන් බොජුන් වළඳා භාග්‍යවතුන් වහන්සේ සෝපදිශේෂ පරිනිර්වාණ ධාතුයෙන් පිරිනිවි සේක. චුන්දයා දුන් බොජුන් වළඳා නිරුපදිශේෂ නිර්වාණ ධාතුයෙන් පිරිනිවි සේක. මෙසේ පිරිනිවන් පෑමේ සම බැවින් ද ඒ වැළැඳූ භොජනය සම ඵල ඇත්තේ ය. (බුදු වන ද භාග්‍යවතුන් වහන්සේ සූවිසි කෙළ ලක්ෂයක් සමාපත්තිනට සමවන් සේක. පිරිනිවන් පාන ද ඒ සේ ම සූවිසි කෙළ ලක්ෂයක් සමාපත්තිනට සමවන් සේක. මෙ සේ සමාපත්තීනට සමවැදීමේ සම බැවින් ද ඒ දෙ දින වැළැඳූ භෝජනය සම ඵල ඇත්තේ ය.)

සුජාතා තමා ගේ දන් පිළිගත්තහු දේවතාවක නො වන බවත් බෝසතාණන් බවත් තමා දුන් බොජුන් ඒ තුමන් බුදු වන්නට පෙර ලත් භෝජනය බවත් එය බුදුවීමෙන් පසු සත් සතියක්ට ම සෑහුණ බවත් අසා තමාට වූයේ මහත් ලාභයෙකැ යි බලවත් ප්‍රීතියට පැමිණියා ය. චුන්දයා ද අන්තිම භෝජනය තමා විසින් දෙන ලදැයි ද තමා ගේ භෝජනය වැළැඳූ බුදුරජාණන් වහන්සේ නිවන් පුර වන් සේකැ යි ද අසා බලවත් ප්‍රීතියට පැමිණියේ ය. මෙ සේ තමන් ගේ දනයන් සිහි කිරීමේ සම බැවින් ද ඒ දෙදෙනා ගේ දන් දෙක සම ඵල ඇති විය. මෙ සේ පරිනිර්වාන සමතා, සමාපත්ති සමතා, අනුස්මෘති සමතා යන තුනින් ඒ දන් සමඵල වූ බව දත යුතු.

197. න බො ආනන්ද එත්තාවතා තථාගතො සක්කතො වා හොති ගරුකතො වා මානිතොවා පූජිතොවා අපචිතොවා. යො බො ආනන්ද භික්ඛු වා භික්ඛුණී වා උපාසකො වා උපාසිකා වා ධම්මානුධම්මපටිපන්නො විහරති සාමීචිපටිපන්නො අනුධම්මචාරී සො තථාගතං සක්කරොති ගරුකරොති මානෙති පූජෙති පරමාය පූජාය. තස්මාතිහානන් ද ධම්මානුධම්මපටිපන්නා විහරිස්සාම සාමීචිපටිපන්නා අනුධම්මචාරිනො ති එවං හි වො ආනන්ද සික්ඛිතබ්බන්ති.

198. **එකූනතිංසො වයසා සුභද්ද**
**යං පබ්බජිං කිං කුසලානුඑසී**
**යතො අහං පබ්බජිතො සුභද්ද**
**ඤායස්ස ධම්මස පදෙසවත්ති**
**ඉතො බහිධා සමණො'පි නත්ථි**

199. **හන්දදනි භික්ඛවෙ ආමන්තයාමි වො**
**වයධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදෙථ**

200. ශක්‍රයා ද අනවතප්ත නාගරාජයා ද, ඒරකපත්‍ර නාගරාජයා ද යන තිදෙනාත් ධාතු කොටස් ඉල්ලා ආරාවුල් කළ විට සියලු ධාතු ප්‍රධාන කොටස් තුනකට බෙද එකක් දෙවියනට ද, එකක් නාගයනට ද, අනෙක රාජ්‍ය අටටද බෙද දුන් බවක් ද, ද්‍රෝණ බමුණා තමාටත් ධාතු ලබා ගැනීමට උපායක් සිතා නාළිකායෙහි ඇතුළත මී පැණි ගා එයින් ඒ ධාතු මැන්න බවද, ඉන් පසු ඒ නාළිකාව පමණක් තමාට ඉල්ලා ගත් බව ද, එහි මී පැණියෙහි ඇලී තුබුණු ධාතූන් සහිත වූ එය ඔහු ගෙන ගිය බව ද, එ සියල්ල බහා කළ ස්තූපය **ද්‍රෝණ ස්තූප** නම් වූ බව ද 'ය්වාංජ්ග්වාං' චීන භික්ෂුව ගේ දේශාටන වාර්තායෙහිත් දිව්‍යාවදානයෙහිත් සඳහන් වේ.

**බළන්ගොඩැ ආනන්ද මෛත්‍රෙය යතිහු විසින් ප්‍රණීත**

**ශාක්‍යමුනීන්ද්‍රාවදනය යන අපර නාමධෙයයක් ඇති**

**සිඩාර්ථගෞතම බුඩ චරිතය**

**මෙතෙකින් නිමියේ ය.**

**-ශිව මස්තු සර්වජගතාම්-**

# පදෝපක්‍රමණිකාව


අ

අඋම් xxiii
අගසවු නනතුර 112
අග්ගාලව චෛත්‍යය xix
අඞග ජනපදය viii
අඞගරට ii
අඞගරාජ viii
අඞගුත්තරාප දනව්ව iii
අඞගුලිමාල දමනය 188
අචිරවතී x
අච්චිමන්තු 2
අජාතශත්‍රු xviii
අජාසත් කුමරු රජ වීම 207
අජාසත් රජු සස්නැ පැහැදීම216
අජිත රට xxx
අංජන රජ 6
අංජන වන xii
අඤ්ඤාත කොණ්ඩඤ්ඤ 86,339
අට වන වස 159
අටොළොස් වන වස 184
අට්ඨක නගර xxxi
අතුරිත චාරිකා 298-300
අනත්ත ලක්ඛණ දේශනාව 92
අනඳ තෙරුන් අග්‍ර උපස්ථායක වීම 191,192
අනඳ තෙරුන් ගේ ආයාචනය (කපක් වැඩ ඉන්නට)285
අනමතග්ග කථාව 349
අනාගාමී මග්ග ඤාණය 328
අනාථපිණ්ඩික xi
අනාලය vii
අනූපිය xxiii
අනුරුඩ xxiii
අනේපිඩු සිටු නිවෙස 134
අනේපිඩු සිටු බුදු රජුන් වෙත යෑම 130
අනේපිඩු සිටු විහාරකැරැවීම 133
අනෝමනාම 340
අනෝමා xxiii
අන්තිම බුද්ධ වචනය 291
අන්තිම බුද්ධ ශ්‍රාවකයා 290
අන්තිම වස 281
අන්ධකවින්දගම vi
අන්ධකවින්ද සූත්‍රය vi
අන්ධ වනය xii
අපර ගෝතම බ්‍රාහ්මණ 134
අපරාන්ත රට xxx
අපරිහාණිය ධර්ම 274
අභිඥපාදක ධ්‍යානය 345
අම්බ තීර්ථය xxiii
අම්බපාලි වනය xx
අම්බලට්ඨිකාව v, 275
අම්බසණ්ඩා නිගමය vi
අයෝධ්‍යා පුරය 2, x, xii
අරුණවතී විහාරය vii
අලහබාද් xxiv
අවන්ති පුත්‍ර xxvi
අල්ලකප්ප රට xxx
අවන්තිපුත්‍ර xxvi
අවන්ති රට xxiii,xxvii,176
අසදෘශ මහාදානය 203
අසිතංජන නුවර xxix
අසිත දේවල 11
අසිතර්ෂීන් බෝ සතුන් දක්නට ඊම 15
අසූ මහ සව්වෝ 305
අස්සක රට xxvi
අස්සජී තෙරණුවෝ 108
අස්සපුර iii
අහිච්ඡත්‍ර xxv

ආ

ආඥාත කෞණ්ඩින්‍ය ix

ආදිත්ත පරියාය සුත්ත vii, 103
ආදීනවඤාණය 326
ආනන්ද xxiii, 127,150,159
ආනන්ද බොධිය 195
ආනන්ද ශ්‍රෙෂ්ඨි සමාගමය 261
අනෙඤ්ජසප්පාය xxv
ආමගන්ධර්ෂි 137
ආයතන ෂට්ක දෙක 340
ආර්‍ය්‍යාෂ්ටාංගික මාර්ගයේ අංග338
ආලාර කාලාම උද්දකාරාමපුත්‍ර 49, 50, 337
ආළවක දමනය 180
ආළවී රට xix
ආශ්චර්‍ය්‍ය ධර්ම (මුහුදේත් සස්නේත්) 195

ඇ

ඇසළ උළෙල 11

ඉ

ඉක්ෂ්වාකු 2
ඉච්ඡානංගල xiii
ඉන්දපත්‍ථ xxiv
ඉන්දසාලගුහා v
ඉන්ද්‍රප්‍රාත් xxiv
ඉන්ද්‍රශාලගුහා v
ඉෂ්ටකාවතී vii
ඉසිගිලි iv

උ

උක්කවේලා 284
උක්කට්ඨා xiii
උක්කල xxviii
උග්ගපුර iii
උග්ගසේන 146
උජ්ජේනි xxvii, 177
උත්තරකා xix, xxx, 278
උත්තරකුරු ii
උත්තර කෝශල x
උත්තරාධ්‍යයන සූත්‍ර xxv
උද්ඝාටිතඥාදීහු 336
උද්දේශික චෛත්‍ය පූජා 196
උද්‍රක viii,49
උදක වන xxiv
උදය බමුණා 175
උදයව්‍යය ඥානය 326
උදාන ගාථා 328, 335
උදායන රජ xi
උදේන xxiii
උදේන රජ xi,xx,168
උපක ආජීවකයා 80
උප ග්‍රන්ථය 311
උපතිෂ්‍ය 108, 110
උපත් හැටියේ ම කථා කළ අය 316
උපවත්තන xxii
උපවාන තෙරණුවෝ 288
උපවාන බ්‍රාහ්මණ 134
උපස්ථායක තෙරවරු (බුදුරජුන්ගේ) 191
උපස්ථායක (නිත්‍ය) 191
උපාලි xxiii,
උබ්බතක xxii
උරුවිල්වාකල්ප vii
උරුවේලකප්ප vii
උරුවේල කස්සපාදීහු 102
උරුවේලා ජනපදය vi
උල්කාමුඛ 2
උසභ කුලපුත්‍රයා 134
උළුම්ප xviii, 273

ඍ

ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය තහනම 155
ඍෂිගිරි iv
ඍෂිදත්ත 177

එ

එකුන් විසි වන වස 18ь
එකොළොස්වන වස 174

එක් විසි වන වස 191

ඒ

ඒකනාලාගම viii, 174
ඒකුද්දානීය 134
ඒනිජංස 340
ඒරකපත්‍ර නාග 97
ඒසුකාරී xii
ඒහිභික්ඛුපසම්පදාව 86

ඔ

ඔක්කාක 2
ඔක්කාක වංශය xxii
ඕස 340
ඕපසාද xiii
ඔරිස්සා xxviii
ඕවාදපාතිමොක්ඛය 193

ක

කක්කරපට්ට xix
කච්චායන බමුණා 176
කජංගලා iii
කඤ්ඤකුජ්ජ 176
කටමෝරකතිස්ස 212
කණ්ටකිවන xii
කණ්ඩරායන 177
කරකණ්ඩ 2
කපිලර්ෂි 3
කපිලවාස්තු xiv, xv
කම්පිල්ල xxv
කර්ණික 2
කර්මය (කළයුතු)350
කරකණ්ඩු රජ xxix
කල්පකෝලාහලය 8
කල්ලවාලමුත්ත ගම vi
කසීභාරද්වාජ සූත්‍රය viii, 174
කාංචන වනය 177
කාංචනා 6
කාන්‍යකුබ්ජ xxv
කාපථික xiii
කාම්බෝජය xxix
කාශ්‍යපාශ්‍රමයේ පෙළහරවල් 342
කාලක xii
කාලකාරාම xii
කාලදේවල 317
කාල සිටු පුත් 227
කාලාමයනට දම්දෙසුම 198, 199
කාලි xxviii,89
කාලුදායි ගමන වණිනා 117
කාසිරට ix
කාළසිලාව v
කිපිල්ලිකා නදිය xxxi
කිඹුල්වත් පුර තොරතුරු (මහභිනිෂ්ක්‍රමණයට පසු)46
කිඹුල්වත් පුර යෑම (මායා දේවින්) 14
කිම්බිල xxiii, 127
කිරිමවුන් සෙවීම (බෝසතුනට) 18
කිසාගෝතමී 246, 319
කීකටසඨාන viii
කුක්කුටාරාම xxiv
කුටිකණ්ණ සොණ177
කුෂ්ඨරෝගී භික්ෂුවකට (බුදු උවටන්) 247
කුකාලි xi
කුණ්ඩග්‍රාම xx
කුණ්ඩ පුරය xx
කුමාර කාශ්‍යප මාතෘ 241
කුරර සර නුවර xxvii,xxviii,177
කුරු රට xxiv, xxv
කුෂ්ට රෝගියකුට (බුදු උවටන්)247
කුශාවතී xxii, 2
කුසිනාරා xxii, 287
කූටාගාර xx

කෘතඥතාය 339
කෘශ 340
කෘශාගෞතමී 34
කෘෂ්ණ 2
කේකය iv
කේණිය 113
කේවට්ටද්වාරගම x
කේසපුත්ත xiii,xxxi,198
කොල්ලාග xxi
කොසඹෑ පුරය xxiv
කොසඹෑපුර විහාර කැරැවීම 163
කොසඹෑ වැසි කලහකාර මහණුනු 172
කොසොල් රජු තෙරුවන් සරණ යෑම 151
කොහානා xiv
කෝකාලික භික්ෂු 213
කෝකාලික රට xxx
කෝටි ග්‍රාමය xx
කෝමාරභච්ච 216
කෝරක්ඛත්තිය 278
කෝරබ්බ xxiv
කෝලාහල තුන 8
කෝලිත 108
කෝලිය නගර 5
කෝලිය වංශය 5
කෝලිය මහාමාත්‍ය x
කෝලියවංශය 5
කෝසම්බි පුරය xxvii, 166
කෝළ නගර xix
කෞරව xxiv

ඛ

ඛාතු මත viii
ඛුජ්ජුත්තරා 168
ඛෙමා 154
ඛෝමදුස්ස xviii

ග

ගණ්ඩකී xx, xxii
ගණ්ධාරය xxviii
ගමන මාර්ග xxxi
ගයා vii
ගයා තීර්ථ vii
ගයා ශීර්ෂ 342
ගර්ගරා පොකුණ iii
ගැරඩියෙකු පෙළ් දරුවනට අවවාද 240
ගරහ දින්න සමාගමය 262
ගිජ්ඣකූට iv
ගිංජකාවසථ xxi
ගිරිව්‍රජපුරය iv
ගුරුමුෂ්ටි 282
ගොවියකු බුදුරජුන් නිසා මරණ දඬුවමින් මිදීම 237
ගෝත්‍රභූ ඤානය 315
ගෝතම xix, 2
ගෝතමක චේතිය xx
ගෝතම කන්දරය iii
ගෝධාවරී xxvi, xxvii
ගෝනද්ධ පුරය xxviii
ගෝරක්පූර xxii
ගෝමග්ගසිංසපා වනය xix
ගෝසිංග සාලවනය xxi
ගෞතම තීර්ථය vii, 277
ගෞතම ද්වාරය 227

ඝ

ඝෝෂිතාරාමය xxiv, 166

ච

චක්‍රවර්ත්ති කෝලාහලය 9
චංකී බ්‍රාහ්මණ xiii
චණ්ඩපජ්ජෝත xxiii, xxvii,176
චතුරංග වීර්යය 324

චන්ද කින්නර ජාතකය 346
චම්පා පුරය iii, viii
චර්මන්වතී xxvii
චාතුමා xviii
චාන්දන් නදිය iii
චාපාල xx
චාරිකා (බුදු රජුන්ගේ) 298,299
චාලිකා xxxi
චිංචි මානවිකා xi
චිත්ත විශුද්ධිය 323
චිත්‍ර ගෘහපති 177
චිත්‍රා 106
චුන්ද කර්මාර පුත්‍ර xxiii, 286
චුන්දත්ථිගාම x, 249
චුල්ලසුභද්දා සමාගම 201
චේති (චේදි) රට xxiii
චෛත්‍ය තුන 196
චෝරපපාත පර්වතය iii, v

ඡ

ඡත්ත (ඡාත්‍ර) මානවක 255

ඤ

ඥාතපුත්‍ර නිර්ග්‍රන්ථ 52
ඥාත පෙලපත xxii
ඥානදර්ශනය (ද්වාදශවිධ) 339
ඥානදර්ශන විශුඩිය 327
ජටාධර තවුසෝ තිදෙන 102
ජන්තු 3
ජනපද 3
ජනක් පූර් xxi
ජම්බුකාජීවික සමාගමය 129
ජයපූර් xxvi
ජයසේන 6
ජරාජීර්ණාදීන්වශයෙන්
පෙනුණෝ 320
ජානුස්සෝණී xii
ජාලිකාපුර xxxi
ජීවකම්බවනය v, 197
ජේන්ත කුමාර vi
ජේන්ත ගාම vi
ජේතවනාරාමය xi, 134
ජෛන සමය xxi

ට

ටංකිත මඤ්චය vii
තක්ෂසිලා xxviii
තනතුරු ලත් උපාසකවරු 308
තනතුරු ලත් උපාසිකාවෝ 309
තනතුරු ලත් භික්ෂූහු 306
තනතුරු ලත් භික්ෂුණීහු 308
තපුස්ස භල්ලික xxviii, 77, 335
තපෝද කන්දරය v
තපෝදාරාමය v
තල් වනය (රජගහ පුර)v, 105
තල්වනයේ තුගරුක 343
තවුසන් මුළුවක් බුදුරජුන් වෙත
යෑම 164
තාමලිත්ති පටුන xxxii
තිස්ස රජ xxx
තිස්ස රජුට බිම්සර රජු යැවූ ලියුම
140
තුදුස්වන වස 179
තුරිත චාරිකා 298
තෙළෙස්වන වස 178
තෙවෙනි වස 129
ත්‍රිවිධ කල්‍යාණ ධර්මය 341
ත්‍රි ශාලා xxii

ථ

ථුල්ලකොට්ඨිතගමxxv
ථුල්ල නන්දා 212
ථූනග්‍රාම xiii

ද

දක්ෂිණ කෝශලය x

දක්ෂිණාගිරිය viii, 174
දක්ෂිණාපථය xxvi
දණ්ඩකප්පක xiii
දම්සක් දෙසීම 341
දඹදිව I
දස වැනි වස 171
දත එල 205
දීඝ නඛ v
දීගරාජි vii
දීඝ ලම්බක පුරය xxxi
දීඝිතිකෝසල ජාතකය 169
දීර්ඝායුෂ ලද්දවෝ (සත්තු) 310
දුගියකුට ආහාර දෙවා දම් දෙසීම 183
දුර්නිමිති (මාර සංග්‍රාමයට පෙර) 64
දුස්සපවාරික සිටු v
දුක්ඛ නිරෝධ සත්‍යය 339
දුක්ඛ නිරෝධගාමිනී පටිපදා සත්‍යය 339
දුක්ඛ සත්‍යය 339
දුක්ඛ සමුදය සත්‍යය 339
දෙවෙනි ධර්මදූත පිරිස 101
දෙවෙනි ධර්ම දේශනාව 90
දෙවෙනි වස 128
දෙවෙනි සතිය (බුදුවීමෙන් )329
දෙව්දත් කුමරු ගේ අරගල 20
දෙව්දත් තෙර 205
දෙව්දතු ඉල්ලූ වස්තු පස 212
දෙව්දතු ගිලන් වීම 214
දෙව්දතුගේ සංඝභේදය 212
දෙව්දතු පොළොවැ ගිලීම214
දෙව්දතු බිම්සර රජු මරවන්නට උපාය යෙදීම206
දෙව්දතු බුදුරජුන් නසන්නට තැත් කිරීම 208, 209
දෙව්දතු යශසින් පිරිහීම 211
දේවදත්ත xxiii
දේවදහ පුර xviii
දේවදහ ශාක්‍ය 6
දේවසන්නිපාතය(බෝසත් උපත)13
දේවායාචනය 9
දොළොස්වන වස 175
ද්‍රෝණවත්ථු xviii
ද්‍රෝණ බමුණු 239
ද්‍රෝණ ස්තූපය 354
ද්වාරකා පුර xxix

ධ

ධනපාල සමාගමය 210
ධම්මකොණ්ඩ පුර xxi
ධර්මගාම්භීර්යය සැලැකීම 335
ධර්මචක්‍රප්‍රවර්ත්තනය 83
ධර්මදේශනා ක්‍රම (බුදුරජුන්ගේ)300
ධර්මපුරි xii
ධර්මපත්තන xii
ධර්මය ලියැවීමක් 177
ධර්මයේ ශාස්තෘභාවය 291
ධර්මසුධර්මත්වය 340
ධර්මදර්ශී දේශනාව 277
ධර්මාරාම ස්ථවිර 282
ධාතු බෙදීම 294, 354
ධ්‍යානය සිස් නොකිරීම 340

න

නගරවින්ද xiii
නග්ගති (නග්නජිත්) xxix
නන්ද උපත 18
නන්ද කුමරු පැවිදි කිරීම 124
නන්ද භික්ෂු නම135
නන්දන වනය 10
නන්දයන්ගේ පහයේ වදළ මංගල ගාථා 346
නන්දා මෙහෙණ 277

නමි රජ xxix
නරසීහ ගාථා 346
නමිද xxvi
නමිද (ඡන්න භායනීාව) 46
නමිද නදී තෙර බුදු පා සටහන
නලේරු කොසොඹ රුක 175
නව වන වස 168
නාගරක xviii
නාඩිවාක්‍ය 314
නාතික xxi
නාමකරණ මංගලය 16
නාලක කුමරු 16
නාලක තෙරුනට මෝනෙය්‍ය වත දෙසීම 94
නාලන්දා නුවර vi
නාලාගිර දමනය 210, 211
නිගණ්ඨනාතපුත්ත v
නිග්‍රෝධමිග ජාතකය 243
නිපුර 2
නිමිත්තපාඨක බමුණෝ 317
න්‍යුංබ ජාතික බ්‍රාහ්මණ 330

ප

පංකධා xiii
පංචවිලෝකන 9
පංචශාලා viii
පංචාල දේශය xxv
පටාචාරා 243
පටිච්චසමුප්පාදය 329
පටිසංඛානුපස්සනා ඤාණය 326
පණ්ඩුපුර xiii
පතිට්ඨාන xxvi
පදරියා xiv
පපාතපබ්බත xxvii
පයාගපතිට්ඨාන xxiv
පරන්තප xxiii
පරිනිර්වාණ වර්ෂය 278
පසුබත්කිස (බුදුරජුන් ගේ)297
පසේනදී කොසොල් රජ xix
පසේනදී ඡත්තපාණී සංවාදය 225
පසොළොස්වන වස 179
පස්වන වස149
පස්වැගි තවුසන් බෝසතුන් හැර යෑම
පස්වැගි මහණුන් රහත්වීම 94
පළමු උපාසකයා (තෙරුවන් සරණ ගිය)95
පළමු උපාසකවරු දෙරුවන් සරණගිය)77
පළමු ධම්දූත පිරිස 99, 341
පළමු වස් වුසුම 86
පළමු උවැසිය (තෙරුවන් සරණ ගිය) 89
පාටලී ග්‍රාමය vii
පාටලීපුත්‍ර නගරාරම්භය 276
පාධිකපුත්‍රිය භක්ත සමාගමය 278
පාණ්ඩව පර්වතය iv
පාතියන්ථ රට xxx
පාරාසරිය iii
පාරිභොගික චෛත්‍ය පූජා 196
පාරිලේය ඇතුගේ උවටන් 171
පාර්ශ්වනාථ xxi
පාවා xxii
පාවාරිකම්බවනය vi, xxiv
පාෂාණක චෛත්‍යය vi, xxvii
පිංගලකොච්ඡ xii
පිණ්ඩොලභාරද්වාජ xxiv
පිප්ඵලී ගුහාව v
පිප්ඵලී වනපුර xxxi
පිරිනිවන් මංචකයෑ බුදුරජුන් සැතැපීම 288
පිහිතාසව 52
පුක්කුස මල්ල කුමරු පැහැදීම287

පුක්කුසාති රජුට බිම්සර යැවූ ලියුම 138
පුක්කුසාති රජු මහණ වීම 140
පුණ්ණ කෙලෙඹියා 160
පුණ්ණ තෙර 129, 161
පුණ්ණමන්තානිපුත්ත 129
පුතුන් විසින් පිටමං කළ බමුණා 234
පුරාණ ජටිලයෝ vii
පූර්ණදසි 246
පූර්වාරාම පූජාව xi, 192
පෙරබත් කිස (බුදුරජුන්ගේ) 296
පෙරයම් කිස (බුදුරජුන් ගේ) 297
පේශකාර ගම x
පේශකාර දුහිතෘ සමාගමය 184
පොක්ඛරවතී xxviii
පෝතන xxvi
පෝතල 2
පෝතලී xxvi
පෞදන්‍ය xxvi
ප්‍රජාවතී ගෞතමී xvi, 7, 19
ප්‍රජාවතී ආදීනට බුදුරජුන දම් දෙසීම 122
ප්‍රජාවතී ගෞතමීන් පිදූ වස්ත්‍රය 348
ප්‍රජාවතී ආදීන් පැවිදිවීම 150
ප්‍රජාවතීන් ආදීන් පිරිනිවීම 286
ප්‍රත්‍යවේක්ෂණ ඥානය 328
ප්‍රථම පාරාජික ශික්ෂාපදය පැණවීම 193
ප්‍රථම බුධ වචනය 328
ප්‍රථම මහා සමාගමය 83
ප්‍රපාත පර්වතය 177
ප්‍රයාගය xxvi
ප්‍රයාග ප්‍රතිෂ්ඨානය 176
ප්‍රසේනජිත් රජ 225
ප්‍රේතයනට පින් පෙත් දීම 107

## බ

බකබ්‍රහ්ම සමාගමය 257
බණ්ඩල්කණ්ඩ් xxiii
බදරිකාරාමය xxiv
බන්ධුල xxii
බබිලෝනිය xxxii
බමුණකු ගේ ප්‍රශ්නයක් (බුදුවීමෙන් පස්වන සතියේ)74
බාරාණසී ix, 2
බාලකලෝණකාරගම xxiv, 170
බාවරී xxvii
බාවෙරු xxxi
බාහිය රට xxx
බිම්බිසාර රජ viii
බිම්බිසාර රජුගේ ප්‍රාර්ථනා පස 106
බිම්බිසාර රජු ගේ මරණය 208
බිම්බිසාර රජු හා පිරිස තෙරුවන් සරණ යෑම 46
බීරණත්ථම්භ 278
බුදුරජුනට මරහුගේ තර්ජනයක් 75
බුදුරජුන් අම්බගාමය පසුකර වැඩීම 286
බුදුරජුන් අම්බලට්ඨිකාවට වැඩීම 275
බුදුරජුන් අම්බලට්ඨිකාවෙන් නාලන්දාවට 275
බුදුරජුන් ඉසිපතන් වැඩීම 81
බුදුරජුන් උරුවේලාවට වැඩීම
බුදුරජුන් උරුවේලාවෙන් පිටත්වීම 80
බුදුරජුන් කිඹුල්වතට වැඩීම 119
බුදුරජුන් කිඹුල්වතැ පිඩු සිගා වැඩීම 121
බුදුරජුන් කුකුත්ථා නදිය කරා වැඩීම 287

බුදුරජුන් කුසිනාරාවට වැඩීම 287
බුදුරජුන් කූටාගාර ශාලාවට
වැඩීම285
බුදුරජුන් කෙත පාළුව හොත්
බමුණා සැනසීම 231
බමුණා සැනැසීම 231
බුදුරජුන් කෝටිග්‍රාමයට වැඩීම
277
බුදුරජුන් ගිලන් වීම 286
බුදුරජුන් චාපාල චෛත්‍යයට
වැඩීම 284
බුදුරජුන් ඥාතික ගමට වැඩීම
277
බුදුරජුන් පාටලීගමට වැඩීම 276
බුදුරජුන් පාවා නුවරට වැඩීම
286
බුදුරජුන් පිරිනිවීම 292
බුදුරජුන් බේළුව ගමැ වස් වීසීම
281
බුදුරජුන් භාණ්ඩ ගාමයට වැඩීම
286
බුදුරජුන් මධුරාපුර වැඩීම 175
බුදුරජුන් යශෝධරාවන් දක්නට
වැඩීම 122
බුදුරජුන් රජගහපුර වැඩීම 284
බුදුරජුන් ලක්දිව් වැඩීම 104, 152
164
බුදුරජුන් වස් වුසු තැන් 301
බුදුරජුන් විසල් පුර වැඩීම 277
බුදුරජුන් සත් සති ගෙවීම 72, 77
බුදුරජුන් සැවැත්පුර වැඩීම 133
බුදුරජුන් සුනාපරන්තයට වැඩීම
63
බුදුරජුන් ගේ පළමු උදනය 72
බුදුරජුන් ගේ පැසිම් යම් කිස298
බුදුරජුන්ගේ ලක්දිව් ගමන 152
බුදුරජුන්ගේ මැදුම් යම් කිස 297
බුදුවීමෙන් දෙවෙනි සතිය 329
බුධකෘත්‍ය පස 296
බුධ කෝලාහලය 8
බුධගයාව vii
බුධ චරිතයේ අග්‍ර දවස් 309
බුධ ජන්ම පත්‍රය 314, 315
බුධ ශරීරයෙහි පිළිපැදිය යුතු
සැටි 288
බේසාර් xx
බේළුව ගම xx
බෝධි මණ්ඩය vii
බෝධිරාජකුමාර xxiii, 159
බෝසත් උපත 13, 314
බෝසතුන් අජපල් රුක් වෙතැ
වැඩීම 61
බෝසතුන් අප්‍රාණකධ්‍යානය
වැඩීම 52
" අබිනික්මන නවත්තන්නට
ශාක්‍ය රජුන් තැත් කිරීම 36
" නෑ කුමරුවන් හා ගමන්
අත්හැරීම 21
" අනුපිය වනයට යෑම 42
" ඇදුරන් සොයා යෑම 42
" ආලාරකයන් වෙතැ යෑම 48
" උද්‍රකයන් වෙත යෑම 49
" උයන්කෙළි ගමන 30
" උපන් කෙණෙහි සත් පියක්
වැඩීම 316
" උපන් කාල වේලාදිය
නාඩි වාක්‍ය අනුව 314
" උරුවෙල් දනවු වැඩීම 51
" කය සැතැප්වීම 58
" කැඳවා ගෙනෙන්නට දූතයන්
යෑම 47
" ගිහිගෙන් නික්ම වැඩිය තැන්
42
" දක්නට බිම්සර රජු යෑම 44

බෝසතුන් දුටු සීන පස 60
" නිපැයූ අක්ෂර විශේෂය 319
" පවත්ත ඵලභෝජී වීම 52
" පැවිදිවීම 40
" පිය රජු හා සාකච්ඡාව 35
බෝසතුන් පිළිසිඳුම 12
" බිලි පූජා නැවැත්වීම 45
" බෝ මුල වැඩ හිඳීම 61
" බෝ රුක වෙත වැඩීම 61
" භද්‍ර වනයේ දිවා විහරණය 62
බෝසතුන්ගේ අල්පාහාරතාව 53
" ආවාහ මංගලය 23
" ත්‍රිවිද්‍යාලාභය හා බුදුවීම 71
" උපස්ථායිකාවෝ 321
" ක්ලෙශතාපක ව්‍රතය 53
" ගිහි ජීවිතය 23 - 30
" දුෂ්කර ක්‍රියා 322
" නාමය 317
" ප්‍රතිසන්ධිය 11
" ප්‍රාසාද තුන 22 - 23
" බෝමුල් වැඩ හිඳුම 63
" මිතුරෝ 318
" සිංහ නාදය (උපන්කෙණෙහි) 14
" මාර තර්ජනය 64
" ළමා විය 19
" ශ්‍රමණ රූප දර්ශනය 25
බෝසතුන් මහණ රුව දැකීම 33
" මහළු රුව දැකීම 31
" මිණියක් දැකීම 32
" මුසපත්වීම 53
" රජගහපුර පිඬු සිඟා වැඩීම 43
" ලෙඩෙකු දැකීම 31
" විතර්ක විමැසීම 58
" වෙත පස්වැගි තවුසන් ඊම 50
" වෙත වසවත් මරහු පැමිණීම 56
බෝසතුන් ශිල්ප දැක්වීම 319
" සමාදන් ව ගත් ශීලය 321
" සිප්සතර ඉගැන්ම 19
" සිරුර කෙට්ටුවීම 54
" සිවුරු පිරිකර ලැබීම 41
" හත් පාංශුකූල සිවුර 323
" හා එක් ද උපන්නෝ 314
" ළමා විය 19
බ්‍රහ්මදත්ත viii, 134
බ්‍රහ්මජාල සූත්‍රය iv
බ්‍රහ්මයාචනය 79
බ්‍රාහ්මී අක්ෂර 319

## භ

භග්ග ජනපදය xxiv
භග්ග රට වැඩීම (බුදුරජුන්) 111
භංගානු පස්සනා ඤාණය 326
භට්ටිය රජ viii, xxii
භණ්ඩ ගාමය xx
භද්දවතිකා පුර xxiii
භද්දවතී රට xxx
භද්දසාල ජාතකය xxii
භද්දිය xxiii
භද්දිය පුර වැඩීම (බුදුරජුන්) 113
භද්දියාදි ශාක්‍යයන්මහණවීම127
භද්‍රවතිකා ඇතින්න 168
භද්‍රවර්ගික කුමාරවරු 100
භද්‍රාකාපිලානි 115
භයතොපට්ඨාන ඤාණය 326
භරුකච්ඡ පුරය
භාග්‍යවතුන් වහන්සේ ගුරුවරයකු පත්කැර. ගැන්ම 76
භාග්‍යවතුන් වහන්සේ ලක්දිව වැඩීම 104
භාග්‍යවතුන් වහන්සේ උරුවෙල් දනවු වැඩීම 101
භාරද්වාජයන් පැවිදිවීම 144

භික්ෂූන් පාරිලෙය්‍ය වනයට යෑම 170
භූමිකම්පා හේතු 285
හෑගු xxiii
හෑගුතෙරණුවෙෝ 170
හෙසකලා වනය xxiv

ම

මක්කරකටක xxvii, 177
මගධරට iv
මංඛලිපුත්‍ර ගෝසාල xii
මංගලසූත්‍ර සමාගමය 138
මච්ඡදේශය xxvi
මච්ඡිකාසණ්ඩ නුවර 177
මට්ටකුණ්ඩලී සමාගමය 265
මණ්ඩුකදේවපුත්‍ර සමාගමය 260
මත්ස්‍ය රට xxvi
මද්ද කුච්ඡි මිගදය v
මද්රදේශය xxix
මධුරා xxvi
මධ්‍යම දේශය i
මධ්‍යම ජනපදය i
මනසාකට xiii
මරහු බුදු රජුන් බිය ගන්වන්නට තැත් කිරීම 75
මල්ල රට xviii
මල්ල රජ කුමරුන් පැවිදිවීම 120
මල්ල රජුන් එක්රැස්වීම 290
මහළු සැඩොලියකට බුදු පිහිට141
මහාකාශ්‍යප පැවිද්ද 115
මහාකෝශල xix
මහාගෝවින්ද iv
මහාතිත්ථගාම xiii
මහා ධම්පාල ජාතකය 126, 346
මහානාම ශාක්‍ය සංඝොපස්ථාක 178
මහානාරද කාශ්‍යප ජාතකය 105, 343
මහා නිදන සූත්‍රය xxv
මහා පදේශ සතර 353
මහාපුරුෂ ලක්ෂණ විද්‍යාව 7, 340
මහාභිනික්‍රමණය 38
මහාමායා ගෞතමී 7, 17
මහාරාහුලෝවාද සූත්‍රය 179
මහාලී රජ 105
මහාවීර xxii
මහාසතිපට්ඨාන xxv
මහා සම්මත රජ 1
මහා සමාගම් සූවිස්ස 303
මහාසුදර්ශන සූත්‍රය 289
මහාසුප්‍රබුධ 6
මහේශ්වරසේන 2
මහෝදය xxv
මාගන්දිය බමුණා 167
මාගන්දිය xxv, 167
මාතංග පසේ බුදු රජ 13
මාතිගාම 13
මාතුපොසක ජාතකය 237
මාතුපොසක බමුණා 146
මාතුලාපුර xxxi
මාතෘ දිව්‍ය පුත්‍ර xi, 19
මාන්ධාතෘ xxviii
මායාගෞතමී 7
මායා දේවි පුතුගේ විලාපය 321
මායාදේවිය ගැන සකු බණ පොත්හි 314
මායාදේවින් දුටු සිහිනය 11, 314
මයාදේවියගේ අශෝක වන ගමන 314
මායාදේවිය දෙව්පුතකු වීම 318
මායා දේවියට තැන වූ විශේෂ ප්‍රාසාද 314
මාර තර්ජනය (බෝසතුන් ගේ උත්තරය) 331
මාරදූන් ආ පුවත 331

මාරපාසය 340
මාරසංග්‍රාමය 63
මාරසේනාව 45
මාරායාචනය (පිරිනිවනට) 284
මාර්‍ග සත්‍යය 339
මාලව දේශය xxvii
මහාහිස්සති පුරය xxvi, xxviii
මිගාවීර xxiv
මිථිලා xxi, 2
මිසදිටු දරුවන් පැහැදැවීම 240
මුගලන් පිරිනිවන 283
මුච්චිතුකම්‍යතා ඤාණය 326
මුණ්ඩනිගමය xxxi
මූලක ජනපදය xxvi
මෙහෙණි සස්න ඇරැඹීම 150
මෛත්‍රෙය බෝධිසත්ව
මෛත්‍රෙයබෝසත් හට කිරුළු පැලැන්දීම 314
මෛත්‍රෙය බෝසතුන් පැවිදිවීම 158
මෛත්‍රෙය බෝසතුන් විවරණ ගැන්ම 158
මොනෙය්‍ය වත 94,
මෝරනිවාපය v
යමා මහ පෙළහර 119. 156
යමුනා xxiii
යශොධරා 6
යශොධරාවන්ගේ ව්‍රතසමාදන 55
යශොධරාවන් මහණවන්නට තැත් කිරීම 124, 126, 150
සස කුල පුතු පැවිදිවීම 95
යස කුල පුතුගේ යහළුවන් පැවිදිවීම 97
යුධිෂ්ඨිර xxiv
යුවනාශ්ව xii
යෝගාසන 324, 325
යෝධයන් තණ ගසක් හිසැපැලැඳ යෑම 322

ර

රජගහපුර iv
රජගහපුරට බුදුරජුන් වැඩි මුල් ගමන 105
රජගෙයි බණ ඉගැන්වීම 226
රජ්ජුමාලා 232
රට්ඨපාල සූත්ත දේශනාව xxv
රත්සඳුනින් විහාර කැරැවීම 162
රජ්ති xii
රහතුන් එක් සැට නමක් 97
රාජකාරාමය xi
රාජ්ගිර් iv
රාජ්පූර් xxix
රාමග්‍රාම xviii
රාමරජ 4
රාමර්ෂි viii
රාම්නගර් xxv
රාහුල ප්‍රව්‍රජ්‍යාව 124
රාහුල ශබ්දර්ථය 320
රාහුල හිමි රහත් වීම 179
රාහුලෝපසම්පදව 179
රුක්ඛොපම සූත්‍රය xxv
රුග්මිනී xvii
රුම්න්දයි xvii
රුවන්ගෙ (රතනඝර) 330
රෝරුක පුරය xxx
රෝහණවත්ථු vii
රෝහිතවත්තු vii
රොහිණී නදිය xv

ල

ලක්දිව් වැඩීම (බුදුරජුන්) 104, 152, 164
ලංකාවතාර සූත්‍රය 342
ලංකාවේදී වදළ බණ 342
ලටුකික ජාතකය 169
ලට්ඨි වනය v

ලිච්ඡවි xvi
ලුම්බිනී උයන xvii, 6
ලුම්බිනී ගමන (මායා දේවින්)12
ලුම්බිනී වනයෙන් මායා දේවීන් පරෙළා ඊම 317
ලෝහිච්ච xiii
ලෝහිතපක්ඛන්දිකාව 281

ව

වච්ඡපාල 105
වච්ඡබ්‍රාහ්මණ 105
වජ්ජි රට xx, xxi, 193
වජ්‍රාසනය 325
වට්ටක ජාතකය දෙසීම 169
වත්ස රට xxiii
වඳුරකු ගේ පූජාවක් 171
වප්ප ආදී තවුසන් ශ්‍රාවක වීම92
වප් මඟුල 18, 318
වර්ධ ග්‍රාමය 177
වර්ධමාන xxii
වරණා ix
වරාහගිර iv
වංශ දේශය xxiii
වාක්‍ය 7
වාසභ ගම 249
වාසිට්ඨී 243
වාසුලත්තා xxiii
වාසෙට්ඨ xxii
විචිකිච්ඡාව 325
විඩූඩභ xvi
විඩූඩභ ශාක්‍ය යුධය 271
විදේහදත්ත xxii
විදේහ රට xii, xvi
විපුලගිරි iv
විමුක්ති සැප 318
විමුඛ රජ xxix
විරාට පුර xxvi
විරූඪක xvi
විරූඪක ඉක්ෂ්වාකු 2
විවාදකාරී භික්ෂූන් සැවතට ඊම 174
විශාඛා xi, 113
විසිවන වස 188
වෘෂභගිරි iv
වෙස්සන්තර ජාතකය 120
වෛඨදීපක xxx
වෛඨදීප රට xxx
වෙත්‍රවතී xxviii
වෙදනාපරිග්ගහ සූත්ත v
වෙදියක පර්වතය v
වෙදිසා xxviii
වෙනාගපුර xiii
වෙපුල්ල iv
වෙභාර iv
වෙරංජාපුර xxvi, 175
වෙසාලී xx
වෙළුකණ්ටකී නන්දමාතා 174
වෙළු කණ්ටකී පුර xxv
වෙළුවනාරාමය v, 106
වෛභාරගිර iv
ව්‍යග්ඝපජ්ජය xix
ව්‍යාඝ්‍රපද්‍ය xix

ස

සකදගාමිමග්ගඤාණය 327
සක්කපඤ්හසුත්ත දේසනා vi
සක්ඛරා නිගමය xiii
සක්දෙවිඳු ගැයූ බුදුගුණ ගී 343
සක්දෙවිඳු ගේ පූජාවක් 77
සක්දෙවිඳුගේ බුද්ධොපස්ථානය 281
සංකස්ස පුරය xxxii
සංඛාරුපෙක්ඛා ඤාණය 326
සංගාරාව xii
සංගීති සුත්තය xxiii
සංග්‍රහ වස්තු 1

සංඝභේදය 169
සච්චබද්ධ(පර්වතය) 163
සච්චානුලෝමික ඥාණය 326
සජ්ජනෙල xix
සඤ්ජය v, 112
සට්ඨිස්සර පසේ බුදුරජ් 215
සතානුස්සාරි විඤ්ඤාණය 322
සතිපට්ඨාන සූත්ත දේසනා xxv
සතලොස් වන වස 182
සත්කාය දෘෂ්ටිය 325
සත්තපණ්ණි ගුහා v
සත්තම්බ චේතිය xx
සත්තානුපස්සනා වීථිය 326
සත්‍යඥානය 339
සදනීරා නදිය x
සඳුන්මුවා බුදු පිළිමය xi
සන්තුෂිත 9
සප්පසොණ්ඩික පබ්භාරය v
සප්පිනිකා නදිය vi
සබ්බමිත්ත බ්‍රහ්මණ 134
සමනොළැ සිරිපා ලස 165
සමය ප්‍රවාදක ශාලා ix
සම සිතැත්තේ 340
සම්ඩි සිටු පුත් 105
සමුද්ද දත්ත 212
සරණ ගමන ප්‍රව්‍රජ්‍යාව 346
සරණගමනොපසම්පදව
සරභපරිබ්බාජකාදී සමාගමය 267
සර්වඥ ශ්‍රී දෙහාදහනය 293
සර්මිත්‍ර ගුරුතුමා 318
සවන වස 154
සහජාති xxiii, xxxii
සහම්පති බ්‍රහ්මායචනය 378
සහම්පති (බුදු පිරිනිවනේ දී)
ගැයූ ගී 292
සහෙත් මහෙත් xii
සළම්ණි සැය 320
සාකේත x, xii
සාකේත බ්‍රාහ්මණ 253
සාගල පුර xxix
සාතාගිර 339
සාපූග xix
සාමගාම xviii
සාමාන්‍ය දේශනා සමාගම් 304
සාමාවතී 168
සාරථීපුර vii
සාරන්දද චේතිය xx
සාරෝපම සූත්ත xxv
සාලා බමුණු ගම xiii
සාළ්හ භික්ෂු 277
සැඩොලකු පැවිදි වීම 140
සැදැහැවතුන් විසින්
දැක්ක යුතු සතර තැන් 288
සැබෑ බුධ පූජාව 288
සැරියුත් මුගලන් පැවිද්ද 108
සැරියුත් පිරිනිවන 283
සිද්ධාර්ථ xxi
සින්ධු viii
සින්ධු දේශය xxix
සිප් සතර ඉගැන්ම (බෝසතුන්)19
සිරිමන්ත කුලපුත් 134
සිරිමා නගර සෝභිනී 182
සිරිවඩ්ඪ 105, 134
සිවුරු කඩා කැපීම පැණැවීම 175
සිවු වන වස 138
සිළුම්ණි සැය 320
සිංහහනු 6, 311
සිලවතී xviii
සීවක වනය v
සුචිලෝම භවනය vii
සුජාතා චුන්ද දෙදෙනා ගේ
දන් සම ඵල නියාව 353
සුජාතාදීන් තෙරුවන් සරණ යෑම
සුජාතාව දුන් රත්තලිය 323

සුජාතාවන් ගේ කිරිපිඩු දන 61
සුණාපරන්තය xxx
සුණාපරන්ත වාණිජ සමාගමය 163
සුදත්ත 347
සුදින්නයන් පැවිදිවීම 178
සුද්ධොදන රජු 149, 344, 345
සුන්දරික භාරද්වාජ දමනය 228
සුන්දරී පරිව්‍රාජිකා 197
සුප්පාරකය xxx, 162
සුප්‍රබුධ xviii, 179
සුභ xii
සුමන දේවායාවනය 165
සුමනමාලාකාර සමාගමය 128
සුලසා නගරශොභිනි 251
සුවාස්තු නදිය xxviii
සුංසුමාරගිර නුවර xxiv
සූකරඛත ලේනය v
සූරසේන xxvi
සූර්ය වංශ 2, 312
සේතව්‍යා xiii
සේනානී නිගමය vi, 321
සේල 113
සේවනය 352
සොළොස්වන වස 182
සෝණකුටිකණ්ණ xxviii
සෝණදණ්ඩ iii
සෝතාපත්ති ඵලය 327
සෝතාපත්තිමග්ග ඤාණය 327
සෝපාක දරුවා 142
සෝමා 106
සෝරෙය්‍ය පුර xxiv, 176
සෝවීර දේශය viii, xxx
සෝවස්තික (සොත්ථිය) බමුණා 62, 323
ශාක්‍ය කෝලිය යුධය 147

ශ
ශක්‍ර ප්‍රශ්න සමාගමය 179
ශරකූපය xvii
ශරයූ xii
ශාක්‍ය ජනපදය xiii
ශාක්‍යවර්ධන දේවාලය 317
ශාක්‍යයෝ xix
ශාතාගිර හේමවත 87
ශාරීරික ධාතු පූජාව 196
ශාලාවතිකා xiii
ශාස්තෘහු ස දෙන viii
ශීතවනය v
ශුද්ධෝදන රජුට දම් දෙසීම 122
ශුධෝදන රජු ගේ දරුවෝ 311
ශුධොදන රජු 30
ශුභා 106
ශූරසේන රට 175
ශ්‍රවස්ථ xii
ශ්‍රාවස්ති x, xi
ශ්‍රී කෘෂ්ණ xxvi
ශෝතෘන් සෙවීම 79
ශ්වේතකේතු 9

හ
හත්ථාලවක කුමරු, xx, 181
හත්ථිනිපුර xxv
හළිද්දිවසන xix
හස්තිග්‍රාමය xxxi
හස්තිනිකා 2
හස්තිනිනා පුර xxv
හංසයා ඇරැබෑ නඩුව 20
හිරණ්‍යවතී xxii
හුහුංක ජාතික බමුණා 330
හේරඤ්ඤකානි ගම්මුදලි 134

## ගාථාදීන් පිළිබඳ උපක්‍රම වණිකාව

අ
අංගාරිනොදනි දුමා භදන්තේ 344
අචිරං වතයං කායො 351

අත්තානං වෙ පියං ජඤ්ඤා 348
අනත්ථසංහිතං ඤත්වා 330
අනිච්චා වත සංඛාරා 292
අනුපවාදෙ අනුපඝාතො 193
අනෙකජාති සංසාරං 328
අන්ධකාරෙ පුරෙ හොති 235
අන්ධ භූතො අයං ලොකො 349
අපාරුතා තෙසං අමතස්ස ද්වාරා 336
අසන්තා කිර මං ජම්මා 235
අසල්ලීනෙන චිත්තෙන 293
අසාරෙ සාරමතිනො 344
අසිතෙනාසි නිද්දිට්ඨො
අස්සො'ව ජිණ්ණො නිබ්භොගො 235
අහමෙවාරහං ලොකෙ 338
අහං හි අරහා ලොකෙ 337
අස්මින් මානුෂ්‍ය විෂයෙ 335

ආ

ආචායෙර්‍ා න හි මෙ කශ්චිත් 337
ආනන්ද, මයා කථිතො ධම්මො 350
ආසාය කස්සතෙ ඛෙත්තං 345

ඉ

ඉධ තප්පති 350
ඉමෙහි අට්ඨෙහි තමග්ග පුග්ගලං 349

උ

උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය 346
උත්තිෂ්ඨෙන්න ප්‍රමද්‍යෙත 346

එ

එකස්ස චරිතං සෙය්‍යො 348
එකූනතිංසො වයසා සුභද්ද 354
එවං සංඛාරභූතෙසු 351
එෂා හි නමුචෙඃ සෙනා 322

ක

කිච්ඡෙන මේ හධිගතං 336
කිංසූ'ධ විත්තං පුරිසස්ස සෙට්ඨං 349

ඛ

ඛන්තීපරමං තපො තිතික්ඛා 193

ච

චක්‍රවර්තිති ශ්‍රියං පුත්‍ර 322
චතුසු සමුද්දෙසු ජලං අනප්පකං 350

ජ

ජිඝච්ඡා පරමා රොගා 349
ජිනා හි මාදෘශා ඥෙයා 338

ඨ

ඨිතො අහං අංගුලිමාල සබ්බද 349

ත

තණ්හාය ජායතෙ සොකො 350
තපෙන බ්‍රහ්මචරියෙන 347.
තපොකම්මා අපක්කම්ම 330
තුලමතුලං ච සම්භවං 352

ද

දණ්ඩො'ව කිර මෙ සෙය්‍යො 235
දන්තො දන්තෙහි සහ 343
දසවාසො දසබලො 343
දිශශ්චාලොක්‍ය චතුරො 321
දුමානි ඵුල්ලානි මනොරමානි 344
දූරෙ සන්තො පකාසන්ති 349
ධම්මචක්කං පවත්තෙතුං 337
ධම්මං චරෙ සුචරිතං 346
ධීරෙහි සුඛ සංවාසෝ 352
ධීරෝ භවෙ සත්තයුගං පුනාති 345

න

නඛො ආනන්ද එත්තාවතා 354
න පුත්තපසුම්මත්තං 351
න මෙ ආචරියෝ අත්ථි 337
න සන්ති පුත්තා තාණාය 347
නා භූ අස්සාස පස්සාසා 293

නිබ්බුතා නූන සා මාතා 320
නෙවාභිසිතං 344
නො චෙ ලභෙථනිපකං සහායං 348

ප

පඨව්‍යා එකරජ්ජේන 350
පස්ස චිත්ත කතං බිම්බං 349
පාතුරහොසි මගධෙසු පුබ්බෙ 336
පුත්‍රාර්ථෙ කං ප්‍රපද්‍යාමි
පුනප්පුනං චෙව වපන්ති බීජං 345
පුනප්පුනං යාචනකා චරන්ති 345

ප, බ, භ

පස්ස චිත්තකතං බිම්බං 349
භාරාණසිං ගමිෂ්‍යාමි 338
බාලාසංගතාචරීහි 352
භික්ඛවේ අඥේඤනාපි 352

ම

මනොපුබ්බංගමා ධම්මා 351
මයා තු දශමාසාන් ශෙව 322
මා කුංජර නාගමාසදෙ 211
මාදිසා වෙ ජිනා හොන්ති 337
මාසෙ මාසෙ කුසග්ගෙන 347
මුඤ්ච පුරෙ මුඤ්ච පච්ඡතො 348

ය

යං ච කම්ම කතං සාධු 347
යත්ථ ච දින්න මහප්ඵලමාහු 256
යථා අගාරං දුච්ඡන්නං 347
යථා අගාරං සුච්ඡන්නං 347
යථා සංකාරධානස්මිං 351
යද ජාතො'සී මෙ පුත්‍ර 321
යද හවෙ පාතු භවන්ති ධම්මා 329
යස්ස නිත්තිණ්ණො පංකො ච 347
යෙ ච කායෙන වාචාය 331
යෙ තරන්ති අණ්ණවං සරං 351
යෙ ධම්මාහෙතුප්පභවා 343
යෙහි ජාතෙහි නන්දිස්සං 235
යො ධීරො සබ්බධි දන්තො 343
යො බ්‍රාහ්මණෝ බාහිත පාපධම්මො 330
යො භික්ඛවෙ මං උපට්ඨහෙය්‍ය 351
යො වදතං පවරො'මනුජෙසු 256

ර

රාගවිරාගමනෙජමසොකං 256

ව

වර්ධමානඃ කුමාරො'ථ 319

ස

සචෙ ලභෙථ නිපකං සහායං 348
සතං හත්ථී සතං අස්සා 347
සන්තො සන්තෙහි සහ 343
සබ්බදානං ධම්මදානං ජිනාති 348
සබ්බද වෙ සුඛං සෙති 347
සබ්බපාපස්ස අකරණං 193
සබ්බා ආසත්තියෝ ඡෙත්වා 347
සබ්බාභිභූ සබ්බ විදූ'හමස්මි 337
සබ්බෙ'ව නික්ඛිපිස්සන්ති 292
සම්පූරිතාපමිත පාරමිතා පගාය i
සංසාරං දීඝමධානං 331
සා ගොතමී කාලකතා ඉතො චුතා 345
සාරංච සාරතො ඤත්වා 344
සාහුදස්සන මරියානං 352
සිඬංපද්මං තථා භද්‍රං 324
සුකරං සාධුනා සාධු 349
සුඛකාමාභූතානි
සුඛො විවෙකො තුට්ඨස්ස
සුඬොදනො නාම පිතා මහෙසිනො 345
සෙලෙ යථා පබ්බත මුඬනිට්ඨිතො 336
සොකාවතිණ්ණං ජනිත ඔපතෙ සොකො336

හ

හන්දද'නි භික්ඛවෙ ආමන්තයාමි වො 354
හිමරජත නිභශ්ච ෂඩ්විෂාණඃ 314